


# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

# 2022

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික**
**සමාජවාදී ජනරජයේ**
**නවවන පාර්ලිමේන්තුව**
**(තුන්වන සැසිවාරය)**

# විගණකාධිපති

වාර්ෂික වාර්තාව

**2022**

ජා ති ක වි ග ණ න කා ර් යා ල ය

## අපේ දැක්ම

රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙර දැරි කර ගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

## අපේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා මනා මූල්‍ය කළමනාකරණ සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම තහවුරු කරනු වස්, විගණනය මෙහෙයවීම මගින් යහපාලනය සහ රාජ්‍ය ගණන්දීමේ වගකීම ප්‍රවර්ධනය කිරීම.

## අපගේ අරමුණු

1. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

## අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය
නවෝත්පාදනය
නායකත්වය

# ජාතික විගණන ආයතනයේ නිල ලාංඡනය




මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ.

- ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මගින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.
- එහි මැද ඇති තරාදිය මගින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මගින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති පලා පෙති රටාව මගින් ජාතික සංස්කෘතිය නිරූපනය කෙරේ.

# විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මූල්‍ය පාලනය ඵලදායිව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම හා එය පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවැරී ඇති ප්‍රධානතම කාර්යය වේ. එම කර්තව්‍යය ඉටු කිරීම සම්බන්ධව 2022 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ දහය යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

| | | |
|---|---|---|
| පළමුවන කාණ්ඩය | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |
| දෙවන කාණ්ඩය | - | රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල් |
| තුන්වන කාණ්ඩය | - | ව්‍යවස්ථාපිත නොවන අරමුදල් |
| හතරවන කාණ්ඩය | - | විදේශ ආධාර ව්‍යාපෘති |
| පස්වන කාණ්ඩය | - | පළාත් සභා |
| හයවන කාණ්ඩය | - | පළාත් පාලන ආයතන |
| අටවන කාණ්ඩය | - | කාර්යසාධන හා පාරසරික විගණන පැවැරුම් |
| නවවන කාණ්ඩය | - | රාජ්‍ය සමාගම් |
| දහවන කාණ්ඩය | - | විශේෂ විගණන පැවැරුම් |
| එකොළොස්වන | - | ත්‍රෛවාර්ෂික වාර්තා |

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් අපේක්ෂා කර තිබුණි. ජාතික විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණත්, ජාතික විගණන කාර්යාලයේ කාර්යභාරයන් ඉටු කිරීමට අත්‍යාවශ්‍ය වූ විගණන කාර්ය මණ්ඩලයට අදාළ රාජ්‍ය විගණන සේවය මේ වන තෙක් ස්ථාපිත කර ගැනීමට නොහැකි වී ඇත. විගණන කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීමට එය බාධාකාරී වී ඇති අතර, කාර්ය මණ්ඩලයට උසස්වීම් ලබා ගැනීමට පැවැති අවස්ථා සීමා වී ඇත. විගණකාධිපති සභාපතිත්වය දරන ලද විගණන සේවා කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනය තුළින් නැවතත් බලාත්මක වී ඇති අතර රාජ්‍ය විගණන සේවය පිහිටුවීමට අදාල ව්‍යවස්ථා කෙටුම්පත මේ වන විට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇත. වර්තමානයේද රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එම බලතල පැවැරීම තුළ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එම බලතල විගණකාධිපතිවරයාට පැවැරීමට ඇති නීතිමය බාධාව තුළ විගණකාදිපතිවරයාගේ ස්වාධීන විගණන

ක්‍රියාවලියට බාධා පැමිණ ඇත. මෙම තත්ත්වය ඉදිරිපත්කර ඇති රාජ්‍ය විගණන සේවා ව්‍යවස්ථාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු යම් තරමකට අඩුවේ යයි මම විශ්වාස කරමි.

ජාතික විගණන කාර්යාලයේ රාජ්‍ය විගණන සේවය ස්ථාපිත නොවීම නිසා කාර්ය මණ්ඩලපය බඳවා ගැනීමට නොහැකි වීම පිළිබඳව සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය විසින් යෝජිත සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට යෝජනා කර තිබුණු කාර්ය මණ්ඩලයට අනුරූපව ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීමට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය මත අන්තර්ග්‍රහණය කිරීමට හා පුරප්පාඩුව පවතින තනතුරු සඳහා පත්කිරීමට හෝ උසස් කිරීම 2021 සැප්තැම්බර් 13 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එම අනුමැතිය මත අන්තර්ගහනණය කිරීමේ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කර අවසන් කර ඇතත් උසස් කිරීමේ හා පත්කිරීමේ කටයුතු මේ වන විට මාස 24 ක් ගතවී ඇතත් එම කටයුතු අවසන් කිරීමට නිසි අනුමතීන් ලබාදී නොමැති නිසා එම උසස් වීම් ලබා දීමට නොහැකි වී ඇත.

ඉහත සඳහන් පරිදි වූ අමාත්‍ය මණ්ඩලය අපෙක්ෂා කළ පරිදි කාර්ය මණ්ඩලය, පුරප්පාඩු වූ තනතුරුවලට පත්කිරීම හා උසස් කිරීම මගින් පිරවීමට නොහැකිවීමෙන්ද, 2022 වර්ෂයේ කාර්ය මණ්ඩල ඌණතාවය සැලැකිල්ලට ගත් විට 2022 වර්ෂයේ විගණන කටයුතු ඉටු කිරීම බාධාකාරී විය. එම බාධකයන් අපගේ කාර්යභාරය ඉටු කිරීමට අභියෝගාත්මක වුවද, මාගේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපකිරීම හේතුවෙන් විගණන කාර්යභාරයන් නියමිත කාලසීමාවන් තුළ අවසන් කර නියමිත වාර්තා ඉලක්කගත කාල පරිච්ඡේදයන් තුළදී ඉදිරිපත් කිරීමට උපරිම වශයෙන් කටයුතු කරන ලදී. ජාතික විගණන කාර්යාලයේ වැදගත් කාර්යභාරය සැලැකිල්ලට ගැනීම මෙන්ම රාජ්‍ය අංශය මුහුණ දෙන ප්‍රධාන ගැටළු හොඳින් අවබෝධ කර ගැනීම සහතික කිරීමට හැකි වන පරිදි ජාතික විගණන කාර්යාලය ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. විගණන වාර්තා කාර්යක්ෂව හා ඵලදායීව බෙදා හැරීම උදෙසා කාර්යාලයේ ක්‍රියාකාරීත්වය අබන්ධව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට ජාතික විගණන කාර්යාලය බැඳී සිටී. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති විගණන ස්වාධීනත්වය කාර්යාලයේ ඵලදායිත්වයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙසම හඳුනාගෙන ඇත.

ජාතික විගණන කාර්යාලයේ රාජකාරියට කැප වූ කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කිරීමට ලැබීම මා ලද ගෞරවයක් වන අතර ඔවුන්ගේ රාජකාරී කටයුතු කාර්යක්ෂව ඉටු කිරීමට ඔවුන් දක්වන කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමන්ලාට සහ සාමාජිකයන්, පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදු කළ වරළත් ගණකාධිකාරීවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය, විගණිත ආයතන, ජනාධිපති ලේකම් ඇතුළු එම කාර්ය මණ්ඩලයට, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික වැටුප් කොමිෂන් සභාව, නීතිපතිවරයා හා පරිපාලන කටයුතු වලදී සහාය වූ අනෙකුත්

රාජ්‍ය ආයතන, කාර්යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සමායාතනයේ සහ යුරෝපා හවුලේ සහයෝගීතාවයට ස්තුති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි.

වර්තමානයේ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මුල්‍ය කලමණාකරන වර්ධන ව්‍යාපෘතිය මගින් විගණන කටයුතු තවදුරටත් ශක්තිමත් කරගැනීමට මම බලාපොරොත්තු වෙමි.

අභියෝග කොතරම් පැමිණියද පවත්නා සම්පත් සේවානියුක්ත කිරීම මගින් පොදු මහජනතාවගේ හා පාර්ලිමේතුවේ අවශ්‍යතාවයන් ඉටුකරලීම උදෙසා දැඩි කැපවීමමෙන් යුතිව මම ඉදිරියටත් කටයුතු කරමි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2023 ඔක්තෝබර් 23 දින

# පටුන


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| අපගේ සංවිධානය | 01 | උසස් අධ්‍යාපන අංශය | 221 |
| අපගේ සංවිධාන සටහන | 13 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය | 229 |
| රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව | 18 | | |
| සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම | 18 | සෞඛ්‍ය අංශය | 237 |
| | | දේශීය වෛද්‍ය අංශය | 245 |
| පාර්ලිමේන්තුවට සහායවීම | 19 | දුම්කොල හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරිය | 253 |
| විගණකාධිපති විසින් පනවන ලද අධිභාර | 22 | | |
| | | කම්කරු හා විදේශ රැකියා අංශය | 257 |
| මහජන නියෝජන පරීක්ෂා කිරීම | 24 | කර්මාන්ත, නිෂ්පාදන හා තාක්ෂණ අංශය | 265 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 25 | | |
| ජාතික විගණන කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන | 29 | රාජ්‍ය පරිපාලන අංශය | 273 |
| | | විදේශ කටයුතු අංශය | 285 |
| විශේෂ විමර්ශන අංශය | 35 | වෙළඳ අංශය | 291 |
| විශේෂ විගණන අංශය | 39 | ආපදා කළමනාකරණ අංශය | 301 |
| කාර්යසාධන විගණන අංශය | 57 | ජනමාධ්‍ය අංශය | 307 |
| පරිසර අංශය | 65 | විදුලිබල හා බලශක්ති අංශය | 317 |
| කෘෂිකාර්මික අංශය | 69 | නාගරික සංවර්ධන හා නිවාස අංශය | 331 |
| ධීවර හා ජල සම්පත් සංවර්ධන අංශය | 81 | | |
| වාරිමාර්ග අංශය | 91 | මහමාර්ග අංශය | 349 |
| වැවිලි කර්මාන්ත අංශය | 101 | ඉදිකිරීම් හා ඉංජිනේරු අංශය | 361 |
| පශු සම්පත් අංශය | 109 | ගුවන් සේවා අංශය | 369 |
| රක්ෂණ අංශය | 115 | ප්‍රවාහන අංශය | 375 |
| බැංකු අංශය | 121 | වරාය හා නාවික අංශය | 387 |
| රාජ්‍ය ආදායම් අංශය | 129 | | |
| භාණ්ඩාගාරය හා රජය ණය | 137 | බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අංශය | 401 |
| ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා | 155 | | |
| මහජන ආරක්ෂක අංශය | 163 | වනාන්තර වනසත්ත්ව හා පරිසර අංශය | 407 |
| ජාතික ආරක්ෂාව | 171 | | |
| අධිකරණ,බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අංශය | 185 | අයෝජන ප්‍රවර්ධන අංශය | 419 |
| | | සංචාරක කටයුතු අංශය | 425 |
| | | විදේශ ආධාර ව්‍යාපෘති | 435 |
| කාන්තා හා ළමා කටයුතු අංශය | 197 | ක්‍රීඩා සහ යෞවන කටයුතු අංශය | 449 |
| විදේශ රැකියා අංශය | 203 | පළාත් සභා | 461 |
| අධ්‍යාපනය අංශය | 211 | පළාත් පාලනය | 485 |

# අපගේ සංවිධානය

## අපගේ ඉතිහාසය

විගණකාධිපති ධූරයේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1796 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 3 කට පසුව එනම්, 1799 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරි වරයෙකු හා විගණකාධිපති වරයෙකුව සිටි බව පැරණි ලිපිවල සඳහන්ව ඇත. එතැන් පටන් විගණකාධිපතිවරු 41 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස 2018 දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුව වශයෙන්ද, 2018 වර්ෂයෙන් පසු එය ජාතික විගණන කාර්යාලය වශයෙන්ද අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

## අපගේ විගණන අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ රාජ්‍ය අංශයේ ආයතන විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය මූලික වශයෙන් ලැබී ඇති අතර විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එය වඩාත් පුළුල් වී ඇත.

“විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, 44 වන හෝ 45 ව්‍යවස්ථා යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41 (අ) ව්‍යවස්ථාවේ I උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම්ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.” යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය යටතේ දක්වා ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පවරා ඇති එම බලය පහත සඳහන් අණපනත්වල තවදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

- රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සළසන 2018 අංක 19 දරන ජාතික විගණන පනත

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය.
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය.
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය.
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය.
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව මගින්, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන

කවර හෝ වෙනත් රාජකාරි ඉටුකිරීම විගණකාධිපතිවරයා විසින් කළ යුතු බවට දක්වා ඇත. විගණකාධිපතිවරයාගේ කාර්ය්‍ය හා කර්තව්‍ය ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධානද එමගින් සලසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම විගණිත ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිස විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සලසා ඇත.

## අපගේ සේවා ග්‍රාහකයෝ

ඉහතින් දක්වා ඇති ආකාරයට විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කර ඇති අතර තවදුරටත් එය විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම වගුව 01 පරිදි වේ.

| සේවාලාභියා | ආයතන ගණන |
|---|---|
| අමාත්‍යාංශ | 29 |
| රාජ්‍ය අමාත්‍යාංශ | 40 |
| දෙපාර්තමේන්තු | 110 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 331 |
| රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි හා රජයට පවරාගත් ව්‍යාපාර | 222 |
| රාජ්‍ය සමාගම් | 117 |
| රාජ්‍ය බැංකු | 09 |
| ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් | 67 |
| විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති | 113 |
| අනෙකුත් ස්වාධීන ආයතන | 11 |
| පළාත් සභා | 09 |
| පළාත් පාලන ආයතන | 341 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 565 |
| ක්‍රීඩා සංගම් | 66 |
| පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක | 273 |
| පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන | 70 |
| **එකතුව** | **2398** |

වගුව 01 – 2022 වර්ෂයේදී අපගේ සේවාලාභී පදනම පහත

## අපගේ විෂය පථය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ I කොටසේ 3 වන වගන්තියේ සිට 5 වන වගන්තිය දක්වා වගන්තිවලින් විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන විගණනවල විෂය පථය සඳහන් කර ඇත. ඒ අනුව,

- විගණකාධිපතිවරයා විසින්,
  - ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියළුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියළු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
  - විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකරගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබාගෙන සහ අදාළ කර ගෙන තිබේ ද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
  - වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේ ද යන්න පිළිබඳ තීරණය කළ යුතු ය; සහ

- එක් එක් විගණනයේ දී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.

- විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද විගණනයක විෂය පථයට විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්, මූල්‍යයන්, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය මූල්‍යවල සහ දේපළ විචක්ෂණ කළමනාකරණය පරීක්ෂා කිරීම ඇතුළත් වන්නේය.

- විගණකාධිපතිවරයා මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතුය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ ඕනෑම කාරණයක් පිළිබඳව, එම කරුණු සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. ඒ අනුව

- විගණන පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටවන ලද ජාතික විගණන කාර්යාලය විසින් කරනු ලබන විගණන සඳහා, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අදාළ විය යුතුය.

- කාර්යසාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද උත්තරීතර විගණන ආයතන සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ විය යුතු වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

## අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය සඳහා පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ

ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග අනුගතවීමට කටයුතු කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

- විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර 41(අ) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය.

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හිදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

## විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වයට ඇති සීමාවන්

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර තිබුණද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම්වලට ලක් කල අවස්ථා විය. නමුත් 2018 අගෝස්තු 01 දින සිට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලින් එම සීමාකිරීම් ඉවත් කර ඇත. විගණකාධිපතිවරයා සියලු පුද්ගලික හා ආයතනික බැදීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික සීමාකිරීම්වලින්ද තොරවිය යුතුය. මූල්‍ය හා පරිපාලනය යන දෙවර්ගයෙන් දැක්වෙන සම්පත් සඳහා විගණකාධිපතිවරයා විධායකය මත රදාපැවතීම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරනු ලබන විගණනයේ ස්වාධීනත්වයට අහිතකර ලෙස බලපාන බව සාමාන්‍ය පිළිගැනීමයි. මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. 2018 වර්ෂය දක්වා විගණකාධිපතිවරයාට ඔහුගේ වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීමට සිදු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ විගණකාධිපති, ඔහුගේ කාර්ය මණ්ඩලය ඇතුළත් ජාතික විගණන කාර්යාලය

සඳහා වූ අයවැය, පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන අතර ඔහුගේ අයවැය පිළිබඳව විධායක පාලනයෙන් බැහැරව තීරණය කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපතිගේ අයවැය පාර්ලිමේන්තුව විසින් වෙනම තීරණය කිරීමට විධිවිධාන සලසා තිබීම මගින් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටු කිරීමේදී මූල්‍යමය ස්වාධීනත්වය තහවුරු කර ඇත.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් නොවන විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර ඇත. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීන්ත්වය තහවුරු කිරීම සඳහා පනවන ලද ප්‍රතිපාදනයකි.

එමෙන්ම 21 වැනි ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විගණන සේවා කොමිෂන් සභාවක් ස්ථාපිත කර ඒ සඳහා සාමාජිකයින් බඳවාගෙන තිබුණි. එම කොමිසම විසින් අනුමත කර ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය සඳහා වූ සේවා ව්‍යවස්ථාව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලැබී නොතිබුණ බැවින් විගණකාධිපතිවරයාගේ විගණන කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම, කාර්ය මණ්ඩලයේ උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු සිදු කිරීම තවදුරටත් ජාතික විගණන කොමිෂන් සභාවට ස්වාධීනව කළ නොහැකිව ඇත.

එක්සත් ජාතින්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා ව්‍යත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1 ප්‍රතිපත්තිය - යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

2 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධුරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය

පහත සඳහන් තත්ත්වයන්ට යටත්වන උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන්ගේ සහ විද්‍යායතනික ආයතනවල සාමාජිකයන්ගේ පත්වීම්, නැවත පත්කිරීම්, සේවා නියුක්තිය, සේවයෙන් ඉවත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳ කොන්දේසි අදාළ නීති සම්පාදනය මගින් විශේෂයෙන් දැක්විය යුතුය.

- ව්‍යවස්ථාදායකයෙන් සහතික කෙරෙන ක්‍රියාවලියක් මගින් ස්වාධීනත්වය තහවුරු කෙරෙන පත්කිරීම්, නැවත පත් කිරීම් හෝ සේවයෙන් ඉවත් කිරීම් (උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනත්වය හා සම්බන්ධ ISSAI II මාර්ගෝපදේශ සහ යහපත් පරිචයන්)

- නීතිමය රාමුව (Mandate) මත ස්වකීය කාර්යයන් හේතු කොටගෙන විධායකයෙන් සිදුවන ප්‍රතිවිරෝධවලට බියකින් තොරව කටයුතු කිරීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රමාණවත් තරම් දීර්ඝ සහ නිශ්චිත කාල සීමාවක් සහිතව කරනු ලබන පත්වීම් ; සහ

- ස්වකීය රාජකාරී නිසියාකාරයෙන් සාමාන්‍ය පරිදි ඉටු කිරීමේදී අතීතයේදී හා වර්තමානයේදී සිදුකරන ලද කවර හෝ කාර්යයක් හේතු කොට ගෙන සිදු කරනු ලබන පැමිණිල්ලකදී නිර්මුක්ත තිබීම. (Immune)

3 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නීතිමය රාමුවක් (Mandate) සහ පූර්ණ අභිමතය

පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.

- රජයට හෝ රජයේ ආයතනවලට ලැබිය යුතු ආදායම් එකතු කිරීම.

- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව

- මූල්‍ය කළමනාකරණයේ හා වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ

- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්ති විගණනය නොකළ යුතු බැවින් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතනවලට අදාළ වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට එම ආයතන ගරු කළ යුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදුකරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරා ගැනීම ;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩ සටහන්කරණය, වැඩසටහන් පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නීතිමය රාමුවේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම ;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරිත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

උත්තරීතර විගණන ආයතන, ස්වකීය විගණිත ආයතන සමඟ වඩා සමීප සම්බන්ධතා ඇති කර නොගන්නා බවට සහතික විය යුතුය. ඒ අනුව ඔවුන් අරමුණුවලට අනුකූලව කටයුතු කරමින් සිටින බව විදහා දැක්විය යුතුය.

ස්වකීය වගකීම් ඉටු කිරීමේදී උත්තරීතර විගණන ආයතනවලට පූර්ණ අභිමතය අනුව ක්‍රියා කළහැකි විය යුතුය. ඔවුන් රාජ්‍ය අරමුදල් භාවිතය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට වෙහෙසෙන රාජ්‍ය හෝ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ද ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ ද අනෙකුත් පිළිගත් ප්‍රමිති නියම කරන ආයතනවලද නිල ලේඛන පදනම් කරගත් යෝග්‍ය වූ වැඩ සහ විගණන ප්‍රමිතීන් ද ආචාර ධර්ම සංග්‍රහයක් ද උත්තරීතර විගණන ආයතන විසින් භාවිත කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ආකාරයට වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍යආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

4 ප්‍රතිපත්තිය - සීමාවකින් තොරව තොරතුරු ලබා ගතහැකි වීම

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, නිවැරදිව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතනය සතු විය යුතුය.

5 ප්‍රතිපත්තිය -ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

6 ප්‍රතිපත්තිය - විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරීම

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.

- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු විය යුතුය.

- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමක් නීති මගින් කළ යුතුය.

- වාර්තා කිරීමට අවශ්‍ය කරුණු නිශ්චිත වශයෙන් නීතියෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර ස්වකීය විගණන වාර්තාවල කාල නියමය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු වේ.

- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.

- උත්තරීතර විගණන ආයතනවල වාර්තා නීතියෙන් නියම වී ඇති පරිදි අදාළ බලධාරීන්ට විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් හෝ භාරදීමෙන් පසු ඒවා ප්‍රකාශයට පත්කොට බෙදා හැරිය යුතුය.

7 ප්‍රතිපත්තිය - උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසු විපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ

නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.

- පසු විපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීය වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබිය දී පවා එකී විගණන ආයතන ස්වකීය පසු විපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

8 ප්‍රතිපත්තිය - මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍යකරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අය වැය ඔවුන් විසින්ම කළමනාකරණය කරගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නීතිමය රාමුවට (Mandate) අනුව කාර්යයන් සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබාදෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නීතිමය රාමුවට අනුව කාර්යයන් (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තරාත්මකව දක්වා තිබීමේ අවශ්‍යතාවය 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් 2018 අගෝස්තු 01 දින සිට සම්පූර්ණ කර ඇත.

## 2018 අංක 19 දරන ජාතික විගණන පනත

ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහා ද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත.

ජාතික විගණන පනතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මුල්‍ය, මුල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මුල්‍ය පාලනය, විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂයපථය පුළුල් කර තිබීම.

- විගණනය කරනු ලබන ආස්ථිත්‍යයකට අදාළ ඕනෑම කාර්ණයක් පිළිබඳව, එම කරුණ සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනයා අතරින් යම් අයෙකු විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුවත් කර ඇත්නම්, එම කරුණු විගණකාධිපතිවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය පිළිගනු ලබන අතර එය විගණනයන්ට අදාළ වේ.

- රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන්වීමෙන් පසු මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු වීම.

- රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.

- අදාළ විගණනය කරනු ලබන ආස්ථිත්‍යය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවීම.

- රජයේ මූල්‍ය ප්‍රකාශන රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම.

- විගණනය කරනු ලබන රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත අරමුදල් හෝ මණ්ඩල, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ රජය

වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගම්වලින් ගාස්තුවක් අය කළ යුතුවීම.

- ජාතික විගණන කාර්යාලයට බදවා ගනු ලබන තැනැත්තන්ගේ වැටුප් සහ වෙනත් දීමනා සහ වෙනත් යම් ප්‍රතිලාභ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතුය.

- සියළුම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන් විසින් විගණකාධිපතිවරයාට සහ ඔහු විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයෙකුට සහයෝගය දැක්විය යුතු අතර ඵලදායී විගණනයක් සිදු කිරීමට පහසුකම් සැලැසීම සඳහා වැඩ කිරීමට අවශ්‍ය සුරක්ෂිත සහ රැකවරණ සහිත පරිසරයක් සකස් කර දිය යුතුය.

- මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු අතර කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඇස්තමේන්තුව දින 10 ක් ඇතුළත මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කථානායකවරයා ලබා ගෙන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුව ජාතික අයවැයට ඇතුළත් කිරීම සඳහා කථානායකවරයා විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සලසා තිබේ.

- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සලසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.
- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කර තිබීම.

- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කථානායකවරයා විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නිශ්චය කර තිබේ.

- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරිත්වය අවධාරණය කර තිබේ.

- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.

- විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත තම වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා පොදු මහජනතාවට ලබා ගැනීම සඳහා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවියේ ඒවා පල කළ යුතුය.

- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිඳු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පුර්ව නීතිමය කටයුක්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

## අපගේ සංවිධාන සටහන

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලයට අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වලට ඇතුළත් කර ඇති නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 5 කින් සමන්විත වේ.

පළමු මට්ටම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. දෙවන මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රාජ්‍ය විගණන කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය හා සමස්ථ රාජ්‍ය විගණනය අධික්ෂණය කිරීම සිදු කරන ලබයි. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ අංශ 74 ක් ස්ථාපිත කර ඇති අතර එම එක් එක් අංශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු තෙවන මට්ටම නියෝජනය කරනු ලබයි. එම ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරුන්ගේ අධික්ෂණය යටතේ රජයේ හා පළාත් සභාවල විගණන කටයුතුද සිදු කරනු ලැබේ. අංශ ප්‍රධානීන් වෙත පැවැරෙන අංශයක ඇති විගණන "ශාඛා"වන්හි ප්‍රධානත්වය "ශාඛා ප්‍රධානී" ලෙස සහකාර විගණකාධිපතිවරයෙකු හෝ විගණන අධිකාරිවරයෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් සිව්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ

ප්‍රධානීන්ට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති සහකාර විගණන අධිකාරීන් හා විගණන නිලධාරීන් කාර්යක්ෂව හා ඵලදායීව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කිරීම ශාඛා ප්‍රධානීන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් පස්වන මට්ටමට අයත් වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වීම විගණන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ඉහත සඳහන් තෙවන මට්ටමට අයත්වන අංශ 74 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් 24 දෙනෙකු දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය විගණනය භාරව කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ අධීක්ෂණය නියෝජ්‍ය විගණකාධිපතිවරුන් දෙදෙනෙකු විසින් ඉටුකරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලයේ සමස්ථ මූල්‍ය හා පරිපාලන කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) විසින් ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී විසින් ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

මුදල් රෙගුලාසි 133 සඳහන් පරමාර්ථ ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර, ඔහු සෘජුව විගණකාධිපතිවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සේවා ව්‍යවස්ථාවක් පිළියෙළ කර අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, විගණන කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙනයාම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින්, රාජ්‍ය විගණන සේවය සඳහා ජාතික වැටුප් කොමිෂම විසින් නිර්දේශිත වැටුප්තල, සේවා නාමයන් හා සේවක සංඛ්‍යාව ශ්‍රී ලංකා විගණන සේවායේ හා විගණන පරීක්ෂක සේවයේ වැටුප් තලයන්ට, සේවා නාමයන්ට හා සේවක සංඛ්‍යාවට ආදේශ කර ජ්‍යෙෂ්ඨතාවයට නිලධාරීන් බඳවා ගැනීමට හා උසස් කිරීමට 2021 සැප්තැම්බර් 13 දින අනුමත කර ඇති බැවින් එම කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඉටු ඉටු කර ඇත. විගණන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ දීර්ඝ කාලීනව පැවැති උසස්වීම් ලබා ගැනීමේ අවස්ථාව මෙම අන්තර්කාලීන විධිවිධාන තුළින් යම්තාක් දුරකට විසඳී ඇත.

ඒ අනුව 2021 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික විගණන කාර්යාලයේ විගණනය ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධාන ව්‍යුහය සංශෝධනයන්ට ලක් කළ අතර නව සංවිධාන ව්‍යුහය පහත දැක්වේ.

## ජාතික විගණන කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



ජාතික විගණන කාර්යාලයේ වගකීම් හා කාර්යභාරය පිළිබඳ ඇගැයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2021 සැප්තැම්බර් 13 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 545 ක්ද, විගණන පරීක්ෂක සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 1,450 ක්ද වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනය අනුව ස්ථාපිත කළ ශ්‍රී ලංකා විගණන සේවා කොමිෂන් සභාව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අහෝසි කර තිබූ අතර එය නැවත 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ස්ථාපිත කර ඇත. 2018 අංක 19 දරන ජාතික විගණන පනත බලාත්මක කර තිබුණි. කෙසේ වුවද, ජාතික විගණන කාර්යාලයට රාජ්‍ය විගණන සේවයක් ස්ථාපිත කිරීමට පිළියෙළ කර ඇති නව විගණන සේවා ව්‍යවස්ථාව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ නමුත් මේ දක්වා අනුමැතිය ලැබී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලයේ 2022 වර්ෂය ආරම්භයට, 2023 ජූනි 30 දිනට ඒ ඒ තනතුරුවල අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පැවැති පුරප්පාඩු සංඛ්‍යාව වගුව 02 හි දැක්වේ.

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු | | පුරප්පාඩු | |
|---|---|---|---|---|---|---|
| | | | 2023.06.01 දිනට | 2023.06.30 දිනට | 2023.06.01 දිනට | 2023.06.30 දිනට |
| **(අ) - විධායක ශ්‍රේණිය/ මාණ්ඩලික හා විධායක/ මාණ්ඩලික නොවන ශ්‍රේණි** | | | | | | |
| **1** | විගණකාධිපති | 1 | 1 | 1 | 0 | 0 |
| **2** | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති | 3 | 0 | 0 | 3 | 3 |
| **3** | නියෝජ්‍ය විගණකාධිපති | 15 | 13 | 13 | 2 | 2 |
| **4** | අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 1 | 0 | 0 |
| **5** | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 0 | 0 | 1 | 1 |
| **6** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 1 | 0 | 0 |
| **7** | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති | 72 | 47 | 46 | 25 | 26 |
| **8** | සහකාර විගණකාධිපති | 455 | 15 | 15 | 206 | 206 |
| **9** | විගණන අධිකාරී | | 234 | 234 | | |
| **10** | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 1 | 0 | 0 |
| **11** | ගණකාධිකාරී | 1 | 1 | 1 | 0 | 0 |
| **12** | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 0 | 1 | 1 |
| **13** | නීති නිලධාරී | 1 | 0 | 0 | 1 | 1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **14** | පරිපාලන නිලධාරී {ක.සේ.නි. (අධි)} | 3 | 2 | 2 | 1 | 1 |
| **15** | තාක්ෂණ නිලධාරී විශේෂ | 1 | 0 | 0 | 1 | 1 |
| **16** | සහකාර විගණන අධිකාරී | 360 | 193 | 192 | 167 | 168 |
| **17** | විගණන නිලධාරී | 1090 | 769 | 765 | 321 | 325 |
| **18** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 3 | 2 | 2 | 1 | 1 |
| **19** | භාෂා පරිවර්තක | 10 | 8 | 8 | 2 | 2 |
| **20** | සංවර්ධන නිලධාරී | 73 | 54 | 53 | 1 | 20 |
| **21** | පුස්තකාලාධිපති | 1 | 1 | 1 | 0 | 0 |
| **22** | තාක්ෂණ නිලධාරී I | 1 | 0 | 0 | 1 | 1 |
| **23** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ. | 6 | 2 | 2 | 4 | 4 |
| **24** | කළමනාකරණ සේවා නිලධාරී | 121 | 119 | 119 | 2 | 2 |
| **25** | වාර්තා සැකසුම්කරු* | 41 | 39 | 39 | ** | ** |
| **26** | ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 0 | 1 | 1 |
| | | **2264** | **1503** | **1496** | **741** | **766** |
| **(ආ) - කණිෂ්ඨ සේවකයින්** | | | | | | |
| **1** | රියදුරු | 48 | 43 | 44 | 5 | 4 |
| **2** | සංචාරක බංගලා භාරකරු | 13 | 7 | 7 | 6 | 6 |
| **3** | විදුලි කාර්මික | 1 | 1 | 1 | 0 | 0 |
| **4** | ජලනල කාර්මික | 1 | 1 | 1 | 0 | 0 |
| **5** | කා.සේ.සේ. | 148 | 135 | 137 | 13 | 11 |
| **6** | දෙපාර්තමේන්තු කම්කරු ** | 2 | 1 | 1 | ** | ** |
| | | **213** | **188** | **191** | **24** | **21** |
| **සාරාංශය** | | | | | | |
| | විධායක ශ්‍රේණිය/ මාණ්ඩලික හා විධායක/ මාණ්ඩලික නොවන ශ්‍රේණි | 2264 | 1503 | 1496 | 741 | 766 |
| | කණිෂ්ඨ සේවකයින් | 213 | 188 | 191 | 24 | 21 |
| | | **2477** | **1691** | **1687** | **765** | **787** |

වගුව 02 - කාර්ය මණ්ඩල තත්ත්වය 2023 ජුනි 01 දිනට හා 2023 ජුනි 30 දිනට

ජාතික විගණන කාර්යාලය ශක්තිමත් කිරීම සඳහා අංක. 21/1274/301/017 හා 2021 සැප්තැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික විගණන කාර්යාලයේ කාර්යයන් වඩාත් ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය වන කාර්යමණ්ඩලය පුළුල් කර ඇති අතර එම අවශ්‍යතාවන් සපුරා ගැනීමට රාජ්‍ය විගණන සේවය විධිමත්ව පිහිටුවන තෙක් නව කාර්යයමණ්ඩලය ජ්‍යෙෂ්ඨතාවය මත උසස් කිරීම මගින් සපුරා ගැනීම අමාත්‍ය මණ්ඩල අනුමතිය මත මේ වන විට ඉටු කර ඇත.

## රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාව

ජාතික විගණන කාර්යාලයේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සලකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව එවකට හිටපු විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන්, හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කර අනුමත කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. නව සේවා ව්‍යවස්ථාව සම්මත කිරීම තුළින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

## සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

විගණන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වන සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා සහ රාජ්‍ය සමාගම්, රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී මෙන්ම අවශ්‍යවන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4)(අ) ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

ඒ අනුව සේවයේ යොදවන ලද විගණන සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවාව වෙනුවෙන් 2022 හා 2021 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 31.2 ක් හා රු.මිලියන 31.9 ක් ගෙවා ඇත. සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව යනාදි සාධක සලකා බලන ලදී. ඊට අමතරව විගණන සමාගමට ඇති ජාත්‍යන්තර සම්බන්ධතා හා ඔවුන් සලසන වෘත්තීය සේවාවන්වල ස්වභාවය යනාදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ

නිර්ණායකවලට ඇතුළත් වී තිබුණි. ඒ අනුව විගණකවරුන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකළ අතර සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛන්ඩව එක් එක් විගණන කාර්යභාරය පවරන ලදී.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුළත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතිය ඇති සමාගම් 125 කින් සමාගම් 17 ක් විගණනය කිරීම සඳහා පමණක් ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් 02 ක් මට සහය විය. ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව සහ ක්‍රීඩා සංගම් 27 ක් විගණනය කිරීම සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් 13 දෙනෙකුගේ සහය ලබා ගන්නා ලදී.

විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම නිසා ජාතික විගණන කාර්යාලය විසින් අදාළ සමාගම් ඍජු විගණනයට භාජනය කිරීම සහ ප්‍රධාන වාණිජ බැංකු දෙකක ශාඛාවන් විගණන සඳහා, සුදුසුකම්ලත් විගණකවරුන් පත් නොකිරීමට ගත් තීරණ හේතුවෙන් 2017 වර්ෂයේ සිට යොදවා ගත් සහාය විගණන සමාගම් ප්‍රමාණය අඩුවී තිබුණි.

රාජ්‍ය බැංකු විගණනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාගැනීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් සහාය ලබා ගන්නා ලදි.

## පාර්ලිමේන්තුවට සහාය වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. රාජ්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය පිළිබඳ ප්‍රධාන දායකත්වයක් සලසන ජාතික විගණන කාර්යාලය විසින්, මූල්‍ය භාරකාරත්වය හා රාජ්‍ය ආයතනවල මෙහෙයුම් හි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ ඍජුවම පාර්ලිමේන්තුවට වාර්තා කරන රජයේ බාහිර විගණක ලෙස කටයුතු කරයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හා 120 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තුවේ කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ. මෙම කාරක සභා දෙකෙහි කාර්ය භාරය වනුයේ රාජ්‍ය ගිණුම් පරීක්ෂා කිරීම් මඟින් රාජ්‍ය අරමුදල් හා සම්පත් නිසියාකාරව භාවිත කෙරේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට ව්‍යවස්ථාදායකයට සහාය වීමයි. එබැවින් රාජ්‍ය අංශයේ ගණන්දීමේ වගකීම හා ඵලදායී පාලනය තහවුරු කර ගැනීම සඳහා ඉතා වැදගත් කාර්ය භාරයක් මෙම කමිටු දෙක මඟින් සිදු කරනු ලැබේ.

ස්ථාවර නියෝග 119 යටතේ පිහිටුවන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය වනුයේ මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු

ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යයනයන්, මූල්‍ය පරිපාටි, කාර්ය සාධනය සහ කළමණාකරනය පරීක්ෂා කිරීම හා ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථා, මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පැවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පරිපාටිය, කාර්යය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය හා ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකු බැඟින් වන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ ද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේ ද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා සහ/ හෝ ඔහුගේ නියෝජිතයින් සෘජුවම එම කමිටුවලට සභාය වේ. එහි දී සාකච්ඡාවට භාජනය වන ආයතනයට අදාළ විගණන වාර්තාවේ ඇතුළත් වැදගත් නිරීක්ෂණවල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර යාවත්කාලීන කරන ලද නිරීක්ෂණය සමඟ වර්තමාන කාර්යය සාධනයට අදාළ කමිටුවේ සාකච්ඡා කිරීමට යෝග්‍ය නිරීක්ෂණ ඇතුළත් සාකච්ඡා සටහනක් පිළියෙල කර කමිටුව වෙත ඉදිරිපත් කරන අතර ඒ මත පදනම්ව කමිටු සභාපතිවරයා සාකච්ඡාව පවත්වාගෙන යනු ලබයි.

සාකච්ඡාවට භාජන වීමට නියමිත විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් කරුණු වලට අදාළ වර්තමාන තත්ත්වය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ලිඛිත තොරතුරු ඇතුළත් වාර්තාවක් සැපයීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. විගණකාධිපතිට පිටපතක් සහිතව ඉදිරිපත් කරන එම වාර්තාව පදනම් කරගෙන විගණකාධිපතිවරයා විසින් යටොක්ත සාකච්ඡා සටහන පිළියෙල කරනු ලබන අතර පෙර පවත්වන ලද රැස්වීම් වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කර ඒ පිළබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු ද එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ. සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර එහි පිටපත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරියට ලබා දෙන බැවින් ඒ මත පදනම්ව සාකච්ඡාව පවත්වාගෙන යාම කමිටුවට පහසුවේ.

කාරක සභා අවස්ථාවේදී විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ සාකච්ඡාවට බඳුන් වන කරුණු පිළිබඳව පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳව අදහස් දැක්වීම මඟින් කමිටුවට සභාය වීමයි. එහිදී අදාළ කරුණු පිළිබඳව මෙන්ම කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට සහ සාකච්ඡාවට කැඳවූ ආයතනයේ නිලධාරීන් ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අදහස් දැක්වීම ද විගණකාධිපතිවරයා විසින් බොහෝදුරට සිදු කරනු ලබයි.

ඒ අනුව, 2022 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 27 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 24 ක්, විශේෂ විගණන වාර්තා හා කාර්යය සාධන වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 03 ක් වශයෙන් පැවැත්වූ සභාවාර 30 ක් සඳහා විගණකාධිපතිවරයා එම කාරක සභාවට සභාය වී ඇත. එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 17 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීමට කමිටු සභාවාර 11 ක් හා විශේෂ විගණන වාර්තා සාකච්ඡා කිරීම සඳහා කමිටු සභාවාර 06 ක් වශයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවාර 17 ක් සඳහා විගණකාධිපතිවරයා සභාය වී තිබේ. ඒ අනුව, කමිටු දෙකම 2022 වර්ෂය තුළ ආයතන 44 කට අදාළ විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීම

සඳහා කැඳවූ සභාවාර 47 කට විගණකාධිපතිවරයා සහාය වී ඇත.

ඊට අමතරව විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ස්වාධීන කොමිෂන් සභාවල මූල්‍ය පාලනය සහ කාර්යය සාධනය ඇඟයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා 2022 වර්ෂයේ දී ජාතික විගණන කාර්යාලයීය නිලධාරීන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වී ඇත. තවද, ඒ එක් එක් ආයතන විසින් එම ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර ඒ බව වාර්තා කිරීම මගින් අදාළ ඇඟයීම් කටයුතු සාර්ථකව නිම කිරීමට විගණකාධිපතිවරයා තවදුරටත් එම කමිටුවට සහාය වේ.

එමෙන්ම මුදල් පිළිබඳ කාරක සභාව, අයවැය කාරක සභා යනාදී විවිධ පාර්ලිමේන්තු කාරක සභා සඳහා විගණකාධිපති නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීම තුළින් ද යනාදී වශයෙන් විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යය භාරයට අමතරව නන් අයුරින් පාර්ලිමේන්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපතිවරයා සහාය වී ඇත.

සති 8 ක් ඇතුළත සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර පිළිබඳව වාර්තා කිරීම සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයාට යොමු කරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳව පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114 ට අදාළව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තා පරීක්ෂා කර නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වර්ෂය තුළ විගණකාධිපතිවරයා විසින් ඉටුකරන ලද තවත් සුවිශේෂී වූ කර්තව්‍යයක් වේ.

## විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

2018 අංක 19 දරන ජාතික විගණන පනත 2018 අගෝස්තු 01 දින සිට බලාත්මක වීමත් සමඟම එහි 19 වගන්තිය පරිදි විගණන සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපති විසින් විගණනය කරනු ලබන අස්ථිත්‍වයක යම් ගණුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණන සේවා කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, යම් ගනුදෙනුවක් හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවයකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදු වූ සෑම ඌනතාවකට ම හෝ පාඩුවකට ම අදාළ වටිනාකම, එම විගණනය කරනු ලබන ආස්ථිත්‍වයේ ප්‍රධානගණන් දීමේ නිලධරයා වෙත වාර්තා කළ යුතු වේ.

එලෙස වාර්තා කරනු ලබන වටිනාකම එම ඌනතාවයට හෝ පාඩුවට වගකිවයුතු තැනැත්තන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව අය

කරගැනීමේ වගකීම අදාළ ප්‍රධාන ගනන්දීමේ නිලධාරී වෙත පවරා ඇත.

එසේ වුවද විගණකාධිපතිවරයාට තම කාර්යය ඉටුකිරීමේදී තමාට දැනගැනීමට ලැබුණු තොරතුරු වෙනත් පාර්ශවයකට හෙලි කිරීමට ජාතික විගණන පනතේ 09 වගන්තිය පරිදි සීමා පනවා තිබීම සහ විගණන පනතේ 19 වගන්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විගණන තොරතුරු විගණකාධිපතිගෙන් විගණන සේවා කොමිෂන් සභාවට ලැබිය යුතු ආකාරය පිළිබඳ නෛතික ප්‍රතිපාදන නොමැතිවීම මත අධිභාර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා එලෙස නෛතික ප්‍රතිපාදන ඇතුළත් වන පරිදි විගණන පනත සංශෝධනය කළ යුතු බවට නීතිපතිවරයා විසින් මතයක් ප්‍රකාශ කර ඇත.

එම තත්ත්වය තුළ විගණන පණත මඟින් හඳුන්වාදී ඇති අධිභාර ක්‍රියාවලිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණ තිබුණි.

එසේ වුවද ජාතික විගණන පනත බලාත්මක වීමටද ප්‍රථම සිට විශ්වවිද්‍යාල සහ පළාත් පාලන ආයතනවලට අදාළව අධිභාර පැනවීමට විගණකාධිපතිට වෙනත් ලිඛිත නීති මඟින් පවරා තිබූ බලතල මත එම අධිභාර ක්‍රියාවලිය විගණකාධිපතිගේ මැදිහත් වීම මත පෙර පරිදිම සිදුවෙමින් පවතී.

ඒ අනුව මෙම අධිභාර ක්‍රියාවලිය වඩාත් සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර ඒ සඳහා අධිභාර පැනවීම විගණකාධිපතිවරයා විසින් අවසන් කිරීමටත් ඒ සම්බන්ධයෙන් වූ අභියාචනා සලකා බැලීම විගණන සේවා කොමිෂන් සභාවටත් පැවරීම සඳහා ජාතික විගණන පනතේ ප්‍රතිපාදන සංශෝධනය කිරීම සභාවට පැවරීම වඩාත් සුදුසු බව නිර්දේශ කෙරේ. මේ සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 19 වන ඡේදය සඳහා සුදුසු සංශෝධන සිදු කළ යුතුව ඇත.

## පළාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම්

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර මහා නගර සභා 24 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් වේ. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥාපනත් හා පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත බලය පවරා ඇත. එකී බලය අනුව සමාලෝචිත වර්ෂය තුල පාර්ශවකරුවන් 135 ක් වෙත රු. 261,095 ක අධිභාර සහතික 10 ක් නිකුත් කර තිබුණි.

## මහජන නියෝජන පරීක්ෂා කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන ආස්ථාන්වයන්ට අදාළව ඕනෑම කාරණයක් පිළිබඳව, සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතුරින් යම් අයෙකු විසින් විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුම් දීමක් කර තිබෙන විට ඒ පිළිබඳව පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය වෙත මහජනතාව පෞද්ගලිකව හෝ මහජන නියෝජිතයන් හා විවිධ සංවිධාන හරහා ලැබෙන ලිඛිත නියෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යාලය තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කර ඇත. එම ඒකකය මගින් ආයතනයට ලැබෙන නියෝජන ලියාපදිංචි කර වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා එහි විශේෂ විමර්ශන හා වෝහාරික විගණන ඒකකයට සහ/හෝ විවිධ විගණිත ආයතනවල පිහිටුවා තිබෙන විගණන ශාඛාවලට හෝ ප්‍රාදේශීයව පිහිටුවා තිබෙන විමර්ශන ඒකක වලට එම තොරතුරු ප්‍රේෂණය කරනු ලබයි. ප්‍රේෂණය කරන එම තොරතුරු පාදක කරගෙන පවත්වනු ලබන විගණනයන්ගෙන් මතුකර ගනු ලබන නිරීක්ෂණ ඒවායේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අදාළ විගණන ආස්ථාන්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති වාර්තාවලට ඇතුළත් කිරීමට හෝ විශේෂ වාර්තා/ කාර්යසාධන වාර්තා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හෝ ජාතික විගණන ආයතනය කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 09 වගන්තියෙහි පවත්නා සීමාකාරී විධිවිධාන පිළිබඳ අවධානය යොමුකර එම විගණනයන්ගේ ප්‍රතිඵල සෘජුව අදාළ නියෝජනයන් ඉදිරිපත් කරනු ලැබූ පාර්ශවයන් වෙත දැනුම් දෙනු නොලැබේ. එහෙත් නිර්නාමික නියෝජන හැරුණු විට අනෙකුත් නියෝජන සම්බන්ධයෙන් එය ලද බව හා ඒවා පරීක්ෂා කර සුදුසු පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව ඒවා එවන ලද පාර්ශවයන් වෙත දන්වා යවනු ලැබේ.

2022 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලය වෙත මහජන නියෝජනයන් 2,111 ක් ලැබී තිබුණු අතර එම නියෝජනයන්ගෙන් 1,416 ක් රජයේ හෝ රාජ්‍ය ආයතනවල පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් වූ අතර 57 ක් විවිධ පාර්ශවයන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විය. තවත් නියෝජන 305 ක් ආයතනික වංචා හා දූෂණ සම්බන්ධයෙන් වූ අතර 28 ක් විවිධ පාර්ශවයන්ගේ පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් විය. එසේම මෙම නියෝජනයන් අතුරින් 318 ක් යොමු කරන්නාගේ අනන්‍යතාවය සහිතව ඉදිරිපත් කර තිබුණු අතර, නියෝජනයන් 1378 ක් නිර්නාමිකව ඉදිරිපත් කර තිබුණි. මේ අතුරින් වැඩි ප්‍රමාණයක් ප්‍රමාණවත් හෝ යම් තරමක හෝ සාක්ෂි සහිතව ඉදිරිපත් කර තිබුණි. සාක්ෂි කිසිවක් නොමැතිව වුවද ලැබෙන පැමිණිලි ද පරීක්ෂාවන්ට ලක් කරනු ලැබේ.

වැඩිදුර විමර්ශන කටයුතු සඳහා යොමුකරන ලද ලිඛිත නියෝජනයන් පිළිබඳ ආංශික

වර්ගීකරණයක් සිදුකිරීමේදී ප්‍රධාන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා 334 ක් ද, පළාත් පාලන අංශය සඳහා 268 ක් ද, සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා නියෝජනයන් 176 ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් නියෝජනයන් 172 ක් ද කෘෂිකර්ම පාරිසරික හා සේවක සුභ සාධනය යන ක්ෂේත්‍ර සඳහා පිළිවෙලින් 119 ක් 58ක් සහ 46 ක්ද වශයෙන් නියෝජනයන් ලැබී තිබුණු අතර රජයේ විවිධ ආයතන සඳහා තවත් නියෝජනයන් 769 ක් ජාතික විගණන කාර්යාලය වෙත ලැබී තිබුණි.

## කාර්ය මණ්ඩල පුහුණුව

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතන වල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන්දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1302කින් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 417කින් සමන්විත කාර්යමණ්ඩලයක දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

එකී ව්‍යවස්ථාපිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම පිණිස ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ වර්තමානයට හා අනාගත ප්‍රවනතාවයන්ට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

- දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- යහපත් ආකල්ප වර්ධනය කිරීම

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුක්තව ජාතික විගණන කාර්යාලයේ විගණන කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරියෙකු විසින්ම අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (Continuous Professional Development – CPD) සඳහා වර්ෂයකට පැය 100 කට නොඅඩු න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය ජාතික විගණන කාර්යාලය විසින් අවධාරණය කර තිබේ.

2018 වර්ෂයේ සිදු කරන ලද පුහුණු අවශ්‍යතා අධ්‍යයනය (Training Need Assessment) අනුව නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ලබාදිය යුතු බවට හඳුනාගත් පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමේ කාර්යභාරය ජාතික විගණන කාර්යාලය සිදු කරමින් පවතී.

- මූල්‍ය විගණනය
- විමර්ශන විගණනය
- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය
- වෝහාරික විගණනය
- ප්‍රසම්පාදන හා ඉදිකිරීම් විගණනය
- ව්‍යාපෘති විගණනය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිත
- බදුකරණය
- විගණන පනතේ 4 හා 5 වගන්තියේ අවශ්‍යතා
- පලාත් පාලන ආයතන ගිණුම් හා විගණනය
- අධිභාර ක්‍රියාවලිය
- විගණන වාර්ථාකරණය
- පරිගණක හැකියාව සංවර්ධනය
- භාෂාමය හැකියාවන් සංවර්ධනය

ඒ අනුව නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරී වෘත්තීය මට්ටමින් සිදු කිරීමට අවශ්‍ය දක්ෂතාවයන් අත්පත් කරගත හැකි පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීමත්, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමටත් කටයුතු කරනු ලැබේ. එහිදී සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන්ගේ සහය මෙන්ම අවශ්‍ය පරිදි බාහිර දේශකවරුන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කරන අතර පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් අදාල පුහුණු අවශ්‍යතාවයන් සපුරා ගැනීම සිදු කරණු ලැබේ.

### දේශීය වශයෙන් පුහුණුව ලබා දීම

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2022 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය මගින් විගණන නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාතෘකා 3 ක් යටතේ පුහුණු වැඩසටහන් 36 ක් ද 2021 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයට බඳවාගත් නවක විගණන නිලධාරීන් හා 2022 වර්ෂයේ බඳවාගත් විගණන නොවන නිලධාරීන් සඳහා සමාරම්භක පුහුණු වැඩසටහන් 2 ක් ද පවත්වා ඇත. අංක 18/2020 දරන “රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම” නමැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව විගණන කාර්යමණ්ඩලයේ හා විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් පහසුකම් ලබා දී තිබේ.

## විදේශීය පුහුණුවීම්

2022 වර්ෂයේදී නිලධාරීන් දෙදෙනෙක් ITEC ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ විදේශ පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි වී ඇති අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ සංවිධානය කළ විදේශ වැඩමුළු 2ක් සඳහා නිලධාරීන් දෙදෙනෙක් සහභාගී කරවා ඇත.

2022 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳව විස්තර පහත වගුව 03 හි දක්වා ඇත.

| | වැඩසටහන් විස්තරය | වැඩසටහන් ගණන | සහභාගී වූ නිලධාරීන් | | | | | | පුහුණු පැය ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අංශ ප්‍රධානීන් සහභාගි වූ අවස්ථා ගනන | සහකාර විගණකාධිපති / විගණන අධිකාරීන් සහභාගිවූ අවස්ථා ගනන | සහකාර විගණන අධිකාරීන් සහභාගිවූ අවස්ථා ගනන | විගණන නිලධාරීන් සහභාගිවූ අවස්ථා ගනන | විගණන නොවන නිලධාරීන් සහභාගිවූ අවස්ථා ගනන | එකතුව | |
| | **දේශීය පුහුණු වැඩසටහන්** | | | | | | | | |
| 1 | මූල්‍ය විගණන පුහුණුව | 33 | 111 | 281 | 184 | 581 | - | 1,157 | 8,504 |
| 2 | බදුකරණය පිළිබඳ පුහුණුව | 2 | 26 | 108 | 27 | 406 | - | 567 | 4,111 |
| 3 | ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණුව | 1 | 13 | 80 | 40 | 219 | - | 352 | 10,280 |
| 4 | නවක නිලධාරීන් සඳහා සමාරම්භක පුහුණුව | 2 | - | - | - | 54 | 56 | 54 | 2,770 |
| | එකතුව | **38** | | | | | | **2,130** | **25,664** |
| | **විදේශීය පුහුණු වැඩසටහන්** | | | | | | | | |
| 1 | ITEC ශිෂ්‍යත්ව වැඩසටහන 2022/2023 රාජ්‍ය අංශයේ අයවැය, ගිණුම්කරණය හා මූල්‍ය කලමණාකරනය පුහුණු වැඩසටහන (Budgeting, Accounting and Financial Management in Government Sector) | 1 | - | 2 | - | - | - | 2 | 131 |
| 2 | දේශගුණ කාර්ය සාධන විගණන පුහුණුව (මාර්ගගත) (Climate Performance Audit Training) | 1 | - | 1 | - | - | - | 1 | 12 |
| 3 | රාජ්‍ය අංශයේ තිරසාර වාර්තාකරණය දියුණු කිරීම (මාර්ගගත) (Advancing Public Sector Sustainability Reporting) | 1 | - | 1 | - | - | - | 1 | 4 |

වගුව 03 - 2022 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳව විස්තර

මූලාශ්‍රය - පුහුණු හා සංවර්ධන අංශය, ජාතික විගණන කාර්යාලය

## බාහිර ආයතන සඳහා සම්පත්දායකත්වය ලබාදීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන් 7 දෙනෙකු 2022 වර්ෂය තුළ අවස්ථා 14කදී ජාතික විගණන පනත හා විගණනයට සමගාමී ක්ෂේත්‍ර පිළිබඳ වෙනත් රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු නිළධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය සඳහා එම ආයතනයන්හි ඉල්ලීම පරිදි තම සම්පත්දායකත්වය ලබා දීම සඳහා යොමු කර තිබේ.

# ජාතික විගණන කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන

| |
|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම |
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය |
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය |

# 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | තත්‍ය<br>**2022**<br>රුපියල් | සංශෝධිත<br>**2021**<br>රුපියල් |
|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1,481,951,627 | 1,452,918,947 |
| | | |
| **මූල්‍ය වත්කම්** | | |
| අත්තිකාරම් ගිණුම් | 194,108,547 | 224,242,476 |
| මුදල් හා මුදල් සමාන දෑ | - | - |
| | | |
| **මුළු වත්කම්** | **1,676,060,174** | **1,677,161,423** |
| | | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | (67,047,400) | 49,419,013 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | 1,481,951,627 | 1,452,918,947 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | | |
| | | |
| **ජංගම වගකීම්** | | |
| තැන්පතු ගිණුම් | 261,155,947 | 174,823,463 |
| අග්‍රිම ශේෂය | - | - |
| **මුළු වගකීම්** | **1,676,060,174** | **1,677,161,423** |

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
විගණකාධිපති
2023 පෙබරවාරි 28 දින

ජී.එස්. තුරුණාරත්න
ප්‍රධාන ගණකාධිකාරී
2023 පෙබරවාරි 28 දින

## වාර්තාකිරීමේ පදනම

### වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

### මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

### ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

### දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

### දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

### මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

### මූල්‍ය නොවන වත්කම්

වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් දරන ලද රු.133,270.00 ක් භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂ යටතේ ගැලපී ඇත්තේ එම වියදම 2022 වර්ෂයේ මිලදී ගත් වත්කමක් වෙනුවෙන් දරන ලද වියදමක් බැවිනි.

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 රු. | | තක්ෂ 2022 රු. | තක්ෂ 2021 රු. |
|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | 489,581,029 | 348,678,099 |
| - | ආදායම් බදු | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 489,581,029 | 348,678,099 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | 489,581,029 | 348,678,099 |
| - | ආදායම් නොවන ලැබීම් | - | - |
| - | භාණ්ඩාගාර අග්‍රිම | 1,532,936,000 | 1,426,015,000 |
| - | තැන්පතු | 190,875,670 | 138,531,867 |
| - | අත්තිකාරම් ගිණුම් | 80,667,273 | 83,398,507 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 5,509,635 | 4,570,132 |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | 1,809,988,578 | 1,652,515,506 |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | 2,299,569,607 | 2,001,193,605 |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | 103,715,921 | 68,514,459 |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | 2,195,853,686 | 1,932,679,146 |
| | අඩු කළා : වියදම් | | |
| - | පුනරාවර්තන වියදම් | - | - |
| 1,758,350,183 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 1,740,721,144 | 1,579,046,154 |
| 337,729,817 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 319,461,981 | 242,889,315 |
| 16,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 14,499,269 | 13,168,281 |
| - | පොළී ගෙවීම් | - | - |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | | 34,698 |
| 2,112,080,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | 2,074,682,394 | 1,835,138,448 |
| | මූලධන වියදම් | | |
| 12,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 6,724,786 | 7,415,964 |
| 6,739,940 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 6,730,671 | 4,670,023 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | - | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | - |
| 1,760,060 | හැකියා වර්ධනය | 1,602,007 | 1,445,665 |
| - | වෙනත් මූලධන වියදම් | - | - |
| 20,500,000 | මුළු මූලධන වියදම් (උ) | 15,057,464 | 13,531,652 |
| | තැන්පතු ගෙවීම් | 104,543,186 | 76,096,982 |
| | අත්තිකාරම් ගෙවීම් | 50,533,345 | 79,461,594 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 5,509,635 | 4,570,132 |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | 160,586,166 | 160,128,708 |
| 2,132,580,000 | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | 2,250,326,024 | 2,008,798,808 |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | (54,472,338) | (76,119,662) |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | (54,472,338) | (76,119,662) |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | |
| | | - | - |

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | **2022** | **2021** |
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 489,581,029 | 348,678,099 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 78,011,355 | 77,718,554 |
| අග්‍රිම ලැබීම් | 1,532,936,000 | 1,426,015,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 81,525,178 | 85,093,512 |
| තැන්පතු ලැබීම් | 190,875,670 | 138,531,867 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 5,509,635 | 4,570,132 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 2,378,438,867 | 2,080,607,164 |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,064,649,400 | 1,830,269,066 |
| සහනාධාර සහ මාරුකිරීම් | 14,499,269 | 13,168,281 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 28,578,887 | 3,567,631 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 103,715,921 | 68,514,459 |
| අත්තිකාරම් ගෙවීම් | 50,211,898 | 79,750,590 |
| තැන්පතු ගෙවීම් | 104,543,186 | 76,096,982 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 5,509,635 | 4,570,132 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 2,371,708,196 | 2,075,937,141 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 6,730,671 | 4,670,023 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 6,730,671 | 4,670,023 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 6,730,671 | 4,670,023 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | (6,730,671) | (4,670,023) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

# විශේෂ විමර්ශන අංශය

## විමර්ශනයට ලක්කල ගනුදෙනු / සිද්ධීන් / ආයතන

- අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
- ත්‍රිපෝෂ සමාගමේ **2021** පෙබරවාරි **02** දිනට පැවති කිලෝ ග්‍රෑම් **300,000** ක නිමි ත්‍රිපෝෂ තොගය
- ඉමදුව නගර සංවර්ධන ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
- ජාතික පුහුණු අධිකාරියේ තෝරාගත් පාලන ක්ෂේත්‍රයන්
- කොළඹ මහ නගර සභාවේ දේපළ හා මූල්‍ය අක්‍රමිකතා
- කොළඹ මහ නගර සභාවේ රථවාහන ගාල් පරිපාලනය
- කොළඹ මහ නගර සභාවට අයත් බොරැල්ල කනත්ත භාරව කටයුතු කරන නිලධාරියාගේ ක්‍රියාකාරකම්
- සුගතදාස ජාතික ක්‍රීඩා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම
- මහනුවර දිස්ත්‍රික්කයේ මැදවල ප්‍රාදේශීය රෝහලේ පරිපාලනය
- ලංකා ඛනිජ වැලි සමාගම **2020** වර්ෂයේ දී ඉල්මනයිට් ඛනිජ වැලි ටොන් **85,000**ක් ටෙන්ඩර් කිරීම
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ **2011-2012** වර්ෂවල ගංවතුරෙන් හානියට පත් වූ මාර්ග ප්‍රතිසංස්කරණය
- ලේක්හවුස් ආයතනය විසින් **2020** මහ මැතිවරණයේ ප්‍රතිපත්ති ප්‍රකාශ මුද්‍රණය කිරීම
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැටුප් වර්ධක ගෙවීම
- මාර්ගගත ක්‍රමයට (Online) මොඩියුල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# විශේෂ විමර්ශන අංශය

විගණකාධිපතිවරයා ලෙස රාජ්‍ය විගණනයට අදාළව මා සතු ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කිරීම ක්‍රමාණුකූල සහ පහසු කරවීම සඳහා විගණන කාර්ය මණ්ඩලය විවිධ විෂයානුබද්ධ විගණන අංශ යටතේ අනුයුක්ත කර ඒවා සඳහා සුවිශේෂ කාර්යයන් පවරා ඇත. එහිදී යම් විගණන ආස්ථිත්‍යකට අදාළව ඇතැම් ගණුදෙනුවක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනාත්මක විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැනනඟින විට එවැනි විමර්ශන විගණන කාර්යයන් සිදුකිරීම සඳහා සහ වෙනත් අංශ වලින් සිදුකරන එවැනි විගණනයන්ට සහය දැක්වීම සඳහා ජාතික විගණන කාර්යාලයේ සේවයේ නිරත විශේෂ විමර්ශන හා වෝහාරික විගණනය පිළිබඳ පුහුණුවී සහ අත්දැකීම් සහිත නිලධාරීන්ගෙන් සමන්විතව විශේෂ විමර්ශන අංශයක් ස්ථාපිත කර ඇත.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 04 වගන්තිය පරිදි මා වෙත ලැබෙන මහජන නියෝජනද, රාජ්‍ය ගිණුම් පිළිබඳ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්හි දැනුම් දීම මෙන්ම රාජ්‍ය ආයතන ප්‍රධානීන් , ජනමාධ්‍ය වෙතින් ප්‍රකාශිත කරුණු, කාලීනව වැදගත්කමක් ඇති ආර්ථික හා සමාජීය කරුණු ද, මා විසින් සැලකිල්ලට ගනු ලබන වෙනත් වෘත්තීමය අවශ්‍යතාවයන් ද පදනම් කර ගනිමින් විශේෂ විගණන විමර්ශනයකට ලක්වීම උචිත යයි මා විසින් තීරණය කරනු ලබන ගනුදෙනු හා සිද්ධීන් මෙම විමර්ශන අංශයේ විගණනයට ලක් කරවනු ලැබේ. ඇතැම් අවස්ථාවන්හිදී මෙම අංශයේ නිලධාරීන් වෙනත් විගණන අංශ/ ශාඛා වෙත තාවකාලිකව අනුයුක්ත කර විශේෂ විමර්ශනයන් සිදු කරවනු ලැබේ.

2022 වර්ෂයේ දී එලෙස විශේෂ විමර්ශනයට ලක් කළ ගනුදෙනු හා සිද්ධීන් සමූහය අතරින් ප්‍රමාණාත්මකව වැදගත් පරීක්ෂාවන් පහත දැක්වේ.

## විමර්ශනයට ලක්කල ගනුදෙනු / සිද්ධීන් / ආයතන

1. අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
2. ත්‍රිපෝෂ සමාගමේ 2021 පෙබරවාරි 02 දිනට පැවති කිලෝ ග්‍රෑම් 300,000 ක නිමි ත්‍රිපෝෂ තොගය
3. ඉමදුව නගර සංවර්ධන ව්‍යාපෘතියේ නිශ්චිත කොටසක්
4. ජාතික පුහුණු අධිකාරියේ තෝරාගත් පාලන ක්ෂේත්‍රයන්
5. කොළඹ මහ නගර සභාවේ දේපළ හා මූල්‍ය අක්‍රමිකතා
6. කොළඹ මහ නගර සභාවේ රථවාහන ගාල් පරිපාලනය
7. කොළඹ මහ නගර සභාවට අයත් බොරැල්ල කනත්ත භාරව කටයුතු කරන නිලධාරියාගේ ක්‍රියාකාරකම්
8. සුගතදාස ජාතික ක්‍රීඩා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම

9. මහනුවර දිස්ත්‍රික්කයේ මැදවල ප්‍රාදේශීය රෝහලේ පරිපාලනය
10. ලංකා ඛනිජ වැලි සමාගම 2020 වර්ෂයේ දී ඉල්මනයිට් ඛනිජ වැලි ටොන් 85,000ක් ටෙන්ඩර් කිරීම
11. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2011-2012 වර්ෂවල ගංවතුරෙන් හානියට පත් වූ මාර්ග ප්‍රතිසංස්කරණය
12. ලේක්හවුස් ආයතනය විසින් 2020 මහ මැතිවරණයේ ප්‍රතිපත්ති ප්‍රකාශ මුද්‍රණය කිරීම
13. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැටුප් වර්ධක ගෙවීම
14. මාර්ගගත ක්‍රමයට (Online) මොඩියුල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළ රට තුල පැවති ප්‍රවාහන ගැටළු හා කලබලකාරී වාතාවරණය තුළ විගණන කටයුතු සඳහා බැහැර යාමට පැවති සීමාකාරී තත්ත්වයන් මෙන්ම විගණන සහ විගණිත ආයතනයන්හි කාර්යමණ්ඩල කාර්යාලගතව රාජකාරි ඉටු කිරීමටද සාපේක්ෂව අඩුවීම මෙම විමර්ශන අංශයේ කාර්යභාරයන් වෙත සීමාකාරී බලපෑමක් ඇති කරවනු ලැබීය.

මෙම විමර්ශන අංශය විසින් අනාවරණය කර ගත් ඇතැම් නිරීක්ෂණ ජාතික විගණන පනතේ 11 සහ 12 වගන්තිය පරිදි නිකුත් කළයුතු වාර්තාවලටද , පනතේ 13 වගන්තිය පරිදි නිකුත් කරනු ලබන විශේෂ වාර්තාවන්ටද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව පරිදි සභාගත කරනු ලබන අතර ඇතැම් නිරීක්ෂණ කලමනාකරණය වෙත නිකුත් කරනු ලබන වාර්තාවලට ඇතුළත් කරනු ලැබේ.

කෙසේ වෙතත් අංශයට අනුයුත්ක කාර්ය මණ්ඩලය අවස්ථානුකූලව වෙනත් අංශ / ශාඛා සඳහා ස්ථිරව හා තාවකාලිකව අනුයුක්ත කිරීම, විමර්ශන විගණනයන් සඳහා සාපේක්ෂව වැඩි කාලයක් ගතවීම සහ විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබාදීමට විශාල කාලයක් ලබාගැනීම මෙන්ම එම පිළිතුරු නැවත නැවත සමාලෝචනය කිරීමට සිදුවීම හේතුවෙන් එකිනෙක වර්ෂ තුළදී සිදුකරනු ලබන විමර්ශන විගණනයන්හි නිරීක්ෂණ ඉහත සඳහන් වාර්තා වලට ඇතුළත් කිරීම බොහෝවිට ඉදිරි වර්ෂවලදී සිදු කෙරේ.

# විශේෂ විගණන අංශය

## 2022 වර්ෂය තුලදී නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

- මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව
- සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව
- ශ්‍රී ලංකාවේ මූල්‍ය කළමණාකරනය සහ රාජ්‍ය ණය පාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2018 -2022
- කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000 ක ප්‍රසම්පාදනය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව
- නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022–2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව
- ක්‍රියාත්මක වෙමින් පැවති සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (කොළඹ සිට මාලඹේ දක්වා) ශ්‍රී ලංකා රජය විසින් ඒකපාර්ශවිය අවසන් කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව

# 2022 වර්ෂය තුලදී නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව හා හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව විශේෂ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ආයතනවලට අදාළව හඳුනා ගන්නා ලද විශේෂ සිද්ධ සම්බන්ධයෙන් මෙම වාර්තා නිකුත් කිරීමට කටයුතු කර ඇත. මෙම විශේෂ විගණන වාර්තා නිකුත් කිරීමේ දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් කරනු ලබන දැනුම්දීම් සහ විගණිත ආයතන ප්‍රධානීන් විසින් සිදු කරන ලද ඉල්ලීම් ද, ජාතික හා කාලීන වැදගත්කම පිළිබඳ අවධානය යොමු කර මාධ්‍ය හෙළිදරව් කිරීම් හෝ මහජන නියෝජනයන් ආදී කරුණු ද සැලකිල්ලට ගෙන මා වෙත පැවරී ඇති අභිමතානුසාරී බලතල මත විශේෂ විගණන වාර්තා සඳහා විෂයයන් තීරණය කරනු ලැබේ.

පහත විස්තර දැක්වෙන පරිදි විශේෂ වාර්තා 06 ක් 2022 වර්ෂය තුලදී නිකුත් කරන ලද අතර එම සියලුම විශේෂ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර මෙම වාර්තා පිළිබඳ උනන්දුවන පාර්ශවයන්ගේ පරිශීලනය සඳහා ජාතික විගණන පනතේ 13 වගන්තිය පරිදි ජාතික විගණන කාර්යාල වෙබ් අඩවියෙහි එම වාර්තාවන් ත්‍රෛභාෂාවෙන් පල කිරීමට ද කටයුතු කර ඇත.

2022 වර්ෂයෙහි නිකුත් කළ එකිනෙක විශේෂ විගණන වාර්තා නිකුත් කිරීමට පසුබිම් වූ කරුණු සහ එම එකිනෙක වාර්තාවන්හි ඇතුලත් සාරාංශයන් පහත දැක්වේ.

### මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ගෝලීය ආශ්චර්යය බවට පත්කිරීම දැක්ම ලෙස හඳුනා ගනිමින් 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත යටතේ “මධ්‍යම සංස්කෘතික අරමුදල” පිහිටුවා ඇත. මෙම අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පාලක මණ්ඩලයකට පැවරී ඇති අතර සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයභාර මාත්‍යාංශයේ ලේකම්වරයා අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. මෙලෙස පාලනය වන මෙම අරමුදලෙහි ප්‍රධාන අදායම් මාර්ගය ලෙස සංස්කෘතික උරුම ස්ථාන නරඹන දේශීය විදේශීය සංචාරකයින් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමෙන් ලබන ආදායම හඳුනාගත හැකි අතර එම ආදායම අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කොතෙක් දුරට ඵලදායී ලෙස මෙහෙයවා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා මෙම වාර්තාව නිකුත් කරන ලදි. ඒ අනුව කරන ලද පරීක්ෂාවන්ට අනුව මෙම අරමුදල පාලනය

කිරීම සඳහා බලතල ඇති පාලක මණ්ඩලය කාලීනව රැස්ව නොතිබුණු අතර පාලක මණ්ඩලය නියමිත වූ සංයුතියට අනුව සකස්වී නොතිබුණු බවද නිරීක්ෂණය විය. තවද, මෙම අරමුදල විසින් පනතෙහි ඇතැම් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විධිමත් රීති මාලාවක් සකස්කර නොතිබුණු අතර මෙම විගණන පරීක්ෂාවට ලක්කල 2015 -2019 අතර කාලය තුල අරමුදලෙහි සමස්ථ වියදමෙන් සියයට 38-58 අතර පරාසයක් සේවක නඩත්තුව වෙනුවෙන් දරන විට ඊට සාපේක්ෂව අරමුදලේ ප්‍රධාන අරමුණු ඉටුකරගැනීම සඳහා දරන ලද වියදම අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. තවද, සංස්කෘතික හා ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් මුදල් පරිත්‍යාග කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාවට නැංවීමට පාලක මණ්ඩලය අපොහොසත් වී තිබුණු බවටත්, ඉහත සඳහන් පනත ප්‍රකාරව ආදායම් රැස්කිරීමට බලතල ලැබී නොමැති සංස්කෘතික ත්‍රිකෝණයෙන් බැහැර ආගමික හා සංස්කෘතික වැදගත්කමකින් යුතු ස්ථානයන්ට පැමිණෙන සංචාරකයින්ට ද ප්‍රවේශපත්‍ර නිකුත් කර 2016 වර්ෂයේ සිට 2019 ජුනි මාසය වන විට රු.මිලියන 13,552 ක් පමණ ආදායමක් ඉපයීමට අරමුදල කටයුතු කර තිබුණි.

තවද, අරමුදල සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සිදුකරන ලද බඳවා ගැනීම්, බඳවා ගැනීමේ කාර්ය මණ්ඩල සංයුතියේ නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් ඇතුළුව සේවක කළමනාකරණය තුළ සැලකිය යුතු මට්ටමේ ගැටළු පවතින බවත් නිරීක්ෂණය විය. තවද අරමුදලෙහි විවිධ ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීමේ දී අදාල ව්‍යාපෘතින් තෝරා ගැනීමේ නිර්නායක, ප්‍රතිපාදනයේ වටිනාකම තීරණය කිරීමේ අධිකාරි බලය පිළබඳවද නිශ්චිත භාවයක් නිරීක්ෂණය නොවීය. ඉහත සඳහන් කර ඇති නිරීක්ෂණ ඇතුළුව මෙම වාර්තාවෙන් අනාවරණය කරනු ලබන කරුණු අනුව මෙම අරමුදල ප්‍රශස්ත හා ඵලදායී ලෙස මෙහෙයවීමට අවශ්‍ය විධිවිධාන කඩිනමින් ගැනීමේ අවශ්‍යතාවය මෙම වාර්තාවෙන් අවධාරණය කෙරේ.

**සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව**

2020 ඔක්තෝබර් මාසයේ දී රජය විසින් සීනි කිලෝ ග්‍රෑම් 1 ක් සඳහා පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමට පියවර ගන්නා ලදි. එලෙස බදු අඩු කිරීම හේතුවෙන් රජයට ලබා ගත හැකිව තිබූ රු. මිලියන 16,763 ක පමණ බදු ආදායමක් 2021 පෙබරවාරි මාසය වන විට අහිමි වී තිබූ අතර පාරිභෝගිකයාටද රජය අපේක්ෂා කල ආකාරයට සහනයක් සැලසී නොතිබුණු බවට කරුණු සාකච්ඡා විය. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කරනු ලැබූ ඉල්ලීමකට ද අනුව මෙම වාර්තාව සකස් කරන ලදී..

ශ්‍රී ලංකාවේ සුදු හා රතු සීනි වල සාමාන්‍ය මාසික පාරිභෝජනයෙහි එකතුව මෙට්‍රික් ටොන් 50,000 ක් පමණ වන අතර වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ මාසික සීනි නිෂ්පාදනයෙහි සාමාන්‍යය මෙට්‍රික් ටොන් 4,359 කි. ඒ අනුව ශ්‍රී ලංකාවේ මාසික පරිභෝජනය සඳහා මෙට්‍රික් ටොන් 45,000 ක පමණ ඌණතාවයක් පවතින අතර එම ඌණතාවය ආනයනය තුළින් සපුරා ගැනීමට කටයුතු කරනු ලබයි.

1974 වර්ෂයේ දී සීනි මෙට්‍රික් ටොන් 46 ක් පමණක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවට සීනි ආනයනය කිරීම ආරම්භ කරන ලද අතර ක්‍රමයෙන් එම ප්‍රමාණය ඉහල ගොස් තිබුණු අතර 2020 වර්ෂය වන විට සාමාන්‍යයෙන් වර්ෂයකට මෙට්‍රික් ටොන් 596,000 ක පමණ ප්‍රමාණයක් ආනයනය කරනු ලබයි.

කෙසේ වුවද මෑත කාලීනව සීනි ආනයනය අධෛර්යමත් කිරීම හා රජයට ආදායමක් ඉපයීමේ අදහසින් රජය වරින් වර ආනයනික සීනි මත බදු පනවන ලදි. ඒ අනුව 2020 වර්ෂය වන විට සීනි කිලෝ ග්‍රෑම් 1 ක් මත රු.50 ක බද්දක් පනවා තිබුණි. නමුත් ජනතාවට ජීවන සහනයක් ලබා දීමේ අරමුණින් රජය විසින් 2020 ඔක්තෝබර් 14 දින එම බදු ප්‍රමාණය ශත 25 දක්වා අඩු කර තිබුණි.

කෙසේ වුවද පෞද්ගලික අංශය විසින් පමණක් ලංකාවට සීනි ආනයනය කරනු ලබන අතර රාජ්‍ය අංශය වෙනුවෙන් සීනි අලෙවිය ලංකා සතොස ආයතනය විසින් සිදු කරනු ලබයි. එහිදී බදු අඩු කිරීමෙන් පසු ලංකා සතොස ආයතනය වරින් වර පෞද්ගලික අංශයේ ආනයනකරුවන්ගෙන් සීනි මිලදී ගෙන අලෙවි කිරීමේ දී 2020 ඔක්තෝබර් 14 (බදු අඩු කල දිනය) දින සිට 2021 පෙබරවාරි 08 (පාලන මිල ඉවත් කල දිනය) රු. මිලියන 102 ක පමණ අලාභයක් ලංකා සතොස ආයතනයට සිදු වී තිබුණි.

තවද සීනි ආනයනය සීමා කිරීමේ අරමුණින් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දී තිබුණද එම ක්‍රමවේදය ද නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය වී තිබුණි. පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් වරින් වර සීනි සඳහා පාලන මිල නියම කල ද ඒ තුළින් රටතුල සීනි මිලෙහි පාලනයක් අපේක්ෂිත පරිදි සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද සීනි සඳහා පනවා තිබුණු බදු අඩු කිරීමෙන් රජය අපේක්ෂා කරන ලද පාරිභෝගිකයන්ට සහන සැලසීමේ අරමුණු යටපත් වී ආනයනකරුවන් සහ වෙළෙඳුන් ඇතුළු වෙළෙඳ ප්‍රජාවට වැඩි ආර්ථික වාසියක් ලබා ගැනීමේ අවස්ථාවක් උදාකර ගෙන තිබුණි.අදාල ආනයනකරුවන් අතරින් පිරමිඩ විල්මා ආයතනයෙහි සීනි ආනයනය 2020 ඔක්තෝබර් සිට 2021 පෙබරවාරි දක්වා කාල පරිච්ඡේදයේ දී පමණක් සියයට 1,222 කින් ඉහළ ගොස් තිබුණි.

කෙසේ වුවද, සියළු කරුණු සලකා බැලීමේ දී මෙලෙස බදු අඩු කිරීම තුළින් ශ්‍රී ලංකා රජය රු.මිලියන 16,708 ක පමණ ආදායමක් සමාලෝචිත කාලය තුලදී කැපකර තිබුණ ද එම වාසිය ප්‍රමාණාත්මකව පාරිභෝගිකයා වෙත විතැන් වී නොමැති බව විගණනයේදී හඳුනා ගැනීමට හැකි විය.

ඒ අනුව සීනි සඳහා වූ බද්ද අඩු කිරීමට සාපේක්ෂව එම වාසිය පාරිභෝගිකයන් වෙත විතැන් නොකර තමන් අත රඳවාගත් පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන ඉදිරියේදී හෝ එම ආර්ථික වාසිය ජනතාවට විතැන් කිරීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමට හෝ එසේ නොමැතිනම් රජය කැප කළ බදු ආදායම තම අත රඳවාගත් පාර්ශවයන්ගෙන් නැවත රජයට ලබාගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසු යැයි නිර්දේශ කෙරේ.

## ශ්‍රී ලංකාවේ මූල්‍ය කළමණාකරනය සහ රාජ්‍ය ණය පාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව 2018 -2022

රජය විසින් ලබා ගන්නා දේශීය හා විදේශීය ණයවල අවශ්‍යතාවය, ණය ගැනීමේ මූලාශ්‍ර, ණය වාර්තාකරණය, ණය සේවාකරණය, මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ සඳහන් පරමාර්ථ අතුරින් රජයේ ණය කළමනාකරණයට වැදගත් යැයි සැලකිය හැකි පරමාර්ථයන් ඉටුකර ගැනීම පිළිබඳව හා රාජ්‍ය ණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය සහ ආශ්‍රිත කරුණු පිළිබඳව සිදු කළ විශේෂ විගණන පරීක්ෂාවට අදාලව මෙම වාර්තාව නිකුත් කරන ලදී. මෙම වාර්තාවට පූර්වයෙන් 2018 හා 2019 වර්ෂයන් වලදී ද රජයේ ණය සම්බන්ධයෙන් විශේෂ විගණන වාර්තා දෙකක් ද නිකුත් කරන ලදී. තවද ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික වාර්තා හා රජයේ මූල්‍ය ප්‍රකාශන මත නිකුත් කරනු ලබන විගණකාධිපති වාර්තා මඟින් ද වාර්ෂිකව රාජ්‍ය ණය කළමණාකරනය පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවලට අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 12,030.5 ක් වූ ශ්‍රී ලංකාවේ රජයේ ණය (Government Debt) වටිනාකම 2019 දෙසැම්බර් 31, 2020 දෙසැම්බර් 31 හා 2021 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.බිලියන 13,031.5 ක් රු.බිලියන15,117.2 ක් හා රු.බිලියන 17,589.3 ක් ලෙස ක්‍රමිකව වර්ධනය වී තිබුණි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2018 දෙසැම්බර් 31 දිනට සියයට 84.2 ක් වූ තිබූ රජයේ ණය ප්‍රතිශතය 2019, 2020 හා 2021 වර්ෂයන්හි දී දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 86.8 ක් , 100.6 ක් හා 104.6 ක් ද දක්වා වර්ධනය වී තිබුණි.2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දේශීය හා විදේශීය ණය සංයුතිය වර්ෂ අවසානයට වගුව 20 හි දැක්වේ.

රු.මිලියන

| වර්ෂය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| **විදේශීය ණය** | | | | | |
| ව්‍යාපෘති ණය | 2,610,547 | 3,149,905 | 3,231,464 | 3,458,461 | 3,764,319 |
| ජාත්‍යන්තර ස් ත්‍රේ බැඳුම්කරය | 1,475,049 | 2,220,411 | 2,531,493 | 2,203,279 | 2,243,049 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරය | - | - | 943 | 4,986 | 4,875 |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 322,611 | 158,823 | 104,021 | 6,874 | 1,914 |
| වෙනත් | 310,411 | 430,408 | 333,362 | 378,579 | 477,993 |
| මුළු විදේශීය ණය | 4,718,618 | 5,959,547 | 6,201,283 | 6,052,179 | 6,492,150 |
| **දේශීය ණය** | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 3,892,408 | 4,197,323 | 4,606,232 | 5,713,300 | 6,966,218 |
| භාණ්ඩාගාර බිල්පත් | 697,154 | 746,887 | 873,943 | 1,620,705 | 2,270,508 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරය | 637,886 | 614,219 | 559,284 | 486,870 | 455,203 |
| ජාත්‍යන්තර ස් ත්‍රේ බැඳුම්කරය | - | - | 202,099 | 415,756 | 372,612 |
| මහ බැංකු අත්තිකාරම් | 199,801 | 198,633 | 236,609 | 153,079 | 150,129 |
| රූපියල් ණය | 24,088 | 24,088 | 24,088 | 24,088 | 24,088 |
| වෙනත් | 212,878 | 289,851 | 328,006 | 651,269 | 858,466 |
| මුළු දේශීය ණය | 5,664,215 | 6,071,001 | 6,830,261 | 9,065,067 | 11,097,224 |
| **මුළු ණය** | **10,382,833** | **12,030,548** | **13,031,544** | **15,117,246** | **17,589,374** |
| විනිමය අනුපාතය (වර්ෂය අවසානයට) ඇ.ඩො. 1 ක් | 152.8548 | 182.7499 | 181.6340 | 186.4082 | 200.4338 |
| **මුළු ණය (ඇමෙරිකානු ඩොලර් මිලියන)** | **67,926.12** | **65,830.67** | **71,746.17** | **81,097.54** | **87,756.53** |

මූලය- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව-2021

වගුව 20 - 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දේශීය හා විදේශීය ණය සංයුතිය වර්ෂ අවසානයට

2019, 2020 හා 2021 වර්ෂයන් අවසානයට විදේශීය මුදලින් නාමනය කරන ලද මුළු ණයවල වටිනාකම පිළිවෙළින් ඇ.ඩො.මිලියන 38,687.14 ක් , ඇ.ඩො මිලියන 38,492.4 ක් හා ඇ.ඩො. මිලියන 37,204.8 ක් විය.

තවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි වාර්ෂික වාර්තාවට අනුව රාජ්‍ය ණය ලෙස (Public Debt) රාජ්‍ය ව්‍යවසායයන් විසින් ලද විදේශ ව්‍යාපෘති ණය හා රජයේ ඇපකර මත ලබා ගෙන ඇති ණය ද ඇතුලත්ව 2018,2019,2020 හා 2021 වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් රු. බිලියන 13,178.4 ක්, 14,155.3 ක්, 16,427.1 ක් හා 19,407.2 ක් විය.

ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2019 වර්ෂය අවසානයේ පටන් ණය තිරසරභාවය පදනම්ව ක්‍රමයෙන් ශ්‍රේණිගත කිරීම් පහළ හෙළීම හා ඒ සම්බන්ධයෙන් දක්වන ලද හේතූන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්වූ බව හෝ ඒ තත්ත්වයන් සමනය කිරීම සඳහා ප්‍රමාණවත් හා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය නොවීය.

ජාතන්තර මූල්‍ය අරමුදල මඟින් 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවට අනුමත කරන ලද ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5 ක විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 164 ක වාරිකයක් (SDR මිලියන 118.5) ලබාදීමට අදාලව 2019 නොවැම්බර් මස නිකුත් කරන ලද සමාලෝචන වාර්තාව අනුව, ශ්‍රී ලංකාවේ බාහිර ණය තිරසාර බව දක්වා ඇති අතර නව අයවැය රීති රාමුවකින් හා ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත ආයතනයක් ස්ථාපිත කිරීම හරහා රාජ්‍ය ණය තිරසරභාවය ඉහළ නංවා ගත හැකි බව දක්වා ඇත. 2020 වර්ෂයේදී විශේෂයෙන්ම බදු පදනම පුළුල් කිරීම හා අනුකූලතාවය වැඩිදියුණු කිරීම මඟින් ආදායම් එකතු කළ හැකි බව දක්වා ඇත.

කෙසේ වෙතත්, 2019 වර්ෂය අවසානයේ සිදු කළ බදු සංශෝධන කිරීම් ඉහත සමාලෝචන වර්තාවේ නිර්දේශ වලට පරස්පර බවත් එමඟින් විස්තීර්ණ ණය පහසුකම් ලබාදීමට අදාලව 2016 වර්ෂයේදී එකඟ වූ අවයැය ප්‍රතිපත්ති හා ගෙවුම් තුලන සම්බන්ධ පරමාර්ථ ඉටුකර ගැනීම අභියෝගයක් වී තිබුණි.

රජයේ ණය ප්‍රමාණය සහ මධ්‍ය වාර්ෂික ජනගහනය අනුව ඒක පුද්ගල ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වී ඇති අතර 2010 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය අවසාන වන විටඑය සියයට 257 කින් වර්ධනය වී රු. 793,888 ක් වී තිබුණි. තවද රාජ්‍ය ණය සහ බැරකම් සඳහා පිළිගත් නිර්වචනයන් මුදල් නීති පනතෙහි 113 වගන්තියෙන්හෝ 2003 අංක 03 දරන මූල්‍ය (කළමනාකරණ වගකීම) පනතෙහි සඳහන් කර නොමැති හෙයින් දළ දේශීය නිෂ්පාදනයට ණය අනුපාතය ලෙස ගණනය කර ඇති අගයද 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතෙන් අපේක්ෂිත අනුපාතයද යන්න නිශ්චය නොවේ.

ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා මහා භාණ්ඩාගාරයට පැවරී ඇති වගකීම පිළිබඳව වූ විෂය පථය නිශ්චිතව ලිඛිත නීතියක් මඟින් පැහැදිලිව හඳුනාගෙන නොතිබුණු අතර කිසියම් අවස්ථාවකදී රටෙහි පවතින නිවැරදි සමස්ථ ණය ශේෂය හා එය සෑදී ඇති ආකාරය හඳුනා ගැනීම සඳහා විධිමත් වූ ක්‍රමවේද නොතිබුණි. 2017 -2021 වර්ෂයන්වල විසර්ජන කෙටුම්පත දෙවනවර කියවීමට යෙදී ඇති දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයන්හි සඳහන් රාජ්‍ය මූල්‍ය සම්බන්ධ රජයේ ප්‍රමුඛතාවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ළඟාකර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. මූල්‍ය වර්ෂය තුල උපලබ්ධි වූ ණය ශේෂයන් නිවැරදිව ණය ලෙස ගිණුම්ගත නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර විශේෂයෙන්ම හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ලබා ගත් ණය මුදල රජයේ හෝ වරාය අධිකාරියේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් නිරූපනය වී නොතිබුණි. මේ අනුව රජයේ සමස්ථ ණය නිවැරදිව වාර්තා කිරීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති හෙයින් එවැනි ක්‍රමවේදයක් හඳුන්වාදීමේ අවශ්‍යතාවය අවධාරණය කරමි.

විදේශ ණය තුළ ඇතුලත් ව්‍යාපෘති ණය ආපසු ගෙවීම සඳහා වූ පුරෝකථන සැලැස්මක් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතුව තිබුණද එම සැලැස්මට අනුව මනා කළමනාකරණයකින් විදේශ විනිමය උපයා ගැනීමට/ කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද, ශ්‍රී ලංකාවට විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරගන්නා තෙක්, බැලපෑම්ගත ණය (Affected Debt) සේවාකරණය අත්හිටුවීමට සිදුව තිබුණි.

තවද 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය සංයුතිය රටවල් / ආයතන අනුව වගුව 21 හි පරිදි වේ.

(රු.මිලියන)

| රට/ ආයතනය | 2021 | | | | | 2020 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති ණය | ව්‍යාපෘති නොවන ණය | | | එකතුව | ව්‍යාපෘති ණය | ව්‍යාපෘති නොවන ණය | | | එකතුව |
| | | භාණ්ඩ ණය | වෙනත් ණය | එකතුව | | | භාණ්ඩ ණය | වෙනත් ණය | එකතුව | |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,051,994 | - | 425 | **425** | **1,052,419** | 864,407 | - | 1,049 | **1,049** | **865,456** |
| ඕස්ට්‍රේලියාව | 5,002 | - | - | **-** | **5,002** | 7,017 | - | - | **-** | **7,017** |
| ඕස්ට්‍රියාව | 21,969 | - | - | **-** | **21,969** | 21,560 | - | - | **-** | **21,560** |
| කැනඩාව | 3,209 | 1,003 | - | **1,003** | **4,212** | 3,385 | 1,117 | - | **1,117** | **4,502** |
| චීනය | 710,336 | - | 210,068 | **210,068** | **920,404** | 628,805 | - | 305,535 | **305,535** | **934,340** |
| යුරෝපීය ආයෝජන බැංකුව | 23,913 | - | - | **-** | **23,913** | 26,810 | - | - | **-** | **26,810** |
| පින්ලන්තය | - | - | - | **-** | **-** | 262 | - | - | **-** | **262** |
| පංගය | 81,661 | - | - | **-** | **81,661** | 80,020 | - | - | **-** | **80,020** |
| ජර්මනිය | 36,992 | 4,365 | 385 | **4,750** | **41,742** | 39,848 | 4,825 | 418 | **5,243** | **45,091** |
| හොංකොං | 25,290 | - | - | **-** | **25,290** | 22,454 | - | - | **-** | **22,454** |
| ඉන්දියාව | 158,136 | 7,746 | - | **7,746** | **165,882** | 145,156 | 9,356 | - | **9,356** | **154,512** |
| පකිස්තානය | - | 423 | - | **423** | **423** | - | 1,113 | - | **1,113** | **1,113** |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 616,323 | - | - | **-** | **616,323** | 568,784 | - | - | **-** | **568,784** |
| ජපානය | 621,587 | - | - | **-** | **621,587** | 659,260 | - | - | **-** | **659,260** |
| කොරියාව | 66,624 | - | - | **-** | **66,624** | 68,771 | - | - | **-** | **68,771** |
| කුවේටය | 17,947 | - | - | **-** | **17,947** | 14,866 | - | - | **-** | **14,866** |
| නෙදර්ලන්තය | 43,352 | - | - | **-** | **43,352** | 48,178 | - | - | **-** | **48,178** |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 24,265 | - | - | **-** | **24,265** | 21,686 | - | - | **-** | **21,686** |
| සෞදි අරාබි අරමුදල | 26,781 | - | - | **-** | **26,781** | 24,085 | - | - | **-** | **24,085** |
| ස්පාඤ්ඤය | 20,544 | - | - | **-** | **20,544** | 21,448 | - | - | **-** | **21,448** |
| ස්විඩනය | 6,952 | - | - | **-** | **6,952** | 9,457 | - | - | **-** | **9,457** |
| එකසත් රාජධානිය | 39,640 | - | - | **-** | **39,640** | 46,276 | - | - | **-** | **46,276** |
| අදමරිකා එක්සත් ජනපදය | 15,541 | - | 11,904 | **11,904** | **27,445** | 17,525 | - | 13,409 | **13,409** | **30,934** |
| වෙනත් | 146,262 | - | 2,491,514 | **2,491,514** | **2,637,776** | 118,402 | - | 2,256,896 | **2,256,896** | **2,375,298** |
| **එකතුව** | **3,764,320** | **13,537** | **2,714,296** | **2,727,833** | **6,492,153** | **3,458,462** | **16,411** | **2,577,307** | **2,593,718** | **6,052,180** |

මූලය - ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තාව , 2021

වගුව 21 - 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය සංයුතිය රටවල් / ආයතන අනුව

මේ අනුව, 2021 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව, චීනය, ජපානය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය ශ්‍රී ලංකාව ණය ලබාගෙන ඇති ප්‍රධාන රටවල්/ ආයතන වේ.

2020 වසරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 7,103.93 ක්වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2021 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 5,491.46 දක්වා අඩුවී තිබුණි. තවද මහබැංකුවේ දෛනික විනිමය අනුපාතය අනුව, 2021 සැප්තැම්බර් 07 සිට 2022 මාර්තු 07 දක්වා එක්සත් ජනපද ඩොරලය සඳහා වන විනිමය අනුපාතය ස්ථාවර අගයකින්(රු.202.9992) පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු තර තිබුණු අතර ඒ හේතුවෙන් ද එම කාලපරිච්ඡේදය තුළ විදේශ ප්‍රේෂණ විශාල ලෙස අඩු වී තිබුණි. තවද 2021 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා මාස 7 සඳහා ලද එ.ජ.ඩො. මිලියන 3,548.9 ට සාපේක්ෂව 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා මාස 7 සඳහා එ.ජ.ඩො. මිලියන 2,049.7 ක් පමණක් ලැබී තිබුණි. මෙම කරුණු ද බලපෑම හේතුවෙන් 2018 අප්‍රේල් මාසය වන විට ඇමරිකානු ඩොලර් මිලියන 9,936 කට පැවති ශ්‍රී ලංකාවේ දළ නිල සංචිතවල (විදේශ සංචිත) වටිනාකම 2022 මාර්තු මස වන විට ඇමරිකානු ඩොලර් මිලියන 2,000 කටත් වඩා පහල අගයක් ගෙන තිබුණි.

මුදල් නීති පනතේ 66(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රුපියල ජාත්‍යන්තරව ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා මහ බැංකුවේ වත්කම් මඟින් ජාත්‍යන්තර ගෙවුම් ශේෂයේ අපේක්ෂා

කළ හැකි හිඟයක් සපුරාලීමට ප්‍රමාණවත් ජාත්‍යන්තර සංචිතයක් පවත්වා ගැනීමට උත්සාහ කළ යුතු ය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවස්ථා දෙකකදී ජාත්‍යන්තර ස්වෛරිත්ව බැඳුම්කර නිදහස් කිරීම සඳහා එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 1,500 ක් වටිනා විදේශ සංචිත යොදාගෙන තිබුණි.

තවද 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි අනාගත බදු අනුප්‍රමාණ යුක්ති සහගත ස්ථායිත්ව මට්ටම්වල සහ කල්තබා දැකිය හැකි මට්ටම්වලට අනුකූල වන සේ වියදම් හා බදු අය කිරීමට අදාල ප්‍රතිපත්ති යොදාගැනීම නමැති ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කල යුතු වුවත් 2019 වර්ෂයේ රු.බිලියන 1,038 ක් වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුව 2020 වර්ෂය වන විට රු.බිලියන 575 දක්වා සංශෝධනය කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.බිලියන 463 කින් ද 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.බිලියන 612 ක් වීම හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම රු.බිලියන 426 කින් අඩු වී තිබුණි. තවද, 2019 වර්ෂයේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රැස්කල තත්‍ය බදු ආදායම රු.බිලියන 1,025 ක් වුවද එයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී තත්‍ය බදු ආදායම රු.බිලියන 523 ක් වීම හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ තත්‍ය බදු ආදායම රු.බිලියන 502 කින් අඩු වී තිබුණි. එසේම, 2021 වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට අනුව, එම දෙපාර්තමේන්තුව එකතු කළ තත්‍ය බදු ආදායම රු.බිලියන 623 ක් වීම හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව රු.බිලියන 402 කින් පහළ ගොස් තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 වර්ෂයේ මුළු බදු ආදායම රු. බිලියන 1,670 ක් වූ අතර 2018, 2019, 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.බිලියන1,712 ක්, රු.බිලියන1,734 ක්, රු.බිලියන 1,216 ක් හා රු.බිලියන 1,298 ක් විය.

ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය ආදායම (ප්‍රදාන සහිතව) දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2006 වර්ෂයේදී සියයට 17.3 ක් වූ අතර 2010 වර්ෂය වන විට එය සියයට 13 ක් ද 2015 දී සියයට 13.3 ක් ද 2018 දී සියයට 13.5 ක් ද 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් සියයට 9.1 ක් හා 8.7 වශයෙන් ද වාර්තා විය.තවද ශ්‍රී ලංකාවේ මුළු බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2010 වර්ෂයේ දී සියයට 11.3 ක් වූ අතර එය 2015 වර්ෂයේ දී සියයට 12.4 ක්ද 2021 වර්ෂයේ දී සියයට 7.7 ක් ද විය.මෙම ආදායම් අඩුවීම ද හේතුකොට ගෙන අයවැය හිඟය 2015 වර්ෂයේ පැවති සියයට 7.6 සිට 2021 වර්ෂය වන විට සියයට 12.2 දක්වා වැඩිවී තිබුණි.

2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරාසය තුළ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබුණද 2015 වර්ෂයේ සිට එය ගිණුම්ගත කිරීම ආරම්භ කර තිබුණි. 2015 වර්ෂයේ සිට රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශවල කර තිබුණු භෞතික වත්කම්

ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස සටහන් කර තිබූ එකතුව රු.බිලියන 8,199 ක් වටිනාකමින් රු.බිලියන 5,530 ක් හෙවත් සියයට 67 ක් වටිනා වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අපොහොසත් වී තිබුණි.

ඒ අනුව රාජ්‍ය ණය සම්බන්ධව පවතින ජාත්‍යන්තරව පිළිගත් නිර්වචනයන් සලකා බලමින් වඩාත් නිවැරදි ආකාරයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ගණයට කුමන අයිතම ඇතුලත් කර ගත යුතුද යන්න ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ අදාල පාර්ශවයන් ගේ නිර්දේශ මත පාර්ලිමේන්තුව මගින් නීතියෙන් නියම කල යුතු වීමත්, විසර්ජන පනත තුලින් සහ සක්‍රිය වගකීම් පනත තුලින් නියම කර ඇති උපරිම ණය සීමා තුල ණය ගැනීම් සිදු කළ යුතු වීමත්, ලබා ගන්නා ණය ප්‍රශස්ථ ලෙස කළමනාකරණය කර ගැනීමට කටයුතු කිරීමත්, විදේශ ණය සම්බන්ධව පවතින ප්‍රධාන අවදානමක් වන රුපියලේ අගය අඛණ්ඩව අවප්‍රමාණය වීම පාලනය කිරීම/විදේශ විනිමය අනුපාතය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා වන ක්‍රමෝපායන් සැළැසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමත් ණය වාර්තාකරණය විධිමත් කිරීම සඳහා කඩිනමින් කටයුතු කිරීමත්, රාජ්‍ය ණය ප්‍රශස්ථ මට්ටමින් අඩු පිරිවැයක් හා අවම අවධානමක් තුල ලබා ගැනීම හා කළමණාකරනය සහ ඊට සුවිශේෂ වූ ස්වාධීන ක්‍රමවේදයක් / ආයතනයක් පිහිටුවීමත්,රටට ගැලපෙන රාජ්‍ය ණය ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා එය නීතිගත කිරීමත්,ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන කරනු ලබන නිරීක්ෂණ පිළිබඳව කාලීනව ප්‍රතිචාර දැක්වීම අතුළුව මෙම වාර්තාවෙන් දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු කරවමි.

## කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000 ක ප්‍රසම්පාදනය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව

ශ්‍රී ලංකාව වසර ගණනාවක සිට ආනයනික රසායනික පොහොර භාවිතයෙන් ගොවිතැන් කටයුතු සිදු කළ අතර 2021 මැයි මාසයේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි රසායනික පොහොර ආනයනය මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කළ අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් තහනම් කරන ලදී. එමගින් 2019 වර්ෂයේදී රසායනික පොහොර ආනයනය සඳහා දරන ලද ඇ.ඩො.මි.221 ක් තරම් වූ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරිකර ගැනීමට හා ගොවියා කාබනික පොහොර භාවිතයට යොමු කර වීම තුළින් සෞඛ්‍ය ආරක්ෂිත ආහාර රටාවක් සඳහා හුරුකිරීමට සැලසුම් කර තිබුණි.

2021/2022 මහ කන්නයේ සිට කාබනික පොහොර පමණක් භාවිතා කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සැලසුම් කර තිබුණු අතර මහකන්නයට ප්‍රමාණවත් තරම් කාබනික පොහොර රට තුළ නොමැති වීම හේතුවෙන් හෙක්ටයාර් 500,000 ක වී වගාවකට අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණය ආනයනය කළ යුතු බවට කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර කාබනික පොහොර ආනයනය සඳහා 2021 ජුනි 08 දිනැති අංක අමප/21/0964/323/030

දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. ඒ අනුව කඩිනම් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් හා කාලරාමුවක් අනුගමනය කරමින් කාබනික පොහොර ආනයනය සඳහා චීනයේ සීමාසහිත කින්ඩාඕ සිවින් බයෝටෙක් සමූහ සමාගම, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ටෙන්ඩර් මණ්ඩලයක් විසින් තෝරාගෙන තිබුණු අතර එම සමාගමේ පොහොර සාම්පල් පරීක්ෂා කිරීමේදී පොහොර සාම්පල් ජීවාණුහරණය කර නොමැති බවත් අර්වීනියා (Erwinia) සහ බැසිලස් (Bacillus) යන අහිතකර බැක්ටීරියා ඇතුළත් බවත් ජාතික ශාක නිරෝධායන සේවය නිරීක්ෂණය කර තිබුණි. එවැනි තත්ත්වයක් මත ආනයනය සඳහා අවශ්‍ය නිරෝධායන සහතික ලබා ගැනීමේ ගැටලු මතු වීම හේතුවෙන් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සාමාජිකයින්ගෙන් යුත් විශේෂ කාර්යය කමිටුවක් ලබා දුන් නිර්දේශ මත අදාළ පොහොර තොග සඳහා ණයවර ලිපි විවෘත කිරීමට රාජ්‍ය පොහොර සමාගම් දෙක වන සීමා සහිත ලංකා පොහොර සමාගම හා සීමා සහිත කොමර්ෂල් පොහොර සමාගම විසින් කටයුතු කර ඇති අතර 2021 සැප්තැම්බර් 23 වන දින අදාළ සැපයුම්කාර සමාගම චීනයේ කින්ඩාඕ වරායේ සිට කොළඹ වරාය දක්වා පොහොර මෙ.ටො.20,550 එවූ බව නාවික උපදෙස් පත්‍රය (Shipping Advice) මඟින් දැනුම් දී තිබුණි. උක්ත පොහොර තොගය රැගත් Hippo Spirit නෞකාව ශ්‍රී ලංකා වරාය ආසන්නයට පැමිණි නමුත් ශාක නිරෝධායන පනතට අනුව ජීවාණුහරණය නොකළ කාබනික පොහොර තොගයක් ලංකාවේ ගොඩබෑමට නොහැකි වීම හේතුවෙන් මතභේදාත්මක තත්ත්වයක් නිර්මාණය වී තිබුණි. පසුව මෙම පොහොර නෞකාවෙහි ඇති පොහොර භාර ගැනීම හා ඒවාට ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කරමින් අදාළ ආනයනික රාජ්‍ය සමාගම් දෙක වන සීමාසහිත ලංකා පොහොර සමාගම හා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් කොළඹ වාණිජ මහ අධිකරණයේ අංක CHC213/2021MR හා CHC214/2021MR යන නඩු ගොනු කරමින් මහජන බැංකුවට එරෙහිව ගෙවීම් අත්හිටුවීමේ වාරණ නියෝගයක් ලබා ගන්නා ලදී. මතභේදාත්මක තත්ත්වය වර්ධනය වීම හේතුවෙන් නීතිපති උපදෙස් මත සමථයක් මඟින් විසඳා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අංක අමප/21/2161/323/030-IX දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව නැවෙහි අන්තර්ගත පොහොර තොගයේ පිරිවැයෙන් සියයට 75 ක් සඳහා ඇ.ඩො.මි. 6.9 කට සමාන වූ රු. මිලියන 1,382 ක අත්තිකාරමක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් 2022 ජනවාරි 07 දින එම මුදල ගෙවා එය ගිණුම්ගත කිරීම සඳහා 2022 මැයි 09 දින කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත වාර්තා කර තිබුණි. සමථ කොන්දේසි අනුව අපේක්ෂිත සංයුතියෙන් හා ප්‍රමිතියෙන් යුක්ත පොහොර නැවත සැපයිය යුතු බවටත් කොන්දේසි ඇතුළත් කරමින් උක්ත නඩු දෙක සමථ වී ඉල්ලා අස්කර ගෙන තිබුණි. එහෙත් මේ දක්වා අපේක්ෂිත ප්‍රමිතියෙන් යුත් පොහොර තොගයක් ලබා ගෙන නොතිබුණි. එමෙන්ම සමථ කොන්දේසි ප්‍රකාරව ණයවර ලිපියේ හා කාර්යසාධන

බැඳුම්කරයේ කාලය දීර්ඝ කර එය වලංගුව තබා ගතයුතු වුවත් 2022 මාර්තු 12 දින ණයවර ලිපිය හා 2022 මාර්තු 24 දින කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත් වී ඇත. එම නිසා නැවතත් අදාළ සමාගම විසින් ප්‍රමිතිගත පොහොර ලබා නොදීම තුළ ඒ සඳහා ගෙවූ මුදල් අය කර ගැනීමේ හැකියාව අහිමිවගොස් ඇත. මේ හේතුවෙන් පොහොර සඳහා ගෙවන ලද මුළු මුදලම රජයට සිදු වූ පාඩුවක් බවට පත්ව තිබේ.

අදාළ සුරක්ෂණයන් කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම හෝ සුරක්ෂණයන්ගේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීම හා අත්තිකාරම් ගෙවීමේ දී කිසිදු සුරක්ෂණයකින් තොරව අරමුදල් නිදහස් කිරීම හේතුවෙන් රජයට සිදුවූ පාඩුව මෙම ගනුදෙනුවට සම්බන්ධ වගකිව යුත්තන්ට එරෙහිව නඩු පවරා අය කර ගැනීමටත්, ගිවිසුමේ කොන්දේසි හා 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත අනුව ශ්‍රී ලංකාවට ආනයනය කළ නොහැකි, ජීවාණුහරණය නොකළ, මර්ධනය කිරීමට නිර්දේශිත කෘෂි රසායන වර්ගයක් නොමැති, ලංකාවේ ආර්ථික වටිනාකමක් ඇති බෝග වලට මෘදු කුණුවීම, අංගමාරය වැනි රෝග ඇතිකරන අර්වීනියා (Erwinia) හා බැසිලස් (Bacillus) නමැති විනාශකාරී බැක්ටීරියා සහිත පොහොර තොගයක්රට තුළට ඇතුළු කිරීමට උත්සහ කිරීම, 2020/2021 මහකන්නයේදී වී වගාවට අවශ්‍ය පොහොර ගිවිසුම් ප්‍රකාරව ලබා නොදී පාඩුවක් සිදු කිරීම, නොසැපයූ පොහොර තොගයක් වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 6.9 කට සමාන ශ්‍රී ලංකා රු.1,382,720,494 ක මුදලක් ලබා ගැනීම හා සමතය ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව නෛතිකව ක්‍රියාමාර්ග ගෙන වන්දියක් ලබා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ නීතිරීති ප්‍රකාරව හා ගිවිසුම්වලට අනුකූලව ක්‍රියා නොකළ උක්ත සැපයුම්කාර සමාගම ශ්‍රී ලංකාව තුළ අසාදු ලේඛනගත කිරීමටත් නිර්දේශ කෙරේ.

## නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022–2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව

නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය ශ්‍රී ලංකාවේ Base Load බලාගාරය ලෙස ක්‍රියාත්මක වන අතර ජාතික විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 30 ත් 40 ත් අතර දායකත්වයක් ලබා දෙනු ලබන අතර බලාගාරය ක්‍රියාත්මක කරවීම සඳහා වාර්ෂිකව ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් පමණ අවශ්‍ය වේ. 2021-2022 ප්‍රසම්පාදන කාලපරිච්ඡේදය අවසාන වන තෙක්ම වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවයෙන් සියයට 50 ක් දීර්ඝ කාලීන ප්‍රසම්පාදනය මඟින් සහ ඉතිරි සියයට 50 ක ප්‍රමාණය ක්ෂණික ප්‍රසම්පාදන මඟින් සපුරා ගෙන තිබුණි. ඒ අනුව 2021 - 2022 කාලපරිච්ඡේදය තුළ දී ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් මිලදී ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද දීර්ඝ කාලීන ප්‍රසම්පාදන ගිවිසුම **(Term Tender)** අනුව 2021-2022 වාරය තුළදී මෙට්‍රික් ටොන් මිලියන 1.125 ක් සපයා තිබූ අතර, මෙතෙක් සැපයුම් නොකළ ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.125 ක් නැව් තොග 19 ක් මඟින් **SWISS**

**SINGAPORE OVERSEAS ENTERPRISES PTE LTD** විසින් සැපයීමට නියමිතව තිබුණි. එසේම, 2021-2022 ප්‍රසම්පාදන වාරය තුළ **SUEK AG** සමාගම විසින් ක්ෂණික ප්‍රසම්පාදන **(Spot Tender)** අංක 05 (LCC/21/22/ST/28/5) යටතේ සැපයිය යුතු එහෙත් මෙතෙක් සැපයුම් නොකළ නැව් තොග 02 ක් ද 2022-2023 වාරය තුළදි සැපයීමට නියමිතව තිබුණු අතර, ඒ අනුව මුළු අවශ්‍යතාවය වූ නැව් තොග 38 න් තවදුරටත් නැව් තොග 17 ක් ප්‍රසම්පාදනය කළ යුතුව තිබුණි.

ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 4.5 ක් සඳහා වූ දිගුකාලීන ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 ජූලි 21 දින ආරම්භ කර තිබූ අතර එමගින් කාල පරිච්ඡේද තුනක් (වර්ෂ 03 ක්) එනම්, 2022-2023, 2023- 2024, 2024-2025 වාරයන් ආවරණය වන පරිදි පිළිවෙළින් ගල් අඟුරු මෙ. ටො. මිලියන 1.125 ක්, මෙ. ටො. මිලියන 2.25 ක් හා මෙ. ටො. මිලියන 1.125 ක් වශයෙන් ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණි.

මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 ජූලි 21 දින ආරම්භ කර 2022 අගෝස්තු 25 දින එනම් දින 35 ක් වැනි කෙටි කාලයක් තුළ Black Sand Commodities FZ-LLC සමාගම වෙත ටෙන්ඩරය පිරිනමා තිබුණි. එම සමාගම වෙත ප්‍රසම්පාදන ටෙන්ඩරය පිරිනැමීම සම්බන්ධයෙන් පරීක්ෂාවක් කර දෙන ලෙස ගරු කථානායකතුමා විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙත උපදෙස් ලබා දී තිබුණු අතර, ඒ අනුව 2022 සැප්තැම්බර් 08 දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ පැවති සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි මෙම වාර්තාව නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

SUEK AG විසින් තමන් වෙනුවට ඉදිරියේදී ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා තම අනුබද්ධිත සමාගමක් ලෙස හඳුන්වා දී ඇති Black Sand Commodities කටයුතු කරන බැවින් සිය ලියාපදිංචිය Black Sand Commodities ලෙස වෙනස් කිරීමට ඉල්ලා තිබුණි. එම ඉල්ලීමට ලිඛිත ප්‍රතිචාර දැක්වීමකින් තොරව SSCAPC විසින් ප්‍රබල සහ සංවේදී සංශෝධනයන් ලංසුලේඛණ වලට සිදු කිරීමට තීරණය කර තිබූණු අතර එම සංශෝධනයෙන් පසුව Black Sand Commodities සමාගමට මෙම ලංසුව ලබා ගැනීමේ අවස්ථාව ලබා දී තිබුණි.

තවද අදාල සංශෝධනයට අනුගත වන්නේ නම් Black Sand Commodities විසින් SUEK AG වෙනුවෙන් ලංසු ඉදිරිපත් කළ යුතු අතර, සපයනු ලබන ගල් අඟුරුවල ගුණත්වය ප්‍රමාණය සහ ගෙවීම් සම්බන්ධව සම්පූර්ණ සුරක්ෂණයක් ලියාපදිංචි සැපයුම්කරුවකු වන SUEK AG විසින් ලබා දිය යුතු වුවද Black Sand Commodities විසින් ඉදිරිපත් කරන ලද ලංසු ලේඛණවල SUEK AG වෙනුවෙන් Black Sand Commodities ලංසු ලේඛන ඉදිරිපත් කරනු ලබන බවට කිසිදු නීතියානුකූල ලේඛනයක්/ගිවිසුමක් ඉදිරිපත් වී නොතිබුණි. තවද, සපයනු ලබන ගල් අඟුරුවල ගුණත්වය, ප්‍රමාණය සහ ගෙවීම් සම්බන්ධ සම්පූර්ණ සුරක්ෂණය SUEK AG විසින් ලබා දෙන බවට

වූ නීත්‍යානුකූල ලේඛන/ ගිවිසුම් ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

අත්‍යවශ්‍ය සුදුසුකම් සපුරනු ලබන සැපයුම්කරුවන් ගල් අඟුරු ප්‍රසම්පාදන සඳහා ලියාපදිංචි කරනු ලබන අතර, ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් පමණක් ලංසු කැඳවීම සිදුකල යුතු වුවද Black Sand Commodities ගල් අඟුරු සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වූ සැපයුම්කරුවකු නොවන බැවින් ගල් අඟුරු සැපයීම සඳහා වන කිසිදු සුදුසුකමක් පරීක්ෂාවට ලක් වී නොතිබුණි. Black Sand Commodities සමාගම සංස්ථාපනය කිරීම සඳහා 2022 මැයි 31 දින IC Suek Ltd LLC (Russia) සමාගම විසින් යෝජනාවක් සම්මත කර 2022 ජුනි 01 දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංස්ථාපිත සමාගමක් ලෙස සංස්ථාපනය කර තිබුණි. ඒ අනුව එය ලියාපදිංචි සැපයුම්කරු වන SUEK AG යටතේ ලියාපදිංචි කල සමාගමක් නොවන බැවින් SUEK AG සහ Black Sand Commodities අතර සෘජු සම්බන්ධතාවයක් නොතිබුණු බව නිරීක්ෂණ විය. එසේ වුවද මෙම තත්ත්වය නොසලකා Black Sand Commodities සමාගම විසින් ඉදිරිපත් කල ලංසුව පිළිගෙන තිබුණු අතර ලියාපදිංචි සැපයුම්කරුවකුගේ සේවාව ලියාපදිංචි නොවූ සහ ලියාපදිංචි වීමට ප්‍රමාණවත් සුදුසුකම් රහිත සැපයුම්කරුවකු වෙත පැවරීමට එකඟවීමට හෙවත් අදාල සංශෝධනය සිදු කිරීමට පූර්වයෙන් එහි නෛතික තත්ත්වය පිළිබඳව නීතිපති වෙතින් උපදෙස් ලබාගෙන නොතිබුණි.

ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලු පාර්ශව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශවයන්ට එරෙහිව සුදුසු ඉදිරි පියවර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කිරීමත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පලපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුලු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිලිගත හැකි මට්ටමකට ලිහිල් කර තරගකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කරවීම මෙම වාර්තාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

තවද ලංසු ලේඛනයන්ට සංශෝධනයන් සිදු කිරීමේ දී අදාල තහවුරු කිරීම් සහ බැඳීම් වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන් ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කරගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදුකල යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛණයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වගබලා යුතු බවටත් ලංසු ලේඛණයන්ට ලංසු කැඳවීමෙන් පසු ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැලකී සිටිය යුතු බවට ඇතුළු නිර්දේශ කිහිපයක් මෙම වාර්තාවෙන් ලබා දීමට කටයුතු කර ඇත.

**ක්‍රියාත්මක වෙමින් පැවති සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (කොළඹ සිට මාලඹේ දක්වා) ශ්‍රී ලංකා රජය විසින් ඒකපාර්ශවිය අවසන් කිරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව**

කොළඹ අගනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය යෝජනා කර තිබුණු කරුණු මත පදනම්ව කොළඹ අගනගරයට වඩාත් උචිත දුම්රිය මාධ්‍ය ලෙස සැහැල්ලු දුම්රිය (LRT) පද්ධතිය හඳුනාගෙන තිබුණු අතර එහිදී හරිත , පීත, රක්ත, දම්, රෝස, ඔලිව් මාර්ගය සහ අලු මාර්ගය ලෙස RTS 1 සිට RTS 7 දක්වා ප්‍රදේශ කිහිපයක් ආවරණය කරමින් මාර්ග 7 ක් හඳුනාගෙන තිබුණි. එම මාර්ග 7 න් RTS 1 (හරිත මාර්ගය) සහ RTS 4 (දම් මාර්ගය) මාර්ග පළමුව ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා වූ අවබෝධතා ගිවිසුමට අනුව බොරැල්ල සිට මාලඹේ දක්වා වූ RTS 4 මාර්ගය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් RTS 1 මාර්ගය අනාගත ව්‍යාපෘතියක් ලෙස සැලකීමට තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම පැකේජ 7 ක් යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර මේ සඳහා මූල්‍ය පහසුකම් සහනදායී ණය කොන්දේසි යටතේ ලබා දීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟ වී තිබුණු අතර උපදේශණ සේවා සැපයීම ජපානයේ ඔරියන්ටල් කන්සල්ටන් ග්ලෝබල් සීමිත සමාගම තවත් සමාගම් කිහිපයක් සමඟ ඒකාබද්ධව සිදු කිරීමට එකඟ වී තිබුණි.

ජපන් අන්තර් ජාතික සහයෝගිතා ආයතනය විසින් එම ණය මුදල වර්ෂ 12 ක සහන කාලයක් ද ඇතුළුව වර්ෂ 40 ක කාලයක් තුලදී ගෙවීමට අවස්ථාව සලසා දී තිබුණු අතර ඒ සඳහා වාර්ෂික පොළි අනුපාතය සියයට 0.1 ක් විය. ඉහත පළමුව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිය පැකේජ 7 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර යෝජිත ණය මුදලින් ජපන් යෙන් මිලියන 30,040 ක් ඉහත සඳහන් පැකේජ 7 අතරින් හඳුනාගන්නා ලද පැකේජ 1 ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකරන ලද පිරිවැය ප්‍රතිලාභ විශ්ලේශණයට අනුව ආර්ථික අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය සියයට 20.18 ක් ලෙස හා ආර්ථික ශුද්ධ වර්තමාන අගය රුපියල් බිලියන 174.3 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව ආර්ථික අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය වට්ටම් අනුපාතය ඉක්මවා තිබීම හේතුවෙන් ජාතික ආර්ථිකය ට මෙය වාසිදායක ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබුණි.තවද ආර්ථික ප්‍රතිලාභ සියයට 10 කින් අඩු වූ විට,ආර්ථික පිරිවැය සියයට 10 කින් වැඩි වූ විට හා ඉහත අවස්ථා දෙකම එක්ව ගත් විට වැනි වඩාත් අවාසිදායක තත්ත්වයකදී වුවද මෙම ව්‍යාපෘතිය වාසිදායක බවට හඳුනාගෙන තිබුණි. අවස්ථා 4 ක් යටතේ කරන ලද මූලය විශ්ලේෂණයට අනුව 4 වන අවස්ථාව වඩා වාසිදායක අවස්ථාව ලෙස හඳුනාගෙන ඇති අතර එහි මූල්‍ය අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය(FIRR) සියයට 27 ක් වන අතර එය සියයට 8.87 ක් වූ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය ඉක්මවා ඇති බවට හඳුනාගෙන තිබුණු අතර මෙහි ශුද්ධ මුදල් ප්‍රවාහය රුපියල් මිලියන 50,185 ක් ගන්නා බවටද හඳුනාගෙන තිබුණි. තවද මෙම ව්‍යාපෘතියෙහි පාරිසරික බලපෑමද අවම මට්ටමක පවතින බව පරිසර බලපෑම් අධ්‍යන වාර්තාව අනුව ද තහවුරු කර තිබුණි.

තවද මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ණය මුදල අඩු පොළී අනුපාතයක් සහිත හා දිගුකාලීනව ආපසු ගෙවිය යුතු ණය මුදලක් හේතුවෙන් හා මෙම ව්‍යාපෘතිය මගින් පොදු ප්‍රවාහන සේවයේ ධාරිතාව ඉහළ නැංවීම සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරෙන බැවින් මහබැංකුවේ මුදල් මණ්ඩලයද මෙම ණය මුදල ලබාගැනීමට නිර්දේශ තිබුණි. කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශ සම්බන්ධ කරමින් එලදායි,කාර්යක්ෂම සහ වේගවත් දුම්රිය ප්‍රවාහන පද්ධතියක් තිබීම මහනගර සංවර්ධන සැලැස්මේ අත්‍යවශ්‍ය අංගයක් බව දක්වමින් මුදල් අමාත්‍යාංශයද නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි.තවද ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතියට අදාලව ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය මඟින් ආර්ථික සංවර්ධනය, ජනතාවගේ ජීවන තත්ත්වය තිරසාර ලෙස වර්ධනය වීම හා ජීවන තත්ත්වයේ ගුණාත්මක වර්ධනයක් ඇති වීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කර තිබුණි. ජාත්‍යන්තර ආයතනයක් විසින් සකස් කරන ලද මූල්‍ය හා ආර්ථික විශ්ලේෂණයට ද අනුව එලදායි බවට හඳුනා ගන්නා ලද මෙම ව්‍යාපෘතිය පිළිගත හැකි පදනමකින් තොරව එලදායි නොවන ව්‍යාපෘතියක් ලෙස සලකා අවලංගු කිරීම කුමන පදනමකින් සිදුකලේද යන්න තහවුරු වන ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

කොවිඩ් 19 වසංගත තත්ත්වයන් මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බැවින් ගිවිසුම අවසන් කරන බව ජපන් රජය වෙත දන්වා තිබූ අතර එය රාජ්‍යයන් අතර ගණුදෙනු වලදී පැවතිය යුතු අන්‍යොන්‍ය විශ්වාසය හා අවංකභාවය පලුදු වීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය විය. තවද මෙම ව්‍යාපෘතිය හෝ ණය ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් අදාල ආයතන අතර හෝ නිවැරදි අවබෝධයක් හා එකඟතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

කෙසේ වුවද සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කර අනතුරුව ශ්‍රී ලංකා රජය විසින් එවකට සිටි ගරු ජනාධිපතිතුමාගේ නියෝගය මත ව්‍යාපෘතිය ඒකපාර්ශවීයව අත්හිටුවීමට තීරණය කර තිබුණු අතර ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමක් හෝ එම ව්‍යාපෘතිය වෙනුවෙන් මේ වන විටත් වැය කර ඇති රුපියල් මිලියන 5,977 ක වියදම් වලින් අත්පත් කරගෙන ඇති ප්‍රතිඵලද උපයෝගි කර ගෙන මෙම ව්‍යාපෘතිය හෝ වෙනත් විකල්ප ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු නොකරන්නේ නම් මෙම වියදම ශ්‍රී ලංකා රජය සිදු කළ අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය. ඔරියන්ටල් කන්සල්ටන්ටස් ග්ලෝබල් කම්පැණි ලිමිටඩ් වන ප්‍රධාන උපදේශක සමාගම විසින් ඉල්ලුම් කරන ලද ලාභ අහිමිවීමේ වන්දිය රුපියල් මිලියන 5,169 ක හිමිකම් මුදල හෝ එම ඉල්ලීම වෙනුවෙන් ගෙවන ලද මුදල මෙන්ම ඉදිරියේ දී ගෙවීමට සිදුවිය හැකි වන්දි ප්‍රමාද පොළී හෝ වෙනයම් ඕනෑම ගෙවීමක් ශ්‍රී ලංකා රජයට නියත ලෙසම සිදුවන අනාර්ථික වියදමක් වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ගිවිසුම අවලංගු කිරීම සඳහා කරන ලද ඉල්ලීම ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය

(JICA) විසින් ප්‍රතික්ෂේප කිරීම තුල මෙම ආයතනය බෙරුම්කරණ කාර්යය සඳහා ජාත්‍යන්තර අධිකරණයට යා නොහැකි යැයි කීමට සහ උපදේශන සමාගම වූ ඔරියන්ටල් කන්සල්ටන් ග්ලෝබල් සීමිත සමාගම බෙරුම්කරණය සඳහා යොමු විය නොහැකි බවට තහවුරුවක් නොමැති අතර එසේ සිදුවුවහොත් ශ්‍රී ලංකා රජයට අවාසිදායක තත්ත්වයක් ඇතිවීම ( ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම) වැලක්විය නොහැකි වනු ඇති බවද නිරීක්ෂණය විය.

අමාත්‍ය මණ්ඩලයේ හෝ විධායකයේ තීරණ ක්‍රියාත්මක කරන නිලධාරීන් එම තීරණ වලට අනුගතව ක්‍රියාකරන අතරම එම තීරණයන් හේතුවෙන් යම් ප්‍රබල ගැටළුවක් ඇතිවිය හැකිබවට වෘත්තිමය වශයෙන් නිගමනයකට එළඹිය හැකි අවස්ථා පවතී නම් එම නිගමනයන් විධායකය වෙත වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ හැකියාව පිළිබඳව රජයේ අවධානය යොමුකළ යුතු වීමත්, විධිමත් අධ්‍යයනයකින් පසුව ගෙන ඇති පූර්ව තීරණ නැවත සංශෝධනයට/අවලංගු කිරීමට කටයුතු කිරීමේ දී පූර්ව තීරණය සඳහා වූ අධ්‍යන වලට දායක වූ පාර්ශවයන් ගෙන් ඒ පිළිබඳව විමසා ලැබෙන තොරතුරු වෘත්තිමය ඇගයීමකට ලක් කල යුතු වීමත්, මෙම ව්‍යාපෘතිය සඳහා මේ වනවිටත් වැය කර ඇති නිරාකරණය නොවූ බැදීම් මෙන්ම පවරාගෙන ඇති දේපල විකල්ප වැඩපිලිවෙළක් සඳහා හෝ උපයෝගී කරගෙන මෙම වියදම්වල පවතින අනාර්ථික ස්වරූපය ආර්ථිකමය තත්ත්වයට පත්කිරීම සඳහා උපරිම ප්‍රයත්න දැරිය යුතුය.තවද 2021 දෙසැම්බර් වන විට ලබාගෙන ඇති රු.මිලියන 5,066 ක ණය මුදල (Disbursement) නියමිතව තිබූ සහනදායක කොන්දේසි මත ආපසු පියවීමේ සහනය ණය ගිවිසුම ඒකපාර්ශවිය අවසන් කිරීමෙන් පසුව වුවද එලෙසම පවත්වාගෙන යාමට අවශ්‍යය එකඟතාවයන් ලබාගැනීමත්, අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාලව මහාභාණ්ඩාගාරය සිය නිරීක්ෂණය ඉදිරිපත් කිරීමේ දී එම සංදේශය මඟින් අපේක්ෂා කරන තීරණ සඳහා සහයෝගය දැක්වීමෙන් ඔබ්බට සිය ස්වාධීන වෘත්තිමය නිරීක්ෂණ ලබා දීමට උපරිම ප්‍රයත්න දැරිය යුතු විම ඇතුළුව නිර්දේශයන් කිහිපයන් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

# කාර්යසාධන විගණන අංශය

## 2022 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද කාර්යසාධන විගණන වාර්තා

- ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩි දියුණු වීමේ කාර්යසාධන වාර්තාව.
- නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම.
- දේශීය වෙළඳපොළ තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය.
- රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය.
- ශ්‍රී ලංකාවේ බෝ නොවන නිදන්ගත රෝග වැළැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය.
- පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම.
- කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය.

# කාර්යසාධන විගණන අංශය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධානයන් ප්‍රකාරව කාර්යසාධන විගණනයන් ජාතික විගණන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කාර්ය සාධන විගණන අංශය මගින් මෙන්ම ශාඛා මට්ටමෙන්ද සිදු කරනු ලැබේ. ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කාර්යසාධන විගණන අංශය මගින් ජාතික වශයෙන් වැදගත් වන මාතෘකාවන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමින් කාර්යසාධන විගණනයන් සිදු කරනු ලබන අතර ශාඛා මට්ටමින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනයන් සඳහා අවශ්‍ය උපදේශාත්මක සහාය ලබා දීම සිදු කරයි. මෙයට අමතරව උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය විසින් සිදු කරනු ලබන සහයෝගීතා විගණනයන් සඳහා සහභාගී වීමද මෙම කාර්යසාධන විගණන අංශය විසින් සිදු කරනු ලැබේ. එසේම සිදු කරනු ලබන සෑම කාර්යසාධන විගණනයක්ම උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය (INTOSAI) විසින් නිකුත් කර ඇති ප්‍රමිති වල දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන සේ සිදු කරනු ලැබේ.

කාර්යසාධන විගණනය මගින් යම් රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ යම් වියදම් ඒකකයක තෝරා ගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එහි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායී බව ඇගයීමට ලක් කරනු ලැබේ. එහි දී අදාළ නිරීක්ෂණයන්ට අමතරව ඒවා නිවැරදි කර ගැනීමට අවශ්‍ය නිර්දේශ ද අදාල වාර්තාවන්හි ඇතුලත් කරනු ලැබේ. වෙනත් විගණනයන්ට සාපේක්ෂව කාර්යසාධන විගණනයන්ට වැඩි කාල පරාසයක් ගත කළ යුතුවන අතර ඒ අනුව 2022 වර්ෂයට පෙර වර්ෂයන්හි ආරම්භ කරන ලද කාර්යසාධන විගණනයන්ට අදාළව 2022 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණන වාර්තාවන් පහත පරිදි වේ.

1. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩි දියුණු වීමේ කාර්යසාධන වාර්තාව.
2. නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම.
3. දේශීය වෙළඳපොළ තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය.
4. රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය.
5. ශ්‍රී ලංකාවේ බෝ නොවන නිදන්ගත රෝග වැළැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය.
6. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම.
7. කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය.

ඉහත විගණනයන්ට අමතරව 2022 වර්ෂයට පෙර වර්ෂයන්හි ආරම්භ කරන ලද 2022 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද නමුත් මෙතෙක් ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික වාර්තාවට විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොමැති කාර්යසාධන විගණන වාර්තාවල ප්‍රධාන කරුණු ඇතුලත් සාරාංශගත වාර්තා පහත පරිදි වේ.

### රාජ්‍ය ආයතන සඳහා ගොඩනැගිලි අවශ්‍යතා සපුරා ගැනීම හා උපයෝජනය

රාජ්‍ය ආයතනවල කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිලි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රජය සතු ගොඩනැගිලි මෙන්ම කුලී හෝ බදු පදනම මත ලබා ගන්නා ගොඩනැගිලිද භාවිතා කරනු ලබයි. මෙම ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තුව හා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා කුළී ගෙවීමට රජය විසින් විශාල වැය බරක් දරනු ලබයි. ඒ අනුව රජයේ ගොඩනැගිලි ආර්ථිකභාවයකින්, කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය පැන නගී.

මෙලෙස ගොඩනැගිලි ඉදිකිරීම් හා අත්පත් කර ගැනීම් සඳහා රජය විසින් වාර්ෂිකව ප්‍රමාණාත්මක වැය බරක් දැරුවද රජයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා රජය සතු ගොඩනැගිලි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා අතිරික්ත ඉඩකඩ පැවතීම, ඒවා සුදුසු මට්ටමේ නොමැති වීම, රජයේ ගොඩනැගිලි කළමනාකරණයේදී අත්‍යවශ්‍ය වූ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන නොයෑම සහ තක්සේරු කිරීමේ ගැටළු පැවතීම මෙම විගණනය තෝරා ගැනීමට හේතු විය. විශේෂ වියදම් ඒකක වල ගොඩනැගිලි, රජයේ පාසල් ගොඩනැගිලි, නිල නිවාස, රෝහල් ගොඩනැගිලි, විදේශ දූත මණ්ඩල කාර්යාල සහ විදේශ රටවල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි රාජ්‍ය බැංකු වලට අයත් ගොඩනැගිලි හැර මධ්‍යම රජයට අයත් ගොඩනැගිලි උපයෝජනය මෙම විගණනයේදී සැලකිල්ලට ගන්නා ලද අතර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ගොඩනැගිලි තක්සේරු කිරීම පිළිබඳවද කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් එහි කාර්යසාධනය පිළිබඳවද තොරතුරු මෙම විගණනයේදී ලබාගන්නා ලදී. අයවැය ඇස්තමේන්තු අනුව ගොඩනැගිලි මිලදී ගැනීම්, ඉඩම් මිලදී ගැනීම්, ගොඩනැගිලි ඉදිකිරීම් හා ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වර්ෂ 2016 සිට වර්ෂ 2020 දක්වා මුළු මූලධන ප්‍රතිපාදන රුපියල් බිලියන 720 ක් වෙන් කර ඉන් සියයට 67 ක් එනම් රුපියල් බිලියන 482 ක් පමණක් වැය කර තිබූ අතර එය මුළු රාජ්‍ය මූලධන පිරිවැයෙන් සියයට 14 ත් සියයට 16 ත් අතර පරාසයක විය. එසේ වුවද රාජ්‍ය ගොඩනැගිලි අවශ්‍යතාවය උපරිම කාර්යසාධනයෙන් යුතුව උපයෝජනය වී නොමැති බව නිරීක්ෂණය වූ අතර 2021 මාර්තු 31 දිනය වන විට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, විශ්වවිද්‍යාල , රාජ්‍ය සමාගම් හා ව්‍යාපෘති ඇතුළු රාජ්‍ය ආයතන 142 ක ගොඩනැගිලි භාවිතා කිරීම් 1,166 ක් පිළිබඳව විගණනය වෙත ලබාගත් තොරතුරු ඇසුරින් රාජ්‍ය ආයතන ගොඩනැගිලි උපයෝජනයේ කාර්යසාධනය පිළිබඳ අනාවරණය වූ ප්‍රධාන ගැටළු පහත සඳහන් රූපසටහන 33 දක්ත ප්‍රස්ථාරය මගින් පැහැදිලි කර ඇත.




රූපසටහන 33 - රාජ්‍ය ආයතන ගොඩනැගිලි උපයෝජනයේ කාර්යසාධනය පිළිබඳ අනාවරණය වූ ප්‍රධාන ගැටළු

එමෙන්ම ඉදිකිරීමේදී, මිලදී ගැනීමේදී හා බදු ගැනීමේදී ගොඩනැගිලි අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගැනීම හේතුවෙන් ආයතනයේ අරමුණු ඉටු වන පරිදි තම ගොඩනැගිලි කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකමයභාවයකින් උපයෝජනය නොවන බවත් ආයතන සතු වූ ගොඩනැගිලි භාවිතය කාලීනව සමාලෝචනය නොකරන බවත් නිරීක්ෂණය විය. ඉඩ පහසුකම් කළමනාකරණයේදී සම්මත ඉඩකඩ වෙන්කිරීමේ ප්‍රමිතීන් නොතිබුණු අතර ඒ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් ද නොතිබුණි.

රජයේ කාර්යයන් සඳහා ගොඩනැගිලි බදු පදනමින් ලබා ගැනීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීමකින් තොරව බදු කුලී ගෙවීම, රජයේ තක්සේරුව නොතකා වැඩි බදු කුලී ගෙවීම නිරීක්ෂණය විය. රජයේ ගොඩනැගිලි තක්සේරු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන නිවැරදිව රජයේ තක්සේරුකරු වෙත ඉදිරිපත් නොවීම වැනි හේතූන් මත රජයේ ඉඩම් හා ගොඩනැගිලි නිසි පරිදි තක්සේරු නොවීම හා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් හේතුවෙන් රජයේ ගොඩනැගිලි නිවැරදි වටිනාකමකින් ගිණුම්ගත නොවීම යන කරුණු මෙම වාර්තාවේ සැලකිල්ලට ගෙන ඇත.

රාජ්‍ය ආයතනවල ඉඩකඩ අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණින් ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කර තිබුණද අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම, ඉදිකිරීම් දුර්වලතා, ඉදිකිරීම් අතරමග නතර කිරීමට තීරණය කිරීම්, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම්, ආයතනවල අවශ්‍යතාවයන් අනුව වරින්වර ගොඩනැගිලි සැලසුම් වෙනස් වීම හා මුළු පිරිවැය ඇස්තමේන්තුව වෙනස්වීම් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු අතර විය.

එමෙන්ම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ පූර්ණ මධ්‍යගත තොරතුරු පද්ධතියක් පවත්වාගැනීම, කාර්යක්ෂම භාවිතය තහවුරු කරමින් රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ පිලිගත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙහි ප්‍රධාන මෙහෙවරක් විය. එසේ වුවද එවැනි මධ්‍යගත දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ කටයුතු වල අසාමාන්‍ය ප්‍රමාදයක් සහ රජයේ ගොඩනැගිලි භාවිතය හා කළමනාකරණය එමගින් අධීක්ෂණය කිරීමක් සිදු නොවීම මෙහි කැපී පෙනෙන නිරීක්ෂණයන් විය.

විගණනය විසින් නිර්දේශ ලෙස රාජ්‍ය ගොඩනැගිලි පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මධ්‍යගත තොරතුරු පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීම සහ සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තමන් සතු ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු හා දත්ත පවත්වාගෙන ගොඩනැගිලි තුළ පවතින ඉඩකඩ වල ඌනතාවයන් හා අතිරික්තයන් කාලීනව සමීක්ෂණය කිරීම යන කරුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම ගොඩනැගිල්ලක් ඉදිකිරීමකදී, මිලදී ගැනීමකදී හෝ බදු ගැනීමකදී එම ගොඩනැගිල්ල යොදා ගනු ලබන කාර්යභාරය, එහි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය හා භාවිතා කරන උපකරණ වල ස්වභාවය අනුව අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය අනාගත අවශ්‍යතාද නිසි ලෙස පුරෝකථනය කරමින් තීරණය කර ගොඩනැගිලිවල සැබෑ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමට මාර්ගෝපදේශ සකස් කිරීම හා ඉඩකඩ භාවිතය පිළිබඳ ප්‍රමිතීන් හඳුන්වා දීම යන නිර්දේශයන්ද මෙහිදී යෝජනා කරනු ලැබේ.

### කොළඹ නගරය සහ අවට ප්‍රවේශ මාර්ගයන්හි රථවාහන තදබදය අවම කිරීම සඳහා අදාල රාජ්‍ය ආයතනයන් විසින් සිදු කරන කාර්යභාරය ඇගයීම

රටක සංවර්ධනය උදෙසා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් අතරින් විධිමත් මාර්ග පද්ධතියක් යනු අවශ්‍යතා අනුව ව්‍යාප්ත වූ ප්‍රමාණවත් හා ගුණාත්මකයෙන් යුතු යටිතල පහසුකමක් විය යුතුය. එමෙන්ම, නගරය තුල සිදුවන සංවර්ධන කාර්යයන්ට සමගාමීව මාර්ග පද්ධතිය වැඩි දියුණු විය යුතුය. මේ සඳහා දියුණු රටවල විද්‍යාත්මක පදනම්න් වර්තමානය හා අනාගතයට ගැලපෙන පරිදි මාර්ග පද්ධති සකස්වී ඇති නමුදු ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල එය තවදුරටත් නොවිසිඳුණු ගැටළුවක්ව පවතී. බස්නාහිර පළාත තුළ එය සුවිශේෂී වන්නේ කොළඹ වාණිජ නගරය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අග නගරය වීම හේතුවෙන් මෙම නගර සීමාව ඇතුළත හා එයට ඇති ප්‍රවේශයන් තුළ මෙකී ගැටලුව මඟින් සමාජීය, පරිපාලනය, ආර්ථික කටයුතු හා පාරිසරික වශයෙන් බාධා ඇති

කරන පරිසරයක් ගොඩනැඟී තිබීමයි. ගාලු පාර, හයිලෙවල් පාර, නව නුවර පාර, ලෝලෙවල් පාර, මීගමු පාර, නුවර පාර හා හොරණ පාර ඇතුළත් පිවිසුම් මාර්ග 07 කින් රථවාහන විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ වාණිජ නගරය වන කොළඹ නගරය දෙසට ඇතුළුවීම හේතුවෙන් එහි දෛනිකව විශාල රථවාහන සංඛ්‍යාවක් ධාවනය වේ.

කොළඹ නගරය සහ අවට ප්‍රවේශ මාර්ගයන්හි පවතින අධික රථ වාහන තදබදය කළමනාකරණය කිරීම සඳහා කෙටිකාලීන හා දිගුකාලීන විසඳුම් සැපයීම සම්බන්ධව රජය හා ප්‍රවාහන කළමනාකරණයට වගකිවයුතු ආයතන ඉටු කරනු ලබන හා ඉටු කළ යුතු කාර්යභාරයෙහි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඇගයීම මෙම කාර්යසාධන විගණනයේ ප්‍රධාන අරමුණ විය. මෙහිදී ජාතික භෞතික සැලැස්ම මෙන්ම නාගරික සැලසුම් හා මාර්ග සැලසුම්වලට අනුකූලව ප්‍රවාහන, රථවාහන කළමනාකරණය, නාගරික සංවර්ධනය හා මාර්ග සංවර්ධනය සම්බන්ධ වන රජයේ ආයතනවල කාර්යභාරය ඉටුකිරීම් පරීක්ෂා කරන ලදී.

ගැසට් නිවේදන මගින් නාගරික සංවර්ධනය, ප්‍රවාහනය හා මාර්ග සංවර්ධන සැලසුම් නීතිමය ලියවිලි බවට පත් නොකිරීම, රථවාහන තදබදයට බලපාන හේතු නිශ්චිතව හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා ගත යුතු පියවර හා ඒවායේ ප්‍රමුඛතාවය හඳුනා නොගැනීම, නාගරික සංවර්ධනය, මාර්ග සංවර්ධනය හා ප්‍රවාහනය යන සියළුම අංශ සම්බන්ධීකරණය මගින් රාජ්‍ය ආයතනවල වගකීම් හඳුනා නොගැනීම යන ගැටලු සැලසුම්කරණයේදී නිරීක්ෂණය විය. මාර්ග සංවර්ධන සැලසුම, ජාතික භෞතික සැලසුම හා නාගරික සංවර්ධන සැලසුම යන ප්‍රධාන සැලසුම් ක්‍රියාත්මක වීමේ ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වය අවම වීම මේ සඳහා බලපා ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම ප්‍රවාහනය හා මාර්ග සංවර්ධනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තීන් කෙටුම්පත් අවධියේ පැවතීම හේතුවෙන් රථවාහන තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඒකාකාරී නොවීම සහ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිරීක්ෂණය විය. මෙම ප්‍රධාන සැලසුම් හා සමගාමීව අදාළ ආයතනවල ක්‍රියාකාරී සැලසුම් සකස් නොවන බවත් මාර්ග තදබදය අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග එම ක්‍රියාකාරී සැලසුම් මගින් ආවරණය වී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ මහ නගර සැලැස්මේ යෝජිත බස් ප්‍රමුඛතා මංතීරු, නම්‍යශීලී කාර්යාල වේලාවන්, ජලාශ්‍රිත ප්‍රවාහන වැනි ව්‍යාපෘතිවල හා සහසර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. මාළඹේ සිට කොටුව දක්වා වූ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය විදේශීය මූල්‍යමය සහායෙන් ආරම්භ කිරීමට සැළසුම් කර මූලික වැඩ කොටස් නිම කර තිබුණු අතර බස්නාහිර කලාපීය සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ මූලික ශක්‍යතා අධ්‍යයනයන් නිම කර තිබුණි. එසේ තිබියදී වර්තමානය වන විට මෙම ව්‍යාපෘති දෙක නතර කර ඇති අතර ඒ අනුව 2019 දෙසැම්බර් 31 දින

තෙක් දරන ලද රු.මිලියන 11,537 ක වියදම නිශ්කාර්ය වී තිබුණි.

එමෙන්ම මෙම ව්‍යාපෘති හා සමගාමීව ක්‍රියාත්මක විය යුතු රථගාල් කළමනාකරණය, මංසන්ධි පාලනය කිරීම, රථවාහන ගමනාගමනය පාලනය කිරීම, පෙර ගෙවුම් කාඩ්පත් බස් රථ ගාස්තු ක්‍රමය, රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය හා නගර මධ්‍යයට පිවිසෙන වාහන සඳහා ගාස්තු අයකිරීම වැනි යෝජනා ක්‍රියාත්මක නොවීම, 2019 වසරේදී සුඛෝපභෝගී බස් රථ 9 ක් පමණක් මිලදී ගැනීමට හැකි වී තිබීම සහ අවශ්‍යතාවය අනුව කාර්යාල හා පාසල් ප්‍රවාහන සේවා වැඩි දියුණු නොවීම නිරීක්ෂණය විය. කොළඹ හා අවට තදාසන්න ප්‍රදේශ වල සිදුවන අනවසර ඉදිකිරීම් හා සංවර්ධන කාර්යයන් නිසා ඇතිවන රථ වාහන තදබදය හා එමඟින් සිදුවන බලපෑම (TIA) ඇගයීම සඳහා පසු විපරමක් මහ කොළඹ ප්‍රදේශයේ ප්‍රමාණවත්ව සිදු නොවීම, රථගාල් පහසුකම් ප්‍රමාණවත් නොවීම රථවාහන තදබදය අධික වීමට හේතු වී තිබුණි. එමෙන්ම, කොළඹ ප්‍රදේශය සඳහා රථවාහන පොලිස් කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම, පුහුණු නොවූ රථ වාහන පොලිස් කාර්ය මණ්ඩලය සියයට 78 ත් සියයට 86 ත් අතර වීම රථ වාහන කළමනාකරණය කෙරෙහි බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

එබැවින් රථ වාහන තදබදයට හේතු වන සාධක, ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග වල ප්‍රමුඛතාවය හා අදාල ආයතනවල ඒ සම්බන්ධයෙන් වූ වගකීම නිවැරදිව හඳුනාගෙන සියලු ආයතන ඒකාබද්ධ වී රථ වාහන තදබදය අවම කිරීම සඳහා තනි සැලැස්මක් සකස් කර ගැසට් නිවේදනයක් මගින් නීතිගත කර එම සැලසුම් නිසි කලට ක්‍රියාත්මක කිරීම. පුහුණු රථවාහන පොලිස් කාර්යමණ්ඩලයක් අවශ්‍යතාවය අනුව කොළඹ ප්‍රදේශයට අනුයුක්ත කිරීම, රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීම, මගී ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා වූ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම,පාසල් හා කාර්යාල ප්‍රවාහන සේවා සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම, නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් පළාත් පාලන ආයතන ඒකාබද්ධ වී අනවසර ඉදිකිරීම් තවදුරටත් ඇති වීම වැලැක්වීම සඳහා පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ.

# පරිසර අංශය

## විගණන නිරීක්ෂණ

- පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන අපජල පිරිපහදු පද්ධතිය පවත්වාගෙන යාම
- අවිධිමත් ගනුදෙනු
- වත්කම් ඌන උපයෝජනය

# පරිසර අංශය



තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් යන දැක්ම හා තිරසර ස්වාභාවික සම්පත් කළමනාකරණය තුළින් පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම පරිසර අමාත්‍යාංශයේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටු කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 04 ක් වූ මධ්‍යම පරිසර අධිකාරිය, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය, GSMB තාක්ෂණික සේවා සමාගම සහ ශ්‍රී ලංකා දේශගුණ අරමුදල් පුද්ගලික සමාගම යන ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකළ යුතුව තිබුණි.

- තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාළ පාර්ශවකරුවන්ට දැනුම් දීම හා ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපායමාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය සහ තිරසර පරිසර සංකල්පය මෙන්ම ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීම.
- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීම ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමයෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමණාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදීම.
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.
- යහපත් වූ පරිසර කළමණාකරණ සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක නිර්මාණය කිරීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත එකතු වූ රුපියල් මිලියන 1,691 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රුපියල් මිලියන 1,510 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට ඉතිරිය රුපියල් මිලියන 181 ක් විය.

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන අපජල පිරිපහදු පද්ධතිය පවත්වාගෙන යාම

1980 අංක 47 දරන ජාතික පාරිසරික (සංශෝධිත) පනතේ 23 (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ එම පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට හා වෙනත් උපමාන වලට අනුකූලව හැර පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම සිදු නොකළ යුතු බවට දක්වා තිබුණද පරිසර අමාත්‍යාංශයේ අපජල පිරිපහදු පද්ධතිය භාවිතය ආරම්භ කල දින සිට විගණිත දිනය වූ 2023 මැයි 03 දින දක්වා (වර්ෂ 05කට අධික කාලයක්) පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි.

### අවධිමත් ගනුදෙනු

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු අදාල ආයතනය සමග කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කල යුතු වුවද අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම 2022 අගෝස්තු 17 දින සිදු කර තිබූ අතර 2022 ජනවාරි සිට 2022 අගෝස්තු 17 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා නෛතික ගිවිසුමක් රහිතව රු. මිලියන 5 ක් ගෙවා තිබුණි.

### වත්කම් ඌන උපයෝජනය

සොබාදම් පියස ගොඩනැඟිලි පරිශ්‍රයේ රු.මිලියන 3.5 ක් වැය කර අපජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කර තිබූ අතර එමඟින් ජීව වායු නිෂ්පාදනය කර භාවිතා කිරීමට අපේක්ෂා කර තිබුණි. එහෙත් ගොඩනැඟිල්ල භාවිතා කිරීම ආරම්භ කළ දින වූ 2017 සැප්තැම්බර් 14 දින සිට විගණිත දිනය වූ 2023 මාර්තු 23 දින දක්වා වූ වර්ෂ 5 කට අධික කාලයක් තුළ ජනනය වූ ජීව වායුව උපයෝජනය කර නොතිබූ අතර සංවෘත අපජල පද්ධතිය තුළ නිපදවෙන ජීව වායුව කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වායු ගෝලයට මුදා හැර තිබුණි.

# කෘෂිකාර්මික අංශය

## විගණන නිරීක්ෂණ

- කෘෂිකර්ම අමාත්‍යාංශය
    - ප්‍රතිපාදන උපයෝජනය
    - ජාතික ශාක නිරෝධායන නියැදි පරීක්ෂණ අසමත් කාබනික පොහොර ආනයනය කිරීම නිසා රටට සිදු වී තිබූ අලාභය
- සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
    - නැනෝ නයිට්‍රජන් දියර පොහොර ආනයනය කිරීමේදී වැඩිපුර ගෙවා තිබූ මුදල් අය කරගෙන නොතිබීම
    - පොහොර සමාගම විසින් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු සහනාධාර වටිනාකම නැවත ප්‍රේෂණය කර නොතිබීම
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
    - ප්‍රතිපාදන උපයෝජනය
    - බිල්පත් සඳහා ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරි නිර්දේශ නොමැතිව සහකාර කොමසාරිස්වරයා විසින් ගෙවීම් සිදු කර තිබීම
    - හදිසි කටයුතු ලෙස මිලට ගෙන තිබූ යන්ත්‍ර සුත්‍ර නිශ්ක්‍රියව තිබීම
    - අයවිය යුතු මුදල් අයකර ගෙන නොතිබීම
    - ව්‍යාපෘති අවසන් කිරීම ප්‍රමාද වීම
    - ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය හා ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් සඳහා ගෙවීම් කර තිබුණද එය ඉටුකර නොතිබීම
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
    - මුදා හැර තිබූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකුට ගෙවා තිබූ වැටුප් ප්‍රතිපූර්ණය කර නොතිබීම.
    - විදේශ අධ්‍යයන වියදම් ආපසු අය කරගෙන නොතිබීම

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
    - කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිළියෙළ කිරීම සඳහා අරමුදල් යොදාගෙන තිබුණද එම පද්ධතිය උපයෝජනය කර නොතිබීම
    - වගා හානි වෙනුවෙන් වූ වන්දි වලට අදාළ ගොවීන් හඳුනාගෙන නිරවුල් කර නොතිබීම
    - රක්ෂණ වාරික මුදලක් අඩු කර ගොවීන්ට රක්ෂණ සහතික ලබා දී නොතිබීම
    - ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය
    - විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීමට ප්‍රමාද වීම
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
    - භාණ්ඩාගාරයෙන් ලද පරිපාලන වියදම් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමකට බැර කර තිබීම
    - විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවා නොතිබීම
- ගොවීන්ගේ භාරකාර අරමුදල
    - ලොතරැයි ආදායම නියමිත පරිදි ගොවීන්ගේ භාරකාර අරමුදලට ලබා නොදීම
    - අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබීම
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
    - ව්‍යාපෘතියේ මෝටර් රථයක් පුද්ගලික පරිහරණයට යොදාගෙන තිබීම
    - යැපුම් දීමනාව ආපසු අයකරගෙන නොතිබීම
    - කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබීම
- බිම් සවිය වැඩසටහන
    - ඉඩම් සම්පතෙහි හිමිකම් නිරවුල් කර අනාගත පරපුර වෙනුවෙන් ඉඩම් සුරක්ෂිත කිරීමේ වැඩසටහනේ අරමුණු ඉටු වී නොතිබීම
    - සැලසුම් කල ක්‍රියාකාරකම් ඉටු කර නොතිබීම
    - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමිත ප්‍රමාණයක පමණක් වැඩසටහන ක්‍රියාත්මක කර තිබීම
    - ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් ගෙවා තිබුණද අදාළ කාර්ය ඉටු කර නොතිබීම
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
    - ප්‍රධාන කාර්යය වන ඉඩම් ලේඛනය සකස් කිරීම ඉටුකර නොතිබීම
    - ඉඩම් හා ප්‍රකාශිත වතු ඉඩම් වල ඉතා අඩුඅගයක් දක්වා තිබීම
    - ගෙවිය යුතු වන්දි නිරවුල් කර නොතිබීම

# කෘෂිකාර්මික අංශය



ආහාර සුරක්ෂිතතාව හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයන් ඇති කිරීම තම දැක්ම ලෙසත් , ස්වාභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් හා වාණිජයමය නැඹුරුවකින් යුතුව , ගෝලීය තරඟකාරී නිෂ්පාදනයක් බිහි කරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම තම මෙහෙවර ලෙසත් හඳුනාගත් කෘෂිකර්ම අමාත්‍යාංශය වර්තමානයේදී එම කටයුතු ඉටුකර ගැනීම සඳහා කෘෂිකර්ම අංශය , පශු සම්පත් සංවර්ධන අංශය , පොහොර අංශය හා ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය ලෙස ක්‍රියාත්මක වේ . මෙම අමාත්‍යාංශය යටතේ දෙපාර්තුමේන්තු 03 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 14 ක් පහත අරමුණු හා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වෙමින් පැවතුණි .

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම විෂයට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනය.
- තොග පවත්වා ගැනීම හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.
- භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම.
- සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම.
- තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරිගැන්වීම.
- රසායනික පළිබෝධක සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම.
- කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම.
- සෘජු නිෂ්පාදකයන් සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම් සහ අපනයන සමාගම් අතර සැලසුම් සබඳතා ශක්තිමත්

කිරීම මඟින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම .

- දේශගුණික වෙනස්කම් සහ කාලගුණයේ දෛනික තොරතුරු ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මඟින් ස්වාභාවික ආපදාවන් අවම කර ගැනීම.
- ප්‍රමිතියෙන් යුතු බීජ හා පැළෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- ජල කළමනාකරණය හා ගොවීන් වගා අවශ්‍යතා අනුව ජල සැපයුම් කළමනාකරණය කිරීම.
- කෘෂිකාර්මික සංවර්ධන කලාප , කෘෂි ගම්මාන හා තිරසාර ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් ප්‍රවලිත කිරීම.
- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණය .
- කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නඟා සිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාබනික පොහොර භාවිතය සහ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම .
- ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදා හැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.
- නියමිත ප්‍රමිතියෙන් යුතු රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම.
- දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියකට අනුගත කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම.
- දේශීය ගොවියා හා පාරිභෝගිකයා සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ මිල ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම .
- ගෙවතු වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම.
- කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම.
- රජයේ ගොවිපළ හා බීජ නිෂ්පාදන ගොවිපල සංවර්ධනය .
- දේශීය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම.
- පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම.
- සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම.
- පශු කෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම

ප්‍රචලිත කිරීම හා එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායනය කටයුතු.

- විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම.
- පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම.
- මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය හා පරිභෝජන අවස්ථා පුළුල් කිරීම.
- ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණය.
- ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
- කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

කෘෂි කාර්මික අංශය මගින් ඉටු කළ යුතුව තිබූ ඉහත අරමුණු හා කර්තව්‍යය ඉටුකිරීම පිළිබඳව සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

## කෘෂිකර්ම අමාත්‍යාංශය

### ප්‍රතිපාදන උපයෝජනය

2022 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයට රු.මිලියන 123,052, ක ශුද්ධ ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 95,151 ක් උපයෝජනය කර රු. මිලියන 27,901 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### ජාතික ශාක නිරෝධායන නියැදි පරීක්ෂණ අසමත් කාබනික පොහොර ආනයනය කිරීම නිසා රටට සිදු වී තිබූ අලාභය

කාබනික පොහොර ආනයනය කිරීමේදී 1999 අංක 35 දරන ආරක්ෂණ පනතට අනුව ශාක නිරෝධායන සහතිකය සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ආනයන බලපත්‍රය ලබා ගත යුතුය. නමුත් එවැනි අනුමැතියක් ලබා නොදී හා ජාතික ශාක නිරෝධායන නියැදි පරීක්ෂණ අසමත් බව දැන දැනම 2021/2022 මහ කන්නයේ හෙක්ටයාර 500,000 කට අවශ්‍ය කාබනික පොහොර මෙ.ටො. 96,000 ක් චීනයේ සමාගමකින් ආනයනය කර එම පොහොර රටට ගොඩබෑමකින් තොරව ඇ.ඩො. මිලියන 6.9 කට සමාන රු. මිලියන 1,383 ක් අනාර්ථිකව අදාළ සමාගම වෙත ගෙවීමට සිදු වී තිබුණි.

### සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

**නැනෝ නයිට්‍රජන් දියර පොහොර ආනයනය කිරීමේදී වැඩිපුර ගෙවා තිබූ මුදල් අය කරගෙන නොතිබීම**

සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2021 ඔක්තෝබර් 18 දින නැනෝ නයිට්‍රජන් දියර පොහොර බෝතල් 100,224 ක් ආනයනයට බෝතලයකට ඇ.ඩො. 12.45 බැගින් රු. මිලියන 253 ක් සැපයුම්කරු වෙත ගෙවීම් කර තිබියදී බෝතලයක මිල ඇ.ඩො. 10 දක්වා අඩු කිරීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු. මිලියන 50 ක මුදල විගණිත දිනය වූ 2023 ජනවාරි 30 දක්වා ආපසු අයකරගෙන නොතිබුණි.

**පොහොර සමාගම විසින් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු සහනාධාර වටිනාකම නැවත ප්‍රේෂණය කර නොතිබීම**

2016 වර්ෂයේදී සහනාධාර පොහොර නිකුත් කිරීම නතරකර ගොවියාට මුදල් ලබාදීමේ ක්‍රමයට මාරුවීම හේතුවෙන් එදිනට පොහොර සමාගම සතුව පැවති පොහොර තොගයන්ට අදාළව කොමර්ෂල් පොහොර සමාගම විසින් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු සහනාධාර වටිනාකම වූ රු. මිලියන 2,112 ක් භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කර නොතිබුණි.

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ප්‍රතිපාදන උපයෝජනය**

2022 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබුණු රු.මිලියන 10,053 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 9, 212 ක් උපයෝජනය කර තිබුණි. එසේම කෘෂිකාර්මික රාජ්‍ය අමාත්‍යාංශය, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු විසින් විවිධ ව්‍යාපෘති සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 3,765 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 2,020 ක් උපයෝජනය කර තිබුණි.

**බිල්පත් සඳහා ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරි නිර්දේශ නොමැතිව සහකාර කොමසාරිස්වරයා විසින් ගෙවීම් සිදු කර තිබීම**

සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය විසින් රු.මිලියන 2.4 ක් වැය කර සාගිනි වැව ප්‍රතිසංස්කරණය සඳහා ඉදිරිපත් කළ බිල්පත් සඳහා ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරි නිර්දේශ නොමැතිව සහකාර කොමසාරිස්වරයා විසින් ගෙවීම් සිදු කර තිබුණි.

**හදිසි කටයුතු ලෙස මිලට ගෙන තිබූ යන්ත්‍ර සූත්‍ර නිශ්ක්‍රියව තිබීම**

ජාතික අයවැය චක්‍රලේඛය අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති ආරම්භ කිරීමට නියමිත සියලුම ව්‍යාපෘති තාවකාලිකව

අත්හිටුවීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණද, රු.මිලියන 6 ක් වැය කර කොන්ක්‍රීට් මික්ස්චර් 04 ක්, කොන්ක්‍රීට් පෝකර් මැෂින් 06 ක් හා සොයිල් වයිබ්‍රේටින් හැමර් 06 ක් ඉතා හදිසි කටයුත්තක් ලෙස සලකා 2022 දෙසැම්බර් 28 දින මිලදීගෙන තිබුණද, 2023 ජුනි 15 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන ගබඩාවක තබා තිබුණි.

### අයවිය යුතු මුදල් අයකර ගෙන නොතිබීම

ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ 2006, 2008, 2010 හා 2012 වර්ෂවල ලබාදී තිබූ රෝද 02 ට්‍රැක්ටර් සඳහා අයවිය යුතු රු.මිලියන 112 ක්, ගොවිජන සංවර්ධන අරමුදලේ ණයගැතියන්ගේ ශේෂය තුළ ඇතුළත් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු.මිලියන 3 ක් හා රු.20 මිලියන ක රෝද 04 ට්‍රැක්ටර් වාරික සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

### ව්‍යාපෘති අවසන් කිරීම ප්‍රමාද වීම

ලෝක බැංකු ආධාර යටතේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාගැනීම ජාතික වැඩසටහන යටතේ කෙටිකාලීන ගබඩා පහසුකම් ලබාදීම සඳහා ලෝක බැංකු ණය CERS (Contingent Emergency Response Component) යටතේ රු. මිලියන 223 ක පිරිවැයක් දරා දිස්ත්‍රික් කාර්යාල 11 ක් ආවරණය වන පරිදි ගබඩා 26 ක් 2021 වර්ෂය අවසානයට පෙර නිම කර අවසන් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩා 15 ක් ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ ගබඩා 11 න් එක් ගබඩාවක වැඩ අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් අවසන් කරන ලද ගබඩා 10 ම මෙම වාර්තාවේ දිනට නිෂ්කාර්යව පැවතුණි.

### ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය හා ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් සඳහා ගෙවීම් කර තිබුණද එය ඉටුකර නොතිබීම

සමාලෝචිත වර්ෂයේ අරමුදල විසින් ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය හා ගොවිජන සංවර්ධන කාරක සභා සඳහා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් සකස් කිරීමට රු.මිලියන 31 ක වටිනාකමකට ගිවිසුම් ගතවී ඉන් රු. මිලියන 9 ක මුදලක් ගෙවීම් කර තිබුණද කිසිදු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.

### හෙක්ටර් කොඛ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

### මුදා හැර තිබූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකුට ගෙවා තිබූ වැටුප් ප්‍රතිපූර්ණය කර නොතිබීම

වී අලෙවි මණ්ඩලයට 2020 පෙබරවාරි 07 දින සිට සම්පූර්ණයෙන්ම මුදා හැර තිබූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකුට 2020, 2021 හා 2022 වර්ෂවලදී ගෙවන ලද රු. මිලියන 4 ක වැටුප් එම මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි.

### විදේශ අධ්‍යයන වියදම් ආපසු අය කරගෙන නොතිබීම

දර්ශනපති උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා 2011 වර්ෂයේ සිට වර්ෂ 02 ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා තිබූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු තවත් වර්ෂ 02 ක වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණද උපාධි සහතිකය ආයතනයට ලබාදීමට අසමත් වීම නිසා අයවිය යුතු රු.මිලියන 9 ක් හා චීනයේ විශ්ව විද්‍යාලයකින් දර්ශනපති උපාධියක් හදාරා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුර සඳහා ගොස් තිබූ නිලධාරියකුගෙන් අයවිය යුතු රු. මිලියන 5 ක් අය කරගෙන නොතිබුණි.

### කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

### කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිළියෙළ කිරීම සඳහා අරමුදල් යොදාගෙන තිබුණද එම පද්ධතිය උපයෝජනය කර නොතිබීම

ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව වගාහානි සඳහා රක්ෂණ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය මාස 2½ ක් දක්වා අඩුකර ගැනීම සඳහා කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිළියෙළ කිරීමට ගිවිසුම් වලට එළඹ තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 20 ක මූල්‍ය පහසුකම්, මණ්ඩලය වෙත ලබාදී ඒ සඳහා මණ්ඩලය රු.මිලියන 23 ක් වැයකර තිබුණු නමුත් එම පද්ධතිය වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කර නොතිබුණ බැවින් අපේක්ෂිත පරමාර්ථ අත්කර ගෙන නොතිබුණි.

### වගා හානි වෙනුවෙන් වූ වන්දි වලට අදාළ ගොවීන් හඳුනාගෙන නිරවුල් කර නොතිබීම

කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, වගා හානි වෙනුවෙන් ගොවීන්ට හානි පූර්ණය සැලසීම සඳහා මණ්ඩලය විසින් පවත්වාගෙන යන කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.මිලියන 70.8 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම ශේෂය නිරවුල් කිරීමට වසර 5 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

### රක්ෂණ වාරික මුදලක් අඩු කර ගොවීන්ට රක්ෂණ සහතික ලබා දී නොතිබීම

2021/22 මහ කන්නය සඳහා ගොවීන් 26,904 දෙනෙකුට ගෙවීමට නියමිත වන්දි මුදලින් රු.මිලියන 11 ක හදිසි අනතුරු රක්ෂණ වාරිකයක් අඩු කරගෙන තිබුණු අතර එම මුදල අඩු කර ගත් දිනයේ සිට වසරක කාලයකට හදිසි අනතුරු රක්ෂණ ආවරණයක් ලබා දියයුතු වුවත්, ගොවීන් 14,779 දෙනෙකුට රක්ෂණ වාරික මුදලක් අඩු කර ගත් දිනයේ සිට මාස 7 ක් ගත වී තිබුණද රක්ෂණ සහතික ලබා දී නොතිබුණි.

### ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයට දායක වී සිටින 64,117 ක් වූ ධීවර ප්‍රජාව සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයට දායක වී තිබුණු වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 27,976 ක් වූ ධීවරයින්ගෙන් ධීවරයින් 22,402 ක් වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

### විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීමට ප්‍රමාද වීම

2009 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් අයදුම් කළ ධීවරයන් 137 ක් සහ 2022 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අයදුම් කළ ධීවරයින් 83 ක් සඳහා රු.මිලියන 6 ක හිඟ විශ්‍රාම වැටුප් ඉල්ලීම් කළ ධීවරයන් වෙත ප්‍රතිලාභ ලබා දීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වී මාස 1 සිට අවුරුදු 07 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

### ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### භාණ්ඩාගාරයෙන් ලද පරිපාලන වියදම් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමකට බැර කර තිබීම

සමාලෝචිත වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු. මිලියන 190 ක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි බැංකු ගිණුමට බැර නොකර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට බැර කර තිබුණි.

### විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවා නොතිබීම

පවතින දත්ත පද්ධතිය තුළ දායකයින් 871,425 ක් ලියාපදිංචි කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වී සිටි දායකයින් 439,025 කින් දායකයින් 246,531 ක් දෙනෙකුට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවා නොතිබුණි.

### ගොවීන්ගේ භාරකාර අරමුදල

### ලොතරැයි ආදායම නියමිත පරිදි ගොවීන්ගේ භාරකාර අරමුදලට ලබා නොදීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල වලට අනුව ගොවිසෙත ලොතරැයි ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද සමුච්චිත එකතුව රු.මිලියන 6,367 ක් වුවත් භාර ඔප්පුවක් මඟින් ස්ථාපිත කර ඇති අරමුදලට වර්ෂ 28 ක කාලය තුළදී ගොවීන්ගේ භාරකාර අරමුදලේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට ලබා දී තිබුණේ රු.මිලියන 956 ක් පමණි.

### අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබීම

ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමට මුදල් උපයෝජනය නොකර භාරකාර අරමුදලේ මුදල් දිගින් දිගටම ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ස්ථාවර තැන්පතුවල රු.මිලියන 465 ක් සහ භාණ්ඩාගාර බිල්පත්වල රු.මිලියන 90 ක් එසේ ආයෝජනය කර රු.මිලියන 73 ක පොලී ආදායමක් උපයා තිබුණි.

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

### ව්‍යාපෘතියේ මෝටර් රථයක් පුද්ගලික පරිහරණයට යොදාගෙන තිබීම

කෙන්යානු රජයේ කෘෂි වන වගාව පිළිබඳ පර්යේෂණ සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර ඇතිකරගෙන තිබුණු පර්යේෂණ හා විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාව සඳහා වන "කෘෂි වන වගාව" පිළිබඳ අවබෝධතා ගිවිසුම අනුව ආරම්භකළ ව්‍යාපෘතියට ලබාගත් මොටර් රථයක් ව්‍යාපෘතිය නිම වීමෙන් පසු, ප්‍රතිපත්ති සභාවට පවරා නොගෙන සම්බන්ධීකරණ විද්‍යාඥ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකුගේ පුද්ගලික පරිහරණයට යොදාගෙන තිබුණි.

### යැපුම් දීමනාව ආපසු අයකරගෙන නොතිබීම

2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පශ්චාත් උපාධි සඳහා විදේශගත වූ ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් 25 දෙනෙකු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපත්ති සභාවට නොදන්වා මෙරටට පැමිණ සිටි කාලසීමාව සඳහා ගෙවා තිබුණු රු.මිලියන 10 ක යැපුම් දීමනාව ආපසු අයකරගෙන නොතිබුණි.

### කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබීම

ප්‍රතිපත්ති සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි.

## බිම් සවිය වැඩසටහන

### ඉඩම් සම්පතෙහි හිමිකම් නිරවුල් කර අනාගත පරපුර වෙනුවෙන් ඉඩම් සුරක්ෂිත කිරීමේ වැඩසටහනේ අරමුණු ඉටු වී නොතිබීම

1998 අංක 21 දරන හිමිකම් නිරවුල් කිරීමේ පනත සම්මත වීමෙන් පසුව ඉඩම් සම්පතෙහි හිමිකම් නිරවුල් කර අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිත කිරීමේ අරමුණු ඇතිව ක්‍රියාත්මක

කළ මෙම වැඩසටහන 2007 වර්ෂයේ සිට ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. විගණිත දින වන විට වර්ෂ 15 ක් ගත වී ඇතත්, මෙම වැඩසටහන ක්‍රියාත්මක වන්නේ දිස්ත්‍රික්ක 18 ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ක පමණක් විය. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශය වෙත 2022 දෙසැම්බර් 31 දිනට ලද ප්‍රතිපාදනය රු.මිලියන 300 ක් වූ අතර වැය කළ වටිනාකම රු.මිලියන 275 ක් විය.

### සැලසුම් කල ක්‍රියාකාරකම් ඉටු කර නොතිබීම

2022 දෙසැම්බර් 31 දිනට බිම් සවිය වැඩසටහන යටතේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කච්චේරි පැවැත්වීම , බලපත්‍ර නිකුත් කිරීම , දීමනා පත්‍ර නිකුත් කිරීම , ජංගම සේවා පැවැත්වීම , කොට්ඨාශ දින පැවැත්වීම හා ගැටළු වලට විසඳුම් පෙන්වීම යන ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුනු අතර , ඉඩම් කච්චේරි පැවැත්වීම හැර අනෙක් කාර්යයන්හි ප්‍රගතිය සියයට 3-39 අතර පරාසයක පැවතුනි.

### ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමිත ප්‍රමාණයක පමණක් වැඩසටහන ක්‍රියාත්මක කර තිබීම

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත 2007 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන වටිනාකම රු.මිලියන 5,911 ක් වූ අතර 1998 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ක පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.මේ සඳහා විධිමත් ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර නොතිබිණි. වැඩ අවසන් කර අදාල ඉඩම් හිමියන්ට හිමිකම් සහතික නිකුත් කර නොතිබු අතර එම කොට්ඨාශ 66 ට අදාලව ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3,971 කින් 1,468 ක පමණක් මැනුම් කටයුතු අවසන් කර තිබුණි.

### ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් ගෙවා තිබුණද අදාළ කාර්ය ඉටු කර නොතිබීම

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ සිට ප්‍රාදේශීය කාර්යාල 48 ක් සඳහා ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 271.3 ක් වැය කර තිබුණු අතර පසුගිය වර්ෂ 6 කට අදාලව පසෙක තබන ලද ගොනු එකතුව 167,322 කින් නැවත විසඳුම් ලබා දී ඇති ගොනු ප්‍රමාණය 58,823 ක් විය.

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ප්‍රධාන කාර්යය වන ඉඩම් ලේඛනය සකස් කිරීම ඉටුකර නොතිබීම

1972 අංක 01 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා මේ වන විට වසර 50 ක් ගත වී ඇතත් නිශ්චිතව හඳුනාගත් ඉඩම් පිළිබඳ තොරතුරු නොපැවතීම හේතුවෙන් මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වන ඉඩම් ලේඛනය සකස් කිරීම සිදු වී නොතිබුනි.

### ඉඩම් හා ප්‍රකාශිත වතු ඉඩම් වල ඉතා අඩුඅගයක් දක්වා තිබීම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව කෘෂිකාර්මික ඉඩම් හා ප්‍රකාශිත වතු ඉඩම් ප්‍රමාණය අක්කර 1,809,495 ක් වූ අතර නීතිමය බැඳීම මගින් හා ගැසට් පත්‍ර මගින් පවරා දුන් ප්‍රමාණය අඩුකල පසු ඉතිරි බිම් ප්‍රමාණය අක්කර 616,876 ක් වූ අතර විහාර දේවාලගම් හා මහජනතාවට බෙදා දුන් පසු කොමිෂන් සභාවට ඉතිරි බිම් ප්‍රමාණය අක්කර 424,809 ක් විය. 2022 දෙසැම්බර් 31 දිනට බිම් ප්‍රමාණයෙහි වටිනාකම රු.මිලියන 676 ක් බවත් ඒ අනුව අක්කරයක වටිනාකම රු.1,561 ක් ද පර්චස් එකක වටිනාකම රු.9.75 ක් ද වැනි ඉතා අඩු අගයක් ගෙන තිබුණි.

### ගෙවිය යුතු වන්දි නිරවුල් කර නොතිබීම

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව වතු සමාගම් වලින් සහ පුද්ගලයන්ගෙන් පවරා ගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි එකතුව රු.මිලියන 216 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

# ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශය

## විගණන නිරීක්ෂණ

- ප්‍රතිපාදන උපයෝජනය කිරීම
- සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීම සහ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් රටේ ආර්ථිකයට සිදුකර තිබුණු දායකත්වය
- ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය අඩුවීම
- පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය
- ලංකා ධීවර සංස්ථාව
    - සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව මසුන් ණයට අලෙවි කිරීම
    - අයහපත් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කරගැනීමට නොහැකි වීම
    - ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම
    - ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු සිදු නොකිරීම
- ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
    - ලංකා ධීවර වරාය වාර්ෂික වියදමෙන් වැඩි කොටසක් සේවක පඩි නදී සඳහා වැය කර තිබීම
    - ලැබිය යුතු බදු ආදායම් අයකර නොගැනීම
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
    - මඩ කකුළුවන් වගා කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථක වීම
    - මත්ස්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අක්‍රීයව පැවතීම

# ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශය

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ දූපතක් ලෙස පිහිටා තිබීම නිසා එහි ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය බොහෝවිට කරදිය ධීවර කර්මාන්තය තුළින් සපුරා ගත හැකිව තිබුණි. නමුත් රටේ ඉල්ලුමට සරිලන මත්ස්‍ය සැපයුමක් නොපැවතීම මත බොහෝ විට මත්ස්‍ය නිෂ්පාදනවල මිල ඉතා ඉහළ අගයක් ගැනීම නිසා රටේ ජනතාවට එම සම්පතින් නිසි ඵල ලබා ගැනීමට නොහැකි වී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුද සහ හෙක්ටයාර් 489,000 වූ කලපු හා අභ්‍යන්තර ජලාශ මනා ලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන ධීවර කර්මාන්තයක් බිහිකිරීම තුළින් මහ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය වර්ධනය කර පෝෂණ මට්ටම ඉහළ මට්ටමක පවත්වා ගැනීම, ජාතික ආර්ථිකය හා විදේශ සංචිතයන්හි මත්ස්‍ය අපනයන තුළින් සුවිශේෂී දායකත්වයක් ලබාදීම, ආශ්‍රිත ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය අංශයේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ව්‍යාවස්ථාපිත මණ්ඩල/ආයතන 6 ක් විසින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටුකළ යුතුව තිබුණි.

- වෙරළ බඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත නව ධීවර වරායන් ඉදිකිරීම.
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම.
- ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම.
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම.
- උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම.
- ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.
- සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම.

- අපනයනය වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- වැව් කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම.
- මහා පරිමාණ බෝට්ටුවල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම.
- බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.
- නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩිදියුණු කිරීම.
- මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ආරම්භ කිරීම.
- පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
- ධීවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.
- ප්‍රජාවගේ සුබසාධන කටයුතු පුළුල් කිරීම

## ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2022 වර්ෂයේ දී ඉහත සඳහන් කාර්යභාර්යන් ඉටුකිරීම සඳහා ධීවර අමාත්‍යාංශය සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 7,442 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු.මිලියන 6,216 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,226 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර පහත රූපසටහන 01 හි දැක්වේ.




| | ධීවර අමාත්‍යාංශය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 6,416 | 1,026 | 7,442 |
| වියදම | 5,227 | 989 | 6,216 |
| ඉතිරිය | 1,189 | 37 | 1,226 |

රූපසටහන 01 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ව්‍යාවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාර්යන් ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ විගණණයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

**සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීම සහ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් රටේ ආර්ථිකයට සිදුකර තිබුණු දායකත්වය**

ඉහත සඳහන් ධීවර අංශයේ අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම මගින් ධීවර ප්‍රජාවට යටිතල පහසුකම් සැලසීම අරමුණු කරගෙන ජාතික ජලජීවී සංවර්ධනය අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සහ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යන ආයතන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,759 ක් ලබා දී තිබුණ ද එකී ආයතනවල කටයුතු පිළිබඳ පසුවිපරම් කිරීම හා ඇගයීමක් අමාත්‍යාංශය මගින් සිදුකර නොතිබුණි.

**ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය අඩුවීම**

අක්වෙරළ, වෙරළාසන්න හා කලපු, මිරිදිය, ජලජීවී වගා, ඉස්සන් යන ක්ෂේත්‍ර 05න් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 2021 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 321,575 ක් වූ අතර 2022 වර්ෂයේ එය මෙට්‍රික් ටොන් 290,640 ක් විය. මේ අනුව මෙට්‍රික් ටොන් 30,935 ක අඩුවීමක් සිදු වී තිබුණු අතර එය සියයට 10 ක සමස්ත නිෂ්පාදනයේ පිරිහීමක් විය. මේ නිසාම 2021 වර්ෂයේ දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය, දිනකට ග්‍රෑම් 36.7 ක් ලෙස හඳුනාගෙන තිබුණු අතර එය 2022 වර්ෂයේ දී මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 31.3 ක් වූයෙන් දෛනික මත්ස්‍ය පරිභෝජනය සියයට 15 ක අඩුවීමක් සිදුවී තිබුණි.

**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය**

- සෞඛ්‍යානුකූලව හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව මසුන් හැසිරවීමට හැකිවන පරිදි තොග මාළු වෙළඳුන්ගේ, මත්ස්‍ය නිෂ්පාදකයින්ගේ සහ පාරිභෝගිකයන්ගේ ප්‍රතිලාභය සඳහා ඒකක 148 කින් සමන්විත තොග වෙළඳපොළ ඒකක 128 කින් යුතු සිල්ලර වෙළඳපොළක්, ශීතාගාර, සහ අයිස් යන්ත්‍රාගාරය ඇතුළු පහසුකම්වලින් සමන්විත ස්ථාවර වත්කම්වල වටිනාකම රු.මිලියන 1,694 ක් වූ පැලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුව මඟින් ස්ථාපිත කර තිබුණු අතර 2011 වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි.
- සමාලෝචිත වර්ෂය අවසාන වන විට මත්ස්‍ය මෙහෙයුම් කටයුතු ආරම්භ කර වසර 12 ක් ගත වී තිබුණ ද මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි.
- මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණය තුළ මසුන් හැසිරවීම සෞඛ්‍යානුකූලව සිදුකිරීමට, වෙළඳාම් කරනු ලබන මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතියක පවත්වාගෙන යන බවට සහතික කිරීමට අවශ්‍ය

මාර්ගෝපදේශයන් හා නීති කළමනාකරණ භාරය විසින් හඳුන්වා දිය යුතුව තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම කළමනාකරණ භාරය ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

එමෙන්ම, වෙළඳසැල් හිමියන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 81 ක හිඟ මුදලක් අයකර ගැනීමට තිබුණු අතර එම මුදලින් රු.මිලියන 55 ක් වසර 03 කට වැඩි කාලයක සිට නොගෙවා තිබෙන කඩකුලි වුවත්, එම හිඟ කඩකුලී මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## ලංකා සීවර සංස්ථාව

සීවර ක්ෂේත්‍රයට සම්බන්ධ "ස්ව සම්පත් කලාපය" සහ පිළිගත් ජාත්‍යන්තර රීති වලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම් වල නිරත වීම,මත්ස්‍ය පිරිසැකසුම, විදේශීය සහ දේශීය වෙළෙඳපොළවල මසුන් විකිණීම,අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවකදී මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ යම් කටයුතු සිදු කරගෙන යාම, ඉහත කටයුතු වලින් යම් කටයුත්තක් සිදුකිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයින් සමඟ හවුල් ව්‍යවසාය ගිවිසුම් වලට ඇතුළත් වීම සහ දේශීය සහ විදේශීය නිෂ්පාදකයන් සහ බෙදාහරින්නන් නියෝජනය කිරීම යන කටයුතු සංස්ථාව වෙත ව්‍යවස්ථාපිතව පැවරී තිබූ නමුත් මසුන් සකස් කිරීමේ කටයුතු සහ මසුන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීමේ හෝ බෙදාහැරීමේ කටයුතු පමණක් සංස්ථාව මගින් සිදුකර තිබුණි.

## සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව මසුන් ණයට අලෙවි කිරීම

සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛය උපදෙස් අනුව මසුන් ණයට අලෙවිය වහාම අත්හිටුවීමට උපදෙස් ලබා දී තිබුණ ද 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු මසුන් විකුණුම් වටිනාකම රු.මිලියන 262 ක් වූ අතර මෙයින් වසර 5 කට වැඩි බාහිර ණයගැති ශේෂය රු. මිලියන 29 ක් ද සේවකයින්ට මාළු විකිණීමෙන් නොපියවූ ණයගැති ශේෂය සහ රෝහලේ ණයගැති ශේෂය රු. මිලියන 17 ක් ද විය.
කෙසේ වුව ද චක්‍රලේඛයට පටහැනිව ණයට මසුන් විකුණූ නිලධාරීන්ට එරෙහිව මේ වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

## අයහපත් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කරගැනීමට නොහැකි වීම

2022 ඔක්තෝබර් 31 දිනට ගෙවිය යුතු භාණ්ඩාගාර ඇපකර මත බැංකු ණය ශේෂය රු. මිලියන 159 ක්, එදිනට ඒ සඳහා ගෙවිය යුතු පොලී මුදල රු. මිලියන 35 ක් හා 2021 දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු මිලියන 25 ක් වුවද මෙම අයහපත් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කරගැනීමට නොහැකිව තිබුණි.

## ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම

2022 ඔක්තෝබර් 30 දින වන විට එකතුකළ අගය මත බදු ලෙස රු.මිලියන 19 ක මුදලක් ද, ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.මිලියන 94ක්

ද ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. තවද, එදිනට ගෙවිය යුතු ආර්ථික සේවා බදු ගාස්තු රු.මිලියන 49 ක් ද, සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායකය රු.මිලියන 579 ක මුදලක් ද ගෙවිය යුතුව තිබුණි.

### ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු සිදු නොකිරීම

සංස්ථාව සතුව පවතින නිවාඩු නිකේතන 03 ක් සහිත අක්කර 04 රූඩ් 4 පර්.38.20ක භූමි ප්‍රමාණයක් ද නිරවුල් කරගෙන නොතිබුණු අතර නුවරඑලිය, ත්‍රිකුණාමලය, යන නිවාඩු නිකේතන පිහිටි භූමිවල ප්‍රමාණයන් හෝ හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව නීත්‍යානුකූල හිමිකමක් නොපවතින භූමි භාගයන් තුළ නිවාඩු නිකේතන සඳහා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

### ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව පසුගිය වසර කිහිපයක සිට දිගටම පාඩු ලබන තත්ත්වයක පැවතුණි.




| | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| මුළු ආදායම | 681 | 710 | 549 | 642 |
| මුළු වියදම | 678 | 781 | 785 | 778 |
| ලාභ/ (පාඩු) | 3 | (71) | (236) | (136) |

රූපසටහන 02. – 2018 සිට 2021 දක්වා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ආදායම, වියදම හා ලාභය

මෙසේ පාඩු ලබන තත්ත්වයක් උද්ගත වීමට මූලික වශයෙන්ම බලපා ඇත්තේ වරායන් වැඩි ප්‍රමාණයක් පාඩු ලබන තත්වයක පැවතීමය. මේ හේතුව මත 2019 වසරේ සිට 2021 වර්ෂය දක්වා සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබූ අතර සංස්ථාව සතු වරායන්හි ලාභ/ පාඩු ලබන වරායන් සංඛ්‍යාව හා ඒවායේ සමස්ත පාඩුවත් පහත දැක්වෙන පරිදි වේ.

| වර්ෂය | ලාභ ලබන වරායන් සංඛ්‍යාව | පාඩු ලබන වරායන් සංඛ්‍යාව | වරායන්හි සමස්ත පාඩුව (රු.මිලියන) |
|---|---|---|---|
| 2018 | 5 | 15 | (41) |
| 2019 | 4 | 16 | (34) |
| 2020 | 4 | 18 | (112) |
| 2021 | 6 | 16 | (134) |

වගුව 04. –සංස්ථාව සතු වරායන්හි 2018 සිට 2021 දක්වා ලාභ/ පාඩු ලබන වරායන් සංඛ්‍යාව හා ඒවායේ සමස්ත පාඩුව

### ලංකා ධීවර වරාය වාර්ෂික වියදමෙන් වැඩි කොටසක් සේවක පඩි නදී සඳහා වැය කර තිබීම

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතුව පැවති වරායන් 24 හි ම වාර්ෂික වියදමෙන් සියයට 50 ඉක්මවූ වැය බරක් දරා තිබුනේ සේවක පඩිනඩි හා අතිකාල දීමනා ගෙවීම් සඳහා වීම කැපී පෙනෙන ලක්ෂණයකි. ඉන්ධන විකුනුම් හා නැංගුරම් සේවා සැපයීම වැනි සාමාන්‍ය වරාය මෙහෙයුම් කටයුතු සිදු නොකරන වරායන්හි පවා වැටුප් හා වේතන සඳහා සමස්ත වියදමින් සියයට 69 ක් පමණ වැය බරක් දරා තිබුණි.

### ලැබිය යුතු බදු ආදායම් අයකර නොගැනීම

සංස්ථාව සතු වත්කම් බදු දීම තුළින් සංස්ථාව වෙත අයවිය යුතුව පවතින බදු ආදායම නිසි පරිදි අයනොවන අතර 2018 වසරේ සිට ණය ගැති ශේෂය තුළ බදු ආදායම් ණයගැතියෝ පහත රූපසටහන 03 පරිදි විය.




රූපසටහන 03 – 2018 සිට 2022 දක්වා බදු ආදායම් ණයගැතියෝ

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

### මඩ කකුළුවන් වගා කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථක වීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රැකව මහඔයට අයත් පුද්ගලික කුඹුරු ඉඩම් අක්කර 42 ක වපසරියක් තුළ, අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2020 වර්ෂයේ දී රු. මිලියන 222 ක් වියදම් කර තිබුණු මඩ කකුළුවන් (Mud Crabs) වගා කිරීමට ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ව්‍යාපෘතියේ අරමුණු වෙනස්කර, කිවුල් දිය ඉස්සන් (වැනමී ඉස්සන්) වගාව සඳහා පෞද්ගලික ආයෝජකයෙක් සමඟ රු. මිලියන 193 කට 2021 දෙසැම්බර් 02 දින බදු ගිවිසුමකට එළඹ තිබුණි.

### මත්ස්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අක්‍රීයව පැවතීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය කරනු ලබන තිලාපියා මත්ස්‍යයන් සඳහා ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.මිලියන 11.8 ක් වැයකර මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රයක් උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණු අතර එමඟින් වාර්ෂික මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 127,000 ක් නිපදවීමට අපේක්ෂා කළද 2021 සහ 2022 වර්ෂවලදී කිලෝග්‍රෑම් 36,612 ක් සහ 36,975 ක් නිෂ්පාදනය කර තිබුණි. එය අපේක්ෂිත නිෂ්පාදන මට්ටමෙන් සියයට 28 ක් සහ 29 ක් වැනි අවම ප්‍රතිශතයක් වූ අතර 2023 වර්ෂය වනවිට මෙම යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන අක්‍රීයව පැවතුනි.

# වාරිමාර්ග අමාත්‍යාංශය

## විගණන නිරීක්ෂණ

- ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම
- ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
- උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටආර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය)
- මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීම සඳහා වැඩිපුර ගෙවීමට සිදු වීම.
- යාන් ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම
- බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය
- මහා/මධ්‍යම පරිමාණ ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම අනුව තෝරාගත් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වීම
- භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම
- මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - නියමිත පරිදි ඉටු නොකිරීම නිසා පිරිවැය ඉහල යාම
- උතුරු මැද මහා ඇළ ව්‍යාපෘතිය - නිශ්කාර්යව දෙවන උමන් විදුම් යන්ත්‍රයක් මිලට ගැනීම
- වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය/දේශගුණික විපර්යයාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය
- රේඛනය අවලංගුකර චෙක්පත් මුදල්කර ගැනීම
- මෝටර් වාහන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතීම
- වැව් හා ජලාශ හා රක්ෂිතයන්හි අනවසර පදිංචි හෝ වගාකිරීම්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
    - සංවර්ධන කටයුතු සඳහා ලබා දී තිබූ ඉඩම් ඌන උපයෝජිතව පැවතීම
    - තෘණ වගාව සඳහා ලබා දී තිබූ ඉඩම් ඌන උපයෝජනය
    - කුඩා පරිමාණ විදුලිබලාගාර හිමියන්ගෙන් විධිමත් පරිදි ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම
    - කළුගල් කැණීම වෙනුවෙන් අයවිය යුතු වාරික ගෙවීම පැහැර හැරීම
    - ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර **30** ක් ස්ථාපිත කර ඊට අනුශාංගික පහසුකම් සැපයීම ආරම්භ කර තිබූ වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීම
- ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ්
    - ඛණිජ වැලි අපනයනය කිරීමෙන් තොරව අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ගෙන ඇති තීරණය ක්‍රියාත්මක නොවීම
    - කෝකිලායිහි නව ඛණිජ වැලි යන්ත්‍රාගාරයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ නොකිරීම

# වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත මණ්ඩල තුනක් හා ව්‍යාපෘති විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටි "ප්‍රශස්ථ වාරි කළමනාකරණයක්" ඇති කිරීම සඳහා නියමිත නීති හා අණපනත්වලට අනුකූලව වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදන, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලාප්‍රවාහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය මනා කළමනාකරණයක් යටතේ සපයාදීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව වෙත 2022 වර්ෂයේදී එකතුව රු.මිලියන 73,332 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 58,088 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 04 හි දැක්වේ.




| | වාරිමාර්ග අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන | 63,670 | 9,662 | 73,332 |
| වියදම් | 49,397 | 8,691 | 58,088 |
| ඉතිරිය | 14,273 | 971 | 15,244 |

රූපසටහන 04 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර දක්වා ඇත.

## ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

වාරිමාර්ග අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කර තිබූ ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය, උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, කුඹුක්කන් ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, මුන්දෙනි ආරු ගංහා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය, කිවුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය, මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය, පහළ මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ ඵලදායිතා ප්‍රවර්ධනය හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 09, 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 203,159ක පිරිවැයක් දරා තිබූ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් සැලසුම් කල පරිදි නිම කිරීමකින් තොරව අත්හැර දැමීමට සිදුව තිබුණි. ඒ අතරින් ව්‍යාපෘති 7 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 13.16 ක් වූ අවම මට්ටමක විය.

## ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ CAMEC සමාගම ඇ.ඩො. මිලියන 690 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ ඒ සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4.35 ක් වූ ඇ.ඩො. මිලියන 30 ක් නොහොත් රු. මිලියන 4,011 ක් ගෙවා අතහැර දමා තිබුණු අතර ව්‍යාපෘතියේ සැලසුම් සඳහා වූ සම්පූර්ණ පිරිවැයම 2014 වර්ෂයේ ගෙවා තිබියදී සැලසුම් කිරීම නිම කර නොතිබීම මත ඊට අදාළව දරා තිබූ රු. මිලියන 4,080 ක පිරිවැය කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

## උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණ ද අවස්ථා 8 කදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2021 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. ඉරාන ෆරාබ් සමාගම 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529 ක් හෙවත් රුපියල් මිලියන 74,326 ක් විය. ඒ යටතේ 2023 අප්‍රේල් 30 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 503 ක වැඩ සහතික කොට ගෙවා තිබුණි.

2023 මැයි 15 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු වසර 7 කුත් මාස 6ක් ප්‍රමාද වී තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි. එහිදී ජාතික විදුලි බල ජනන පද්ධතියට මෙගා වොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම ප්‍රමාද වීම තුළින් පමණක් සිදුව තිබූ පාඩුව රු. මිලියන 150,562ක් වී තිබුණි.

උක්ත ප්‍රමාදය ඇතුළු කරුණු 05 ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඇ. ඩොලර් මිලියන 181 ක් රජයෙන් ඉල්ලා තිබුණි. ඒ සඳහා පත්කල කමිටුවක් විසින් ඇ. ඩොලර් මිලියන19 ක මුදලක් ගෙවීමට නිර්දේශ කර තිබූ අතර තවත් ඇ. ඩොලර් මිලියන 19 ක් සානුකම්පිත හේතු මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා සලකා බැලීමටද නිර්දේශ කර තිබුණි. ඒ පිලිබඳ නිෂ්චිතව සඳහන් කිරීමකින් තොරව 2021 ඔක්තෝබර් 31 දින අංක IR/2021/62 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබූ අතර ඒ මඟින් ඇ. ඩොලර් මිලියන 38 ක් අමතරව කොන්ත්‍රාත්කරුට ගෙවීමට අනුමැතිය ලබා ගෙන තිබුණි.

ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් රක්ෂණ සමාගමෙන් ඇ. ඩොලර් මිලියන 8 ක වන්දියක් ලබාගෙන තිබුණි.

**උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටඅර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය)**

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11,877ක් හෙවත් සියයට 120 ක් වැයකර තිබූ නමුත් දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ගෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර නොතිබුණි. ඒ හේතුවෙන් උමාඔය ද්‍රෝණියේ ජලය කිරිඳිඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන අරමුණ වූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකි වී තිබුණි.

**මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ විදුලි උත්පාදන යන්ත්‍ර හතරක් සවිකිරීම සඳහා වැඩිපුර ගෙවීමට සිදු වීම.**

මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන බැම්ම ඉදිකිරීම මූලික ගිවිසුමේ විෂය පථය අනුව ඉදිකිරීමට යෝජිතව තිබූ මෙගා වොට් 5 විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගා වොට් 15 විදුලි ජනන යන්ත්‍ර 1ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 3ක් මඟින් මෙගා වොට් 25 ක් උත්පාදනය කරන විදුලි බලාගාරය වෙනුවට, මෙගා වොට් 5ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් හා මෙගා වොට් 7.5 ක විදුලි ජනන යන්ත්‍ර 2 ක් සහිත විදුලි ජනන යන්ත්‍ර 4 ක් මඟින් මෙගා වොට් 25ක් උත්පාදනය කරන විදුලි බලාගාරයක් ඉදි කිරීමට තීරණය කර තිබුණි. ඒ සඳහා අතිරේක ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 10,937,960 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට අදාළ 2016 නොවැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා වූ මුදල්

අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ව්‍යාපෘතියේ විෂය පථය තීරණය කිරීමට ප්‍රථම, ලංකා විදුලිබල මණ්ඩලයෙන් උපදෙස් ලබා නොගැනීම සම්බන්ධව රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් වගකිව යුතු බව නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ දුර්වල සැලසුම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පත්කිරීම් බලධාරීන් වෙත වාර්තා කළ යුතුව පැවති නමුත් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද අතිරේකව දැරීමට සිදු වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 11 ක වියදම රජයට සිදු වූ පාඩුවක් විය.

### යාන් ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම

යාන් ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම සම්බන්ධව චීන කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ EPC කොන්ත්‍රාත් ගිවිසුමට අදාළ සියලු වැඩ කොටස් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කර ඇති බවට වූ කාර්යසාධන සහතිකය 2021 ඔක්තෝබර් 28 දින නිකුත් කර තිබුණි. එසේ වුවද ගිවිසුම් ප්‍රකාරව ඉටු කල යුතුව තිබූ ඇමරිකානු ඩොලර් 3,478,910 ක් වූ කාර්යයන් 6 ක් ඉටු කර නොතිබුණි.ඒ පිලිබඳ නොසලකා සම්පූර්ණයෙන්ම වැඩ සහතික කර ගෙවා තිබුණි.

### බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදන කමිටු (CAPC) නිර්දේශ ප්‍රකාරව ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) වෙත ස්ථාවර මිලක් මත මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ඒ සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව අවම මිල ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කල රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1(v) ට පටහැනිව කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කල ලංසුවට වඩා රු.මිලියන 254 ක වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. එම වැඩි කරන ලද වටිනාකමට කොන්ත්‍රත්තුව පිරිනැමීම හා ඒ මත පදනම්ව අත්තිකාරම් ගණනය කර ගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත 2019 වර්ෂයේදී සංචලන අත්තිකාරම් ලෙස (Mobilization advance) රු.මිලියන 51 ක් වැඩි පුර ගෙවා තිබුණි.

### මහා/මධ්‍යම පරිමාණ ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම අනුව තෝරාගත් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වීම

මෙම දස අවුරුදු සංවර්ධන සැලැස්ම අනුව මහගල්ගමුව වැව ප්‍රගුණවත් කිරීම, පහළ මල්වතු ඔය ජලාශය ඉදිකිරීම, රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධනය, කිවුල් ඔය ජලාශය, කවුඩුල්ල වම් ඉවුර ප්‍රධාන ඇළ දම්සෝපුර වැව දක්වා දිර්ඝ කිරීම, රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධනය සහ මහවැලි බී කලාපය මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය යන ව්‍යාපෘති 7 ක් 2012-2017 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට 2011 සැප්තැම්බර් 28 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. එම ව්‍යාපෘති 7 ක්‍රියාත්මක කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,528 ක් වැය කර තිබූ නමුත් එකී ව්‍යාපෘති

අතරින් එක් ව්‍යාපෘතියක්වත් මේ දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 3 කට අදාලව නිම කිරීමේ ප්‍රතිශතය 1 ත් 5 ත් අතර විය.මීට අමතරව කුඩාවිලච්චිය ජලාශ ප්‍රතිසංස්කරණය, එලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම (PEISEIP), තල්පිටිගල ජලාශය, ගිං නිල්වලා හැරවුම, දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය, හිඹිලියාකඩ වත්තේ ගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති හය, 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,902 ක පිරිවැයක් දරා තිබුණ ද ඒවායින් එක් ව්‍යාපෘතියක්වත් සමාලෝචිත වර්ෂය දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘති 5 කට අදාලව නිම කිරීමේ ප්‍රතිශතය 0.06 ත් 13.16 ත් අතර විය.

## භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම

වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක නියමු ව්‍යාපෘතියක් ලෙස භූගත ජල විමංසන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18ක් හෙවත් රු.මිලියන 3,628.39 ක් වන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. වසර 3 ක් වූ ව්‍යාපෘති කාලය වසර 2 කින් දීර්ඝ කිරීමෙන් පසු 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබූ නමුත් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ යුතුව පැවති අත්‍යවශ්‍ය අංගයක් වූ දත්ත මධ්‍යස්ථානය ඉදිකර නොතිබුණි.

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - නියමිත පරිදි ඉටු නොකිරීම නිසා පිරිවැය ඉහල යාම

මේ යටතේ කළුගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශයට ජලය ගෙන යාම සඳහා කි.මී. 8.8 ක් දිගැති උමං මාර්ගය කැණීමේ කොන්ත්‍රාත්තුව, 2018 – 2021 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 22 ක් සහ රු. මිලියන 3,797 ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 7,147 කට විදේශ සමාගමකට භාර දී තිබුණි. කොන්ත්‍රාත්තුව අදාළ කාලය තුළ නිම නොකිරීම හේතුවෙන් 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රගතිය සියයට 82 ක් වූ අතර 2022 වර්ෂයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 12 ක් විය. කොන්ත්‍රාත්තුවේ මිල විචලනයන් සඳහා රු. මිලියන 275 ක් වෙන් කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.මිලියන 781 ක් ඒ සඳහා ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් පිරිවැය ඉදිරියේදී ඇමරිකානු ඩොලර් මිලියන 35 (ආසන්න වශයෙන් රු. මිලියන 9,383) දක්වා ඉහළ යා හැකි බවට ඇස්තමේන්තුකර තිබුණි.

## උතුරු මැද මහා ඇළ ව්‍යාපෘතිය - නිශ්කාර්යව දෙවන උමන් විදුම් යන්ත්‍රයක් මිලට ගැනීම

උතුරු මැද මහ ඇළ අදියර 2 ව්‍යාපෘතියෙහි මොරගහකන්ද ජලාශයේ සිට ජලය ගෙන යාමට කි.මී. 27.7 ක් දිග උමං මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 – 2027 කාලය තුළ නිම කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 106 ක් සහ රු. මිලියන 21,180 ක් වශයෙන් මුළු වටිනාකම රු. මිලියන 40,073 කට විදේශ සමාගමකට භාර දී තිබුණි. අනතුරුව කොන්ත්‍රාත්තුව 2025 ජූනි 07 දිනට

කඩිනමින් නිම කිරීම සඳහා, භාවිත කරනු ලැබූ උමං විදුම් යන්ත්‍රයට අතිරේකව 02 වන උමං විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව රු. මිලියන 6,691 කට දෙවන උමං විදුම් යන්ත්‍රයක් මිලදීගෙන 2022 ඔක්තෝබර් මාසයේ මෙරටට ආනයනය කර තිබුණි. අනතුරුව රටේ පවතින ආර්ථික අවපාතය හා අමතර අරමුදල් කඩිනම්ව සොයාගැනීමට ඇති අපහසුව නිසා දැනට පවතින ඇමරිකානු ඩොලර් මිලියන 69.5ක (රු. මිලියන 22,240 පමණ) ප්‍රතිපාදනය තුළ එක් උමං විදුම් යන්ත්‍රයක් පමණක් පාවිච්චි කරමින් කොන්ත්‍රාත්තුව 2024 ජූනි දක්වා පවත්වා ගෙන යාමටත් අලුතින් ආනයනය කළ උමං විදුම් යන්ත්‍රය 2024 මාර්තු දක්වා ක්‍රියාත්මක නොකිරීමටත් 2023 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

### වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය/දේශගුණික විපර්යයාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය සඳහා හරිත දේශගුණික අරමුදල (GCF) පසුගිය වසර 06 තුළ රු. මිලියන 6,651 කට සමාන එ.ජ.ඩො. මිලියන 30.01 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත ලබා දී තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 1,465 කට සමාන එ.ජ.ඩො. මිලියන 7.99 ක් පමණක් වාරිමාර්ග අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබුණි. ඉතිරි රු.මිලියන 5,186 කට සමාන එ.ජ.ඩො.මිලියන 22.01 ක මුදලින් ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදුකිරීම සඳහා UNDP විසින් රු.මිලියන 2,777 කට සමාන එ.ජ.ඩො.මිලියන 13.94 ක් වැය කර තිබුණි. ඒ අනුව එ.ජ.ඩොලර් මිලියන 8.07 කට සමාන රු.මිලියන 2,409 ක වියදම් සම්බන්ධ තොරතුරු හෙළිදරව් නොකෙරුණි.

### රේඛනය අවලංගුකර චෙක්පත් මුදල්කර ගැනීම

මුදල් රෙගුලාසි ප්‍රකාරව රු. 500 ට හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී එය මුදලින් නොගෙවිය යුතු වුවත් ඊට පටහැනිව හා නිසි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2022 වර්ෂයේදී රු. මිලියන 352 ක් වටිනා චෙක්පත් 1177 ක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නමින් ලියා රේඛනය අවලංගු කර කොට්ඨාශ සහකාර විසින් මුදල් කරගෙන තිබුණි. අනතුරුව කොට්ඨාශ සහකාර විසින් අනුමැතියකින් තොරව ගෙවීම්ලාභීන් වෙත මුදලින් ගෙවීම් කරද තිබුණි.

### මෝටර් වාහන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතීම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද දෙපාර්තමේන්තුවට අයත් හා පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 1,124 ක් විය. ඒ අනුව වාහන 880 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි.

### වැව් හා ජලාශ හා රක්ෂිතයන්හි අනවසර පදිංචි හෝ වගාකිරීම්

වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත්ව පවතින ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශ 387 කින් වැව් හා ජලාශ 116 ක රක්ෂිතයන්හි අනවසර පදිංචි හෝ වගාකිරීම් සිදුකර . වාරිමාර්ග රක්ෂිත සීමා, දෙපාර්තමේන්තු ඉඩම් ආරක්ෂා කිරීම හා නිදහස් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 දෙසැම්බර් 01 දින නිකුත් කර තිබූ අංක 08/2014 දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 65 වන වගන්තියේ විධිවිධානයන් අනුගමනය කර මේ පිළිබඳව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### සංවර්ධන කටයුතු සඳහා ලබා දී තිබූ ඉඩම් ඌන උපයෝජිතව පැවතීම

2022 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයන් 704 දෙනෙකු වෙත හෙක්ටයාර 7,832 ක ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබුණි. ඉන් පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 3,645 ක් වූ අතර, සියයට 5 ත් 25 ත් අතර ඌන සංවර්ධිත ඉඩම් හෙක්ටයාර 377 ක් පැවතුණි. සංවර්ධනය කරමින් පවතින ඉඩම් කට්ටි ප්‍රමාණයෙන් ඉඩම් හෙක්ටයාර 291ක් සියයට 25 ත් 50 ත් අතර සංවර්ධනයකුත්, ඉඩම් හෙක්ටයාර 821ක් සියයට 50 ත් 90 ත් අතර සංවර්ධනයක් සිදුකර තිබුණි. පූර්ණ වශයෙන් අසංවර්ධිතව ඉඩම් හෙක්ටයාර 2697 ක් පැවතුණි. ඒ අනුව ලබාදුන් දුන් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 34 ක් පූර්ණ අසංවර්ධිතවත්, සියයට 19 ක් ඌන හා සංවර්ධනය වෙමිනුත් පැවතුණි.

### තෘණ වගාව සඳහා ලබා දී තිබූ ඉඩම් ඌන උපයෝජනය

කිරි ගව පාලනයේ නියුතු ගොවීන්ට මහවැලි බී, සී, ඩී, එල් සහ උඩවලව කලාපවල තෘණ වගාව සඳහා අක්කර 2,802 ක් පමණ ලබාදී සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම්වලින් යුක්ත වැඩසටහනක් ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත්, විගණිත දින වන 2023 මැයි 25 දින වනවිටත් කිසිදු ඉඩමක් තෘණ වගාකරුවන් වෙත බෙදාදී නොතිබුණි.

### කුඩා පරිමාණ විදුලිබලාගාර හිමියන්ගෙන් විධිමත් පරිදි ගාස්තු අයකර ගැනීමට නොහැකි වීම

කුඩා පරිමාණ ජලවිදුලි උත්පාදන ආයෝජකයින්ගෙන් අධිකාරිය අයකරන ජල පෝෂක කළමනාකරණ ගාස්තුව අයකිරීම සඳහා විදුලිබල මණ්ඩලය, අදාළ විදුලි බලාගාරය අයත් ආයෝජකයා හා මහවැලි අධිකාරිය ඇතුළත්ව විධිමත් ත්‍රෛපාර්ශවික ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් විදුලි ජනනයේ යෙදී සිටින කුඩා පරිමාණ විදුලිබලාගාර 12 න් 2021 හා 2022 වර්ෂ සඳහා රු.මිලියන 242 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

### කළුගල් කැණීම වෙනුවෙන් අයවිය යුතු වාරික ගෙවීම පැහැර හැරීම

2020 දෙසැම්බර් 20 දිනැති අංක අමප/201852/317/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ව්‍යාපාරිකයින් 15 දෙනෙකු කළුගල් කැණීම වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 893 ක ඉඩම් පරිහරණ ගාස්තුවේ හිඟ මුදලින් සියයට 75 ක ප්‍රමාණයක් කපාහැරීමට අනුමැතිය හිමිව තිබූ අතර, එම කපාහැරීම වූ රු.මිලියන 670 න් පසු ඉතිරි හිඟ මුදල වන රු.මිලියන 223 වාරික 36 න් ගෙවීමටද අනුමත කර තිබුණි. එම හිඟ මුදලින් රු.මිලියන 166 කට අදාළ ව්‍යාපාරිකයින් 05 දෙනෙකු විසින් එකඟවූ පරිදි වාරික ගෙවීම පැහැර හැර තිබුණි.

### ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් ස්ථාපිත කර ඊට අනුශාංගික පහසුකම් සැපයීම ආරම්භ කර තිබූ වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීම

මහවැලි බී හා එල් කලාපවල ව්‍යාප්තවී ඇති උග්‍ර වකුගඩු රෝග තත්ත්වයට පිළියමක් වශයෙන් ප්‍රමිතියෙන් යුත් ජල සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් ස්ථාපිත කර ඊට අනුශාංගික පහසුකම් සැපයීම ආරම්භ කර තිබූ වැඩසටහන නිසි කළමනාකරණයක් හා අධීක්ෂණය සිදුනොවීම මත ලභාකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු කරා ලඟාවී නොතිබුණි. තවද, රු.මිලියන 80 වැය කර ස්ථාපිත කර තිබුණු ඉහත යන්ත්‍ර 30න් 14ක් 2023 මැයි 01 දින වනවිට අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

### ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ්

### ඛණිජ වැලි අපනයනය කිරීමෙන් තොරව අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ගෙන ඇති තීරණය ක්‍රියාත්මක නොවීම

2020 පෙබරවාරි 12 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අමුද්‍රව්‍ය ස්වරූපයෙන්ම ඛණිජ වැලි අපනයනය කිරීමෙන් තොරව අගය එකතු කරන ලද නිෂ්පාදන විදේශයන් වෙත යැවීමට සමාගම අවධානය යොමු කළ යුතුව තිබුණද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දින වූ 2023 මැයි 31 දින දක්වා ගෙන නොතිබූ අතර අමුද්‍රව්‍ය ස්වරූපයෙන් ම ඛණිජ වැලි අපනයනය කර තිබුණි.

### කෝකිලායිහි නව ඛණිජ වැලි යන්ත්‍රාගාරයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ නොකිරීම

සමාගම විසින් වැලි මුලතීව් දිස්ත්‍රික්කයේ කෝකිලායිහි නව ඛණිජ වැලි යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා වර්ෂ කිහිපයක සිට කටයුතු කර තිබුණු අතර 2013 පෙබරවාරි 13 දින රු. මිලියන 2 කට හෙක්ටයාර 17.69ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. යන්ත්‍රාගාර කටයුතු සැපසුම් කිරීමට පෙර රු. මිලියන 39 කට සර්පිලාකාර යන්ත්‍රයක් (Spiral Machine) මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය පුල්මුඩේ යන්ත්‍රාගාරය නිශ්කාර්යව තබා තිබුණි. යන්ත්‍රාගාරයේ කටයුතු 2022 වර්ෂය තෙක් ආරම්භ කර නොතිබුණි.

# වැවිලි කර්මාන්ත අංශය

## විගණන නිරීක්ෂණ

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
    - බදු ආදායම අය කර ගැනීමට කටයුතු නොකිරීම
    - කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු මුදල් අය වී නොතිබීම
- රබර් පර්යේෂණ මණ්ඩලය
    - මණ්ඩලය විසින් ටයර් පරීක්ෂා කිරීමේ ඒකකයේ වැඩ අතර මග නවතා තිබීම
    - අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ඉටු වී නොතිබීම
- පොල් සංවර්ධන අධිකාරිය
    - අරමුදල් අදාළ අරමුණු සඳහා නොයෙදීම
- පොල් වගාකිරීමේ මණ්ඩලය
    - මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක **03** හි පොල් ගස්වල කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය මර්ධනය හා පාලනය ප්‍රමාද වීම
    - භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කම්කරු දීමනා ගෙවීම
- පොල් පර්යේෂණ මණ්ඩලය
    - “සුදුමැස්සා” පළිබෝධකයා පාලනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් යොදා නොතිබීම
    - අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවූ නිලධාරීන් ගෙන් අය විය යුතු මුදල් අය නොවීම
    - පර්යේෂණ කටයුතු අත හැර දමා තිබීම

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය
    - නිරවුල් නොකළ තැන්පත් පැවතීම
    - තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත නොකිරීම
    - තේ වෙළඳ ප්‍රදර්ශන වල ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු කර නොතිබීම
    - අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියා මාර්ග නොගැනීම
- තේ පර්යේෂණ ආයතනය
    - නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අය කර නොතිබීම
    - කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීම සිදු කර නොතිබීම
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
    - බදු ආදායමක් හිඟව පැවතීම
    - ඌන උපයෝජිත ඉඩම්වල වල වගා කිරීමට කටයුතු නොකිරීම
- හලාවත වැවිලි සමාගම
    - වියදමට සරිලන ආදායමක් උපයා නොතිබීම

# වැවිලි කර්මාන්ත අංශය

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම මෙම අමාත්‍යාශයේ විෂය පථය වී තිබුණි. මෙම අමාත්‍යාශයට අදාළ දෙපාර්තමේන්තු 02 ක් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන 28 ක්ද පැවතිණි. මෙම අමාත්‍යාශයට පැවරුනු පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුව තිබුණි.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි කර්මාන්ත විෂයට සහ අමාත්‍යාංශයට පැවරුනු දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම.

- ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කරගත් වැවිලි භෝග මත පදනම්ව වූ අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- තේ,රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු

- තේ,රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම.

- වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් ද ඇතුළත්ව ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම.

- දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.

- වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

- තේ,රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම.

- කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

- පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම.

- නවීන තාක්ෂණය ද භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම තුළින්, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අපනයන වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.

- අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ පෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

- බහු භෝග වගාවන් සහ සංගත ගොවිපළ ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණයන් සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### බදු ආදායම අය කර ගැනීමට කටයුතු නොකිරීම

1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු පදනම මත පවරා දී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 07කින් රජයට අයවිය යුතු රු.මිලියන 838 ක බදු ආදායම හිඟව පැවතියද , මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු මුදල් අය වී නොතිබීම

කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් බදුකුලී ගිවිසුම අනුව වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 278 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතුව තිබෙන අතර , එයින් රු. මිලියන 117 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

## රබර් පර්යේෂණ මණ්ඩලය

### මණ්ඩලය විසින් ටයර් පරීක්ෂා කිරීමේ ඒකකයයේ වැඩ අතර මග නවතා තිබීම

මණ්ඩලය විසින් ටයර් පරීක්ෂා කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මාර්තු හා මැයි මාසයන් හි එම කාර්යය සඳහා රු. මිලියන 30 ක යන්ත්‍රෝපකරණ 03 ක් මිලදී ගෙන තිබුණි. එහෙත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමට අපොහොසත් වීම නිසා මෙම උපකරණ විගණිත දින වූ 2022 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

### අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයේ අරමුණ ඉටු වී නොතිබීම

රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය යටතේ ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා 2019 වර්ෂයේ දී රු.මිලියන 50 ක් වැයකර "අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානය"ක් පිහිටුවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එම මධ්‍යස්ථානය පිහිටුවීමෙන් අපේක්ෂිත ටයර් ආකෘති නිෂ්පාදන අරමුණ ඉටු වී නොතිබුණි .

## පොල් සංවර්ධන අධිකාරිය

### අරමුදල් අදාළ අරමුණ සඳහා නොයෙදීම

තැඹිලි ප්‍රවර්ධනය වෙනුවෙන් රු. මිලියන 128 ක මුදලක් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා තවාන් ව්‍යාපෘති අරමුදලකට බැරකර තිබුණි. එම අරමුදලින් තැඹිලි ප්‍රවර්ධනය වෙනුවෙන් රු.මිලියන 25 ක මුදලක් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබා දීම හා 2022 වර්ෂයේදී රු. මිලියන 2 ක් ගෙවා බීජ පොල් 20,000 ක් මිලදී ගැනීම හැර අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට අදාළ වෙනත් කිසිදු කාර්යයක් සිදුකර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලෙහි රු.මිලියන 101ක ශේෂයක් පැවතුණි. එසේම පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදුන් රු.මිලියන 25 ක මුදලද අදාළ කාර්යයයේ නොයොදවා සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

## පොල් වගාකිරීමේ මණ්ඩලය

### මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 හි පොල් ගස්වල කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය මර්ධනය හා පාලනය ප්‍රමාද වීම

මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 හි පොල් ගස්වල කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී කලාපයන්හි 2008 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ රෝගී පොල් ගස් 332,075 ක් හඳුනාගෙන ඉන් ගස් 309,622 ක් ඉවත් කර තිබුණු නමුත් රෝගය හඳුනාගෙන අවුරුදු 14 ක් ගතවී තිබුණද , දකුණු පළාත තුළින් මෙම රෝගය මර්ධනය කිරීමට හෝ පාලනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද නොහැකි වී තිබුණු අතර, රෝගී කලාපය තුළ රෝගී ලක්ෂණ පෙන්වන පොල්ගස් හා පැළ කපා ඉවත් කිරීම පමණක් සිදු කර තිබුණි.

### භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කම්කරු දීමනා ගෙවීම

භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මණ්ඩලයේ සභාපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 27 දෙනෙක් වෙත 2011 නොවැම්බර් සිට 2015 ජනවාරි දක්වා රු. මිලියන 17 ක කම්කරු දීමනාවක් ගෙවා තිබුණු නමුත් මෙම දීමනාව නැවත අයකර ගැනීමට හෝ ගෙවූ මුදල් සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## පොල් පර්යේෂණ මණ්ඩලය

### "සුදුමැස්සා" පළිබෝධකයා පාලනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් යොදා නොතිබීම

මණ්ඩලයේ කාර්යයන් අතර ප්‍රධානතම කාර්යයක් වන පොල් වගාව පිළිබඳ වැඩිදුර විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම, රෝග සහ පළිබෝධ වැලැක්වීම හා සුව කිරීම වුවද, 2019 වර්ෂයේ අගභාගයේදී ඇතිවූ "සුදුමැස්සා" පළිබෝධකයා පාලනය කිරීම සඳහා 2022 වර්ෂය දක්වා ස්ථීර ප්‍රතිකර්මයක් සොයාගෙන නොතිබුණු අතර කොහොඹ තෙල්, සබන් කුඩු මිශ්‍රණයක් 2022 අගභාගය වන විට හඳුනාගෙන නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ක පමණක් පොල් ගස් 81,176 ක මර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර පළිබෝධකයා පාලනය කිරීමට පියවර ගෙන තිබුණි.

### අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවූ නිලධාරීන් ගෙන් අය විය යුතු මුදල් අය නොවීම

පොල් පර්යේෂණ මණ්ඩලයේ සේවය කරමින් සිටියදී අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවූ නිලධාරීන් 06 දෙනෙකු විසින් මණ්ඩලය සමඟ ඇති කරගත් සේවා ගිවිසුම් උල්ලංඝනය කරමින් මණ්ඩලයේ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් මණ්ඩලයට අයවිය යුතු රු. මිලියන 14 ක් ද, සේවය කළ යුතු අනිවාර්ය සේවා කාලය ඉක්මවා යාමට පෙර මණ්ඩලයේ සේවය හැරගොස් තිබුණු තිදෙනෙකුගෙන් ද මණ්ඩලයට අයවිය යුතු රු. මිලියන 37 ක් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

### පර්යේෂණ කටයුතු අත හැර දමා තිබීම

2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයේ අංශ 7 ක සිදුකරමින් පැවතුන පර්යේෂණයන් 14 ක් පර්යේෂණ නිලධාරියා සේවය අතහැර යාම, මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම, වල් අලින්ගෙන් හානි සිදුවීම, බලශක්ති නිෂ්පාදනය සඳහා ගිලිරිසිඩියා දඬු ඉල්ලුම අඩුවීම හා ගිලිරිසිඩියා වගාකිරීම අඩුවීම ආදී හේතූන් මත සමාලෝචිත වර්ෂය අවසානය වන විට අතහැර දමා තිබුණු අතර ඒ සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 11 ක් වියදම් කර තිබුණි.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### නිරවුල් නොකළ තැන්පත් පැවතීම

2022 දෙසැම්බර් 31 දිනට තේ කම්හල්හිමියන් විසින් තේ දළු සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි

අදාල පුද්ගලයින් වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු තැන්පතු වටිනාකම රු. මිලියන 92 ක් වූ අතර එයින් රු.මිලියන 6 ක් වසර 10 ක් ඉක්මවූ පැරණි තැන්පතු වී තිබුණි.

### තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත නොකිරීම

තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර තේ අලෙවිකරණ හා ප්‍රවර්ධන අරමුදල වෙතින් ඒ සඳහා රු. මිලියන 220 ක් 2018 ජුලි 03 වන දින මණ්ඩලය වෙත ලබාගෙන තිබුණද වසර දෙකකට වැඩි කාලයක් එම මුදල් නිෂ්කාර්යව රඳවා ගෙන 2020 සැප්තැම්බර් 30 දින පුද්ගලික ආයතනයක් සමඟ පද්ධතිය ස්ථාපනය සඳහා ගිවිසුම්ගත වී තිබුණි.ඒ අනුව රු. මිලියන 53 කට සමස්ත පද්ධතියම වසර දෙකයි මාස හයක කාලයකදී පමණ නිමකිරීමට සැලසුම් කළද 2023 අප්‍රේල් 30 දක්වා කාර්යය නිමකර නොතිබුණි. එසේම අධි ඇස්තැමේන්තුවක් මත මෙම මුදල් ලබාගැනීම හේතුවෙන් රු. මිලියන 166 ක මුදලක් තවදුරටත් නිෂ්කාර්යව පැවතුණි.

### තේ වෙළඳ ප්‍රදර්ශන වල ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු කර නොතිබීම

2022 වාර්ෂික සැලැස්ම අනුව විදේශීය වෙළඳ ප්‍රදර්ශන 34 ක් සඳහා සහභාගී වීමට සැලසුම් කර රු. මිලියන 200 ක් අයවැය ලේඛනයෙන් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළදී වෙළඳ ප්‍රදර්ශන 25 ක් සඳහා සහභාගී වීම වෙනුවෙන් රු. මිලියන 104 ක් වියදම් කර තිබුණි. මණ්ඩලය විසින් තෝරාගන්නා ලද අපනයනකරුවන් සඳහා විදේශ වෙළඳ සල්පිල් වලට සහභාගී වීමට අවස්ථාව හා සහනාධාර ලබා දීමෙන් පසුව, එම වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු කර නොතිබුණි.

### අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියා මාර්ග නොගැණීම

2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස්" නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානය ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කිරීම හා ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ රු. මිලියන 63 ක අලාභය කපා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### තේ පර්යේෂණ ආයතනය

### නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අය කර නොතිබීම

සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යන නිවාඩු ලබා විදේශගතව සිට නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.මිලියන 15 ක් 2022 වර්ෂය අවසානය වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි.

### කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීම සිදු කර නොතිබීම

ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විස් ලිමිටඩ් වෙත 2020 අප්‍රේල් 22 දින රු. මිලියන 4 ක මුදලකට ඇණවුම භාර දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 1 ක අත්තිකාරම් මුදලක් සැපයුම්කාර ආයතනයට ගෙවා තිබුණ නමුත් මෙම ප්‍රසම්පාදනයේ ප්‍රගතිය සියයට 43 ක මට්ටමක පැවතුණි.

### ජනතා වතු සංවර්ධන මණ්ඩලය

### බදු ආදායමක් හිඟව පැවතීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි දීර්ඝ කාලීන බදු පදනම මත බාහිර පාර්ශවයන් වෙත නිදහස් කර තිබූ අතර, නියැදි පරීක්ෂාව අනුව එම බදු දේපළවලින් 2022 දෙසැම්බර් 31 දින වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත රු. මිලියන 196 ක බදු ආදායමක් හිඟව පැවතුණි.

### ඌන උපයෝජිත ඉඩම්වල වල වගා කිරීමට කටයුතු නොකිරීම

මණ්ඩලයේ හෙක්ටයාර ලේඛනය අනුව 2021 දෙසැම්බර් 31 දිනට , තේ හා අනෙකුත් භෝග වගා කරන වතු 15 ට අදාළව පවතින මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 10,126 ක් වන අතර ඉන් තේ වගාව සඳහා හෙක්ටයාර 3,545 ක්ද, අනෙකුත් වගාවන් සඳහා හෙක්ටයාර 705 ක්ද බැගින් හෙක්ටයාර 4,250ක් භාවිතා කර තිබුණි. ඉතිරි භූමි ප්‍රමාණය වන හෙක්ටයාර 5,876 ක් එනම් මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 58 ක ප්‍රමාණය ඌන උපයෝජනය වී තිබුණුද, එම ඌන උපයෝජිත ඉඩම්වල වගා කිරීමට හෝ බාහිර පාර්ශවයන්ට බදු දීමට හෝ මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

### හලාවත වැවිලි සමාගම

### වියදමට සරිලන ආදායමක් උපයා නොතිබීම

හලාවත වැවිලි සමාගමේ කිනියම වතුයායේ පරිනත පොල් වගාව ඇතුලත යටි වගාවක් ලෙස 2012 වර්ෂයේදී ස්ථාපිත කප්රුවන බීජ පොල් ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති හෙක්ටයාර 58 ක ඉඩම් නඩත්තු කිරීමට ආරම්භක දිනයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා රු. මිලියන 57 ක පිරිවැයක් දරා තිබුණද කප්රුවන බීජ පොල් ව්‍යාපෘතියට අදාලව උපයා තිබුණේ රු.මිලියන 3 කි. මේ අනුව ආදායම පිරිවැය සමග ගැලපීම් කල පසු තවදුරටත් රු. මිලියන 54 ක පිරිවැයක් ආවරණය කර ගැනීමට තිබුණි.

# පශු සම්පත් අංශය

## විගණන නිරීක්ෂණ

- මිල්කෝ පුද්ගලික සමාගම
    - මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනය
    - කර්මාන්තශාලාවේ තෙල් ටැංකි තුළට පොම්ප කර නොතිබුණ ඩීසල් තොග සඳහා ගෙවීම් කිරීම
    - ආයතනය වෙත නොපැමිණි ඩීසල් බව්සර් සඳහා ගෙවීම් කිරීම
    - නිකුත් කළ ඩීසල් ප්‍රමාණය හා ලැබූ ඩීසල් ප්‍රමාණය අතර නොසැසඳීමක් පැවතීම
    - දියර කිරි විකුණුම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවී තිබීම
    - උපයෝගී තාවය සැලකිල්ලට නොගෙන වත්කම් මිලට ගැනීම
    - කර්මාන්තශාලා වල මුළු ධාරිතාවය උපයෝජනයට නොගැනීම
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
    - කිරිගවයින් වෙනුවෙන් පෞද්ගලික රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබුණු රක්ෂණය වන්දි ලබාගෙන නොතිබීම
    - පොල් වෙන්දේසි වලදී නියමිත කාලය තුළ පොල් තොග ඉවත් කර නොගැනීම නිසා අයකර ගත යුතු මුදල් අයකර නොගැනීම
    - වෙනත් ආයතන වලින් ලබාගත් වාහන ධාවනයේ යොදවාගෙන තිබුනද එම වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු නොකිරීම
    - ගව ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් නිශ්කාර්යව තිබීම

# පශු සම්පත් අංශය

ශ්‍රී ලංකාව නාගරික ජනගහනයට වඩා ග්‍රාමීය ජනගහනයක් ජීවත්වන රටක් වන අතර ග්‍රාමීය ජනතාව බොහෝවිට ප්‍රාථමික කර්මාන්තයන්හි නියැලෙන පිරිසක් වේ. ඒ අනුව මෙම ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි හා සත්ව නිෂ්පාදන මිලදී ගැනීම ඒවා සඳහා හොඳ මිලක් ලබා දීම හා නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ප්‍රාථමික නිෂ්පාදන ද්විතීය නිෂ්පාදන බවට පරිවර්තනය කර ඒවා විදේශ වෙළඳ පොළ වෙත යොමු කිරීම ඊට සම්බන්ධ රාජ්‍ය ආයතන වල කාර්යභාරය විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයට අදාළ කාර්යභාරය පහත සඳහන් පරිදි විය.

- විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැළපෙන පරිදි පශු සම්පත් හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරි ගැන්වීම.
- පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ අපනයනය සඳහා දිරිගැන්වීම
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම
- මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් සහ ආයෝජන පහසුකම් සැපයීම
- රජය සතු සත්ත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිත කිරීමේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
- කුකුල් මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීම මගින් දේශීය නිෂ්පාදනය සහ පරිභෝජන අවස්ථා පුළුල් කිරීම.
- සත්ත්ව ගොවිපොළවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වාදීම
- පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැපයීම.

ඉහත කාර්යභාරය ඉටුකිරීම සඳහා මෙම අංශයට අදාළ රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හා රාජ්‍ය සමාගම් දෙකක් මගින් ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

### මිල්කෝ පුද්ගලික සමාගම

### මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනය

කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘති යටතේ නව යන්ත්‍රාගාරයක් සවිකිරීමෙන් පසු 2017 වර්ෂයේ ජූලි මාසයේදී නිෂ්පාදනය කර තිබුණු කිරිපිටි කිලෝග්‍රෑම් 771,652 ක් දෝෂ රහිත බවට පරීක්ෂණ වාර්තා නිකුත් කර විකුණා තිබුණ අතර පාරිභෝගික පැමිණිලි හේතුවෙන්

මිනිස් පරිභෝජනයට නුසුදුසු බැවින් නැවත ගබඩා වෙත ගෙන්වා ගෙන තිබුණි. ඒ අනුව රුපියල් මිලියන 475 ක් වටිනා කිරිපිටි කිලෝග්‍රෑම් 720,000 ක ප්‍රමාණයකින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සත්ත්ව ආහාර ලෙස විකිණීමෙන් පසු ඉතිරි කිලෝග්‍රෑම් 561,264 ක් 2022 දෙසැම්බර් 31 දින අඹේවෙල කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි. නමුත් මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

### කර්මාන්තශාලාවේ තෙල් ටැංකි තුළට පොම්ප කර නොතිබුණ ඩීසල් තොග සඳහා ගෙවීම් කිරීම

මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කර්මාන්තශාලාවේ 2015 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඩීසල් තොග ආයතනය වෙත නිකුත් කර තිබුණු නමුත් රු. මිලියන 17 ක වටිනාකමින් යුත් ඩීසල් ලීටර් 165,300 ක ප්‍රමාණයක් මිල්කෝ ආයතනයේ තොග පොත් අනුව අදාළ කර්මාන්තශාලාවේ තෙල් ටැංකි තුළට **පොම්ප** කර නොතිබුණ ද ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

### ආයතනය වෙත නොපැමිණි ඩීසල් බව්සර් සඳහා ගෙවීම් කිරීම

2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා ඉන්ධන තොග කර්මාන්තශාලාව වෙත ලැබීමේ ආරක්ෂක අංශයේ ලේඛන පරීක්ෂාවේදී රු.මිලියන 9ක් වටිනා ඩීසල් ලීටර් 92,400ක ප්‍රමාණයක් රැගත් බවුසර් රථ 14 ක ප්‍රමාණයක් කර්මාන්තශාලාව තුළට පැමිණ නොතිබූ බව නිරීක්ෂණය වුව ද ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

### නිකුත් කළ ඩීසල් ප්‍රමාණය හා ලැබූ ඩීසල් ප්‍රමාණය අතර නොසැසඳීමක් පැවතීම

මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ 2019 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා කර්මාන්තශාලාවේ ඇති විදුලි ජනක යන්ත්‍රය සඳහා අවශ්‍ය ඩීසල් ටැංකි වලින් නිකුත් කිරීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඩීසල් තොග විදුලි ජනක යන්ත්‍රය වෙත නිකුත් කර ඇති බවට ඩීසල් තොග පොත්වල සඳහන් කර ඇතත් ඉංජිනේරු අංශය විසින් ලබාදුන් වාර්තා අනුව නිකුත් කළ ඩීසල් ප්‍රමාණය හා ලැබූ ඩීසල් ප්‍රමාණය අතර ඩීසල් ලීටර් 58,703 ක ප්‍රමාණයක් අස්ථානගතවී තිබුණි.

### දියර කිරි විකුණුම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවී තිබීම

2020 , 2021 හා 2022 යන වර්ෂ වලදී සත්‍ය දියර කිරි විකුණුම් ප්‍රමාණය පිළිවෙළින් ලීටර් 17,891,573 ලීටර් 20,705,024 ලීටර් 16,012,534 ක් විය. දියර කිරි විකුණුම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර වර්තමාන වෙඳෙපොළ ප්‍රවණතාවය දියර කිරි පරිභෝජනය වුවත් ඒ පිළිබඳ කළමනාකරණය අවධානය යොමුකර දියර කිරි නිෂ්පාදනය වැඩි කරගැනීම සඳහා යොමුවී නොතිබුණි.

### උපයෝගී තාවය සැලකිල්ලට නොගෙන වත්කම් මිලට ගැනීම

සමාගමට අයත් කොළඹ කර්මාන්තශාලාව සඳහා 2011 ජනවාරි 20 දින කල්බදු පදනම මත මිලදීගත් රු. මිලියන 104 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය වසර 12 ක කාලයක සිට සහ වටිනාකම රු. මිලියන 2 ක් වූ කිරි නිෂ්පාදන යන්ත්‍රෝපකරණ 4 ක් වසර 4 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. සමාගමට අයත් දිගන කිරි කර්මාන්තශාලාවේ පවතින ස්ටීරියලයිස්ඩ් කිරි බෝතල් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය හා කොළඹ කිරි කර්මාන්තශාලාවේ රු. මිලියන 15 ක් වූ අයිස්ක්‍රීම් බඳුන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය පිළිවෙලින් සියයට 71 ක් හා සියයට 46 ක් වූ මට්ටමක ඌන උපයෝජිතව පැවතුණි.

### කර්මාන්තශාලා වල මුළු ධාරිතාවය උපයෝජනයට නොගැනීම

අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ පැරණි සහ නව නිෂ්පාදනාගාරයන්හි සමස්ත ධාරිතාවය ලීටර් 9,300,000 ක් වුව ද 2020, 2021 හා 2022 අගෝස්තු දක්වා විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සාමාන්‍ය ධාරිතා උපයෝජනය පිළිවෙලින් ලීටර් 3,052,858 ක්, ලීටර් 2,675,819 ක් හා ලීටර් 1,690,560 ක් වූ අතර එය මුළු ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 33 ක්, 29 ක් හා 18 ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි.

### ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය කිරිගවයින් වෙනුවෙන් පෞද්ගලික රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබුණු රක්ෂණය වන්දි ලබාගෙන නොතිබීම

කිරිගවයින් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2013 වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සඳහා ආනයනය කරන ලද කිරිගවයින් වෙනුවෙන් පෞද්ගලික රක්ෂණ සමාගමකින් රක්ෂණයක් ලබාගෙන තිබුණි. නමුත් 2013 වර්ෂයේ සිට මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි වූ රු.මිලියන 19 ක් 2022 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### පොල් වෙන්දේසි වලදී නියමිත කාලය තුළ පොල් තොග ඉවත් කර නොගැනීම නිසා අයකර ගත යුතු මුදල් අයකර නොගැනීම

පොල් සංවර්ධන අධිකාරිය මඟින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී එම අධිකාරිය විසින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව නියමිත කාල තුළදී පොල් තොග ඉවත් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් තැරැව්කරුවන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයට අයවිය යුතු අවුරුදු 5 ට වැඩි හිඟ ශේෂ රු.මිලියන 18 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට පියවරන් ගෙන නොතිබුණි.

**වෙනත් ආයතන වලින් ලබාගත් වාහන ධාවනයේ යොදවාගෙන තිබුනද එම වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු නොකිරීම**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් අනෙකුත් අමාත්‍යාංශවලට අයත් වාහන 42 ක්ද , කොවුල්වැව පුද්ගලික සමාගමට අයත් වාහන 01 ක් ද, ඉඩම් ගොඩකිරීමේ කොමිසමට අයත් වාහන 02 ක් ද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන 09 ක් ද, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමට අයත් වාහන 05ක් ද ලෙස වෙනත් ආයතන වලින් ලබාගත් වාහන ධාවනයේ යොදවාගෙන තිබුනද එම වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**ගව ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් නිශ්කාර්යව තිබීම**

පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදී ගව ආහාර ටොන් 3.75 ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4 ක් පවතී. එබැවින් මසකට ගව ආහාර මෙ.ටො 900 ක් වන ලෙස වර්ෂයකට මෙට්‍රික් ටොන් 10,800 ක් නිෂ්පාදනය කළ හැකි වුවද යන්ත්‍ර වසරක කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

# රක්ෂණ අංශය

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
    - රක්ෂණ කර්මාන්තයේ මුළු වටිනාකම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතා පහල අගයක් ගැනීම
    - රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදල මත වන අතිරික්තය සඳහා කොමිෂන් සභාව විසින් ආදායම් බදු නොගෙවීම
    - මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා කාර්යසාධන දීමනා ගෙවීම
    - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වීම
- ජාතික රක්ෂණහාර අරමුදල් මණ්ඩලය
    - නීති ප්‍රකාරව ලියාපදිංචි නොවූ රක්ෂණ තැරැව්කරුවෙකු වෙත ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් සිදු කිරීම
    - ප්‍රතිරක්ෂණය තැරැව්කාර සමාගම ගිවිසුමෙන් ඉවත් වීම මත ප්‍රතිරක්ෂණ ආවරණයකින් තොරව ආයතනය පවත්වාගෙන යාම
    - සමාගම් වෙත ගෙවිය යුතු ලෙසට හඳුනා ගෙන තිබූ මුදල් නොගෙවා සිටීම මත එකී ආයතන විසින් ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික මුදල් නොගෙවීම
    - ලැබිය යුතු ප්‍රතිරක්ෂණ සහ ප්‍රතිරක්ෂණ අලාභ සටහන් කිරීම සඳහා නිසි කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොතිබීම
- අග්‍රහාර වෛද්‍ය රක්ෂණය
    - ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීම
    - ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමේදී සිදු කර තිබූ නීති විරෝධී ක්‍රියා නිසා රජයට අලාබ සිදු කර තිබීම
    - මණ්ඩලය අධිභාර බදු පනත අනුව අධිභාර බද්දට යටත් නොවන නමුත් අධිභාර බදු ගෙවා තිබීම
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

# රක්ෂණ අංශය



ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය රක්ෂණ සමාගම් හා ආයතන 28 ක්, රක්ෂණ තැරැව්කරුවන් 78 ක්, අලාභ ගැලපුම්කරුවන් 31 ක් හා ආසන්න වශයෙන් 45,000 ක් පමණ වන රක්ෂණ නියෝජිතයන් ප්‍රමාණයකින් සමන්විත වේ. මෙම කර්මාන්තයට අදාල නියාමන ආයතනය ලෙස 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද රක්ෂණ නියාමන කොමිෂන් සභාව කටයුතු කරයි.

ඉහත රක්ෂණ අංශයට අදාළ ආයතන මගින් කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ කර්මාන්තයේ මුළු වටිනාකම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතා පහල අගයක් ගැනීම

රක්ෂණ කර්මාන්තයේ මුළු වටිනාකම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.4 ක් පමණ වේ. එය කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් ගත් කල ඉතා පහල අගයක් බව නිරීක්ෂණය විය. මෙම තත්වයට හේතු හඳුනා ගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

### වැඩ වර්ජන, කැරලි ගැසීම්, ජන කැලඹීම් හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා සිදුවන හානි රක්ෂණය සඳහා ප්‍රාථමික රක්ෂණ සමාගම වලින් අය විය යුතු මුදල අය කර නොතිබීම

1989 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා 2008 මාර්තු 25 දිනැති ගැසට් නිවේදනය අනුව, වැඩ වර්ජන, කැරලි ගැසීම්, ජන කැලඹීම් හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා සිදුවන හානි රක්ෂණය සඳහා ප්‍රාථමික රක්ෂණ සමාගම් විසින් නිකුත් කරනු ලබන සියලුම රක්ෂණ ආවරණ මගින් ලබා ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබාගත යුතුයි. නමුත් රක්ෂණ භාර අරමුදල විසින් ඒ අනුව කටයුතු නොකර මෝටර් රක්ෂණයෙන් සියයට 12ක ද, මෝටර් නොවන රක්ෂණයෙන් සියයට 80ක ප්‍රතිශතයක්ද පමණක් අරමුදලට අයකරගෙන තිබීම නිසා පසුගිය වර්ෂ 17ක කාලය තුළ අරමුදලට සිදුව තිබූ අලාභය ආසන්න වශයෙන් රුපියල් මිලියන 5,100ක් විය.

### රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදල මත වන අතිරික්තය සඳහා කොමිෂන් සභාව විසින් ආදායම් බදු නොගෙවීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂක අරමුදල මත වන අතිරික්තය සඳහා කොමිෂන් සභාව විසින් ආදායම් බදු ගෙවිය යුතු නමුත් 2018 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවා නොතිබුණි. ඒ අනුව 2018 සිට 2022 වර්ෂය දක්වා බදු හා බදු නොගෙවීම මත වන දඩ ලෙස රු. මිලියන 909 ක් 2022 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණි.

### මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා කාර්යසාධන දීමනා ගෙවීම

මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන, 2010 වර්ෂයේ සිට එක් මුලික වැටුපක් කාර්යසාධන දිරි දීමනා ලෙස ගෙවා තිබූ අතර 2018 වර්ෂයේ සිට එය දළ වැටුපෙන් මාස එක හමාරක් ලෙස වෙනස් කර ගෙවා තිබුණි. මේ හේතුවෙන් මුළු කාර්යසාධන දීමනා ගෙවීම සියයට 105 කින් ඉහල ගොස් තිබුණි. තවද මෙම කාර්යසාධන දීමනා ගෙවීමට අදාලව තාත්වික කාර්යසාධන ඇගයීමක්ද සිදු කර නොතිබුණි. 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ගෙවන ලද මුළු කාර්යසාධන දීමනාවල එකතුව රු.මිලියන 50 ක් විය.

### මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වීම

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො.මිලියන 13.8ක් රක්ෂණ ක්ෂේත්‍රය සඳහා වෙන් කර තිබුණි. නමුත් විවිධ හේතු නිසා මෙම ව්‍යාපෘතියට අදාල අරමුණු ඉටු කර ගැනීමට නොහැකිව අවසන් කර තිබුණි.

### ජාතික රක්ෂණහාර අරමුදල් මණ්ඩලය

### නිති ප්‍රකාරව ලියාපදිංචි නොවූ රක්ෂණ තැරැව්කරුවෙකු වෙත ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ගෙවීම් සිදු කිරීම

රක්ෂණය විධිමත් කිරීමේ පනතේ නියමය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු රක්ෂණ මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තැරැව්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නෙකු නම් සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන්නේ නම් මිස රක්ෂණ තැරැව්කරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම හෝ එලෙස පෙනී සිටීම නොකල යුතු බව දන්වා තිබියදී එකී නිති ප්‍රකාරව ලියාපදිංචි නොවූ රක්ෂණ තැරැව්කරුවෙකු වෙත 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා රු. මිලියන 1,204 ක් ගෙවීම් කර තිබුණි.

### ප්‍රතිරක්ෂණය තැරැව්කාර සමාගම ගිවිසුමෙන් ඉවත් වීම මත ප්‍රතිරක්ෂණ ආවරණයකින් තොරව ආයතනය පවත්වාගෙන යාම

2023 ජූලි 31 දින දක්වා මාස 18 ක කාලයකට ප්‍රතිරක්ෂණය කිරීම සඳහා තෝරා ගත් තැරැව්කාර සමාගම මගින් ඒකපාර්ශවීයව 2022 අප්‍රේල් 21 දින ගිවිසුමෙන් ඉවත් වීම නිසා එදින සිට 2022 අගෝස්තු 01 දින දක්වා ප්‍රතිරක්ෂණ ආවරණයකින් තොරව ආයතනය පවත්වාගෙන ගොස් තිබුණ අතර එකී කාලයට රු. මිලියන 516ක මුදලක් එම ආයතනය වෙත ගෙවා තිබුණි. නමුත් එම තැරැව්කාර සමාගමට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති වීම නිසා අරමුදල දැඩි අවධානම් තත්වයකට පත්වී තිබුණි.

### සමාගම් වෙත ගෙවිය යුතු ලෙසට හඳුනා ගෙන තිබූ මුදල් නොගෙවා සිටීම මත එකී ආයතන විසින් ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික මුදල් නොගෙවීම

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත ගෙවිය යුතු ලෙසට හඳුනා ගෙන ලිපිගොනු වැඩ අවසන් කර ඇති රු.මිලියන 72 ක මුදල අදාල ආයතන වෙත නොගෙවීම හේතුවෙන් එම සමාගම් විසින් අරමුදලට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික මුදල්

රු. මිලියන 2,046ක මුදලක් 2022 ජනවාරි සිට 2023 මාර්තු 31 දක්වා වූ මාස 15 ක කාලයක් රඳවා ගෙන තිබුණි.මේ නිසා අරමුදලට අහිමි වූ පොලී ආදායම රු. මිලියන 568 ක් විය.

### ලැබිය යුතු ප්‍රතිරක්ෂණ සහ ප්‍රතිරක්ෂණ අලාභ සටහන් කිරීම සඳහා නිසි කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොතිබීම

ලැබිය යුතු ප්‍රතිරක්ෂණ ශේෂ රු. මිලියන.3,284 සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ අලාභ සටහන් කිරීම සඳහා නිසි කළමණාකරණ තොරතුරු පද්ධතියක් නොතිබීම නිසා ප්‍රතිරක්ෂණ වාරික කාලීනව එකතු කිරීම සහ ප්‍රතිරක්ෂණ අලාභ ගෙවීම ගැටළු සහගත තත්වයක පැවතුණි.

### අග්‍රහාර වෛද්‍ය රක්ෂණය

### ප්‍රතිලාභ ගෙවීම ප්‍රමාද වීම

අග්‍රහාර හිමිකම් ප්‍රතිලාභ ගෙවීමේ අයදුම්පත්‍ර භාරගත් දින අනුව අනුපිළිවෙළට ලියාපදිංචි කර භාර නොගැනීම, භාරගන්නා අවස්ථාවේදී එහි නිරවද්‍යතාවය පරීක්ෂා කර භාර නොගැනීම, භාර ගත් බවට ලිඛිත තහවුරුවක් ලබා නොදීම හා පරිගණක පද්ධතියේ දුර්වලතාවන් හා අභ්‍යන්තර පාලනයේ ගැටළු යනාදී කරුණු හේතුවෙන් අයදුම්පත් සඳහා කාර්යක්ෂම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හා ගෙවීමේ ක්‍රියාවලියක් නොමැති වීමෙන් අග්‍රහාර ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් දීර්ඝ ප්‍රමාදයක් පැවතුණි. එම ප්‍රමාදය සාමාන්‍යයෙන් දින 200 සිට දින 240 ක පමණ කාලයක් විය.

### ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමේදී සිදු කර තිබූ නීති විරෝධී ක්‍රියා නිසා රජයට අලාභ සිදු කර තිබීම

2016 වර්ෂයේදී ස්වභාවික විපත් රක්ෂණය ආවරණය කිරීම සඳහා රජයේ අරමුදල් යටතේ රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. නමුත් අරමුදල් භාවිතා කර ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමේදී සිදු කර තිබූ නීති විරෝධී ක්‍රියා නිසා රජයට රු. මිලියන 4,400ක අලාභයක් සිදු කර තිබුණි. එම හේතුවෙන් ප්‍රධාන විධායක නිළධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී මුදල් යන අය සේවයෙන් ඉවත් කර තිබුණද, අරමුදලට සිදුවූ අලාභ අයකර ගැනීමට හෝ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොතිබුණි.

### මණ්ඩලය අධිභාර බදු පනත අනුව අධිභාර බද්දට යටත් නොවන නමුත් අධිභාර බදු ගෙවා තිබීම

මණ්ඩලය විසින් අධිභාර බදු ලෙස රු.මිලියන 1,196 ක් සමාලෝචිත වර්ෂයේ දී වැඩවර්ජන කැරලි කොලාහල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් දේශීය අදායම් දෙපාර්ථමේන්තුව වෙත ගෙවා තිබුණි. නමුත් මණ්ඩලය 2022 අංක 14 දරණ අධිභාර බදු පනත අනුව අධිභාර බද්දට යටත් නොවන අතර මේ හේතුවෙන් අරමුදලට එම මුදල් ආයොජනයන් ලබා ගත හැකිව තිබූ රු. මිලියන 275 ක ආයෝජන ආදායමක් අහිමි වී තිබුණි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සංස්ථාවේ සාමාන්‍ය රක්ෂණ අංශයේ සහ ජීවිත රක්ෂණ අංශයේ වෙළඳපල කොටස

2021 වර්ෂයේදී සාමාන්‍ය රක්ෂණ අංශයේ වෙළඳපල කොටස සියයට 18.74 ක් වන අතර 2020 වසරට සාපේක්ෂව එය සියයට 0.34 කින් සුළු වර්ධනයක් සිදුවී ඇත. 2021 වර්ෂය සඳහා ජීවිත රක්ෂණ අංශයේ වෙළඳපොළ කොටස සියයට 17.62 ක් වන අතර 2020 වසරට සාපේක්ෂව සියයට 1.08 කින් අඩු වී ඇත.

# බැංකු අංශය

## විගණන නිරීක්ෂණ

- බැංකු අංශයේ වත්කම්
- බැංකු අංශයේ වගකීම්
- බැංකු අංශයේ වත්කම් හා වගකීම් සංයුතිය
- බැංකු අංශයේ තැන්පතු සංයුතිය
- ශ්‍රී ලංකා මහ බැංකුව
    - ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් අලාභයක් සිදු වී තිබීම
- ලංකා බැංකුව
- 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පසුබෑම
    - ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරන ගාස්තු ඉහළ යාම
    - ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව මුළු ණය සහ අත්තිකාරම් ශේෂයන් සැලකිය යුතු අගයක් ගෙන තිබීම
- මහජන බැංකුව
    - රජය සතු ව්‍යවසායන්ට ලබා දී ඇති ණය හා අත්තිකාරම් බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් වලින් සැලකිය යුතු කොටසක් වීම
    - අපේක්ෂිත ප්‍රතිඵල ළඟා නොවීම හේතුවෙන් දත්ත ගබඩා කිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
    - බැංකුවේ පොළී ආදායම වැඩි වීමට සාපේක්ෂව පොළී වියදම වැඩි වීම
    - බැංකුව රජයේ සුරුකුම්පත් වල ආයෝජනය මුළු ආයෝජන වලින් සැලකිය යුතු අගයක් වීම
    - මුළු අක්‍රිය ණය සහ අත්තිකාරම් සැලකියයුතු අගයකින් ඉහළ යාම
    - ජාතික ඉතිරිකිරීම් බැංකු පනතින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් සඳහා බැංකුව මගින් ණය ලබා දීම

- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
    - සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ලබා දී ඇති ණය සහ අත්තිකාරම්
    - කොරතුරු පද්ධති අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් වන පාලන 5 ක් බැංකුව විසින් අනුගමනය කර නොතිබීම
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
    - උපයන විට ගෙවීම් බද්ද අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර ගෙවා තිබීම
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
    - පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට අනුරූපව මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීම
    - අක්‍රීය ණය ශේෂ

# බැංකු අංශය



නිදහසින් පසු ඇති වූ උග්‍රතම ආර්ථික අර්බුදයෙන් පැන නැගුණු අභියෝගයන්ට මුහුණ දීමට 2022 වසර තුළ දී මූල්‍ය පද්ධතියට හැකි විය. සියලුම ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම, බැංකු අංශය රාජ්‍ය අංශය වෙත වැඩි වශයෙන් නිරාවරණය වීම, ආර්ථිකය සංකෝචනය විම, උග්‍ර විදේශ විනිමය හිඟය සහ 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ද්විපාර්ශවික සහ වාණිජ ණය මත විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ නිවේදනයත් සමඟ ඉහළ මට්ටමක පැවති උද්ධමනය, මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් කෙරෙහි පෙර නොවූ දැඩි අහිතකර බලපෑමක් ඇති කළ අතර මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ද අභියෝගයට ලක් කළේය. කේසේ වුවද, ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාව මත ඇති වූ උග්‍ර පීඩනය, ඉහළ ණය හානිකරණය හේතුවෙන් ලාභදායීත්වය අඩු මට්ටමක පැවතීම සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කර ගැනිමට ප්‍රාග්ධන ස්වාරක්ෂක පිරිහීම හේතුවෙන් පැන නගින අභියෝග මධ්‍යයේ වුවද 2022 වසර තුළ දී බැංකු අංශයේ ස්ථායීතාව පවත්වා ගැනිමට හැකි විය.

### බැංකු අංශයේ වත්කම්

2022 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ථ වත්කම්වලින් සියයට 61.9කට හිමිකම් වාර්තා කරමින් බැංකු අංශය, මූල්‍ය අංශයේ මූලිකත්වය දරනු ලැබීය. බැංකු අංශයේ වත්කම් පදනම 2022 වසර තුළ රුපියල් ට්‍රිලියන 2.6 කින් ඉහළ ගිය අතර 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 15.1ක වර්ධනයට සාපේක්ෂව සියයට 15.4ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 19 ඉක්මවිය. මාර්තු සහ අප්‍රේල් මාස වලදී ශ්‍රී ලංකා රුපියල් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 44.1කින් අවප්‍රමාණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ මුදලින් නාමනය කරන ලද වත්කම්වල වර්ධනයක් ඇති විය. කෙසේ වුවද, පැවති දැඩි මුදල් ප්‍රතිපත්තිය හමුවේ 2021 වසරේ දී පැවති සියයට 14.5 ණය හා අත්තිකාරම්වල වර්ධනය 2022 වසරේ දී සියයට 5.7ක් දක්වා පහළ ගියේය. මේ අතර ආයෝජනවල 2021 වසර අවසානයේ සියයට 16.4 සිට 2022 වසර අවසානය වන විට සියයට 19.4ක් දක්වා වැඩි විය.

### බැංකු අංශයේ වගකීම්

අරමුදල් සැපයිමේ ප්‍රධාන ප්‍රභවය ලෙස තැන්පතු අඛණ්ඩව පැවති අතර එය 2022 වසර අවසානය වන විට මුළු වගකීම්වලින් සියයට 78.8ක් වූ අතර, ණය ගැනීම් මුළු වගකීම්වලින් සියයට 9.6කට දායක විය. 2022 වසර තුළ දී සිදු වූ සමස්ත තැන්පතුවල වර්ධනයට කාලීන තැන්පතු ප්‍රධාන වශයෙන් දායක වූ අතර සමස්ත තැන්පතුවලට කාලීන තැන්පතු දැක්වූ දායකත්වය 2021 වසරේ දී සියයට 61.0ක සිට 2022 වසර අවසන් වන විට සියයට 67.9ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2022 වසර

අවසන් වන විට සමස්ථ තැන්පතුවලින් ඉතුරුම් තැන්පතු හා කාලීන තැන්පතු, පිළිවෙළින් සියයට 24.3ක් සහ සියයට 6.9ක් විය.

බැංකු අංශයේ සමස්ථ ණය ගැනීම් 2021 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 462,800ක, එනම් සියයට 27.1ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් මිලියන 300,400ක එනම් සියයට 13.8ක පහත වැටීමක් පෙන්නුම් කළේය.

## බැංකු අංශයේ වත්කම් හා වගකීම් සංයුතිය

| අයිතමය | 2021 (අ) | | 2022 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2021 (අ) | 2022 (ආ) |
| වත්කම් | | | | | | |
| ණය සහ අත්තිකාරම් | 10,726.7 | 63.8 | 11,337.9 | 58.4 | 14.5 | 5.7 |
| ආයෝජන | 4,968.5 | 29.5 | 5,934.3 | 30.6 | 16.4 | 19.4 |
| වෙනත් (ඇ) | 1,131.0 | 6.7 | 2,144.3 | 11.0 | 15.0 | 89.6 |
| වගකීම් | | | | | | |
| තැන්පතු | 12,879.2 | 76.5 | 15,299.1 | 78.8 | 13.3 | 18.8 |
| ණය ගැනුම් | 2,172.9 | 12.9 | 1,872.5 | 9.6 | 27.1 | -13.8 |
| ප්‍රාග්ධන අරමුදල් | 1,348.3 | 8.0 | 1,593.4 | 8.2 | 13.1 | 18.2 |
| වෙනත් | 425.8 | 2.5 | 651.5 | 3.4 | 20.4 | 53.0 |
| **මුළු වත්කම්/වගකීම්** | **16,826.2** | **100.0** | **19,416.6** | **100.0** | **15.1** | **15.4** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වගුව **05** - බැංකු අංශයේ වත්කම් හා වගකීම් සංයුතිය

## බැංකු අංශයේ තැන්පතු සංයුතිය

| අයිතමය | 2021 (අ) | | 2022 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2021 (අ) | 2022 (ආ) |
| ඉල්ලුම් තැන්පතු | 888.0 | 6.9 | 1,060.0 | 6.9 | 25.9 | 19.4 |
| ඉතුරුම් තැන්පතු | 4,011.8 | 31.1 | 3,713.0 | 24.3 | 19.7 | -7.4 |
| ස්ථාවර තැන්පතු | 7,860.4 | 61.0 | 10,393.0 | 67.9 | 8.6 | 32.2 |
| වෙනත් තැන්පතු | 118.9 | 0.9 | 133.2 | 0.9 | 80.0 | 12.0 |
| **මුළු තැන්පතු** | **12,879.2** | **100.0** | **15,299.1** | **100.0** | **13.3** | **18.8** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වගුව 06 - බැංකු අංශයේ තැන්පතු සංයුතිය

බැංකු අංශයට අයත් පහත සඳහන් මූල්‍ය ආයතන මගින් සිය කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ශ්‍රී ලංකා මහ බැංකුව

#### ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් අලාභයක් සිදු වී තිබීම

නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුවකු සමඟ ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් බැංකුවේ දෙපාර්තමේන්තු හතරක් විසින් කළමනාකරණය කරන අරමුදල් වලට 2018 දෙසැම්බර් 10 දිනට රු. මිලියන 2,586 ක අලාභයක් සිදු වී තිබුණි. 2020 සැප්තැම්බර් 18 දිනට එම ප්‍රාථමික අළෙවිකරුගෙන් ලැබිය යුතු ලෙස නැවත වර්ගීකරණය කරන ලද ආයෝජනයේ වටිනාකම රු. මිලියන 2,954 ක් විය. එම ලැබිය යුතු මුදල ආදල ප්‍රාථමික අළෙවිකරුගෙන් අයකර ගැනීමට බැංකුව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.

### ලංකා බැංකුව

#### 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පසුබෑම

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 31,972ක ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ ලාභය රු.මිලියන 37,590ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 5,618ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව පොලී වියදම සියයට 121 කින් ඉහළ යෑම හා ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරන ගාස්තු සියයට 99 කින් ඉහළ යෑම හේතු වී තිබුණි.

#### ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරන ගාස්තු ඉහල යාම

ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරන ගාස්තු පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 43,422 කින් හෙවත් සියයට 99.3කින් ඉහළ ගොස් තිබුණි. 2022 වසරේදී ශ්‍රී ලංකාවේ අයහපත් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ, ලාභදායිත්වය අඩු වූ සේවා හා නිෂ්පාදන අඩපන වීම ඇතුළුව ගනුදෙනුකරුවන් බහුවිධ ආර්ථික පසුබෑම්වලට මුහුණුදීම් සහ රජය සහ රාජ්‍ය ව්‍යවසායයන් සඳහා විදේශ මුදලින් ප්‍රදානය කරන ලද ණය මුදල් සහ විදේශ මුදලින් සිදුකරන ලද ආයෝජන මත කරන ලද වෙන්කිරීම් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

#### ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව මුළු ණය සහ අත්තිකාරම් ශේෂයන් සැලකිය යුතු අගයක් ගෙන තිබීම

2022 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව රු.මිලියන 33,784 ක් වූ අතර එය එදිනට මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 1.45 ක ප්‍රතිශතයක් විය.

## මහජන බැංකුව

### රජය සතු ව්‍යවසායන්ට ලබා දී ඇති ණය හා අත්තිකාරම් බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් වලින් සැලකිය යුතු කොටසක් වීම

2022 වසර අවසානය වන විට රජය සතු ව්‍යවසායන්ට ලබා දී ඇති ණය හා අත්තිකාරම් රු.මිලියන 871,619 ක් වූ අතර එය 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් වලින් සියයට 45.5ක ප්‍රතිශතයකි. 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු අනෙකුත් ලැබීම් රු.මිලියන 1,024,096ක් වූ අතර, ඒ අනුව බැංකුවේ මුළු වත්කම් වලින් සියයට 63.79ක ප්‍රතිශතයක් රජය හා රජය සතු ව්‍යවසායන් නියෝජනය කරයි.

### අපේක්ෂිත ප්‍රථිඵල ළඟා නොවීම හේතුවෙන් දත්ත ගබඩා කිරිමේ ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම

දත්ත ගබඩා කිරිමේ ව්‍යාපෘතිය සඳහා 2022 මැයි 30 දින වන විට රු. මිලියන 402 ක වියදමක් දරා ඇතත් අපේක්ෂිත ප්‍රථිඵල ළඟා නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය නතර කිරීමට විධායක මෙහෙයුම් කමිටුව තීරණය කර තිබුණි.

## ජාතික ඉතිරිකිරිමේ බැංකුව

### බැංකුවේ පොළී ආදායම වැඩි වීමට සාපේක්ෂව පොළී වියදම වැඩි වීම

අඩු පොළී අනුපාතයක් පැවති කාලයේදි බැංකුව විසින් වැඩි ණය හා අත්තිකාරම් ප්‍රමාණයක් ලබා දී තිබුනේ ස්ථාවර පොළී අනුපාත යටතේ නිසා එම ණය හා අත්තිකාරම් නැවත මිළ කිරිමට බැංකුවට අපහසු වීමත් ජාතික ඉතිරිකිරිමේ බැංකු පනතේ අවශ්‍යතාවය පරිදි බැංකුවේ මුළු තැන්පතු හා ඒ මත පොළියෙන් සියයට 60 ක් රජයේ සුරුකුම් පත් වල ආයෝජනය කළ යුතු බැවින් වැඩි ප්‍රතිලාභ අපෙක්ෂාවෙන් දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර වල කරන ලද ආයෝජනද නැවත මිළ කිරීමක් සිදු නොවිම නිසා 2022 වර්ෂයේ බැංකුවේ පොළී වියදම වැඩි වීමට සාපේක්ෂව, පොළී ආදායම වැඩි නොවිය. ඉහත සියළු හේතුන්වල ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේදි බැංකුවේ ශුද්ධ පොළී ආදායම සියයට 40.6කින් අඩු වි තිබුණි.

### බැංකුව රජයේ සුරුකුම්පත් වල ආයෝජනය මුළු ආයෝජන වලින් සැලකිය යුතු අගයක් වීම

2022 වර්ෂය තුලදි බැංකුව රජයේ සුරුකුම්පත් වල රු .මිලියන 822,398 ක් ආයෝජනය කර තිබුණ අතර මෙය පසුගිය වර්ෂයේදි රු.මිලියන 835,444ක් විය. රජයේ සුරුකුම්පත් වල ආයෝජනය, බැංකුවේ මුළු ආයෝජනයන්ගෙන් සියයට 85 ක් පමණ වන අතර මෙය මුළු වත්කම් වලින් සියයට 50.9ක් පමණ විය.

### මුළු අක්‍රීය ණය සහ අත්තිකාරම් සැලකියයුතු අගයකින් ඉහල යාම

බැංකුවේ මුළු අක්‍රීය ණය අනුපාතය 2021 වසරේ සියයට 2.97 සිට 2022 වසරේ දී සියයට 3.99 දක්වා වර්ධනය වූ අතර මුළු අක්‍රීය ණය සහ අත්තිකාරම් වලින් හානිකරණය සඳහා වෙන් කිරිමේ අනුපාතය පසුගිය වසරේ සියයට 73.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 75.2 දක්වා වර්ධනය වි තිබුණි.

### ජාතික ඉතිරිකිරීම් බැංකු පනතින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් සඳහා බැංකුව මගින් ණය ලබා දීම

2022 දෙසැම්බර් 31 දිනට, මුළු ණය හා අත්තිකාරම් වලින් රු.මිලියන 4,178ක් විදේශ ණය වන අතර මෙම සමස්ථ ණය මුදල තුල අන්තර්ගත වන්නේ, 2018 වර්ෂයේදී මාලදිවයිනේ පුද්ගලික සමගමකට ලබාදී තිබූ ඇමරිකන් ඩොලර් මිලියන 9ක් සහ 2022 දෙසැම්බර් 31 දිනට ඒ මත ගණනය කරන ලද හිඟ පොළිය වේ. විදේශ රටක සංචාරක කර්මාන්තයේ නියැලී සිටින පෞද්ගලික සමාගමකට ඉදිකිරීම් කටයුතු සඳහා ණය ලබා දීම, ජාතික ඉතිරිකිරීම් බැංකු පනතින් ආවරණය නොවන ක්ෂේත්‍රයක් විය.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ලබා දී ඇති ණය සහ අත්තිකාරම්

සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව 2022 දෙසැම්බර් 31 දිනට ලබා දී ඇති මුළු හිඟ ණය වටිනාකම රු. මිලියන 13,777ක් වූ අතර ඉන් රු. මිලියන 9,100ක මුදලක් අක්‍රීය ලෙස වර්ගීකරණය කර තිබූ අතර එය මුළු හිඟ ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 66.05ක් නියෝජනය කරයි. තවද, EPF අරමුදල්/ ණය පද්ධතියෙ වාර්තා මකා දැමීම හේතුවෙන් 2022 කාල සීමාව සඳහා EPF ගනුදෙනුකරුවන් 70 දෙනෙකුගේ සමස්ත හිඟ මුදල් රු. මිලියන 3 ක් ගෙවීම මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

### තොරතුරු පද්ධති අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් වන පාලන 5 ක් බැංකුව විසින් අනුගමනය කර නොතිබීම

බැංකු පනතේ උපදෙස්වලට අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා මූලික ආරක්ෂක ප්‍රමිතිය ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, තොරතුරු පද්ධති අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් වන පාලන 5ක් බැංකුව විසින් අනුගමනය කර නොතිබුණි. තවද, ආරක්ෂක වසම් 14 ක පාලන 95න්, 2022 වර්ෂය තුළ බැංකුව විසින් පාලන 45කට පමණක් අනුකූල වී තිබුණි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

### උපයන විට ගෙවීම් බද්ද අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර ගෙවා තිබීම

ආදායම් බදු ගෙවීමට බැඳී සිටින එක් එක් සේවකයාගේ කැමැත්ත මත රැකියාවෙන් ලැබෙන ආදායම් සහ ලාභ වලින් සෑම සේවා යෝජකයෙකුම ආදායම් බද්ද අඩු කිරීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, 2016 අප්‍රේල් 29 වැනි දිනැති පොදු ව්‍යවසාය චක්‍රලේඛයට පටහැනිව, බැංකුව විසින් 2022 වසර සඳහා රු.මිලියන 43 ක උපයන විට ගෙවීම් බද්දක් අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර බැංකුව මඟින් ගෙවා තිබුණි.

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට අනුරූපව මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීම

සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු ගෙවීමට පෙර ලාභය රු.මිලියන 89ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 405ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 494 න් අඩු වී තිබුණි. ශුද්ධ පොලී අදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 16 න් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

#### අක්‍රීය ණය ශේෂ

2022 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ණය ශේෂ 10 හි එකතුව රු.මිලියන 175ක් වූ අතර එය එදිනට මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සියයට 0.3ක ප්‍රතිශතයක් විය. 2022 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණයවලින් පුද්ගලික ණය සියයට 24ක්ද, උකස් ණය සියයට17ක්ද, සේවක අර්ථ සාධක අරමුදල් ණය සියයට 55ක් ද විය

# රාජ්‍ය ආදායම් අංශය

## විගණන නිරීක්ෂණ

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
    - සංශෝධිත රජයේ ආදායමින් රැස් කර තිබූ ආදායම
    - රාජ්‍ය ආදායම් රැස් කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ආදායම් ප්‍රතිශතය නොලැබීම
    - සෘජු හා වක්‍ර බදුවල සංයුතිය අපේක්ෂිත මට්ටම කරා ළඟා නොවීම
    - ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වීම
    - තොරතුරු පද්ධති මගින් හඳුනා ගත් හිඟ ආදායම් අය කර නොගැනීම
    - තෙවන පාර්ශවයන් විසින් රැස් කර ගන්නා බදු ආදායම කාලානුරූපීව අය කර ගැනීමට කටයුතු නොකිරීම
- ශ්‍රී ලංකා රේගුව
    - වැරදි තීරණය මත අලාභ ගෙවීමට සිදු වීම
    - විමර්ශන කඩිනමින් අවසන් කිරීමට කටයුතු නොකිරීම
    - ප්‍රතිඅපනයනයට නියමිත පොල්තෙල් දේශීය වෙළඳපොලේ විකුණා රජයට ආදායම් අහිමි කිරීම
- සුරාබදු දෙපාර්තමේන්තුව
    - මත්පැන් හා රා නිෂ්පාදන ආයතන සහ ස්කාගාරවලින් අය විය යුතු හිඟ සුරාබදු ආදායම
    - ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියේ දුර්වලතා පැවතීම
    - සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව ප්‍රතිසංස්කරණයෙන් යුතු ආදායම් පරිපාලන පද්ධතියක් හඳුන්වා දීම සඳහා වූ ප්‍රතිපාදන උපයෝගී කර නොගැනීම

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
    - අයවැය ඇස්තමේන්තු තාත්ත්වික නොවන අයුරින් හා නිසි පුරෝකථනයකින් මෙන්ම පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව වෙනස් කිරීම
    - සුඛෝපභෝගී ආදායම් රැස් කර ගැනීමට අපොහොසත් වීම
    - ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා නොතිබීම
- ජාතික ලොතරැයි මණ්ඩලය
    - පනතේ විධිවිධානවලට පටහැනිව අරමුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම
    - රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලලොතරැයිපත් ආදායම අඩුවෙන් ප්‍රේෂණය කිරීම
    - හිමිකම් නොපෑ ත්‍යාග මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# රාජ්‍ය ආදායම් අංශය



2022 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැයේ මුල් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම රු.බිලියන 2,213ක් ද, වර්ෂයේ අතුරු අයවැය අනුව එය රු.බිලියන 2,084ක් ද වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී රජයේ ආදායම රු. බිලියන 1,961ක් වී තිබූ බැවින් ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම මුල් අයවැය ඇස්තමේන්තුව හා අතුරු අයවැය අනුව පිළිවෙලින් රු. බිලියන 252කින් හා රු. බිලියන 123කින් හෙවත් සියයට 12.85කින් හා සියයට 6.27කින් වැඩි කර රජයේ අයවැය ඇස්තමේන්තු කර තිබුණි. නමුත් 2022 වර්ෂයේ රැස් කළ රජයේ ආදායම රු.බිලියන 1,999ක් විය. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව හා 2022 වර්ෂයේ ඉදිරිපත් කළ අතුරු අයවැය ආදායම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේ දී එම අඩු වීම පිළිවෙලින් රු. බිලියන 214ක් හා රු. බිලියන 85ක් වී තිබුණි.

මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම පමණක් සඳහන් වන හෙයින්, පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ආදායම් ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමට අවස්ථාව ලබා දීම නිසා ආදායම් තාත්ත්වික ලෙස ඇස්තමේන්තු කිරීමේ වගවීම දුර්වල වී තිබුණි.

ආදායම් රැස් කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අය විය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු. මිලියන 971,730ක් විය.

ආදායම් රැස් කරන ප්‍රධාන ආයතනවල ආදායම් ඇස්තමේන්තු සහ රැස් කරන ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතා දිරි ගැන්වීම මඟින් බදු ගෙවීම පැහැර හැරීම හා මඟ හැරීම වලක්වාලීම මඟින් බදු නීති හා අනෙකුත් අණ පනත්වලට යටත්ව බදු අය කිරීම, බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මඟින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන අතර, ඒ සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ විෂය පථයට ගැනෙන සියළු අණ පනත් පරිපාලනය කිරීම, රාජ්‍ය බදු ආදායම රැස් කිරීම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිචාර ලබා දීම යන කාර්යයන් ඉටු කරනු ලබයි.

### සංශෝධිත රජයේ ආදායමින් රැස් කර තිබූ ආදායම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ ඇස්තමේන්තු කළ මුළු ආදායම රු. මිලියන 1,067,807ක් වූ අතර එය නැවත රු. මිලියන 1,131,012ක් දක්වා සංශෝධනය කර ඉන් රු. මිලියන 1,045,189ක ආදායමක් රැස් කර තිබුණි.

### රාජ්‍ය ආදායම් රැස් කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ආදායම් ප්‍රතිශතය නොලැබීම

2022 වර්ෂයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කළ රජයේ මුළු සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව සියයට 54ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් රැස් කර ගැනීමට අපේක්ෂා කළ ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ රැස් කළ අදායම රජයේ ඇස්තමේන්තුගත මුළු ආදායමෙන් සියයට 50ක් විය.

### සෘජු හා වක්‍ර බදුවල සංයුතිය අපේක්ෂිත මට්ටම කරා ළඟා නොවීම

2022 වර්ෂයේ දී රජයේ මුළු ආදායම කෙරෙහි වක්‍ර බදු අනුපාතය සියයට 70ක් බවත් වර්තමානයේ දී 30:70 ලෙස පවතින සෘජු හා වක්‍ර බදුවල සංයුතිය, වඩා යෝග්‍ය මිශ්‍රණයක් ලෙස 60:40 මට්ටමට ළඟා කර ගැනීම කෙරෙහි ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනයන් ඉලක්ක කෙරේ. වර්තමාන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වක්‍ර බදුකරණය මඟින් ඉහළ බදු ආදායමක් අපේක්ෂා කරන අතර, රජය විසින් කෙටි කාලීන ආදායම් ඉහළ නැංවීමට වක්‍ර බදු භාවිත කරනු ලබයි. එබැවින් රජයේ දේශීය බදු රැස් කරන්නා ලෙස සෘජු බදු හා වක්‍ර බදු අනුපාතය 60:40 ලෙස ළඟා කර ගැනීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අභියෝගයක් වී තිබුණි.

### ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වීම

දෙපාර්තමේන්තුව විසින් බදු ආදායම් රැස් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (RAMIS) ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණු අතර, ඒ සඳහා 2022 සැප්තැම්බර් දක්වා රු. මිලියන 7,153ක පිරිවැයක් දරා තිබුණි. ඊට අමතරව RAMIS පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යාලයේ ගෙවීම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 71ක් වෙත මාසිකව දළ වශයෙන් රු. මිලියන 3 බැගින් මුදලක් වැටුපට අමතරව ගෙවා තිබුණු අතර, 2020 වර්ෂයේ ඔක්තෝබර් සිට 2021 වර්ෂයේ ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව RAMIS ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා රු. මිලියන 44ක් ගෙවීම් කර තිබුණි. නමුත් පද්ධතියේ අදියර 1 පවරා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා දිගින් දිගටම අමතර පිරිවැය දැරීමට සිදු වී තිබුණි.

### තොරතුරු පද්ධති මගින් හඳුනා ගත් හිඟ ආදායම් අය කර නොගැනීම

2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තා අනුව හිඟ බදු සහ දඩ පොළී ආදායම RAMIS හා Legacy පරිගණක පද්ධතිවලට අදාළව පිළිවෙලින් රු. මිලියන 671,774 ක් හා රු. මිලියන 232,568ක් වශයෙන් රු. මිලියන 904,342ක් විය. මෙම මුළු හිඟ ආදායමෙන් රු. මිලියන 740,917ක් අය වීම තාවකාලිකව අත්හිටුවා ඇති අතර, රු. මිලියන 163,425ක් පමණක් අය කර ගත හැකි ලෙස හඳුනා ගෙන තිබුණි. එසේ අය කර ගත හැකි ලෙස හඳුනා ගෙන තිබුණු හිඟ ආදායමෙන් රු. මිලියන 86,802ක් එනම් සියයට 53ක් වසර 3ක් ඉක්ම වූ කාලයක් පුරා පවතින ශේෂයන් විය. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කාර්යයන්ට අදාළ නිශ්චිත කාර්ය සාධනයන්ට ළඟා නොවීමක් විය.

### තෙවන පාර්ශවයන් විසින් රැස් කර ගන්නා බදු ආදායම කාලානුරූපීව අය කර ගැනීමට කටයුතු නොකිරීම

අය කර ගත හැකි ලෙස හඳුනා ගෙන තිබුණු මුළු හිඟ ආදායමෙන් රු. මිලියන 114,294ක්, එනම් සියයට 70ක් එකතු කළ අගය මත බදු හා දඩ මුදල් බවත් ඒ අනුව තෙවන පාර්ශවයන් විසින් රැස් කර ගන්නා ලද බදු ආදායම කාලානුරූපීව ප්‍රේෂණය කර ගැනීමට අවශ්‍ය පියවරයන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

### ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා රේගුවේ 2022 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම රු. මිලියන 713,426ක් වූ අතර එය නැවත රු. මිලියන 513,341ක් දක්වා සංශෝධනය වී රු. මිලියන 523,346ක ආදායමක් රැස් කර තිබුණි.

2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුළු හිඟ බදු ආදායම රු. මිලියන 61,254ක් වූ අතර එදිනට සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. මිලියන 23,230ක් හෙවත් සියයට 38ක් ආනයන හිඟ බදු ද, රු. මිලියන 16,076ක් හෙවත් සියයට 26ක් විශේෂ වෙළඳ භාණ්ඩ බදු ද, රු. මිලියන 10,477ක් එනම් සියයට 17ක් වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු ද, රු. මිලියන 6,138ක් හෙවත් සියයට 10ක් ආනයන සෙස් බදු ද වේ. ඉතිරි අනෙකුත් බදුවලට අදාළ හිඟ බදු ප්‍රමාණය රු. මිලියන 5,333ක් විය. මෙම හිඟ බදු ආදායමෙන් රු. මිලියන 39,063 ක් හෙවත් සියයට 63 ක් මුදල් අමාත්‍යාංශයෙන් අය විය යුතුය.

### වැරදි තීරණය මත අලාභ ගෙවීමට සිදු වීම

අත්අඩංගුවට ගන්නා ලද දුම්වැටි තොගයකට අදාළව ගෙන තිබූ වැරදි තීරණය ක් මත ශ්‍රී ලංකා රේගුවට ගෙවීමට සිදු වී තිබූ මුළු අලාභය රු. මිලියන 69.4ක් විය.

### විමර්ශන කඩිනමින් අවසන් කිරීමට කටයුතු නොකිරීම

2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ අංශ 40ට අදාළව රේගු විමර්ශන 9,754ක් පැවතුණු අතර, 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ විමර්ශන

සංඛ්‍යාවෙන් වසර 05 ට වඩා පැරණි විමර්ශන 3,582ක් ද, වසර 1ත් 5ත් අතර 4,720ක් ද, වසරක් ඇතුළත වූ විමර්ශන 1,452ක් ද වූ අතර එම විමර්ශන කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## ප්‍රතිඅපනයනයට නියමිත පොල්තෙල් දේශීය වෙළඳපොලේ විකුණා රජයට ආදායම් අහිමි කිරීම

පොල්තෙල් ආනයනය කර අගය එකතු කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා රේගුවේ ලියාපදිංචි වූ සමාගමක් 2014 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයේ දී පොල්තෙල් කිලෝ 463,065ක් දේශීය වෙළඳපොළට විකුණා තිබුණි. ඒ වෙනුවෙන් රේගුව අදාළ සමාගමට රු. මිලියන 477 ක දණ්ඩනයක් නියම කර එම දණ්ඩනය රු. මිලියන 90ක් දක්වා අඩු කිරීම නිසා සහ රේගු ආඥා පනත ප්‍රකාරව ඉන් සියයට 30ක් පමණක් මහා භාණ්ඩාගාරයට ලැබීම නිසා සත්‍ය වශයෙන්ම රජයට ලද ආදායම රු. මිලියන 27ක් පමණක් වී තිබුණි. නමුත් එම සිදුවීම නිසා රජයට අහිමි වූ ආදායම රු. මිලියන 64 ක් විය.

## සුරාබදු දෙපාර්තමේන්තුව

2022 වර්ෂයේ ඇස්තමේන්තුගත සුරාබදු ආදායම රු. මිලියන 180,000ක් වූ අතර, එය නැවත රු. මිලියන 185,000 දක්වා සංශෝධනය කර රු. මිලියන 165,188ක බදු ආදායමක් රැස් කර තිබුණි. එය සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 89ක් විය.

## මත්පැන් හා රා නිෂ්පාදන ආයතන සහ ස්කාගාරවලින් අය විය යුතු හිඟ සුරාබදු ආදායම

2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා අනුව මත්පැන් හා රා නිෂ්පාදන ආයතන සහ ස්කාගාරවලින් අය විය යුතු හිඟ සුරාබදු ආදායම රු. මිලියන 5,514ක් විය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17කින් වැඩි වී තිබුණි. ඉන් ආයතන 04කට අදාළ රු. මිලියන 2,389ක හිඟ සුරාබදු ආදායමක් වසර 5කට වැඩි කාලයක සිට අය කර ගෙන නොතිබුණි. තව ද නිෂ්පාදන කටයුතු අත්හිටුවා තිබී නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය දී තිබුණු සැර මත්පැන් නිෂ්පාදන සමාගමකින් අය විය යුතුව තිබුණු රු. මිලියන 2,748කට අදාළ හිඟ වාරික ගෙවීම් පැහැර හැර තිබුණි.

## ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියේ දුර්වලතා පැවතීම

විගණන පරීක්ෂාවේ දී ඉහත පද්ධතියේ විවිධ දුර්වලතා පැවතීම හා කොන්ත්‍රාත් සමාගමේ අධීක්ෂණය යටතේ සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව තිබූ අතර, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 දක්වා කාලය තුළ මත්පැන් බෝතල් මිලියන 5 ක ස්ටිකර් මුද්‍රණය නොවී වෙළඳපොළට නිකුත් වී තිබීම, ඩිජිටල් සලකුණු නොමැතිව වෙළඳපොළට නිකුත් නොකළ යුතුය යන විධානය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම යන කරුණු නිසා ඉහත පද්ධතිය අසාර්ථක වී තිබුණි.

### සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව ප්‍රතිසංස්කරණයෙන් යුතු ආදායම් පරිපාලන පද්ධතියක් හඳුන්වා දීම සඳහා වූ ප්‍රතිපාදන උපයෝගී කර නොගැනීම

සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා නව ප්‍රතිසංස්කරණයෙන් යුතු ආදායම් පරිපාලන පද්ධතියක් (RASED) ක්‍රියාවට නැංවීමේ කටයුතු 2020 දෙසැම්බර් සිට ආරම්භ කර ක්‍රියාකාරී ක්ෂේත්‍ර හඳුනා ගෙන යෝජිත ආදායම් පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සඳහා 2022 වර්ෂයේ දී රු. මිලියන 100 ක ප්‍රතිපාදනයන් සලසා තිබුණ ද ඒ සඳහා කිසිදු වියදමක් සිදු කර නොතිබුණි.

### මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ලෙස හඳුනා ගෙන ඇත.

### අයවැය ඇස්තමේන්තු තාත්ත්වික නොවන අයුරින් හා නිසි පුරෝකථනයකින් මෙන්ම පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව වෙනස් කිරීම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 1,050ක බදු ආදායමක් හා රු. මිලියන 7,503ක බදු නොවන ආදායමක් 2022 වර්ෂය සඳහා රැස් කර ගත යුතු බවට වාර්ෂික විසර්ජන පනත මඟින් පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇතත්, එකී ඇස්තමේන්තුගත බදු ආදායම රු. මිලියන 630ක් ලෙස සියයට 40කින් හා බදු නොවන ආදායම රු. මිලියන 5,500ක් ලෙස සියයට 27කින් පහත දැමීමට මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගෙන තිබුණි. කෙසේවෙතත්, වර්ෂය තුළ බදු ආදායම ලෙස රු. මිලියන 1,374ක් හා බදු නොවන ආදායම ලෙස රු. මිලියන 6,554ක් රැස් කර ගෙන තිබීම හේතුවෙන් අයවැය ඇස්තමේන්තු තාත්ත්වික නොවන අයුරින් හා නිසි පුරෝකථනයකින් මෙන්ම පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව වෙනස් කර තිබුණි.

### සුඛෝපභෝගී ආදායම් රැස් කර ගැනීමට අපොහොසත් වීම

සුඛෝපභෝගී ආදායම් බදු ගණනය කිරීම් අනුව, 2022 වර්ෂය සඳහා රු. මිලියන 1,283ක් හා ඉකුත් වර්ෂයේ හිඟව තිබූ රු. මිලියන 214ක් සමඟ එකතුව රු. මිලියන 1,497ක් අය කර ගත යුතු වුවත්, ඉන් රු. මිලියන 165ක සුඛෝපභෝගී බදු ආදායමක් රැස් කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා නොතිබීම

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඊමෝටරින් ව්‍යාපෘතියට අයවැය ඇස්තමේන්තු මඟින් එකතුව රු. මිලියන 360ක් වෙන් කර ඇති නමුත් ඊ-මෝටරින් ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා ඇති වියදම රු. මිලියන 0.18ක් විය.

### ජාතික ලොතරැයි මණ්ඩලය

පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම සඳහා 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය 1963 වර්ෂයේ දී පිහිටුවා තිබුණි.

### පනතේ විධිවිධානවලට පටහැනිව අරමුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයිපත් ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩු කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, එම විධිවිධානවලට පටහැනිව රු. මිලියන 2,397ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි.

### රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලලොතරැයිපත් ආදායම අඩුවෙන් ප්‍රේෂණය කිරීම

රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලුම ලොතරැයිපත් ආදායමෙන් සියයට 16.5ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුව ද, 2022 වර්ෂය තුළ දී පවත්වා තිබූ ලොතරැයි 11කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා 2022 වර්ෂයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ වටිනාකම රු. මිලියන 560කින් අඩු වී තිබුණි.

### හිමිකම් නොපෑ ත්‍යාග මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම

2022 ජනවාරි 27 දින සිට 2022 ජුනි 30 දින දක්වා හඳහන ලොතරැයියේ අමතර ලග්නය වෙනුවෙන් ලබා දෙන ලද ත්‍යාග මුදල්වලින් මාස 06 ඉක්මවා හිමිකම් නොපෑ රු. මිලියන 12ක් පනතේ විධිවිධාන ප්‍රකාර ඒකාබද්ධ අරමුදලට බැර නොකර මණ්ඩලයේ අරමුදල තුළම රඳවා ගෙන තිබුණි.

### සංවර්ධන ලොතරැයි මණ්ඩලය

1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් පවත්වන ලද ලොතරැයිවලින් ලැබෙන සම්පූර්ණ ලාභය ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. ඒ අනුව 2022 වර්ෂයේ බදු පසු සම්පූර්ණ ලාභය වූ රු. මිලියන 3,211 ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කර තිබුණි.

# භාණ්ඩාගාරය හා රාජ්‍ය ණය

## විගණන නිරීක්ෂණ

- රජයේ ආදායම
- රජයේ වියදම
- පොළී වියදම වර්ධනය වීම
- ආදායම් ඌනතාවය
- අයවැය හිඟය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය
- අයවැය හිඟය මූල්‍යනය
- ණය ශේෂය වර්ධනය වීම
- රාජ්‍ය ණය
- බැරකම් සීමාව ඉක්මවීම
- ඒක පුද්ගල ණය ප්‍රමාණය
- රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොළී ගෙවීම වැඩිවීම

# භාණ්ඩාගාරය හා රාජ්‍ය ණය

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත. මෙම කාර්යයන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම සිදු කරන ප්‍රධානම යාන්ත්‍රණය භාණ්ඩාගාරය වේ.

## රජයේ ආදායම

2022 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 24,148 ක් වී තිබුණු අතර, 2021 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 16,809 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 7,339 කින් හෙවත් සියයට 43.66 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම රු.බිලියන 2,213 ක් වී තිබුණු අතර, 2022 වර්ෂයේ ඉදිරිපත්කළ අතුරු අයවැය අනුව රජයේ ආදායම රු.බිලියන 2,084 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 1,961 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම මුල් අයවැය ඇස්තමේන්තුව හා අතුරු අයවැය අනුව පිළිවෙලින් රු.බිලියන 252 කින් හා රු.බිලියන 123 කින් හෙවත් සියයට 12.85 කින් හා සියයට 6.27 කින් වැඩි කර රජයේ අයවැය ඇස්තමේන්තු කර තිබුණි.

2022 වර්ෂයේ රැස්කළ රජයේ ආදායම රු.බිලියන 1,999 ක් වී තිබුණු අතර, එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා රු.බිලියන 103 කින් අඩු වී තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව හා 2022 වර්ෂයේ ඉදිරිපත් කළ අතුරු අයවැය ආදායම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී එම අඩුවීම පිළිවෙලින් රු.බිලියන 214 ක් හා රු.බිලියන 85 ක් වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරාසයක තුළ සෑම වර්ෂයකදීම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් ආදායමට වඩා අඩුවෙන් රැස්කළ ආදායම සියයට 4.08 ක සිට සියයට 26.06 ක පරාසයක් වී තිබූ අතර, එම කාල පරාසය තුළ වැඩිම ප්‍රතිශතය 2021 වර්ෂයේදී වාර්තා වී තිබුණි. විස්තර රූපසටහන 05 හි දැක්වේ.




රූපසටහන 05 - ඇස්තමේන්තු කළ ආදායමෙන් රැස්නොකළ ආදායම් ප්‍රතිශතය

මූලාශ්‍ර - වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා රජයේ මූල්‍ය ප්‍රකාශන 2012-2022

මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම පමණක් සඳහන් වන හෙයින්, පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ආදායම් ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමට අවස්ථාව ලබා දීම නිසා ආදායම් තාත්ත්වික ලෙස ඇස්තමේන්තු කිරීමේ වගවීම දුර්වල වී තිබුණි.

### රජයේ වියදම

2022 මුදල් වර්ෂය සඳහා රජයේ වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2021 අංක 30 දරන විසර්ජන පනතින් සලසා තිබුණි. ඒ අනුව, විසර්ජන පනතේ ප්‍රතිපාදන හා පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන ඇතුළුව රජයේ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 4,819,569 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රයක් මඟින් රු.මිලියන 251,000 ක ප්‍රතිපාදන විශේෂ නීති සේවා වියදම් සඳහා ලබා ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 5,070,569 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණි. විස්තර වගුව 07 හි දැක්වේ.

| මූල්‍ය | මූලධන ප්‍රතිපාදනය | පුනරාවර්තන ප්‍රතිපාදනය | එකතුව |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සැපයුම් හා සේවා සඳහා විසර්ජන පනතින් සලසා තිබුණු ප්‍රතිපාදනය (විසර්ජන පනත I වන උපලේඛනය) | 1,090,397 | 2,239,830 | 3,330,227 |
| පවත්නා නීති මගින් අනුමැතිය ලැබී ඇති , ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන(විසර්ජන පනත II වන උපලේඛනය) | 1,505,000 | 1,396,123 | 2,901,123 |
| සැපයුම් හා සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු මගින්) | - | - | - |
| විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ප්‍රතිපාදන | - | 251,000 | 251,000 |
| එකතුව | **2,595,397** | **3,886,953** | **6,482,350** |

වගුව 07 - රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය

මූලාශ්‍රය - 2021 අංක 30 දරන විසර්ජන පනත හා පරිපූරක ඇස්තමේන්තු

2021 අංක 30 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.මිලියන 73,758 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 73,079ක ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 674 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර වගුව 08 හි දැක්වේ.

| වියදමේ ස්වභාවය | විසර්ජන පනතෙන් | පරිපූරක ඇස්තමේන්තු මගින් | මු.රෙ.66/69 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | වැය ශීර්ෂවලට ප්‍රතිපාදන මාරු කිරීම | ප්‍රතිපාදන ඉතිරිය |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන | 55,600 | - | (31,363) | 24,237 | 23,563 | 674 |
| මූලධන | 18,153 | - | 31,363 | 49,516 | 49,516 | - |
| එකතුව | 73,753 | - | 0 | 73,753 | 73,079 | 674 |

වගුව 08 - පරිපූරක සහය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂ වලට මාරු කිරීම

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන 2022

සමාලෝචිත වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 6,482,350 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 5,420,912 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 1,061,438 ක් හෙවත් සියයට 19.58 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂයේ සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5,985,985 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් රු.මිලියන 496,365 ක්, එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 8 ක් ඉතිරි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සිදුවී තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,791,498 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 3,539,237 ක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 252,261 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ත පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 7 ක් වී තිබුණි.

- රාජ්‍ය ආයෝජනය සඳහා රු.මිලියන 1,180,382 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 1,014,293 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 166,089 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක් වී තිබුණි.

- දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1,510,470 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ණය ආපසු ගෙවීම සඳහා රු.මිලියන 1,432,455 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 78,016 ක් හෙවත් සියයට 5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 3,791,498 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු. මිලියන 3,539,237 ක් හෙවත් සියයට 93 ක් උපයෝජනය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 2,874,192 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 2,757,343 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7 ක් හෙවත් රු.මිලියන 252,261 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මුළු අයවැයගත වියදම රු.මිලියන 6,482,350 ක් වී තිබුණු අතර, තත්‍ය වියදම රු.මිලියන 5,985,985 ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ වියදමෙන් රු.මිලියන 496,365 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### පොළී වියදම වර්ධනය වීම

සමාලෝචිත වර්ෂයේදී පොළී වෙනුවෙන් රු.මිලියන 1,565,190 ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 1,048,382 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 516,808 කින් හෙවත් සියයට 49.30 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේදී රු.මිලියන

150,778 ක්ව පැවති පොළී වියදම 2022 වර්ෂය අවසන් වන විට රු.මිලියන 1,565,190 ක් දක්වා වැඩි වී තිබුණි. 2006 වර්ෂයට සාපේක්ෂව එය සියයට 938 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ මුළු පොළී වියදම පුනරාවර්තන වියදමෙන් සියයට 26.03 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 44.22 ක් දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම 2006 වර්ෂයේදී රජයේ ආදායමෙන් සියයට 31.58 ක් හෙවත් රු.මිලියන 150,578 ක් පොළී වශයෙන් ගෙවා තිබුණු අතර, 2022 වර්ෂයේදී එය සියයට 78.31 ක් දක්වා වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 06 හි දැක්වේ.




රූපසටහන 06 - මුළු පුනරාවර්තන වියදම හා පොළී වියදම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

### ආදායම් ඌනතාවය

සමාලෝචිත වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ආදායමේ ඌනතාවය රු.බිලියන 1,540 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 1,290 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරාසය තුළ ඉහළම ආදායමේ ඌනතාවය 2022 වර්ෂයේදී වාර්තා වී තිබුණි. එම කාල පරාසය තුළ සෑම වර්ෂයකම රඳ්කළ ආදායම රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි. ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර, එය රු.බිලියන 43 ක් වී තිබුණු අතර, රඳ්කළ රජයේ ආදායමෙන් සියයට 7.52 ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ත ආදායමේ ඌනතාවය රු.බිලියන 6,319 ක් වී තිබුණි. එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ

විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි. මේ අනුව එම කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 20,484 ක් ද, විදේශීය ණය රු.බිලියන 7,487 ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 246 ක් වශයෙන් එකතුව රු.බිලියන 28,218 ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 6.89 ක සිට සියයට 45.59 ක පරාසයක ප්‍රතිශතයන් මගින් ආදායමේ ඌනතාවය මූල්‍යනය කර තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.25 ක් ද, 2020 වර්ෂයේදී සියයට 45.59 ක්, 2021 වර්ෂයේදී සියයට 42.39 ක් හා 2022 වර්ෂයේදී සියයට 30.59 වශයෙන් උපයෝජනය කර තිබුණි. විස්තර වගුව 09 හි දැක්වේ.

| වර්ෂය | තත්‍ය ආදායම | තත්‍ය පුනරාවර්තන වියදම | ආදායමේ ඌනතාවය | ආදායමේ ඌනතාවය රැස්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | විදේශ ණය, ප්‍රදාන හා දේශීය ණය | ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | සියයට | රු.බිලියන | සියයට |
| 2006 | 477 | 579 | 102 | 21.38 | 514 | 19.84 |
| 2007 | 572 | 615 | 43 | 7.52 | 587 | 7.33 |
| 2008 | 664 | 736 | 72 | 10.84 | 678 | 10.62 |
| 2009 | 708 | 882 | 174 | 24.58 | 1,019 | 17.08 |
| 2010 | 826 | 951 | 125 | 15.13 | 918 | 13.62 |
| 2011 | 943 | 1,020 | 77 | 8.17 | 998 | 7.72 |
| 2012 | 997 | 1,118 | 121 | 12.14 | 1,108 | 10.92 |
| 2013 | 1,066 | 1,254 | 188 | 17.64 | 1,289 | 14.58 |
| 2014 | 1,128 | 1,370 | 242 | 21.45 | 1,397 | 17.32 |
| 2015 | 1,394 | 1,673 | 279 | 20.01 | 1,750 | 15.94 |
| 2016 | 1,699 | 1,771 | 72 | 4.24 | 1,623 | 4.44 |
| 2017 | 1,845 | 1,946 | 101 | 5.47 | 1,466 | 6.89 |
| 2018 | 1,935 | 2,109 | 174 | 8.99 | 1,883 | 9.24 |
| 2019 | 1,907 | 2,322 | 415 | 21.76 | 2,049 | 20.25 |
| 2020 | 1,379 | 2,683 | 1,304 | 94.56 | 2,860 | 45.59 |
| 2021 | 1,467 | 2,757 | 1,290 | 87.93 | 3,043 | 42.39 |
| 2022 | 1,999 | 3,539 | 1,540 | 77.04 | 5,035 | 30.59 |
| එකතුව | **21,006** | **27,325** | **6,319** | | **28,217** | |

වගුව 09 - පුනරාවර්තන වියදම පියවා ගැනීමට නොහැකි වූ ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවලින් උපයෝජනය කිරීම
මූලාශ්‍රය - 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

2006 වර්ෂයේදී රු.බිලියන 151 ක් වූ පොළී ගෙවීම් 2022 වර්ෂය වන විට එය රු.බිලියන 1,565 ක් දක්වා සියයට 936 කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යනය කිරීම් සඳහා ණය ලබා ගැනීමට සිදු වී තිබූ අතර ඒ සඳහා වන පොළී ගෙවීම් වාර්ෂිකව වැඩි වී තිබුණි. 2022 වර්ෂයේදී රැස්කරන ලද රු.බිලියන 1,999 ක රජයේ ආදායමෙන් රු.බිලියන 1,565 ක් හෙවත් සියයට 78.29 ක පොළී ගෙවීමට සිදු වී තිබුණි. මෙම තත්ත්වය අදාළ කාලපරිච්ඡේදයේදී වාර්ෂිකව වර්ධනය වෙමින් පැවැති අතර, 2019 වර්ෂයේ සිට එය සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. විස්තර වගුව 10 හි දැක්වේ.

| වර්ෂය | තත්‍ය පුනරාවර්තන වියදම | පොළී වියදම | පොළී වියදම මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | තත්‍ය ආදායම | පොළී ගෙවීම තත්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | සියයට | රු.බිලියන | සියයට |
| 2006 | 579 | 151 | 26.08 | 477 | 31.66 |
| 2007 | 615 | 181 | 29.43 | 572 | 31.64 |
| 2008 | 736 | 212 | 28.80 | 664 | 31.93 |
| 2009 | 882 | 303 | 34.35 | 708 | 42.80 |
| 2010 | 951 | 348 | 36.59 | 826 | 42.13 |
| 2011 | 1,020 | 353 | 34.61 | 943 | 37.43 |
| 2012 | 1,118 | 409 | 36.58 | 997 | 41.02 |
| 2013 | 1,254 | 465 | 37.08 | 1,066 | 43.62 |
| 2014 | 1,370 | 446 | 32.55 | 1,128 | 39.54 |
| 2015 | 1,673 | 527 | 31.50 | 1,394 | 37.80 |
| 2016 | 1,771 | 611 | 34.50 | 1,699 | 35.96 |
| 2017 | 1,946 | 736 | 37.82 | 1,845 | 39.89 |
| 2018 | 2,109 | 852 | 40.40 | 1,935 | 44.03 |
| 2019 | 2,322 | 889 | 38.29 | 1,907 | 46.62 |
| 2020 | 2,683 | 975 | 36.34 | 1,379 | 70.70 |
| 2021 | 2,757 | 1,048 | 38.01 | 1,467 | 71.44 |
| 2022 | 3,539 | 1,565 | 44.22 | 1,999 | 78.29 |
| එකතුව | **27,325** | **10,071** | | **21,006** | |

වගුව 10 - ණය සඳහා පොළී ගෙවීම් වෙනුවෙන් රැස්කළ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වැය කිරීම

මූලාශ්‍ර - 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

ආදායම් රැස් කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු.මිලියන

971,330 ක් විය. කෙසේවුවද, වැඩිම හිඟ හිටි ආදායමක් වාර්තා වී ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 දෙසැම්බර් 31 දින වන විට එකතු කළ යුතුව තිබූ රු.බිලියන 904 ක ආදායම්, එකතු නොකර හිඟහිටව පැවතුණි. එම ආදායම් 2022 වර්ෂයේදී රැස් කර ගැනීමට සමත් වූයේ නම්, එම වර්ෂයේ ආදායම් ඌනතාවය රු.බිලියන 636 ක් හෙවත් සියයට 41.30 කින් අඩු කර ගත හැකිව තිබුණි. එම හිඟහිටි ආදායම 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.බිලියන 698 ක් හා රු.බිලියන 620 ක් වී තිබුණි. එම වර්ෂවල ද එම හිඟහිටි ආදායම් රැස්කර ගත හැකිව තිබුණේ නම් 2020 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 606 ක් දක්වා සියයට 46.47 කින් ද, 2021 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 670 ක් දක්වා සියයට 51.94 කින් ද අඩුකර ගැනීමට හැකියාව පැවතුණි.

ඒ අනුව, බදු පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ පවතින අඩුපාඩු, බදු අභියාචනා ක්‍රියාවලියේ දීර්ඝකාලීන භාවය, හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට විශේෂිත වූ අධිකරණ පද්ධතියක් ස්ථාපිත වී නොතිබීම යන හේතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු අය කිරීමේ ප්‍රමාදයට බලපා තිබුණි. විස්තර වගුව 11 හි දැක්වේ.

| වර්ෂය | හිඟහිටි ආදායම | ආදායම් ඌනතාවය | හිඟහිටි ආදායම් රැස්කර ගත්තේනම් ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) | ආදායම් ඌනතාවය අඩුකර ගැනීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | සියයට |
| 2019 | 579 | 414 | 165 | 39.86 |
| 2020 | 698 | 1,304 | (606) | (46.47) |
| 2021 | 620 | 1,290 | (670) | (51.94) |
| 2022 | 904 | 1540 | (636) | (41.30) |

වගුව 11 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟහිටි ආදායම් හා එම ආදායම් ඌනතාවය කෙරෙහි ඇතිකළ බලපෑම
මූලාශ්‍රය - 2019 සිට 2022 වර්ෂය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන හා රජයේ මූල්‍ය ප්‍රකාශන




රූපසටහන 07 - ආදායම් ඌනතාවය තත්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2006 -2022

### අයවැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,555 ක් වී තිබූ අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.58 ක් වී තිබුණි. 2021 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,080 ක් වී තිබුණු අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12.37 ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සමස්ත කාල පරාසය පුරාවට අයවැය හිඟයක් පැවතුණු අතර, එය 2006 වර්ෂයේදී පැවති රු.බිලියන 300 ක අයවැය හිඟය 2022 වර්ෂය වන විට රු.බිලියන 2,555 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිඟය 2022 වර්ෂයේදී වාර්තා ගත වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 5.55 ක සිට සියයට 14.08 ක් දක්වා පරාසයක පැවතුණි. තත්‍ය අයවැය හිඟය තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව පැවතිය යුතුව තිබුණු සියයට 5 ක සීමාව එම කාල පරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී පවත්වා ගෙන නොතිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 5.55 ක්, සියයට 5.69ක් හා 5.59 ක ප්‍රමාණයන්ගෙන් පවත්වා ගැනීමට සමත් වී තිබුණි. විස්තර රූපසටහන 08 හි දැක්වේ.




රූපසටහන 08- අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සහ රජයේ මූල්‍ය ප්‍රකාශන 2006- 2022

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන අයවැය හිඟය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් වන අයවැය හිඟය අතර වෙනස් අගයන් වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ වර්ගීකරණය අනුව පිළියෙල කර ඇති බවත්, ආර්ථික වර්ගීකරණය අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය ගණනය කර ඇති බව දන්වා තිබුණි. 2022 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව අයවැය හිඟය රු.මිලියන 2,459,967 ක් වී තිබුණි. නමුත් රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම හිඟය රු.මිලියන 2,554,741 ක් බැවින් එම ශේෂ දෙක අතර රු.මිලියන 94,774 ක වෙනසක් පැවැතුණි.

## අයවැය හිඟය මූල්‍යනය

රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී, අයවැය හිඟය රු.මිලියන 474,664 කින් එනම් සියයට 22.82කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් විදේශ ණය රු.මිලියන 424,821 ක් ලබා ගැනීමට සිදු වී තිබුණි. එසේම අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් දේශීය ණය රු.මිලියන 3,144,578 ක් ලබා ගැනීමට සිදු වී තිබුණි.

## ණය ශේෂය වර්ධනය වීම

වාර්ෂිකව අයවැය හිඟය වර්ධනය වීම හමුවේ ණය ලබා ගැනීම් ප්‍රමාණය ද වැඩි වී තිබුණි. 2022 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු.බිලියන 27,379 ක් ලෙස රජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ශේෂය දේශීය ණය වශයෙන් රු.බිලියන 14,360 ක් ද, විදේශීය ණය වශයෙන්

රු.බිලියන 13,020 ක් ද වශයෙන් පැවතුණි. 2021 වර්ෂයේදී රජයේ ණය ශේෂය රු.බිලියන 16,827 ක් වී තිබුණි. ඒ අනුව 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී ණය ශේෂය රු.බිලියන 10,552 කින් හෙවත් සියයට 63 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවති රු.බිලියන 2,431 ක ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 82.72 ක් වී තිබූ අතර, එය 2022 වර්ෂය අවසාන වන විට රු.බිලියන 27,379 ක් වී තිබුණු අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 113.38 ක් වී තිබුණි.




රූප සටහන 09- රාජ්‍ය ණය ශේෂය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන 2007- 2022 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

### රාජ්‍ය ණය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් මස 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශීය ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අප්‍රේල් මස 13 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණය ගිවිසුම් 391 කට අදාළව රු.මිලියන 671,569ක ණය වාරික ගෙවීම අත්හිටුවා තිබුණි.

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය රු. මිලියන 783,326 ක් ද, දේශීය බැංකු නොවන ණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.මිලියන 4,218,528 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 5,001,854 ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.මිලියන 3,036,026 ක ණය ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) සමඟ සැසඳීමේදී, රු.මිලියන 1,965,828 කින් හෙවත් සියයට 64.75 කින්

වැඩිවීමකි. සමාලෝචිත වර්ෂයේදී රජය දේශීය ණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළුව) රු.මිලියන 2,519,420 ක දේශීය ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.මිලියන 1,699,108 කින් හෙවත් සියයට 67.44 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා ගත් ණය ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සසඳා වගුව 12 හි දැක්වේ.

| විස්තරය | 2022<br>රු.මිලියන | 2021<br>රු.මිලියන |
|---|---|---|
| **විදේශීය ණය ගැනීම්** | **783,326** | **516,606** |
| **දේශීය ණය ගැනීම්** | | |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | **1,855,672** | **649,336** |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | **2,373,044** | **1,761,979** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | **(77,701)** | **(102,352)** |
| **සංවර්ධන බැඳුම්කර** | **67,441** | **207,504** |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | **72** | **2,953** |
| **දේශීය කාලීන ණය පහසුකම්** | | **-** |
| **මුළු දේශීය ණය ගැනීම්** | **4,218,528** | **2,519,420** |
| **වර්ෂය තුළ ලබා ගත් මුළු ණය ප්‍රමාණය** | **5,001,854** | **3,036,026** |

වගුව 12 - රජය විසින් ලබා ගත් දේශීය හා විදේශීය ණය

මූලාශය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2021 හා 2022

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) රු. මිලියන 27,379,288 ක් වූ අතර, එය 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 16,826,831 ක් වූ මුළු රාජ්‍ය ණය ශේෂය (බැංකු අයිරාව හැර) සමඟ සැසඳීමේදී රු.මිලියන 10,552,457 කින් හෙවත් සියයට 62.71 කින් වැඩිවී තිබුණි. ප්‍රවර්තන වර්ෂය තුළදී රජය විසින් ඇප වූ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු වූ රු. මිලියන 884,093 ණය වගකීම් රජයේ මූල්‍ය ප්‍රකාශනවලට පවරාගෙන තිබීම සහ රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයෙන් මුළුමනින්ම පිටතින් පවත්වාගෙන පැමිණි ණය වර්ග 08 කට අදාලව රු.මිලියන 518,293 ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් ගත කිරීම ද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති විදේශ ණය දේශීය ව්‍යවහාර මුදල් බවට

පරිවර්තනය කිරීමේ දී ජනිත වූ රු.මිලියන 5,232,909ක විනිමය අලාභය ද සමාලෝචිත වර්ෂයේ මුළු ණය ශේෂය ඉහල අගයක් ගැනීමට හේතු වී තිබුණි. ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තරයක් පහත වගුව 13 හි දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|
| | 2022 | 2021 |
| | රු.මිලියන | රු.මිලියන |
| භාණ්ඩාගාර බිල්පත් | 4,126,384 | 2,270,712 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 8,692,135 | 6,937,928 |
| රුපියල් ණය | 24,088 | 24,088 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 391,737 | 460,078 |
| විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය | 131,372 | 139,301 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති) | 24,500 | 20,247 |
| සුහුරුපාය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලබා ගත් ණය | 4,551 | 5,120 |
| භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රීය වගකීම් කළමනාකරණ පනත) | 30,000 | 30,000 |
| විශ්‍රාම පාරිතෝෂික ණය | 48,924 | 52,995 |
| කල්බදු ණය හිමියන් | 1,865 | 478 |
| දේශීය කාලීන ණය පහසුකම් | - | 45,000 |
| රජය ඇප වූ ලංකා ඛනිජතෙල් සංස්ථාවේ ණය | 884,093 | - |
| මුළු දේශීය ණය | 14,359,649 | 9,985,947 |
| විදේශීය (ව්‍යාපෘති) | 7,665,019 | 3,779,702 |
| විදේශ මුදලින් කාලීන ණය පහසුකම් | 797,589 | 445,521 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 4,557,030 | 2,615,661 |
| මුළු විදේශීය ණය | 13,019,638 | 6,840,884 |
| මුළු රාජ්‍ය ණය ශේෂය | 27,379,287 | 16,826,831 |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | 23,843,000 | 16,508,000 |
| මුළු රාජ්‍ය ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස | 114.83 | 101.93 |

වගුව 13 - වර්ගීකරණය කරන ලද වර්ෂය අවසානයට පැවති ණය ශේෂය

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2021 හා 2022

### බැරකම් සීමාව ඉක්මවීම

2021 අංක 12 හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතුව තිබුණත්, 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා තිබුණු විවිධ රාජ්‍ය ව්‍යවසායවලට අදාළ බැරකම්ද සැලකිල්ලට ගත්විට සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. විස්තර වගුව 14 හි දැක්වේ.

| බැරකම් | 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු.බිලියන |
|---|---|
| **බැංකු අයිරාව** | 84 |
| **රාජ්‍ය ණය (රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව)** | 27,379 |
| **මහ බැංකු අත්තිකාරම්** | 235 |
| **මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම්:** | |
| **ගිණුමගත නොකළ විදේශ ණය** | 39 |
| **මුළු බැරකම්** | 27,737 |
| **ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය** | 23,843 |
| **මුළු බැරකම් ඇස්තමේන්තුගත දළ දේශීය නිශ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස** | 116.33 |

වගුව 14 - උපරිම බැරකම් සීමාව ඉක්මවීම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන

මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන තිබුණු ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපිවල වටිනාකම වූ රු.බිලියන 1,292 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශනවල ඇතුළත් රු. බිලියන 106 ක වටිනාකම්ද ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

### ඒක පුද්ගල ණය ප්‍රමාණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 09 ක ඒක පුද්ගල ණය ප්‍රමාණය රූපසටහන 10 හි දැක්වේ.




රූපසටහන 10 ඒක පුද්ගල ණය ප්‍රමාණය

මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන 2013- 2022 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

ඉහත තොරතුරු අනුව මුළු රාජ්‍ය ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රු.264,811 ක් වූ ඒක පුද්ගල ණය වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට රු.1,234,358 ක් දක්වා වැඩිවී තිබුණි. එසේම එය, 2021 දෙසැම්බර් 31 දිනට රු.759,471 ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.474,887 කින් හෙවත් සියයට 62.53 කින් පමණ වැඩිවී තිබුණි.

## රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොළී ගෙවීම වැඩිවීම

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ණය ගැනීම් (දේශීය හා විදේශීය) රු.මිලියන 1,865,589 කින් වැඩි වී තිබුණු අතර ණය සඳහා පොළී ගෙවීම්ද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 516,807 කින් හෙවත් සියයට 49.30 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදීද ණයවාරික හා පොළී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. විස්තර රූපසටහන 11 හි දැක්වේ




රූපසටහන 11 ණය වාරික හා පොළී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2013- 2022

# ජල සම්පාදනය සහ සනීපාරක්ෂක සේවා

## විගණන නිරීක්ෂණ

- ජල සම්පාදන අමාත්‍යාංශය
  - ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය උපයෝජනය කර නොතිබීම
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
  - ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා වූ Nano Filters 80 නියමිත ප්‍රමාණය සපයා නොතිබීම
  - වර්ෂයක කාලයකදී අවසන් කල යුතු ව්‍යාපෘති 4 න් එක් ව්‍යාපෘතියක පොම්පාගාරය පමනක් ඉදිකර තිබීම
  - ජල මනු වල වගකීම් කාලයෙන් ප්‍රයෝජනයක් ගෙන නොතිබීම
  - ජල සම්පාදන ව්‍යාපෘති වල ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා කොන්ත්‍රාත් පිරිනමා තිබීම
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
  - ජල සැපයුම් ඉලක්ක සපුරාගෙන නොතිබීම
  - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා රජයේ දායකත්වය
  - රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති
  - ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය
  - සැමට ජලය වැඩසටහන
  - ජලය නොමැති අවස්ථා වලදී ජලය බෙදා හැරීම සඳහා කැබි රථ 30 ක් මිලදී ගැනීම
  - ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් අමාත්‍යාංශය සඳහා නිදහස් කිරීම
  - ප්‍රසාද දීමනා ගෙවීම
  - ණය ගැනි ශේෂ අයකර ගැනීම

# ජල සම්පාදනය සහ සනීපාරක්ෂක සේවා

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 06 ට අනුව සියළු දෙනාටම ජලය හා සනීපාරක්ෂාව ලබාගැනීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම බලාපොරොත්තුවේ. ඉහත ඉලක්කයන් මූලික කරගත් රටෙහි සමස්ථ ජල සැපයුම සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා ජලසම්පාදන අමාත්‍යාංශය සහ ඒ යටතේ වූ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය යනාදී ආයතන පිහිටුවා තිබුණි. 2022 වර්ෂයේ ජල සම්පාදන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රු. මිලියන 32,223 ක්ද, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා රු. මිලියන 941 ක්ද වශයෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන ලැබී තිබුණු අතර පිළිවෙලින් රු. මිලියන 31,156 ක් හා 787 ක් එනම් සියයට 96.69 ක් හා සියයට 83.63 ක් මෙම ක්ෂේත්‍රය සඳහා උපයෝජනය කර තිබුණි.

රටේ ආරක්ෂිත පානීය ජල ආවරණය යටතේ නල ජල ආවරණය ප්‍රධාන වන අතර 2022 වර්ෂය අවසන් වන විටත් සමස්ථ ජනගහනයෙන් නලජල පරිභෝජන ප්‍රතිශතය සියයට 60.2ක් වැනි අගයක් ගෙන තිබුණි.




රූපසටහන 12 - රටෙහි පානීය නල ජල සැපයුම (2015 සිට 2022 වසර දක්වා) - නල ජල පරිභෝජනය ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය




රූපසටහන 13 - රටෙහි පානීය නල ජල සැපයුම (2015 සිට 2022 වසර දක්වා) - පානීය ජල සැපයුම

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රටෙහි පානීය ජල සැපයුමෙහි ප්‍රමුඛතම කාර්යභාරය ඉටුකරනු ලබන අතර 2022 වර්ෂය වනවිට මණ්ඩලය විසින් රටෙහි සමස්ත පානීය ජල සැපයුමෙන් සියයට 46.6 ක් පමණ ආවරණය කර තිබුණි. කෙසේ වුවද, 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ රටෙහි සමස්ත පානීය ජල සැපයුම සියයට 4.5 කින් වර්ධනය වී තිබුණද එම වැඩිවීමට මණ්ඩලයේ දායකත්වය සියයට 0.7 ක් පමණක් වී තිබුණු අතර ප්‍රජා මූල සංවිධාන මඟින් සිදුකරන ලද ව්‍යාපෘති වලින් ලැබී ඇති දායකත්වය සියයට 3.7 කින් පමණ වැඩිවී තිබුණි.

### ජල සම්පාදන අමාත්‍යාංශය

“සැමට ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව” යන දැක්ම යටතේ පිහිටුවා ඇති ජල සම්පාදන අමාත්‍යාංශයේ, සමස්ත ජනගහනයට ආරක්ෂිත හා ප්‍රමාණවත් පානීය ජල පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රවේශය සහතික කිරීමත්,සැමට ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීමත් ප්‍රධාන අරමුණු වේ. ඒ සඳහා අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකල යුතුව තිබුණි.

- පානීය ජලසම්පාදන හා සනීපාරක්ෂක විෂයට අදාලව ප්‍රතිපත්ති සැකසීම.
- ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් සම්බන්ධ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම .

### ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය උපයෝජනය කර නොතිබීම

චීන රජය විසින් ප්‍රදානයක් ලෙස ජල සම්පාදන අමාත්‍යාංශය වෙත භාර දී තිබූ රු. මිලියන 39 ක් වටිනා ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය 2022 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

### ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා වූ Nano Filters 80 නියමිත ප්‍රමාණය සපයා නොතිබීම

2021 වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ, ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීමේ අරමුණින් **Nano Filters** 80 ක් සපයා සවිකිරීමට දෙපාර්තමේන්තුව කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර විගණන දිනය වූ 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 121 ක් වැය කර ඉන් 25 ක් ඉදිකර අවසන් කර ඇති බව විගණනයට දන්වා තිබුණි. මෙම **Nano Filters** 80 න් 30 ක් සපයා සවි කිරීමට සැලසුම්කර තිබූ පුත්තලම, කුරුණෑගල, අනුරාධපුරය සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල 2023 ජුනි මස සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණවලදී අනාවරණයවූ පරිදි මෙම ප්‍රදේශ සඳහා රු. මිලියන 35.96 ක් වැයකර මිලට ගෙන තිබූ **Nano Filters** 30 න් 03ක් පමණක් සපයා සවිකර තිබුණි.

### වර්ෂයක කාලයකදී අවසන් කල යුතු ව්‍යාපෘති 4 න් එක් ව්‍යාපෘතියක පොම්පාගාරය පමනක් ඉදිකර තිබීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 54 ක්වූ ජල ව්‍යාපෘති 4 කට අදාල කොන්ත්‍රාත් 2021 වර්ෂයේ පෞද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණු අතර එම ඉදිකිරීම් වර්ෂයක පමණ කාලයකදී අවසන් කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘති වලින් එක් ව්‍යාපෘතියක පමණක් පොම්පාගාරය ඉදිකිරීම අවසන් කර තිබුණද ඉතිරි වැඩ කොටස් වසරකට අධික කාලයක සිට නිම නොකර තිබුණි.

### ජල මනු වල වගකීම් කාලයෙන් ප්‍රයෝජනයක් ගෙන නොතිබීම

සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. මිලියන 4.3 ක් වැය කර වසරක වගකීම් කාලයක් සහිතව ජලමනු 945 ක් ක් මිලදීගෙන තිබුණු අතර විගණන දිනය වූ 2023 මාර්තු වන විට එම ජලමනු වසරකට වඩා වැඩි කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව තිබුණි. ඒ අනුව වගකීමක් සහිත මිලකට එම ජලමනු මිලදී ගැනීම ඵල රහිත වී තිබුණි.

### ජල සම්පාදන ව්‍යාපෘති වල ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා කොන්ත්‍රාත් පිරිනමා තිබීම

මඩකලපුව ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 5 කට අදාලව සහ මොණරාගල ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 04 ක ට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා සියයට 24 සිට සියයට 29 ක වැඩි වටිනාකමකට

කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර එසේ ඉක්මවීම් නිසා කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය වැඩිවීම්වල එකතුව රු. මිලියන 15 ක් වී තිබුණි.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

### ජල සැපයුම් ඉලක්ක සපුරාගෙන නොතිබීම

ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ සනීපාරක්ෂාව සැපයීම සඳහා පහසුකම් සපයන ප්‍රධාන ආයතනය වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා 2022- 2025 වර්ෂයන් වෙනුවෙන් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සැමට ජලය ව්‍යාපෘතිය යටතේ ලබා දීමට අපේක්ෂා කර තිබූ නව ජල සම්බන්ධතා සංඛ්‍යාවද ඇතුළත් වන පරිදි සකස් කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ නව ජල සම්බන්ධතා 327,685 ලබා දීමට මුලදී සැලසුම් කොට පසුව එය ජල සම්බන්ධතා 190,000 ක් දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය ලබා දුන් සත්‍ය ජල සම්බන්ධතා සංඛ්‍යාව 153,217 ක් පමණක් විය.

| කාර්ය සාධන දර්ශකය | ඒකකය | 2022 | |
|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා කරගත් |
| ආරක්ෂිත පානීය ජල ආවරණය | ජනගහනයෙන් % | - | 94.3 |
| ආරක්ෂිත නල ජල ආවරණය | ජනගහනයෙන් % | 51.3 | 46.6 |
| නව ජල සැපයුම් සම්බන්ධතා | සංඛ්‍යාව | 190,000 | 153,217 |
| ආරක්ෂිත නල මලාපවහන පහසුකම් | ජනගහනයෙන් % | 2.1 | 2.08 |
| **ආදායම් නොලබන ජල සැපයුම්** | | | |
| කොළඹ නගරය | පිරිපහදු කල ජලයෙන් % | 18 | 24.11 |
| දිවයින පුරා | පිරිපහදු කල ජලයෙන් % | 23 | 25.24 |

වගුව 15 - ජල සැපයුම් ඉලක්ක

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා රජයේ දායකත්වය

මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට රජයේ මැදිහත්වීම මත මණ්ඩලය විසින් දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය වටිනාකම රු. මිලියන 334,844 ක් වී තිබුණි. ඒ සඳහා වර්ෂය තුල රු.මිලියන 21,426 ක මූල්‍ය වියදමක් දරා තිබුණි. තවද, නියැදි පරීක්ෂාවට ලක්වූ ව්‍යාපෘති 16 ක් සඳහා රු. මිලියන 3,214 ක බැඳීම් ගාස්තු (Commitment Charges) 2022 දෙසැම්බර් 31 දින වන විට ගෙවීමට සිදු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. එමෙන්ම 2022 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 115,116 ක ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සහ පොලිය රජයේ භිමිකම් බවට පත් කර තිබුණි. ඒ අනුව එම ණය සහ පොලිය රජය විසින් ගෙවිය යුතුව තිබුණි.

### රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

### ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

නිදන්ගත වකුගඩු රෝගීන් සැලකිය යුතු ප්‍රමාණයක් වාසය කරන වියලි කලාපයක් වන ලග්ගල ප්‍රදේශයේ ජනතාවට වැඩිදියුණු කළ ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබාදීමේ අරමුණෙන් රු.මිලියන 4,496 ක දේශීය මූල්‍ය දායකත්වයක් ලබාදීමේ එකඟතාවයෙන් 2014 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කොට තිබූ අතර වසර 02 කින් එහි ඉදිකිරීම් කටයුතු නිමකිරීමට මූලිකව සැලසුම් කර තිබිණි. 2022 වර්ෂය නිම වන විට ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මි. 2,387 ක් වැය කර තිබුණු අතර විවිධ හේතූන්මත මෙම ව්‍යාපෘතියෙහි කටයුතුද දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි.

### සැමට ජලය වැඩසටහන

2025 වර්ෂය වන විට සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත පිරිසිදු පානීය ජලය ලබා දීමේ අරමුණ මත රු.බිලියන 1,132.5 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2021 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා 2020,2021, සහ 2022 යන වර්ෂයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 24,568 ක්, 29,568 ක් හා රු.මිලියන 17,000 ක් රජයේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් වෙන් කොට තිබුණි. 2020 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත අරමුදල් (අග්‍රිම) ලැබී නොතිබුණි. ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව එම ප්‍රතිපාදන වලින් 2021 වර්ෂය සඳහා රු. මිලියන 7,559 ක් හා 2022 වර්ෂය සඳහා රු. මිලියන 5,400 පමණක් ලැබී තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් කල 2914ක්වූ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් විගණිත දිනය වූ 2022 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම් 1330 ක සියයට 6 ක හා සියයට 6 කට අඩු ප්‍රගතියක් පමණක් ලහා කර ගෙන තිබුණි.

### ජලය නොමැති අවස්ථා වලදී ජලය බෙදා හැරීම සඳහා කැබ් රථ 30 ක් මිලදී ගැනීම

ජල මූලාශ්‍ර නොමැති, ලවණ ආශ්‍රිත ප්‍රශ්න සහිත, අඩු පීඩන බෙදා හැරීමක් ඇති ප්‍රදේශ වල පාරිභෝගිකයන්ට ජලය නොමැති අවස්ථා වලදී ජලය බෙදා හැරීම සඳහා මහ කොළඹ ජල හා අපජල කලමනාකරණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 229ක් වටිනා කෘ කැබ් **(crew cab)** 30 ක් මිලදී ගෙන තිබූ අතර එම කැබ් රථ වලට ජල ටැංකි සවි කිරීම සඳහා තට්ටු සකස් කිරීමට හා ජල මෝටර් හා උපාංග සැපයීම වෙනුවෙන් රු. මිලියන 24 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, එම සවිකල තට්ටු ඉවත් කර වෙනත් කටයුතු සඳහා එම කැබ් රථ යොදාගෙන තිබුණි. ඒ අනුව තට්ටු සවිකිරීම සහ උපාංග වෙනුවෙන් සිදු කරන ලද රු.මිලියන 24ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

### ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් අමාත්‍යාංශය සඳහා නිදහස් කිරීම

2021 නොවැම්බර් 17 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නිකුත් කල මෙහෙයුම් අත්පොතේ වගන්ති 3.5 ට පටහැනිව 2022 වර්ෂය තුල මණ්ඩලය මඟින් අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද නිලධාරීන් 15ක් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 23 ක් මණ්ඩලය මඟින් ගෙවා තිබූ අතර එම වටිනාකමද ඇතුලත්ව 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ජල සම්පාදන අමාත්‍යාංශය

වෙත නිදහස් කරන ලද සේවකයන්ගේ වැටුප් හා දීමනා ලෙස ගෙවූ රු. මිලියන 239 ක මුදලක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කල යුතුව තිබුණි.

### ප්‍රසාද දීමනා ගෙවීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2021 නොවැම්බර් 17 දින නිකුත් කල මෙහෙයුම් අත්පොතට අනුව ප්‍රසාද දීමනා, දිරි දීමනා ගෙවීම සිදු කල යුත්තේ ලාභ ඒකාබද්ධ අරමුදලට යැවීමෙන් පසුව වේ. ඊට පටහැනිව මණ්ඩලය විසින් රු. බිලියන 3 ක පාඩුවක් ලබා තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2022 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වෙනුවට ඵලදායී දීමනාව ලෙස රු. මිලියන 269 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එහි සේවකයන්ට ගෙවා තිබුණි.

### ණය ගැනි ශේෂ අයකර ගැනීම

මණ්ඩලය සතුව වසර 2 කට වඩා වැඩි අයකර නොගත් වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණය ගැතියන්, මලාපවහන ණයගැතියන්, විසන්ධි වූ ණය ගැතියන් සහ අනෙකුත් ණයගැතියන් රු. මිලියන 1,791 ක ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවතුණි. තවද, වාරික 3 කින් අයකර ගත යුතු රු.මිලියන 6 ක් වූ නව සබඳතා සඳහා ජල ගාස්තු වර්ෂ 3 ක් ඉක්මවී ඇති නමුත් අයකර ගෙන නොතිබුණි. රු. මිලියන 16 ක බැර ශේෂයක් ලෙස පවතින නව සම්බන්ධතා ණයගැති ශේෂයක් වර්ෂය අවසාන වන විටත් පවතින නමුත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

# මහජන ආරක්ෂක අංශය

## විගණන නිරීක්ෂණ

- මහජන ආරක්ෂක අමාත්‍යාංශය
  - විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍යයේ ස්ථාපිත කිරීමට නොහැකි වී තිබීම
  - විශේෂ කාර්ය බලකාය සඳහා ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය අවසන කිරීමට නොහැකි වීම
- ශ්‍රී ලංකා පොලීසිය
  - කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම
  - ප්‍රතිපාදන උපයෝජනය කිරීම
  - පොලිස් ආඥා පනත සංශෝධනය නොකිරීම
  - සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලැබී තිබූ මුදල් අදාළ කාර්ය සඳහා උපයෝජනය කර නොගැනීම
  - හබරාදුව "නිල සෙවන" යෝජනා ක්‍රමයේ නිවාස විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම
  - රථ ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති ගොඩනැගිල්ලක් කුලියකට ලබාගෙන තිබීම
  - රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ මිලට නොගැනීම
  - වැරදි සිදුවන වාර ගණන පිළිබඳ තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්‍රියාත්මක නොකිරීම
  - පොලීසියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොතිබීම
  - පොලිස් ත්‍යාග ගෙවීම් වටිනාකම් තීරණය කිරීම සඳහා නිශ්චිත පදනමක් නොතිබීම

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
  - සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් ලබා ගැනීම
  - දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටුතු නොකිරීම
  - කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ බාහිර පාර්ශව වලට ලබා දී තිබූ ඉඩකඩ වෙනුවෙන් කුලී අය නොකිරීම
  - ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මගින් ගෙන තිබූ තීරණ දැනුම් දීමට අදාළ සාක්ෂි නොතිබීම
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
  - සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ඉක්මවා ආදායම් ලබා ගැනීම
  - හැඳුනුම්පත් නිකුත් කිරීමේ ප්‍රමාදය
  - දෝෂ සහිත හැඳුනුම්පත් මුද්‍රණය කිරීම
  - සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීම

# මහජන ආරක්ෂක අංශය

මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය සඳහා කාර්යයන්, රටේ අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම, සමාජ විරෝධී හා අපරාධ ක්‍රියාවන් මර්ධනය, කාන්තාවන් හා දරුවන්ගේ ආරක්ෂාව රැකවරණය තහවුරු කිරීම, විධිමත් රථ වාහන පාලනය හා එය නවීකරණය කිරීම, රාජ්‍ය නොවන සංවිධාන වල ක්‍රියාකාරීත්වය සම්බන්ධව මැදිහත්වීම, පුද්ගලයින් ලියාපදිංචිය හා ආගමන විගමන කටයුතු පාලනය, අන්තරාදායක ඖෂධ භාවිතය පාලනය යන කාර්යයන් මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලින් මූලික කාර්යයන් ලෙස සැකෙවින් හඳුනාගත හැක.

2022 වර්ෂයේ ඉහත කාර්යභාරය ඉටු කිරීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 12,095 ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 11,274 ක් උපයෝජනය කර තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## මහජන ආරක්ෂක අමාත්‍යාංශය

### විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍යයේ ස්ථාපිත කිරීමට නොහැකි වී තිබීම

එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීම සඳහා නිලධාරීන් 160 දෙදෙනෙකු තෝරා ගෙන පුහුණුවීම් ද ලබාදී ඒ සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1,780 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නිලධාරීන් සාම සාධක රාජකාරී සඳහා එක් කිරීමට නොහැකි වී තිබුණි.

### විශේෂ කාර්ය බලකාය සඳහා ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය අවසන කිරීමට නොහැකි වීම

විශේෂ කාර්ය බලකාය වෙත පැවරෙන රාජකාරී සාර්ථකව ඉටු කිරීමට ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 196 ක ව්‍යාපෘතියක් ආරම්භ කර ඒ සඳහා සැපයූ උපකරණ වෙනුවෙන් 2018 වර්ෂයේ රු. මිලියන 159 ක් වැයකර තිබුණි. සන්නිවේදන ජාලය 2017-2020 කාලපරිච්ඡේදය තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කළ ද, 2022 වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබීම මත අපේක්ෂිත ශක්තිමත් සන්නිවේදන ජාලය බිහිකිරීමට විශේෂ කාර්ය බලකායට නොහැකි වී තිබුණි.

## ශ්‍රී ලංකා පොලිසිය

### කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම

ශ්‍රී ලංකා පොලිසිය ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ 45 කින් හා ක්‍රියාකාරී පොලිස් කොට්ඨාට 79 කින් සමන්විත වන අතර දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන සංඛ්‍යාව 607 ක් වේ. මෙම පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානයන්හි නිල ඇඳුම් කාර්ය මණ්ඩලය ලෙස නිලධාරීන් 85,144 ක් ද, පොලිස් සහායක සේවා කාර්ය මණ්ඩලය ලෙස නිලධාරීන් 1272 ක් ද සිවිල් කාර්ය මණ්ඩලය ලෙස නිලධාරීන් 4,279 ක් ද ලෙස එකතුව නිලධාරීන් 90,695 ක් සේවය කරන අතර සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 24,327 ක් විය.

### ප්‍රතිපාදන උපයෝජනය කිරීම

ශ්‍රී ලංකා පොලිසිය සඳහා රු. මිලියන 100,779 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර එයින් පුනරාවර්තන ප්‍රතිපාදනය වූ රු. මිලියන 94,368 න් සියයට 96 ක් ද මූලධන ප්‍රතිපාදනය වූ රු. මිලියන 6,411 න් සියයට 70 ක් ද 2022 වර්ෂය තුලදී උපයෝජනය කර තිබුණි.

### පොලිස් ආඥා පනත සංශෝධනය නොකිරීම

පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. පනත වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද සංශෝධනය කර නොතිබුණි.

### සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලැබී තිබූ මුදල් අදාළ කාර්ය සඳහා උපයෝජනය කර නොගැනීම

2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. මිලියන 46 ක පරිත්‍යාග මුදලින් ඉතිරිව තිබූ රු. මිලියන 12 ක මුදලක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද පිළියෙල කර නොතිබුණි.

### හබරාදුව "නිල සෙවන" යෝජනා ක්‍රමයේ නිවාස විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම

හබරාදුව "නිල සෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 4 බැගින් නිවාස 192 ක් රු.මිලියන 730 කට මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු.මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර මෙම නිල නිවාස අවශ්‍යතාවය හා ඉල්ලුම පිළිබඳ නිවැරදි අධ්‍යනයක් සිදු නොකර මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබීම හේතුවෙන් අදාළ පොදු පහසුකම් ද ඇතුළුව නිවාස 192 ක් විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු ද 2023 මාර්තු මාසය වන විටත් අවසන් කර නොතිබුණි.

### රථ ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති ගොඩනැගිල්ලක් කුලියකට ලබාගෙන තිබීම

ත්‍රස්ත මර්ධන හා විමර්ශණ කොට්ඨාශය හා අළුතින් පිහිටුවන ලද පොලිස් කොට්ඨාස 04 ක් පවත්වාගෙන යාම සඳහා රථ ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති ගොඩනැගිල්ලක් රු. මිලියන 235 ක වාර්ෂික කුලියකට ලබාගෙන තිබුණු අතර එහි මෝටර් රථ ඉහළ, පහළ ගෙන යාම ඇතුළු විදුලි වියදම් සඳහා මාසිකව රු. මිලියන 3 ක් පමණ ගෙවීමට සිදු වී තිබුණද නැවත වසර 02 ක් සඳහා ගොඩනැගිල්ල රු. මිලියන 250 කට නැවත කුලියට ලබාගෙන තිබුණි.

### රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ මිලට නොගැනීම

රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ 25 ක් අවසන් වරට මිලදී ගෙන තිබුණේ 2016 වර්ෂයේ දීය. ඊට පෙර 2014 වර්ෂයේ දී 30 ක් ද, 2010 දී 100 ක් ද, මිලදී ගෙන තිබුණු අතර මෙම උපකරණ අතරින් විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. 2018 - 2022 කාල පරිච්ඡේදයේ වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර (Automatic Speed Trap) 500 බැගින් රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් ඉල්ලුම් කර තිබුණද ඒවා ලැබී නොතිබුණි.

### වැරදි සිදුවන වාර ගණන පිළිබඳ තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්‍රියාත්මක නොකිරීම

2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය මඟින් ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

### පොලීසියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොතිබීම

2022 වර්ෂය අවසාන වන විට පොලීසියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 24,327 ක් ලෙස ගණනය කර තිබුණද, පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි.

**පොලිස් ත්‍යාග ගෙවීම් වටිනාකම් තීරණය කිරීම සඳහා නිශ්චිත පදනමක් නොතිබීම**

පොලිස් ආඥා පනතේ 73 වන වගන්තිය ප්‍රකාර අරමුදලට අදාලව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග 1990 මාර්තු 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබුණ අතර එම නියෝග වර්තමානයට ගැලපෙන අයුරින් යාවත්කාලීන විය යුතුව තිබුණි. මෙහිදී ත්‍යාග මුදල් සාධාරණ පදනමින් ගෙවීම් කිරීම, ගෙවීම් වටිනාකම් තීරණය කිරීම සඳහා නිශ්චිත පදනමක් නොවුණු බැවින් අරමුදල සම්බන්ධ වගන්ති යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවක් විය.

2015 - 2022 කාලපරිච්ඡේදයට අදාල පොලිස් ත්‍යාග අරමුදලේ ප්‍රධාන ආදායම්, වියදම් හා ආයෝජන වටිනාකම් පිළිබඳ තොරතුරු වගුව 16 හි දැක්වේ.

| විස්තරය | 2015 රු.මි. | 2016 රු.මි. | 2017 රු.මි. | 2018 රු.මි. | 2019 රු.මි. | 2020 රු.මි. | 2021 රු.මි. | 2022 රු.මි. |
|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රධාන ආදායම්** | | | | | | | | |
| උසාවි දඩ මුදල් | 713 | 845 | 962 | 1,014 | 984 | 1,017 | 925 | 1,312 |
| රථ වාහන දඩ මුදල් | 438 | 643 | 668 | 945 | 1, 219 | 646 | 698 | 623 |
| ස්ථාවර තැන්පතු පොලී | 325 | 469 | 819 | 1,014 | 1,275 | 1,198 | 902 | 2,045 |
| **එකතුව** | 1,476 | 1,957 | 2,449 | 2,973 | 3,478 | 2,861 | 2,525 | 3,980 |
| **ප්‍රධාන වියදම්** | | | | | | | | |
| ත්‍යාග ගෙවීම් | 567 | 685 | 715 | 885 | 872 | 1,427 | 981 | 1,185 |
| සුභසාධන | - | - | - | - | 6 | 93 | 125 | 360 |
| **එකතුව** | 567 | 685 | 715 | 885 | 878 | 1,520 | 1,106 | 1,545 |
| ප්‍රධාන ආදායමින් වියදම් ප්‍රතිශතය | 38% | 35% | 29% | 30% | 25% | 53% | 44% | 39% |
| ස්ථාවර තැන්පතු වටිනාකම | 5,333 | 6,750 | 8,123 | 9,824 | 12,307 | 14,071 | 15,869 | 17,481 |

වගුව 16 - පොලිස් ත්‍යාග අරමුදලේ ප්‍රධාන ආදායම්, වියදම් හා ආයෝජන වටිනාකම් පිළිබඳ තොරතුරු

මූලාශ්‍රය පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2015 -2022

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අනෙකුත් කරුණු පහත පරිදි විය.

- 2020 හා 2021 වර්ෂ දෙකේදී හැර ඉතිරි වර්ෂ හයේදී පොලිස් නිලධාරීන්ට ත්‍යාග ගෙවීම් හා ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා වැයකර තිබුණේ සියයට 40 ට අඩු ප්‍රතිශතයක් පමණි.
- 2022 ජනවාරි හා පෙබරවාරි මාසවල ආයෝජනය කර තිබූ මුළු වටිනාකම රු.මිලියන 1,490 ක් වූ ස්ථාවර තැන්පතු 4 කට අදාලව 2022 සැප්තැම්බර් මාසයේදී එම තැන්පතු අවලංගු කර ඉහල පොලී අනුපාතයක් යටතේ ආයෝජනය කිරීම තුලින් අත්වන වාසි, අවාසි ගණන් බැලීමෙන් පසු පවතින ආයෝජන අවලංගු කර නැවත ආයෝජනය තුලින් රු.මිලියන 18 ක අමතර පොලියක් උපයා ගත හැකි බව හඳුනාගෙන තිබුණද තීරණ ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් එය අහිමි වී තිබුණි.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් ලබා ගැනීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූලික ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 8,480 වූ අතර, සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 23,500 ක් හෙවත් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 177.12 ක් විය. සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු.මිලියන 23,834 ක් වූ බැවින් සංශෝධිත ආදායම ඉක්මවා රු. මිලියන 335 ක ඉපැයීම් පැවතුණි.

### දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටුතු නොකිරීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2014 වර්ෂයෙන් පසුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුල ගෙව තිබූ දිරිදීමනා වටිනාකම රු.මිලියන 192.2 ක් විය.

### කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ බාහිර පාර්ශව වලට ලබා දී තිබූ ඉඩකඩ වෙනුවෙන් කුලී අය නොකිරීම

බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ සිට හත් වන මහල දක්වා සහ පියස පරිශ්‍රයේ කොටසකට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් කුලී ගෙවනු ලබන අතර පළමු මහලේ බැංකු කිහිපයක් (BOC, NSB, PEOPLE'S BANK, SAMPATH BANK) සඳහා ද දෙවන මහලේ කුරියර් ආයතන දෙකක් සඳහා ද ගනුදෙනු කිරීම සඳහා ඉඩ පහසුකම් වෙන් කර දී ඇති නමුත් එම ආයතනවලින් කුලී හෝ වෙනත් ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.

### ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මගින් ගෙන තිබූ තීරණ දැනුම් දීමට අදාළ සාක්ෂි නොතිබීම

ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මගින් අනුමත කර මුදල් ගෙවීම සඳහා අයදුම්කරුවන් දැනුවත් කළ 2015 වර්ෂයේ සිට 2022 ජූනි 30 දක්වා ලැබූ අයදුම්පත් 2,160 ක් පැවති අතර එම අයදුම්කරුවන්ට අදාළ සහතිකය නිකුත්කර අනුමත ආදායම එකතු කරගැනීම සඳහා පළමු අවස්ථාවේ දී ස්වයංක්‍රීයව යවන ලද ඊ-මේල් පණිවිඩය හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක්ගෙන නොතිබුණි.

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ඉක්මවා ආදායම් ලබා ගැනීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 352 ක් වූ අතර, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 431 ක් හෙවත් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 122 ක් විය. සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු. මිලියන 552 ක් වූ අතර සංශෝධිත ආදායම ඉක්මවා රු. මිලියන 121 ක ඉපයීම් පැවතුණි.

### හැඳුනුම්පත් නිකුත් කිරීමේ ප්‍රමාදය

සහතික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත්කර ඇති අයදුම්පතක් දින 07 ක් ඇතුළත හැඳුනුම්පත් අංශයට භාර දිය යුතු වුව ද, අයදුම්පත්‍ර හැඳුනුම්පත් අංශයට ලැබීමට දින 10 සිට දින 35 ක කාලයක් ගත වී තිබුණු අවස්ථා මෙන්ම ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් භාරදීමට දින 13 සිට දින 51 දක්වා ප්‍රමාද කාලයක් ගත වී තිබුණු අවස්ථා පැවතුණි.

### දෝෂ සහිත හැඳුනුම්පත් මුද්‍රණය කිරීම

සමාලෝචිත වර්ෂයේ දී මුද්‍රණය කරන ලද මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව 628,973 ක් වූ අතර, ඉන් 22,497 ක් හෙවත් සියයට 4 ක් දෝෂ සහිත විය. මෙම දෝෂ සහිත හැඳුනුම්පත් PVC හා Polycarbonate යන කාඩ්පත් වර්ග දෙකෙන්ම අන්තර්ගත වූ නමුත් දෝෂ සහිත මුළු හැඳුනුම්පත් ප්‍රමාණය, උක්ත කාඩ්පත් වර්ග දෙක සඳහා වෙන වෙන ම ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බැවින් දෝෂ සහිත හැඳුනුම්පත්වලට අදාළව පිරිවැය ගණනය සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීම

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සතුව සාමාන්‍ය සේවය යටතේ 2022 ජනවාරි 01 දිනට හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 650,034 ක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ සාමාන්‍ය සේවය යටතේ අයදුම්පත්‍ර 675,583 ක් ලැබී තිබුණු නමුත්, දෙපාර්තමේන්තුව විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සාමාන්‍ය සේවය යටතේ ජාතික හැඳුනුම්පත් 459,978 ක් පමණක් නිකුත්කර ඇති බැවින් 2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කිරීමට ඇති හැඳුනුම්පත් ප්‍රමාණය 865,639 ක් විය.

# ජාතික ආරක්ෂාව

## විගණන නිරීක්ෂණ

- ආරක්ෂක අමාත්‍යාංශය
    - අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම
    - උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ ප්‍රගතිය අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබීම
    - වත්කම් ඵලදායීව උපයෝජනය කර නොගැනීම
- ජාතික ආරක්ෂක අරමුදල
    - නිවාස ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභ ගෙවා අවසන් කිරීමට නොහැකි වීම
    - පොලී අනුපාත වැඩිවීමෙන් සිදුවූ වාසිය ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කර නොගැනීම
- අපි වෙනුවෙන් අපි අරමුදල
    - තෝරාගත් ප්‍රතිලාභීන් ගෙන් ඉතා සුළු පිරිසකට ප්‍රතිලාභ ලබා දීම
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
- රණවිරු සේවා අධිකාරිය
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

# ජාතික ආරක්ෂාව



ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 07 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 16 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයට සම්බන්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම හා විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.
- රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් පවත්වාගෙන යාම.
- පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි පිළිබඳ කටයුතු.
- ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය සහ පශ්චාත් සේවා අධ්‍යාපනය ලබා දීම.
- ගලවා ගැනීමේ මෙහෙයුම් සහ වෙරළාරක්ෂක සේවය පරිපාලනය කිරීම.
- උද්දර්පනයට අදාල කටයුතු, අන්තරාකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය.
- කාලගුණය සහ දේශගුණය පිළිබඳ සේවාවන් සැපයීම.
- නාය යෑම් ආපදා කළමනාකරණය සහ ඊට අදාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම.

2022 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තු මත ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 07 ක් වෙත එකතුව රු.මිලියන 394,477 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 353,125 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 14 හි දැක්වේ.




| | ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා යුධ හමුදාව | ශ්‍රී ලංකා නාවිකහ මුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | බහුකාර්යය සංවර්ධන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 29,339 | 205,787 | 68,845 | 55,236 | 792 | 20,201 | 507 | 13,770 | 394,477 |
| ශුද්ධ වියදම | 27,260 | 193,691 | 61,429 | 42,016 | 369 | 19,332 | 337 | 8,691 | 353,125 |
| ඉතිරිය | 2,079 | 12,096 | 7,416 | 13,219 | 423 | 869 | 170 | 5,079 | 41,351 |

රූපසටහන 14 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - 2022 වාර්ෂික මුල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ආරක්ෂක අමාත්‍යාංශය

#### අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඇතැම් ඉදිකිරීම් ප්‍රමාදවීම, ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීම හේතුවෙන් සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු විසින් රු.මිලියන 1,389 ක හා එක්සත් ජනපද ඩොලර් මිලියන 6.21 ක කාලය දීර්ඝ කිරීමේ හිමිකම්පෑම් (Claims for EOT) 28 ක් ඉල්ලුම් කර තිබුණි.

#### උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ ප්‍රගතිය අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබීම

ආරක්ෂක සේවාවන් අතර පොදු සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කරවීම සඳහා රු. මිලියන 1,192 ක පිරිවැයක් යටතේ උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය වර්ෂ 2014- 2016 කාලසීමාව තුළ අවසන් කිරීමට යෝජිතව පැවතියද විවිධ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති කාලසීමාව අවස්ථා තුනකදී වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර

තිබුණු නමුදු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ලබාදීම 2022 අප්‍රේල් 20 දක්වා ප්‍රමාද වී තිබුණු අතර එදින වනවිට ප්‍රතිපාදන අවුරාතැබීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්ය තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වර්ෂ 06 කට ආසන්න කාලයක් ගතවීම ව්‍යාපෘතිය ප්‍රමාද වීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

### වත්කම් ඵලදායීව උපයෝජනය කර නොගැනීම

උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 38.54 ක් වැයකර මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් හා රු.මිලියන 562 ක් වැයකර ඉදිකිරීම් නිමකර තිබුණු සන්නිවේදන කුළුණු 11 ක් සහ එයට සම්බන්ධිත උපාංග මැදිරි ,සමගාමී ක්‍රියාවන්ගේ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන් 2020 වර්ෂයේ සිට අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකිව තිබුණු අතර ව්‍යාපෘතිය වෙනුවෙන් දරාතිබුණු රු. මිලියන 659 ක පිරිවැය ඵලදායී උපයෝජනයකට ලක්ව නොතිබුණි.

### ජාතික ආරක්ෂක අරමුදල

මෙම අරමුදල 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත යටතේ ජාතික ආරක්ෂාව සඳහා අරමුදල් සැපයීම පිණිස පිහිටුවන ලද අරමුදලක් වන අතර එහි කාර්යයන් පිලිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### නිවාස ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභ ගෙවා අවසන් කිරීමට නොහැකි වීම

මෙත්සෙවණ අර්ධ නිවාස ව්‍යාපෘතිය යටතේ රණවිරුවන්ගේ අඩක් ඉදිකර ඇති නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා 2022 වර්ෂයේදී ප්‍රතිලාභීන් 150 ක් වෙත රු.750,000 බැගින් රු. මිලියන 113 ක ප්‍රතිලාභ ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද එම වර්ෂය තුල කිසිදු වාරික මුදලක් ගෙවීමට අපොහොසත් වී තිබුණි.

### පොලී අනුපාත වැඩිවීමෙන් සිදුවූ වාසිය ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කර නොගැනීම

2022 මැයි මාසයේදී පොලී අනුපාත ඉහල ගොස් ඇතත් ප්‍රති ආයෝජන පිලිබඳ තීරණ ගැනීම මාස දෙකකට අධික කාලයක් ප්‍රමාදවී තිබීම හේතුවෙන් පොලී අනුපාත වැඩිවීමෙන් සිදුවූ වාසිය ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව ප්‍රමාද දින 72 ක් සඳහා අහිමිව තිබුණු ඇස්තමේන්තුගත පොලී ආදායම රු. මිලියන 22 කට අධික විය.

### අපි වෙනුවෙන් අපි අරමුදල

මෙම අරමුදල 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනත යටතේ සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස තැනීම සඳහා හෝ නිවාස මිලදී ගැනීම සඳහා ණය ලබාදීම පිණිස පිහිටුවනලද අරමුදලක් වන අතර එහි කාර්යයන් පිලිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### තෝරාගත් ප්‍රතිලාභීන් ගෙන් ඉතා සුළු පිරිසකට ප්‍රතිලාභ ලබා දීම

2022 වර්ෂයේදී රු. මිලියන 300 ක උපරිමයකට යටත්ව පූර්ණ නිවාස 25ක් සහ අර්ධ නිවාස 350ක් සඳහා නිවාස ආධාර ලබා දීමට සැලසුම්කර ඇතත් ආරක්ෂක අමාත්‍යාංශ මහජන දිනයන්හිදී ඉදිරිපත්වූ ඉල්ලිම් අතරින් තෝරාගත් ප්‍රතිලාභීන් 11 ක් සඳහා පමණක් අර්ධ නිවාස ආධාර ලෙස රු.මිලියන 7 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය සියයට 2.3 ක් වැනි අවම මට්ටමක පැවතුණි.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශ්‍රී ලංකා ගුවන් හමුදාව "ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ" දැක්ම මූලිකව "ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනුන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම" යන මෙහෙවර උදෙසා ප්‍රධාන කාර්යයන් 5ක් ඉටු කරනු ලබයි. මෙම කාර්යභාර්ය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා පරිපාලන ව්‍යුහය කොළඹ ගුවන් හමුදා මූලස්ථානය ඇතුළු මූලික කඳවුරු 05 කින් යුතුව ක්‍රියාත්මක වේ.

- පාකිස්ථාන ණය යෝජනා ක්‍රමය යටතේ යුධ ටැංකි (APC-15) මිලදී ගැනීමට ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 16 ක් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ වූ රේඩාර් පද්ධතියට අමතර කොටස් මිලදී ගැනීම සඳහා යොදවා ගෙන තිබුණි.
- රත්මලාන ගුවන් හමුදා මූලික කඳවුර තුල පවතින ගුවන් හමුදා කෞතුකාගාරයේ 2022 වර්ෂයේදී ඉපයූ රු. මිලියන 21 ක ආදායමින් රජයට අභිමිවූ ආදායම රු.මිලියන 19 ක් විය.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එකතු වටිනාකම රු.මිලියන 53,847 ක්වූ ගුවන් යානා 110 කින් ගුවන් යානා 66ක් වර්ෂ 1 සිට වර්ෂ 23 ක් දක්වා වූ දීර්ඝ කාලයක සිට මෙහෙයුම් කටයුතු වලින් බැහැරව පැවතුණි .
- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරු 3 ක භාණ්ඩ වර්ග 31 කට අදාල එකතු වටිනාකම රු.මිලියන 29 ක් වූ තොග භාවිතයකින් තොරව වසර 01 ක් 09 ක් අතර කාලයක සිට නිෂ්කාර්යව ගබඩා තුල පැවතුණි.
- සාම සාධක හමුදාවට යැවීම සඳහා 2022 අප්‍රේල් 01 දින රු.මිලියන 42 ක් ගෙවා මිලදී ගත් ලෑන්ඩ්රෝවර් ඩිෆෙන්ඩර් ජීප් රථය 2023 මැයි 19 දින වන විට වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද සාම සාධක හමුදාව වෙත යවා නොතිබුණි.
- 2018 වර්ෂයේ රු.මිලියන 946 ක් ගෙවා මිලදී ගන්නා ලද ගුවන්යානා 06 කින් ගුවන් යානා 2 ක් 2020 වර්ෂයේදී හා 2023 වර්ෂයේ දී අනතුරට ලක්වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. මිලදී ගන්නා ලද ඉතිරි ගුවන් යානා 04 ද එන්ජින් පිරිවැඩියාව ප්‍රමාද වීම හේතුවෙන් වසර 2කට අධික කාලයක් නිස්සේ පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. ඒ අනුව දරන ලද මුළු වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.

- 2021 වර්ෂයේදී "X Press Pearl" නෞකාවේ අනතුර මැඩපැවැත්වීම සඳහා දායකත්වය ලබා දීම වෙනුවෙන් ඇ.එ.ජ.ඩො 2,875,136.55 ක වන්දි මුදලක් ප්‍රතිපූර්ණය විය යුතුව පැවති අතර ඒ තුල ඇතුලත් ඇ.එ.ජ.ඩො 1,149,500 ක් වූ අවදානම් දීමනාව ලබා ගැනීමට අවශ්‍ය වැඩිදුර සාක්ෂි ගුවන් හමුදාව විසින් ඉදිරිපත් නොකිරිම හේතුවෙන් අදාල වන්දි ගෙවන පාර්ශව එය ගෙවීම ප්‍රතික්ෂේප කල බැවින් එම මුළු මුදලම රජයට අහිමි වී තිබුණි.
- 2004-2013 දක්වා කාලය තුල විදේශයන් වෙත අළුත්වැඩියාවන් සඳහා යවන ලද එකතු වටිනාකම ඇ.එ.ජ.ඩො 179,633 ක්වූ ගුවන් යානා අමතර කොටස් 50 ක්ද 2016 සිට 2020 දක්වා කාලය තුල විදේශ අළුත්වැඩියා සඳහා යවන ලද ගුවන් යානා අමතර කොටස් 53 ක් ද වර්ෂ 2 සිට 18 දක්වා කාලයක් ගතවී තිබුණද ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.

### ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

සන්නද්ධ හමුදාවල නිලධරයන් අයත්වන අදාළ සේවාවල උචිත පත්වීම් සහ උසස්වීම් සඳහා ඔවුන් සූදානම් කිරීමට හා දැනුම ලබාදීමට මාණ්ඩලික විද්‍යාලයේ දී පුහුණු කිරීම සඳහා තෝරාගනු ලැබූ එම නිලධරයන්ගේ වෘත්තීය දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම ප්‍රධාන මෙහෙවර වූ මාණ්ඩලික විද්‍යාලයේ 2022 වර්ෂයේ සමස්ථ වියදම රු.මිලියන 171 ක් විය.

- රු.මිලියන 133 ක් වැයකර ඉදිකරන ලද සිව් මහල් පුස්තකාල සහ විභාග ශාලා ගොඩනැගිල්ලේ ජල කාන්දුවීමේ ගැටළුව නිසා ඉහල මහලේ විදුලි පද්ධතියට හා බිත්තිවලට විශාල හානියක් සිදු වී තිබුණ අතර එය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොහැකි වී තිබුණි.

### රණවිරු සේවා අධිකාරිය

සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන්ගේ සහ ක්‍රියාන්විතයේදී මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ගේ ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම අධිකාරියේ මූලික අරමුණ විය. 2022 වර්ෂය තුලදී අධිකාරියේ සමස්ථ වියදම රු.මිලියන 464 ක් විය.

- සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආබාධිත, අතුරුදහන්වූවන් සහ මියගිය හෝ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව විධිමත් හා නිවැරදි තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.
- 2001 වර්ෂයේදී අධිකාරිය වෙත නිවාස ඉදිකිරීම සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 1 රූඩ් 1 පර්චස් 09 ක් වූ රු.මිලියන 1.5 කට තක්සේරු කර තිබුණු ඉඩමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

- 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ පූර්ණ නිවාස 1950 ක් සහ අර්ධ නිවාස 1700 ක් වැඩ අවසන් කිරීම වෙනුවෙන් රු.මිලියන 3,192 ක් වෙන් කර තිබුණි. එහෙත් 2022 වර්ෂය අවසන් වන විට ආධාර ලබාදී ඇති ප්‍රතිලාභීන් ගණන 550 ක් වූයෙන් එය සම්පූර්ණ ව්‍යාපෘතියෙන් සියයට 15 ක් තරම් අවම මට්ටමක පැවතුණි.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

වෘත්තීමයභාවය විශ්වාසනීයත්වය හා ගෞරවනීයත්වය තුළින් දේශයේ ඒකීයත්වය, ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම ප්‍රධාන කාර්යය කරගත්, රටතුළ සාමකාමී පරිසරයක් නිර්මාණය කරමින් රාජ්‍යයේ ආරක්ෂාවට අසමසම දායකත්වයක් ලබාදෙමින් ජාතික ව්‍යවසන හා හදිසි තත්ත්වයන්ටද සහයෝගය ලබාදෙමින් කටයුතු කරන විශාලතම හමුදාව යුද්ධ හමුදාව වේ.

යුද්ධ හමුදාවේ කටයුතු සඳහා 2022 වර්ෂයේ වැයකර තිබූ සමස්ත වියදම රු.බිලියන 194 ක් වන අතර, පුනරාවර්ථන වියදම රු.බිලියන 190 ක් විය. එයින් රු.බිලියන 148 ක් වැටුප් හා දීමනා ගෙවීම සඳහා වැයකර තිබුණි. යුද්ධ හමුදාව සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ කරුණු සාරාංශ කර පහත දැක්වේ.

- 2018 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 11 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යුද්ධ හමුදාවට රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර වැව් හතරක ප්‍රතිසංස්කරණයන් මේ වන තෙක්ම නිම නොකිරීම නිසා එම ප්‍රදේශවල ග්‍රාමීය ජනතාව විවිධ අපහසුතාවයට මුහුණ දී තිබුණි. වැව් ප්‍රතිසංස්කරණයට සෘජුවම අදාළ නොවන කාර්යාල හා යන්ත්‍ර උපකරණ සඳහා රු.මිලියන 28 ක් වැයකර තිබුණු අතර, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා දුන් රු.මිලියන 1.6 ක් වටිනා සිමෙන්ති තොගයක් යුද්ධ හමුදා කඳවුරුවල ඉදිකිරීම් සඳහා භාවිතා කර තිබුණි.
- රු.මිලියන 205 ක ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කල ආරක්ෂාව හා ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර, වෙනත් වැය විෂයන් යටතේ රජයේ ඇතැම් සංවර්ධන වැඩසටහන් සඳහා රු.මිලියන 1,153 ක් යුද්ධ හමුදාවට ලබා දී තිබුණු අතර, එයින් රු.මිලියන 634 ක් වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි. මේ යටතේ ප්‍රවේශ මාර්ග දෙකක සහ ප්‍රාථමික විද්‍යාල ගොඩනැගිල්ලක වැඩ නිමකිරීමේ ප්‍රතිශතය සියයට 15 කට අඩු මට්ටමක පැවතුණි.
- යුද්ධ හමුදාවට අයිති හා යුද්ධ හමුදාව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 15 ක් සහ රු.බිලියන 35 ක් වටිනා ගොඩනැගිලි 2,163 ක්

ලේඛනගත කර නොතිබුණු අතර, යුද්ධ හමුදාවට අයිති හා පරිහරණය කරමින් පවතින වාහන 3201 කට රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. තවද, අවශ්‍යතාවය සොයා බැලීමකින් තොරව මිලදී ගත් රු.මිලියන 5 ක් වටිනා ටයර් සහ වාහන බැටරි ඇතුළු උපකරණ ප්‍රයෝජනයට නොගෙනම අපහරණය කිරීමට සිදුව තිබුණු අතර, යුද්ධ හමුදාවේ විවිධ වත්කම්වලට සිදුවූ රු.බිලියන 13 ක වර්ෂ පහ ඉක්මවූ අලාභ හානි අයකර ගැනීම හෝ කපා හැරීම මන්දගාමී ස්වභාවයක පැවතුණි. යුද්ධ හමුදාවේ හා සිවිල් ජනතාවගේ වෛද්‍ය කටයුතු වඩාත් කාර්යක්ෂමව හා උසස් අන්දමින් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 39 ක් වැයකර මිලදී ගත් වෛද්‍ය බස්රථ දෙකෙන් (ජංගම වෛද්‍ය පරීක්ෂණ කාමරයක් සහ ෆාමසියක් සහිත බස් රථයක් සහ ජංගම රසායනාගාර පහසුකම් සහිත බස්රථයක්) යුද්ධ හමුදාවට හා ජනතාවට ලැබුණු සේවය ඉතා අඩු මට්ටමක පැවතුණි.

- සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 47 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව පිළියෙල කර තිබූණු ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නොසළකා රු.මිලියන 693 ක ප්‍රසම්පාදනයන් සඳහා සීමිත/පාලිත ජාතික තරහකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණි. තවද සැපයුම්කරුවන් සතුව තොග පවතීද යන්න සහ පිරිවිතර ලේඛන අවශ්‍ය ආකාරයට විස්තර නොකර මිල ගණන් ඉල්ලුම් කිරීම නිසා තරහකාරී මිල ගණන් ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද, ප්‍රසම්පාදන කටයුතු ලංසු සුරක්ෂණ, කාර්යසාධන සුරක්ෂණ හා ගිවිසුම්ගත වීමක් නොමැතිව සිදු කිරීම නිසා යුද්ධ හමුදාවේ ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා පෙරමුසු කොන්ක්‍රීට් ඇතුළු උපකරණ මිලදී ගැනීමේදී රු.මිලියන 368 ක ද්‍රව්‍ය, සැපයීම සැපයුම්කරුවන් පැහැරහැර තිබුණු අතර, අතිරේක වැයබරක් දරමින් ප්‍රසම්පාදනයන් නැවත කිරීමට සිදුවී තිබුණි.

### ශ්‍රී ලංකා නාවික හමුදාව

1950 අංක 34 දරන නාවික හමුදා පනත මඟින් පිහිටුවා තිබූ ලංකා රාජකීය නාවික හමුදාව 1993 අංක 11 දරණ නාවික හමුදා (සංශෝධන) පනත මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව පිහිටුවා පවත්වාගෙන යනු ලබයි. ජාතික ආරක්ෂාව සහ ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව සමුද්‍රික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නාවික මෙහෙයුම් සිදු කිරීම මෙහෙවර කොටගත් නාවික අරමුණු 15 කින් හා නාවික නොවන ක්‍රියාකාරකම් 07 කින් යුක්ත නාවික හමුදාව සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි නාවික විධාන 07කට බෙදා වෙන් කර පරිපාලනය සිදු කරනු ලබයි.

- 2017 වර්ෂයේදී වෙඩි බෙහෙත් ගබඩාවේ සිදුවී තිබූ රු.මිලියන 8 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු මේ වන විටත් නිම කර නොතිබුණි.

- මීගමුව ප්‍රදේශයේ පෞද්ගලික අධ්‍යයන ආයතනයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නාවික කාර්ය මණ්ඩලය යොදවා තිබුණි. 2019 දෙසැම්බර් ආරම්භකර තිබූ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත මිනිස් දින 1614 ක් ද යොදවා තිබුණු අතර එමෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මිනිස් දින 9901ක් ද වශයෙන් මිනිස් දින 11,515ක් සඳහා දළ වැටුප් වියදම ලෙස රු. මිලියන 28 ක් දරා තිබුණ ද, එය ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත මඟින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත. සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කිරීම සහ බලාත්මක සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම ,ඒවෙව විවිධත්ව කළමනාකරණය, ස්වභාවික හා මිනිසා විසින් කරනු ලබන ව්‍යසනයන් කළමනාකරණය සහ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමත් සමුද්‍ර පරිසරය සුරක්ෂිත කිරීම තුළින් පරිසරයේ සමතුළිත තාවය පවත්වා ගැනීම සහ සමුද්‍ර දූෂණය වැළැක්වීම මෙහෙවරකොට ගත් කාර්යභාරයන් 12 කින් දෙපාර්තමේන්තුව සමන්විත වී තිබුණි.

- පනතේ III වන කොටසේ 11 හා 12 වගන්ති ප්‍රකාරව උපදේශක සභාවක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර අමාත්‍යවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාට යම් කරුණක් පිළිබඳව උපදෙස් ලබාදීමට ද නොහැකි වී තිබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් තහනම් මත්ද්‍රව්‍ය ප්‍රවාහනයේ යෙදුණු බෝට්ටු යාත්‍රා ද ඇතුළුව නාවික යාත්‍රා 07 ක් අත්අඩංගුවට ගෙන තිබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 14 කදී අත්අඩංගුවට ගෙන තිබුණු තහනම් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 330 ක් හා මත්පෙති 1300 ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත භාරදී තිබුණි.
- වටිනාකම රු. මිලියන 284 ක්වූ නෞකා හා යාත්‍රා 07 ක් මාස 03 ක සිට අවුරුදු 3 ක් දක්වා වූ කාලයක සිට අක්‍රීයව පැවතුණද, ප්‍රතිපාදන නොපැවතීම මත ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමට කටයුතු කර නොතිබුණි.

### සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම

සම්පූර්ණ හිමිකාරීත්වය ශ්‍රී ලංකා රජය සතු ආරක්ෂක අමාත්‍යාංශය යටතේ මෙහෙයවනු ලබන රාජ්‍ය සමාගමක් වන මෙම සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත. සමුද්‍රීය ආරක්ෂක, ව්‍යාපාර, කාර්මික හා වාණිජ ආරක්ෂක සේවා, ගිනි නිවීමේ සේවා, අවන්හල් හා ආපනශාලා ව්‍යාපාර, බිම් බෝම්බ ඉවත් කිරීමේ සේවා, මුදල් හා ණය ගනුදෙනු සඳහා ආරක්ෂාව

සැපයීම ආදිය මෙම සමාගමේ කාර්යභාරයට අයත් වේ. ඉහත කාර්යභාරයන් මගින් සමාගම 2020/2021 මූල්‍ය වර්ෂය තුළදී රු.මිලියන 1,986 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර එහි වියදම රු. මිලියන 1,872 ක් වී තිබුණි. සමාගම 220 ක කාර්යමණ්ඩලයකින් සමන්විත වී ඇති අතර ඉන් 181 ක් කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබයි.

- 2016/2017 මූල්‍ය වර්ෂයේ සිට 2020/2021 මූල්‍ය වර්ෂය දක්වා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතය වියාචනය කරන ලද විගණන මතයක් ඉදිරිපත් වී තිබුණි.

- රු.මිලියන 1841 ක්වූ ණයගැතියන් පොත්වලින් ලියාහැර තිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම මීට අදාළ ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණු අතර අදාල අනෙකුත් සාක්ෂි නොවූ බැවින් එම ගනුදෙනුව පරීක්ෂා කිරීමට නොහැකි විය.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 මාර්තු 31 දිනට පැවති රු. මිලියන 557 ක්වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් හා රු. මිලියන 170 ක්වූ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා වූ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ප්‍රකාරව කැඩෙට් නිළධරයන් සහ රජයේ නිලධාරීන් සඳහා රාජ්‍ය ආරක්ෂාව සහ යුධ හමුදා කළමනාකරණය සඳහා අදාල වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ උපදෙස් සැපයීම සඳහා පිහිටුවා ඇත.

- 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිලධරයන් නොවන දේශීය හා විදේශීය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණු අතර, 2022 වර්ෂයේදී එසේ උපාධිය හදාරමින් සිටි සිසුන් 4,376 ක් සඳහා උපාධි පාඨමාලා 31 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම උපාධි පාඨමාලා 31 අතරින් උපාධි පාඨමාලා 11 ක් කැඩෙට් නිලධරයන් නොවන, මුදල් ගෙවීමේ පදනම මත බඳවාගත් සිසුන් සඳහා පමණක් ක්‍රියාත්මකව පැවතුණි.

- 2018 වර්ෂයේදී පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනීම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්ව විද්‍යාලයට ගැලපෙන සේ විශ්වවිද්‍යාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ද පනත

සංශෝධන කාර්යය අවසන්කර නොතිබුණි.

- 2013 වර්ෂයේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ලබා දුන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 201.6 ක ණය මුදලෙන් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට වෙන්කර තිබූ එක්සත් ජනපද ඩොලර් මිලියන 21.5 මුදලක් එනම් රු. මිලියන 7,468 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.

- 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 85 ක් වැයකර මිලදී ගෙන තිබූ වෛද්‍ය උපකරණ 90 ක් ද රු.මිලියන 77 ක් වැයකර මිලදීගත් වෛද්‍ය උපකරණ තොගයක්ද ගබඩාව තුල නිෂ්කාර්යව රඳවා තිබුණි. තවද 2022 මැයි මාසයේ සිට ශික්ෂණ රෝහලේ නේවාසික වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන වාට්ටු අංක 07 භාවිතයට ගැනීම නතරකර වසාදමා තිබූ බැවින් එහි රු. මිලියන 14 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 52 ක්ද, දැඩි සත්කාර ඒකක 02,03 හා 04 යන අංශ භාවිතයට ගැනීම නතර කර තිබූ බැවින් එහි රු. මිලියන 198 ක් වටිනා අයිතමයන් 145 ක්ද වසරකට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව නිශ්කාර්යව පැවති මුළු වත්කම්හි වටිනාකම රු. මිලියන 374 ක් විය.

- කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් හෙක්ටයාර 21.5815 ක භූමියේ විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල ස්ථාපිතකර තිබූ අතර, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විශ්වවිද්‍යාලය වෙත පැවරී නොතිබුණි. එහෙත් එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලිවල වටිනාකම රු. මිලියන 45,386 ක් වූ අතර, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. මිලියන 1,217 ක පිරිවැයක්ද දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 06 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත්කර ගැනීමේ කාර්යයන් අවසන්කර නොතිබුණි.

- 2018 වර්ෂයේදී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ඉදිකිරීමේදී අංශ 56 කට අදාළව රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් එක්සත් ජනපද ඩොලර් 530,000 වැය කරමින් වායු නල පද්ධතියක් (Pneumatic Tube System) ස්ථාපිත කර තිබුණි. නමුත් 2022 වර්ෂය සඳහා භාවිතා කර තිබුණේ අංශ 56 න් අංශ 47 ක් සඳහා පමණක් වුවත් එයිනුත් අංශ 24 ක් සඳහා දත්ත ප්‍රවාහනයට යොදාගෙන තිබුණේ 2 ත් 100 ත් අතර අඩු දත්ත ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය.

- 2022 ජනවාරි 24 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා Amrita Technologies සහ Thinkcube Systems සමාගම සමඟ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහලේ එක්සත් ජනපද ඩොලර් මිලියන 1 වැය කරමින් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ත්‍රිපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව මෙම පද්ධතිය 2023 පෙබරවාරි 24 දින නිම කිරීමට බලාපොරොත්තු වුවද, විගණන දිනය වන 2023 මැයි 31 දින වන විටත් මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය නිම කර නොතිබුණි.

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

විජයග්‍රහණයෙන් පසු රටේ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායකවීමේ මෙහෙවර යටතේ ප්‍රධාන අරමුණු 7කින් යුක්තව දෙපාර්තමේන්තුව සමන්විත වී තිබුණි.

- දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නමුත් එකතුව රු.මිලියන 334 ක හිඟ ආදායම් 2023 මාර්තු මස 24 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxviii පරිච්ඡේදයේ 1.3 වගන්තියට පටහැනිව දෙපාර්තමේන්තුවේ හට/ භටවරියන් 2569 ක් දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන/ පුරාවිද්‍යාස්ථාන ඇතුලු පූජනීය ස්ථාන වෙත විවිධ රාජකාරී කටයුතු සඳහා දීර්ඝ කාලයක සිට අනුයුක්ත කර ඇති අතර, එම හට/භටවරියන්ගේ පැමිණීම, පිටවීම විධිමත් අධීක්ෂණයකින් තොරව 2022 වර්ෂයේදී වැටුප් ලෙස රු.මිලියන 1,294.78 ක මුදලක් ගෙවා තිබුණි.

## බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉලක්කය වන්නේ දිවයින පුරාම අවම අධ්‍යාපන සුදුසුකම් සහිත දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල්වල තරුණ තරුණියන් 100,000ක් තෝරාගෙන ඔවුන්ට විධිමත් වෘත්තිය පුහුණුවක් ලබා දී ඔවුන් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් ලෙස රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ප්‍රාථමික ගණයේ පුරප්පාඩු වල සේවා අවශ්‍යතා සඳහා යෙදවීමයි.මෙම භාරදූර කටයුත්ත මේ වනවිටත් සාර්ථකව ක්‍රියාත්මක වන අතර එම වෘත්තිය මට්ටම් කාර්යසහායකයන් අවශ්‍යතාවය පරිදි පෞද්ගලික අංශයේ රැකියවන් හි නිරත කරවීමටද, අවශ්‍ය නම් විදේශ ශ්‍රම වෙළඳපල අවශ්‍යතා සඳහා යෙදවීමටද සුදුසුවන පරිදි බලගන්වා ඇත.

# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අංශය

## විගණන නිරීක්ෂණ

- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම
- වන්දි මුදල් ඇමරිකානු ඩොලර්වලින් ලබා නොගෙන දේශීය මුදලින් ලබා ගැනීම
- අධිකරණ පරිපාලනය
  - ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණ කිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම
  - සාමුන්ගේ සාක්ෂි ලබා ගැනීමේ ක්‍රම වේදය වෙනස් කිරීම සඳහා මිලට ගෙන තිබූ උපකරණ උපයෝජනයට ගෙන නොතිබීම
- ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
  - ණය සහන ලබාගැනීම සඳහා සිදුකර තිබූ ඉල්ලීම් විසඳීමේ ප්‍රගතිය
- බන්ධනාගාර දෙපාර්තමේන්තුව
  - සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල ආදායම් රජයේ ආදායමට බැර කර නොතිබීම
  - රැඳවියන් සඳහා සිර මැදිරිවල ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම
  - බන්ධනාගාර ධාරිතාවය අනුව රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාව ඉක්මවා රැඳවියන් රඳවා තිබීම
  - රැඳවියන් කාණ්ඩවලට වෙන් කර රඳවා තබානොගැනීම
  - පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී ඇති රැඳවියන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු නොකිරීම
  - රසපරීක්ෂණ වාර්තා නොලැබීම නිසා බන්ධනාගාර ගතකර තිබූ රැඳවියන් සංඛ්‍යාව ඉහල යාම.
  - කළමනාකරණ තොරතුරු පද්ධතිය උපයෝජනය කර නොතිබීම
  - බන්ධනාගාර රෝහල්වලට අනුයුක්තව සේවයේ නියුතු වෛද්‍යවරුන් නියමිත කාලය සේවයේනොයෙදීම
  - අවන්හලක් මුවාවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සම්පත් යොදාගනිමින් පුද්ගලික ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම

- නීතිපති දෙපාර්තමේන්තුව
  - පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දී නොතිබීම
- ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
  - ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමේ දුර්වලතා
  - පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීමේ ප්‍රගතිය දුර්වල වීම
  - විදේශගත වූ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු මුදල් අය කර නොගැනීම
- ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව
  - ප්‍රජා විශෝධන ක්‍රියාවලි සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති වීම
  - ඇණිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම
- උපරිමාධිකරණ විනිශ්චයකාරවරු
  - විසඳා ඇති නඩු ප්‍රමාණයේ ප්‍රගතිය ඉතා පහල මට්ටමක තිබීම
  - තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු නොකිරීම
  - පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කර නොතිබීම
- නීති ආධාර කොමිෂන් සභාව
  - නීති ආධාර සැපයීම සඳහා තිබූ නඩු නිරවුල් කිරීමේ ප්‍රගතිය
- හානි පූර්ණය සඳහා වන කාර්යාලය
  - වන්දි ගෙවීම් ක්‍රියාවලියේ ප්‍රමාදය
  - යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබා දීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම
  - ආර්ථික ප්‍රතිලාභයකින් තොරව ජංගම ගිනුමක මුදල් රඳවා තිබීම
- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
  - ලැබී තිබූ මුළු පැමිණිලි ගණන හා සසඳන විට විමර්ශණය කරන ලද පැමිණිලි ගණන ඉතා අඩු අගයක් ගැණීම
  - ලිපිගොනු යාවත්කාලීන කිරීමේ ප්‍රමාදය
- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය
  - වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබීම
  - රැකවරණ නිවාසය උපයෝජනය කර නොතිබීම

# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අංශය

රටේ මහජනතාව විශ්වාස කරන නීති පද්ධතියක් හා සධාරණ ශ්‍රී ලංකාවක් යන දැක්ම යටතේ, ජනතාව කේන්ද්‍ර කරගත් කාර්යක්ෂම අධිකරණ පරිපාලනය මගින් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා ස්ථාවර සාධාරණ සහ නිදහස් පරිසරයක් ඇති කිරීම මගින් පහත අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිතය.

- ❖ ඵලදායී හා කාලෝචිත නීති ප්‍රතිසංස්කරණ
- ❖ ප්‍රතිපත්ති සංවර්ධන මුල පිරීම්
- ❖ ජත්‍යාන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා සම්බන්ධ වීම.
- ❖ ප්‍රජා නීති සේවා

මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යයන් ගණනාවක් යටතේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන මෙහෙයවීම්, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු අමාත්‍යාංශය වෙත ඇති ප්‍රධාන වගකීම වේ. අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති සියලු ආයතනවල ප්‍රධාන කාර්යයන්ගෙන් සමන්විතව අදාල අරමුණු කරා ලගා වීමට කටයුතු කරයි. ඒ අනුව අධිකරණ හා බන්ධනාගාර කටයුතු යටතේ කාර්යයන් 28ක් ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තු 08 කින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 11 ක් පිහිටුවා ඇති අතර නීති විද්‍යාලය මෙම අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබෙන නමුත් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

2022 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 09 ක් වෙත එකතුව රු.මිලියන 32,138 ක ප්‍රතිපාදන පර්ලිමේන්තුව විසින් අනුමත කර ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එමගින් එකතුව රු. මිලියන 27,114 ක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 15 හි දැක්වේ.




| | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ පරිපාලනය | ණයසහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 8255 | 11176 | 40 | 9106 | 1887 | 137 | 312 | 18 | 677 | 530 | 32138 |
| සත්‍ය වියදම | 4849 | 10616 | 37 | 8396 | 1744 | 133 | 300 | 16 | 531 | 492 | 27114 |
| ඉතිරි ප්‍රතිපාදනය | 3406 | 560 | 3 | 710 | 143 | 4 | 12 | 2 | 146 | 38 | 5024 |

රූපසටහන 15 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් විගණනයේදී අනාවරණය වූ කරුණු සාරාංශ කර පහත පරිදි විය.

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම**

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීමට නිශ්චිත කාලරාමුවක් හඳුනාගැනීම සඳහා 2020,2021 හා 2022 වාර්ෂික ඇස්තමේන්තු වලින් පිළිවෙලින් රු.මිලියන 50, රු.මිලියන 100 හා රු.මිලියන 5 ක් වශයෙන් එකතුව රු.මිලියන 155 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද ඉන් 2020, 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 41 ක්, රු. මිලියන 88 ක් හා රු. මිලියන 4 ක් හෙවත් සියයට 78 සිට සියයට 88 ක් දක්වා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**වන්දි මුදල් ඇමරිකානු ඩොලර්වලින් ලබා නොගෙන දේශීය මුදලින් ලබා ගැනීම**

ගිනිගෙන තිබූ MV X – Press Pearl නෞකාව නිසා සිදු වී තිබූ සමුද්‍රීය උපද්‍රවය හේතුවෙන් මුහුදු පද්ධතියට වෙරල බඩ හා ගොඩබිම පද්ධතියට යිවර ප්‍රජාවට සිදු වූ හානි ප්‍රතිපූර්ණය සඳහා නීතිමය පියවර ගැනීමට ඕස්ට්‍රේලියානු නීතිඥ සමාගමකට රු. මිලියන 77 ක් ගෙවා තිබුණි. මෙලෙස ඉහළ මිලක් ගෙවා ජාත්‍යාන්තර නීතිඥ සමාගමක සේවය ලබා ගෙන තිබුණද,වන්දි මුදල ඇමරිකානු ඩොලර්වලින්ම ලබා නොගෙන රු. මිලියන 912 ක වටිනාකමකින් යුත් වන්දි මුදලක් අභ්‍යන්තර ප්‍රේෂණය වශයෙන් භාර ගැනීම විගණනයේ දී ගැටළු සහගත විය.

## අධිකරණ පරිපාලනය

### ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණ කිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම

2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රීයකරණ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් උපදේශන සේවා සැපයීමට රු.මිලියන 79 ක මුදලක් ගිවිසුම්ගත වී තිබුණු අතර ඒ වෙනුවෙන් රු. මිලියන 36 ක මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි. 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 49 ක් වූ වියදම් දරා තිබුණද, 2022 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පමණක් සිදු කර තිබුණි. උපදේශන සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය ගෙවූ මුදලින් රු. මිලියන 27 ක මුදලක් නැවත අධිකරණ අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබූ අතර ව්‍යාපෘතිය අත්හිටුවීමට අමාත්‍යාංශය තීරණය කර තිබුණි.

### ළමුන්ගේ සාක්ෂි ලබා ගැනීමේ ක්‍රම වේදය වෙනස් කිරීම සඳහා මිලට ගෙන තිබූ උපකරණ උපයෝජනයට ගෙන නොතිබීම

ළමුන්ගේ සාක්ෂි විවෘත අධිකරණයෙන් ලබා නොගෙන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා මඟින් ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඇමතුම් කට්ටල 26 ක් ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 49 ක වියදම් දරා තිබුණද විගණිත දින වන විටත් අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

### ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ශාඛා මණ්ඩල සඳහා අනුමත සාමාජිකයන් ප්‍රමාණය පත් කර නොතිබීම

ශාඛා මණ්ඩලවල සංයුතිය සභාපතිවරයාගෙන් හා සිව් දෙනෙකුට නොවැඩි හා දෙදෙනෙකුට නොඅඩුවන්නා වූ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු වුව ද, කුරුණෑගල ශාඛා මණ්ඩලය 2022 සැප්තැම්බර් මස සිට සභාපති හා තවත් එක් සාමාජිකයෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. තවද, කුරුණෑගල ශාඛා මණ්ඩලයට අධිකරණ සේවා බල ප්‍රදේශ 34 න් 14 ක කාර්යයන් පැවරී ඇති බැවින්, ප්‍රාදේශිය ශාඛා මණ්ඩල පිහිටුවීමෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව පිළිබඳ ගැටලු සහගත විය.

### ණය සහන ලබාගැනීම සඳහා සිදුකර තිබූ ඉල්ලීම් විසඳීමේ ප්‍රගතිය

2019 සිට 2022 දක්වා වර්ෂ 04 තුළ ලද මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව, විසඳූ ඉල්ලුම්පත් සංඛ්‍යාව හා ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව පිළිබඳ විස්තර වගුව 17 හි දැක්වේ.

| | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|
| මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1881 | 1406 | 1268 | 1237 |
| වර්ෂය තුළ විසඳූ මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 822 | 230 | 222 | 416 |
| දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 1059 | 1176 | 1046 | 821 |
| ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාවට ප්‍රතිශතයක් ලෙස (%) | 57 | 84 | 82 | 66 |

වගුව 17 - ණය සහන ලබාගැනීම සඳහා සිදුකර තිබූ ඉල්ලීම් විසඳීමේ ප්‍රගතිය

2022 වර්ෂය වන විට දෙපාර්තමේන්තුව සතුව පැවති මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව 1881 ක් විය. 2022 දෙසැම්බර් 31 දිනට අවසන් නොවූ ඉල්ලුම්පත් සංඛ්‍යාව 1,059 ක්වූ අතර ඒ තුළ ප්‍රධාන කාර්යාලය සතු ඉල්ලුම්පත් 192 ක්ද, කොළඹ, ගාල්ල, ගම්පහ හා කුරුණෑගල ශාඛා මණ්ඩල සතු ඉල්ලුම්පත් පිළිවෙලින් 177, 106, 281 හා 303 ක්විය විය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර නේවාසිකයින් විධිමත් පුනරුත්ථාපනය මගින් නීති ගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත් කර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීමට දායක වීම හා බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු වන අතර, ඒ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 09 ක් ඉටු කරයි.

## සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල ආදායම් රජයේ ආදායමට බැර කර නොතිබීම

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර ජල හා විදුලිය වෙනුවෙන් ද වැය වන වියදම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි. නමුත් ඒවාගේ බදු කුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. බන්ධනාගාර ආයතන 09 ක 2022 වර්ෂයේ මුල් මාස 06 තුළ ආපනශාලා සහ අලෙවිසැල්වල එම ආපනශාලාවලට නුයුක්ත බන්ධනාගාර නිලධාරීන් 27 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා වේතන වශයෙන් රු.මිලියන 8 ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි. මීට අමතරව මිනිස් දින 5,581 ක සිර ශ්‍රමය යොදාගෙන තිබූ අතර රැඳවියන් හට ආහාර ද්‍රව්‍ය හා සනීපරක්ෂක දෑ අලෙවියෙන් පමණක් රු.මිලියන 105 ක ආදායමක් උපයා තිබුණි.

## රැඳවියන් සඳහා සිර මැදිරිවල ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම

පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුගතව රැඳවියන්ගේ මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට

ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු වුවත්, 2022 ජූලි 01 දින වන විට බන්ධනාගාර 14 ක පිරිමි රැඳවියන් සඳහා වර්ග අඩි 108,689 ක ඌන ඉඩකඩ ප්‍රමාණයක් පැවතුණි.

2015 දෙසැම්බර් 31 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිට රැඳවියන් ප්‍රමාණය රූපසටහන 16 පරිදි විය.




රූපසටහන 16 - බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිට රැඳවියන් ප්‍රමාණය

මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය




රූපසටහන 17 - 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ එක් එක් මාසය තුළ බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය

මූලාශ්‍රය - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය

### බන්ධනාගාර ධාරිතාවය අනුව රඳවිය හැකි රඳවියන් සංඛ්‍යාව ඉක්මවා රඳවියන් රඳවා තිබීම

2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ධාරිතාවය අනුව රඳවිය හැකි රඳවියන් සංඛ්‍යාව 11,291 ක් වුවද, එය ඉක්මවා රඳවා සිටි රඳවියන් සංඛ්‍යාව 14,885 ක් විය. 2022 දෙසැම්බර් 31 දින වන විට එක් එක් බන්ධනාගාර ආයතන 27 ක සංඛ්‍යාත්මක තොරතුරු අනුව ධාරිතාවය ඉක්මවූ රඳවියන් සංඛ්‍යාවේ පරාසය 62 සිට 1,907 දක්වා ඉහළ අගයක් විය.

### රඳවියන් කාණ්ඩවලට වෙන් කර රඳවා තබානොගැනීම

බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව රඳවියන් කාණ්ඩවලට වෙන් කර රඳවා තබාගත යුතුය. නමුත් විගණනය විසින් බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවලදී අවස්ථා 04 කදී රඳවියන් 2,222 දෙනෙකු වර්ගීකරණයකින් තොරව රඳවා තබා තිබුණි.

### පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී ඇති රඳවියන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු නොකිරීම

2022 නොවැම්බර් 01 දින වන විට අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට අපේක්ෂාවෙන් මාස 06 කට වැඩි කාලයක් වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටි රඳවියන් සංඛ්‍යාව 1,271 ක් විය.

### රසපරීක්ෂණ වාර්තා නොලැබීම නිසා බන්ධනාගාර ගතකර තිබූ රඳවියන් සංඛ්‍යාව ඉහල යාම

අධිකරණය මගින් බන්ධනාගාර ගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලිසිය විසින් රසපරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාළ රසපරීක්ෂණ වාර්තා මෙතෙක් ඉදිරිපත් නොවීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් සංඛ්‍යාව 5,676 දෙනෙකු විය.

### කළමනාකරණ තොරතුරු පද්ධතිය උපයෝජනය කර නොතිබීම

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රු. මිලියන 221 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 152 ක් වැය කර තිබුණි. නමුත් කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම තුළින් බලාපොරොත්තු වූ අපේක්ෂිත අරමුණු ලභා කරගෙන නොතිබුණි.

### බන්ධනාගාර රෝහල්වලට අනුයුක්තව සේවයේ නියුතු වෛද්‍යවරුන් නියමිත කාලය සේවයේ නොයෙදීම

සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස් අනුව බන්ධනාගාර රෝහල්වල වෛද්‍යවරුන් සතියේ දිනවල දිනකට පැය 06 ක අවම කාලයක් සහ සෙනසුරාදා දිනයන්හි පැය 04 ක කාලයක් සේවය කළ යුතු වුව ද, බන්ධනාගාර රෝහල්වලට අනුයුක්තව සේවයේ නියුතු වෛද්‍යවරුන් 33 දෙනෙකු මාසයක කාලපරිච්ඡේදයක් සඳහා මුළු මිනිස්

පැය 4,570 ක් සේවය කළ යුතු වුව ද සේවය කර තිබුනේ මිනිස් පැය 1,296 ක් පමණි.

### අවන්හලක් මුවාවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සම්පත් යොදාගනිමින් පුද්ගලික ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම

අනුරාධපුර බන්ධනාගාරයේ සුභසාධන අලෙවිසැල් සම්බන්ධව අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින දුර්වලතා නිසා බන්ධනාගාර සැරයන්වරයෙකු විසින් සුභසාධන සංගමය මඟින් පවත්වාගෙන යන අවන්හලක් මුවාවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සම්පත් යොදාගනිමින් පුද්ගලික ව්‍යාපාර කටයුත්තක් ලෙස මහා පරිමාණ අවන්හලක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යමින් තිබුණි.

### නීතිපති දෙපාර්තමේන්තුව

### පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දී නොතිබීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම සිදුකළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුව මේ දක්වා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සිදුකර නොතිබුණි.

### ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

### ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමේ දුර්වලතා

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කල රු. මිලියන 19 ක ප්‍රතිපාදන මාරුකර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරු කිරීමේ ප්‍රතිශතය සියයට 13 සිට සියයට 333 අතර පරාසයක් ගෙන තිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ ලබාගත් ප්‍රතිපාදන වලින් වැය විෂයයන් තුනක සියයට 24 සිට සියයට 68 දක්වා ඉතිරිවීම් පැවතිණි.මූලධන වැය විෂයයක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු. මිලියන 5 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීමේ ප්‍රගතිය දුර්වල වීම

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දෙපාර්තමේන්තුවේ අංශ 12 ක් සඳහා නඩු 7700 ක් පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා ඉතිරි වී තිබුණු අතර, 2022 වර්ෂයේ දී තවත් නඩු 45,245 ක් ලැබී තිබුණි. මින් 2022 වර්ෂය තුළ දී වාර්තා කළ නඩු සංඛ්‍යාව 40,756 ක් වන අතර වර්ෂය අවසානයේ විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නඩු 12,189 ක් ඉතිරි වී තිබුණි.

### විදේශගත වූ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු මුදල් අය කර නොගැනීම

වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් තිදෙනෙකු ගෙන් අයවිය යුතු රු. මිලියන 3 ක මුළු දණ්ඩන මුදල සහ වැටුප් සහිත නිවාඩු ලබා විදේශ ගත වූ සහකාර රස පරීක්ෂකවරියක නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් අය විය යුතු රු. මිලියන 9 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද විදේශගත වූ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයකු අසනීපවීම හේතුවෙන් නැවත ලංකාවට පැමිණ තිබූ අතර,එම නිළධාරියාට පාඨමාලා ගාස්තු ඇතුළුව අනෙකුත් වියදම් සඳහා දරන ලද රු. මිලියන 6 ක මුදල දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

## ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව

### ප්‍රජා විශෝධන ක්‍රියාවලි සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති වීම

ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නිරත නිලධාරීන්ට තම කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් හා කාර්යාලීය පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදිය යුතු වුව ද, පළාත් 9 මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා තිබෙන ප්‍රජා විශෝධන කාර්යාල 49 ක ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිවීම හේතුවෙන් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී තිබුණි.

### ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා 2018 වර්ෂයේ රු. මිලියන3 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 97 ක් ලබාදී තිබුණද, ප්‍රධාන කාර්යාලවලින් පාලනය වන පරිදි ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතියක් වැඩි දියුණු කර නොතිබීම හේතුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

## උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැමිණ ඇති බලතල ක්‍රියාත්මක කරමින් කාර්යක්ෂමව යුක්තිය පසිඳලීම තුළින් ශ්‍රී ලාංකික ජනතාවගේ විශ්වාසය සුරක්ෂිත කිරීම හා එමඟින් ජනතා අභිවෘද්ධිය සැලසීම ශ්‍රේෂ්ඨාධිකරණයේ අරමුණ විය.

### විසඳා ඇති නඩු ප්‍රමාණයේ ප්‍රගතිය ඉතා පහල මට්ටමක තිබීම

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ විසඳීමට තිබූ මුළු නඩු ප්‍රමාණය 6,678 ක් වුව ද, එම කාලය තුළ විසඳා ඇති නඩු ප්‍රමාණය 1,196 ක් වීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් විසඳීමට ඇති නඩු ප්‍රමාණය 5,482 ක් විය. එනම් වර්ෂය ආරම්භයේ විසඳීමට තිබූ නඩුවලට සාපේක්ෂව විසඳා ඇති නඩු ප්‍රමාණය සියයට 18 ක තරම් පහළ ප්‍රතිශතයක් විය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු නොකිරීම

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි.

### පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කර නොතිබීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, කොමිෂන් සභාව මේ දක්වා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සිදුකර නොතිබුණි.

## නීති ආධාර කොමිෂන් සභාව

### නීති ආධාර සැපයීම සඳහා තිබූ නඩු නිරවුල් කිරීමේ ප්‍රගතිය

කොමිෂන් සභාවේ 2022 කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව නීති ආධාර සැපයීම සඳහා 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාව 38,099 ක් වූ අතර, 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අලුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 11,380 ක් වූයෙන් එම කාල සීමාව තුළ කටයුතු කිරීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 49,479 ක් විය. ඉන් නඩු 10,740 ක් දෙසැම්බර් 31 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර තිබුණු අතර, එදිනට තවදුරටත් නිරවුල් කිරීමට තිබූ නඩු 38,739 ක් විය. එය මුළු සේවා සැපයීමට තිබූ නඩු සංඛ්‍යාවෙන් සියයට 78 ක් විය.

## හානි පූර්ණය සඳහා වන කාර්යාලය

### වන්දි ගෙවීම් ක්‍රියාවලියේ ප්‍රමාදය

හානි පූර්ණය සඳහා වන කාර්යාලයේ වන්දි ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී අනාවරණය වූ පරිදි වන්දි යෝජනා ක්‍රම 04 ක් යටතේ 2002 වර්ෂයේ සිට ආයතනය වෙත යොමු කර තිබූ රු. මිලියන 653 ක් වටිනා වන්දි අයදුම්පත් 4,770 ක් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වන්දි මුදල් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

### යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබා දීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද වන්දිලාභීන් හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබා දීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වී නොතිබුණි. 2022 වර්ෂය සඳහා වන්දි ප්‍රතිලාභීන් හට ලබාදී තිබුණු චෙක්පත් අතුරින් රු. මිලියන 18 ක් වටිනා චෙක්පත් 150 ක තොරතුරු නිවැරදි නොවීම මත බැංකුව විසින් අගරු කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 30 ක් වටිනා චෙක්පත් 448 ක කාලය දීර්ඝ කිරීම් කර තිබුණි.

### ආර්ථික ප්‍රතිලාභයකින් තොරව ජංගම ගිනුමක මුදල් රඳවා තිබීම

ඒකාබද්ධ ණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂය තුළ උපලබ්ධි වී තිබුණු රු. මිලියන 115 ක ආයෝජනවලින් 2022 ඔක්තෝබර් 21 දින සිට පැවති රු. මිලියන 20 ක මුදල් සහ ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරය වෙතින් ලැබුණු 2022 මාර්තු 22 වන දින සිට රඳවා තබාගෙන ඇති රු. මිලියන 5 ක මුදල් කිසිදු ආර්ථික ප්‍රතිලාභයකින් තොරව විගණන දිනය දක්වා හානි පූර්ණ කාර්යාලයේ බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

### අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

### ලැබී තිබූ මුළු පැමිණිලි ගණන හා සසඳන විට විමර්ශණය කරන ලද පැමිණිලි ගණන ඉතා අඩු අගයක් ගැණීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමට අදාල පනතේ ප්‍රධාන කාර්යයන් අතරට අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාල බලධාරියා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම හා අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ආරක්ෂා කිරීම ඇතුලත් වුව ද, කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දක්වා ලැබී තිබූ මුළු පැමිණිලි ගණන 14,988 ක් වූ අතර, එදිනට විසඳන ලද පැමිණිලි ගණන 2389 ක් විය. ඒ අනුව ලැබී තිබූ මුළු පැමිණිලි ගණන හා සසඳන විට විමර්ශණය කරන ලද පැමිණිලි ගණන සියයට 15 වැනි අඩු මට්ටමක පැවතිණි.

### ලිපිගොනු යාවත්කාලීන කිරීමේ ප්‍රමාදය

2022 වර්ෂය තුල දී රු. මිලියන 9 ක් වැයකර විමර්ශන අංශයේද සහයෝගය සමඟ විමර්ශන පැවැත්වීම සහ ලිපිගොනු 9000 ක් යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබූ අතර මින් වර්ෂය අවසාන වන විට රු. මිලියන 21 ක් වැයකර ලිපිගොනු 2389 ක් පමණක් යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ මුදලට වඩා සියයට 226 කින් සත්‍ය මුදල වැඩි වී තිබූ අතර ඒ අනුව නිසියාකාරයෙන් මුදල් ඇස්තමේන්තු කිරීමක් සිදුකර නොතිබුණි.

### අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

### වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබීම

අපරාධයක වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු වුවත්, අධිකාරිය පිහිටුවා වර්ෂ 7 ක් ගත වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර මෙම අරමුදලෙහි 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16 ක ශේෂයක් පැවතුණි.

### රැකවරණ නිවාසය උපයෝජනය කර නොතිබීම

රැකවරණ නිවාසයක් පවත්වාගෙන යාම සඳහා වස්කඩුව ප්‍රදේශයෙන් ඉඩම සහ ගොඩනැඟිල්ල රු. මිලියන 21 ක මුදලකට ඒ සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා අනෙකුත් උපකරණ මිලදීගැනීමට රු. මිලියන 1 ක මුදලක්ද වැයකර තිබුණු නමුත් මෙම රැකවරණ නිවාසය උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතුණි.

# කාන්තා හා ළමා කටයුතු අංශය

## විගණන නිරීක්ෂණ

- ගිනි ගෙන තිබූ වාහනයකට අදාළ රක්ෂණ ආවරණය අයකර ගැනීමට කටයුතු නොකිරීම
- ඩිජිටල් අලෙවිකරණ වේදිකාවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම
- විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය
- කාලීන දත්ත හා වාර්තා අදාල ආයතනයට සැපයීමේ අරමුණින් ආරම්භ කර තිබූ දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# කාන්තා හා ළමා කටයුතු අංශය

ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කරන හිතකර සංවේදී සමාජයක් බිහිකිරීමේ අපේක්ෂාවෙන් කාන්තා, ළමාකටයුතු හා සමාජසවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ කාන්තා, ළමා කටයුතු අංශය , පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනයන් පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

- අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරණ ක්‍රම තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම් වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වැළැක්වීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා කටයුතුවලට අදාල තිරසර සංවර්ධන අභිමතාර්ත ඉටුකර ගැනීම.
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවන් ඇති කිරීමේ අභිප්‍රායෙන් ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙනසේ වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 33,394 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන්

රු.මිලියන 19,385 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 18 හි දැක්වේ.




| | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | එකතුව |
|---|---|---|---|---|
| ප්‍රතිපාදනය | 32,639 | 434 | 321 | 33,394 |
| වියදම | 18,646 | 425 | 314 | 19,385 |
| ඉතිරිය | 13,993 | 9 | 7 | 14,009 |

රූපසටහන 18 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

**ගිනි ගෙන තිබූ වාහනයකට අදාළ රක්ෂණ ආවරණය අයකර ගැනීමට කටයුතු නොකිරීම**

අමාත්‍යාංශයට අයත් රක්ෂිත වටිනාකම රු. මිලියන 22 ක් වූ මෝටර් රථයක් ගිණි ගැනීමට ලක්වීම හේතුවෙන් අනතුර සිදු වී මාස 07 ට පසුව නිකුත් කර තිබූ අවසන් වාර්තාව අනුව රක්ෂණ සමාගමෙන් රු.මිලියන 17 ක් අයකර ගත හැකි බව දක්වා තිබුණද එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ඩිජිටල් අලෙවිකරණ වේදිකාවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කාන්තා ව්‍යවසායකයන් වෙනුවෙන් ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් (E- Pola) ස්ථාපිත කිරීමට කටයුතු කර තිබුණි. මේ සඳහා 2022 වර්ෂය අවසාන වන විට රු. මිලියන 4.4 ක මුදලක් අමාත්‍යාංශය විසින් වියදම් කර තිබුණි. කාන්තා ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා මාර්ග ගත අලෙවිකරණ වේදිකාවක් වූ මෙම පද්ධතිය තුල කාන්තාවන් 143 දෙනෙකු පමණ ලියාපදිංචි කර තිබුණද අලෙවිකරණ කටයුතු සිදු කර නොතිබුණි.

### විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකු ආධාර යටතේ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව හා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. මිලියන 1,895 ක ප්‍රතිපාදනයක්ද ලබා දී තිබුණද, කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 37 ක් වූ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 20 ක ඉදිකිරීම් කටයුතු අවලංගු කර තිබුණි.

### කාලීන දත්ත හා වාර්තා අදාල ආයතනයට සැපයීමේ අරමුණින් ආරම්භ කර තිබූ දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත සැපයීම සඳහා තොරතුරු රැස් කර තබා ගැනීමේ දුෂ්කරතාවය නිසා නිවැරදි , කාලීන දත්ත හා වාර්තා අදාල ආයතනයට සැපයීමේ අරමුණෙන් රු. මිලියන 2 ක මුදලක් වැය කර දත්ත පද්ධතියක් නිර්මාණය කර තිබුණ නමුත් දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේ සංකීර්ණ බව හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

### ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු කාලයක් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු. මිලියන 18 ක වටිනාකමකට මිළදීගෙන තිබුණද එම ඉඩම මේ දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

# විදේශ රැකියා අංශය

## විගණන නිරීක්ෂණ

- කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළ ගිවිසුම යාවත්කාලීන නොකිරීම
- විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කිරීම
- අනුමත සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම
- අබුඩාබි තානිපති කාර්යාලය හා කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදුකර ඇති මූල්‍ය අක්‍රමිකතා
- අධිකාරී බලය නොලත් ගණුදෙනු
- කම්කරු සුභසාධන අරමුදල
    - විගමණිකයින් සඳහා රුපියල් මිලියනයක් වටිනා නිවාසය බැගින් තනාදීමේ වැඩසටහනේ ඌන ප්‍රගතිය
    - ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම
    - කාර්යාංශය වෙත ලැබී තිබූ අරමුදල් අදාල කාර්යයයන් වෙත නොයොදා රදවා ගැනීම
    - ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක නොකිරීම
- ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම
    - රැකියා ඇබෑර්තු සඳහා ප්‍රමාණවත් ශ්‍රමිකයන් පිරිසක් යොමු කිරීමට අපොහොසත් වීම

# විදේශ රැකියා අංශය



ශ්‍රී ලංකාව ස්වභාවික සම්පත් බහුල රටක් වුවද විදේශ වෙළඳ පොලේ අනමාය ඉල්ලුමක් සහිත නිෂ්පාදන සඳහා වූ තාක්ෂණික හා ප්‍රාග්ධන ඌනතාවය නිසා තවදුරටත් ප්‍රාථමික භාණ්ඩ අපනයනය කරන රටක තත්වයේ රැඳී සිටීමට සිදු වී ඇත. එමෙන්ම රටේ ඛනිජ සම්පත් වල හිඟතාවය නිසා තවදුරටත් සීමිත ජල විදුලි බල ශක්තීන් හැර අනෙකුත් සියලුම බල ශක්ති අවශ්‍යතා සඳහා විදේශ වෙළඳ පොළ වෙත යාමට සිදු වීම මගින් රටේ ආනයන අපනයන පරතරය දිගින් දිගටම අවාසිදායක තත්වයක පැවතුණි. මෙම තත්වයෙන් ජය ගැනීම සඳහා හොඳම විසඳුම අනමාය ඉල්ලුමක් සහිත විදේශ ශ්‍රම වෙළඳ පොලක් බිහි කිරීම නමුත් ඒ සඳහා සුදුසු විදේශ පුහුණු ශ්‍රම බලකායක් බිහිකිරීමට කටයුතු කළ යුතුය. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රමුඛතම ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වන අතර පහත සඳහන් ආයතනික ව්‍යූහය මගින් එහි සේවාව පුළුල් කර තිබුණි.

- විදේශ දූත මණ්ඩල 15 ක කම්කරු සුභසාධන අංශ පිහිටුවා තිබීම.
- විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටළු වලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා රැඳවුම් නිවාස 05 ක් මෙම සුභසාධන අංශ යටතේ පවත්වාගෙන යාම.
- විගමනික ශ්‍රමිකයන් හුරු කිරීමේ සහ පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 10 ක් පවත්වා ගෙන යාම.
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශිය කාර්යාල 06 ක් ස්ථාපිත කර තිබීම.

2022 වර්ෂය තුළ කාර්යාංශය විසින් තම සේවාව තුළින් එකතුව රු. මිලියන 11,470 ක ආදායමක් උපයා තිබුණු අතර මුළු වියදම රු.මිලියන 3,680ක් වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට කාර්යාංශය සතු මුළු ආයෝජන වටිනාකම රු. මිලියන 23,251 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු අනුව 2022 වර්ෂයේ කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 311,046 ක් වී තිබුණි. ඉන් 183,649 (60%) ක් ගෘහ සේවක, අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් වී තිබුණි. වෘත්තීය ගණයේ රැකියා සඳහා සහ පුහුණුවලත් රැකියා සඳහා පිටත්වූ සංඛ්‍යා පිළිවෙලින් 14,307 ක් සහ 40,174 ක් වී තිබුණි.




රූපසටහන 19 - සේවා වර්ගීකරණය අනුව විදේශගත වීම් - 2022

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය




රූපසටහන 20 - කාර්යාංශයේ ලියාපදිංචිව රැකියා සඳහා විදේශගත වීම් - 2018 සිට 2022

මූලාශ්‍රය : - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2022

## විදේශ රැකියා සඳහා යොමුවීමේ වර්ධනයක් පෙන්නුම් කිරීම

ගෝලීය වසංගත තත්ත්වය ප්‍රධාන කොටගත් විවිධ හේතූන් මත පසුගිය වර්ෂවල රැකියා සඳහා විදේශ ගත වූ ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුවී තිබුණු අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 154ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළ ගිවිසුම යාවත්කාලීන නොකිරීම

කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාළව විදේශ රැකියා අමාත්‍යාංශය සහ කොරියානු රජය අතර 2017 නොවැම්බර් 29 දින වර්ෂ 02 ක කාලයකට අදාළව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, සාධාරණ හේතුවක් නොමැතිව

එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීම සඳහා ගිවිසුම අවලංගුවී මාස 06 ක කාලයක් ඉකුත් වුවහොත්, ගිවිසුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හැකියාව පවතී. මේ යටතේ එම රාජ්‍ය වෙත ශ්‍රමිකයින් යොමුකිරීමේ කටයුතු කාර්යාංශය විසින් පමණක් සිදුකළ යුතු අතර පසුගිය වර්ෂ 06 තුළ එකතුව 20,667 ක් රැකියා සඳහා යොමුකර තිබුණි. එහෙත් 2020 වර්ෂයේ ආරම්භ කළ ගිවිසුම යාවත්කාලීන කිරීම 2023 ජූලි වනවිටත් නිමවී නොතිබුණි.

## විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කිරීම

2023 ජනවාරී 18 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදීද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කරන ලෙස නිර්දේශ ලබාදී තිබුණද 2023 ජනවාරි 17 දින අනුමත කර තිබූ ක්‍රියාපටිපාටිය අඩුපාඩු පවතින බව සඳහන් කර කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

## අනුමත සීමාව ඉක්මවා ආපදා ණය ගෙවීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් වලට පටහැනිව කාර්යාංශයේ නිලධාරීන් වෙත ආපදා ණය ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 525 දෙනෙකු වෙත එකතුව රු. මිලියන 68 ක් වැඩියෙන් ආපදා ණය ලෙස ගෙවා තිබුණ අතර ක්ෂණික ණය ලෙස 4 පොළී අනුපාතය යටතේ 107 දෙනෙකු සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4 ක් වෙන් කර තිබුණි.

## අබුඩාබි තානිපති කාර්යාලය හා කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදුකර ඇති මූල්‍ය අක්‍රමිකතා

අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ කාර්යමණ්ඩල සාමාජිකයෙකු විසින් සිදුකරන ලද රු. මිලියන 1 ක මුදල් අක්‍රමිකතාව සහ කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු. මිලියන 4 ක මුදල් අවභාවිතය සිදු කර වසර 9 ක් ගත වී ඇතත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## අධිකාරී බලය නොලත් ගණුදෙනු

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 45 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ යහපත අරමුණු කරගෙන ආරම්භ කර තිබුණු කම්කරු සුභසාධන අරමුදල සතුව විදේශ බැංකු ජංගම ගිණුම්වල පැවති ශේෂයන්ගේ එවිනාකම රු. මිලියන 395 ක් වී තිබුණි. පනතෙහි 17 (2) සහ 45 (2) වගන්තිවල විධිවිධානයන්ට පටහැනිව කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු එකතුව රු. මිලියන 3,494 ක ආදායමක් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර කාර්යාංශ අරමුදලින් ගෙවිය යුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරීන් 60 දෙනෙකුට වැටුප්, දීමනා සහ අනෙකුත් පහසුකම් වෙනුවෙන් එකතුව රු. මිලියන 684 ක් කම්කරු සුභසාධන අරමුදලෙන් වැය කර තිබුණි.

### කම්කරු සුභසාධන අරමුදල

### විගමණිකයින් සඳහා රුපියල් මිලියනයක් වටිනා නිවාසය බැගින් තනාදීමේ වැඩසටහනේ ඌන ප්‍රගතිය

කම්කරු සුභසාධන අරමුදල මඟින් පූර්ණ ආබාධිත විගමණිකයින් සඳහා රු. මිලියනයක් වටිනා නිවාසය බැගින් තනාදීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී නිවාස 04 ක් ඉදිකිරීමට රු. මිලියන 10 ක් වෙන් කර කටයුතු ආරම්භ කර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිවාස 03 ක වැඩ අවසන් කර නොතිබුණු අතර රු. මිලියන 2 ක් පමණක් වැය කර තිබුණි.

### ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම

1990 හා 1991 වර්ෂයන්හි ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම ශ්‍රී ලංකාවට ලබාදී ඇති වන්දි අරමුදලෙහි, වන්දි ලබා දීම 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වනවිටත් 948 දෙනෙකු වෙත රු. මිලියන 251 ක් වන්දි ලෙස ගෙවිය යුතුව පැවතුණි. මෙම වන්දි අරමුදල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර 1997 සිට 2022 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු. මිලියන 4,961 ක ආදායමක් උපයාගෙන ඇති අතර 2022 දෙසැම්බර් 31 වන විට, වන්දි අරමුදල රු. මිලියන 5,212 ක් වී තිබුණි. කෙසේ වුවද 2022 දෙසැම්බර් 31 වන විටත් වන්දි ගෙවිය යුතු අය වෙත මෙම වන්දි ලබා දීමට කටයුතු කර නොතිබුණි.

### කාර්යාංශය වෙත ලැබී තිබූ අරමුදල් අදාල කාර්යයයන් වෙත නොයොදා රදවා ගැනීම

2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව කාර්යාංශයේ පැමිණිලිකරුවන් වෙත ගෙවීම සඳහා රු. මිලියන 22 ක්ද, මියගිය විගමණික ශ්‍රමිකයින් 157 දෙනෙකු වෙත මරණ වන්දි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබී තිබූ රු. මිලියන 48 ක්ද, විදෙස්ගත ශ්‍රමිකයින් වෙනුවෙන් ආරක්ෂිත ගිණුමේ (Safe Account Deposit) තැන්පත් කර තිබූ රු. මිලියන 82 ක්ද සහ විදෙස්ගත ශ්‍රමිකයින් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ඔවුන්ගේ නිවැසියන් විසින් කාර්යාංශයේ තැන්පත් කරන ලද මුදලින් ඉතිරිව ඇති රු.මිලියන 37 ක් වශයෙන් එකතුව රු. මිලියන 189 ක ශේෂයක් නොගෙවා එම කාර්යාංශ ගිණුමේ රඳවාගෙන තිබුණි.

### ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක නොකිරීම

2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු. මිලියන 100 ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත් ව්‍යාපෘතියට අනුව ණය ලබා දීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ සඳහා 2014 වර්ෂයේ සිට

සමාලෝචිත වර්ෂය දක්වාම පොළී ආදායමක් ද ලැබී නොතිබුණි. ඉහත තැන්පතුව සමඟ කාර්යාංශය සතුව එකතුව රු. මිලියන 397 ක් වටිනා ස්ථාවර තැන්පතු 07ක් බැංකු ඇපකර ලෙස තබා ගනිමින් නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කර තිබුණද, එම ණය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමෙහි කාර්යයසාධනය

1996 ඔක්තොබර් 04 දිනැති සාංගමික සංස්ථාවලියේ අරමුණු අනුව සියලු අංශ සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සැපයීම හා නියෝජිතයකු, උපදේශකයකු ලෙස කටයුතු කිරීම, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම, රැකියා ඉල්ලුම තෘප්තිමත් කිරීම සමාගම පිහිටුවීමේ අරමුණ වේ.

## රැකියා ඇබෑර්තු සඳහා ප්‍රමාණවත් ශ්‍රමිකයන් පිරිසක් යොමු කිරීමට අපොහොසත් වීම

රජයේ පූර්ණ හිමිකාරත්වය ඇතිව ආරම්භ කර තිබූ මෙම සමාගම මගින් රජයේ සුරක්ෂිතතාවය මත සාපේක්ෂව අඩු පිරිවැයකින් සීමාවකින් තොරව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා සඳහා යොමු කිරීමේ හැකියාව තිබුණද, 2021 හා 2022 වර්ෂ වලදී පිළිවෙළින් රැකියා ඇබෑර්තු 2561 ක් හා 2860 ක් ලැබී තිබුණද රැකියා සඳහා විදේශගත වී තිබූ ප්‍රමාණය පිළිවෙලින් 155ක් හා 333 වී තිබුණි. එය ලැබුණු රැකියා ඇබෑර්තු වලින් සියයට 4 ක් හා සියයට 13 ක් වූයෙන් සමාගමේ ප්‍රධාන අරමුණ ඉටු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

1996 සාංගමික සංස්ථාවලියේ 2017 සැප්තැම්බර් 28 දිනැති විශේෂ යෝජනා සම්මුතිය මඟින් (special resolution) ඒජන්සි සමාගමේ ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් විගමණික ශ්‍රමිකයන්ගේ ගුවන් ටිකට්පත් නිකුත් කිරීම ඇතුළත් කර සමාගම විසින් ගුවන් ටිකට්පත් නිකුත් කිරීමේ ඒකකයක් පිහිටුවාගෙන තිබුණි. එහෙත් ඊට අදාල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු අනුමත කරගෙන නොතිබුණු අතර සමාගම විසින් ඒ සඳහා පුහුණු කාර්යය මණ්ඩලයක් පත්කරගෙන නොතිබුණි. එසේම ඒ සඳහා ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය (IATA) නීත්‍යානුකූලව ලබා ගෙන නොතිබීම හේතුවෙන් නියෝජිත ආයතනය මඟින් ගුවන් ටිකට්පත් නිකුත් කිරීමේ සේවාව ඉටු කිරීම හේතුවෙන් විදේශගත වන ශ්‍රමිකයින්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් වැඩි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

# අධ්‍යාපන අංශය

## විගණන නිරීක්ෂණ

- ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදු කිරීමට අපොහොසත් වීම
- ජාතික පාසල් සංඛ්‍යාව දහසක් දක්වා ඉහළ නැංවීම වැඩසටහන සාර්ථක කර ගත නොහැකිවීම
- පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පූර්ණ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වීම
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් ඉදි කල විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය එම ළමුන්ගේ අවශ්‍යතා අනුව ඉදි කර නොතිබීම
- විශේෂ අධ්‍යාපන අංශයෙහි පවතින පුහුණුව සහිත ගුරු පත්වීම් සඳහා ඇති පුරප්පාඩු සහ අතිරික්ත සම්බන්ධයෙන් නිසි ලෙස කටයුතු කර නොතිබීම
- සුරක්ෂා සිසු රක්ෂණය 2023 වර්ෂය සඳහා ගිවිසුම්ගතවී නොතිබීම
- විශේෂිත අධ්‍යාපන ක්‍රමයක් වෙනුවෙන් වූ සැලසුම්ගත වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කිරීම හා පසුවිපරම් කිරීම සිදුකර නොතිබීම
- විද්‍යාපීඨය සතු භූමි ප්‍රදේශ බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ට නිසි පරිදි උසස්වීම් ලබා නොදීම
- ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසැල්හි කටයුතු අරමුණුගත ලෙස ක්‍රියාත්මක නොවීම
- වයස අවුරුදු 5 ත් අවුරුදු 14 ත් අතර වයස් සීමාවල දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සම්බන්යෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබීම
- ඉදි කිරීම් ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රගතිය ලබා නොතිබීම
- වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය අපේක්ෂිත අයුරින් භාවිතයට ගෙන නොතිබීම
- විභාග දෙපාර්තමේන්තුවේ සයමහල් බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවෙහි අඩුපාඩු
- පිරිවෙන් අධ්‍යාපනය ක්‍රියාකාරකම් අතරමග නවතා තිබීම
- “සැලසිනේ” රූපවාහිනී ආයතනය සමඟ ජාතික අධ්‍යාපන ආයතනය එළඹ තිබූ ගිවිසුම අනුව අධ්‍යාපන වැඩසටහන් ප්‍රචාරණය කර නොතිබීම
- පාසල් පෙළපොත් ළමුන් වෙත බෙදා දීමේ අකාර්යක්ෂමතා

# අධ්‍යාපන අංශය



ඕනෑම රටක අනාගත අභිවෘද්ධිය තීරණය කරන ප්‍රධාන සාධකය එරටේ අධ්‍යාපනය සඳහා සිදුකරන ආයෝජනයයි. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව්‍ය බොහෝ දියුණු රටවල් අබිබවා ගොස් තිබුනද, සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවන් තවදුරටත් අනුගමනය කිරීම නිසා ලෝක ශ්‍රම ඉල්ලුමට සරිලන තාක්ෂණික දැනුමක් සහිත ශ්‍රමිකය දැනට පවතින අධ්‍යාපන ක්‍රමය තුලින් බිහිකිරීමට නොහැකිවී තිබේ. එම නිසා නවීන අධ්‍යාපන ක්‍රමවේදයන් තුලින් දැනුමෙන් හා තාක්ෂණික හැකියාවෙන් පිරිපුන් සමාජයක් බිහි කිරීම අධ්‍යාපන අංශයේ වගකීමයි. එම වගකීම ඉටුකිරීම අරමුණු කරගත් අධ්‍යාපන අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටුකර තිබුණි.

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධ්‍යාපන විෂයට සහ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනය හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.
- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම.
- සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම.
- විෂය සමගාමී සහ බාහිර ක්‍රියාකාරකම් පාසැල් තුළ ප්‍රවලිත කිරීම.
- ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම.
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම.
- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම.

- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටු වන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය.
- පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- සියලු පාසැල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියළු භෞතික පහසුකම් දියුණු කිරීම.
- ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.
- විෂයමාලා නවීකරණය කොට "One TVET" සංකල්පය යටතේ අදාල ආයතන ජාලගත කර තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම.
- පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නො ලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකි වන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම.
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම.
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රැකියා අවස්ථාවන්ට ගැලපෙන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇති ව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමඟ අනුබද්ධ වීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.
- උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්නායක හඳුනා ගැනිම හා ක්‍රියාත්මක කිරීම.
- දේශීය විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම.
- සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම.
- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකි වන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම.
- බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සමස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් වන ජනාධිපති කාර්ය සාධක බලකාය හා විශේෂ කමිටුවල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම.
- තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.
- ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම, ගුරුවරුන් පුහුණු

කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය.

- අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනයන් වෙත පැවරී ඇති අනෙකුත් සියලු විෂයන්ට අදාළ කටයුතු කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා සියලු ආයතනයන් අධීක්ෂණය කිරීම.මේ අනුව මෙම අංශයට අදාළ අධ්‍යාපන අමාත්‍යාශය හා දෙපාර්තමේන්තු 02 ක් හා කොමිෂන් සභාවක් මගින් ඉටු කරන ලද ඉහත කාර්යයන් සම්බන්ධයෙන් සිදුකළ විගණනයෙදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාශය වෙත එකතුව රු. මිලියන 143,904 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පහත සඳහන් පරිදි ඉන් රු.මිලියන 127,173 ක් පමණක් උපයෝජනය කර තිබූ බැවින් ඉතිරිය රු.මිලියන 16,731 ක් විය. විස්තර පහත රූපසටන 21 හි දැක්වේ.




| | අධ්‍යාපන අමාත්‍යාංශය | විභාග දෙපාර්තමේන්තුව | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය | 138,952 | 4,709 | 171 | 72 | 143,904 |
| උපයෝජනය | 122,414 | 4,581 | 116 | 62 | 127,173 |
| ඉතිරිය | 16,538 | 128 | 55 | 10 | 16,731 |

රූපසටහන 21 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සිදු කිරීමට අපොහොසත් වීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ පිහිටුවා තිබුණු අතර 2020, 2021 හා 2022 යන වර්ෂ 03 තුළදී රු. මිලියන 5,219 ක වියදමක් දරා තිබුණද සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. 2022 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කර තිබුණු අතර විෂය පථයට අයත් ව තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් පසුගිය වර්ෂ 03 තුළ දී රාජ්‍ය අමාත්‍යාංශය විසින් වැය කර තිබූ රු. මිලියන

351 ක වියදම නිශ්කාර්ය වියදමක් වීමේ අවධානමක් පැවතුණි.

**ජාතික පාසල් සංඛ්‍යාව දහසක් දක්වා ඉහළ නැංවීම වැඩසටහන සාර්ථක කර ගත නොහැකිවීම**

353 ක් වූ මෙරට ජාතික පාසල් සංඛ්‍යාව දහසක් දක්වා ඉහළ නැංවීම අරමුණු කරගෙන හඳුන්වා දී තිබූ වැඩ සටහන යටතේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන හා කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුළදී රු.මිලියන 2,285 ක් වැයකර තිබුණි. මීට අමතරව ජාතික පාසල් ලෙස නම් කිරීම සහ නාම පුවරු වෙනුවෙන් රු. මිලියන 2 ක වියදමක් දරා තිබුණද මෙම වැඩ සටහන අතරමග නවතා දමා තිබුණි.

**පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පූර්ණ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වීම**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී සකස් කළ පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සැලසුම් කළ කාර්යයන් සම්පූර්ණ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

**විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් ඉදි කල විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය එම ළමුන්ගේ අවශ්‍යතා අනුව ඉදි කර නොතිබීම**

විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් කහතුඩුව වෙනිවැල්කොළ ප්‍රදේශයේ රු.මිලියන 247 ක වියදමක් දරා විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ ඉදිකිරීම් ක්‍රමයට ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබූ අතර විශේෂ අවශ්‍යතාවය ඇති ළමයින්ට උචිත ලෙස එය ඉදි කර නොතිබූ බව පසුව හඳුනාගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය ට පෙර තම අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වී නොතිබුණි.

**විශේෂ අධ්‍යාපන අංශයෙහි පවතින පුහුණුව සහිත ගුරු පත්වීම් සඳහා ඇති පුරප්පාඩු සහ අතිරික්ත සම්බන්ධයෙන් නිසි ලෙස කටයුතු කර නොතිබීම**

විශේෂ අධ්‍යාපන අංශයක් ඇති පාසල්වල ළමුන් සහ ගුරුවරුන් 5:1 අනුපාතයට අනුව සිටිය යුතු වුවත් පලාත් 09 හි පාසල් 55 ක ගුරුභවතුන් 66 ක් අතිරික්තව සිටි අතර පාසල් 212 ක පුරප්පාඩු 349 ක් ද පැවතුණි. තවද විශේෂ අධ්‍යාපනය සම්බන්ධව පුහුණුව සහිත ගුරු පත්වීම් ලබා සිටින නමුත් වෙනත් විෂයයන් ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරුභවතුන් 147 දෙනෙක් පාසල් 135 ක සිටින බව නිරීක්ෂණය වූ අතර එම ගුරුභවතුන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ **37/2020** හා දෙසැම්බර් **31** දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**සුරක්ෂා සිසු රක්ෂණය 2023 වර්ෂය සඳහා ගිවිසුම්ගතවී නොතිබීම**

සෑම දරුවෙකුටම රක්ෂණාවරණයක් ලබා දීමේ අරමුණින් 2017 වර්ෂයේ සිට ආරම්භ කළ සුරක්ෂා සිසු රක්ෂණය 2023 වර්ෂය සඳහා ගිවිසුම්ගතවී නොතිබුණි.

**විශේෂිත අධ්‍යාපන ක්‍රමයක් වෙනුවෙන් වූ සැලසුම්ගත වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කිරීම හා පසුවිපරම් කිරීම සිදුකර නොතිබීම**

රු.මිලියන 3,444 ක වියදමක් දරා ටැබ් පරිගණක 96,919ක් හා ආරෝපිත රාක්ක 2019 වර්ෂයේදී මිලදි ගෙන තිබුණි. අරමුණින් බැහැරව මෙම පරිගණක ජාතික පාසල් 184 කට හා පළාත් සභා පාසල් 1,217 කට 6 වසරේ සිට 11 වසර දක්වා සිසුන් වෙත 2020 වර්ෂය අවසානයේදී ලබා දී තිබූ අතර බෙදාහරින කාලය වන විටත් වගකීම් කාලය වසරක් ඉක්මවා තිබුණි. ඉතිරි ටැබ් 3,892 ක් ආයතන 3ක් වෙත ලබා දී තිබුණි.මෙම පරිගණක භාවිතයෙන් කිරීමට අපේක්ෂිත විශේෂිත අධ්‍යාපන ක්‍රමයක් වෙනුවෙන් වූ සැලසුම්ගත වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කිරීම හා පසුවිපරම් කිරීම සිදුකර නොතිබුණි. වර්තමානය වන විට බෙදාහරින ලද ඇතැම් ටැබ් පරිගණක නිෂ්කාර්යව පවතින අතර අස්ථාන ගත වූ පරිගණකද පැවතුණි.

**විද්‍යාපීඨය සතු භූමි ප්‍රදේශ බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම**

ජාතික පාසල් 21 ක අක්කර 55 පර්.05 ක්ද, ගුරු විද්‍යාල 03 කට අයත් අක්කර 07 රූඩ් 01 පර්වස් 25 ක් හා විද්‍යාපීඨයක් සතුව පැවති අක්කර 91 පර්වස් 24 ක්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණද ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ට නිසි පරිදි උසස්වීම් ලබා නොදීම**

2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ජාතික පාසැල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරු වශයෙන් පත්කර නොතිබුණි.

**ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසැල්හි කටයුතු අරමුණුගත ලෙස ක්‍රියාත්මක නොවීම**

ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසැල් 22 ක් පසුගිය වර්ෂ 5 තුලදී ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ හේතුවෙන් එම පාසැල්වල පැවති

නේවාසිකාගාර, ක්‍රීඩා උපකරණ හා කාය වර්ධන උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. කළමනාකරණ දුර්වලතා, නිසි පුහුණුවක් නොලැබීම හා ක්‍රීඩා පාසල් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පසුගිය වසර 5 තුල ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන් 293 ක් මෙම පාසල්වලින් ඉවත් වී තිබුණි. මෙම පාසැල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන්ට වෙන්කරන ලද ඉඩද භාවිතා කර තිබීම හේතුවෙන් ක්‍රීඩා ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් කරගැනීමට ඉඩකඩ නොතිබුණි.

## වයස අවුරුදු 5 ත් අවුරුදු 14 ත් අතර වයස් සීමාවල දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සම්බන්යෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබීම

1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් අවුරුදු 14 ත් අතර වයස් සීමාවල දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පෞද්ගලික පාසැල් ආරම්භ නොකළ යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපාරික ආයතන ලෙස ජාත්‍යන්තර පාසල්ද ආගමික පාසල් ලෙස මද්‍රසා පාසල්ද හා පෞද්ගලික පාසල්ද ආරම්භ කර තිබුණි. එසේ වුවද, ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් නියාමනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතරින් එකක් වුවත්, ඒ සම්බන්ධ නියාමනයක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

## ඉදි කිරීම් ව්‍යාපෘති වලින් අපේක්ෂිත ප්‍රගතිය ලබා නොතිබීම

අධ්‍යාපන අමාත්‍යාංශයට විදේශ ආධාර ලෙස 2022 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබූ ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල් වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සහ තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය පිලිවෙලින් සියයට 42 සහ සියයට 15 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි.

## වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය අපේක්ෂිත අයුරින් භාවිතයට ගෙන නොතිබීම

ප්‍රශ්න පත්‍රවල මනා නිමාවක් ලබාගැනීම මගින් විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනියත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් විභාග දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 546 ක වියදමක් දරා 2018 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලද වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයෙන් 2019 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රශ්නපත්‍ර වලින් සියයට 8 ක් ද, 2020, 2021 හා 2022 යන වර්ෂයන්හි දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සියලුම විභාග සඳහා මුද්‍රණය කරන ලද සමස්ථ ප්‍රශ්න පත්‍රවලින් පිළිවෙළින් සියයට 5, 10 හා 3.5 ක ප්‍රමාණයක්ද පමණක් මුද්‍රණය කර තිබුණි.

**විභාග දෙපාර්තමේන්තුවේ සයමහල් බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවෙහි අඩුපාඩු**

කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 564.3 ක් වූ විභාග දෙපාර්තමේන්තුවේ සයමහල් බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේ දී ආරම්භකර 2019 පෙබරවාරි 02 අවසන් කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර එදින වන විට ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පිළිවෙලින් රු.මිලියන 64 ක් හා රු.මිලියන 305 ක් වශයෙන් රු.මිලියන 369 ක් ගෙවීම් කර තිබුණි.

**පිරිවෙන් අධ්‍යාපනය ක්‍රියාකාරකම් අතරමග නවතා තිබීම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්වී භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් රු. මිලියන 1 ක් වැයකර තිබුණද සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් අතරමග නවතා තිබුණි.

**“සැලසිනේ” රූපවාහිනී ආයතනය සමඟ ජාතික අධ්‍යාපන ආයතනය එළඹ තිබූ ගිවිසුම අනුව අධ්‍යාපන වැඩසටහන් ප්‍රචාරණය කර නොතිබීම**

2021 දෙසැම්බර් 24 දින නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා “සැලසිනේ” රූපවාහිනී ආයතනය සමඟ ජාතික අධ්‍යාපන ආයතනය ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම අනුව රූපවාහිනී වැඩසටහන් 05 ක් පැවැත්වීමට රු.මිලියන 15 ක වියදමක් දරා තිබුණි. ඊට අදාළ ප්‍රචාරක වැඩසටහන් 2021 දෙසැම්බර් 29 දිනට ප්‍රථම අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල වැඩසටහන් ප්‍රචාරණය කර නොතිබුණි.

**පාසල් පෙළපොත් ළමුන් වෙත බෙදා දීමේ අකාර්යක්ෂමතා**

2022 වර්ෂයේ පළමු පාසල් වාරය අප්‍රේල් 18 දින ආරම්භ කර තිබුණද 2022 දෙසැම්බර් මාසය වන තෙක් පෙළපොත් පාසල් වෙත බෙදාහැර තිබුණු අතර මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා 1 වසර සිට 11 වසර දක්වා බෙදාහරින ලද පෙළපොත් පිටපත් සංඛ්‍යාව 22,082,941 කි. ඒ අනුව 2022 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කරන ලද මුළු පෙළපොත් පිටපත් 32,831,750 ප්‍රමාණයෙන් පොත් පිටපත් 22,082,941 ක් එනම් මුළු පෙළපොත් වලින් සියයට 67 ක් 2022 වර්ෂයේ පළමු පාසල් වාරය ආරම්භ වීමට ප්‍රථම නියමිත කාලයේදී බෙදාහැරීමට නොහැකිවී තිබුණි.තව ද 2023 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දී පෙළපොත් පිටපත් 32,890,400 ක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතන 23 ක් සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුම් ගත වී තිබුණි. පළමු පාසල් වාරය 2023 මාර්තු 20 දින ආරම්භ කර තිබුණද, ඒ වන විට පාසල් හා පෙළපොත් බෙදාහැරීමේ මධ්‍යස්ථාන වෙත පෙළපොත් පිටපත් 15,645,654 ක ප්‍රමාණයක් බෙදා දීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

# උසස් අධ්‍යාපනය අංශය

## විගණන නිරීක්ෂණ

- බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් අය වියයුතු මුදල් අයකරගෙන නොතිබීම
- ආරම්භ කර තිබූ ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදය
- උපයෝජනය නොකල මුදල් සංවර්ධන අරමුදල යටතේ පැවතීම
- පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණද පර්යේෂණ අවසන්කර නොමැති වීම
- විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබා දී තිබූ පර්යේෂණ යෝජනා ඉවත්කර ගැනීම සහ නවතාදමා තිබීම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා පර්යේෂණ දීමනා ගෙවා තිබීම
- භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබීම
- විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ උපදෙස් වලට පටහැනිව විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීම
- විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා වූ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම

# උසස් අධ්‍යාපනය අංශය



ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සහශ්‍ර දෙකක් තරම් ඈතට දිව යන දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් වශයෙන් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනය සතුව , තුන්වන ලෝකයේ රටකින් බලාපොරොත්තු වන මට්ටමට වඩා වැඩි සියයට 92 ක සාක්ෂරතා මට්ටමක් පවතී. දකුණු ආසියාවේ ඉහළම සාක්ෂරතා අනුපාතය සහ සමස්ත වශයෙන් ආසියාවේ ඉහළ සාක්ෂරතා අනුපාතයක් ශ්‍රී ලංකාව සතුය. රටේ ජන ජීවිතය සහ සංස්කෘතිය තුළ අධ්‍යාපනය විසින් ඉතා වැදගත් භූමිකාවක් රඟ දක්වන අතර එය ක්‍රි.පූ.543 දක්වා අතීතයට දිව යයි. නව අධ්‍යාපන පද්ධතිය ඇති කරනු ලැබුවේ 19 වන සියවසේදී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග සම්බන්ධ වීමත් සමග වන අතර එය ඇතැම් වගකීම් මධ්‍යම රජය වෙතත් අනෙක් කරුණු සම්බන්ධව ස්වාධිපත්‍යය පළාත් සභා වෙතත් පවතින අයුරින් මධ්‍යම රජය සහ පළාත් සභා යන අංශ දෙකම යටතට පත්වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ යටතේ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාල 17 ක් හා උසස් අධ්‍යාපන ආයතන 19 ක් විසින් පහත අරමුණු වෙත ලඟා විය යුතුව තිබුණි.

- ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාලව පාර්ලිමේන්තුව මඟින් වෙන්කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතන මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
- උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම.
- එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම, නියාමනය කිරීම සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මඟින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරී සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම.

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීම සඳහා උසස් අධ්‍යාපන අංශය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පිළිවෙලින් රු.මිලියන 19,096ක හා රු.මිලියන 61,564 ක ප්‍රතිපාදන 2022 වර්ෂය තුල පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් පිළිවෙලින් රු.මිලියන 17,623 හා රු.මිලියන 58,017ක් පමණක් උපයෝජනය කර තිබුණි.




| | උසස් අධ්‍යාපන අංශය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිපාදනය | 19,096 | 61,564 | 80,660 |
| වියදම | 17,623 | 58,017 | 75,640 |
| ඉතිරිය | 1,473 | 3,547 | 5,020 |

රූපසටහන 22 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ සිදුකල විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනයකර පහත දක්වා ඇත.

### බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් අය වියයුතු මුදල් අයකරගෙන නොතිබීම

දිවයිනේ විශ්ව විද්‍යාල 12 ක් හා උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීමෙන් පසුව බැඳුම්කර කඩකළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 526 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. බිලියන 2.332 ක අයවිය යුතුව පැවතුණද විශ්ව විද්‍යාල කොමිෂන් සභාව එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### ආරම්භ කර තිබූ ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදය

- මොරටුව විශ්ව විද්‍යාලයට අතිරේක සිසුන් බඳවා ගැනීමට අවශ්‍ය පහසුකම් කඩිනමින් සැපයීම සඳහා 2013 ජුනි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව ඉංජිනේරු පීඨය සඳහා බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සඳහා රු. මිලියන 313 ක ප්‍රතිපාදන යොදවා අවස්ථා 04 ක කාල දිගු ලබාගෙන ඒවා කල් ඉකුත් වී තිබුණද, 2023 ජුනි 30 දින වන විටත් නිමකර භාර දීමට අපොහොසත් වී තිබුණි.

- ත්‍රිකුණාමල විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශ්‍රවනාගාරයක් සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 674.47 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් 2018 අගෝස්තු 08 දින පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව 2021 පෙබරවාරි 08 දින වන විට අවසන් කළ යුතු වුවද 2023 මැයි 23 වන දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 09 ක් ව තිබුණි.

- 2018 අයවැය යෝජනා අනුව වෛද්‍ය උපාධි අපේක්ෂක සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම,ජාතික සෞඛ්‍ය සේවය වැඩිදියුණු කිරීම,පශ්චාත් වෛද්‍ය උපාධි අභ්‍යාසලාභීන් වැඩිකිරීම,සහ සායනික පුහුණුව පිළිබඳ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා 2019 වර්ෂයේදී මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත රු. මිලියන 1,300 ක වටිනාකමකට කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය පිරිනමා තිබුණි. 2023 පෙබරවාරි 15 වන දින වන විටත් එහි මහල් 06 ක් දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරීමේ කටයුතු පමණක් සිදු කොට තිබුණි.

- රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි 03ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 03 දින පුද්ගලික සමාගමකට රු. මිලියන 1,501 කට ප්‍රදානය කර 2023 ජූනි 02 දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණද නැවත 2023 ජූලි 14 දින දක්වා දින දීර්ඝ කිරීමක් උපකුලපති විසින් සමාගම වෙත ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය 2023 ජූනි 30 දිනට 59% ක මට්ටමේ පැවතුණි.

- කැළණිය විශ්වවිද්‍යාලයේ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයට මහල් 10 කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන සේවා සපයන ආයතනයකට 2020 හා 2021 වර්ෂ වලදී එකතුව රු.මිලියන 15 ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණු නමුත් අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

**උපයෝජනය නොකල මුදල් සංවර්ධන අරමුදල යටතේ පැවතීම**

මොරටුව විශ්වවිද්‍යාලයේ සංවර්ධන අරමුදල යටතේ ඒ ඒ දෙපාර්තමේන්තු හා පාඨමාලා සඳහා විවිධ වැය ශීර්ෂ ගිණුම් 89 ක රු.මිලියන 252 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේ මෙහි උපයෝජනය නොකල සමස්ත අරමුදල්වල ප්‍රතිශතය සියයට 91.5 ක් හෙවත් රු. මිලියන 228 ක් විය.

**පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණද පර්යේෂණ අවසන්කර නොමැති වීම**

2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 335 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා වශයෙන් එකතුව රු. මිලියන

434 ක් ගෙවීම් කර තිබුණද, ඊට අදාළ පර්යේෂණවල ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබා දී තිබූ පර්යේෂණ යෝජනා ඉවත්කර ගැනීම සහ නවතාදමා තිබීම**

පසුගිය වර්ෂ 6 ක කාලසීමාවක් තුල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අනුමැතිය ලබා දී තිබූ පර්යේෂණ 459 න් අදාල යෝජනා ඉවත්කර ගැනීම් හා මුදල් ලබා නොගැනීම මත පර්යේෂණ 34 ක් නවතාදමා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 454 ක් වූ පර්යේෂණ 193 ක් සම්පූර්ණ කර නොතිබුණි. 2023 මාර්තු 15 දිනට එම පර්යේෂණ සංඛ්‍යාව 229 ක් වී තිබුණි.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා පර්යේෂණ දීමනා ගෙවා තිබීම**

2/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් තොරව හා කිසිදු අන්තර් පර්යේෂණ වාර්තාවක් හෝ වෙනත් පර්යේෂණ වාර්තාවක් හෝ ලබා ගැනීමකින් තොරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් 59 දෙනෙකු සඳහා 2014 නොවැම්බර් 01 දින සිට 2022 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ රු.මිලියන 84 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

**භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම**

රජයේ අරමුදල්වලින් සියයට 65 ක්ද සේවකයින්ගෙන් සියයට 35 ක්ද වශයෙන් දායකත්ව මුදල් ලබාගෙන විවෘත විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු රක්ෂණ ගිණුමක් ඇති කරගෙන අභ්‍යන්තර නිලධාරීන්ගෙන් සමන්විත වූ කමිටුවක නිර්දේශ මත විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලයේ අයදුම්පත් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීමට 2020 සිට 2022 වර්ෂය දක්වා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රජයේ අරමුදල් රු. මිලියන 30 ක් යොදවාගෙන තිබුණි.

**නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබීම**

පිරිවැයක් රු.මිලියන 58 ක් වූ විවෘත විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල වශයෙන් ස්ථාපිත කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (omis) පවතින අඩුපාඩු නිරාකරණය කරගැනීමට නඩත්තු සමාගම්වලට නොහැකි වී තිබුණු බැවින් 2018 වර්ෂයේ සිට නව අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතිය (new omis) ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 46 ක් වැය කළද, 2022 වර්ෂය වන විට කිසිදු මොඩියුලයක් නිර්මාණය කර නොමැති අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත්, නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

**විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ උපදෙස් වලට පටහැනිව විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීම**

විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ උපදෙස් වලට පටහැනිව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය සහ ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය වෙත 2022 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණු එකතුව රු. මිලියන 72 ක විදේශ ප්‍රදාන ආයතන වෙත සෘජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

**විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා වූ පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම**

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පුරප්පාඩු වට 04ක් පවත්වා තිබුණද තවදුරටත් පුරප්පාඩු 3,008 ක් පැවති අතර එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2020/2021 අධ්‍යයන වර්ෂයේ දී පමණක් සිසුන් 3,008 කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි. මෙසේ සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවීම අවම කිරීම සඳහා නව ක්‍රමවේදයක් කොමිෂන් සභාව සකස්කර නොතිබුණි.

# නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය

## විගණන නිරීක්ෂණ

- වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් ඉහළ දැමීමට නොහැකි වීම
- විදේශීය රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා නොගැනීම
- ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා නොගැනීම නිසා විෂය ක්ෂේත්‍රයට අදාල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට නොහැකි වී තිබීම
- සිසුන් ගේ පුහුණු කාලය අවසන්වී රැකියාගත කිරීමට අදාල තොරතුරු පද්ධතියක් නොතිබීම
- සංචාරක හෝටලය මගින් කිසිදු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබාදී නොතිබීම
- ලියාපදිංචිය කල් ඉකුත් වී තිබූ වෘර්තීය පුහුණු ආයතන ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු නොකිරීම
- තාවකාලිකව තහනම් කර තිබූ ආයතන වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැඳී සිටීම
- ණය මුදල් ලබාදීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී නොතිබීම
- ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ආරම්භ කර නොතිබීම
- සූර්යපැනල මූලාකෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයාදෙන ව්‍යාපෘතිය අසාර්ථක වී තිබීම
- නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබීම
- විශේෂ ව්‍යාපෘතියක් ඉටු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලැබී තිබූ මුදල් අදාළ කාර්ය කිරීමකින් තොරව රදවා ගැනීම
- නිෂ්කාර්යව පොලී ගෙවීමට සිදු වීම
- වත්කම් අක්‍රියව හෝ ඌණ උපයෝජිතව පැවතීම
- ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකර නොතිබීම
- සාර්ථකත්වය පරීක්ෂා කිරීමටද පෙර ව්‍යාපෘති ආරම්භ කිරීම
- ව්‍යාපෘතිය පිළිබඳ අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබීම
- පෙව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා දරා තිබූ වියදම් අනාර්ථික වීම

# නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය

වර්තමාන හා අනාගත ශ්‍රම බලකාය වඩාත් සංකීර්ණ ආර්ථික රටාවකට ගැලපෙන පරිදි නවීකරණය වූ අධ්‍යාපනයකින් හා නිපුණතාවයෙන් හා කුසලතාවලින් සපිරි පර්යේෂණශීලී නවෝත්පාදන සුහුරු සමාජයකින් සමන්විත වීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා කුසලතා හා දැනුම අතර පරතරය සම්පූර්ණ කිරීමට ආර්ථිකයෙහි පවතින උසස් හා තෘතීයික අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවිය යුතුව ඇත. එම අපේක්ෂාව ඉටු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් අංශය තුල එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 20 ක් විසින් පහත සඳහන් කාර්යභාරය ඉටු කළ යුතුව තිබුණි.

- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබාගැනීමට අවස්ථා ඇති කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.
- වෘත්තීය විෂයමාලා නවීකරණයක් කොට - One TVET සංකල්පය යටතේ අදාල ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම.
- පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම.
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුලත් කරමින් විෂයමාලා සංශෝධනයක් සිදු කිරීම.
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොල ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රැකියා අවස්ථාවන්ට ගැලපෙන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ජාතික නවෝත්පාදන ආයතන පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 14,486 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 11,481 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාලපරිච්ඡේදය තුළ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් හෙවත් රු.මිලියන 3,005 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 23 හි දැක්වේ.




| | අධ්‍යාපන අමාත්‍යාංශය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය) | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිපාදනය | 12,109.11 | 2,377.00 | 14,486.11 |
| වියදම | 9,297.95 | 2,183.39 | 11,481.34 |
| ඉතිරිය | 2,811.16 | 193.61 | 3,004.77 |

රූපසටහන 23 - පාර්ලිමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය
මූලාශ්‍රය - මහා භාණ්ඩාගාරයේ අවසාන ගිණුම් ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යයභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

**වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් ඉහළ දැමීමට නොහැකි වීම**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පසුගිය වසර 05 ක කාලය තුළ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඉල්ලුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව 3,075 සිට 4,683 දක්වා එනම් සියයට 412 සිට සියයට 681 දක්වා වාර්ෂිකව ඉහළ මට්ටමක පැවතියද වැඩිවන ඉල්ලුමට සාපේක්ෂව පාඨමාලා සඳහා බඳවා ගැනීම් ඉහළ දැමීමට කළමනාකරණය විසින් කටයුතු නොකර සියයට 20 ක් එනම් වාර්ෂිකව 600 ක් වැනි ස්ථාවර අගයකට සිසුන් අවම සංඛ්‍යාවක් බඳවාගැනීමට කටයුතු කර තිබුණි. එසේම ප්‍රාදේශීය මධ්‍යස්ථාන 03 හිද බඳවාගනු ලබන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට අවධානය යොමුකර නොතිබුණි. එම නිසා උසස් පෙළ විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වූ සිසුන්ට රැකියා සඳහා වෘත්තීය පුහුණුව ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි.

**විදේශීය රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා නොගැනීම**

මෙම අංශය අතර පවතින වෘත්තීය පුහුණු ආයතන හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොවීම හේතුවෙන් විදේශීය රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා නොගැනීම නිසා විදේශ රැකියා වෙළඳපොලට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් ඉලක්ක කර ගනිමින් පාඨමාලා හඳුන්වාදීම දුර්වල මට්ටමක පැවතීමත්, ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති තත්ත්වය අඩුකරලීමට මෙම ආයතනවල දායකත්වය ඉතා අඩු මට්ටමක පැවතිණ.

**ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා නොගැනීම නිසා විෂය ක්ෂේත්‍රයට අදාල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට නොහැකි වී තිබීම**

වෘත්තීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අදාලව ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම හා ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා විෂය ක්ෂේත්‍රයට අදාලව ප්‍රමාණවත් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට අවස්ථාව ලබාදීම කල යුතු වුවද, පළපුරුදු උපදේශක හිඟය හා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් නොමැතිවීම යන අඩුපාඩු හේතුවෙන් දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් බිහිවීම අවම මට්ටමක පැවතුනි.

**සිසුන් ගේ පුහුණු කාලය අවසන්වී රැකියාගත කිරීමට අදාල තොරතුරු පද්ධතියක් නොතිබීම**

සිසුන් ලියාපදිංචි වූ අවස්ථාවේ සිට පුහුණු කාලය අවසන්වී රැකියාගත කිරීමට අදාල තොරතුරු පද්ධතියක් මෙම අංශය තුල පවතින කිසිදු පුහුණු ආයතනයක යාවත්කාලීන නඩත්තු කර නොතිබුණි.

**සංචාරක හෝටලය මගින් කිසිදු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබාදී නොතිබීම**

වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා හදාරන සිසුන්ගේ වැඩිදුර පුහුණු කටයුතු සඳහා සහ වඩා හොඳ පුහුණුවක් ලබාදීමේ පරමාර්ථයෙන් අහංගම හෝටල් පාසැල රු. මිලියන 149 ක් වැයකර 2019 වර්ෂයේදී හෝටලයක් ලෙස නවීකරණය කර තිබුණද එම වර්ෂයේ සිට 2023

ජුනි 30 දක්වාම මෙම සංචාරක හෝටලය තුලින් කිසිදු ආධුනිකයෙකුට ප්‍රායෝගික පුහුණුව ලබා දී නොතිබුණි.

### ලියාපදිංචිය කල් ඉකුත් වී තිබූ වෘර්තීය පුහුණු ආයතන ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු නොකිරීම

2022 අප්‍රේල් 20 වනවිට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය තුල ලියාපදිංචි වී තිබූ මුළු ආයතන සංඛ්‍යාව 3386 ක් වූ අතර මින් ආයතන 2154 ක ලියාපදිංචිය කල් ඉකුත් වී තිබුණි. 2017 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලියාපදිංචිය කල් ඉකුත් වී තිබුණු ආයතන 371 ක් ලියාපදිංචිය අලුත් කර ගැනීම සඳහා ඉල්ලුම් කළද 2023 අප්‍රේල් වන විට ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### තාවකාලිකව තහනම් කර තිබූ ආයතන වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැඳී සිටීම

නීත්‍යානුකූල නොවන ලෙස කටයුතු කරන ලද ආයතන 81 ක කටයුතු තාවකාලිකව තහනම් කර තිබුණද, එම ආයතන වල ලියාපදිංචිය අහෝසි කර නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් මෙම ආයතන විසින් ද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියාමනයෙන් බැහැරව වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැඳී තිබුණි.

### ණය මුදල් ලබාදීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී නොතිබීම

ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් අදාල වන සියළුම ඉල්ලුම් පත් අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කලයුතු වුවත් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම ලියාපදිංචි කල ප්‍රතිලාභීන් 1,308 කින් ප්‍රතිලාභීන් 1,127 ක් වෙනුවෙන් රු. මිලියන 491 ක ණය මුදල් ලබාදී තිබුණත් අමාත්‍යාංශය මැදිහත් වීමකින් තොරව ණය ලබාදෙන බැංකු විසින්ම එම ණයලාභීන් තෝරාගෙන ණය ප්‍රදානය කර තිබුණි.

### ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ආරම්භ කර නොතිබීම

ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ඉඩම් කොටසක් පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේද විස්තරාත්මක ඉලක්ක යටතේ අවස්ථා 07 ක් ඉලක්ක කරමින් රු. මිලියන 60 ක් වෙන්කර තිබුණු අතර මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුල නිම කිරීමට යෝජනා වී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 2,820 ක් වුවත් මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

### සූර්යපැනල මූලාකෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයාදෙන ව්‍යාපෘතිය අසාර්ථක වී තිබීම

සූර්යපැනල මූලාකෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයාදෙන විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අධ්‍යාපනික පුහුණු වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රජයේ රු. මිලියන 240 ක දායකත්වය මත වර්ෂ 06 ක ව්‍යාපෘති කාලයක් සහිත ප්‍රස්තුත ව්‍යාපෘතිය වෙනුවෙන් අනුමැතිය ලබාදී තිබුණි. නමුත් වසර 06 ක් ගත වී තිබියදීත් ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 43 ක් පමණක් උපයෝජනය කර ඇති අතර

ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවී අසාර්ථක වී තිබුණි.

### නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබීම

ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ ආරම්භ කර 2020 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 06 කින් යුත් අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

### විශේෂ ව්‍යාපෘතියක් ඉටු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලැබී තිබූ මුදල් අදාළ කාර්ය කිරීමකින් තොරව රඳවා ගැනීම

විශේෂ ව්‍යාපෘතියක් ඉටු කිරීම වෙනුවෙන් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත වෙනත් ආයතන විසින් ලබා දී තිබූ රු. මිලියන 45 ක ප්‍රතිපාදන 2022 වර්ෂය අවසන් වන විට උපයෝජනය කිරීමකින් තොරව ආයතනයේ රඳවාගෙන තිබුණි. මෙම වටිනාකම් තුල වසර 13 ක් අඛණ්ඩ අධ්‍යාපනය වෙනුවෙන් වසර 3කට පෙර එනම් 2019 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු. මිලියන 27 ක මුදලක්ද ඇතුලත්ව තිබුණි.

### නිෂ්කාර්යව පොලී ගෙවීමට සිදු වීම

ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමේ අරමුණ සහිතව දෙහිවල උසස් තාක්ෂණ ආයතනය ඉදිකිරීමට 2015 අගෝස්තු 26 දින වැඩ ආරම්භ කර රු. මිලියන 20 ක් වැයකර මහල් 03 ක වැඩ නිමකර 2017 පෙබරවාරී 21 දින ආයතනය වෙත භාර දී තිබුණි. ඉතිරි මහල් 02 හි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් එම ගොඩනැගිල්ල භාර දුන් දිනයේ සිට නිෂ්කාර්යව පැවතුණි. 2017 මාර්තු සිට 2022 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රු.මිලියන 55 ක කුලී වියදමක් බාහිර ආයතන වලට ගෙවීමට සිදු වී තිබුණි.

### වත්කම් අක්‍රියව හෝ ඌණ උපයෝජිතව පැවතීම

තාක්ෂණ ඉන්කියුබේටර් අංශයේ සේවාවන් සැපයීමේ අවශ්‍යතාවය රට තුළ විශාල ලෙස පැවතියදී ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ නඟාසිටුවීම වෙනුවෙන් අත්පත් කරගෙන තිබූ ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් කර නොතිබූ වටිනාකම රු. මිලියන 103 ක ඉහළ ධාරිතාවයෙන් යුතු අධිතාක්ෂණික යන්ත්‍රෝපකරණ 14 ක්, රු. මිලියන 13 ක වටිනාකමකින් යුත් යන්ත්‍රයක් සහ වටිනාකම හඳුනා නොගත් තවත් යන්ත්‍රයක් අක්‍රියව හෝ ඌණ උපයෝජිතව පැවතුණි.

### ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකර නොතිබීම

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 05 හි ඇතුළත් අනු ක්‍රියාකාරකම් ගණන 15 ක් වූ අතර ඉන් ක්‍රියාකාරකම් 02 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු. 100,000 ත් රු. මිලියන 2.3 ත් අතර පරාසයක් ගෙන තිබූ ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 0 ත් සියයට 56 ත් අතර පරාසයක තිබුණි.

### සාර්ථකත්වය පරීක්ෂා කිරීමටද පෙර ව්‍යාපෘති ආරම්භ කිරීම

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් සන අපද්‍රව්‍ය දිරාපත්වීම වේගවත් කරන ක්ෂුද්‍ර ජීවීන් සමූහ හඳුනා ගැනීම සඳහා SP 21 -02 විශේෂ ව්‍යාපෘතිය 2021 ජූලි මාසයේ ආරම්භ කර රු. මිලියන 8 ක් වැය කර තිබුණි. මෙම ගැටලුව සඳහාම ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ ව්‍යාපෘතියක් (TO 18-21) සඳහා 2018 වර්ෂයේදි රු. මිලියන 49 ක අරමුදලකින් ආරම්භ කර අවසාන අදියර ක්‍රියාත්මකව පැවතියදී එහි සාර්ථකත්වය පරීක්ෂා කිරීමටද පෙර මෙම නව ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.

### ව්‍යාපෘතිය පිළිබඳ අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබීම

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් TO-14-04 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ඩෙංගු වාහකයන් පාලනය කිරීම සඳහා රු. මිලියන 46 ක වියදමක් දරා ඩෙංගු මර්ධනයට නව කීට ප්‍රභේදයක් සොයාගෙන තිබුණද එම කීටයන් රට තුළ ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මුළුමනින් තුරන් කිරීම තෙක් ව්‍යාපෘතියේ ප්‍රතිඵලය යොදාගත යුතුව තිබියදී ඒ පිළිබඳ අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

### ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා දරා තිබූ වියදම් අනාර්ථික වීම

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි සමාගම විසින් ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා සෘජු පිරිවැය සහ පරිපාලන වියදම් ලෙස එකතුව රු. මිලියන 144 ක් වියදම් දරා තිබූ අතර ඉන් රු. මිලියන 125 ක් වැටුප් හා ගොඩනැගිලි කුලී වෙනුවෙන් පමණක් වැයකර තිබුණි. අපේක්ෂිත ප්‍රතිඵල කිසිවක් ලභාකරගෙන නොතිබුණද සමාගම විසින් සේවක පරිපාලනය සහ ගොඩනැගිලි පහසුකම් සඳහා මුළු පිරිවැයෙන් විශාල දායකත්වයක් එනම් සියයට 87 ක් ලබා දී තිබුණි.

# සෞඛ්‍ය අංශය

## විගණන නිරීක්ෂණ

- සෞඛ්‍ය අමාත්‍යාංශය
  - ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු නොකළ පැමිණීම සහ පිටවීම සඳහා වැටුප් අතිකාල හා වෙනත් දීමනා ගෙවීම
  - සීමාවාසික වෛද්‍ය නිලධාරීන් සඳහා නීත්‍යානුකූල නොවූ දීමනා ගෙවා තිබීම
  - පුහුණුව නියමිත පරිදි අවසන් කර නොතිබුණ හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය .පුහුණු කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර නොගැනීම
  - වත්කම් ගිණුම්ගත නොකිරීම
  - වාහන කළමනාකරණයේ පැවැති දුර්වලතා
  - රජයට ගෙවිය යුතු බදු ගෙවීම පැහැර හැරීම
  - සෞඛ්‍ය ක්ෂේත්‍රය පවත්වා ගෙන යාමේදී අත්‍යවශ්‍ය වන තනතුරු
  - සේවක අතිරික්ත තා හා උනතා නිවැරදිව කලමනාකරණය නොකිරීම
- සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
  - සමාගම සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම
  - බිස්කට් නිෂ්පාදන යන්ත්‍රයක් නිශ්කාර්යව තිබීම
- ශික්ෂණ රෝහල්
  - අමු ආහාර ද්‍රව්‍ය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී කලින් හඳුනාගත් සැපයුම්කරුවන්ට වාසි සැලසෙන පරිදි පිළියෙළ කර තිබීම
  - ශල්‍යාගාර වල ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග පාලනයේ දුර්වලතා පැවතීම

- වෛද්‍ය සැපයීම් අංශය
  - වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම
  - ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ පහසුකම් ප්‍රමාණවත් නොවීම
  - කොටිකාවත්තේ පිහිටි වෛද්‍ය සැපයීම් ගබඩාවකට සිදු වී තිබූ හානියට අදාළ රක්ෂණ ආවරණය පූර්ණ වශයෙන් අයකර නොගැනීම
  - ෆයිසර් එන්නත් කල් ඉකුත් වීම
  - වෛද්‍ය සැපයුම් අංශය සඳහා විස්තීරණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම
  - නියමිත උෂ්ණත්වයට ඖෂධ ගබඩා කර නොතිබීම

# සෞඛ්‍ය අංශය

ඕනෑම සංවිධානයක යහ පැවැත්ම හා ඵලදායිත්වය තීරණය වන්නේ එම සංවිධානයට අයත් මානව සම්පතේ පවතින කාර්යක්ෂමතාවයයි. එමෙන්ම රටක යහ පැවැත්ම හා සංවර්ධනය තීරණය කරන ප්‍රධාන සාධකයක් වන්නේ ද එරට තුල ජීවත් වන ජනතාවගේ කාර්යක්ෂමතාවයයි.. රටක ජනතාවගේ කාර්යක්ෂමතාවය තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ එරට ජනතාවගේ යහපත් සෞඛ්‍ය තත්ත්වයයි.. රටක නිරෝගීමත් ජනතාවක් බිහිකිරීම සඳහා එම රටේ ඉතා ඉහල ගුණත්වයෙන් යුත් සෞඛ්‍යය සේවාවක් පවත්වාගෙන යා යුතුය.

දේශයේ ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ දැක්මකින් යුතුව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය
- සෞඛ්‍ය හා පෝෂණ විෂයයන් සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයයන්, අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදුකිරීම
- මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය
- මහජන සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම
- අන්තර් ජාතික නිරෝධායන හා සනීපාරක්ෂණයට අදාල නීතිරීති ක්‍රියාත්මක කිරීම
- පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය
- ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය
- වසංගත, බෝවන හා බෝ නොවන රෝග තත්ත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම
- පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාල වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
- වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන් පිළිබඳ කටයුතු
- සාමාන්‍ය සනීපාරක්ෂණය
- ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම
- සියලුම රෝහල් හා රෝහල් සේවකයින් පරිපාලනය (පළාත් සභා යටතේ ඇති රෝහල් හැර)
- පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය සහ අනෙකුත්

උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන හා සම්බන්ධීකරණය

- ජාතික රුධිර පාරවිලයන සේවාවන් පිළිබඳ කටයුතු
- ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතු
- ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාල පරිපාලනය හා පිරිස් කළමනාකරණය
- වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇතිකිරීම
- සෞඛ්‍ය අංශයට අදාල පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම
- ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් පිළිබඳ කටයුතු

2022 වර්ෂයේදී ඉහත සදහන් කාර්යභාරය ඉටු කිරීම සදහා සෞඛ්‍ය අමාත්‍යාංශයට රු. මිලියන 256,586 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 240,852 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

ඉහත සදහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු නොකළ පැමිණීම සහ පිටවීම සදහා වැටුප් අතිකාල හා වෙනත් දීමනා ගෙවීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට නොගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් සඳහා රු.මිලියන 43,356 ක් ද වර්තමාන වැටුප පදනම් කර ගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා රු.මිලියන 36,192 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 79,548 ක් වැයකර තිබුණි.එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 72 ක් පමණ වී තිබුණි.

### සීමාවාසික වෛද්‍ය නිලධාරීන් සදහා නීත්‍යානුකූල නොවූ දීමනා ගෙවා තිබීම

සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයකට අනුව 2016 ජනවාරි සිට පුහුණුව සඳහා මධ්‍යම රජයේ රෝහල් 22 කට අනුයුක්ත කර තිබුණු සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ට 2022 මාර්තු දක්වා කාලය වෙනුවෙන් රු. මිලියන 47 ක් නීත්‍යානුකූල නොවූ දීමනා ගෙවා තිබුණි. අනෙකුත් රෝහල් වලට අදාළව 2016 සිට 2022 දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවා ඇති නීත්‍යානුකූල නොවූ දීමනා වටිනාකම කොපමණද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### පුහුණුව නියමිත පරිදි අවසන් කර නොතිබුණ හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය පුහුණුකරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර නොගැනීම

2018 ජනවාරි 01 සිට 2022 අගෝස්තු 15 දක්වා කාලය තුළ පුහුණු පාසල් 23 කට බඳවාගත් හෙද, පරිපූරක හා අතුරු වෛද්‍යපුහුණු ලාභීන්, 432 ක් පුහුණුව නියමිත පරිදි අවසන් නොකර පුහුණුව අතහැර දමා ගොස් තිබුණු අතර ඔවුන්ගෙන් අයවිය යුතු ඇපකරවල වටිනාකම පමණක් රු. මිලියන 116 ක් පමණ විය.

### වත්කම් ගිණුම්ගත නොකිරීම

2020 වර්ෂයේදී විවිධ දේශීය, විදේශීය ආයතන, සංවිධාන හා පුද්ගලයින් විසින් අමාත්‍යාංශයට හා ඒ යටතේ පවතින රෝහල් ආයතන හා විවිධ අංශ වෙත මූල්‍ය නොවන ආධාර හෝ පරිත්‍යාග ලෙස වටිනාකම රු.මිලියන 1,339 ක භාණ්ඩ උපකරණ හා වෛද්‍ය සැපයීම්ද වටිනාකම නොදත් භාණ්ඩ හා උපකරණ ඒකක 2,444 ලබාදී තිබුණු බැව් තහවුරු වුවද ඒවායේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. තවද,2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 54 ක් යටතේ දරන ලද රු.මිලියන 7,603 ක වියදම තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා සංවර්ධනය සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට මිලදිගෙන තිබුණු රු. මිලියන 6,326 ක මූල්‍ය වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කරද නොතිබුණි.

### වාහන කළමනාකරණයේ පැවැති දුර්වලතා

2019 අප්‍රේල් 22 දින ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාවට අනුව අමාත්‍යාංශය සතු වාහන 679 අස්ථාන ගතවී ඇති බව දක්වා තිබුණි. මින් වාහන 240 ක් හඳුනා ගත් බව ප්‍රකාශ කළද එය තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර තවදුරටත් වාහන 439 ක් පිළිබඳව තොරතුරු 2023 ජුනි 30 දින දක්වා සොයා ගැනීමට, උක්ත විශේෂ විගණන වාර්තාව නිකුත් කර වර්ෂ 04 ක් පමණ ගතවී ඇතත් නොහැකි වී තිබුණි. 2020 වර්ෂයේදී රු.මිලියන 239 ක් වැය කර මිලදීගෙන තිබුණු යතුරු පැදි 805 ක් අමාත්‍යාංශයේ වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර මෙම යතුරු පැදි ලබාදුන් නිලධාරින් සමඟ අමාත්‍යාංශය ලිඛිත ගිවිසුම් වලටද 2023 ජුනි 30 දින දක්වා එළඹී නොතිබුණි.

### රජයට ගෙවිය යුතු බදු ගෙවීම පැහැර හැරීම

2020 අප්‍රේල් 15 දිනැති බදු නිවේදනය අනුව 2020 ජනවාරි 01 දින සිට 2020 මාර්තු 31 දක්වා කාල සීමාවට අදාළව නිකුත් කර තිබුණු බදු නිවේදනයේ දැක්වෙන විධිවිධාන අමාත්‍යාංශය හා රෝහල් විසින් අනුගමනය කර නොතිබුණු අතර විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය, රෝහල් හා

ආයතන 24 කට අදාළව උක්ත මාස 03 ක කාලපරිච්ඡේදය සඳහා රජයට අහිමිවී තිබුණු බදු ආදායම රු.මිලියන 8 ක් පමණ විය.

### සෞඛ්‍ය ක්ෂේත්‍රය පවත්වා ගෙන යාමේදී අත්‍යවශ්‍ය වන තනතුරු

මෙම අංශය තුල පැවති තනතුරු පුරප්පාඩු තුල සෞඛ්‍ය ක්ෂේත්‍රය පවත්වා ගෙන යාමේදී අත්‍යවශ්‍ය වන තනතුරු අතරින් වෛද්‍ය නිලධාරීන් 1,331 ක්ද, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් 77 ක්ද, හෙද නිලධාරීන් 1,759 ක්ද, හෙද සොයුරු සොයුරියන් 275 ක්ද, වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥවරු 136 ක්ද, වෘත්තීය චිකිත්සකවරු 68 ක්ද, ඖෂධවේදීන් 126 ක්ද සහ විකිරණ ශිල්පීන් 270 ක්ද පුරප්පාඩු වී තිබුණි.

### සේවක අතිරික්ත තා හා උනතා නිවැරදිව කලමනාකරණය නොකිරීම

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දිනට රෝහල් 02 ක විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන් 03 ක් අතිරික්තව සිටියදි රෝහල් 12 ක විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන් 15 ක ඌනතාවයක්ද, රෝහල් 13 ක විශේෂඥ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 20 ක් අතිරික්තව සිටියදි රෝහල් 24 ක විශේෂඥ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් 97 ක ඌනතාවයක්ද, රෝහල් හා ආයතන 5 ක වෛද්‍ය පරිපාලක (ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය) නිලධාරීන් 5 ක් අතිරික්තව සිටියදි රෝහල් හා ආයතන 40 ක වෛද්‍ය පරිපාලක (ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය) නිලධාරීන් 43 ක ඌනතාවයක්ද, රෝහල් 23 ක විශේෂඥ වෛද්‍යවරුන් 146 ක් අතිරික්තව සිටියදි රෝහල් 38 ක විශේෂඥ වෛද්‍යවරුන් 156 ක ඌනතාවයක්ද, රෝහල් හා ආයතන 21 ක වෛද්‍ය නිලධාරීන් 282 ක් අතිරික්තව සිටියදි රෝහල් හා ආයතන 89 ක වෛද්‍ය නිලධාරීන් 1613 ඌනතාවයක්ද පැවතුණි.

## සිමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

### සමාගම සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම

ත්‍රිපෝෂ සමාගම සතුව පවතින සමාගම සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබුණු අතර මේ හේතුවෙන් විවිධ මිල පරාසයන් තුළ මිලදී ගැනීමට සිදුව තිබුණි.ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් එකතුව රු.මිලියන 192 ක් 2021 වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී ලබා දී තිබුණුද 2022 වර්ෂය තුළදීද අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

### බිස්කට් නිෂ්පාදන යන්ත්‍රයක් නිශ්කාර්යව තිබීම

පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය රු. මිලියන 209 ක් වූ යන්ත්‍රයක් 2020 වර්ෂයේදි සමාගම විසින් මිලදි ගෙන තිබුණු අතර යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 19 ක් හා නිලධාරින් පුහුණුව වෙනුවෙන් රුපියල් මිලියන 5 ක වියදමක්ද දරා තිබුණද සමාලෝචිත වර්ෂයේදිද බිස්කට් නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි.

### ශික්ෂණ රෝහල්

### අමු ආහාර ද්‍රව්‍ය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී කලින් හඳුනාගත් සැපයුම්කරුවන්ට වාසි සැලසෙන පරිදි පිළියෙළ කර තිබීම

රෝහල් වල නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා රෝගීන්ට හා කණිෂ්ඨ සේවකයින්ට පිසූ ආහාර සැපයීම සඳහා අවශ්‍ය අමු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවයන් ඇතුළත් කර සකස් කරන ලද ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී කලින් හඳුනාගත් සැපයුම්කරුවන්ට වාසි සැලසෙන පරිදි පිළියෙළ කර තිබුණි. එම නිසා ඒ පිළිබඳ අවබෝධයක් ලබාගෙන සිටින කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකු විසින් තම අත්දැකීම් අනුව රෝහල විසින් ඇණවුම් නොකරන හා අඩුවෙන් ඇණවුම් කරන ද්‍රව්‍ය සඳහා අඩු ඒකක මිලකුත් වැඩිපුර ඇණවුම් කරන ද්‍රව්‍ය සඳහා වැඩි ඒකක මිලකුත් ඉදිරිපත් කිරීම මගින් විවෘත ටෙන්ඩර් පට්පාටිය අවභාවිතා කිරීමට කටයුතු කර තිබුණි. මේ නිසා සෑම තරඟකරුවෙකුටම සමාන අවස්ථාවන් අහිමි වී තිබුණ නමුත් මෙම තත්වය අවම කිරීම සඳහා තාර්කික ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාළ රෝහල් පරිපාලනය කටයතු කර නොතිබුණි.

### ශල්‍යාගාර වල ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග පාලනයේ දුර්වලතා පැවතීම

කොළඹ ජාතික රෝහලේ ජන්‍ය මෞත්‍ර ශල්‍යාගාරයේ ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී රු. මිලියන 9 ක් වටිනා ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඒකක 1,555 ක තොගයක් වංචනික ලෙස ඊට යාබදව පිහිටි ශල්‍යාගාර B හි මැහුම් කාමරයේ සිවිලිම තුළ පොලිතින් බෑග් වල අසුරා සගවා තිබුණි. එසේම තවත් ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වර්ග 3 කට අදාළ ඒකක 7 ක් මෞත්‍ර ශල්‍යාගාරයෙන් ශල්‍යාගාර G වෙතද ඉන් අනතුරුව ශල්‍යාගාර D වෙතද අවිධිමත් හා වංචනික ලෙස බැහැර කර තිබුණු බැවින් තොග පාලනය තවදුරටත් ශක්තිමත් කල යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් ගැඹුරින් පරීක්ෂා කිරීමේදි ජන්‍ය මෞත්‍ර ශල්‍යාගාරය රු. මිලියන 5 ක් වටිනා ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වර්ග 3 ක් එම ශල්‍යාගාරයේ සිදුකර තිබුණු සැත්කම්වලට වඩා වැඩියෙන් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## වෛද්‍ය සැපයීම් අංශය

### වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම

රජයේ රෝහල් සඳහා නිකුත් කළ වෛද්‍ය සැපයීම් අතරින් රු. මිලියන 349 ක් වටිනා ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය 2022 වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් රු. මිලියන 32 ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා තිබුණි.

### ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ පහසුකම් ප්‍රමාණවත් නොවීම

වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත ඖෂධ නිකුත් කිරීමට පෙර ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ක්‍රියාත්මක ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය මඟින් ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ හැකියාවක් නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ තත්ත්වයෙන් අසමත් බවට වාර්තාවන අවස්ථාව වන විට එම ඖෂධ වලින් බොහෝ ප්‍රමාණයක් රෝගීන් විසින් භාවිතා කර අවසන් වී තිබුණි.

### කොටිකාවත්තේ පිහිටි වෛද්‍ය සැපයීම් ගබඩාවකට සිදු වී තිබූ හානියට අදාළ රක්ෂණ ආවරණය පූර්ණ වශයෙන් අයකර නොගැනීම

වෛද්‍ය සැපයීම් අංශයට අයත්ව තිබූ කොටිකාවත්ත අංක 53 ගබඩාව 2016 මැයි 18 දින ගංවතුරට යට වීමෙන් පසු සිදු වී ඇති හානිය රු. මිලියන 405 ක් ලෙස ගණනය කර තිබුණු අතර තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති මුදල රු. මිලියන 199 ක් විය. මෙම හානිය සම්බන්ධයෙන් හිමිවිය යුතු රක්ෂණාවරණය රු. මිලියන 320ක් වූව ද ලැබී ඇති මුදල රු. මිලියන 206 කි. ඒ අනුව තවදුරටත් රක්ෂණ ආයතනය වෙතින් ලැබිය යුතු රු. මිලියන 114 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### ෆයිසර් එන්නත් කල් ඉකුත් වීම

ලෝක බැංකු ණය මඟින් ක්‍රියාත්මක COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (තෙවන අතිරේක මූල්‍යාකරණය) මඟින් 2021 දෙසැම්බර් සිට 2022 ජනවාරි දක්වා කාලය තුළ කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා මිල දී ගෙන වසංගත රෝග විද්‍යායතනයට රු. මිලියන16,102 ක් වටිනා ෆයිසර් එන්නත් මාත්‍රා 13,999,050 ක් ලබා දී තිබුණි. මෙම එන්නත් මාත්‍රා වලින් රු. මිලියන 10,736 ක් වටිනා එන්නත් මාත්‍රා 7,951,710 ක් 2022 ජූලි 31 දිනට කල් ඉකුත් වී තිබුණි.

### වෛද්‍ය සැපයුම් අංශය සඳහා විස්තීරණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම

වෛද්‍ය සැපයුම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා යහපත් ලෙස සංවිධානය කර ගැනීමටත්, රජයේ රෝහල්වලට අත්‍යාවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීමටත්, වෛද්‍ය සැපයුම් අංශය සඳහා අවශ්‍ය යැයි හඳුනාගෙන තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම, සපයා සවිකිරීම, ක්‍රියාත්මක කිරීම, පුහුණු කිරීම හා නඩත්තු කිරීම යන සමස්ථ කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 633 ක් වැය කර තිබුණ ද එම කටයුතු අතරමඟ නවතා කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 102 කට ස්වස්ථ නමින් නව තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වෙනත් පුද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණි.

### නියමිත උෂ්ණත්වයට ඖෂධ ගබඩා කර නොතිබීම

ගම්පහ හා අනුරාධපුර ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශවල හා මීරිගම මූලික රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල් පරිශ්‍රයන්හි සෙල්සියස් අංශක 25 ට අඩු උෂ්ණත්වයක තැබිය යුතු ඖෂධ අයිතම 17 ක් සෙල්සියස් අංශක 30 ට වැඩි උෂ්ණත්වයන් යටතේ ගබඩා කර තිබුණු අතර ආසාත්මිකතා හා අධිරුධිර පීඩන රෝග සඳහා භාවිතා කරන ඖෂධ හා ප්‍රතිජීවක ඖෂධ ද ඒ තුළ පැවතුණි.

# දේශීය වෛද්‍ය අංශය

## විගණන නිරීක්ෂණ

- ප්‍රතිපාදන හා  උපයෝජනය
- ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර නොගෙන දීමනා ගෙවීම
- යතුරු පැදි විධිමත්ව භාරදීමට කටයුතු නොකිරීම
- ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකිරීම සඳහා වූ අරමුදල් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකිරීම
- ඔසු කැඳ සැල්  ස්ථාපිත කර නොතිබීම
- මානව සම්පත් කළමනාකරණය
- ආයුර්වේද දෙපාර්තමේන්තුව
    - දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන උපයෝජනය හා ඉතිරිවීම්
    - පංචකර්ම මධ්‍යස්ථාන නියාමනය
    - අතිකාල දීමනා පාලනය
    - කාර්යභාරයන් ඉටු නොකිරීම
    - අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන යන්ත්‍ර මිලට ගැනීම
    - මාර්ගෝපදේශ සංග්‍රයේ නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබීම
    - යෝජිත කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම
- ආයුර්වේද වෛද්‍ය සභාව
    - ආයුර්වේද වෛද්‍යවරුන් නියාමනය කර නොතිබීම
    - මියගිය පාරම්පරික වෛද්‍යවරුන්  පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව පවත්වා නොගැනීම
    - ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යසාධනය නියාමනය නොකිරීම

- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
    - මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබීම
    - රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දමා තිබීම
    - අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇතිකිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කර නොතිබීම

# දේශීය වෛද්‍ය අංශය

හෙළ වෙදකමින් සැමට සුවසෙත සැලසීම දේශීය වෛද්‍ය අංශයේ දැක්ම වේ. ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම ආයතනයේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටුකිරීම පිණිස ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන කාර්යයන් වනුයේ

- දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනගා ගැනීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම
- දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම
- දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහල දැමීම
- සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය රටේ සංවර්ධනයට දායක කර ගැනීම
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, හෝමියෝපති වෛද්‍ය සභාව සහ හෝමියෝපති රෝහල ක්‍රියාත්මකව පවතින අතර ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල් 10 ක්ද ඔසු උයන් 7 ක්ද බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය සහ ආයුර්වේද වෛද්‍ය සභාව නම් ආයතන 3 ද ක්‍රියාත්මකව පවතී.

## ප්‍රතිපාදන හා උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දේශීය වෛද්‍ය අංශයේ මූලධන වියදම් සඳහා රු. මිලියන 12 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 356 ක්ද ප්‍රතිපාදනය කර තිබුණු අතර මූලධන ප්‍රතිපාදන වලින් සියයට 78 ක් හෙවත් රු.මිලියන 9 ක්ද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් සියයට 91 ක් හෙවත් රු. මිලියන 323 ක්ද වශයෙන් වියදම් දරා තිබුණි.

## ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර නොගෙන දීමනා ගෙවීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර නොගෙන පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.මිලියන 8 ක් ගෙවා තිබුණි.

### යතුරු පැදි විධිමත්ව භාරදීමට කටයුතු නොකිරීම

2021 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ වාහන ලැයිස්තුව අනුව ඔසු ගොවි ව්‍යාපෘතියට අයත්ව තිබුණු යතුරු පැදි 48 ක් ආයුර්වේද දෙපාර්තමේන්තුවට හා ආයුර්වේද ඖෂධ සංස්ථාවට විධිමත්ව පවරා දීමට කටයුතු කරනු ලබන බව දක්වා තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම යතුරු පැදි හඳුනාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

### ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකිරීම සඳහා වූ අරමුදල් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකිරීම

ආයුර්වේද ඖෂධ සංස්ථාව තුළ නව ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකිරීම සඳහා 2020 වර්ෂයේ රු.මිලියන 5 ක් දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය විසින් එම සංස්ථාවට ලබා දී තිබුණි. නමුත් 2023 මැයි 16 දින වන විටත් සංස්ථාව විසින් අදාල මුදල් එම කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

### ඔසු කැඳ සැල් ස්ථාපිත කර නොතිබීම

සුව ධරණි ඔසු කැඳසල් ව්‍යාපෘතිය යටතේ ඔසු කැඳ අලෙවි කිරීමේ ජංගම කුටි 18 ක් සකස් කර සමාලෝචිත වර්ෂයේ දෙවන හා තෙවන කාර්තු තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ස්ථාපිත කිරීම සඳහා කාර්තුවකට රු.මිලියන 3 බැගින් රු. මිලියන **05** ක් වෙන් කර තිබුණද, එම කාර්තු අවසානය වන විටත් එක් ඔසු කැඳ සලක් හෝ ස්ථාපිත කර නොතිබුණි.

### මානව සම්පත් කළමනාකරණය

2022 සැප්තැම්බර් **08** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නව රාජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම හේතුවෙන් දේශීය වෛද්‍ය ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය (ශීර්ෂ අංක **416)** අහෝසි වී තිබුණු නමුත් එම රාජ්‍ය අමාත්‍යාංශයට අනුමත වූ තනතුරු **403** කින් **2022** දෙසැම්බර් **31** දිනට තත්‍ය කාර්යමණ්ඩලය **345** දෙනෙකු කාර්ය මණ්ඩල සමාලෝචනයකින් තොරව තවදුරටත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ යොදවා තිබුණි.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන උපයෝජනය හා ඉතිරිවීම්

සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. මිලියනයක ප්‍රතිපාදනවලින් රු.මිලියන 0.66 ක් එම වැය විෂයයන්හි අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකර වෙනත් මූලධන වැය විෂයන්ට මාරු කර තිබුණු අතර රු.මිලියන 0.34 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. මූලධන වැය විෂයයන් 07 ක් සඳහා සලසාගෙන තිබුණු රු.මිලියන 7 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 4 ක් හෙවත් සියයට 40 ත් සියයට 63 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන මාරුකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 05 කට වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 26 ත් සියයට 67 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු අතර මුල් ඇස්තමේන්තුවෙන් රු.මිලියන 412

ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු පුනරාවර්තන වැය විෂයයකට වෙනත් වැය විෂයයකින් මාරුකර තිබුණු රු.මිලියන 0.90 ක්ද ඇතුළුව රු.මිලියන 10 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

### පංචකර්ම මධ්‍යස්ථාන නියාමනය

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රම භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.

### අතිකාල දීමනා පාලනය

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.මිලියන 63 ක් ගෙවා තිබුණි.

### කාර්යභාරයන් ඉටු නොකිරීම

ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ වෙනම ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 148 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 153 ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි.

### අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන යන්ත්‍ර මිලට ගැනීම

අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර

බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් මෙම වාර්තාවේ දිනය වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු. මිලියන 15 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම් වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. මිලියන 28 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය.

### මාර්ගෝපදේශ සංග්‍රයේ නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබීම

සමාලෝචිත වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ආයතන 18ක ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු.මිලියන 75 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

### යෝජිත කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම

දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, 2023 අගොස්තු මාසය අවසන් වන විටද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැතිණි.

## ආයුර්වේද වෛද්‍ය සභාව

### ආයුර්වේද වෛද්‍යවරුන් නියාමනය කර නොතිබීම

2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිය වර්ෂ

05 ක් ඉක්ම වූ වෛද්‍යවරු 18,516 ක් සිය ලියාපදිංචිය අලුත් කරගෙන නොතිබුණි.

### මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව පවත්වා නොගැනීම

2022 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 26,650 ක් බවත්, මියගිය සංඛ්‍යාව 3,827 ක් බවත් වර්තා කර තිබුණු නමුත් මියගිය පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ නිවැරදි තොරතුරු යාවත්කාලීනව ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මියගිය වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ඒ බව මහජනතාවට නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් අදාළ ලියාපදිංචි සහතික අවභාවිතා කිරීමේ ඉඩ කඩ පැවතුණි.

### ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යසාධනය නියාමනය නොකිරීම

ආයුර්වේද වෛද්‍යවරු, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරු, ආයුර්වේද හෙද නිලධාරීන් හා හෙසජ්ජකවරු ලියාපදිංචි කිරීම, ඔවුන් වෙනුවෙන් විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

### ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබීම

2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.මිලියන 76 කින් රු.මිලියන 31 ක් හෙවත් සියයට 41ක් 2023 අගෝස්තු 23 වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

### රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දමා තිබීම

රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.මිලියන 46 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම, රූ රු.මිලියන 37 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.මිලියන 12 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2023 අගෝස්තු 23 වන විට වසර 05 ක් ගතවී තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණු අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබූ මුදල අනාර්ථික බවට පත්ව තිබුණි.

### අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇතිකිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කර නොතිබීම

ආසියානු රටවල පවතින සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඒකාබද්ධ කරමින් දේශීය ජනතාවට මෙන්ම විදේශිකයන්ට ස්වකැමැත්තෙන් ප්‍රතිකාර සහ ඖෂධ ලබා ගැනීමට හැකිවන පරිදි අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇතිකිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් 2022 ජනවාරි 10 දින දේශීය වෙදකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණු අතර රු. මිලියන 100 ක් වූ මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.මිලියන 40ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින්ද රු.මිලියන 60ක් සංස්ථාව මගින්ද දැරීමට ඉන් යෝජනා කර තිබුණි. නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය හා රු.මිලියන 40 ක ප්‍රතිපාදන ලබා දී නොතිබුණු පසුබිමක ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හෝ පිළියෙල නොකර අවිධිමත්ව සේවයේ යොදවාගත් සැලසුම් ශිල්පියකුට රු.මිලියන 02 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.

# දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

## විගණන නිරීක්ෂණ

- නව බදුකරණ සූත්‍රය නීතියක් බවට පත් කර නොතිබීම
- බලයලත් නිලධාරින්ට අදාළ නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථාන නියාමනය කිරීමට නොහැකි වීම
- සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහොසත් වීම

# දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

### නව බදුකරණ සූත්‍රය නීතියක් බවට පත් කර නොතිබීම

අධිකාරියේ වාර්තා අනුව වර්තමානයේ දුම්කොළ නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ පවතින බදුකරණ ව්‍යුහය අවිධිමත් සහ සංකීර්ණ බවත්, එය බදු වර්ග කිහිපයක එකතුවකින් සමන්විතවන බවත්, 2016 වර්ෂයේ සිගරට් මත වූ සුරාබදු ආදායම රජයේ සමස්ථ ආදායමෙන් සියයට 7.3ක් වුවත් එය 2020 වර්ෂය වන විට සියයට 3.1 දක්වා පහත වැටී තිබීම හේතුවෙන් අධිකාරිය විසින් 2020 සහ 2021 යන වර්ෂවලදී රු. මිලියනයක වියදමක් දරා දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රයක් හඳුන්වාදී තිබුණු අතර එමඟින් 2021 වර්ෂයේ රු. බිලියන 92 ක්ව පවතින සිගරට් මත වූ සුරාබදු ආදායම 2026 වර්ෂය වන විට රු. බිලියන 125 ක් දක්වා වැඩිකර ගත හැකි බවටත්, එය දුම්කොළ පරිභෝජනය සියයට 1.1 කින් පහත වැටීමකට සහ වාර්ෂිකව රාජ්‍ය ආදායම සියයට 6 කින් පමණ වැඩිවීමකට හේතුවන බවටත් අපේක්ෂාකර තිබුණද, නව බදුකරණ සූත්‍රය මෙම වාර්තාවේ දිනය වන විටත් නීතියක් බවට පත්වී නොතිබුණි.

### බලයලත් නිලධාරීන්ට අදාළ නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථාන නියාමනය කිරීමට නොහැකි වීම

2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත ප්‍රකාරව දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවිකිරීම සඳහා තබා ඇති ස්ථානයක් තුළ එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා තිබෙන බව නියමකොට හඳුන්වා දෙමින් සහ ඒවායේ මිල ගණන් දක්වමින් නියමිත ප්‍රමාණයේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දී තිබුණද, උක්ත වගන්තියට අදාළ වන පරිදි නියෝග සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව පනත යටතේ වූ බලයලත් නිලධාරීන්ට අදාළ නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කිරීමට නොහැකිවී තිබුණි.

### සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහොසත් වීම

දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත ප්‍රකාරව සිගරට් සහ දුම්කොළ නිෂ්පාදකයින්ට සෞඛ්‍ය අවවාද මාස හයකට වරක් වෙනස් කර සිගරට් පැකට්, ඇසුරුම් හෝ කාඩ්බෝඩ් පෙට්ටි මත ප්‍රදර්ශනය කිරීමට හැකිවන පරිදි ඉහත ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පුළුල් කිරීම සඳහා 2022 වර්ෂයේදී සෞඛ්‍ය අවවාද 10 ක් හඳුනාගෙන තිබුණද, ඒවා වර්ග කිරීමක් හෝ ගැසට්පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කිරීමක් සිදුකර නොතිබුණු අතර 2015 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වාම සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පමණක් භාවිතා වීමෙන් සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහෝසත් වී තිබුණි.

# කම්කරු හා විදේශ රැකියා අංශය

## විගණන නිරීක්ෂණ

- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
    - රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් පිළියෙළ කර නොතිබීම
    - දෝෂ සහිත සම්මාන ජයග්‍රාහකයන් වෙත බෙදා දීම
- කම්කරු දෙපාර්තමේන්තුව
    - සේවක අර්ථ සාධක අරමුදලට අදාල මුදල් පුද්ගලික ගිණුම් වලට බැර නොකර පොදු තැන්පත් ගිණුමක රඳවා තිබීම
    - කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා ලියාපදිංචි වී නොතිබීම
    - පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය විධිමත්ව සිදු නොවීම
    - වෘත්තීය සමිති අංශය රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර ගෙන නොතිබීම
- මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
    - මානව සම්පත් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය දුර්වල වීම
- ශ්‍රම වාසනා අරමුදල
    - පනතේ දක්වා ඇති අරමුණු ඉටුකරගැනීමට නොහැකි වීම
- සේවක අර්ථසාධක අරමුදල
    - සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොවූ මුදල් ශේෂ පැවතීම
    - මියගිය සාමාජිකයන් වෙනුවෙන් ලැබිය යුතු ප්‍රතිලාභ මුදල් නොගෙවීම
    - සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම නිශ්කාර්යව තිබීම
- කාන්තා ළමා කටයුතු හා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
    - සමෘද්ධිලාභියා සවිබල ගැන්වීම
    - සමෘද්ධිලාභීන් සවිබල ගැන්වා නොතිබීම
    - සහනාධාර මුදල් දිර්ඝ කාලීනව බැංකු ගිණුම්වල රඳවා තබා ගැනීම
    - දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති
- දිවිනැගුම සංවර්ධන අරමුදල
    - දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබීම
    - කළමනාකරණ මොඩියුලය ආශ්‍රයෙන් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ මොඩියුලය ක්‍රියාත්මක කර නොතිබීම
- සේවා නියුක්තියන්ගේ භාර අරමුදල
    - සාමාජික මුදල් සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොකර වෙනත් ගිණුම් වල මුදල් රඳවා තිබීම
    - අධිකරණ කටයුතු මගින් ලැබූ මුදල් සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොකර වෙනත් ගිණුම් වල රඳවා තිබීම
    - මරණ ප්‍රතිලාභ මුදල නොගෙවීම

# කම්කරු හා විදේශ රැකියා අංශය

රටේ ජීවනාලිය වැඩකරන ජනතාවයි. සතුටුදායක වැඩපරිසරයක් තුල තම කාර්යයන් ඉටුකිරීමට ලැබීම තුල සෞඛ්‍යය සම්පන්න ශ්‍රම බලකායක් ඇතිකිරීමට හේතුවන අතර ඒ තුලින් රටේ නිෂ්පාදනය හා ඒවාගේ ගුණාත්මකතාවය වර්ධනය කර ගැනීමට හැකිවේ.

කම්කරු විෂය පථයට ගැනෙන සියලු චක්‍රලේඛ , නීති, අණපනත්, නීති රෙගුලාසි සමාලෝචනය කොට වර්තමානයට ගැලපෙන සහ සේවක අයිතීන් සුරක්ෂිත කෙරෙන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම සේවක අර්ථසාධක අරමුදලට අමතර සේවකයින්ගේ සැදෑ සමය සුරක්ෂිත කරන දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම කම්කරුවන්ගේ නිපුණතා හා කුසලතා දියුණු කරමින්, සේවාස්ථාන වල ඉහල ප්‍රමිතීන් සහිත සනීපාරක්ෂක හා සේවක ආරක්ෂණ ක්‍රම පවත්වා ගනිමින් සේවා සේවක සුහදතාවය පදනම්ව ඵලදායීව වැඩසටහන් දිරි ගැන්වීම අරමුණු කර ගත් කම්කරු හා විදේශ රැකියා අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

මේ අනුව මෙම අංශයට අදාළ කම්කරු අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ව්‍යාපාර 05 ක් මගින් ඉටු කරන ලද ඉහත කාර්යයන් සම්බන්ධයෙන් සිදුකළ විගණණයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් පහත සාරාංශ කර දක්වා ඇත.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2022 වර්ෂය සඳහා රු.මිලියන.1,775 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර රු.මිලියන.1,671 ක් වැය කර තිබුණි. ඉන් රු.මිලියන.104 ක් ඉතිරිවී තිබුණි.




රූපසටහන 24 – ප්‍රතිපාදන ප්‍රමාණය හා ඉකිරිය

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

### රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් පිළියෙළ කර නොතිබීම

රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් 2022 වර්ෂය අවසාන වන විටත් පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### දෝෂ සහිත සම්මාන ජයග්‍රාහකයන් වෙත බෙදා දීම

2020 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියේ ජයග්‍රාහකයන්ට පිරිනැමීම සඳහා සම්මාන කුසලාන 685 ක් සඳහා රු.මිලියන 5 ක ගෙවීමක් සිදුකර තිබූ අතර 2022 ජුනි 15 දින සම්මාන ගබඩාව වෙත භාර දී තිබුණි. සම්මාන භාරගෙන මසකට පසුව මේවා නිවැරදි පිරිවිතරයන්ගෙන් පවතින්නේද යන්න වාර්තාවක් කැඳවා තිබූ අතර, ගබඩාවට ලබාදුන් සම්මාන ඒකක 33 ක් හැර ඉතිරි ඒවා දෝෂ සහිත බව වාර්තා කර තිබුණි. එසේ තිබියදී මෙම සම්මාන කුසලාන ජයග්‍රාහකයන්ට පිරිනැමීමට කටයුතු කර තිබුණි.

## කම්කරු දෙපාර්තමේන්තුව

### සේවක අර්ථ සාධක අරමුදලට අදාල මුදල් පුද්ගලික ගිණුම් වලට බැර නොකර පොදු තැන්පත් ගිණුමක රඳවා තිබීම

සමාලෝචිත වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවට හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල සේවක අර්ථ සාධක අරමුදලට අදාලව එකතුව රු.මිලියන 283 අදාල කේවල ගිණුම් වලට බැර කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා ලියාපදිංචි වී නොතිබීම

කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා ලියාපදිංචි විය යුතු වුවත්, 2022 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාලය තුල පවත්වාගෙන ගිය ගොනු සංඛ්‍යාව 32,948 කින් නව නීතිරීති අනුව ලියාපදිංචි වූ සංඛ්‍යාව 3,153 ක් විය. මේ අනුව අවම ලියාපදිංචි ගාස්තුව වූ රු.1,000 සැලකූවිට ලියාපදිංචි නොවූ කර්මාන්තශාලා සඳහා ලබාගත හැකි ලියාපදිංචි ගාස්තුව අවම වශයෙන් රු.මිලියන 30 ක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

### පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය විධිමත්ව සිදු නොවීම

සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම පරිපාලනය සහ අධීක්ෂණය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව පුද්ගලික අර්ථසාධක අරමුදල් අංශයක් පිහිටුවා තිබුණද මෙම අංශයෙන් ඒවා පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. මෙම අරමුදල් සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පැමිණිලි 291 ක් ඉදිරිපත්ව තිබූ අතර, මෙයින් පැමිණිලි 68 ක් විසඳා නොතිබුණි. පනත ප්‍රකාරව යම් මාසයක දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට ගෙවිය යුතු වුවත් එක් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සේවක අර්ථ සාධක අරමුදල සඳහා විධිමත්ව දායක මුදල් බැර නොකිරීම නිසා 2019 – 2021 කාලයට අදාලව රු.මිලියන 108 ක අධිභාර ගෙවීම පැහැර හැර තිබුණි.

### වෘත්තීය සමිති අංශය රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර ගෙන නොතිබීම

2022 ජූලි මස 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ කාර්ය හා කර්තව්‍ය ලෙස වෘත්තීය සමිති ලියාපදිංචිය, සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර හඳුන්වාදීම ක්‍රියාත්මක කලයුතු වුවද එවැනි පියවර ගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය.

## මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

### මානව සම්පත් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය දුර්වල වීම

ශ්‍රම වෙළඳපොල තොරතුරු රැස්කිරීම පදනම් කර ජනාධිපති කාර්යාලය මගින් දෙපාර්තමේන්තුවට යොමුකරන ලද තරුණ මානව සම්පත් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් කරන ලද පරීක්ෂණ වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ අනුව පද්ධතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත නොහැකි බැවින් මෘදුකාංගය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය වන විට දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2022 වර්ෂවලදී රු.මිලියන 84 ක වියදමක් දරා තිබූ අතර පරිගණක උපාංග, ගෘහ උපකරණ හා ලීබඩු මිලදී ගැනීම සඳහා ඉහත ව්‍යාපෘති යටතේ රු.මිලියන 84 ක් වැයකර තිබුණි.

### ශ්‍රම වාසනා අරමුදල

### පනතේ දක්වා ඇති අරමුණු ඉටුකරගැනීමට නොහැකි වීම

යැපෙන්නන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.මිලියන 38 කින් රු.මිලියන 5.4 ක් පමණක් ලැබී තිබුණු අතර 2004 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඒකාබද්ධ අරමුදලින් සුභසාධන කටයුතු සඳහා ලැබිය යුතු මුදල රු.මිලියන 379 ක් විය. ඒ අනුව භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් ලබාගත නොහැකි බැවින් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් පනතේ දක්වා ඇති අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි.

## සේවක අර්ථසාධක අරමුදල

### සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොවූ මුදල් ශේෂ පැවතීම

2022 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් ශේෂය වූ රු.මිලියන 3,380,617 න් රු.මිලියන 63,571 ක් විවිධ හේතු මත එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමෙන් තොරව පැවතුණි.

### මියගිය සාමාජිකයන් වෙනුවෙන් ලැබිය යුතු ප්‍රතිලාභ මුදල් නොගෙවීම

2022 වර්ෂයේ ජූනි 20 දිනට ප්‍රධාන කාර්යාලයේ පැවති නොගෙවූ මරණ ප්‍රතිලාභ අයදුම්පත් සංඛ්‍යාව 1,101 ක්වූ අතර ඉන් අයදුම්පත් 220 ක් අයදුම්පත් භාරදුන් දිනයේ සිට වසර 10 ත් 15 ත් අතර කාලයක සිටද

අයදුම්පත් 27 ක් වසර 4 ත් 13 ත් අතර ද අයදුම්පත් 8 ක් අවුරුදු 6 ත් 10 ත් අතර කාලයක සිට ද පවතින අතර අයදුම්පත් 210 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. මෙම නොගෙවූ මරණ ප්‍රතිලාභ වටිනාකම කොපමණද යන්න මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කර නොතිබුණි.

### සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම නිශ්කාර්යව තිබීම

අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 13 ක් වැයකර කාඩ්පත් 15,000 ක් ද, රු.මිලියන 18 ක් වැයකර ගිණුම් ශේෂ පිරික්සීමේ යන්ත්‍ර (KIOSK) 35 ක් ද මිල දී ගෙන තිබුණි. මිලදී ගත් මෙම කාඩ්පත් 15,000 අදාළ කාර්ය සඳහා උපයෝගී කර නොගෙන විගණිත දින වනවිටත් නිෂ්කාර්යව තොරතුරු තාක්ෂණ අංශයේ රඳවාගෙන තිබුණු අතර යන්ත්‍ර 35 කින් යන්ත්‍ර 2 ක් අපහරණය කර තිබුණි. අක්‍රිය යන්ත්‍ර 33 න් 25 ක් අපහරණය සඳහා ප්‍රධාන කාර්යාලයට රැගෙන විත් තිබුණි. මෙම යන්ත්‍ර වර්තමානයේ ක්‍රියාත්මක නොවීමෙන් අරමුදලේ මුදල් නිශ්කාර්ය වී තිබුණි.

### කාන්තා ළමා කටයුතු හා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

### සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

### සමෘද්ධිලාභීන් සවිබල ගැන්වා නොතිබීම

2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල සීමාව තුලදී රජය විසින් සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ විවිධ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 1,260 ක් වැයකර තිබුණ ද සවිබලගැන්වීම් පිළිබඳ නිශ්චිත ඉලක්කයක් හඳුනාගෙන නොතිබුණි. 1995 වසරේදී හඳුනාගත් සමෘද්ධිලාභීන් 312,307ක් 2023 වර්ෂය වන විට වසර 29 ක් ගතවී ඇතත්, සවිබලගැන්වීමකින් තොරව තවදුරටත් සහනාධාර ලබා දෙමින් පැවතුණි.

### සහනාධාර මුදල් දිර්ඝ කාලීනව බැංකු ගිණුම්වල රඳවා තබා ගැනීම

ප්‍රජාමූල බැංකු වෙත මාසිකව ප්‍රේෂණය කරනු ලබන සමෘද්ධිලාභී සහනාධාර මුදල් ඇතැම් සමෘද්ධිලාභීන් විසින් මාසිකව ලබා නොගෙන දිර්ඝ කාලීනව තම බැංකු ගිණුම්වල රඳවා තබා තිබුණි. මේ සම්බන්ධයෙන් කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රජාමූල බැංකු 10 ක වසම් 41ක් තුල සමෘද්ධිලාභීන් 2,433 කගේ ඉතිරි කිරීමේ ගිණුම්වල එසේ රඳවා තිබූ මුදල රු. මිලියන 60 ක් විය.

### දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති

### සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ අරමුණෙන් බැහැරව, ලාභ අරමුණින් ක්‍රියාත්මක වී තිබීම

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රජාමූල බැංකු 1,089ක සාමාජිකයින් 4,115,100 ක ගේ මුළු තැන්පත් මුදල රු.බිලියන 155 ක් වන අතර එයින් ප්‍රතිලාභීන්ට ලබාදුන් ණය මුදල්වල පිටහිටි ශේෂය රු. බිලියන 68 ක් පමණක් විය. 2022 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 149ක් ඉහළ පොළී අනුපාත යටතේ ආයෝජනය කර තිබුණු අතර සමෘද්ධිලාභීන්ගේ ඉතිරිකිරීම් සඳහා ගෙවා ඇත්තේ සියයට 03 ක් වැනි අඩු පොළියකි. මේ අනුව සමෘද්ධිලාභීන් සවිබල

ගැන්වීම අරමුණු කරගෙන ප්‍රජාමූල බැංකු පද්ධතිය ආරම්භකර තිබුණද, වර්තමානයේදී සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ අරමුණෙන් බැහැරව, ලාභ අරමුණින් ක්‍රියාත්මක වී තිබුණි.

## දිවිනැගුම සංවර්ධන අරමුදල

### දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබීම

දිවිනැගුම ආඥාපනත අනුව දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කර පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් දිවිනැගුම සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි.

### කළමනාකරණ මොඩියුලය ආශ්‍රයෙන් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ මොඩියුලය ක්‍රියාත්මක කර නොතිබීම

2012 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් නිර්මාණය කරන ලද සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභින්ගේ තොරතුරු ඇතුළත් කළමනාකරණ මොඩියුලය ආශ්‍රයෙන් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ “e” - සමෘද්ධි ව්‍යාපෘතියට 2016 වර්ෂයේ දී රු.මිලියන 4.3 ක වියදමක් දරා තිබූ අතර, 2019 වර්ෂයේදී නැවත CRM මොඩියුලය සඳහා රු.මිලියන 4 ක් වැයකර තිබුණි. නමුත් 2023 වර්ෂය වන විටත් මොඩියුලය ක්‍රියාත්මක කර නොතිබුණි.

## සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

### සාමාජික මුදල් සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොකර වෙනත් ගිණුම් වල මුදල් රඳවා තිබීම

මණ්ඩලය විසින් 1981 සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල සේවායෝජකයින් 3,912 කට අදාලව 2021 අප්‍රේල් 28 දිනට අයකරගෙන තිබූ එකතුව රු.මිලියන 581 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන පැවතුණි. මේ තුල වසර 7 ත් 41 ත් අතර කාලයක සිට පැවතෙන එන ශේෂය රු.මිලියන 91 ක් විය.

### අධිකරණ කටයුතු මගින් ලැබූ මුදල් සාමාජිකයන්ගේ කේවල ගිණුම්වලට බැර නොකර වෙනත් ගිණුම් වල රඳවා තිබීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත ප්‍රකාරව යම් සේවා නියුක්තයෙකු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අධිකරණ කටයුතු මගින් 1985 සිට 2022 වර්ෂය දක්වා අයකරගෙන තිබූ රු.මිලියන 1,511.14 ක වටිනාකම වූ දායක මුදල් හා අධිභාර මුදල් වලින් රු.මිලියන 71 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි.

### මරණ ප්‍රතිලාභ මුදල නොගෙවීම

සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස සාමාජිකයන් 1,207 කට අදාලව රු. මිලියන 21 ක් ගෙවිය යුතුව පැවතුණි. 1995 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මියගිය පුද්ගලයන්ට අදාලව ගෙවිය යුතු මරණ ප්‍රතිලාභීන්ගේ කාල විශ්ලේෂණය තුළ වසර 07 ත් 20 ටත් වැඩි කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 786 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 9 ක් විය.

# කර්මාන්ත, නිෂ්පාදන හා තාක්ෂණ අංශය

## විගණන නිරීක්ෂණ

- කර්මාන්ත අමාත්‍යාංශය
  - ප්‍රතිපාදන උපයෝජනය කිරීම
  - බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් උපයෝජනය කිරීම
  - රයිගම හරිත කාර්මික හා තාක්ෂණික සංවර්ධන සුපිරි කර්මාන්ත කලාප ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය
  - කර්මාන්තපුර වල නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමට වඩා අඩු ධාරිතාවයකින් පවත්වාගෙන යාම
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
  - රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය නිශ්ක්‍රියව තිබීම
  - උණ දැව භාණ්ඩ නිෂ්පාදනය ආයතනය නිශ්කාර්යව තිබීම
- ලංකා පිහන් සංස්ථාව
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
  - බදු ආදායම් අය කර නොගැනීම
- පරන්තන් කෙමිකල්ස් සමාගම
  - කෝස්ටික් සෝඩා බෑග් නිශ්කාර්යව මිලට ගැනීම
- ජාතික ශිල්ප සභාව
  - හණ පැල නඩත්තු නොකිරීම නිසා විනාශ වී තිබීම
  - හෙළ කලා ගම්මානය ප්‍රයෝජනයට නොගැනීම
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
  - ජංගම ගිණුම්වල නිශ්ක්‍රියව මුදල් රඳවා තිබීම
  - දේපල වල නීත්‍යානුකූල හිමිකම ලබාගැනීමට කටයුතු කර නොතිබීම
  - භෞතිකව නොපවතින තොගයක් ගිණුම් වල දක්වා තිබීම

- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
  - තැන්පතු අය කර නොගැනීම
  - එකතුකරන ලද මුදල් දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය නොකිරීම
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
  - ඉඩම් ඌණ උපයෝජිතව පැවතීම
- කාර්මික තාක්ෂණ ආයතනය
  - ඖෂධ රසායනාගාරයට ප්‍රයෝජනයට නොගැනීම
  - තුන්වන පාර්ශවීය ඛණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස උපකරණ යොදා නොගැනීම
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
  - ආනයනකරුගේ පුද්ගලික ඇපකරන ලියවිලි ලබා ගැනීමෙන් තොරව සීනි තොග ගබඩාව වෙත මුදා හැර තිබීම

# කර්මාන්ත, නිෂ්පාදන හා තාක්ෂණ අංශය

## කර්මාන්ත අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව ප්‍රාථමික අපනයනය සිදු කිරීමට වැඩි නැඹුරුවක් ඇති රටක් බැවින් ඒවාට විදේශ වෙළඳපොලේ ස්ථාවර මිලක් නොමැති වීම කාලගුණ හා දේශගුණ බලපෑම් මත ඒවාගේ නිෂ්පාදනය ඉහල පහල යාම වැනි කරුණු නිසා රට අඛණ්ඩ විදේශ වෙළඳ ශේෂයේ හිඟයක් සහිත රටක් වී තිබේ. මේ නිසා රට තුලට ගලා එන මුදල් වලට වඩා රට තුලින් මුදල් ගලා යාම නිසා අඛණ්ඩ විදේශ විනිමය අර්බුධයකට රට මුහුණ දී සිටී. නමුත් ජාත්‍යන්තර වෙළඳපොලත් සමග තරඟ කල හැකි දේශීය කාර්මික නිෂ්පාදන ධෛර්යමත් කිරීම තුලින් මෙම අභියෝගය ජය ගත හැකිය. ඒ අනුව තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව කාර්මික නිෂේපාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් තහවුරු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 02 ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා 12 ක් සහ සමාගම් 11 ක් ක්‍රියාත්මක වනු ලබයි.

- නිෂ්පාදන කර්මාන්ත අංශයේ සියළුම පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම උදෙසා හිතකර ව්‍යුහයක් ගොඩනැගීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයේ තාක්ෂණ භාවිතාවන්, අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය, දේශීය සම්පත් භාවිතය සහ තිරසර බව ඉහළනැංවීම.
- සැමට ප්‍රතිලාභ සලසන කාර්මික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සහ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.
- කර්මාන්ත අංශයේ දේශීය සහ ගෝලීය වෙළඳපොල ප්‍රවේශය ඉහළ නැංවීම යන අරමුණු ඉටු කර ගැනීමට කර්මාන්ත අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

## ප්‍රතිපාදන උපයෝජනය කිරීම

අමාත්‍යාංශය සඳහා 2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට රු. මිලියන 4,287 ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3,327 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, වර්ෂය අවසානයට රු.මිලියන 960 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.




රූපසටහන - 25 - කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ වියදම

## බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් උපයෝජනය කිරීම

බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 43 ක් වෙන් කර තිබුණු අතර, 2016 වර්ෂයේ සිට 2021 දක්වා කර්මාන්ත කරුවන් 15 දෙනෙකු වෙත හා 2022 වර්ෂයේදී තවත් කර්මාන්තකරුවන් දෙදෙනෙකු වෙත ඉඩම් කට්ටි 41 ලබා දී තිබුණි. ඉන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්තකරුවන් 5 ක් වන අතර කර්මාන්තකරුවන් 7 ක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති. කර්මාන්තකරුවන් තිදෙනෙකු වෙත වෙන් කර දී තිබුණ පර්චස් 340.8ක් වූ මුලු ඉඩම් ප්‍රමාණයම කිසිදු ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි.

## රයිගම හරිත කාර්මික හා තාක්ෂණික සංවර්ධන සුපිරි කර්මාන්ත කලාප ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය

රයිගම හරිත කාර්මික හා තාක්ෂණික සංවර්ධන සුපිරි කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීම සඳහා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 97 ක මුදලක් 2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 48 ක වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු වුවද මූල්‍ය ප්‍රගතිය සියයට 49 ක් විය. ඉහත වියදමින් ජලසැපයුම සඳහා රු. මිලියන 29 ක් වැය කර තිබුණ ද භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණක් විය.

### කර්මාන්තපුර වල නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමට වඩා අඩු ධාරිතාවයකින් පවත්වාගෙන යාම

බස්නාහිර පළාත තුල පිහිටි කර්මාන්තපුර 5 ක කර්මාන්තශාලා 07 ක් කිසිදු නිෂ්පාදන කටයුත්තක් සිදු නොකර කර්මාන්තශාලා වසා දැමීම හේතුවෙන් පර්චස් 1535.7 ක් වූ ඉඩම් ප්‍රමාණයක් උපයෝජනය නොවී පවතින අතර ඉහත කර්මාන්තපුර 05 ද ඇතුළුව කර්මාන්තපුර 07 ක කර්මාන්තශාලා 57 ක් තම නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමට වඩා අඩු ධාරිතාවයකින් පවත්වා ගෙන ගොස් තිබුණි.

### ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

### රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය නිශ්ක්‍රියව තිබීම

2016 අගෝස්තු 17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් රු. මිලියන 80ක රජයේ දායකත්වයක් සහිතව රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නවබිම පෙර වැඩුම් මධ්‍යස්ථානය තෝරාගෙන තිබුණි. නවබිම ගොඩනැගිල්ලක කාමර 5 කින් යුත් පලමු හා දෙවන මහල ඉදිකිරීම, අළුත්වැඩියා හා නවීකරණය කිරීම සඳහා රු. මිලියන 40 ක් දරා තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු. මිලියන 34 ක් වටිනා රොබෝ තාක්ෂණික යන්ත්‍රෝපකරණ 2018 හා 2019 වර්ෂයන්හිදී මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද 2023 ජුලි 30 දින වන විටත් මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇති යන්ත්‍රෝපකරණ, වායුසමීකරණ යන්ත්‍ර නිෂ්කාර්යව පැවතිණි.

### උණ දැව භාණ්ඩ නිෂ්පාදනය ආයතනය නිශ්කාර්යව තිබීම

උණ දැව භාවිතයෙන් ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම මඟින් ආදායම, රැකියාව සහ ජීවනෝපායට ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ මූලික අරමුණින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා යුනිඩෝ ආයතනය ඒකාබද්ධව ලක්සල වඩු කර්මාන්ත ශාලාව පිහිටි ගොඩනැගිල්ලක තාවකාලික පදනමින් උණ දැව පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබුණි. 2020 මැයි මස යුනිඩෝ ආයතනය භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පවතින බවත් දක්නට ලැබුණි.

### ලංකා පිඟන් සංස්ථාව

2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම නිෂ්පාදනය වැඩිකිරීම, නිෂ්පාදන වියදම් ඇතුළු සමස්ථ වියදම් අඩුකිරීම, විකුණුම් පරිමාව හා වෙළඳ කොටස වැඩි කිරීම ආදී වශයෙන් ඉලක්ක 10ක් සපුරා ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ඇතුලත් කරමින් සකස් කර තිබුණ ද ඊට අදාළ අයවැයගත ප්‍රතිපාදන දක්වා නොතිබුණ අතර කාර්යසාධනය මැනීම සඳහා වූ ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන ප්‍රගතිය ඇගයීම් කර නොතිබුණි.

### ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

සංස්ථාව විසින් මේ වන විට සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිදු නිෂ්පාදනයක් සිදු කරනු නොලබන අතර සංස්ථාව සතු අරුවක්කාලු හුණුගල් නිධිය බදු දීමෙන් ලැබුනු රු. මිලියන 64 ක් හා කොල්ලුපිටියේ පිහිටි ඉඩම රථගාලක් සඳහා බදු දීමෙන් ලැබුනු රු.මිලියන 4 ක් වූ

කුලී ආදායම පමණක් 2022 වර්ෂයේ සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබුණි.

### බදු ආදායම් අය කර නොගැනීම

කන්කසන්තුරෙහි පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2 ක් හා නළ පද්ධති ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබුණු අතර, තක්සේරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 22 දිනැති තක්සේරු වාර්තාව මත පදනම්ව 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා රු. මිලියන 201 ක මුදලක් සංස්ථාව වෙත අයවිය යුතු බවට තක්සේරු කර තිබුනද, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

### පරන්තන් කෙමිකල්ස් සමාගම

### කෝස්ටික් සෝඩා බෑග් නිශ්කාර්යව මිලට ගැනීම

සමාලෝචිත වර්ෂයේදී අවස්ථා දෙකකදී බංග්ලාදේශයෙන් රු. මිලියන 39 ක් වටිනා 25 Kg කෝස්ටික් සෝඩා බෑග් 5,997 ක් මිලදී ගෙන ඇති අතර වර්ෂය අවසාන වන විට මින් රු. මිලියන 23 ක් වටිනා බෑග් 2,894 ක් ඉතිරි වී තිබුණි. 2023 ජූලි 12 දින වන විටත් මෙම තොගයෙන් රු. මිලියන 18 ක් වටිනා තවත් බෑග් 2,277 ක් ඉතිරි වී තිබුණු අතර මෙහි කල් ඉකුත්වීමේ දිනය 2023 අගෝස්තු 26 දින ලෙස සටහන් කර තිබුණි.මෙසේ බෑග් 2,894 ක තොගයක් ඉතිරිව තිබියදී නැවත 2023 වර්ෂයේ අවස්ථා 2 කදී කෝස්ටික් සෝඩා බෑග් 7,998 ක් ඉන්දියාවෙන් මිලදී ගෙන තිබුණි. 2023 ජූනි 30 දිනට කෝස්ටික් සෝඩා ඉතිරි වී තිබූ මුළු බෑග් ගණන 10,034 ක් වූ අතර එහි වටිනාකම රු.මිලියන 79 ක් විය.

### ජාතික ශිල්ප සභාව

### හණ පැල නඩත්තු නොකිරීම නිසා විනාශ වී තිබීම

මහවැලි B ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය තුළදී රු. මිලියන 35 ක් වැය කර මිලදී ගත් හණ පැල 44,000 කින් පැල 36,000 ක් පමණක් සිටුවා තිබුණද විගණන දිනය වන විට වගාවෙන් සියයට 95 ක් විනාශවී තිබුණි. මීට ප්‍රධාන හේතුව ව්‍යාපෘතිය නිසි අධීක්ෂණය හා නඩත්තු සිදු නොකිරීම විය.

### හෙළ කලා ගම්මානය ප්‍රයෝජනයට නොගැනීම

ජාතික ශිල්ප සභාවට අයත් මුණියන්ඩි වැව අසල හෙළ කලා ගම්මානය 2021 වර්ෂයේ රු. මිලියන 10 ක් හා 2022 වර්ෂයේ රු. මිලියන 5 ක් වශයෙන් එකතු වටිනාකම රු. මිලියන 15 ක් වැය කර කුටි 14 ක් ඉදිකර තිබුණද විගණන දිනය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

### ජංගම ගිණුම්වල නිශ්ක්‍රියව මුදල් රඳවා තිබීම

මණ්ඩලයට අයත් ඇතැම් ශාඛාවන් වල පවත්වාගෙන යන ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම්වල විශාල මුදලක් දෛනිකව රඳවා තබාගෙන තිබූ බැවින් මාසිකව හෝ යම් නිශ්චිත දිනක හෝ යම් නිශ්චිත මුදලක් හෝ ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමට ස්වයංක්‍රියව මාරු කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් සකස්

කිරීම තුළින් මුදල් නිශ්ක්‍රියව ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම් වල පවත්වා ගැනීම අවම වේ. මෙලෙස බැංකු ගිණුම් 9 ක රු. මිලියන 44 ක් ඵලදායී ආයෝජන මාර්ගයක ආයෝජනය නොකර නිෂ්ක්‍රියව රඳවාගෙන තිබුණි.

### දේපල වල නීත්‍යානුකූල හිමිකම ලබාගැනීමට කටයුතු කර නොතිබීම

ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති කැබිනට් තීරණය මඟින් මණ්ඩලය වෙත පවරා දී ඇත. ඒ අනුව ගැනුම් ප්‍රතිඥාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 12 දිනැතිව රු. මිලියන 15 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ද දේපලෙහි නීත්‍යානුකූල හිමිකම ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### භෞතිකව නොපවතින තොගයක් ගිණුම් වල දක්වා තිබීම

මුල්‍ය ප්‍රකාශනවල සඳහන් තොග වෙන්කිරීම් ගිණුමේ රු. මිලියන 12 ක් හා චලනය නොවූ තොග ගිණුමේ රු. මිලියන 108 ක් ලෙස එකතුව රු. මිලියන 120 ක භෞතිකව නොපවතින තොගයක් ගිණුම් වල දක්වා තිබුණි.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

### තැන්පතු අය කර නොගැනීම

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබාදීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුනද ආරක්ෂිත ඇප තැන්පතු රු. මිලියන 16 ක මුදල 2023 පෙබරවාරි 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

### එකතුකරන ලද මුදල් දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය නොකිරීම

මාසයක් ඇතුලත එකතුකරන ලද රදවාගැනීමේ බදු මුදල් ඊළඟ මස 15 දිනට පෙර දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතු වුවද, 2022 නොවැම්බර් 30 දක්වා අයකරන ලද සියයට 2.5 ක රදවාගැනීමේ බදු මුදල් රු. මිලියන 483 ක් ප්‍රේෂණය කර නොතිබුණි.

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

### ඉඩම් ඌණ උපයෝජිතව පැවතීම

ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේදී රු. මිලියන 14 ක වටිනාකමට අවුරුදු 30ක බදු පදනම මත ලබාගත් ඉඩමෙහි, අදාල කාර්යන් සිදු නොකිරීම හේතුවෙන් වසර 06 කට අධික කාලයක සිට ඌණ උපයෝජිතව පැවතුණි.

### කාර්මික තාක්ෂණ ආයතනය

#### ඖෂධ රසායනාගාරයට ප්‍රයෝජනයට නොගැනීම

සංවර්ධිත රටවල උසස් ඖෂධ රසායනාගාරවලට සමගාමීව පහසුකම් සහිතව ජීඑල්පී (GLP) තත්ත්වය ඇතුළුව ප්‍රතීතනය ලත් අති නවීන ඖෂධ රසායනාගාරයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු. මිලියන 99 ක් වියදම් කර ආයතනය තුල 2019 සිට පවත්වාගෙන ගොස් තිබුණද දිවයිනේ ඇති රෝහල් පද්ධතියද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනිම හා බෙදාහැරීම් කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් උක්ත රසායනාගාරයේ පුළුල් සේවාවන් ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි.

#### තුන්වන පාර්ශවීය ඛණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස උපකරණ යොදා නොගැනීම

2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිසමේ (PUCSL) නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය ඛණිජතෙල් නිෂ්පාදනයේ පරීක්ෂාවන් සිදුකිරීම පිණිස උපකරණ අත්පත්කර ගැනීමට හා සවිකිරීමට රු.මිලියන 118 ක් වැයකර ස්ථාපනය කර තිබූ ඛණිජතෙල් හා ලිහිසිතෙල් රසායනාගාරය සඳහා ඛණිජතෙල් සාම්පල් ලැබීමේ ක්‍රමවේදයක් නිර්මාණය කර නොතිබීම නිසා රසායනාගාරය පිහිටුවීමේ මූලික කර්තව්‍යය ඉටුවී නොතිබුණි .

### ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

#### ආනයනකරුගේ පුද්ගලික ඇපකරන ලියවිලි ලබා ගැනීමෙන් තොරව සීනි තොග ගබඩාව වෙත මුදා හැර තිබීම

1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත අනුව ආයතනය විසින් නිකුත් කර තිබූ 2010 අප්‍රේල් 01 දිනැති GL-II-04 දරන ආනයන භාණ්ඩ පරීක්ෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව පනතේ අරමුණු ඉටු කිරීම සඳහා සකස් කළ මාර්ගෝපදේශය ප්‍රකාරව නියැදි සාම්පල් පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර ආනයනකරුගේ පුද්ගලික ඇපකරන ලියවිලි ලබා ගැනීමෙන් තොරව අවස්ථා 58 කදී එකතුව කිලෝ ග්‍රෑම් 10,986,250 ක සීනි තොග ආනයනකරුගේ ගබඩාව වෙත මුදා හැර තිබුණි.

# රාජ්‍ය පරිපාලන අංශය

## විගණන නිරීක්ෂණ

- හිඟ ගොඩනැගිලි කුලී අය කර ගැනීමට කටයුතු නොකිරීම
- වත්කම් කළමනාකරණයේ පවතින අඩුපාඩු
- E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඌන උපයෝජනය
- විදේශාධාර ව්‍යාපෘති වල අරමුදල් ඌන උපයෝජනය
- විදේශ ණය අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබීම
- විදේශ ණය ඌන උපයෝජනය
- කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල

- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
    - පත්ඉරු පරිලෝකනය කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් ඊ - ඉඩම් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබීම
    - උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබීම

# රාජ්‍ය පරිපාලන අංශය



රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇති කිරීම පිණිස අදාල රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදුකිරීම සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගැයීම, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය, පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටුකළයුතු කාර්යයන් ඉටු කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් විය.

අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ විවිධ වැඩසටහන්, ව්‍යාපෘති හා කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුව පැවතුණ අතර 2022 වර්ෂයේදී එම කාර්යභාරය ඉටුකිරීම සඳහා අමාත්‍යාංශය වෙත එකතුව රු. මිලියන 64,096 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් වර්ෂය අවසානයේ රු. මිලියන 56,150ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 7,946ක් උපයෝජනය කර නොතිබුණි.

සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සියළුම පළාත් පාලන ආයතන, දෙපාර්තමේන්තු 04ක්, සංස්ථා/මණ්ඩල 05ක්, එක් කොමිෂන් සභාවක් සහ එක් සමාගමක් මෙම අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වේ.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඉහත කාර්යයන් ඉටුකිරීම පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### නිහ ගොඩනැගිලි කුලී අය කර ගැනීමට කටයුතු නොකිරීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් නිහ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති නිහ ආදායම් තව තවත් එකතු වීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු වුවත් ආයතන 29 කින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි නිහ කුලිය රු.මිලියන 342 ක් වී තිබූ අතර එම නිහ කුලී මුදලින් සියයට 22 ක් හෙවත් රු.මිලියන 74 ක් අමාත්‍යාංශය යටතේ පාලනය

වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි. 2019 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පවතින හිඟ කුලිය රු.මිලියන 195 ක් වූ අතර හිඟ කුලී ආදායම ඉකුත් වර්ෂයේ සංඛ්‍යා හා සැසඳීමේදී රු.මිලියන 19 ක වැඩිවීමක් විය.

## වත්කම් කළමනාකරණයේ පවතින අඩුපාඩු

කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස කඩා ඉවත් කර නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රු. මිලියන 322 ක් වෙන්කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එම නිවාස සංකීර්ණයේ කඩා ඉවත් කිරීමට යෝජිත නිවාස 11 ක් 2009 වර්ෂයේ සිට තාවකාලික පදනම මත ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ට ලබාදී තිබුණු අතර මෙම නිවාසවල පරිපාලනය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව පැවතුණි. නිල මැදුර ගොඩනැඟිල්ලේ වටිනාකම වූ රු.මිලියන 459 ක් ගිණුම් වලට ගෙන තිබූ නමුත්, ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. තවද, ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක බංගලා 35 ක් හා ඊට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒවා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඌන උපයෝජනය

ග්‍රාම නිලධාරීන් විසින් ජනතාවට ලබාදෙන සේවාවන් සඳහා එදිනෙදා අවශ්‍ය තොරතුරු රැස්කර තබා ගැනීමට හා පරිශීලනය කිරීමට අවශ්‍ය දත්ත ඇතුලත් E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ පළමු අදියර නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක, ග්‍රාම නිළධාරී වසම් 133ක් තුළ රු.මිලියන 57 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් එහි සාර්ථකත්වය මත දෙවන අදියර ග්‍රාම නිලධාරී වසම් 7,000 ක් ආවරණය වන පරිදි රු.මිලියන 1689 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. මේ වෙනුවෙන් 2022 වර්ෂය සඳහා සලසාගෙන තිබුණු රු.මිලියන 750 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3 ක් පමණක් වැයකර තිබුණි. 2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 332 ක් වැයකර තිබුණද සැපයුම්කරු සමග ගිවිසුම්ගත වීමෙන් පසුව ප්‍රසම්පාදනය අත්හිටුවා තිබූ අතර ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, අමාත්‍ය මණ්ඩල සංදේශ යොමු කිරීම ප්‍රමාද වීම වැනි විවිධ අඩුපාඩු මීට හේතු වී තිබුණි.

## විදේශාධාර ව්‍යාපෘති වල අරමුදල් ඌන උපයෝජනය

යාපනයේ ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා විදේශ ප්‍රදාන මඟින් වෙන්කර තිබූ රු.මිලියන 200 ක් හා ශ්‍රී ලංකා

රජය යටතේ වෙන්කර තිබූ රු.මිලියන 40ක්, උතුරු පළාතේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජයිකා ආයතනයේ ප්‍රදාන යටතේ වෙන්කර තිබූ රු.මිලියන 10 ක් හා පළාත් පාලනය ඉහළ නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන යටතේ වෙන්කර තිබූ රු.මිලියන 50 ක්, පළාත් පාලනය ඉහළ නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 50ක්, අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයේ ප්‍රදාන යටතේ වෙන්කර තිබූ රු.මිලියන 270 ක් හා ශ්‍රී ලංකා රජය යටතේ වෙන්කර තිබූ රු.මිලියන 5 ක් වශයෙන් එකතුව රු.මිලියන 625ක් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ඉතිරිවී තිබුණි.

### විදේශ ණය අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබීම

මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීම සඳහා වූ ආයෝජන වැඩසටහනෙහි 03 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු (ආ.ස.බැ.) ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 200 ක ප්‍රතිපාදනවලින් සියයට 55 ක් වූ රු. මිලියන 110 ක් ද, මෙම වැඩසටහන තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආ.ස.බැ. ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනවලින් සියයට 58ක් වූ රු.මිලියන 576 ක් ද, ශ්‍රී ලංකා රජය යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 200 ක ප්‍රතිපාදනවලින් සියයට 79 ක් වූ රු.මිලියන 157 ක් ද, අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර ගෙන නොතිබුණි. ශ්‍රී ලංකා රජය මඟින් සලසාගෙන තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 8 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර වියදම් කර තිබුණි.

### විදේශ ණය උන උපයෝජනය

ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකු ණය යටතේ රු.මිලියන 1,900 ක් හා ප්‍රදාන යටතේ රු.මිලියන 1,400 ක් ද, ශ්‍රී ලංකා රජය මඟින් රු.මිලියන 50 ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ලෝක බැංකු ප්‍රදාන යටතේ සලසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 56 ක් හෙවත් රු.මිලියන 778 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නෙදර්ලන්ත රජයේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 300 ක ප්‍රතිපාදනවලින් සියයට 69 ක් වැයකර තිබුණද, ශ්‍රී ලංකා රජය මඟින් සලසාගෙන තිබුණු රු.මිලියන 12 ක ප්‍රතිපාදනවලින් සියයට 64ක් වූ රු.මිලියන 8 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

### කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශ 13 කින් හා දෙපාර්තමේන්තු 14 කින් ලද ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු.මිලියන 1,239,453 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක අවමයක්

ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි හා ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමට සහය වන භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදනයෙන් රු. මිලියන 88 ක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සියයට 24 ක් වූ රු. මිලියන 21 ක් පමණක් වෙන් කර තිබුණි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින් / වැන්දඹුවන් 259 දෙනෙකු වෙත එකතුව රු. මිලියන 53 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණ අතර, 2022 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා එයින් තවදුරටත් රු. මිලියන 30 ක මුදලක් අය විය යුතුව තිබුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් වෙන්කළ මුදල රු. මිලියන 52 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර ඇති මුදල රු. මිලියන 15 ක් බැවින් ග්‍රාම සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම අවම මට්ටමක පැවතුණි.

ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ වෙන්කළ මුදල රු. මිලියන 115 ක් වූ අතර, මෙයින් රු.මිලියන 68 ක් ණය වැඩසටහන් සඳහා වැයකර තිබූ අතර, ඉතිරිය රු. මිලියන 47 ක් විය. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 74 ක් සඳහා රු. මිලියන 21 ක ණය මුදලක් ලබාදීම සඳහා වෙන්කර තිබුණද, අදාල ණය වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අදාලව පසුගිය වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ, වන අලි හානි සඳහා එකතුව රු. මිලියන 11 ක් දේපළ, ශාරීරික හා ජීවිත හානි වශයෙන් වන්දි මුදල් පිරිනමා තිබුණද, පසුගිය කාලපරිච්ඡේදයට අදාලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන අලි ගැටලුවලට විසඳුම් ලබාගත හැකි සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

2022 නොවැම්බර් 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා තෝරාගත් පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් සපයන පොහොර සඳහා වන ගෙවීම්, අදාල දිස්ත්‍රික් ලේකම් / දිසාපතිගේ නිර්දේශ මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිරවුල් කිරීමට හැකිවන පරිදි යෝග්‍ය වැඩපිළිවෙලක් හඳුන්වාදීම මඟින් සිදුවිය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව ගෙවීම් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත රු. මිලියන 823 ක මුදලක් ලබාදී තිබුණි. නමුත් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව සැපයුම්කරුවන් 12 දෙනෙකු වෙත රු. මිලියන 205ක මුදලක් ගෙවීම් කර තිබුණි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක විදුලි රහිත නිවාස 2,856ක් වැසිකිලි නොමැති නිවාස 4,990 ක්, වල වැසිකිලි සහිත නිවාස 2,314 ක්, තාවකාලික නිවාස 2,961 ක් සහ පදිංචියට නිවසක් නැති පවුල් 2,851 ක් පැවතියදී, විමධ්‍යගත මූල්‍ය වැඩසටහන යටතේ පහසුකම් ලබා දීම සඳහා ලබා දී තිබූ රු. මිලියන 88 ක

ප්‍රතිපාදන වලින් සියයට 01 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගෙන සහල් කර ලබාදීමේ පදනම යටතේ රජය විසින් 2020/21 මහ කන්නයේ දී වී මෝල් හිමියන් 14 දෙනෙකු වෙත ලබාදෙන ලද රු. මිලියන 100 ක මුදල වෙනුවෙන් ලැබිය යුතු රු. මිලියන 33 ක් වටිනා සහල් කි.ග්‍රෑ. 422,502 ක් සහ 2021 යල කන්නයේ දී වී මෝල් හිමියන් 19 දෙනෙකුට ලබාදෙන ලද රු. මිලියන 78 ක මුදල සඳහා ලැබිය යුතු සහල් කිලෝ ග්‍රෑම් 1,006,687ක් 2023 මැයි 30 දින වන විටත් ලැබී නොතිබුණි.

ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැඟිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබූ අතර, ඒ සඳහා බෙරුම් කරන ක්‍රියාවලියකට යාම නිසා ප්‍රමාද පොලී ලෙස රු. මිලියන 10 ක් ගෙවීමට සිදුවී තිබුණි. එසේම ඉදිකිරීම්වල දෝෂ නිවැරදි කිරීමට රු. මිලියන 34 ක ඉංජිනේරු ඇස්තමේන්තුවකින් සහතික කර තිබුණ ද, බෙරුම් කරන ක්‍රියාවලියේ දී එය නොසලකා හැර කටයුතු කිරීමෙන් රජයට රු. මිලියන 18 ක අලාභයක් සිදුවී තිබුණි.

### මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක නායයෑම් හා අධි අවදානම් ලෙස නම් කළ ප්‍රදේශවල පවුල් 1,070 ක් ජීවත්වන බව හඳුනාගෙන තිබුණ ද ඔවුන් වෙනත් ස්ථාන වල පදිංචි කරවීම හෝ විකල්ප අවස්ථාවක් කරා යොමු නොකර අධි අවදානම් ප්‍රදේශයේම ජීවත්වීමට ඉඩහැර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල් ගිණුමේ එකතු ශේෂය රු.මිලියන 177 ක් වූ අතර, ඉන් රු. මිලියන 116 ක ණය ශේෂයක් හිඟහිටිව තිබුණි. මෙයින් ණයලාභීන් 128 දෙනෙකුගේ රු.මිලියන 5 ක ණය කල්පසු වී තිබුණු අතර, ණයලාභීන් 105 දෙනෙකුගේ රු. මිලියන 6 ක ණය අයකර ගත නොහැකිව තිබුණි.

මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ ණයලාභීන් 1,779 ක් වෙත රු.මිලියන 62 ක ණය ලබාදී තිබුණි. මෙම ණයලාභීන්ගෙන් 319 දෙනෙකුගෙන් රු. මිලියන 9 ක ණය අයවීම් අක්‍රීය වී තිබුණි.

### මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

රත්තොට, ලග්ගල, විල්ගමුව, අඹන්ගගකෝරළේ හා නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමශක්ති ව්‍යාපාරය සඳහා වසර 04 කට පමණ පෙර ග්‍රාම නිලධාරි වසම් 59 ක සමිති වෙත ලබාදී තිබුණු රු. මිලියන 20 ක මුදලක් අරමුණුගත කාර්යය සඳහා යොදවා ගැනීමකින් තොරව බැංකු ගිණුම් වල නිෂ්කාර්යයව පැවතුණි.

### නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2019 වර්ෂයේ ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන සඳහා සූර්යය බල පද්ධති ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු. මිලියන 17 ක් වැයකර ආගමික ස්ථාන 14 ක සවිකර තිබුණු සූර්යය බල පද්ධතින් මඟින් ස්ථාපනය වන විදුලිය ජාතික විදුලි පද්ධතියට එකතු කිරීම වර්ෂය අවසාන දින වන විටත් සිදු කර නොතිබුණි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිපාදන මඟින් ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ අවධානම අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 19 ක් ගෙවා තිබුණද, ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණු හා ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

ග්‍රාම ශක්ති වැඩ සටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මල් වගාකරුවන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා 2019 වර්ෂයේදී රු. මිලියන 9 ක් වැය කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකරන ලද ආරක්ෂිත ගෘහ 29 ක් ගලවා ඉවත් කර, වලපනේ ගල්කඩපතන ග්‍රාම ශක්ති ජනතා සමිතිය වෙත ලබාදී තිබුණද, කිසිදු ඵලදායි කාර්යයක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

### ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2019 වර්ෂයේදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,155 ක් වූ ආසන 2,000 ශ්‍රවණාගාරය ඉදි කිරීමට අදාළව 2023 මාර්තු 16 දින වන විට ව්‍යාපෘති උපදේශක විසින් නිර්දේශිත මූළු බිල්පත් වටිනාකම රු.මිලියන 967 ක් වූ අතර එය ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 30 ක් පමණ වුවද, ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 15 ක් පමණ වී තිබුණි. කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ රු.මිලියන 426 ක අත්තිකාරම් මුදලද අය කර ගැනීමට නොහැකි වී පැවති අතර අත්තිකාරම් බැඳුම්කරයද ඒ වන විට කල් ඉකුත් වී තිබියදී ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි.

### මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පවතින අරමුදල් පරීක්ෂාවේදී 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශ 11 ක් තුළ ග්‍රාමශක්ති ජනතා සමිති 125 ක් පැවති අතර එම සමිති සතු බැංකු ගිණුම් හි රු.මිලියන 82 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ලේඛනගත ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන 08 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2014 වර්ෂයේදී අධි අවදානම් කලාපයක් ලෙස හපුතලේ දඹේතැන්න වතුයායේ ජීවත්වන පවුල් 65 ක් නැවත පදිංචි කිරීම සඳහා දඹේතැන්න වතුයායට අයත් ඉඩමක් තෝරාගෙන ප්‍රතිලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ කටයුතු නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඉටුකරවා ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 14 වන දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2020 ඔක්තෝබර් 14 වන විට අවසන් කල යුතු උක්ත නිවාස ව්‍යාපෘතිය සඳහා 2022 ජනවාරි 01 වන දින විට රු. මිලියන 22 ක් වැයකර තිබුණු නමුත් ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි.

මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. මිලියන 141 ක ගිවිසුම්ගත මුදලකට 2017 දෙසැම්බර් 18 දින පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගත වී තිබුණු අතර, 2023 මාර්තු 31 දින වන විට රු. මිලියන 139 ක් වැයකර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත දින සිට දින 546 කින් වැඩ අවසන් කල යුතු වුවද, 2023 මාර්තු 31 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි. එදිනට වැඩ ප්‍රමාද කාලය දින 1,928 ක් වූ අතර එය ඇස්තමේන්තුගත කාලය මෙන් සිවු ගුණයකට ආසන්න වී තිබුණි.

### අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වනිතා සංවර්ධන නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ ණය යෝජනා ක්‍රම 06 කට අදාලව ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 18 ක සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 03 ට වැඩි කාලයක සිට අයවීම් හිඟ හිට ඇති ණය ශේෂවල එකතු වටිනාකම රු. මිලියන 3 ක් විය.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 09 ක කළු ගල් කැණීම් වෙනුවෙන් බලපත්‍රලාභීන් හැට දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට 2020 සිට 2022 කාලයට අදාලව අය විය යුතු රජයේ ගාස්තුව රු. මිලියන 147 ක් විය.

2009 මැයි 06 දින අංක 1618 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති රීති අනුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ දෙකක 2019 සිට 2022 කාලය තුල සිදු කර තිබූ බොරළු කැණීම් වෙනුවෙන් බලපත්‍රලාභීන් හත්දෙනෙකුගෙන් අය විය යුතු රජයේ ගාස්තුව රු. මිලියන 10 ක් විය.

### පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ඉන්දීය විදේශ ආධාර යොදාගනිමින් කදුරුවෙල නගරයේ තෙරුවන් භාෂා මිශ්‍ර පාසලක් ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් ඉටුකරවාගෙන තිබුණු අතර, ඒ සඳහා උපදේශනය රාජ්‍ය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක

කාර්යාංශය මගින් සිදුකර තිබුණි. මුලික වියදම් සඳහා රු.මිලියන 187 ක් වැය කර තිබුණි. පාසල ඉදිකිරීමේ දෙවන කොටස සඳහා රු.මිලියන 246 ක කොන්ත්‍රාත් වටිනාකමින් රු.මිලියන 136 වැය කර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 04 ක කළුගල් කැණීම් වෙනුවෙන් බලපත්‍රලාභීන් 41 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට 2017 සිට 2021 කාලයට අදාලව අය විය යුතු රජයේ ගාස්තුව රු. මිලියන 140 ක් විය.

## මුලතීව් දිස්ත්‍රික් ලේකම් කාර්යාල

සමාලෝචිත වර්ෂයේ "හරිත රටක්" ජාතික ගෙවතු වගා විප්ලවය සහ ඒ ආශ්‍රිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා රු. මිලියන 201 ක් ලබා දී තිබූ නමුත් අනුමත කළ ප්‍රතිලාභීන්, තෝරා ගැනීමේ අයදුම්පත්, තෝරා ගැනීමේ නිර්ණායක, බෝග ප්‍රරෝහණ පරීක්ෂණ වාර්තාව, ග්‍රාමීය, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ක්‍රියාකාරකම්වල ප්‍රගති වාර්තා, වගාවෙන් අස්වැන්න හෝ ප්‍රතිඵල, වගාවන්ගෙන් අපේක්ෂික තක්සේරු මට්ටම සහ රජයේ ආයතන ඒකක 139 කට සපයනු ලැබූ කෘෂිකාර්මික උපකරණවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ආදිය මේ දක්වා විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස පිළිගෙන සහතික කිරීමට නොහැකි විය.

## යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාල

2019 වර්ෂයේ එකතුව රු. මිලියන 75 ක පිරිවැයකින් ඉටුකළ යුතුව තිබූ චුන්නාගම් මලාපවහන පිරිපහදු ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති කාර්යයට කොන්ත්‍රාත්කරුට මේ දක්වා එකතුව රු. මිලියන 9 ක් ගෙවා තිබූ නමුත් කාර්යය අවසන් කර නොතිබූ හෙයින් මලාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට ලක්කළ නොහැකිව තිබුණි.

## මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාල

සමාලෝචිත වර්ෂයේ ලෝක ආහාර වැඩසටහනට අනුව මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශයට අයත් ප්‍රතිලාභීන් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන ප්‍රතිලාභීන් 74 කට සැපයිය යුතුව තිබූ අශ්ව බල 2 ක් වූ වාරිමාර්ග උපකරණ වෙනුවට අශ්ව බල 1.5 ක් සහිත උපකරණ ලබාදීම නිසා ප්‍රතිලාභීන් උපරිම ධාරිතාවයෙන් වගා කටයුතු සිදුකළ නොහැකි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සිංහල ගම්මානයේ ජනතාවට පිරිපහදු ජලය ලබාදීම සඳහා පැයට ලීටර් 750 ක ජලය පිරිපහදු යන්ත්‍රයක් සහ රු. මිලියන 3 ක් ගෙවීම් කර මිලදී ගතයුතු වූවත්, පැයකට ලීටර් 500 ක ජල පිරිපහදු යන්ත්‍රයක් මිලදී ගෙන ලබාදීම හේතුවෙන් එම ගමේ ජනතාවට දිනකට අවශ්‍ය ප්‍රමාණයට පිරිපහදු කළ ජලය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

### වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල

රාජ්‍ය අමාත්‍යාංශයේ ග්‍රාමීය නිවාස පුනර්ජීවන වැඩසටහන යටතේ සලසා තිබූ ප්‍රතිපාදනවලින් පවුල් 2610 ක් සඳහා 2015 වර්ෂයේදී ඉදිකර ලබාදුන් නිවාසවලින් මේ දක්වා නිවාස 64 ක් පදිංචිය සඳහා භාවිතයට නොගෙන අත්හැර දමා තිබුණි.

2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව එකතුව රු. මිලියන 292 ක පිරිවැයකින් ඉදිකර තිබූ වවුනියා ආර්ථික මධ්‍යස්ථානය මේ දක්වා මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර නොතිබුණි. කෙසේ වෙතත්, එම මධ්‍යස්ථානය වෙනුවෙන් ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ ජල ගාස්තු ආදියෙහි එකතුව රු. මිලියන 6 ක් පසුගිය වර්ෂ 05 ක කාලයක සිට ගෙවා තිබුණි.

### කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනට අනුව 2021 වර්ෂයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 3ක පිරිවැයකින් ඉදිකළ වෙළෙඳපොල සංකීර්ණය අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට මහජනතාවට විවෘත නොකර පසුගිය වර්ෂයේ සිට අත්හැර දමා තිබුණි.

වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 55 ක පිරිවැයකින් ඉදිකළ සමූපකාර සමිති 03 ක් සහ ප්‍රජා මූලික සංවිධාන ආදියට භාරදුන් පොල් තෙල් නිෂ්පාදන මධ්‍යස්ථානය, වර්ග 04ක දේශීය නිෂ්පාදන කර්මාන්තයන් සඳහා වූ යන්ත්‍රෝපකරණ නියමිත අරමුණු සඳහා උපයෝජනය නොකර පසුගිය වර්ෂ 03 සිට 04 ක් දක්වා කාලයක් අත්හැර දමා තිබුණි.

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

වසර 160 ක ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියමින් රටේ නිශ්චල හා චංචල දේපලවලට අදාළ නෛතික ලේඛන ලියාපදිංචි කිරීම, ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ වැදගත් අවස්ථා වන විවාහ, උපත් සහ මරණ ලියාපදිංචි කිරීම, එම ලේඛන සංරක්ෂණය කිරීම සහ ඉල්ලීම මත ඒවායේ සහතික කරන ලද පිටපත් නිකුත් කිරීම සහ එමගින් ජනතාවට සිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය විම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. ලේඛන ලියාපදිංචිය හා හිමිකම් ලියාපදිංචිය දිවයින පුරා පිහිටුවා ඇති කලාප හාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල 07 ක්, දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල 14 ක්, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 ක්, මධ්‍යම ලේඛනාගාර 4 ක් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල 334 ක් මඟින් සිදුකරනු ලබයි.

2022 වර්ෂයේ දී ඉහත කාර්යභාරය ඉටු කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 2,622 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 2,527 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 95 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර හා රූපසටහන පහත දැක්වේ.

ඉහත සඳහන් කාර්යයභාරය ඉටු කිරීමේ දී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

### පත්ඉරු පරිලෝකනය කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් ඊ - ඉඩම් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබීම

ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු මාර්ගගතව සිදුකිරීමේ අරමුණින්, ඊ - ඉඩම් (e - Land) ව්‍යාපෘතියට අදාළ පත්ඉරු පරිලෝකනය කිරීමේ කටයුතු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 50 කින් 20 ක පමණක් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද, 2018 වර්ෂය දක්වා වූ කාලයට අදාළ පත්ඉරු 11,595,197 ක් පමණක් පරිලෝකනය කර තිබුණි. 2018 වසරෙන් පසු ලියාපදිංචි කරන ලද පත්ඉරු පරිලෝකනය කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුකර නොතිබුණි. ඒ අනුව කොළඹ හා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට පමණක් මෙම වැඩසටහන හඳුන්වා දී තිබුණි. වැඩසටහන වෙනුවෙන් ලබා දී තිබූ රු.මිලියන 99 ක යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් උපාංග ප්‍රධාන කාර්යාලයේ අංශ අතර හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල අතරේ බෙදාහැර තිබුණ ද, වැඩසටහන ක්‍රියාත්මක කර තිබූ කොළඹ සහ හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලද, මුල් අදියර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

### උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබීම

රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා 2010/2011 වර්ෂ වන විට නිර්මාණය කළ මෘදුකාංග පද්ධතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වාගෙන යාම සඳහා ලැප්ටොප් පරිගණක හා උපාංග 331 ක් බෙදාහැර තිබුණ ද, දිස්ත්‍රික්ක 14 කට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 44 ක 2021 වසරට අදාළව දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණේ ලියාපදිංචි කළ උපත් 53,739 කින් 01 ක් පමණක් හා ලියාපදිංචි කළ මරණ 23,467 කින් 04 ක් පමණක් විය. එසේම විවාහ පිළිබඳ තොරතුරු කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පවත්වාගෙන ගොස් නොතිබුණි.

# විදේශ කටයුතු අංශය

## විගණන නිරීක්ෂණ

- විදේශයන්හි මියගිය/ආපදාවන්ට ලක්වූ ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්දි මුදල් ගෙවීම
- අග්‍රිම නිරවුල් නොකිරීම
- වත්කම් කළමනාකරණය

# විදේශ කටයුතු අංශය

මිත්‍රශීලි හා නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක් මත ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කරමින් ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම් දරන රටක් බවට පත්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂා කිරීම, විදහා දැක්වීම, ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම අමාත්‍යාංශයේ මෙහෙවර වේ.

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල හැටක (60) ජාලයක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පරිපාලනය කරනු ලබන අතර, ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපාය මාර්ගික අධ්‍යයන පිළිබඳ ආයතනයද මෙම අමාත්‍යාංශය මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා 2022 වර්ෂයේදී රු.මිලියන 17,860ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 14,798ක් පමණක් උපයෝජනය කර තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම පිළිබඳව කරන ලද විගණන පරීක්ෂාවන්හිදී අනාවරණයවූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

**විදේශයන්හි මියගිය/ ආපදාවන්ට ලක්වූ ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්දි මුදල් ගෙවීම**

සෞදි අරාබියේ රැකියා නියුක්තිකයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වී වර්ෂ 10 ක් ගත වී තිබුණද කිසිදු වන්දි මුදලක් ගෙවා නොතිබුණි. කුවේට් රාජ්‍යයෙහි රැකියා නියුක්තව සිටි රැකියා ලාභිනියක 2012 ජනවාරි 29 දින මියගොස් තිබූ අතර ඇයගේ අභ්‍යන්තර අවයව ඉවත් කර තිබූ බව අනාවරණය වී තිබුණද මරණය සිදු වී වර්ෂ 10ක් ගත වුවද, කිසියම් වන්දි මුදලක් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට තානාපති කාර්යාල නිලධාරීන් අපොහොසත් වී තිබුණි. එමෙන්ම වර්ෂ 17ක පමණ කාලයක් කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවයේ යෙදී සිටි රැකියා ලාභිනියක 2011 ඔක්තෝබර් 17 වන දින සුරක්ෂාගාරය තුළ මරණයට පත්ව තිබුණි. මියගිය අය ජීවතුන් අතර සිටියදී හාම්පුතා විසින් වකුගඩුවක් ඉවත් කරගත් බවට චෝදනා ඇති බැවින් ඒ සඳහා අදාළ විමර්ශනයන් සිදුකර වාර්තාවක් ලබාගැනීමත් මරණ පරීක්ෂණ වාර්තාවක් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමටත් කටයුතු කරන ලෙස දන්වා තිබුණද මරණය සිදු වී වර්ෂ 11 ක් ගත වුවද එම වාර්තා ලබාගැනීමට තානාපති කාර්යාලය අසමත් වී තිබුණි. පෙදාහිදී 2011 වර්ෂයේදී මරණයට පත්වූ රැකියා නියුක්තිකයෙකු මරණයට හේතුව සියදිවි නසා ගැනීමක්ද නැතහොත් අනතුරකින් සිදු වූවක්ද යන්න

සනාථ කරගැනීම සඳහා පොලිස් වාර්තා ලබාගැනීමට ද කටයුතු කර නොතිබුණි.

### අග්‍රිම නිරවුල් නොකිරීම

සමාලෝචිත වර්ෂය අවසන් වනවිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් දෙකක පිළිවෙලින් රු.මිලියන 86 ක් හා රු.මිලියන 365 ක් වශයෙන් එකතුව රු.මිලියන 450 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. මින් රු.මිලියන 86 ක් වූ අග්‍රිම ශේෂයෙන් රු. මිලියන 56 ක ශේෂය විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දී තිබූ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 243 කින් සමන්විත වී තිබුණි. එක් ඇප තැන්පතුවක් හැර රු. මිලියන 56 ක් වූ නිවාස ඇප තැන්පතු 242 ක්ම මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු විය. අනෙත් අග්‍රිම ගිණුමේ නොපියවූ අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 365 න් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබාදෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.මිලියන 319 ක්වූ අතර ඉන් රු.මිලියන 63 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 108 කින් සමන්විත වී තිබුණි.

**අග්‍රිම ගිණුම 7002-0-0-35-13**




රූපසටහන 26 - අග්‍රිම ගිණුම 7002-0-0-35-13




රූපසටහන 27 - අග්‍රිම ගිණුම 7002-0-0-35-22

### වත්කම් කළමනාකරණය

1972 වර්ෂයේදී මිලදිගෙන තිබූ ස්විඩනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති නිල නිවාස ගොඩනැගිල්ල 2012 වර්ෂයේ සිටද, 1976 වර්ෂයේදි මිලදිගෙන තිබූ කෙන්යාවේ පිහිටි ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලය සතු නිල නිවාසය 2014 වර්ෂයේ සිටද භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර භාවිතයට නොගැනීම හේතුවෙන් නිල නිවාස කුලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 55.58ක් ගෙවා තිබුණි.

# වෙළඳ අංශය

## විගණන නිරීක්ෂණ

- වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
  - සහල් සංචිත පවත්වා ගෙන යාමට අදාළ අමාත්‍යාංශයේ අධික්ෂණ කාර්යය ඉටුකර නොතිබීම
  - මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති ආරම්භ කර නොතිබීම
  - මඩකලපුව රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම වී නොතිබීම
- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
  - ඉන්දියානු ආධාර බෙදාහැරීම
  - දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය ඉදි කිරීමේ ප්‍රමාදය
  - ආපනශාලා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතීම
- සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
  - සමූපකාර අතිරික්ත අරමුදලින් ලබා දී තිබූ ණය අය කරගෙන නොතිබීම
  - ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට ලබා දී තිබූ ණය අය වී නොතිබීම
- සමූපකාර සංවර්ධන අරමුදල
  - සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සණස යන සමිති වලට ලබා දී තිබූ ණය අය වී නොතිබීම
  - සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබූ ණය අය වී නොතිබීම
- ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව
  - සමූපකාර තොග වෙළඳ සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය නිෂ්කාර්යව පැවතීම
  - ගබඩා නවීකරණය කටයුතු අවසන් කර නොතිබීම
  - ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් නොවී දේපල බදු දීම නිසා බදු අදායම් අහිමි වීම
  - ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු නොකිරීම

- ලංකා සතොස සමාගම
  - ලංකා සතොස අලෙවිසැල් ජාලයෙහි කාර්යසාධනය
- ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
  - මිල්ලැව විශ්ව විද්‍යාල ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
  - විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසු සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
  - පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබීම
  - පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා වූ මෘදුකාංගය ක්‍රියාත්මක තත්වයේ නොතිබීම
  - වැටලීම් ඉලක්කයන් සපුරා නොතිබීම
- ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
  - අයිතිය පවරා නොගත් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා මුදල් වැය කිරීම
  - පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය දුර්වල වීම

# වෙළඳ අංශය

පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරගකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම පිණිස පිහිටුවා ඇති වෙළඳ , වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයත්, ඒ යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන 09 ක් ද විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොල හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම
- වෙළෙඳපොල තුළ භාණ්ඩ වල මිළ අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම
- විවෘත තරඟකාරී වෙළෙඳපොල පරිසරයක ලංකා සතොස සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මහපෙන්වීම සිදු කිරීම.
- වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.
- ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.
- ජාතික වශයෙන් අපනයනය දිරිමත් කිරීම සඳහා නෛතිකමය සහාය, උපදේශක දායකත්වය ලබාදීම.
- දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් සංවිධානයට මඟපෙන්වීම.
- අධ්‍යාපනයේදී, උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම
- ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම
-

- ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතීතන සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපොල අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.
- අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී මඟපෙන්වීම හා සම්බන්ධීකරණය.
- ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් ( NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් 2022 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 10,064 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 9,008ක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 28 හි දැක්වේ.




| | වාණිජ දෙපාර්තමේන්තුව | වෙළඳ අමාත්‍යාංශය | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | සමූපකාර සේවක කොමිෂන් සභාව | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ ප්‍රතිපාදනය | 206 | 8,414 | 94 | 452 | 170 | 48 | 22 | 62 | 542 | 19 | 35 | 10,064 |
| මුළු වියදම | 104 | 7,829 | 91 | 101 | 169 | 47 | 19 | 58 | 542 | 19 | 29 | 9,008 |
| ඉතිරිය | 102 | 585 | 3 | 351 | 1 | 1 | 3 | 4 | 0 | 0 | 6 | 1056 |

රූපසටහන 28 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාර ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන වලදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

### සහල් සංචිත පවත්වා ගෙන යාමට අදාළ අමාත්‍යාංශයේ අධික්ෂණ කාර්ය ඉටුකර නොතිබීම

අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉටුකර ගැනීම සඳහා සැලසුම් කල ප්‍රධාන කාර්යයක් වූ ශ්‍රී ලංකාව තුල මෙට්‍රික් ටොන් 8,000 ක ආරක්ෂක සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 50 ක් හා පෙර වර්ෂයේ රු. මිලියන 200 ක් ප්‍රතිපාදන ලෙස ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද මේ සම්බන්ධ කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයෙත් ඉකුත් වර්ෂයෙත් ඉටු කර නොතිබුණි. තවද මේ සම්බන්ධව අමාත්‍යාංශයේ අධික්ෂණ කාර්යයද නිසි ලෙස ඉටු කර නොතිබුණි.

### මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති ආරම්භ කර නොතිබීම

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය, නුවරඑළිය පෙව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ විදේශ භාෂා විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම යන ව්‍යාපෘති 3 ආරම්භ කිරීම සිදු කල යුතු බවට අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු නමුත් ව්‍යාපෘතියට අදාල ඉඩම් පවරා නොදීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම මත මහපොළ භාරකාර මණ්ඩලයේ තීරණය ප්‍රකාරව මෙම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. තවද මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය සඳහා අදාල මූලික කටයුතු වෙනුවෙන් රු. මිලියන 2 ක මුදලක්ද මේ වන විට වැය කර තිබුණි.

### මඩකලපුව රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම වී නොතිබීම

සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (සමාගම) විසින් මඩකලපුවේ ඉදිකරමින් පවතින රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 48 ක් වූ අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 23 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 06 දින වන විට ඉදිකිරීම නිමවිය යුතු වුවත් 2023 මැයි වන විටත් එම කටයුතු සම්පූර්ණ වී නොතිබුණි.

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ඉන්දියානු ආධාර බෙදාහැරීම

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ මානුෂීය අධාර ලෙස 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පිරිනමා තිබූ සහල් මෙට්‍රික් ටොන් 40,000 ක් කිරිපිටි මෙට්‍රික් ටොන් 500 ක් හා ඖෂධ මෙට්‍රික් ටොන් 50 ක් ලබාදීමේ වැඩසටහන අධියර 03 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මෙම ආධාර බෙදා හැරීම සඳහා වෙළඳ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයෙන් රු.මිලියන 481 ක

ප්‍රතිපාදනයක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. මෙම ඉන්දියානු ආධාර ගබඩා කිරීම සඳහා මරදාන දුම්රිය ගබඩා දෙකෙහිම විශාල ඉඩ ප්‍රමාණයක් තිබියදී සහල් තොග මරදාන ගබඩාවේ රඳවා නොගෙන ඔරුගොඩවත්ත ගබඩාවට මාරු කිරීම නිසා නැවතත් මරදාන ගබඩාවට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2022 ජූලි 04 දින සිට ජූලි 18 දින දක්වා කාලය තුල රු. මිලියන 2 ක නිෂ්කාර්ය වියදමක් සිදු කර තිබුණි.

### දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය ඉදි කිරීමේ ප්‍රමාදය

ගිවිසුම් වලට එළඹ තිබූ දඹුල්ල උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව නිමකල යුතු දිනයෙන් වර්ෂ 03 ක් ඉක්මවා ගිය ද අදාල ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කර නොතිබුණි. දේශීය අරමුදල් සහ විදේශ ප්‍රදාන යටතේ වූ රු. මිලියන 205 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයද විදේශ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් එනම් රු. මිලියන 39 ක් ද ඉතිරි වී තිබුණි.

### ආපනශාලා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතීම

ආපනශාලා ගොඩනැඟිල්ල මාසික බදු කුලියකට බදු දී තිබූ අතර ඒ වෙනුවෙන් වසර 3 සඳහා රු. මිලියන 5.12 ක කුලී මුදලක් ලැබිය යුතුව තිබුණි 2020 දෙසැම්බර් 01 සිට 2022 නොවැම්බර් 30 දක්වා පමණක් රු. මිලියන 3 ක ඉන්වොයිස් නිකුත් කර තිබූ අතර එයින් ද රු. මිලියන 2 ක් හිඟ කුලී ලෙස පැවතුණු අතර ගිවිසුම උල්ලංඝණය කිරීම හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

## සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### සමූපකාර අතිරික්ත අරමුදලින් ලබා දී තිබූ ණය අය කරගෙන නොතිබීම

අක්‍රිය ණය උපලේඛණය අනුව 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුල අරමුදලින් සමූපකාර සමිති 69 කට ලබා දී තිබුණු රු. මිලියන 129 ක ණය මුදලින් 2022 ජනවාරි 01 දිනට රු. මිලියන 89 ක ශේෂයක් අයවීමට පැවති අතර 2022 වර්ෂයේ ජනවාරි 01 දිනට රු. මිලියන 507 ක් වූ ලැබිය යුතු සක්‍රීය ණය ශේෂයෙන් 2022 වර්ෂයේදී අය වී තිබුණේ රු. මිලියන 25 ක් පමණි. මෙම ණය ශේෂය තුල ඇතුලත් වර්ෂ 07 කට පෙර විවිධ සමූපකාර සමිති සහ සමාගම් වලට ලබා දී තිබූ රු. මිලියන 125 ක ණය ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට 2022 වර්ෂය අවසන් වන විට ද කටයුතු කර නොතිබුණි. 2022 ජනවාරි 01 දිනට මෙම ණය ශේෂ මත ලැබිය යුතු රු. මිලියන 217 ක ණය පොළියක් අයවීමට පැවතියද 2022 වර්ෂය තුල ලැබී තිබුණේ රු. මිලියන 10 ක් පමණි. තවද 2010, 2012 හා 2013 වර්ෂ වල දී ලබා දී තිබූ ණය මුදල් වලට අදාල වාර්ෂික ණය පොලී හා ණය වාරික ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කළමනාකරණය කටයුතු නොකිරීම නිසා 2022 වර්ෂයේදී රු. මිලියන 49 ක පොලී මුදලක් ලාභයෙන් කපා හැර තිබුණි.

### ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට ලබා දී තිබූ ණය අය වී නොතිබීම

ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට 2013 මැයි 08 දින ලබා දී තිබූ රු. මිලියන 75 ක ණය මුදලින් 2022 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 62 ක මුදලක් අයවීමට පැවති අතර ඒ සඳහා අයවිය යුතු පොලිය රු. මිලියන 76 ක් විය. වසර 10 ක් ගත වී තිබුණ ද ණය මුදල හා පොලි වල එකතුව රු. මිලියන 138 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### සමූපකාර සංවර්ධන අරමුදල

### සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සඟස යන සමිති වලට ලබා දී තිබූ ණය අය වී නොතිබීම

2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු. මිලියන 119 ක් වූ අතර, ඉන් රු. මිලියන 61 ක් හා රු. මිලියන 17 ක් වශයෙන් එකතුව රු. මිලියන 79 ක් එනම් සියයට 66ක ඉහළ ප්‍රතිශතයක් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සඟස යන සමිති දෙකෙන් අයවිය යුතුව පැවතුණි. ලැබිය යුතු දායක මුදල් ශේෂය තුල සමිති 12 කින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දායක මුදලක් ලැබී නොතිබුණු අතර එම ශේෂය රු. මිලියන 5 ක් විය.

### සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබූ ණය අය වී නොතිබීම

සමූපකාර සංවර්ධන අරමුදලින් 2011 වර්ෂයේදී රු.මිලියන 153 ක් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබුණි. එම මුදලින් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92 ක් විය.

### ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව

වෙළෙඳ ණයගැති ශේෂයෙන් 2022 මාර්තු 31 දිනට අය වී නොපැවතුණු ශේෂය රු.මිලියන 995 ක් විය. එම ශේෂයේ වර්ෂ 2,3,4,5 සහ වර්ෂ 5ට වැඩි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 2, රු.මිලියන 7, රු.මිලියන 16, රු.මිලියන 11 ක් සහ රු.මිලියන 138 ක් වී තිබුණි. තවද පෙර විකුණුම් සඳහා මුදල් අය වී නොතිබුණු ණයගැතියන් වෙතද නැවත නැවතත් ණයට විකුණුම් සිදුකර තිබුණි.

### සමූපකාර තොග වෙළඳ සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය නිශ්කාර්යව පැවතීම

සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය වසර 18 කට ආසන්න කාලයක සිට ඌණ උපයෝජිතව පවතින අතර සහල් සංකීර්ණ දෙකෙහිම පැයකට සහල් කි.ග්‍රෑ 2000 ක් බැගින් සැකසීමේ ධාරිතාවයක් පවතියි. කෙසේ වුවද ,2022 වර්ෂයේදී අදාල සහල් සංකීර්ණ දෙකෙහි කිසිදු සහල් නිශ්පාදනයක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුණු අතර සහල් සැකසීමේ සංකීර්ණ දෙකෙහි 2022 වර්ෂයේදී 03 සිට 12 දක්වා

සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු අතර වැටුප් , අතිකාල සහ දීමනා ඇතුළු සේවක පිරිවැය රු. මිලියන 11 ක් වී තිබුණි.

### ගබඩා නවීකරණය කටයුතු අවසන් කර නොතිබීම

අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂයේදී සංස්ථාව සතු ගබඩා 13 ක් නවීකරණය කිරීම ආරම්භකර තිබුණු අතර නවීකරණය කිරීම සඳහා 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් රු. මිලියන 83 ක් වැයකර තිබුණි. අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 62 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි එම සියළුම නවීකරණ කටයුතු 2020 වර්ෂය තුල අවසන් කල යුතු වුවද 2022 වර්ෂය වන විටත් ගබඩා 09 ක පමණක් නවීකරණ කටයුතු අවසන් කර තිබුණි.

### ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් නොවී දේපල බදු දීම නිසා බදු අදායම් අහිමි වීම

සංස්ථාව විසින් වාර්ෂික බදු කුලී ආදායම රු. මිලියන 86 ක් වූ වර්ග අඩි 71,464 ක දේපල 2022 වර්ෂයේදී ලිඛිත ගිවිසුම් වලට එළඹීමෙන් තොරව බදු පදනමින් ලබා දී තිබුණි. මෙලෙස ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් නොවීම හේතුවෙන් ලංකා සතොස සමාගම විසින් ඉන්වොයිසියේ සඳහන් රු.මිලියන 142 ක් වූ බදු කුලී වටිනාකමට වඩා අඩුවෙන් ගෙවීම් කර තිබුණෙන් 2022 වර්ෂයේදී අහිමි වූ ආදායම රු. මිලියන 29.3 ක් වී තිබුණි.

### ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු නොකිරීම

2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 2,152 ක් සහ රු. මිලියන 94 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 89 ක් සහ රු. මිලියන 967 ක් වී තිබුණි.

## ලංකා සතොස සමාගම

### ලංකා සතොස අලෙවිසැල් ජාලයෙහි කාර්යසාධනය

2022 වර්ෂයේ සමාගමෙහි සමස්ථ අලෙවිසැල්වල ලාභඅලාභ තත්වය සලකා බැලීමේදී අලෙවිසැල් 452 ක් අතුරින් අලෙවිසැල් 193 ක් එනම් සියයට 43ක් අලාභ ලබන බව නිරීක්ෂණය විය. එම අලෙවිසැල්වල රු.මිලියන 0.005 සිට රු. මිලියන 5.25 දක්වා පරාසයක අලාභ ලබා තිබූ අතර එම මුළු අලාභ වටිනාකම රු.මිලියන 288 ක් වී තිබුණි. අලෙවිසැල්වල සාමාන්‍ය දළ ලාභ අනුපාතය සියයට 12ක් වැනි අවම මට්ටමක පැවතීම හා දෛනික විකුණුම් රු. මිලියන 0.2 ක් වැනි අවම මට්ටමක පැවතීම හා ඉහළ පොදු කාර්ය වියදමක් දැරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

### මිල්ලෑව විශ්ව විද්‍යාල ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

මිල්ලෑව විශ්ව විද්‍යාල ගම්මාන ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම හා ආයෝජකයින් සමඟ ගිවිසුම් ගත වීම 2022 වර්ෂය අවසාන වන විට නිම විය යුතුව තිබූ නමුත්, එසේ සිදු කර නොතිබූ අතර, 2021 දෙසැම්බර් 30 දින රු. මිලියන 340 ක් වැය කර 99 අවුරුදු බදු පදනම යටතේ ලබා ගත් ඉඩමේ භුක්තිය පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ගැනීමට 2023 ජුනි 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

### විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසු සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම

විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා හා ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසු සියළුම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයක් පිරිනැමීම ඉලක්ක කර තිබුණ ද දෙමාපියන් විසින් උපයනු ලබන ලබන වාර්ෂික ආදායම රු. මිලියන 0.5 ට අඩු නිර්ණායකය පදනම් කර ගැනීම හේතුවෙන් 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාලව මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීමට විශ්ව විද්‍යාල කොමිෂන් සභාව මඟින් සුදුසුකම් ලද සිසුන් 26,000 ක් අතුරින් අරමුදලේ භාරකාර මණ්ඩලය මඟින් සිසුන් 16,000 කට පමණක් එනම්, සියයට 61.5 කට පමණක් මහපොළ ශිෂ්‍යත්ව පිරිනමා තිබුණි.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබීම

අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ වගන්ති ප්‍රකාර පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වී. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකයකට සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල වන ලෙස භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශනය කල හැකිය. කෙසේ වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුල දිස්ත්‍රික්කවලට ලද පැමිණිලි වලින් පැමිණිලි 284 ක් හා ප්‍රධාන කාර්යාලයට ලද පැමිණිලි වලින් පැමිණිලි 1078 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි.

### පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා වූ මෘදුකාංගය ක්‍රියාත්මක තත්වයේ නොතිබීම

පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 2015 වර්ෂයේදී 1977 දරන පාරිභෝගික විමසුම් සේවා (1977 Interactive Mobile Service) මෘදුකාංගය වෙනුවෙන් අධිකාරිය විසින් රු. මිලියන 5 ක් සහ මෙම ව්‍යාපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා රු. මිලියන 4 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, නොයෙකුත් දුර්වලතා හේතුවෙන්

ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු වී නොතිබුණි.

### වැටලීම් ඉලක්කයන් සපුරා නොතිබීම

2022 වර්ෂය තුල දිවයින පුරා වැටලීම් 23,280 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණු අතර, එයින් වැටලීම් 13,980 ක් එනම් සියයට 60 ක් සිදුකර තිබුණි. කොළඹ, නුවර, කලුතර,ගාල්ල, බදුල්ල, නුවරඑලිය යන දිස්ත්‍රික්ක 06හි ඉලක්කගත වැටලීම් ප්‍රමාණයෙන් සියයට 50 කට අඩු වැටලීම් ප්‍රමාණයක් සිදුකර තිබුණි.

### ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය අයිතිය පවරා නොගත් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා මුදල් වැය කිරීම

ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 22 ක මුදලක් වියදම් කර තිබියදී ඒ ආශ්‍රිත ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල 2022 වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට නොහැකිවී තිබුණි.

### පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය දුර්වල වීම

සමාලෝචිත වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා 431 දෙනෙකු ඉල්ලුම් කර තිබූ අතර 2023 අප්‍රේල් 30 දින වන විට ඉන් බලපත්‍ර නිකුත් කර තිබුණේ 5 දෙනෙකු සඳහා පමණි. එමෙන්ම වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ලද ඉල්ලුම්පත්‍ර 9,465 කින් ඉල්ලුම්පත්‍ර 531 ක් එනම් සියයට 5.6 ක් ප්‍රාථමික හා ද්විතීක පරීක්ෂාවට ලක් කිරීම පමණක් සිදු කර තිබුණි.

# ආපදා කලමනාකරණ අංශය

## විගණන නිරීක්ෂණ

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
  - ප්‍රතිපාදන උපයෝජනය කිරීම
  - ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා නිශ්කාර්යව මුදල් වැය කිරීම
  - ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති නිසි පරිදි උපයෝජනයට ගෙන නොතිබීම
  - රේඩාර් පද්ධති කාලගුණ මධ්‍යස්ථානවල ස්ථාපනය නොකිරීම
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන
  - අනුමැතියකින් තොරව දිරිදීමනා ගෙවීම
  - නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර නොගැනීම
  - ස්වයංක්‍රීය වර්ෂාමාන අක්‍රීයව පැවතීම
  - දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම
  - නායයෑම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් සඳහා වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය
  - සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා කුළුණු අක්‍රියව පැවතීම
  - ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් සකස් කර නොතිබීම
  - වන්දි ගෙවීම් සිදුකර නොතිබීම
  - ව්‍යාපෘතියක් අසාර්ථකව සිදු කළ කොන්ත්‍රාත්කරු නැවත කොන්ත්‍රාත් බාරදීම

# ආපදා කලමනාකරණ අංශය

රටක කාලගුණ හා දේශගුණ තත්ත්ව එම රටේ ජනතාවගේ සෞඛ්‍යය තත්වය සහ ජීවන තත්වය උසස් කිරීම සඳහා මෙන්ම රටේ නිෂ්පාදනයේ විචලනයන් කෙරෙහිද ප්‍රබල වශයෙන් බලපෑම් සිදු කරනු ලබයි. එමෙන්ම කාලගුණ හා දේශගුණ තත්ත්වවල විචලනයන් කල්තියා හඳුනා ගැනීම තුලින් ඒ සඳහා පැහැදිලි සැලසුම් පිළියෙළ කිරීම තුලින් අනාගතේ සිදුවීමට නියමිත ප්‍රබල ව්‍යසනයන්ගෙන් රට හා එහි ජීවත්වන වැසියන් මුදවා ගැනීමට කටයුතු කල හැකිය. මේ අනුව බලන කල රටක ආපදා කලමනාකරණ අංශය රටේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් ලබා දෙයි.

රටේ ස්වභාවික ආපදා අවදානම් කල්තබා හඳුනා ගැනීම, ආපදා වළක්වා ගැනීම, හානි අවම කිරීම හා හානිවුවන් නගා සිටුවීම කාර්යක්ෂම කිරීම සඳහා ආපදා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කරමින් ආයතනික ව්‍යුහයන් ශක්තිමත් කිරීම ආපදා තත්වයන් පිලිබඳ නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන තාක්ෂණය සහ දැනුමෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සවිමත් කිරීම. ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක්වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියළු තොරතුරු ඇතුලත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම යන අරමුණු සහිතව ආපදා කලමනාකරණ අංශය ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව එම අංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 04ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

ඉහත සඳහන් ආයතන විසින් සිය කාර්යභාරයන් ඉටුකිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂන සම්පිණ්ඩනය කර පහත දැක්වේ.

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ප්‍රතිපාදන උපයෝජනය කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 792 ක් වූ අතර මුළු වියදම රු.මිලියන 369 ක් වූ බැවින් ඉතිරිය රු.මිලියන 423 ක් විය.ඒ අනුව, සියයට 53 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මූලධන වැය විෂයයන් 03 ක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 378 ක මුළු ප්‍රතිපාදනය සහ ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක සියයට 39 සිට 91 දක්වා පරාසයකද ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා නිශ්කාර්යව මුදල් වැය කිරීම

දෙපාර්තමේන්තුව විසින් ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 403 ක් වැය කර වර්ෂ 13 ක් ගතවී තිබුනද, එම කාර්යය මේ දක්වා නිමකර නොතිබුණි. අදාළ කාර්යය සඳහා රැගෙනවිත් තිබුණ උපකරණවලින් රු.මිලියන 9 ක් වටිනා

උපකරණ අස්ථානගතවී තිබූ අතර මෙම අස්ථානගතවීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එකී නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති නිසි පරිදි උපයෝජනයට ගෙන නොතිබීම

ජපන් ආධාර යටතේ (JICA) 2008 වර්ෂයේදී ලැබුණ රු. මිලියන 570 ක් වටිනා ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 මගින්, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, වර්ෂාපතනය, සුළඟේ වේගය හා දිශාව, පීඩනය, සූර්ය විකිරණ ප්‍රමාණය යන පරාමිතීන් මනිනු ලැබේ. මෙම උපකරණ පද්ධති අමතර කොටස් සඳහා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. මිලියන 123 ක වියදම් දරා තිබූ අතර ස්ථාපනයට අදාල මිලදීගැනීම් සඳහා විධිමත් අනුමැතීන් සහිත ලිපිගොනු නිසි අයුරින් නඩත්තු කර ප්‍රසම්පාදන අංශයේ පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම උපකරණ පද්ධතිවලින් 20 ක් කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍ර තුලද, ඉතිරි 16 තේ පර්යේෂණ ආයතනය වැනි වෙනත් ආයතන පරිශ්‍ර තුලද ස්ථාපිත කර තිබුණ අතර පද්ධති 02ක් සවිකර නොතිබුණි.

### රේඩාර් පද්ධති කාලගුණ මධ්‍යස්ථානවල ස්ථාපනය නොකිරීම

ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ මධ්‍යස්ථාන භූමිවල ස්ථාපනය කිරීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 514 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒ සඳහා රු.370,161 ක් පමණක් වැයකර තිබුණි. ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවිය යුතු වුවද, ගිවිසුම්ගත වී වසර 06 ක් ගත වී ඇතත් රේඩාර් පද්ධති සවිකර නොතිබුනි.

### ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන අනුමැතියකින් තොරව දිරිදීමනා ගෙවීම

2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය හා 1994 ජූනි 14 දිනැති අංක 05 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2022 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සංවිධානය විසින් රු. මිලියන 9 ක් දිරිදීමනා ගෙවා තිබුණි.

### නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර නොගැනීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 30 ක් පමණ ගතවී ඇතත් එයට නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට සංවිධානයට නොහැකි වී තිබුණි.

### ස්වයංක්‍රීය වර්ෂාමාන අක්‍රීයව පැවතීම

නායයෑම් අනතුරු ඇඟවීම් නිකුත්කිරීම සඳහා 2022 සැප්තැම්බර් 15 දිනට අවදානම් සහිත දිස්ත්‍රික් 14 ක ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් ස්ථාපිත කර තිබුණු අතර ඉන් 72 ක් අක්‍රීයව පැවතුණි. ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිවල දත්ත සම්ප්‍රේෂණයට සිදුවන අවහිරතාවන් හේතුවෙන් පූර්ව නායයෑම් අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කිරීම කෙරෙහි බලපෑම් ඇති කර තිබුණි.

### දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම

රත්නපුර හා කළුතර දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීමට 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 143 ක් ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 60.52 ක් උපයෝජනයකින් තොරව පැවතුණි. රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම් නිම කර තිබුණ අතර කළුතර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

### නායයෑම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් සඳහා වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය

දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පිහිටුවා ඇති ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන කාර්යාල වෙත නායයෑම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වාර්තා නිකුත් කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ප්‍රමාදයක් පැවතුණි. විස්තර වගුව 18 හි දැක්වේ.

| වර්ෂය | ජනවාරි 01 දිනට පැවති ඉල්ලුම්පත් ප්‍රමාණය | වර්ෂය තුළ ලද ඉල්ලුම්පත් ප්‍රමාණය | සහතිකපත් නිකුත් කළ ප්‍රමාණය | පරීක්ෂණ අනවශ්‍ය ඉල්ලුම්පත් ප්‍රමාණය | දෙසැම්බර් 31 දිනට ඉතිරි ඉල්ලුම්පත් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| **2020** | 2773 | 5098 | 3717 | 0 | 4154 |
| **2021** | 4154 | 7607 | 5783 | 1208 | 4770 |
| **2022** | 4770 | 4231 | 5260 | 2397 | 1344 |

වගුව 18 - නායයෑම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම්පත් තොරතුරු

### සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා කුළුණු අක්‍රියව පැවතීම

පිරිවැය රු.මිලියන 32 ක් වැයකර ඉදිකර තිබූ මුලතිව් දිස්ත්‍රික්කයේ ස්ථාන 05 ක පිහිටි සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා කුළුණු අක්‍රිය තත්ත්වයක පැවතුණි.

### ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් සකස් කර නොතිබීම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 04 වන ඡේදය ප්‍රකාරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කර්තව්‍යයක් ලෙස ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් සුදානම් කිරීම හා සකස් කිරීමත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනිමත් දක්වා තිබුණි. නමුත් වර්ෂය අවසාන වන විටත් ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සඳහා අමාත්‍ය

මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මද සකස් කර නොතිබුණි.

### වන්දි ගෙවීම් සිදුකර නොතිබීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 28 ක හදිසි ආපදා හේතුවෙන් නිවාස හානිවීම් 441ක් 2022 වර්ෂයේදී වාර්තා වී තිබූ අතර නිවාස හානිවීම් 192 ක් සඳහා 2023 ජූනි 30 දින වනවිටත් වන්දි ගෙවීම් සිදුකර නොතිබුණි.

### ව්‍යාපෘතියක් අසාර්ථකව සිදු කළ කොන්ත්‍රාත්කරු නැවත කොන්ත්‍රාත් බාරදීම

මහනුවර අකුරණ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථකව සිදු කළ කොන්ත්‍රාත්කරුටම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ හා නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පැවරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියද අතරමග නවතා දැමීම නිසා ව්‍යාපෘතියෙන් ප්‍රයෝජනයක් ගත නොහැකි වූයෙන් එතෙක් වැය කර තිබූ රු.මිලියන 19 ක මුදලක් නිශ්ක්‍රියව වැය වී තිබූ අතර ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගත නොහැකි වී තිබුණි.

# ජනමාධ්‍ය අංශය

## විගණන නිරීක්ෂණ

- ජනමාධ්‍ය අමාත්‍යාංශය
    - භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම
    - විද්‍යුත් මාධ්‍ය සඳහා වූ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේද සකස් නොකිරීම
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
    - පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් සඳහා කාර්යය ඉටු කිරීමට පෙර ගෙවීම් සිදුකර තිබීම
    - සංස්ථාව සතු අරමුදල් විචක්ශනකාරී ලෙස උපයෝජනය නොකිරීම
    - ප්‍රමාණවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර දේපල බදු දීම
    - සංස්ථාවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදු කිරීමට සිදු වීම
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
    - සංස්ථාවේ මුල්‍ය තත්වය පිරිහීම
    - ආදායම් බදු ගෙවීම පැහැර හැරීම
- සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
    - මුල්‍ය තත්වය පිරිහීම
- සැලසිනේ රූපවාහිනී ආයතනය
    - ණය අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම
- එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
    - මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් සාමාන්‍ය විනය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
    - පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය නොකිරීම
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
    - නිසි කලට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා අලාභ සිදු වීම
    - ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමයන්ට පටහනිව මුද්‍රණ නිළධාරින්ට ගෙවීම් සිදු කිරීම
- ශ්‍රී ලංකා පදනම් ආයතනය
    - ආයතනයේ ස්ථීර කථිකාචාර්යවරුගෙන් උපරිම සේවාවක් ලබා ගැනීමට කටයුතු නොකිරීම
    - මූල්‍ය පරිපාලනය දුර්වල වීම
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
    - පාලක මණ්ඩලය සම්පූර්ණ කර නොතිබීම
- තැපැල් දෙපාර්තමේන්තුව
    - වාහන භෞතිකව ආයතනය තුල නොපැවතීම
    - වත්කම් පරිපාලන දුර්වලතා
    - භිග ආදායම් අයකර නොගැනීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
    - නිශ්කාර්යව වන්දි හා බේරුම්කරණ වියදම් ගෙවීමට සිදු වී තිබීම
    - කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය

# ජනමාධ්‍ය අංශය



භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම" සඳහා නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම යන විෂය පථයකින් සමන්විත වූ ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතන පහළොවකින් පහත සඳහන් කාර්යභාරය හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කළයුතුව පැවතුණි.

- ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිළිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට විනිවිදභාවයෙන් යුත් ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වා දීම වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසිවලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කරමින් ඩිජිටල් තැපැල් ආශ්‍රිත සේවාවන් සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ වෘත්තිමය දැනුම හා අවබෝධය ලබා දීම සඳහා සමාජ අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන වෘත්තීමය කුසලතා ප්‍රවර්ධන අවස්ථාවන් ඇති කිරීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු තුනක් වෙත එකතුව රු.මිලියන 21,262 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 20,302 ක් උපයෝජනය කර තිබුණි.

ඉහත සඳහන් කාර්යභාරය හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වල සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණ තුලින් අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

### භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම

ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කළද ක්‍රියාත්මක නොවීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි යාවත්කාලීන කරන ලද අතර, තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ තුළින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, 2023 ජූනි 30 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. 2022 වර්ෂය සඳහා රු.මිලියන 120 ක් ලැබී තිබුණ ද, උපයෝජනය කර තිබුණේ රු.මිලියන 9 කි. ඒ අනුව රු.මිලියන 111 ක් ඌන උපයෝජිතව පැවතුණි.

### විද්‍යුත් මාධ්‍ය සඳහා වූ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේද සකස් නොකිරීම

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උපරිමයෙන් සුරක්ෂිත කරමින් ප්‍රශස්ත මාධ්‍යකරණයක් තහවුරු කිරීමේ අරමුණ සහිතව විද්‍යුත් මාධ්‍ය සඳහා විකාශන අධිකාරි පනත විගණිත දින දක්වාම සකස් කර නොතිබුණි. එමෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය කිරීමේ ක්‍රමවේදයද නිමකර නොතිබුණි. තවද ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍රයන්හි ඒකමතිකභාවයක් ඇති කිරීමට පොදු ආකෘතියක් විගණිත දින දක්වාම හඳුන්වා දී නොතිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් සඳහා කාර්යය ඉටු කිරීමට පෙර ගෙවීම් සිදුකර තිබීම

පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් බඳවා ගැනීමට අදාළ ගෙවීම් සිදුකළ යුත්තේ අදාළ කාර්යය ඉටු කළ පසුව අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත වුවද සංස්ථාව විසින් පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් 07 දෙනෙකුට 2022 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා පමණක් රු.මිලියන 2 ක මුදලක් කාර්යය ඉටු කිරීමට පෙර මාස් පතා ගෙවීම් සිදුකර තිබුණි.

### සංස්ථාව සතු අරමුදල් විචක්ෂණකාරී ලෙස උපයෝජනය නොකිරීම

සංස්ථාව සතු අරමුදල් රු. මිලියන 56.2 ක් සියයට 2.5ට වඩා අඩු පොළී අනුපාතයක් යටතේ තැන්පත් කර තිබියදී 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 52 ක් වූ බැංකු අයිරා වක් සඳහා රු. මිලියන 5 ක් පොලී ගෙවා තිබුණි . තවද 2012 වර්ෂයට පෙර සිට පෞද්ගලික බැංකුවක වූ ජංගම ගිණුමක රු.මිලියන 18 ක් නිශ්ක්‍රීයව තබා ගෙන තිබුණි.

### ප්‍රමාණවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර දේපල බදු දීම

සංස්ථාවේ ඉදිරිපස නව ගොඩනැගිල්ල 2022 සැප්තැම්බර් 01වන දින බදු ඔප්පුවකින් සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් සඳහා වසර 20ක කාලසීමාවක් සඳහා රු. මිලියන 1,014 ක වටිනාකමට බදු දී තිබුණි. මේ සඳහා එක් පුවත්පතක පමණක් දැන්වීම් පලකර තිබුණි.

දැනටමත් රු.මි.3 ක ආරම්භක කුලියකට ලබාදී තිබූ මෙම ගොඩනැගිල්ල හා රථගාල සඳහා ලබාගෙන තිබූ තක්සේරු වාර්තාවේ ගොඩනැගිල්ලේ හා රථගාලේ වර්ග ප්‍රමාණය අඩුවෙන් සඳහන් කර ගිවිසුමට එළඹ තිබුණි.

### සංස්ථාවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් සිදු කිරීමට සිදු වීම

සංස්ථාව 2012 වර්ෂයෙන් පසු භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම නිසා එම අලාභ අවම කර ගැනීමට අවස්ථාව ලැබී තිබුණි. 2021 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර රු. මිලියන 334 ක් වූ අලාභය රු. මිලියන 345 ක ප්‍රතිපාදන ලැබීම නිසා රු. මිලියන 12 ක ලාභයක් බවට පත් වී තිබූ අතර 2022 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම අලාභය රු. මිලියන 236.4 ක් දක්වා වැඩි වී තිබුණි.

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

### සංස්ථාවේ මූල්‍ය තත්වය පිරිහීම

සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ශුද්ධ වත්කම් රු. මිලියන 351 ක සෘණ අගයක් දක්වා පිරිහී ඇති අතර 2022 ජනවාරි 01 දිනට රු. මිලියන 572 ක් වූ සමුච්චිත අරමුදල් සෘණ ශේෂය සමාලෝචිත වර්ෂයේ අලාභය රු. මිලියන 538 ක් සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම් සිදුකිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 1,112 ක සෘණ වටිනාකමක් දක්වා පිරිහී තිබුණි. 2020 වර්ෂයේ රු. මිලියන 69 ක්වූ සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්වය 2021 වර්ෂයේ දී රු. මිලියන 254 ක සෘණ කාරක ප්‍රාග්ධන තත්වයක් දක්වා පහත වැටී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දී සෘණ කාරක ප්‍රාග්ධන තත්වය රු. මිලියන 568 කින් තවදුරටත් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් දිනට ජංගම ගිණුම් දෙකකට අදාලව බැංකු අයිරාව පිළිවෙළින් රු. මිලියන 231 ක් සහ රු. මිලියන 114 ක් වූ අතර ඒ සඳහා රු. මිලියන 23 ක අයිරා පොලී සංස්ථාව විසින් ගෙවා තිබුණි.එසේම එක් ජංගම ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ මාස 08 ක් අනුමත අයිරා සීමාව වරින් වර ඉක්මවා තිබුණි.

### ආදායම් බදු ගෙවීම පැහැර හැරීම

2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු බැඳියාව රු. මිලියන 314 ක් වූ අතර මින් රු. මිලියන 45 ක් 2022 වර්ෂයේ ගෙවිය යුතු එකතු කල අගය මත බදු වගකීම වේ.

## සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

### මූල්‍ය තත්වය පිරිහීම

2015 වර්ෂයේ දී රු.මිලියන 3,199 ක් වූ සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය 2022 වර්ෂයේදී රු. මිලියන 654 දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. මාධ්‍ය ජාලයේ 2016 වර්ෂයේ රු. මිලියන 107 ක් වූ අලාභය 2022 වර්ෂය අවසානය වන විට රු.මිලියන 362 ක් දක්වා වර්ධනය වී තිබුණි. තවද එම කාලය තුළ මාධ්‍ය ජාලය අඛණ්ඩව

අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනී සේවයේ අලාභය රු.මිලියන 285 ක් වූ අතර ඒ යටතේ පවතින වසන්තම් ටීවී, අයිටීඑන් එෆ්එම් සහ වසන්තම් එෆ්එම් හි අලාභයන් පිළිවෙලින් රු. මිලියන 27 , රු. මිලියන 45 ක් සහ රු. මිලියන 5 ක් විය. මාධ්‍ය ජාලයේ 2020 වර්ෂයේ රු.මිලියන 620.8 ක් වූ කාරක ප්‍රාග්ධනය 2021 වර්ෂයේ දී රු.මිලියන 399 ක් දක්වා අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු.මිලියන 117 දක්වා අඩු වී තිබුණි.

### සැලසිනේ රූපවාහිනී ආයතනය

#### ණය අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම

සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 296 ක් වූ අතර ඉන් රු.මිලියන 200 ක් හෙවත් ණයගැති ශේෂයෙන් සියයට 68ක් වර්ෂ 4 ඉක්මවූ ණයගැතියන්ගෙන් සමන්විත විය.මුළු ණයගැති ශේෂය තුල ඇතුලත් වර්ෂය ඉක්මවූ ණයගැති ශේෂය රු.මිලියන 231 ක් හෙවත් සියයට 78ක් වූ අතර එම ශේෂයන් අයකර ගැනීම සඳහා ආයතනය ආරම්භයේ සිටම නීතිමය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

### එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

#### මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් සාමාන්‍ය විනය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම

ආයතනයේ හිටපු අලෙවි ප්‍රධානී වගකීම් පැහැර හැරීම හේතුවෙන් ආයතනයට සිදුකළ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් සාමාන්‍ය විනය පටිපාටියෙන් බැහැරව කළමනාකරණය විසින් කටයුතු කිරීම නිසා රු.මිලියන 23 ක් වූ මූල්‍ය අලාභයක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

#### පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය නොකිරීම

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් ලියාපදිංචි කිරීම් හා එසේ ලියාපදිංචි කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ද නියෝග සෑදීම සිදු කල යුතු වුවද, තාක්ෂණික දියුණුවත් සමග e-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇතත්, එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

#### නිසි කලට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා අලාභ සිදු වීම

නිසි කලට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා 2021 වර්ෂයේ අවසාන මාස තුන තුලදී ඉවත ලන අස්කොන් කඩදාසි කිලෝග්‍රැමයක් රු. 65 කට නව ගැණුම්කරුට අලෙවි කිරීමට හැකියාව තිබියදී පෙර ගැණුම්කරුටම කිලෝග්‍රැමයක් රු. 26.50 කට අලෙවිකිරීම නිසා දෙපාර්තමේන්තුවට රු.මිලියන 10 ක පාඩුවක් සිදු වී තිබුණි.

### ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමයන්ට පටහනිව මුද්‍රණ නිළධාරින්ට ගෙවීම් සිදු කිරීම

ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමයන්ට පටහනිව මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා ඔවුන්ගේ මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 85 සිට සියයට 366 ක් දක්වා විවිධ වර්ගයේ දිමනා වර්ග 07 ක් මාසිකව ගෙවා තිබූ බවට දෙපාර්තමේන්තුවේ අංශයක් තුල සිදුකල පරීක්ෂාවකදි අනාවරණය විය. එකතුව රු. මිලියන 12 ක් එම අංශයේ නිළධාරින්ට සමාලෝචිත වර්ෂයේදි මාස 8 කදී ගෙවා තිබුණි.

## ශ්‍රී ලංකා පදනම් ආයතනය

### ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරුගෙන් උපරිම සේවාවක් ලබා ගැනීමට කටයුතු නොකිරීම

ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරු 10 ක් සඳහා දේශක ගාස්තු වශයෙන් රු. මිලියන 16 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු. මිලියන 17 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 45 කින් 29 ක් සඳහා බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 06 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා ගොස් තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතිය ද පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි.

### මුල්‍ය පරිපාලනය දුර්වල වීම

2022 දෙසැම්බර් 31 වන දිනට ජංගම ගිණුමක රු.මිලියන 55 ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල කෙටිකාලිනව ඵලදායී ආයෝජනයක යොදවා ආයතනයට ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

### පාලක මණ්ඩලය සම්පූර්ණ කර නොතිබීම

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ විධි විධාන ප්‍රකාරව ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය සඳහා සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත "පාලක මණ්ඩලයක්" පත්කල යුතුය. නමුත් නිල වශයෙන් සාමාජිකයින් වශයෙන් සඳහන් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනා (04) හැර, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නාවූ සාමාජිකයින් පස්දෙනෙකු 2022 මාර්තු 31 දිනෙන් පසුව පත්කර නොතිබුණි.

## තැපැල් දෙපාර්තමේන්තුව

### වාහන භෞතිකව ආයතනය තුල නොපැවතීම

තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හා මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී වාහන 42 ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර අංක 60 ශ්‍රී 7256 දරන බස්රථය භාවිතයෙන් ඉවත්කර තිබුණද ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

### වත්කම් පරිපාලන දුර්වලතා

සමාලෝචිත වර්ෂය අවසානය වන විට විධිමත්ව පවරා නොගත් තැපැල් කාර්යාල 565 ක් වූ අතර තැපැල් දෙපාර්තමේන්තුව සතුව ඉඩම් තිබියදී කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීමට කටයුතු නොකර තැපැල් කාර්යාල 08 ක් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු තැපැල් කාර්යාල 43 ක හා නිල නිවාස 02 ක වර්ග මීටර 83,152.61 (පර්චස් 3,286.66) ක ඌන උපයෝජිත ඉඩම් පවතින බව නිරීක්ෂණය විය.

### හිඟ ආදායම් අයකර නොගැනීම

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ආදායම් ශේෂය රු.මි 93.4 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. ඉන් රු.මිලියන 75 ක් 2019 වර්ෂයේ හා ඊට පෙර වර්ෂයන් තුළ සිට පැවත එන හිඟ මුදල් විය. දෙපාර්තමේන්තුව විසින් විදේශ තැපැල් පරිපාලන ආයතන වෙත 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර තිබුණු නමුත් එම ආයතන විසින් හිඟ ආදායම් වාර්තා අනුමත කර නොතිබීම හේතුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක විහිදී තිබුණු හිඟ ආදායම රු. මිලියන 486 ක් විය. එම හිඟ මුදල අය කරගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් බලපෑමක් සහ හිඟ ආදායම අනුමත නොකිරීමට හේතු සොයා බැලීමක්ද සිදුකර නොතිබුණි.

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

### නිශ්කාර්යව වන්දි හා බේරුම්කරණ වියදම් ගෙවීමට සිදු වී තිබීම

හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් ආයෝජන මණ්ඩලයේ හා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් මත 2016 අගෝස්තු 10 දින අවසන් කර තිබීම හේතුවෙන් එම තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලට අනුව කොන්ත්‍රාත්කරුට වන්දි ඇතුලුව මුළු බේරුම්කරණ වියදම ලෙස රු.මිලියන 427 ක මුදලක් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

### කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය

කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව වලංගු කාර්යය සාධන බැඳුම්කරයක්, රඳවා ගැනීමේ සහතිකයක් හා වෘත්තීය වන්දි රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට වයිනා නැෂනල් ඉලෙක්ට්‍රොනික්ස් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් සමාගම අපොහොසත් වී තිබුණු අතර 2022 ජනවාරි 31 දිනැති අංක 22/0132/331/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව එම බැඳීම් ඉටුකරන තෙක් ද්‍රවශීලතා හානි ලෙස අඩුකර ඇති ඇ.ඩො. මිලියන 10.43 ක මුදල සහ ගැලපුම්ගත කොන්ත්‍රාත් වටිනාකමින් ඉතිරි මුදල වූ ඇ.ඩො. මිලියන 4.115 ක මුදල රඳවා ගැනීම සිදුකර තිබුණි. ව්‍යාපෘතියේ ආදායමෙන්

ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 12,762 ක ණය වාරික හා පොලී කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. කොළඹ නෙලුම් කුලුන මුළුතැන්ගෙයි උපකරණ භෞතික පරීක්ෂාවේදී පිරිවැය ඇ.ඩො. 15,747 ක් වූ අයිස් කැට සාදන යන්ත්‍රය (S/N G01423B) ක්‍රියාත්මක කල නොහැකි මට්ටමේ පැවතුණු අතර ඇ.ඩො. 100,744 ක් පිරිවැය වූ අයිතම 32 ක ඌනතාවයක් විය. 2010 ඔක්තෝබර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව රූපවාහිනී, විදුලි සංදේශ හා ගුවන් විකාශන සේවා කටයුතු සඳහා කුලුන යොදා ගැනීම මූලික අරමුණ වී තිබුණු අතර ගුවන් විදුලි, රූපවාහිනී හා විදුලි සංදේශ කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවූ උපදේශන ගාස්තුව රු. මිලියන 336 ක් වූ අතර ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා ගෙවූ මුදල රු. මිලියන 138 ක් විය.

# විදුලිබල හා බලශක්ති අංශය

## විගණන නිරීක්ෂණ

- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
  - ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රමාදවීම නිසා නිෂ්කාර්ය බැදීම් ගාස්තු ගෙවීමට සිදු වීම හා  භෞතිකව ප්‍රගතිය දුර්වල වීම
  - පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම
  - සාක්ෂාත් කර ගත යුතුව තිබූ අපේක්ෂිත ඉලක්ක හා සංධිස්ථාන ලඟාකරගැනීමට අදාල වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබීම
- ලංකා ගල් අඟුරු සමාගම
  - ගල් අඟුරු අඩුවෙන් සැපයීම
- ලංකා විදුලිබල මණ්ඩලය
  - විදුලි නිෂ්පාදන පිරිවැය ඉහල යාම
  - විදුලිබල පනතේ වගන්තිවලට පටහැනිව  බලශක්තිය මිලදී ගෙන තිබීම
  - පාරිභෝගික තැන්පතු සඳහා පොළි ගෙවා නොතිබීම
  - දීර්ඝ කාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව කටයුතු කර නොතිබීම
  - පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව කටයුතු කර නොතිබීම
  - නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද පොළී ගෙවීමට සිදුවීම
  - පාර්ලිමේන්තු නිල නිවාස වලින් විදුලි ගාස්තු අයකර නොතිබීම
  - නිසි අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා විවිධ දීමනා ගෙවීම්
  - රජයට වාසිදායක ලෙස පෞද්ගලික විදුලි බලාගාර අත්පත් කර නොගැනීම
  - විදුලි ජනනය සඳහා බලපත්‍ර යක් ලබාගෙන නොතිබුණ විදුලිබල සැපයුම් කරුවකුගෙන් විදුළිය මිලට ගැනීම
  - දකුණු ප්‍රදේශයේ විදුලි බල සැපයුම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය විදුලි මාර්ග අලුත්වැඩියා කටයුතු අවසන් නොකිරීම

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
    - දේශීය ඛනිජ තෙල් වෙළඳපොල
    - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්වය
    - ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) නිසා රටට සිදුවී තිබූ පාඩුව
    - මාසික උපයෝගිතා ගාස්තුව (Monthly Utility Fees) ගෙවීම
    - අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට පටහැනිව අලෙවි නියෝජිත කොමිස් ගෙවීම
    - SAP පරිඝනක පද්ධතිය යාවත්කාලීන නොකිරීම
    - බොර තෙල් මිලදී ගැනීමේදී වැඩිපුර ගෙවා තිබීම
    - දැවිතෙල් මිලදී ගැනීමේදී අතිරේක ඇස්තමේන්තුගත ප්‍රමාද ගාස්තුවක් දැරීමට සිදුවීම
    - වළක්වාගත හැකිව තිබූ අතිරේක පිරිවැයක් වලක්වා ගැනීමට නොහැකි වීම
    - ලංකා ඔටෝ ඩීසල් මිල කිරීම සඳහා අදාළ රේටය යොදා නොගැනීම නිසා වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවීම
    - ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ ඛනිජතෙල් මිලදී ගැනීම (Indian Credit Line) සඳහා වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවීම
    - ලැබිය යුතු ශේෂය කපා හැරීමේ තීරණයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න තහවුරු නොවීම
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
    - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර නොගැනීම
    - පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් නොකිරීම
    - මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය නොකිරීම
    - බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබා දීමේ කාර්ය ඉටු කර නොතිබීම
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
    - විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම
- ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම
    - සමාගම සතු බවුසර් උපයෝජනය කිරීම

# විදුලිබල හා බලශක්ති අංශය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 12ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා විදුලිබල හා බලශක්ති විෂයට සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- සූර්ය, ජලය, තාප, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මඟින් පුනර්ජනනීය බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය හා අධීක්ෂණය.
- ශ්‍රී ලංකාවේ විදුලි අවශ්‍යතාවය සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම හා බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.
- දිගුකාලීන අවශ්‍යතා පදනම් කර ගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාවය සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.
- විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
- හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
- ග්‍රාමීය විද්‍යුතනය.
- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වාභාවික වායු ආනයනය, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.
- ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
- ඛනිජ තෙල් හා ස්වභාවික ගෑස් ගවේෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු.
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් සහ අතුරු නිෂ්පාදන කටයුතු , තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය සහ බෙදා හැරීම.
- ඉන්ධන සැපයීම සහ බෙදාහැරීමට අදාල වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය.
- නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදමින් විදුලිබලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති සහ සූර්යකෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පුද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම.
- කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් බලශක්ති උත්පාදනය ඉහළ දැමීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන පැවරීඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාල කටයුතු හා අමාත්‍යාංශ විෂය පථයට අයත්වන සියලුම ආයතන අධීක්ෂණය කිරීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත රු.මිලියන 274,955 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 267,444 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 7,511 ක් ඉතිරිවී තිබුණි.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන විසින් ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

#### ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රමාදවීම නිසා නිෂ්කාර්ය බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වීම හා භෞතිකව ප්‍රගතිය දුර්වල වීම

ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන.19,288 ක් වූ මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර 2018 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. මෙම ප්‍රමාදය නිසා රු.මිලියන 28 ක් බැඳීම් ගාස්තු ලෙස අනාවර්තිකව ගෙවීමට සිදු වී තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9,737 ක් වැය කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 45 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි.

#### පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම

පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම සඳහා කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන දීර්ඝ කාලය අවම කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීම සඳහා සුළං, සූර්ය බලය හා වර්ෂාපතනය සඳහා ඵලදායී පුරෝකථන තාක්ෂණයන් හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ගයේ දක්වා තිබුණද, අමාත්‍යාංශය විසින් මේ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### සාක්ෂාත් කර ගත යුතුව තිබූ අපේක්ෂිත ඉලක්ක හා සංධිස්ථාන ලභාකරගැනීමට අදාල වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබීම

අමාත්‍යාංශය විසින් බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම, ජාතික ආර්ථිකය සඳහා ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සැපයුම් සේවා ලබාදීම, පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම, බලශක්ති අංශයේ යහපාලනය ශක්තිමත් කිරීම හා අනාගත බලශක්ති යටිතල ව්‍යුහය සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම යන කාර්යයන් සම්බන්ධයෙන් සාක්ෂාත් කර ගත යුතුව තිබූ අපේක්ෂිත ඉලක්ක හා සංධිස්ථාන ලභාකරගැනීමට අදාල වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

## ලංකා ගල් අඟුරු සමාගම

### ගල් අඟුරු අඩුවෙන් සැපයීම

ගල් අඟුරු සමාගමකින් සැපයූ රු.මිලියන 590 ක හිඟ ගල් අඟුරු ශේෂයක් වර්ෂ අටක කාලයක සිට ලංකා ගල් අඟුරු සමාගම විසින් එකඟ වූ බෙරුම්කරණ ක්‍රමයක් යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

## ලංකා විදුලිබල මණ්ඩලය

### විදුලි නිෂ්පාදන පිරිවැය ඉහළ යාම

2022 වර්ෂයේ විදුලි කිලෝ වොට් පැයක සාමාන්‍ය පිරිවැය රු. 33.65 ක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ එය රු.19.42 ක් විය. එමෙන්ම, 2022 වර්ෂයේ විදුලි කිලෝ වොට් පැයක සාමාන්‍ය විකුණුම් මිල රු. 21.24 ක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ එය රු.16.37 ක් විය. ඒ අනුව, 2022 වර්ෂයේ විදුලි කිලෝ වොට් පැයක සාමාන්‍ය දළ ලාභය රු. 12.41 ක් වූ අතර පසුගිය වර්ෂයේ විදුලි කිලෝ වොට් පැයක සාමාන්‍ය දළ ලාභය වූ රු. 3.05 ට සාපේක්ෂව එය සියයට 307 කින් වැඩි වීමක් විය. 2022 වර්ෂය තුළදී ගල් අඟුරු ඇතුළුව ඉන්ධන මිළ ගණන් සැළකිය යුතු මට්ටමකින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන හේතුව වී තිබුණි.

### විදුලිබල පනතේ වගන්තිවලට පටහැනිව බලශක්තිය මිලදී ගෙන තිබීම

ශ්‍රී ලංකා විදුලිබල පනතේ වගන්තිවලට පටහැනිව නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රයක් ලබා නොගත් විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) 2022 වර්ෂය තුළදී රු. බිලියන 5 ක වූ ගිගාවෝට් 60.33 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.

### පාරිභෝගික තැන්පතු සඳහා පොළි ගෙවා නොතිබීම

ශ්‍රී ලංකා විදුලිබල පනතේ දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොළි ගෙවා නොතිබුණි. 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොළිය රු. මිලියන 976 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. බිලියන 9 ක් විය.

### දීර්ඝ කාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව කටයුතු කර නොතිබීම

2018 - 2037 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක , මෙගාවොට් 657 ක , මෙගාවොට් 445 ක සහ මෙගාවොට් 430 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

### පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව කටයුතු කර නොතිබීම

මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කොන්දේසි සහිතව අනුමැතිය ලබා දී තිබුණ 2022 - 2041 අවම පිරිවැය දිගුකාලීන ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2022 වර්ෂයේදී එකතුව මෙගාවොට් 544 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එකතුව මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. මෙම සැලැස්ම ක්‍රියාත්මක නොකිරීම නිසා 2022 වර්ෂය තුලදී රු. බිලියන 5 ක් වටිනා ගිගාවොට් පැය 60.33 ක අතිරේක විදුලිබලයක් මිලදී ගැනීමට සිදු වී තිබුණි.

### නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද පොළී ගෙවීමට සිදුවීම

නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය මිලදී ගැනීම් සහ ඉන්ධන මිලදී ගැනීම් (ලංකා ඛණිජ තෙල් නිතිගත සංස්ථාව) සඳහා ප්‍රමාද පොළිය ලෙස 2022 වර්ෂය තුළ පිළිවෙලින් රු. බිලියන 6.55 ක් සහ රු. බිලියන 8.92 ක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණයවලට අදාළව මණ්ඩලය විසින් ණය වාරික ආපසු ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 11 කට සමාන මුදලක් දඩ පොළී ද ගෙවා තිබුණි.

### පාර්ලිමේන්තු නිල නිවාස වලින් විදුලි ගාස්තු අයකර නොතිබීම

සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව පාර්ලිමේන්තු නියෝජිත නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 74ක් සම්බන්ධයෙන් රු. මිලියන 16 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගෙන නොතිබුණි. එයින් සම්බන්ධතා 29 කට අදාළ රුපියල් මිලියන 5ක මුදලක් වසර හයක කාලයක් තිස්සේ අයකර නොගෙන ඇති අතර සම්බන්ධතා 30 ට අදාළ තවත් රුපියල් මිලියන 3ක් වසරකට වැඩි කාලයක් අයකර නොගෙන හිඟව තිබුණි.

### නිසි අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා විවිධ දීමනා ගෙවීම්

2008 අප්‍රේල් 09 වැනි දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව සහ කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන 2022 වර්ෂය සඳහා ඉංජිනේරු දීමනාව, දිරි දීමනාව, තාවකාලික දීමනාව යනාදී දීමනා වෙනුවෙන් රු. මිලියන 418 ක් ගෙවා තිබුණි.

### රජයට වාසිදායක ලෙස පෞද්ගලික විදුලි බලාගාර අත්පත් කර නොගැනීම

ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම සමග ඇති කර ගත් ගිවිසුමෙහි වලංගු කාලය වූ වසර 10 ක කාලය 2005 අප්‍රේල් 06 සිට 2015 අප්‍රේල් 06 වන දිනෙන් අවසන් වූ පසු මෙම බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට 2016 මාර්තු 23 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලයේ දී තීරණය කර තිබුණි. රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සමාගම රු. මිලියන 2,370 කට තක්සේරු කර තිබූ අතර බලාගාරයේ හිමිකරුවන් විසින් එය රු.මිලියන 2,446 ක ලංසු මිලකට මණ්ඩලයට අලෙවි කිරීමට එකඟ වී තිබුණි. තවද, වසර 10 ක මුල් ගිවිසුම් කාලය තුළදී ගිණුම්ගත කරන ලද ශුද්ධ ලාභයේ සාමාන්‍ය ඉදිරි වසර 8 ක් සඳහා සියයට 9.5 ක වට්ටම් සාධකය යටතේ වට්ටම් කිරීමෙන් බලාගාරයේ වටිනාකම රු. මිලියන 4,192 කට ආසන්න අගයක් විය. කෙසේවෙතත්, මෙම බලාගාරය මිලදී ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2016 අප්‍රේල් 6 දින සිට 2022 සැප්තැම්බර් 8 දින දක්වා අවස්ථා 4 කදී වසර 05 යි මාස 06 ක කාලයක් සඳහා මූලික ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම සමාගමේ හිමිකරුවන් විසින් බලාගාරය විකිණීමට එකඟ වූ ලංසු මිළට වඩා අඩු අගයක් වීම හේතුවෙන් බලාගාරය මණ්ඩලයට අත්කර ගෙන රජයට වඩා වාසිදායක ලෙස පවත්වාගෙන යාමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

### විදුලි ජනනය සඳහා බලපත්‍ර යක් ලබාගෙන නොතිබුණ විදුලිබල සැපයුම් කරුවකුගෙන් විදුළිය මිලට ගැනීම

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියමයන් ප්‍රකාරව විදුලි ජනනය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් විදුලි ජනනය සඳහා බලපත්‍ර ලබාගත යුතුය .ඒ අනුව උක්ත පනතේ 43 (1) වගන්තිය ප්‍රකාරව එසේ බලපත්‍ර හිමිවූ සමාගම් වෙතින් පමණක් විදුලිය ජනනය සහ සැපයීම සිදුකළ යුතු වුවද, එසේ ජනන බලපත්‍ර ලබාගෙන නොමැති ඒස් පවර් ඇඹිලිපිටිය සමාගමෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

### දකුණු ප්‍රදේශයේ විදුලි බල සැපයුම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය විදුලි මාර්ග අලුත්වැඩියා කටයුතු අවසන් නොකිරීම

සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම - 2013 ට අනුව දකුණු ප්‍රදේශයේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නව පොල්පිටිය -

හම්බන්තොට 220 KV සම්ප්‍රේෂණ මාර්ගය, කොත්මලේ -නව පොල්පිටිය 220 KV සම්ප්‍රේෂණ මාර්ගය සහ හොරණ - පාදුක්ක 220 KV සම්ප්‍රේෂණ මාර්ග වල වැඩ අවසන් කර නොතිබුණි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### දේශීය ඛනිජ තෙල් වෙළඳපොල

2022 වර්ෂයේ දේශීය ඛනිජ තෙල් වෙළඳපොලෙන් සියයට 86 කට වැඩි සැපයුමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) මගින් සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමස්ත ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 4,532 ක් වැය කර තිබුණි. සමස්ත ඛනිජ තෙල් වෙළඳපොලේ වෙනස්වීම් වල ප්‍රතිපථයක් ලෙස, 2022 වසරේදී බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල පෙර වර්ෂයේදී පැවති එ.ජ. ඩොලර් 68.86 මිලට සාපේක්ෂව එ.ජ. ඩොලර් 100.11ක් දක්වා සියයට 45.4 කින් ඉහළ ගොස් තිබුණි. විදේශ විනිමය හිඟය හේතුවෙන් විධිමත් ලෙස බොරතෙල් ආනයනය කිරීමට නොහැකිවීම නිසා සපුගස්කන්ද පිරිපහදුව නිරන්තරයෙන් වසා දැමීමට සිදුවීමෙන්, 2022 වසරේ දී සමස්ත ඛනිජ තෙල් පිරිපහදු නිෂ්පාදනය සියයට 55.4 ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කර තිබුණි.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්වය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.මිලියන 39,849 ක දළ ලාභයක් වාර්තාකර තිබූ අතර එය ඉකුත් වර්ෂයේදී වාර්තාකළ දළ අලාභය වූ රු.මිලියන 4,068 ට සාපේක්ෂව රු. මිලියන 43,917 ක වැඩිවීමකි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදීද රු. මිලියන 615,053 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණු අතර ඒ අනුව ඉකුත් වර්ෂයේ රු. මිලියන 81,816 ක්වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව සංස්ථාවේ ශුද්ධ අලාභය රු. මිලියන 533,237 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ රු. මිලියන 33,220 ක්ව පැවති විනිමය අනුපාත විචලනයේ අවාසිය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 527,010 දක්වා රු. මිලියන 493,790 කින් වැඩිවීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 5 ක සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය (ශුද්ධ ලාභය) රූපසටහන 29 මගින් දැක්වේ.




රූපසටහන 29 - සංස්ථාවේ ශුද්ධ ලාභය / අලාභය

මූලාශ්‍රය - සංස්ථාවේ විගණිත මූල්‍ය ප්‍රකාශන

### ඉදිරි සුරැකුම් ගනුදෙනු (හෙජින්) නිසා රටට සිදුවී තිබූ පාඩුව

2007 සිට 2009 දක්වා කාලය තුළ සංස්ථාව විසින් තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කර තිබූ හෙජින් ගනුදෙනුවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව, එම ගනුදෙනුවලින් 2022 දෙසැම්බර් 31 දිනට රටට සිදු වූ මුළු පාඩුව රු. මිලියන 14,028 ක් වී තිබුණි. තවද, සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6 ක අයිතියක් සඳහා කොමර්ෂල් බැංකුව විසින් කොළඹ ඉහළ වාණිජ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2022 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

### මාසික උපයෝගිතා ගාස්තුව (Monthly Utility Fees) අය කිරීම

2013 ඔක්තෝම්බර් 29 දිනැති අංක 38/1140 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අනුව, සංස්ථාව සතු සියලුම අලෙවි නියෝජිත (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු වෙළෙඳුන් විසින් පවත්වාගෙන යනු ලබන (TODO) පිරවුම්හල්වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් (MUF) 2014 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, CODO සහ TODO පිරවුම්හල් 220 ක් අතරින් අලෙවිකරුවන් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගිතා ගාස්තුව අය කරගෙන තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 වනවිට සංස්ථාවට අයවිය යුතුව පැවැති රු. මිලියන 3,416 ක මුදල අයකර ගැනීමට මේ දක්වා සංස්ථාව අපොහොසත්වී තිබුණි.

### අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට පටහැනිව අලෙවි නියෝජිත කොමිස් ගෙවීම

2019 ජුලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව ඛනිජ තෙල්වල දේශීය වෙළඳපොළ මිල උච්චාවචනයන්ගේ බලපෑම මත බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් ප්‍රමාණය උච්චාවචනය වීම මත සංස්ථාවට සහ බෙදුම්කරුවන්ට වන අහිතකර බලපෑම බැහැර කිරීම සඳහා පහත පරිදි ඉහළ හා පහළ සීමාවන්ට යටත්ව කොමිස් ප්‍රතිශතය තීරණය කර තිබුණි.

| | පෙට්‍රල් | | ඩීසල් | |
|---|---|---|---|---|
| | 92 Oct | 95 Oct | LAD | LSD |
| **Upper Cap** | Rs.162 | Rs.170 | Rs.121 | Rs.145 |
| **Lower Cap** | Rs.117 | Rs.128 | Rs.95 | Rs.110 |

වගුව 19 - ඉහළ හා පහළ සීමාවන්

එසේ වුවද, මෙම අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට පටහැනිව, ඉහළ සීමාවන් නොසලකා බෙදුම්කරුවන්ට අලෙවි නියෝජිත කොමිස් මුදල් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 12,410 ක් අලෙවි නියෝජිත කොමිස් මුදල් වැඩිපුර ගෙවා විකුණුම් හා බෙදාහැරීමේ වියදම් යටතේ දක්වා තිබූ අතර 2023 සැප්තැම්බර් 01 දිනට වැඩිපුර ගෙවූ මුලු අලෙවි නියෝජිත කොමිස් මුදල රු. මිලියන 23,576 ක් වී තිබුණි.

### SAP පරිඝනක පද්ධතිය යාවත්කාලීන නොකිරීම

සංස්ථාව විසින් SAP ERP පද්ධතියේ 2005 වර්ෂයේදී හඳුන්වා දුන් මූලික අනුවාදය (SAP ECC 6.0) 2010 අප්‍රේල් මස 01 දින සිට මේ දක්වා කිසිඳු යාවත්කාලින කිරීමකින් තොරව භාවිතා කරනු ලබන අතර SAP පරිඝනක පද්ධතිය යාවත්කාලින කිරීමට අවශ්‍ය කඩිනම් පියවර මේ වනවිටත් ගෙන නොතිබුණි. මෙම පද්ධතියේ යම් බිඳවැටීමක් හේතුවෙන් සමස්ත රටෙහිම තෙල් සැපයුම අකර්මන්‍ය වීමේ දැඩි අවදානමක් පවතිණ බවට නිරීක්ෂණය කෙරේ.

### බොර තෙල් මිලදී ගැනීමේදී අතිරේකව දැරූ පිරිවැය

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුලදී ආනයනය කරන ලද බොරතෙල් (Siberian Light සහ Ural) බැරල් 2,023,509 කට අදාලව ගෙවීම් කිරීමේදී මිල තීරණ කිරීම සඳහා වෙනස් මිල දර්ශකයක් යොදාගැනීම හේතුවෙන්, ඒ ඒ නිෂ්පාදන වලට අදාලව Singapore PLATTS හි දෛනිකව ප්‍රසිද්ධ කරනු ලබන මිල දර්ශකයට අනුව ගණනය කරන ලද මිලට (පිරිවැයට) සාපේක්ෂව, සංස්ථාව විසින් සැපයුම්කාර සමාගමට ඇ. ඩො. මිලියන 49ක් හෙවත් අදාල අනායන සටහන්කරයේ සඳහන් විනිමය අනුපාතය පදනම්ව ගණනය කරන ලද රු.මිලියන 17,876 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

### දැවිතෙල් මිලදී ගැනීමේදී අතිරේක ඇස්තමේන්තුගත ප්‍රමාද ගාස්තුවක් දැරීමට සිදුවීම

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් හදිසි අවශ්‍යතාවයක් ලෙස පිරිවිතර සංශෝධනය කරමින් මූල්‍ය සඛ්‍යතාවය පිලිබඳව නිසි ඇගයීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය යටතේ දැවිතෙල් මිලට ගැනීම සඳහා තොග සමාලෝචන කමිටුව විසින් තීරණය කිරීම හේතුවෙන් රු .මිලියන 336ක අතිරේක ඇස්තමේන්තුගත ප්‍රමාද ගාස්තුවක් දැරීමට සිදුවී තිබුණි.

### දැවිතෙල් මිලදී ගැනීමේදී වළක්වාගත හැකිව තිබූ අතිරේක පිරිවැය වලක්වා ගැනීමට නොහැකි වීම

සමාලෝචිත වර්ෂයේද දැවි තෙල් මිලදී ගැනීමේ දී ලෝක වෙළඳපලේ ඛනිජ තෙල් මිල ක්‍රමිකව ඉහළයන උපනතියක් පෙන්නුම් කරන බවට සිංගප්පූරු PLATTS ආයතනය මගින් පූරෝකථන කර තිබූ කාලච්ඡේදයකදී, ඒ පිළිබඳව විධිමත් ඇගයීමකින් තොරව, පිරිවිතර වලට අනනුකූලබවට ටෙන්ඩර් අවලංගුකර, නැවත එම පිරිවිතර යටතේම ගොඩබෑමේ දින වෙනස්කර එම සැපයුම්කරුගෙන්ම මිලදී ගැනීම හේතුවෙන් සංස්ථාවට ඇ.ඩො. 368,837 ක් හෙවත් රු. මිලියන 73 ක වළක්වාගත හැකිව තිබූ අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### ඔටෝ ඩීසල් මිලදී ගැනීමේදී මිලකිරීම සඳහා සුපර් ඩීසල් මිල යොදා ගැනීම හේතුවෙන් දැරූ අතිරේක පිරිවැය

සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් ඇණවුම් 08 දී සැපයුම්රුවන් හතර දෙනෙකුගෙන් ලංකා ඔටෝ ඩීසල් (LAD (Gas Oil 500 ppm) බැරල් 1,820,012 ක් මිලදීගෙන තිබුණි. එසේ වුවද, මෙහිදී මිල කිරීම සඳහා සාපේක්ෂව වැඩි PLATTS සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් (FOB Singapore Price Method of Gas Oil 10ppm) මිල පදනම් කර ගැනීමට එකගවී තිබුණි. ඒ අනුව, සංස්ථාවට එකතුව ඇ.ඩො මිලියන 10.5 ක් හෙවත් රු. මිලියන 3,873 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ ඛනිජතෙල් මිලදී ගැනීම (Indian Credit Line) සඳහා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීම

ඉන්දියානු කෙටිකාලීන ණය පහසුකම යටතේ සංස්ථාව විසින් අවස්ථා දෙකකදී ලංකා ඔටෝ ඩීසල් LAD (Gas Oil 500 ppm) බැරල් 599,722 ක් මිලදී ගැනීමේදී, ඒ සඳහා මිල කිරීම සඳහා PLAATS හි සාපේක්ෂව වැඩි සාමාන්‍ය අගයක් සහිත ලංකා සුපර් ඩීසල් (FOB Singapore Price Method of Gas Oil 10ppm) වලට අදාල මිල පදනම යොදාගැනීම හේතුවෙන් සංස්ථාවට එකතුව ඇ.ඩො. මිලියන 4.6 ක හෙවත් රු. මිලියන 1,669 ක වැඩිපුර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### ලැබිය යුතු ශේෂය කපා හැරීමේ තීරණයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න තහවුරු නොවීම

2021 ජූලි 22 දිනැති අංක 08/1252 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, ප්‍රමාණවත් තොරතුරු නොමැතිකම හේතුවෙන්, සංස්ථාවේ ගිණුම් පොත්වලින් රු. මිලියන 1,516 ක ලැබිය යුතු ශේෂය කපා හැරීමට අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් ලැබී ඇති තොරතුරු අනුව, ලැබිය යුතු මුදල් කපා හැරීමට තීරණයක් ගැනීමට පෙර එම ශේෂය පදනම් කරගත් ගනුදෙනු සහ සිද්ධීන් සමඟ වංචනික ක්‍රියා සිදුවීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

### ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර නොගැනීම

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා විසින් අධිකාරියේ සභාපති වෙත නිකුත්කර තිබුණු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීමේ විධාන අධිකාරිය විසින් නිසිපරිදි බලාත්මක කර නොතිබුණි. එම චක්‍රලේඛයේ 16 වගන්තියට අනුව ව්‍යාපෘති කමිටුව විසින් නිර්දේශ නොකරන ලද ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩපිලිවෙලක් කළමනාකරණ මණ්ඩලය විසින් සකස් කර නොතිබුණු අතර එමෙන්ම විශේෂ බලපත්‍ර කාලය අවසන් කුඩා ජල විදුලි ව්‍යාපෘතිවල ස්ථාන පනතේ බලතල ප්‍රකාරව රජයට පවරාගෙන විවෘත ලංසු කැඳවීම මඟින් සුදුසු ආයෝජකයන් තෝරා සංවර්ධනය කිරීම සඳහා විදුලි බල මණ්ඩලය හා ඒකාබද්ධව පියවර ගත යුතු වුවත් එවැනි කුඩා ජල විදුලි ව්‍යාපෘති 30 කට අදාලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් නොකිරීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අනුව එක් එක් ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 15 ක් ගත වී තිබුණද එවැනි සැලැස්මක් ගැසට් කර නොතිබුණි. ඒ හේතුවෙන් බලශක්ති සංවර්ධන ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන කාර්යයන් ඉතා මන්දගාමී වී තිබුණි. අධිකාරිය විසින් විවිධ දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 269,562 ක් සුළං බලශක්ති සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් කර තිබුණද 2021 දෙසැම්බර් 31 වන විට ඉන් හෙක්ටයාර් 206 ක භූමි ප්‍රමාණයක පමණක් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වල මූලික සංවර්ධන කාර්යයන් ආරම්භකර තිබුණි.

### මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය නොකිරීම

ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය( Available Grid Capacity) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත 5 ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනත 25 ප්‍රකාරව 2023 ජනවාරි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීමට හැකි වී නොතිබුණි.

### බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබා දීමේ කාර්ය ඉටු කර නොතිබීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති පනත අනුව, බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබා දීමේ කාර්යය සඳහා සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවා තිබුණද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් මේ දක්වා ඉටු කර නොතිබුණ අතර 2022 දෙසැම්බර් 31 වනවිට එම අරමුදලේ රු. මිලියන 127 ක ශේෂයක් පැවතුණි.

### ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත 48 ප්‍රකාරව විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීමට සභාවේ අනුමැතිය දීම සඳහා යොදාගත යුතු අවශ්‍යතා සහ කාර්යපටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ පදනම් කරගනිමින් සාදන ලද රීති මත පදනම් විය යුතු වුවත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් අන්තර්ජාතික මාර්ගෝපදේශ සුදුසු පරිදි යොදාගෙන රීති සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

#### සමාගම සතු බවුසර් උපයෝජනය කිරීම

2022 දෙසැම්බර් මාසය සඳහා SAP (ERP පද්ධතියේ) වාහන කාර්ය සාධන වාර්තාවට අනුව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සතු බවුසර් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රශස්ථ ලෙස භාවිත කර නොතිබුණි. 2022 දෙසැම්බර් මාසයට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව සමාගම සතු බවුසර් 130 න් බවුසර් 68 ක් මාසය තුළ එකදු ගමනක් හෝ භාවිත කර / බෙදාහැර නොතිබූ අතර භාවිත කළ බවුසර්වලින් බවුසර් 18 ක් මාසය තුළ එක් දිනක් පමණක් භාවිත කර තිබුණි.

# නාගරික සංවර්ධන හා නිවාස අංශය

## විගණන නිරීක්ෂණ

- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
    - නිවාස සහ ඉදිකිරීම් අංශය
    - වතු නිවාස අංශය
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති
    - කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)
- නාගරික සංවර්ධන අධිකාරිය
- LRDC-සේවා පොද්ගලික සමාගම
- ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

# නාගරික සංවර්ධන හා නිවාස අංශය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා ඒ යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතන විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කළ යුතුව තිබුණි.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන හා නිවාස විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදාගනිමින් සියළුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- මහනගර, උපනගර සහ තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය.
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.
- නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය, නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම , නිවාස මූල්‍යාධාර සැපයීම
- නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.
- සියලු නාගරික ඉදිකිරීම්වල දී රථවාහන නැවැත්වීමේ අංගන හා අබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම සහතික කිරීම.
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම හා නියාමනය සිදුකිරීම.
- සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
- පහත්බිම් සංවර්ධනය කිරීමට අදාළ කටයුතු.
- රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියාමනය කිරීම.
- පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මග පෙන්වීම.
- රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉන්ජිනේරු සේවා සැපයීම.
- ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
- බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.
- ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම.
- දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම.
- සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු.
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.

- රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම.
- වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජීය සහ සංස්කෘතිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.
- ග්‍රාමීය වතු අංශයන් හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම.
- වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට හා රාජ්‍ය අමාත්‍යාංශ 04ක් ඇතුළුව දෙපාර්තමේන්තු 03 කට රු.මිලියන 27,147.75 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 24,205.05 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 2,942.7 ක් උපයෝජනය කර නොතිබුණි.

විස්තර පහත රූපසටහන 30 හි දැක්වේ.




| | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | රජයේ කරමාන්තශාලාව | භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 26,175.77 | 557.91 | 200.43 | 213.64 | 27,147.75 |
| වියදම | 23,308.28 | 537.27 | 175.28 | 184.22 | 24,205.05 |
| ඉතිරිය | 2,867.49 | 20.64 | 25.15 | 29.42 | 2,942.70 |

රූපසටහන 30. : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2021 අංක 30 දරන විසර්ජන පනතේ ඇතුළත්ව තිබුණු පහත සඳහන් රාජ්‍ය අමාත්‍යාංශ 2022 සැප්තැම්බර් 30 දින සිට 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධිත) පනතින් අහෝසි කර එම රාජ්‍ය අමාත්‍යාංශ යටතේ පැවති කාර්යභාරයන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වූ වැය විෂයයන්වලට අන්තර්ග්‍රහණය කර තිබුණි.

- නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
- ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
- වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
- වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පින්ඩනය කර පහත දක්වා ඇත.

### නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

- 2017 අප්‍රේල් 14 දින මීතොටමුල්ල කසල කන්ද නායයෑමෙන් ජීවිත 32 ක් අහිමි වීමත් සමග 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණද ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයේ අක්කර 266 ක් පමණ වූ ප්‍රදේශයක කසල රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකර, එයට බස්නාහිර කලාපය තුල දෛනිකව එකතු වන ඝණ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1200 ක් දුම්රිය මාර්ග ඔස්සේ බැහැර කිරීමේ ව්‍යාපෘතියක්, ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර 2017 මැයි 09 දින අනුමැතිය ලබාගෙන තිබුණි. මෙය විදේශීය ආධාර මත සිදු කිරීමට යෝජනා වී තිබුණද, ලෝක බැංකු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම මත ලබාදීමට එකඟවූ ඇමෙරිකන් ඩොලර් 700,000 ක ආධාර මුදල අහිමි වී තිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදලින් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 19,127 ක් වූ අතර ශක්‍යතා අධ්‍යයන කටයුතුවලට රු.මිලියන 85 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමටද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර තිබුණි. අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදීගැනීමේ පැකේජය යටතේ, දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මිලියන 8.27 ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර වසර 03 ගතවී තිබුණද අදාල කාර්යයට යොදවා ගත නොහැකි වීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය එන්ජින් වෙනත් කාර්යයන් වලට යොදවා තිබුණි.

කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 21,045 ක් වැයකර තිබුණුද, සැලසුම් කල කටයුතු සම්පූර්ණ කර නොතිබුණු බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

- සියක් නගර ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 496 ක් වැයකර 2022 ජූනි 30 දින වන විට වැඩ අවසන් කළ, නගර අලංකරණ ව්‍යාපෘති 04ක්, මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 02ක් ඇතුළු ව්‍යාපෘති 15 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල ආයතන වෙත භාරදීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

- සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බුලත්සිංහල ඇඟල්ඔය බහු මාදිලි ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත 2016 අගෝස්තු 16 දින රු.මිලියන 41 ක කොන්ත්‍රාත් වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව අදියර 03 කට කොටස්කර කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 153 ක් දක්වා සියයට 272 කින් වැඩිකර ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. ගොඩනැගිල්ලේ භුක්තිය බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත 2018 ඔක්තෝබර් 20 දින භාර දී තිබුණි. කෙසේ වුවද ගොඩනැගිල්ල ඉදිකර වසර 04 ක් පමණ ගතවී තිබුණුද එම ගොඩනැගිල්ල කිසිදු අරමුණුගත කාර්යයන්ට යොදා ගෙන නොතිබුණි.

- අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ ආරම්භ කරන ලද රු.මිලියන 113.93 ක් වටිනා ව්‍යාපෘති 7 ක් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛය පරිදි නවතා දමා තිබුණි. මෙහි ඇතැම් ව්‍යාපෘති සඳහා සියයට 25 සිට සියයට 53 දක්වා පරාසයක වියදම් දරා තිබුණු අතර එම ව්‍යාපෘති අත්හිටුවුවහොත් ඒ සඳහා දරන ලද රු. මිලියන 49 ක මුදල අනාර්ථික වියදමක් වන බව නිරීක්ෂණය විය.

- 2020 හා 2021 වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ නිවාස ව්‍යාපෘති 12 ක් හා 30 ක් සඳහා නිවාස 145 ක් හා 602 ක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.මිලියන 202ක් හා රු.මිලියන 837ක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ත පිරිවැය ලෙස පිළිවෙලින් රු.මිලියන 110 ක් හා රු.මිලියන 228 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබූ අතර ඒ සඳහා එම ආයතනය වෙත කළමණාකරණ ගාස්තුද ගෙවා තිබුණි. එසේ වුවද අදාල ව්‍යාපෘතිවල ගිවිසුම්ගත කාලයන්ද ඉක්ම ගොස් ඇතත් ව්‍යාපෘති සම්පූර්ණ කර නිවාසලාභීන්ට භාරදී අදාල ණය වාරික අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

- අමාත්‍යාංශයේ නිවාස අංශය විසින් 2017 - 2020 කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 4,989 ක් වූ නිවාස ව්‍යාපෘති 10 ක් යටතේ නිවාස 27,555 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.මිලියන 4,025 ක් වැය කර තිබුණු අතර ඉන් නිවාස 5,604 ක පමණක් වැඩ නිමකර තිබුණි. ප්‍රගති වාර්තා අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 ට අඩු නිවාස ව්‍යාපෘති 07 ක් ද සියයට 25ත් 50ත් අතර වූ ව්‍යාපෘති 02 ක් ද සියයට 75 ට වැඩි ව්‍යාපෘති එකක්ද, වී තිබුණි. මෙම ව්‍යාපෘති යටතේ ඉදිකළ යුතු අනෙකුත් නිවාස වල ඉතිරි වැඩ සම්පූර්ණ නොකොට අතරමග නවතා දමා තිබුණි.

- 2030 වර්ෂය වන විට සියලු දෙනාටම ප්‍රමාණවත් ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ඉලක්කගත ප්‍රමාණයෙන් වර්ෂය අවසාන වන විට ලබාගෙන තිබූ ප්‍රගතිය සියයට 8 ක් පමණක් වී තිබුණි.

### නිවාස සහ ඉදිකිරීම් අංශය

- නිවාස සහ ඉදිකිරීම් අංශය විසින් 2019 වර්ෂයේ ආරම්භ කරන ලද "වැලිඔය නිවාස" යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 32 ක් වැයකර ඉදිකිරීමට ඉලක්කගත නිවාස 256 කින් කිසිදු නිවාසයක වැඩ සම්පූර්ණයෙන් නිමකර නොතිබුණි.

2019 වසරේදී ආරම්භ කරන ලද මුලතිව්, කිළිනොච්චි නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 530 ක් වියදම් දරා තිබුණද කිසිදු නිවසක වැඩිදියුණු කිරීම් සම්පූර්ණයෙන් අවසන්කර නොතිබුණි.

උතුරු හා නැගෙනහිර පළාත්වල වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශවල ජනතාව සඳහා ජල පිරිපහදු පද්ධති 115 ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.මිලියන 481 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවක් ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව හරහා පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ මූලික අදියර යටතේ පිරිපහදු පද්ධතීන් 50 ක් ස්ථාපිත කිරීමට නියමිත වූ අතර එම ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 209 ක් විය. එයින් රු. මිලියන 111 ක් කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරු වෙත 2021 හා 2022 වර්ෂවලදී ප්‍රජා ජල සම්පාදන දෙපාර්තුමේන්තුව හරහා කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවා තිබුණද එකදු ජල පවිත්‍රකරණ පද්ධතියක් හෝ 2022 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාකාරී තත්ත්වයකට පත්කර වකුගඩු රෝගීන්ට ජලය ලබා දී නොතිබුණි.

- ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් උතුරු නැගෙනහිර පළාත්වල පවුල් සඳහා

කොන්ක්‍රීට් පැනල් නිවාස ඒකක 300 ක් ඉදිකිරීම සඳහා වෙන්කල රු. මිලියන 384 කින් 2022 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 106 ක් කොන්ත්‍රාත් ආයතනය වෙත ද රු.මිලියන 3 ක් උපදේශක ආයතනය වෙතද ගෙවා තිබුණි. ගෙවූ මුදල මුළු පිරිවැයෙන් සියයට 28 ක් වුවද, භෞතික ප්‍රගතිය සියයට 4 ක් පමණක් විය. සම්පූර්ණ කරන ලද නිවාස සංඛ්‍යාව 12 ක් පමණක් වී තිබුණු අතර එම. නිවාස 12 සම්බන්ධයෙන්ද තාක්ෂණික උපදේශන ආයතනය විසින් 2022 ජනවාරි 12 ලබා දී තිබූ අවසාන ඇගයීම් වාර්තාවේ සඳහන් පිරිවිතරයන්ගෙන් බැහැරවීම් හා දෝෂ නිවැරදි කරගැනීමට කටයුතු නොකොට එකඟවූ සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. තවද ගිවිසුමෙහි වගන්ති කඩ වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කලද, මු.රෙ. 507 ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගේ නම අසාධු ලේඛනයට ඇතුලත් කිරීමට අවශ්‍ය මූලික පියවරයන් ගෙන නොතිබුණි.

- පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණු අතර එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් නිවාසවල නිත්‍යානුකූල අයිතිය නිවාසලාභීන්ට ලැබී නොතිබුණි. තවද වන්දි මුදල් ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ගෙන් මීට වසර 20 කට පෙර ඉඩම් අත්පත්කර ගෙන නිවාස ඉදිකර තිබුණු නමුත් අදාළ ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගෙවා නොතිබුණි.

### වතු නිවාස අංශය

- වතු අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හරිත රන් නිවාස වැඩසටහන යටතේ 2022 දෙසැම්බර් 31 දිනට අවසන් අදියරේ පැවති නිවාස 466 ක් සම්පූර්ණ කිරීමට රු.මිලියන 65 ක් ප්‍රතිපාදනය කර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිමකර තිබුණේ නිවාස 282 ක් පමණක් වූ අතර එය අපේක්ෂිත නිමවුම සමග සැසඳීමේදී සියයට 61 ක් පමණි. එමෙන්ම හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ වතුකරයේ පවුල් 1,000 ක ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා රු.මිලියන 2.5 ක් ප්‍රතිපාදනය කර තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට පවුල් 300 කගේ පමණක් ඉඩම් අයිතිය තහවුරු කිරීමට කටයුතු කර තිබුණි. එය අපේක්ෂිත නිමවුමෙන් සියයට 30 ක් පමණක් විය.

- 2021 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2021 නොවැම්බර් මස වැඩකටයුතු අවසන් කල යුතුව පැවති හැටන්, නුවරඑළිය, මහනුවර, රත්නපුර, කෑගල්ල හා ගාල්ල යන කලාප 06 හි නිවාස ඉදිකිරීම් සඳහා වෙන්කරන ලද රු.මිලියන 451 ක් වූ මුදලින් රු.මිලියන 227 ක් එනම් සියයට 50 ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

- වතු අංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන යටතේ, සමාලෝචිත වර්ෂය තුලදී නිවාස 3,525 ක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීම, සම්පූර්ණ කිරීම, ඉඩම් නිදහස් කිරීම සහ වැඩ කණ්ඩායම් පිහිටුවීම සඳහා ඉන්දියානු ආධාර යටතේ රු. මිලියන 400 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම ඉන්දියානු ආධාර නිවාස 4,000 වැඩසටහන යටතේ, නිවාස 180 ක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් රු.මිලියන 95 ක් ප්‍රතිපාදනය කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට ඉන් රු.මිලියන 35 ක් වැයකර නිවාස 26 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 37 වන විට භෞතික ප්‍රගතිය සියයට 14 ක් විය.

- වතු **ප්‍රජාව** සඳහා නිවාස ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කර ණය අයකර ගැනීමේ සියළුම කටයුතු, ගිවිසුම් ප්‍රකාරව ඉටු කිරීමේ වගකීම වැවිලි මානව සංවර්ධන භාරය වෙත භාර දී තිබුණු අතර අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අදාල නිවාස ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 7 ක කළමණාකරන ගාස්තුවක් ගෙවීමට තීරණය වී තිබුණි. ඒ අනුව වතු ප්‍රජාව සඳහා නිවාස ඉදිකර, අදාල නිවාස හිමියන්ගෙන් අයවිය යුතු නිවාස ණය ප්‍රමාණය වාරික වශයෙන් අයකර ගැනීම යටතේ, 2016, 2017 හා 2018 වර්ෂවල රු.මිලියන 3,867 ක් වැය කර ඉදිකර තිබූ නිවාස 4202 ක් වෙනුවෙන් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු.මිලියන 271 ක් කළමණාකරණ ගාස්තු වශයෙන් ගෙවා තිබුණද, රු.මිලියන 1,998 ක ණය වාරික අය කර ගැනීමට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය අපොහොසත් වී තිබුණි.

- හැටන් හා නුවරඑළිය කලාප 02 හි වතු 06 ක නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ රු.මිලියන 160 ක ඇස්තමේන්තු ගත මුදලින් රු.මිලියන 31 ක් එනම් සියයට 20ක් වැය කර තිබුණද කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි.

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

### කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)

- ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 353 ක් වූ නොරිස් කැනැල් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට එරෙහිව ඒ අවට ඇති මහල් නිවාස ඒකකවල නිවැසියන් විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබීම හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (IFMS) ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 77.4 ක් වැය කර තත්‍ය කාලීන පාලන පද්ධති මධ්‍යස්ථානය (RTC)

ස්ථාපිත කර තිබුණද, අධීක්ෂණ පාලන සහ දත්ත රැස් කිරීමේ පද්ධතිය (SCADA) සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර නොතිබුණි.

### නාගරික සංවර්ධන අධිකාරිය

- 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 8 ඡේදයේ (එ) වගන්තිය අනුව අදාළ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කිරීම සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 වන විට අධිකාරිය විසින් පළාත් පාලන ආයතන හා එහි කොටස් වශයෙන් නාගරික සංවර්ධන ප්‍රදේශ 273 ක් ප්‍රකාශයට පත්කර තිබුණද, භූමි පරිහරණ සැලසුම් සකස් කොට අදාල පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇත්තේ ප්‍රකාශිත ප්‍රදේශ 85 ක් සඳහා පමණි.

- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් 22 ක් යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඒකක 14,542 ක් ඉදිකර ඉන් නිවාස ඒකක 12,325 ක් 2013 වර්ෂයේ සිට 2021 දක්වා කාලය තුළ ජනතාවට පවරා තිබූ නමුත් සභාධිපත්‍ය කළමනාකරණ සහතිකය ලබානොගැනීම හේතුවෙන් පදිංචිකරුවන් ගෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයකට නිවාසවල හිමිකාරීත්වය ලබාදීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් මෙම නිවාස ඒකකවල විදුලිය, ආරක්ෂක වියදම්, ජලය, පිරිසිදු කිරීම් සහ නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 231 ක වැයබරක් අධිකාරියට දැරීමට සිදුවී තිබුණි. තවද මෙම නිවාස ඒකක වලින් 271 ක් 2023 අගෝස්තු වනවිටත් කිසිවකුට ලබා නොදී නිශ්කාර්යව පැවතුනි. එසේම, අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදී තිබූ නිවාස ඒකක කුලී සහ ජල ගාස්තු රු.මිලියන 953 ක් අයකර ගත යුතුව පැවතුණි.

- හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොරියානු අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සියේ (KOICA) ආධාර යටතේ ඇමරිකන් ඩොලර් මිලියන 6.4 ක් (රු.මිලියන 851) වැය කරමින් මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන ශ්‍රවනාගාරය ඉදිකර තිබූ අතර සම්මන්ත්‍රණ ශාලාවේ අනෙකුත් ඉදිකිරීම් සඳහා රු.මිලියන 3,831 ක් රජයේ අරමුදල්වලින් වැය කර තිබුණි. සම්මන්ත්‍රණශාලාව පවත්වා ගෙන යාම සඳහා අයහාර වියදම් ලෙස වර්ෂ 2017 සිට 2020 දක්වා රු.මිලියන 93 ක් අධිකාරිය විසින් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘතියෙන් එම කාලපරිච්ඡේදයට අදාළව ආදායම ලෙස උපයා තිබුණේ රු. මිලියන 20.64 ක් පමණි.

- 2022 ජූලි 16 දිනැති අංක 22/0970/502/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස ව්‍යාපෘතියෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වසරක කුලී පදනම මත නිවාස ඒකක 101 ක්, වාර්ෂික කුලිය රු.මිලියන 69 ක් රජයෙන් අධිකාරියට ගෙවීමේ පදනම මත ලබාදී තිබුණි. නමුත් 2023 ජූලි වන විටත් මේ සඳහා කුලිය අධිකාරිය වෙත ලැබී නොතිබූ අතර එක් එක් නිවාස හිමියන් විසින් ගෙවිය යුතු නඩත්තු වියදම් සහ නිවාස ඒකක වෙනුවෙන් ගෙවිය යුතු විදුලිය, ගෑස් සහ ජල ගාස්තු වෙනුවෙන් 2023 අගෝස්තු වනවිටත් රු.මිලියන 10 ක් අධිකාරියට අය විය යුතුව පැවැතුණි.

- අධිකාරිය සතු කොළඹ කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිම්ව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4 ක ඉඩම 2023 අගෝස්තු දක්වාම කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

- 2006 වර්ෂයේ දී ගාල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ ඇලෝසියස් විද්‍යාලීය ක්‍රීඩාංගනය, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය හා ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා අක්කර 16 රූඩ් 3 පර්චස් 0.57 ක නිවාස, වගාවන් හා ව්‍යාපාර පැවති ඉඩම් අත්පත්කර ගැනීමට අධිකාරිය කටයුතු කර තිබුණි. මෙම ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවා නිරවුල් කිරීම වෙනුවෙන් රු.මිලියන 400 ක මුදලක් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබූ අතර 2021 ජූලි 13 දිනට රු.මිලියන 282 ක් වන්දි හා පොලී වෙනුවෙන් ගෙවා තිබුණි. කෙසේ නමුත් එලෙස පවරාගත් අක්කර 16 රූඩ් 03 ක භූමියෙන් සැලකිය යුතු භූමි ප්‍රමාණයක් තවදුරටත් නිෂ්කාර්යව පැවතුණි.

- පොදු මහජනතාව වෙත සේවා සපයනු ලබන මූල්‍ය හා පරිපාලන ආයතන සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් වශයෙන් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ පිහිටි ඉඩම්වලින් අක්කර 04 පර්චස් 43ක් වූ ඉඩම් කොටස් 03 ක් 2013 ඔක්තෝබර් 09 දින අධිකාරියට අත්පත්කරගෙන තිබුණි. නමුත් මෙලෙස අත්පත් කරගනු ලැබූ ඉඩමෙන් අක්කර 02 රූඩ් 03 පර්චස් 01 ක ඉඩම් කොටස් 02 ක් වර්ෂ 2015 හා 2016 වර්ෂ වලදී මුල් හිමිකරුවන්ට නැවත අවසතු කර තිබූ අතර ඉතිරි රූඩ් 01 පර්චස් 02 ක ඉඩම් ප්‍රමාණය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 213 ක් වන්දි වශයෙන් ගෙවීම්කර තිබුණි.කෙසේ නමුත් එම ඉඩම් කොටස 2023 ජූනි වන විටත් මුලින් අපේක්ෂා කල කාර්යයට හෝ වෙනත් කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා යොදවාගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

- නිදහස් රදවා ගැනීමේ පදනම මත (Free Hold Basis) රජය විසින් සංස්ථාවට ලබාදී තිබූ මුතුරාජවෙල පිහිටි ඉඩමෙන් අක්කර 02 ක් පමණ වූ ඉඩම 2019 වර්ෂයේදී රාජ්‍ය සමාගමකට විකුණා තිබුණි. එම ඉඩමේ

විකුණුම් වටිනාකමින් ඒ සඳහා දැරූ සංවර්ධනය කිරීමේ වියදම් අයකර ගෙන ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙසට සංස්ථාවට දන්වා තිබුණද ඉඩම විකුණා රු.මිලියන 273 න් සංවර්ධන වියදම වූ රු.මිලියන 21 ක් අඩුකර රු.මිලියන 252 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි.

- මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් අධිකරණ නියෝග මත අයකරගත් මුදල හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස රු.මිලියන 47 ක් විය. එම මුදල ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙම මුදල අයකර ගත නොහැකි බව නිරීක්ෂණය විය. අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වේ. එහෙත් මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව මෙම පාඩු පොත්වලින් කපා හැරීම සඳහා 2021 ජූනි 28 දිනැති අංක MRW/5404 දරන අධ්‍යක්ෂ මණ්ඩල තිරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි.

- සංස්ථාව 2010 ජූලි 14 දින නිකුත් කළ අංක 1662/17 දරන ගැසට් නිවේදනය පරිදි බස්නාහිර පළාත තුළ පිහිටි ඇල මාර්ගවල රක්ෂිත ඉඩම් (Reservation) ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට උක්ත ගැසට් පත්‍රය නිකුත් කර වර්ෂ 10 ක් ගත වුවද, එම රක්ෂිත ඉඩම් හඳුනාගැනීමට හෝ රක්ෂිත ඉඩම්වල පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සාධනීය පියවර ගෙන නොතිබුණි.

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ අතුරුගිරිය කොතලාවල අධිවේගී මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛීය උද්‍යානයක් ඉදිකිරීම සහ ජලාපවහන වැඩි දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සෞභාග්‍යයේ දැක්ම වැඩ පිළිවෙළ යටතේ ක්‍රියාත්මක කර තිබුණි. භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනාව සඳහා පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබුණු අතර 2022 සැප්තැම්බර් වන විට සංස්ථාවේ අරමුදල්වලින් රු. මිලියන 214 ක් මේ සඳහා වැය කර තිබුණි. ඉන් කිසිදු මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සිදු කර තිබූ වැඩවල වටිනාකම රු.මිලියන 129 ක් ලෙස තාක්ෂණික කමිටුවේ සහතික කිරීම මත කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

- රු.මිලියන 800 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත රොන් මඩ ඉවත් කර බේරේ වැව පිරිසිදු කිරීම සඳහා වූ ව්‍යාපෘතියෙහි වැඩ 2019 වර්ෂයේදී ආරම්භ කර 2019 වර්ෂයේදීම අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබා තිබූ ප්‍රගතිය සියයට 21ක් වැනි පහල

මට්ටමක පැවතුණි. මෙම ව්‍යාපෘතියට අවශ්‍ය යන්ත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 284 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද එම සීමාව ඉක්මවා නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 අගෝස්තු මාසයේදී රු. මිලියන 404 ක් වටිනා යන්ත්‍ර 3 ක් මිලදී ගෙන තිබුණි. මෙයින් රු.මිලියන 245 ක් හා රු.මිලියන 76 ක් වැය කර මිලදි ගෙන තිබූ යන්ත්‍ර දෙක 2023 මාර්තු 31 වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

- මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් කැණීම, ගොඩබිමට පොම්ප කිරීම සහ ගබඩා කිරීම සඳහා සංස්ථාව විදේශීය පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් සමඟ 2018 අප්‍රේල් 10 දින ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් සංස්ථාව විසින් ගිවිසුම් කාලය අවසන් වීමට ප්‍රථම ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් විදේශීය සමාගම විසින් බේරුම්කරණයට යොමුවී තිබූ අතර එයට අදාළව 2023 අප්‍රේල් 28 වන දින ලබාදෙන ලද බේරුම්කරණ නඩු තීන්දුවට අනුව, එ.ජ. ඩොලර් මිලියන 2 කට සමාන ශ්‍රී ලංකා රු.මිලියන 633 ක් හා කොන්ත්‍රාත්කරු විසින් බේරුම්කරණ නඩු කටයුතු සඳහා දරන ලද වියදම් වලින් රු.මිලියන 120 ක්ද වශයෙන් රු.මිලියන 753 ක් ආයතනයට ගෙවීමට සිදුව තිබුණි. එසේම මෙම ආරවුල සම්බන්ධයෙන් වන නෛතික කටයුතු සඳහා සංස්ථාව විසින් රු.මිලියන 49 ක්ද වැය කර තිබුණි. මේ අනුව අවිධිමත් ලෙස ගිවිසුම අවසන් කිරීම සඳහා වගකිව යුතු වන නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට සංස්ථාව කටයුතු කලයුතු ව තිබුණි.

## සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ පරිපාලිත සමාගම්

### ➢ LRDC-සේවා පොද්ගලික සමාගම

- සමාගම විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු රු.මිලියන 9 ක්ද උපචිත පදනම මත ගෙවිය යුතු වැට් බදු වටිනාකම රු.මිලියන 526 ක්ද වූ අතර ඒඅනුව මුදල් පදනම මත ගෙවිය යුතු වැට් බදු වටිනාකම රු. මිලියන 345 ක් සහ ඒ මත දඩ මුදල් ගෙවීමේ අවධානමක්ද පැවතුණි. ස්වතක්සේරු පදනම මත ප්‍රේෂණය කළ යුතු රු.මිලියන 81 ක් වූ ආදායම් බදු සහ එම නොගෙවූ වටිනාකම මත සියයට 21.5 ක පොළියද ඇතුළත් අධි භාරයක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතුව පැවතුණි. මෙම කිසිදු ගෙවීමක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට 2022 දෙසැම්බර් දක්වා අපොහොසත්ව පැවතුණි.

- 2018 වර්ෂයේදී රු. මිලියන 9 කට මිලදී ගන්නා ලද CCTV කැමරා උපකරණ 1669 කින් රු.මිලියන 4 ක් වටිනා ඒකක 835 ක් තාක්ෂණික යල් පැනීම නිසා හා අලෙවි කිරීමට නොහැකි වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි. එසේම 2018 වර්ෂයේදී රු.මිලියන 2 කට ආනයනය කර තිබූ Hand Held Metal

Detectors with Chargers 1000 කින් ඒකක 506 ක් හා රු.මිලියන 11 ක් වැය කොට ආනයනය කරන ලද අයිතම 8 කට අදාළ ඒකක 731 ක ආරක්ෂක උපකරණ සමාලෝචිත වර්ෂයේදීද අලෙවි කිරීමට නොහැකිව තිබූ අතර අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය නොකොට මෙම උපකරණ මිලදී ගෙන තිබුණි.

### ➢ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

- ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම වාණිජ ව්‍යාපාරයක් ලෙස මුහුදු වැලි අසුරුම් කර විකිණීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ යුතු බවට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 4 දින තීරණය කර තිබුණු අතර ඒ සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීමට සංස්ථාව විසින් රු. මිලියන 200 ක ණය මුදලක් සමාගම වෙත 2019 මැයි 07 දින ලබාදී තිබුණි. අදාළ ඉදිකිරීම සිදු කිරීම සඳහා සංස්ථාව සතු ඉඩමක් දෙපාර්ශවය අතර බදු ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව සමාගම වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට විධිමත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව සංස්ථාව විසින් තීරණය කර තිබූ අතර ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම විසින් රු.මිලියන 331 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ල රජයේ තක්සේරුව මත රු.මිලියන 326 කට සංස්ථාව වෙත පවරාගෙන එය රාජ්‍ය සමාගමක් වන ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගමට ලබා දී තිබුණි.

- සංස්ථාව විසින් සමාගමට ලබාදුන් ණය මුදල සඳහා සියයට 12 ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ මාසිකව රු. මිලියන 2 ක් බැගින් වර්ෂ 10 කින් ණය ආපසු ගෙවීමේ පදනම මත සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපාරය අතරමඟ නවතා දැමීම හේතුවෙන් ණය හා පොළිය ගෙවීමට සමාගම අපොහොසත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමාගම විසින් තවදුරටත් ගෙවිය යුතු ණය මුදල රු. මිලියන 141 ක් සහ ගෙවිය යුතු පොළිය රු.මිලියන 49 ක් වුයෙන් සංස්ථාවට ලැබිය යුතු මුළු වටිනාකම රු. මිලියන 191 ක් විය. තවද, පරිපාලිත සමාගමේ ගිණුම් අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් සමාගම විසින් වැයකර තිබූ මුදල රු. මිලියන 383 ක් වී තිබුණි. සංස්ථාව විසින් වරින් වර ගෙන තිබූ අවිධිමත් තීරණ හේතුවෙන් සමාගමේ මෙහෙයුම් කටයුතුවලට අයහපත් බලපෑමක් හා මූල්‍යමය අවාසිදායක තත්වයක් සිදුව තිබුණි.

- සමාගම විසින් සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තශාලා 05 ක් හා වැලි සේදීමේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යන අතර ඒ අතරින් නාවල කර්මාන්තශාලාව හැර අනෙකුත් සියලුම කර්මාන්තශාලා වර්තමානයේ අලාභ ලබන තත්වයට පත් වී ඇති අතර සමාලෝචිත වර්ෂයේදී එම කර්මාන්තශාලා වලින් ලද

මුළු අලාභය රු.මිලියන 13 ක් වූ අතර පසුගිය වර්ෂ 05 තුළ දරන ලද මුළු අලාභය රු.මිලියන 75 ක් විය. තවද හිඟුරක්ගොඩ කර්මාන්ත ශාලාව 2019 වර්ෂය අවසානයේ සිටම සිය නිෂ්පාදන කටයුතු නවතා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කර්මාන්තශාලාව හා එහි උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

### නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

රු.මිලියන 1,392 ක් වැය කරමින් නිදහස් දීමනාවක් ලෙස අධිකාරිය වෙත ලැබුණු මොරටුව ලුනාව රජය සතු ඉඩමේ නිවාස ඒකක 356 ක් ඉදිකර සමාලෝචිත වර්ෂය අවසාන වන විට විකුණුම් පදනම මත නිවාස ඒකක 353 ක් බැහැර කර තිබූ අතර එම නිවාස ඒකක පිරිවැය තීරණය කිරීමේදී ඉඩමෙ පිරිවැය ඒ සඳහා සැලකිල්ලට ගෙන නොතිබුණු අතර නිවාස ලාභීන් වෙත ඔප්පු ලබාදීමද සිදු කර නොතිබුණි.

### ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

- සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබූ නිවාස ණය හා ආධාර වැඩසටහන් අතර "ඔබට ගෙයක් රටට හෙටක්" "ආධාර වැඩසටහන යටතේ 2021 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද නිවාස 8,153 ක ඉදි කිරීම් කටයුතු සඳහා රු. මිලියන 2,589 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් 2022 වර්ෂයේදී නිවාස 5,878 ක් රු.මිලියන 388 ක් වැයකර ඉදි කර තිබූ අතර නිවාස 6353 ක ඉදිකිරීම් ආරම්භ කර තිබුණද අවසන් කර නොතිබුණි. එසේ පැරණි ඉදිකිරීම් අවසන් නොකර 2022 දී අලුතින් මෙම වැඩසටහන යටතේ නිවාස 1485 ක් සඳහා ආධාර ලබා දීමට සැලසුම් කර තිබූ අතර එයින් නිවාස 19 ක් පමණක් ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණි. 2022 වර්ෂයේ දී අලුතින් ආරම්භ කළ අභ්‍යන්තර මුදල් ප්‍රතිපාදන යටතේ නිවාස ණය වැඩසටහන සඳහා රු.මිලියන 600 ක ප්‍රතිපාදන වෙන් කර නිවාස 1000 ක් ඉදි කිරීමට සැලසුම් කල ද එයින් රු. මිලියන 147 ක් වැය කර නිවාස 391 ක් පමණක් ඉදි කර තිබුණි.

- "මිහිදු නිවාස" වැඩසටහන යටතේ 2021 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද නිවාස 557 ක වැඩ 2022 වර්ෂයේ දී රු.මිලියන 92 ක් වැය කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද නිවාස 210 ක් පමණක් ඉදිකර තිබුණි. 2022 වර්ෂයේ දී අලුතින් නිවාස 77ක වැඩ ආරම්භ කිරීමටත් ඉන් නිවාස 21 ක් ඉදිකිරීම අවසන් කිරීම සඳහා රු.මිලියන 40 ක් වෙන් කර තිබුණද රු.මිලියන 18 ක් වැය කර නිවාස 08 ක් පමණක් ඉදිකර තිබුණි. එමෙන්ම සෙවණ ආධාර වැඩසටහන යටතේ 2022 වර්ෂය තුල රු.මිලියන 75 ක් වෙන්කර නිවාස 100 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද රු.මිලියන 32 ක් වැය කර නිවාස 94 ක වැඩ ආරම්භ කර තිබුණ ද එක් නිවසක ඉදිකිරීම් පමණක් අවසන් කර තිබුණි.

- 2017 සහ 2019 වර්ෂ වලදී ආරම්භ කර තිබූ ඉන්දියානු නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 2400 ක් රු.මිලියන 1200 ක ප්‍රතිපාදන මත ඉදි කිරීමට සැලසුම් කර තිබූ

අතර ඒ යටතේ 2022 වර්ෂයේ දී රු. මිලියන 242 ක ප්‍රතිපාදන මත නිවාස 820 ක් ඉදිකිරීම් සැලසුම් කල ද රු.මිලියන 42 ක් වැය කර ඉදිකර තිබුණේ නිවාස 138 ක් පමණි. තවද, පැරණි නිවාස සංකීර්ණ අළුත්වැඩියා කිරීම යටතේ ගම්පහ හිඹුටු උයන නිවාස සංකීර්ණයේ මළ පද්ධතිය අළුත්වැඩියා කිරීමට රු. මිලියන 76 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් රු. මිලියන 51 වැයකර අළුත්වැඩියාවෙන් සියයට 5 ක් පමණක් සිදු කර තිබුණි.

- අධිකාරිය සතු කොළඹ 10 ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩමේ නිවාස සහ වෙළඳ සංකීර්ණයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ මිල කැඳවීමකින් තොරව 2005 නොවැම්බර් 09 දිනැති කැබිනට් අනුමැතිය මත BAY SAT MBH (Pvt) LTD විදේශීය සමාගමට ලබාදී තිබුණි. එම සමාගම සමග 2006 ජූනි 23 දින එලඹී ගිවිසුම ප්‍රකාරව ඉඩමේ වටිනාකම රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ රු. මිලියන 650 ක තක්සේරුව මත අයකිරීමටත් , වසර 06 ක් තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු රු.මිලියන 162 ක ලාභාංශයක් අධිකාරියට ලබාදීමටත් එකඟවී තිබුණි. නමුත් BAY SAT MBH (Pvt) LTD සමාගම යෝජිත සංවර්ධන කාර්යයන් ඉටු නොකර 2006 වර්ෂයේදීම ඉන් ඉවත්වී තිබූ අතර එම කාර්යය L & T Infrastructure Development සමාගමට පවරා දී තිබුණි. මෙම නව සමාගම සමග අධිකාරිය 2016 දී ගිවිසුම් ගතවීමේදී ඉඩම් සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා නොගෙන වසර 10 කට පෙර එනම් 2006 වර්ෂයේදී ලබාගන්නා ලද තක්සේරු වටිනාකමවූ රු. මිලියන 650 කට පවරා දී තිබුණි. 2016 මැයි 05 දින ගිවිසුම යටතේ මුදල් ගෙවීමට පෙර අංක 983 දරන ඔප්පුව මඟින් 2016 මැයි 05 දිනදීම මෙම ඉඩමේ අයිතිය සමාගමට පවරා දී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව රු.මිලියන 712 විදේශීය මුදලින් ගෙවිය යුතු විය. එහෙත් එයට පටහැනිව ඉඩමේ කැබලි අංක 2,3,4 යන බිම් කොටස් 3 සම්පත් බැංකුවට උගස්කර ලබාගන්නා ලද රු.මිලියන 800 ක මුදලින් 2016 මැයි 05 දිනැති සම්පත් බැංකු චෙක්පත් දෙකක් මඟින් අධිකාරියට අදාල ගෙවීම් කර තිබුණි.

- එමෙන්ම 2017 ඔක්තෝබර් 31 දින දක්වාම L&T Infrastructure Development සමාගම විසින් යෝජිත සංවර්ධන කාර්යයන් ඉටුකර නොතිබුණි.

### ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

- දෙපාර්තමේන්තුව තම මෙහෙවරෙන් බැහැරව භූජාභූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සේවකයින් 64 දෙනෙකු අඛණ්ඩව යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් වැටුප් හා අතිකාල වශයෙන් රු.මිලියන 25.35 ක් දෙපාර්තමේන්තුව වැයකර තිබුණි.

- 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කළ යුතු අතර 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021 ඔක්තෝම්බර් 31 දින වන විට, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්මේ අවශ්‍ය සංශෝධනයන් සිදු කල යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි.

- අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉන් ඉවත් කිරීම දෙපාර්තමේන්තුවට අයත් කාර්යභාරයක් නොවුව ද, කැබිනට් තීරණයකට අනුව ඒ සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය දෙපාර්තුමේන්තුව යටතේ සිදු කිරීමට තීරණය කර තිබුණි. ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර 2022 දක්වා රු.මිලියන 634 ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2022 වර්ෂය වන විට රු.මිලියන 13 ක් එනම්, සියයට 2 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි.

# මහාමාර්ග අංශය

## විගණන නිරීක්ෂණ

- රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය
    - බෙස්ලයින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර
    - විකල්ප මාර්ග කි.මී 100,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන
    - මධ්‍යම අධිවේගී මාර්ග – IV ව්‍යාපෘතිය
- ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් අංශය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම්.

# මහාමාර්ග අංශය

මහා මාර්ග ජාලය රටක වඩාත් වටිනාම සහ වඩාත් සුවිශාල වූ සාමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික සමාජයීය, සංස්කෘතිමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද සමාජ සුභසාධනය උදෙසා ඉතා වැදගත් අංශයක් ලෙස පිළිගෙන ඇත. ඒ අනුව ආර්ථික අංශ වලට සමානව සේවා හා යටිතල පහසුකම් සැපයීමෙන් නාගරික හා ග්‍රාමීය සංවර්ධනයේ විෂමතාවයට පිළියමක් වශයෙන් කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම මූලික අවශ්‍යතාවයක් ලෙස රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති තුලින් හඳුනාගෙන ඇත. රට තුල ජීවත්වන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම උදෙසා රජය විසින් නිරන්තරයෙන් ආයෝජනයන් සිදුකරනු ලබන අතර, ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලීම උදෙසා මහා මාර්ග අංශය සඳහා සමස්තයක් ලෙස ඉතා ඉහළ ආයෝජනයක් සිදුකරනු ලැබේ. ඒ අනුව ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ගද ඇතුලත්ව රටේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් මඟී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම, මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මෙම අංශය සඳහා සිදුකරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය වටිනාකමක් උත්පාදනය කරනු ලබන බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකාවේ ජාතික මහා මාර්ග ජාලය 2022 වර්ෂය අවසන් වන විට ආසන්න වශයෙන් කි. මීටර් 12,536 කින් යුක්ත වන අතර එය "ඒ" ශ්‍රේණියේ මහා මාර්ග දුර කි. මීටර් 4,217 කින් ද, "බී" ශ්‍රේණියේ මහා මාර්ග දුර ආසන්න වශයෙන් කි. මීටර් 8,007 කින්ද, ගාස්තු අය කරන මහා මාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි. මීටර් 312 කින්ද, පාලම් 4,254 කින්ද සමන්විත වේ.




රූපසටහන 31 - ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය

2022 ජූලි 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රවාහන අමාත්‍යාංශය, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය සහ මහාමාර්ග අමාත්‍යාංශය යන අමාත්‍යාංශ වල විෂය පථයන් ඒකාබද්ධ කර ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය ලෙස එදින සිට ක්‍රියාත්මකව තිබුණි.

2022 වර්ෂයේදී එක් එක් අංශයේ වාර්ෂික ඇස්තමේන්තු අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකළ යුතුව තිබුණි.

### මහාමාර්ග අංශය

- මාර්ග හා මහා මාර්ග විෂයයට සහ සංස්ථාපිත ආයතන වලට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ සම්බන්ධ කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහා මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- අධිවේගී මාර්ග ගාස්තු නියම කිරීම, රැස්කිරීම හා නියාමනය කිරීම.
- රජයේ ප්‍රමුඛතාවය සහ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගනිමින් ප්‍රාදේශීය සහ පළාත්පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ වැඩසටහන් හා ව්‍යාපෘති සකස්කර ඒවා සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
- ඉහත සඳහන් ආයතන සහ එම ආයතන වලට අදාල සියළු විෂයයන්ට අයත් කටයුතු අධීක්ෂණය කිරීම.

### ප්‍රවාහන අංශය

ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නවතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම මෙම අංශයේ මෙහෙවර වී තිබුණි. එම මෙහෙවර ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.
- පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.
- දුම්රිය හා බස්රථ නැවතුම් පොළවල් ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.

- දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම.
- බස්රථ නිෂ්පාදනය හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.
- තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පළවල් වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම.
- වත්මන් බස් සංචිත ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස්රථ හඳුන්වා දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහනයට අනුකූල කර ගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- දුම්රිය මැදිරි, බස් රථ, මොටර් රථ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවයක් ගොඩනැගීම.
- පාසල් බස්රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම.
- මගී හා ප්‍රවාහන සේවය ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම.
- රියදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත් කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම.

## ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් අංශය

ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන් පුළුල් දැක්මකින් සහ ඉලක්කගත ප්‍රවේශයක් ඔස්සේ මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ. ඒ සඳහා නව ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා පසු විපරම් කිරීම ප්‍රධාන වශයෙන් මෙම අංශය මඟින් ඉටුකිරීම අරමුණු විය . ඒ අනුව මෙම අංශය මඟින් පහත ප්‍රධාන අරමුණු ඉටුකිරීම අපේක්ෂා කෙරේ.

- ග්‍රාමීය මාර්ග පාලම් සහ ඒ හා බැඳුනු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ක්‍රමවේද තාක්ෂණයන් සහ යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම.

- ග්‍රාමීය ප්‍රජාව තුල රැකියා සහ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.
- ප්‍රමුඛතාවය අනුව හඳුනාගනිමින් ග්‍රාමීය මාර්ග, පාලම් හා අනෙකුත් යටිතල පහසුකම් කාර්යක්ෂමව සංවර්ධනය කිරීම.

2022 වර්ෂයේදී ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වැය ශීර්ෂය සඳහා රු.මිලියන 272,062 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 214,962 ක් උපයෝජනය කර තිබුණි. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා 2022 වර්ෂය හා ඊට පෙර වසර 05 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය, වියදම් කළ ප්‍රමාණය හා ඉතිරිය රූපසටහන 32 හි දැක්වේ.




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදන (රු.මිලියන) | 242,202 | 218,534 | 284,665 | 298,027 | 410,118 | 272,062 |
| වියදම (රු.මිලියන) | 214,043 | 185,920 | 177,644 | 258,646 | 230,297 | 214,962 |
| ඉතිරිය (රු.මිලියන) | 28,160 | 32,614 | 107,021 | 39,382 | 179,821 | 57,099 |

රූපසටහන 32 පසුගිය වසර 6 ක කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශයට ලබාදී තිබුණු ප්‍රතිපාදන, උපයෝජනය සහ ඉතිරිය
මූලාශ්‍ර - වාර්ෂික කාර්ය සාධන වාර්තා

2017 සිට 2021 දක්වා වූ ඉකුත් වසර 05 ක කාලය තුල ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණු සමස්ථ ප්‍රතිපාදනය රු.මිලියන 1,453,546 ක් වූ අතර සමස්ථ වියදම රු.මිලියන 1,066,550 ක් වූයෙන් උපයෝජනය කර නොතිබුණු ප්‍රතිපාදන රු. මිලියන 386,996 ක් විය.

### රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය

- කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා මාර්ගයක් කණුමතින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී අවසන් කර වසර 15 ක් ආයෝජකයකු විසින් පවත්වාගෙන යාමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය සැලසුම් කිරීම - ගොඩනැගීම - මූල්‍යනය - ක්‍රියාත්මක කිරීම - නඩත්තු කිරීම සහ පැවරීමේ (DBFOMT) පදනම මත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් (PPP) ලෙස

ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 193,000 ක් වූ අතර යෝජිත ප්‍රධාන මංතීරුවේ දිග කි.මී. 16.4කි. 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදල් වලින් වැය කරන මුදල රු.මිලියන 1,182 ක් වූ අතර, 2023 ජනවාරි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව තීරණය කර තිබුණි.

- ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 54,695 ක් වූ රුවන්පුර අධිවේගී මාර්ගයේ ව්‍යාපෘති කටයුතු 2016 වර්ෂයේදී ආරම්භකර තිබුණි. ඒ අනුව කහතුඩුව අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා දුර කි. මීටර් 76 ක් සහ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටසේ කි. මීටර්. 24.3 ක් ඉදිකිරීම් කටයුතු සඳහා 2021 මැයි 03 දින ඉදිකිරීම් සමාගම වෙත භාරදී තිබුණි. අදාල ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද එම ඉදිකිරීම් ආරම්භ කර වර්ෂයකට පසුව බිල්පත් සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් 2022 මැයි 10 දින සිට කොන්ත්‍රාත්කරු ඒක පාර්ශවිකව ඉදිකිරීම් කටයුතු නතරකර තිබුණි. ඉදිකිරීම් සමාගම වෙත අත්තිකාරම් වශයෙන් වැටි බදු සහිතව රු.මිලියන 3,012 ක් 2022 පෙබරවාරි 18 දින ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ලබාගත් ණය මුදලකින් ගෙවා තිබූ අතර කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් නතර කිරීම නිසා ඉහත මුදල් නිරවුල් කරගත නොහැකි වී තිබුණි.

## බෙස්ලයින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර

- බෙස්ලයින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර 2009 දී ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසානයට වසර 13 ක් ඉක්ම ගොස් තිබුණද, ප්‍රමුඛතාව ලබාදී ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක් නොවන බවට සලකා ව්‍යාපෘතිය නවතා දැමීමට මෙගා ව්‍යාපෘති සමාලෝචනය හා කඩිනම් කිරීමේ කමිටුව විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද ඉඩම් පවරා ගැනීමේ කටයුතු දිගටම කරගෙන යාම මාර්ග සංවර්ධන අධිකාරියට පැවරී තිබුණි. 2023 ජනවාරි මාසයේදී ව්‍යාපෘතිය අවසන් කරන අවස්ථාව වන විටත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ව්‍යාපෘති කළමණාකරන ඒකකය සඳහා පිළිවෙලින් රු. මිලියන 3,720 ක් සහ රු. මිලියන 49 ක් වැය කර තිබුණි.

## විකල්ප මාර්ග කි.මී 100,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන

- විගණනය මගින් පෙන්වා දී තිබූ කි. මීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ සකස් කර තිබූ ඉංජිනේරු අධි ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා

නිවැරදි කිරීම කරන ලෙස අධිකාරිය වෙත හා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුම් දී තිබුණි. තවද, අවස්ථා කිහිපයකදීම අධිතක්සේරු කරන ලද කොන්ත්‍රාත් ඇස්තමේන්තු වටිනාකම් සංශෝධනය කර අවසන් බිල්පත් ගෙවීම සිදු කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දැනුම් දී තිබුණි. කෙසේ වුවද පසුව, 2021 අප්‍රේල් 27 දිනට පෙර අත්සන් කරන ලද කොන්ත්‍රාත් වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකමත් ඉන් පසු අත්සන් කරන ලද කොන්ත්‍රාත් සඳහා සත්‍ය වශයෙන් සිදුකළ වැඩ අනුව ගෙවීමටත් අමාත්‍යාංශ ලේකම් මගින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් අධි ඇස්තමේන්තු මත 2022 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 115,435 ක් ගෙවීම විගණනයේ දී මතභේදාත්මක විය.

- 2022 දෙසැම්බර් 31 දින වන විට දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි.මීටර් 100,000ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කරන ලද සමස්ත මාර්ග දුර ප්‍රමාණය කි.මී.17,847 ක් වූ අතර වැඩ නිමකර තිබූ ප්‍රමාණය කි.මී. 6,298 ක්ද විය. තවදුරටත් කෙරීගෙන යන ප්‍රමාණය කි.මී.11,549 ක් විය. මෙම කාර්යයන් සඳහා රු. මිලියන 142,821 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවා තිබූ අතර එදිනට ගෙවීමට ඇති අතැති බිල්පත්වල වටිනාකම රු.මිලියන 16,810 ක් විය. මෙම වියදම් පියවීම සඳහා දේශීය බැංකු වෙතින් රු.මිලියන 43,205 ක් ද අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ රු. මිලියන 68,263 ක් ද, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් රු. මිලියන 35,940 ක්ද ලබාගෙන තිබුණි.

- කුරුණෑගල, පොළොන්නරුව සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල පමණක් ක්‍රියාත්මක කර තිබුණු මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 42 ක මාර්ග 119 කට අදාළව ඇස්තමේන්තු සකස් කිරීමේ දී ප්‍රධාන වැඩ විෂයන්හි මිල අනුපාත අධිගණනය වීම, අමුද්‍රව්‍ය ප්‍රවාහන දුර සත්‍ය දුරට වඩා වැඩි වීම, ව්‍යාපෘති අධීක්ෂණ පිරිවැය සහ පරිපාලන පිරිවැය ඉහළ අනුපාතයකින් දැක්වීම, අමුද්‍රව්‍ය අපතය සඳහා අසාමාන්‍ය වටිනාකම් ඇතුළත් කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 220 කින් අධිගණනය වී තිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක වැඩ පූර්ව අත්තිකාරම් ලබා දිය හැකි වේ. එහෙත් මහ නැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබූ කොන්ත්‍රාත් වැඩ ඇණවුම් 1,753 ක් සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලබා දීමේදී වැඩ ඇණවුම් 16 කට අදාළව පමණක් වැඩ පූර්ව අත්තිකාරම් සුරක්ෂණ ලබා ගෙන තිබුණි.

මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන්ට වැඩ අත්තිකාරම් ලබාදීමේදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගෙන තිබුණු රු. මිලියන 590 ක්වූ වැඩ අත්තිකාරම් සුරක්ෂණ 26 ක වලංගු කාලය සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉකුත්ව තිබුණි. නමුත් වැඩ අවසන් නොකල හා වැඩ අතර මග නතර කර ඇති මාර්ග වලට අදාල වැඩ අත්තිකාරම් සුරක්ෂණ වල වලංගු කාලසීමාව දීර්ඝ කර ගැනීමට හෝ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් විගණිත දිනය වූ 2023 මාර්තු 15 දින වන විට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ වැඩ පූර්ව අත්තිකාරම් රු. මිලියන 399 ක් ආපසු අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

- නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ පරිදි කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මහනැගුම ඉදිකිරීම් සමාගම වෙත පවරන ලද පිරිවැය රු.මිලියන 1,736 ක්වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 74 ක් වැඩ ආරම්භ කර නොතිබූ අතර පුත්තලම දිස්ත්‍රික්කය තුළ මාර්ග 124 ක වැඩ ආරම්භ කර නොතිබුණි. තවද පුත්තලම දිස්ත්‍රික්කය තුළ මාර්ග 20 ක් සංවර්ධනයට රු.මිලියන 5,291 ක්ද පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ මාර්ග 10 ක් සංවර්ධනයට රු.මිලියන 377 ක්ද වැය කර තිබූ නමුත් එම ඉදිකිරීම්ද පුත්තලම දිස්ත්‍රික්කය තුල මාර්ග 208 ක සංවර්ධන කටයුතුද අතරමඟ නතර කර තිබුණි. මේ හේතුවෙන් මාර්ග භාවිතා කරන මහජනතාව අපහසුතාවයට පත්ව තිබූ අතර සංවර්ධන කටයුතු සඳහා ගෙන එන ලද අමුද්‍රව්‍ය අනාරක්ෂිතව පැවතුණි.

- මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ ABC අතුරා සංවර්ධනය කර තිබුණු වටිනාකම රු.මිලියන 62.74 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 10 ක ඇතිරූ ABC සම්පූර්ණයෙන්ම ගැලවී ඉවත්වීම නිසා මාර්ග , සංවර්ධනය කිරීමට පෙර පැවති තත්වයටම පත් වී ඇති බවත්, මාර්ගය ගමනාගමනයට භාවිතා කල නොහැකි තත්වයට පත්ව තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ එකතුව රු. මිලියන 17 ක් නිෂ්කාර්යය වියදම් වී තිබුණි.

### මධ්‍යම අධිවේගී මාර්ග – IV ව්‍යාපෘතිය

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 04 කොටසේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2016 වර්ෂයේ දී ස්ථාපිත කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 551 ක් වැය කර තිබුණද 2022 පෙබරවාරි 28 ව්‍යාපෘති කටයුතු අවසන් වන විටත් ව්‍යාපෘතියේ සිවිල් වැඩ ආරම්භ කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය ඇවර කිරීමට තීරණය කර තිබුණි.

### ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් අංශය

- සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.මිලියන 1,496 ක ප්‍රතිපාදන වලින් රු. මිලියන 616 හෙවත් සියයට 41 ක් උපයෝජනය කිරීමට අසමත් වී තිබුණි. එමෙන්ම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට 2022 වර්ෂය සඳහා රු.මිලියන 5,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර නව මාර්ග වැඩසටහන් ආරම්භ කර නොතිබුණු බැවින් ලැබී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 72 ක්හෙවත් රු. මිලියන 3,603 ක හිඟ බිල්පත් ගෙවීම සඳහා උපයෝජනය කරගෙන තිබුණි.

- වාහන ගමනාගමනය කල හැකි පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,204 ක් වූ පාලම් 463 ක් ඉදිකිරීම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම පාලම් අතුරින් පාලම් 52ක් සම්පූර්ණ කර තිබූ අතර ඉදිකිරීම් ආරම්භකර නොතිබුණු පාලම් ගණන 175 ක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 25 ට අඩු පාලම් 96 ක්ද, සියයට 25 ත් 50 ත් අතර වූ පාලම් 46 ක්ද පැවතුණි.

- අඩු පිරිවැය පාලම් ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 1,500 ක් වූ පාලම් 1,000 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට පාලම් 22 ක වැඩ පමණක් අවසන් කර තිබුණු අතර පාලම් 11 ක ඉදිකිරීම ආරම්භකර තිබුණි.

- ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා දිවයින පුරා හඳුනාගත් පිරිවැය රු.මිලියන 35,497 ක් වූ ග්‍රාමීය මාර්ග 38,718 ක් සංවර්ධනය කිරීම සඳහා ඉදිකිරීමේ කොන්ත්‍රාත් පළාත් පාලන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට ග්‍රාමීය මාර්ග 6,423 ක කොන්ත්‍රාත් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 16 ක පහළ අගයක් විය. එමෙන්ම එහි කළ වැඩවල වටිනාකම රු. මිලියන 6,394 ක් වී තිබුණි.

### මාර්ග සංවර්ධන අධිකාරිය

- අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දින වන විට දේශීය බැංකු මඟින් ලබාගත් ණය වලින් ආපසු ගෙවීමට ඇති ණය ශේෂය රු.මිලියන 356,059 ක් වූ අතර, ණය ලබාගැනීම නිසා වසර 05 ක කාලය තුළ දේශීය වාණිජ බැංකු වෙත ගෙවීමට සිදු වී තිබුණු පොලී ප්‍රමාණය රු.මිලියන 108,970 ක් වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය පොලිය රු.මිලියන 37,669 ක් ද ගෙවිය යුතු ණය වාරික වටිනාකම රු.මිලියන 2,502 ක් ද විය.

- දේශීය බැංකු මඟින් ලබාගත් ණය මුදල් සඳහා ණය පොලිය සහ වාරිකය ලෙස 2022 දෙසැම්බර් 31 දිනට හිඟව තිබුණු මුදල් පියවීම සඳහා භාණ්ඩාගාරයට ප්‍රතිපාදන ලබාදීමට නොහැකිවීම මත රු.මිලියන 36,672 ක භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කර තිබුණි. තවද දේශීය බැංකු මඟින් ණය ලබාගැනීමට අමතරව මාර්ග කි.මී. 100,000 යේ වැඩසටහනට අදාලව මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්තරුවන් 36 දෙනෙකු වෙත ගෙවීමට තිබූ රු. මිලියන 32,218 ක් සඳහාද 2022 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබුණි.

- අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග 285 කට අයත් කිලෝමීටර් 3,267 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 8958 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, මෙය සමස්ත මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 73 ක ප්‍රතිශතයක් විය.

- අධිකාරිය විසින් ඉදිකිරීම් ව්‍යාපෘතීන් 10 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ අත්තිකාරම් මුදල්වල වටිනාකම රු.මිලියන 45,812 ක් වූ අතර, එම වටිනාකම් තුළ ව්‍යාපෘති 05 කට අදාළව ලබා දී තිබූ රු.මිලියන 15.53 ක අත්තිකාරම් 2015 වර්ෂයට පෙර ලබා දී තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ශේෂ නිරවුල්කර ගෙන නොතිබුණි. තවද, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III සහ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සඳහා එකතුව රු.මිලියන 39,976 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර, අදාළ ව්‍යාපෘති 03 හි වැඩ අතරමඟ නතර කර තිබුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 45,812 ක අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී තිබුණි.

### මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම්

- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමක් වන සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2015 ගිණුම් වර්ෂයෙන් පසුව මේ දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමක් වන සී/ස මහනැගුම ඉමල්ෂන් (පුද්ගලික) සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 99 ක් මාර්ග සංවර්ධන අධිකාරිය සතු බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල මාර්ග සංවර්ධන අධිකාරියට හා තවත් පෞද්ගලික පාර්ශවයකට සියයට 50 බැගින් සමාගමේ කොටස් හිමිකම පවතින බව සඳහන් කර තිබුණි.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් පරිපාලිත සමාගම් 04 ඒ අනුව කටයුතු කර නොතිබුණි.
- 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 අනුව අධිකාරිය සතු පාලිත සමාගම් 04 ඇවර කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අදාල සමාගම්වල අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්වයක පැවතුණි.

# ඉදිකිරීම් සහ ඉංජිනේරු අංශය

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
    - ව්‍යවස්ථාපිත ගෙවීම් හා ණය හා පොලී ගෙවීම පැහැර හැරීම
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
    - ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව අඩුවීම
    - ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම අධිකාරිය වෙත පවරා නොගැනීම්
    - නිශ්ක්‍රිය මුදල් ශේෂයක් ජංගම ගිණුමක පවත්වාගෙන යාම
    - වැඩිපුර ගෙවා තිබූ ඉන්ධන දීමනාව අයකර ගෙන නොතිබීම
    - අනුමැතියකින් තොරව හා ගාස්තු අයකිරීමකින් තොරව නේවාසිකාගාරයක් උපයෝජනය කිරීම
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
    - ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබීම.
    - ව්‍යාපෘති සඳහා වියදම් දැරීමෙන් පසු නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබීම.
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
    - ව්‍යාපෘති අතරමග නවතා දමා තිබීම
- සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
    - සාවද්‍ය ලෙස ඉන්වොයිස්පත් නිකුත් කර විකුණුම් වටිනාකම වැඩිකර දැක්වීමට කටයුතු කිරීම
    - හවුල්කාර සමාගමකින් මුදල් අයකරගෙන නොතිබීම.
- ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය
    - කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම

- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
    - බදු ගෙවීම පැහැර හැරීම
    - නිල නිවාස සංකීර්ණය නිලධාරීන් නොවන බාහිර පාර්ශවයන් විසින් භාවිතා කිරීම
- මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික ) සමාගම
    - සම්පූර්ණයෙන් වැඩ නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් මෙහෙයුම් අලාභයන් ලබා තිබීම
    - ව්‍යාපෘති ප්‍රමාද වීම නිසා ප්‍රමාද වන්දි ගෙවීමට සිදු වීම
- රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
    - කොන්ත්‍රාත් ආදායම අඩුවීම
    - ගෙවිය යුතු මුදල් නිදහස් නොකිරීම
- ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල
    - සුරැකුමක් තබානොගෙන සේවායෝජකයන් වෙත නිතුක් කළ ඇප සඳහා අරමුදල විසින් ගෙවූ මුදල් නැවත අය වී නොතිබීම
    - කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර මුදල්  මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබීම
    - කළමනාකරණ තොරතුරු පද්ධතියක්  ස්ථාපනය කර නොතිබීම

# ඉදිකිරීම් සහ ඉංජිනේරු අංශය

2022 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව ඉදිකිරීම් අංශයේ එකතු කළ අගය 2021 වර්ෂයේදී සියයට 4.4 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය සියයට 20.9 කින් පහත වැටී තිබුණි. ඉන්ධන සහ අමුද්‍රව්‍ය නොමැතිවීම, ගොඩනැගිලි ද්‍රව්‍ය පිරිවැය ඉහළ යාම, සැපයුම්කරුවන් භාණ්ඩ ණය පදනමට ලබාදීම සීමා කිරීම වැනි හේතූන් සහ රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සඳහා ගෙවීම් ප්‍රමාදවීම ප්‍රධාන වශයෙන් මෙයට බලපා තිබුණි.

ඉදිකිරීම් සහ ඉංජිනේරු අංශයට අයත් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සහ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය යන ආයතන 06 නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම වාරිමාර්ග අමාත්‍යාංශය යටතේද රාජ්‍ය ඉදිකිරීම් සහ නිර්මාණ නීතිගත සංස්ථාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේද ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යටතේද පිහිටුවන ලද ආයතන වේ.

### මෙම ආයතනවල මූලික අරමුණු සහ කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහාද, ඉදිකිරීම් සම්බන්ධව ජාතික උපදේශන සභාව පිහිටුවීම යනාදිය පිළිබඳ විධිවිධාන සැලැස්වීම ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම හා ශ්‍රේණිගත කිරීම
- ගොඩනැගිලි උපාංග නිෂ්පාදනය, යාන්ත්‍රික හා විදුලි කටයුතු, ඉංජිනේරුමය කාර්යයන් සහ උපදේශන කටයුතු
- රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම,ගොඩනැගිලි සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම, රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
- නිෂ්පාදන, ඉදිකිරීම්, අලුත්වැඩියා සහ නඩත්තු, හා යාන්ත්‍රික ඉංජිනේරු උපදේශන සේවා සැපයීම
- ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මක භාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා

උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම

- ඉදිකිරීම් කටයුතු වල නිරතව සිටින්නන්ගේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම හා ජාතික ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය දිරිගැන්වීම
- ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහුවිධ උපදේශන සේවාවන් සැපයීම හා ඉදිකිරීම්, උපදේශන සේවා සහ ඉංජිනේරුමය සේවා කටයුතු
- පාලම්, මහා මාර්ග, ජලාශ, වාරිමාර්ග පද්ධති, ජල විදුලි බලාගාර, උමං හා ඇල මාර්ග, ජල සැපයීම් ව්‍යාපෘති, ගොඩනැගිලි හා ඉදිකිරීම් වැනි ඉංජිනේරුමය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ව්‍යවස්ථාපිත ගෙවීම් හා ණය හා පොලී ගෙවීම පැහැර හැරීම

2022 දෙසැම්බර් 31 දිනට දින වන විට සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් හා ඒ මත අධිභාර රු. මිලියන 877 ක් ද එකතු කළ අගය මත බදු රු. මිලියන 1,296 ක් හා එම මත පනවා ඇති අධිභාරය රු. මිලියන 803ක් ද වූ ව්‍යවස්ථාපිත ගෙවීම් සංස්ථාව විසින් 2023 අගෝස්තු 18 වන විටද ගෙවා නොතිබුණි. තවද, සංස්ථාවේ දේපළ හා භාණ්ඩාගාර ඇප මත රාජ්‍ය බැංකුවලින් ලබා ගෙන තිබූ ණය මුදල වූ රු. මිලියන 2,737ක් හා ඊට අදාළව ගෙවිය යුතු වූ පොළි වූ රු. මිලියන 1,136ක් ද 2022 වර්ෂය අවසානය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව අඩුවීම

2022 වර්ෂය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉලක්කය 1090 වුවත් ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 1,618 ක් වී තිබුණි. මේ අතරින් නව ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 445 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 945 න් අඩුවී තිබුණි.

### ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම අධිකාරිය වෙත පවරා නොගැනීම්

අධිකාරිය විසින් රු. මිලියන 306 ක් වැය කර පැලවත්ත, බත්තරමුල්ලේ ඉදිකර තිබූ ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

### නිශ්ක්‍රිය මුදල් ශේෂයක් ජංගම ගිණුමක පවත්වාගෙන යාම

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් ජංගම ගිණුමක රු.මිලියන 307 ක සාමාන්‍ය මුදල් ශේෂයක් නිෂ්ක්‍රියව පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තැන්පත්කර තිබුණි. මේ හේතුවෙන් සාමාන්‍ය පොළී අනුපාතිකය මත ගණනය කිරීමේදී අධිකාරියට ආසන්න වශයෙන් රු. මිලියන 149 ක පොළී ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.

### වැඩිපුර ගෙවා තිබූ ඉන්ධන දීමනාව අයකර ගෙන නොතිබීම

2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිළධාරීන් 06 දෙනකු විසින් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ඉන්ධන ලීටර් 12,789 ක් භාවිතාකර තිබුණි. ඒ අනුව වැඩිපුර වැයකරන ලද වටිනාකම වූ රු. මිලියන 1.6 ක මුදලක් මෙතෙක් ආපසු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### අනුමැතියකින් තොරව හා ගාස්තු අයකිරීමකින් තොරව නේවාසිකාගාරයක් උපයෝජනය කිරීම

බත්තරමුල්ලෙහි පිහිටි අධිකාරියට අයත් නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ පුහුණුව ලබන සිසුන්ගේ නේවාසික පහසුකම් සඳහා කාමර 08 කින් යුක්ත නේවාසිකාගාරයේ කාමර 05 ක අධිකාරියේ කාර්ය මණ්ඩලය හා රේඛීය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිසි අනුමැතියකින් තොරව හා ගාස්තු අයකිරීමකින් තොරව නවාතැන් ගෙන තිබීම.

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබීම

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් 2022 වර්ෂයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ අමාත්‍යාංශය කම්කරු අමාත්‍යාංශ ගොඩනැගිල්ලට රැගෙන යාමේ ව්‍යාපෘතිය, කළුතර කර්මාන්තපුරයේ ඉදිකිරීම්, කයිතඩි ආයුර්වේද රෝහල ඉදිකිරීම්, මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම යනාදී රු.මිලියන 244.23ක් වටිනා ව්‍යාපෘති 09 ක් ගිවිසුම් ගත වීමෙන් පසු වැඩ ආරම්භ කිරීමට දීර්ඝ කාලයක් ගත කිරීම නිසා කොන්ත්‍රාත් මුදල වැඩ ඇස්තමේන්තුව ඉක්මවීම සහ අමුද්‍රව්‍ය හා ඉන්ධන හිඟය යනාදී හේතු නිසා නිම නොකර අත්හැර දමා තිබුණි.

### ව්‍යාපෘති සඳහා වියදම් දැරීමෙන් පසු නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 05 ක කාලසීමාව තුළ පිරිනමන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 23ක්, රු.මිලියන 659ක වියදම් දැරීමෙන් පසු නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. මෙයින් ව්‍යාපෘති 20 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත අමාත්‍ය මණ්ඩලය විසින් ඍජුවම ප්‍රදානය කරන ලද ව්‍යාපෘති වේ. එක් ව්‍යාපෘතියක් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුනද එම ව්‍යාපෘතියද අතහැර දමා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබූ රු.මිලියන 1.37 ක් වූ අත්තිකාරම් මුදලද වෙනත් ව්‍යාපෘතියක් වෙනුවෙන් හිලව් කර තිබුණි.

### රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

### ව්‍යාපෘති අතරමග නවතා දමා තිබීම

2022 වර්ෂයේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්ගෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 245ක් වූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ විදුලි ලාම්පු කණු 191 ක් සැපයීම, ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ බද්දේගම ජලසම්පාදන පද්ධතිය පිළියෙල

කිරීම, උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ සකස් කළ හැකි ඇඳන් 20 ක් අළුත්වැඩියා කිරීම සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ යකඩ පාලම පිළිසකර කිරීම යන ව්‍යාපෘති 04 අත්තිකාරම් මුදල් ලබා නොදීම, යාවත්කාලීන කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය නොලැබීම වැනි හේතු මත අතරමග නතර කර තිබුණි.

### සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

### සාවද්‍ය ලෙස ඉන්වොයිස්පත් නිකුත් කර විකුණුම් වටිනාකම වැඩිකර දැක්වීමට කටයුතු කිරීම

අග්‍රාමාත්‍ය සහ පස්වන විධායක ජනාධිපති නිලනිවසේ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සඳහා සමාගම විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද පරිගණක විකුණුම් වාර්තාව අනුව 2021 මාර්තු 26 දින සිට 2023 ජූනි 07 දින දක්වා රු. මිලියන 780 ක් වූ විකුණුම් වෙනුවෙන් ඉන්වොයිස්පත් 2,197 ක් නිකුත්කර තිබුණි. එසේ වුවද 2023 ඔක්තෝබර් 06 දින සමාගමෙහි සහකාර අලෙවි කළමනාකරු විසින් ලබාදුන් උපලේඛණය ප්‍රකාරව මේ වෙනුවෙන් නිකුත්කර තිබුණු ඉන්වොයිස් සංඛ්‍යාව 575 ක් වූ අතර වටිනාකම රු.මිලියන 1,158 ක් විය. මින් රු. මිලියන 559 ක් වෙනුවෙන් විකුණුම් ඉන්වොයිස් 98 ක් සාවද්‍ය ලෙස නිකුත් කර විකුණුම් වටිනාකම වැඩිකර දැක්වීමට කටයුතු කර පසුව ඒවා අවලංගු කළ යුතු බවට හඳුනාගෙන තිබුණි.

### හවුල්කාර සමාගමකින් මුදල් අයකරගෙන නොතිබීම

රටෙහි විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ආනයන සීමා පනවා ඇති අවස්ථාවක වෙළඳපලෙහි ටයිල් හිඟය අවම කර ගැනීමේ අරමුණින් රාජ්‍ය සමාගමක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට පමණක් ටයිල් ආනයනය කර විකිණීමේ අවසර ලබා දී තිබියදී ඒ සඳහා සම්බන්ධ කරගෙන තිබූ හවුල්කාර සමාගම විසින් මුදල් බැංකුවේ තැන්පත් කළ පසු සැපයුම්කරුවන් සඳහා මුදල් ගෙවීමට ගිවිසුම් ගත වී සිටියද සමාගමෙහි බැංකු ගිණුමින් වියදම් කර තිබූ රු. මිලියන 64 ක් අය කර ගෙන නොතිබුණි.

### ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය

### කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම

මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණ බැවින් සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර ඉන් නිලධාරීන් 16 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට 17 දක්වා කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

### බදු ගෙවීම් පැහැර හැරීම

2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7 (2) වගන්තිය අනුව කාර්යාංශය විසින් 1996 සිට 2007 කාලපරිච්ඡේදයන්ට අදාළව නොගෙවූ ආදායම් බදු, වැට් සහ උපයන විට ගෙවීම් බදු ඇතුළු අනෙකුත් බදු සහ අදාළ දඩ මුදල් එකතුව රු.මිලියන 82 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් පැහැර හැර තිබුණි.

### නිල නිවාස සංකීර්ණය නිලධාරීන් නොවන බාහිර පාර්ශවයන් විසින් භාවිතා කිරීම

කාර්යාංශය සතුව කොළඹ 07, සරණ පාරේ පිහිටි නිවාස ඒකක 15 කින් සමන්විත නිල නිවාස සංකීර්ණය පිහිටි ඉඩමේ 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 960 ක් ද ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 6.68 ක් ද විය. මෙම නිල නිවාස 15 න් නිල නිවාස 05 ක් කාර්යංශයේ නිලධාරීන් නොවන බාහිර පාර්ශවයන් විසින් භාවිතා කිරීමට ඉඩ සලසා තිබුණි.

## මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික ) සමාගම

### සම්පූර්ණයෙන් වැඩ නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් මෙහෙයුම් අලාභයන් ලබා තිබීම

මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගමේ සම්පූර්ණයෙන් වැඩ නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් 2022, 2021 සහ 2020 වර්ෂයන් හි දී පිළිවෙළින් රු.මිලියන 667, රු.මිලියන 888 ක සහ රු.මිලියන 973 ක මෙහෙයුම් අලාභයන් ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 47 කින් රු.මිලියන 434 ක අලාභයක් ලබා තිබුණි.

### ව්‍යාපෘති ප්‍රමාද වීම නිසා ප්‍රමාද වන්දි ගෙවීමට සිදු වීම

ව්‍යාපෘති 59 කට අදාලව රු. මිලියන 69 ක් ප්‍රමාද වන්දි ලෙස සේවායෝජකයින් විසින් බිල්පත්වලින් අඩුකර ගෙන තිබුණි. එම ව්‍යාපෘති තුල වූ ව්‍යාපෘති 47 ක් සඳහා 2023 ජූනි 30 දින වන විටත් ඉල්ලුම් කළ කාලය දීර්ඝ කර ගැනීම් වෙනුවෙන් අනුමැතීන් ලැබී නොතිබූ අතර ව්‍යාපෘති 07 කට අදාලව අඩු කල ප්‍රමාද වන්දි මුදල වූ රු. මිලියන 2.1 ක් නැවත අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

### කොන්ත්‍රාත් ආදායම අඩුවීම

සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් ආදායම් රු.මිලියන 2,060 ක් වූ අතර, එය පසු ගිය වර්ෂයේදී රු.මිලියන 3,371 ක් වූ බැවින් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් ආදායම රු.මිලියන 1,311 කින් එනම් සියයට 39 කින් අඩුවී තිබුණි.

### ගෙවිය යුතු මුදල් ගෙවීම් නොකිරීම

සංස්ථාව විසින් සංස්ථාවේ දේපළ හා භාණ්ඩාගාර ඇප මත බැංකුවලින් ලබාගෙන තිබෙන රු.මිලියන 1,848 ක ණය මුදලක්ද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.මිලියන 1,474ක් හා එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම මත

පනවා ඇති අධිභාරය රු.මිලියන 928 ක්ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නොගෙවා පැවතුණි.

### ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල සුරැකුමක් තබානොගෙන සේවායෝජකයන් වෙත නිතුක් කළ ඇප සඳහා අරමුදල විසින් ගෙවූ මුදල් නැවත අය වී නොතිබීම

අරමුදල විසින් කිසිදු සුරැකුමක් තබානොගෙන ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ඇපකර නිකුත් කරන අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය අඩුවන අවස්ථාවලදී සේවායෝජකයන් ඇපකර මුදල් අරමුදලෙන් ඉල්ලුම් කරනු ලබන අතර සේවායෝජකයන් වෙත අරමුදල විසින් ගෙවා තිබූ එකතුව රු.මිලියන 113 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට නැවත අරමුදලට අයකර ගත යුතුව පැවතුණි.

### කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර මුදල් මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබීම

කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සිදු කරන කොන්ත්‍රාත්කරුවන් 290 කගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2022 වසර තුළ අරමුදල වෙත රු.බිලියන 31 ක් ලබාදී තිබුණු අතර එයින් රු.බිලියන 30 ක් කොන්ත්‍රාත් වෙනුවෙන් නිදහස් කර තිබුණි. මෙම ඉතිරි මුදලද ඇතුලත්ව මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය වෙතින් කොන්ත්‍රාත්වන්ට මුදාහැරීමට ලබා දී තිබූ නමුත් කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර රු.මිලියන 279 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙම මුදලින් රු.මිලියන 127 ක් වසර 01 ක කාලයක සිටද, රු.මිලියන 147 ක් වසර 1 ත් 2 ත් අතර කාලයක සිටද, රු.මිලියන 6 ක් වසර 02 ට වැඩි කාලයක සිටද රඳවාගෙන තිබුණි. තවද, සංකීර්ණ සහ අවදානම් වැඩි ලෙස හඳුනාගෙන තිබුණු ඉහත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ අරමුදල විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

### කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර නොතිබීම

අරමුදල සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කර සංවර්ධනය කිරීම සඳහා අරමුදල විසින් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ රු.මිලියන 2.98 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම පරිදි පළමු වාරිකය සහ සංවර්ධනය කිරීමෙන් පසු ගෙවිය යුතු දෙවන වාරිකයද වශයෙන් එකතුව රු. මිලියන 2.08 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70 ක් 2015 සහ 2016 වර්ෂවල දී අදාළ ආයතනය වෙත ගෙවා තිබුණි. මුදල් ගෙවා වර්ෂ 07 ක් පමණ ගත වුවද 2023 මාර්තු 31 වන දින දක්වාම මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීම අවසන් කර නොතිබුණි.

# ගුවන් සේවා අංශය

## විගණන නිරීක්ෂණ

- සිවිල් ගුවන් සේවා අධිකාරිය
    - රජයේ ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම
    - සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම
    - අත්හැර දැමූ ව්‍යාපෘති
    - බදු කුළී අය කිරීමකින් තොරව වත්කම් භාවිතය සඳහා අවසර ලබා දී තිබීම
    - ගුවන් තොටුපළවල් සහ ගුවන් යානා පහසුකම් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබීම
- සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ එහි පරිපාලිත සමාගම්
    - සමාගමේ අඛණ්ඩ පැවැත්ම
    - වර්තමාන ගුවන් යානා ඇණිය
    - ණය මුදල් ආපසු නොගෙවීම
    - අයවිය යුතු මුදල්
- ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
    - ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් නොකිරීම
    - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II - පියවර II ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීම

# ගුවන් සේවා අංශය

රජයේ පවතින ප්‍රතිපත්තිවලට අනුකූලව සහ විවිධ අවස්ථාවල ලබා දෙන මහපෙන්වීම් අනුව වරාය, නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍රයට හා ඒ හා සම්බන්ධ ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යය වන අතර ගුවන් සේවා ක්ෂේත්‍රයට අදාළ සිවිල් ගුවන්සේවා අධිකාරිය, සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම හා සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ එහි පාලිත සමාගම් වලට අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය මහපෙන්වීම සිදුකරනු ලැබේ.

## සිවිල් ගුවන් සේවා අධිකාරිය

“සැමට සුරක්ෂිත අහසක් සහතික කරමින් දක්ෂ හා විශ්වාසදායක ගුවන් සේවා ආරක්ෂක නියාමකයෙකු වීම” යන දැක්ම ඇතිව අමාත්‍යාංශය යටතේ සිවිල් ගුවන්සේවා අධිකාරිය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර හා අභ්‍යන්තර ගුවන් තොටුපළවලට අදාළ නියාමන කටයුතු අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ජාත්‍යන්තර සම්මුතීන් රටතුල ක්‍රියාත්මක කිරීම අධිකාරියේ ප්‍රධාන කර්තව්‍ය වේ.

අධිකාරිය විසින් ඉහත සඳහන් කාර්යන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සහ මූල්‍ය කටයුතු පිළිබඳව සිදු කළ විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## රජයේ ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම

අංක 1550/7 හා 2008 මැයි 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි අනුව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශපත්‍රයක් සම්බන්ධයෙන්ම ඇමෙරිකානු ඩොලර් 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කළ යුතු අතර, එසේ අය කරනු ලබන අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, 2008 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ එකතු කරන ලද රු.මිලියන 16,982 ක් වූ අධිභාරය අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද,අධිකාරිය පිහිටුවීමෙන් පසු 2002 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ එකතු කරන ලද අධිභාර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබේද යන්න සොයා බැලීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 (ඇ) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාව සඳහා වන ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් අධිකාරිය විසින් සකස් කළ යුතු වුවද 2023 ජුනි 23 දිනය වන විටත් එය සකස් කර නොතිබුණි.

### අත්හැර දැමූ ව්‍යාපෘති

2016 ජාතික අයවැයෙන් අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, PPP විධිවිධාන හරහා දිගන, බදුල්ල සහ පුත්තලම යන ස්ථානවල නව අභ්‍යන්තර ගුවන් තොටුපළ තුනක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව, බදුල්ල ගුවන් තොටුපළ සඳහා වන සමීක්ෂණ සැලසුම් සහ පාරිසරික බලපෑම් තක්සේරු (EIA) සකස් කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් රු.මිලියන 2 ක් ගෙවා තිබුණු අතර වර්තමානය වන විට මෙම ගුවන් තොටුපළවල් තුනේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.

### බදු කුළී අය කිරීමකින් තොරව වත්කම් භාවිතය සඳහා අවසර ලබා දී තිබීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ තුන්වන උපලේඛනයට ඇතුළත් ගුවන් යානා පහසුකම් සහ ඉඩම්, බදු ගිවිසුමකින් තොරව සහ කුළිය අය කිරීමකින් තොරව ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගමට භාවිත කිරීම සඳහා අවසර ලබා දී තිබුණි.

### ගුවන් තොටුපළවල් සහ ගුවන් යානා පහසුකම් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ දෙවන උපලේඛනයේ සඳහන් ගුවන් තොටුපළවල් 14 ක් සහ තුන්වන උපලේඛනයේ සඳහන් ගුවන් යානා පහසුකම් 08 ක් සහ ඊට අදාළ ඉඩම් පැවරීමේ නියෝගය, 2016 වර්ෂය තෙක් ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. , 2017 දී ගුවන් තොටුපළවල් 02 ක්, ගුවන් පහසුකම් 07 ක් සහ කටුනායක සහ රත්මලාන ගුවන් තොටුපළට අදාළ ඉඩම අධිකාරියට පවරා දීමට නියමිත බව සඳහන් කරමින් ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කරතිබුණි.. තවද පලාලි ගුවන් තොටුපළ හා මඩකලපුව ගුවන් තොටුපළ සම්බන්ධ ගැසට් පත්‍ර පිළිවෙළින් 2019 සහ 2022 දී ප්‍රකාශයට පත් කර තිබුණි. 2023 මැයි 15 දිනට වසර 21 ක් ගතවී ඇතත් පනතේ සඳහන් ඉතිරි ගුවන් තොටුපළවල් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි.

## සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ එහි පරිපාලිත සමාගම්

### සමාගමේ අඛණ්ඩ පැවැත්ම

2022 මාර්තු 31 **දිනෙන්** අවසන් වර්ෂය සඳහා සමූහයේ අලාභය (බදු පසු) රු.මිලියන 163,583 ක් වූ අතර එදිනට සමුච්චිත අලාභය රු.මිලියන 529,213 ක් ද එදිනට සමූහයේ ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.මිලියන 292,420 ක් ද මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් රු.මිලියන 426,424 ක් ද විය. තවද, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමරු.මිලියන 166,370 ක ශුද්ධ

අලාභයක්ද එදිනට රු.මිලියන 537,505 ක සමුච්චිත අලාභයක් ද ලබා ඇති අතර, එදිනට, සමාගමේ ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.මිලියන **302,703** ක් ද මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් ප්‍රමාණය රු.මිලියන 437,037 ක් ද වී තිබුණි. 2022 ඔක්තෝම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ආයතනය ප්‍රතිව්‍යුහගත කරන තුරු "දිගුකල් පැවැත්මක් ඇත"යන උපකල්පනය මත 2022 නොවැම්බර් 08 දින භාණ්ඩාගාර ලේකම් විසින් ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර.) සමාගමට සිය මෙහෙයුම් කටයුතු කරගෙන යාම සඳහා දක්වන සහයෝගය තහවුරු කරමින් නිකුත් කරන ලද ලිපිය ද සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන දිගුකල් පැවැත්මක් ඇත යන උපකල්පනය මත සකස් කර තිබුණි. **2022/2023** වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ෙමෙ ෙතක් විගණනයට ඉදිරිපත් කර නොමැත.

### වර්තමාන ගුවන් යානා ඇණිය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අවශ්‍යතා තක්සේරුවට අනුව, ගුවන් යානා 27 ක් අවශ්‍ය වූ අතර දැනට ගුවන්යානා 24 ක් ක්‍රියාත්මක වේ. ඉන් 2023 අප්‍රේල් 20 දින වන විට, ගුවන්යානා 08 ක්, 2021 ජූලි සිට 2023 අප්‍රේල් 20 දක්වා වූ කාලය තුළ වරින් වර ගුවන් යානා 8ක් භාවිතයෙන් (සේවයෙන්) බැහැරව තිබූ අතර එම කාලය තුළ බදු කුළී වශයෙන් රු. මිලියන 4,955.63 ක් ගෙවා තිබුණි.ඉන් එක් ගුවන් යානාවක් 2021 ජූලි සිට අඛන්ඩව භාවිතයෙන් බැහැරව පැවතුණි.

### ණය මුදල් ආපසු නොගෙවීම

සමාගම එහි ණයගැතිභාවය වැඩි කරමින් රජයේ බැංකුවලින් රු.මිලියන 37,960 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 200 ක් සහ රු.මිලියන 26,250 ක් වූ රුපියල් ණය 2017/18 වර්ෂ තුළදී ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම එ.ජ.ඩො. මිලියන 200 ණය සඳහා පොලී ලෙස එ.ජ.ඩො. මිලියන 14.63 ක් (ආසන්න වශයෙන් රු. මිලියන 2,777 ක්) ගෙවා තිබුණි. 2023 අප්‍රේල් 27 දිනය දක්වා මෙම ණය මුදල්වල මූලික ණය කිසිවක් ගෙවා නොතිබුණි.

### අයවිය යුතු මුදල්

විගණනයට ලැබී ඇති තොරුතුරුවලට අනුව, 2023 පෙබරවාරි 28 දිනට වන විට නොගෙවූ වෙළඳ ණයගැතියන් රු.මිලියන 24,050 කි. ඉන් රු.මිලියන 2,321 ක මුදලක් වසර 5 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි.

## ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

### ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් නොකිරීම

2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, භාණ්ඩාගාර ලේකම් විසින් දැනට රජයට අයත් ගුවන් තොටුපළේ ඉඩම සහ ගොඩනැඟිලි හා සමාගම සතු චංචල සහ නිශ්චල වත්කම් තක්සේරු කරන ලෙසත් සහ එවකට ශ්‍රී ලංකා රජය විසින් සේවාකරණය කරන ලද ගුවන් තොටුපළ සංවර්ධනයට අදාළ වගකීම් භාර ගැනීම සහ ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස්

නිකුත් කිරීමක් කරන ලෙසත් නියෝග කර තිබුණි.

තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ ඉල්ලීම මත නීතිපතිවරයා විසින් 2010 පෙබරවාරි 08 දිනැති ලිපිය මගින්, ගුවන් තොටුපළේ ඉඩම් සහ ගොඩනැගිලි හා දැනට සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ ශ්‍රී ලංකා රජයට අයත් අනෙකුත් සියලුම චංචල සහ නිශ්චල වත්කම් අන්‍යෝන්‍ය වශයෙන් පැවරීම සම්බන්ධ වන බැවින් නව කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙසත් උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මේ දක්වා නව කැබිනට් මණ්ඩල තීරණයක් ලබා ගැනීමට සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

එසේම, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනත යටතේ, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මගින් අමාත්‍යවරයා විසින් කටුනායක ගුවන්තොටුපළ, රත්මලාන ගුවන්තොටුපළ, රත්මලාන සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථාන සතු ඉඩම්, ගොඩනැගිලි සහ ව්‍යූහයන්, අත්තිඩියේ ගගන සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, ගම්පහ සහ පමුණුගම ගුවන්විදුලි නාවික ආධාරක, පිදුරුතලාගල රේඩාර් මධ්‍යස්ථානය, සිවිල් ගුවන් සේවා අධිකාරිය සතු නුවරඑළියේ සහ අනුරාධපුර හෙක්ටෙයාර් 0.125 ක නිවාඩු බංගලා ඉඩම් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පවරා දී තිබුණි. එබැවින් සමාගම විසින් භාවිතා කරන ලද ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය පිළිබඳව විගණනයේදී සැක සහිත විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගොඩනැගිලි පමණක් නැවත තක්සේරු කර තිබූ අතර මුළු තක්සේරුව අවසන් කර ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

### බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II - පියවර II ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීම

2022 අප්‍රේල් 12 දිනැති "ශ්‍රී ලංකාවේ විදේශ ණය සම්බන්ධ අන්තර්කාලීන ප්‍රතිපත්තිය" යටතේ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද විශේෂ ලිපියට අනුව ,මුදල් අමාත්‍යාංශයෙන් ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව සහතිකයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II - පියවර II ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව 2022 දෙසැම්බර් 09 දින සිට බලාත්මක වන පරිදි ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව ඇති බැවින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු ඇතුලුව අනෙකුත් ගාස්තු හා අලාභ සඳහා රු මිලියන 15,730 ක් සහතික කළ යුතුව තිබුණි.

# ප්‍රවාහන අංශය

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලංකා දුම්රිය සේවය(ව්‍යාපෘති)
  - කුරුණෑගල හබරණ දුම්රිය - ව්‍යාපෘතිය
  - කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
  - කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය
  - මහව/අනුරාධපුර/ඕමන්තේ දක්වා දුම්රිය මාර්ග ව්‍යාපෘතිය - අදියර **04**
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
  - හිඟ ආදායම් අයකර නොගැනීම
  - ප්‍රමාද ගාස්තු හා පොලී
  - නිරවුල් නොවූ ණයවර ලිපි
  - සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම
  - ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම
  - ඌන උපයෝජිත වත්කම්
  - දුම්රිය ධාවනය
  - අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග වල ආරක්ෂාව සඳහා සීනු හා විදුලි පද්ධති **200** ක් ස්ථාපනය
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
  - ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම
  - වායු විමෝචන මධ්‍යස්ථාන **09** ක් ඉදි කිරීම
  - පෙරසවි ටයර් නිෂ්පාදනය කිරීම
  - ක්‍රියාකාරී සැලැස්ම
  - හානි පූර්ණ වන්දි අයකර නොගැනීම
  - ඉන්ධන ඌනතාවය
  - සහසර බස් නවීකරණ ව්‍යාපෘතිය

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව
    - මගී අවසරපත්‍ර
    - GPS යන්ත්‍ර ඌන උපයෝජනය
    - නිසි සැරිය ව්‍යාපෘතිය

# ප්‍රවාහන අංශය

ප්‍රවාහන අංශයේ මෙහෙවර වන ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීම උදෙසා නවතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම යන මෙහෙවර ඉටු කර ගැනීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතුව තිබුණි.

- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.
- පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.
- දුම්රිය හා බස්රථ නැවතුම් පොළවල් ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.
- දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම.
- බස්රථ නිෂ්පාදනය හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැඟීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.
- තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පළවල් වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම.
- වත්මන් බස් සංචිත ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස්රථ හඳුන්වා දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහනයට අනුකූල කර ගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- දුම්රිය මැදිරි, බස් රථ, මොටර් රථ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවයක් ගොඩනැඟීම.

- පාසල් බස්රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම.
- මගී හා ප්‍රවාහන සේවය ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම.
- රියදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත් කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම.

ඉහත කාර්යයභාරයන් ඉටු කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයට, රාජ්‍ය අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු දෙකකට පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 62,710 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් එකතුව රු. මිලියන 58,940 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 6 ක් හෙවත් රු.මිලියන 3,770 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි. විස්තර රූපසටහන 34 හි දැක්වේ.




| | ප්‍රවාහන අමාත්‍යාංශය | රාජ්‍ය අමාත්‍යාංශය | ශ්‍රී ලංකා දුම්රිය දෙපා | මෝටර් රථ ප්‍රවාහන දෙපා | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය | 14,699 | 2,759 | 42,697 | 2,555 | 62,710 |
| වියදම | 13,782 | 791 | 42,531 | 1,836 | 58,940 |
| ඉතිරිය | 917 | 1,968 | 166 | 719 | 3,770 |

රූපසටහන 34: ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීමට අදාලව විගණනයේ දී අනාවරණය වූ නිරීක්ෂණ සම්පින්ඩනය කර පහත දැක්වේ.

## ශ්‍රී ලංකා දුම්රිය සේවය(ව්‍යාපෘති)

### කුරුණෑගල හබරණ දුම්රිය - ව්‍යාපෘතිය

ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා ඉදිකිරීමට යෝජිත මෙම නව දුම්රිය මාර්ගයේ දෙපස ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබූ ප්‍රතිපාදනය කර තිබූ රු.මිලියන 1460 කින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් වැයකර තිබුණේ සියයට 39 කට සමාන රු. මිලියන 576 ක් පමණි.

මෙම ව්‍යාපෘතියට අදාලව ග්‍රාම නිලධාරී වසම් 57 ක ඉඩම් කැබලි 4,392 ක් අත්පත් කර ගැනිමට යෝජිතව තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දින වන විට නියමිත පරිදි මුදල් ගෙවා අත්සන් කොට අත්පත් කර ගෙන තිබුණේ බිම් කොටස් 149 ක් පමණි. කුරුණෑගල සිට හබරණ දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරිම සඳහා 2022 වර්ෂය වන විට ආයෝජකයන් හෝ අරමුදල් සපයා ගනු ලබන මාර්ගයක් හඳුනාගෙන නොතිබුණු අතර 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් ලෙස රු. මිලියන 349 ක් ඇතුළුව සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 568 ක වියදමක් දරා තිබුණි. ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් මේ දක්වා දරා ඇති ඉහත සඳහන් මුළු වියදම නිශ්කාර්ය වී තිබුණි.

### කොළඹ නගරාශ්‍රිත දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා අරමුණු 05 ක් ඔස්සේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියට අදාලව 2019 අගෝස්තු 20 දින අත්සන් කර තිබූ ඇ.ඩො.මිලියන 160 ක් වූ ණය ගිවිසුම 2019 සැප්තැම්බර් 06 දින සිට ක්‍රියාවට නංවා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුව යටතේ රු.මිලියන 2,538 ක් හා දේශිය අරමුදල් ප්‍රතිපාදන යටතේ රු.මිලියන 200 ක් වෙන්කර තිබුණ ද, දේශිය අරමුදල් ප්‍රතිපාදනවලින් 2022 වර්ෂයේ දී වැයකර තිබුණේ රු.මිලියන123 ක් හෙවත් සියයට 61 ක් පමණි. එසේම ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ අදාල කාලපරිච්ඡේදය තුල උපයොජනය කළ යුතු වූ ඇ.ඩො. මිලියන 120 ප්‍රතිපාදනයෙන්, ඇ.ඩො.මිලියන 20 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව වෙත බැදීම් ගාස්තු ලෙස රු.මිලියන 141 ක් 2022 වර්ෂය අවසානය වන විට ගෙවා තිබුණි.

### කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ වසර 20 ක කාලය තුළ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ඇතුළත් ශක්‍යතා අධ්‍යයන සංවර්ධනය, ප්‍රවාහන ව්‍යාපෘති සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලැසුම් සකස් කිරීම සහ ප්‍රවාහන ව්‍යාපෘති සඳහා සහාය ලබාදීමට ප්‍රතිපාදන ඇති කිරීම වැනි කාර්යයන්

අරමුණුගතව මුළු පිරිවැය රු.මිලියන 1,654 කට සමාන ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 11.36 ක් ප්‍රතිපාදන ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.

ශක්‍යතා අධ්‍යන වාර්තාව හා විස්තරාත්මක සැලසුම් 2021 වර්ෂයේ මාර්තු මස නිමකර අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. ශක්‍යතා අධ්‍යනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ රු.මිලියන 1,446 ක මුදලක් වැය කර තිබූ අතර එම ණය සඳහා වූ ණය වාරික ලෙස රු.මිලියන 361 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් උක්ත ශක්‍යතා අධ්‍යනය ක්‍රියාත්මක නොකොට වසර දෙකකට අධික කාලයක් නිශ්කාර්යව පැවතුන බැවින් එමඟින් ආර්ථිකයට කිසිදු ප්‍රයෝජනයක් අත් වී නොතිබුණි.

### මහව/අනුරාධපුර/ඕමන්තේ දක්වා දුම්රිය මාර්ග ව්‍යාපෘතිය - අදියර 04

ඉන්දියානු එක්සිම් (Exim) බැංකුව සමඟ එලඹී ණය ගිවිසුමේ කොන්දේසි වලට යටත්ව මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය අදියර 04 ක් යටතේ පිළිසකර කිරීම සඳහා ඉන්දීය රජයේ සමාගම් වලින් මිල ගණන් කැඳවා 2019 නොවැම්බර් 29 දින සිට මාස 36 කින් නිම කිරීම සඳහා 2019 ජූලි 18 දින Ircon International Limited ආයතනය සමඟ ඇ. ඩො. මිලියන 91 කට ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2022 නොවැම්බර් 28 වන විට මෙම ව්‍යාපෘතිය නිම කළ යුතු වුවද එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 35 ක පමණ දුර්වල මට්ටමක පැවතුණි. අනුරාධපුර - වවුනියා හා වවුනියා ඕමන්තේ මාර්ග කොටස ඉදිකිරීම් 2023 ජනවාරි සිට සිදු කරමින් පැවති අතර එම කොටසෙහි වැඩ අවසන් කිරීම 2022 මැයි මස වනවිට සැලසුම් කර තිබුණි. 2023 පෙබරවාරි වන විට මුළු ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 44 ක් පමණක් වූ අතර මහව-අනුරාධපුර මාර්ග කොටසෙහි ඉදි කිරීම් මෙතෙක් ආරම්භකර නොතිබූ බැවින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2023 වර්ෂයේ දී ද නිම කිරීමට නොහැකි තත්ත්වයක් පැවතුණි.

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### හිඟ ආදායම් අයකර නොගැනීම

2008 සිට 2021 දක්වා කාලයට අදාලව සී/ස ටෝකියො සිමෙන්ති සමාගමෙන් අයවිය යුතු රු. මිලියන 8 ක ප්‍රවාහන ගාස්තු ද, සිලෝන් පෙට්ට්‍රෝලියම් ස්ටෝරේජ් ලිමිටඩ් ආයතනයෙන් අයවිය යුතු රු. මිලියන 54 ක ප්‍රවාහන ගාස්තු ද, භාණ්ඩ ප්‍රවාහනය සහ අනෙකුත් වෙළඳ කටයුතු වලින් ලැබිය යුතු රු.මිලියන 12 ක හිඟ ආදායම් ද, දුම්රිය රක්ෂිත ඉඩම් බදු දීම වෙනුවෙන් විවිධ පුද්ගලයන් හා ආයතන වලින් අයවිය යුතු රු. මිලියන 80 ක්ද ඇතුළුව රු. මිලියන 154 ක හිඟ ආදායමක් 2022 වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### ප්‍රමාද ගාස්තු හා පොලී

භාණ්ඩ ආනයනය කිරීමේදී නිශ්කාෂණ කටයුතු කාර්යක්ෂමව ඉටුකර නොගැනීම හේතුවෙන් වාර්ෂිකව විශාල මුදලක් ප්‍රමාද ගාස්තු හා පොළී වශයෙන් ගෙවීමට සිදුව තිබූ අතර 2018-2021 තුළ එසේ ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 74 ක් ගෙවා තිබූ අතර අතර 2022 වර්ෂය තුල එසේ ගෙවා තිබූ මුදල රු. මිලියන 5 ක් විය.

### නිරවුල් නොවූ ණයවර ලිපි

2022 වර්ෂය අවසානයට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු.මිලියන 249 ක් වූ අතර එයින් සියයට 47 ක් වූ රු.මිලියන 118 ක් වර්ෂ 02 ත් 24 ත් අතර පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී ඇති මෙම ශේෂයන් භාණ්ඩ ලැබීම් තුන්ඩු (GRN) මඟින් නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර මෙම ගෙවීම් සපයා නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති මුදල්ද යන්න විගණනයේ දී මතභේදකාරී විය.

### සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම

භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට සහතික වීමෙන් අනතුරුව ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ සහතික වීමකින් තොරව සපයා නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන්ට රු. මිලියන 96 ක් ගෙවා තිබුණි.

### ශ්‍රී ලංකා දුම්රිය ප්‍රධාන සැලැස්ම

ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධානයන් යටතේ ලද ඇ. ඩො. මිලියන 1.5 ක් වැය කර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සකස් කළ ප්‍රධාන මෙහෙයුම් සැලැස්ම (Master Plan) ක්‍රියාත්මක කර නොතිබුණි.

### ඌන උපයෝජිත වත්කම්

චීනයෙන් ගෙන්වා තිබූ මගී මැදිරි 100 න්, මේ වන විට ධාවනයට යොදවා ඇති මගී මැදිරි සංඛ්‍යාව 17 ක් වන අතර අනෙකුත් මැදිරි මාලිගාවත්ත, රත්මලාන අංගන වල ගාල් කර තිබූ අතර තවත් මැදිරි කිහිපයක් පුත්තලම දුම්රිය ස්ථානයේ ගාල් කර තිබුණි.

එසේම 2021 වර්ෂයේ දී ඉන්දියාවෙන් බලවේග කට්ටල 06 ක් හා එන්ජින් 10 ක් ඇමරිකානු ඩොලර් මිලියන 90 ක් ගෙවා ලබා ගෙන තිබුණද, 2022 වර්ෂයේ දී දුම්රිය එන්ජින් 23 ක් හා බලවේග කට්ටල 36 ක් ඌණ උපයෝජිතව පැවතුණි.

### දුම්රිය ධාවනය

කාලසටහනකට අනුව දුම්රිය ධාවනය 1865 දී ආරම්භ වුවද, 2022 වර්ෂය දී කාල සටහන් අනුව දුම්රිය ධාවනය නොවූ බවට දුම්රිය භාවිතා කරන්නන්ගෙන් පැමිණිලි ලැබී තිබුණි. 2022 දී සැලසුම් කල දුම්රිය ධාවන වාර සංඛ්‍යාව 120,993 ක් වූ අතර අවලංගු වී තිබූ දුම්රිය වාර ගණන 10,077 ක් විය. නිශ්චිත වේලාවට ධාවනය වී තිබූ දුම්රිය වාර ගණන 32,844 ක්වූ අතර සැලසුම් කල දුම්රිය ධාවන වාර සංඛ්‍යාවෙන් සියයට 72 නියමිත පරිදි ධාවනය වී නොතිබුණි.

දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ සමස්ත මගී ප්‍රවාහනයෙන් සියයට 6 ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 6.5 ක් දායකත්වයක් ලබා දෙන දුම්රිය සේවය එකී දායකත්වය ඉහළ නංවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර 1934 වර්ෂයේ කිලෝමීටර් 1,521 ක දුම්රිය මාර්ගස්ථ ජාලය, බෙලි අත්ත දක්වා වූ කිලෝ මීටර් 32 ක්ද අලුතින් එක් කල පසුව 2021 වර්ෂය වන විට කිලෝ මීටර් 1,465 ක් දක්වා කිලෝ මීටර් 56 කින් අඩු වී තිබුණි.

### අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග වල ආරක්ෂාව සඳහා සීනු හා විදුලි පද්ධති 200 ක් ස්ථාපනය

ගිවිසුම් ප්‍රකාරව 2017 ජනවාරි 27 වන විට මාර්ග ආරක්ෂණ පද්ධති 200 නිමකර භාරදිය යුතු වුව ද 2022 අගෝස්තු 01 වන විට ඉදිකර තිබූ පද්ධති 200 න් පද්ධති 10 ක් නිසි පරිදි අත්හදා බැලීම් සිදු කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදී නොතිබුණ අතර 2022 අගෝස්තු වන විට කොන්ත්‍රාත් මුදලින් සියයට 95 ක් වූ රු.මිලියන.1,003 ක් ගෙවීම් ද කර තිබුණි.

පහල මාර්ගයේ ( මුහුදුබඩ ) සවිකළ සීනු හා විදුලි පද්ධති 142 න් 60 ක් හා පුත්තලම් මාර්ගයේ සවිකළ සීනු හා විදුලි පද්ධති 46 න් 34 ක් වශයෙන් සමස්තව සීනු හා විදුලි පද්ධති 94 ක් සවි කර වසරක් ගත වීමටත් ප්‍රථම ක්‍රියා විරහිත වී තිබුණි. ඒ අනුව සවිකර ඇති සීනු හා විදුලි පද්ධති වලින් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් අක්‍රිය වීම මත ඒ සඳහා වැය කර තිබූ රු. මිලියන 500 කට ආසන්න වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

### ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

### ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම

ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම සඳහා මණ්ඩලය 2018 මාර්තු 20 වන දින පුද්ගලික සමාගමක් සමඟ රු. මිලියන 61 ක වටිනාකමට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු 2018 ජුනි 20 දින නිම කළ යුතු වූවද 2023 මාර්තු වන විටද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඉන්ධන පිරවුම්හල භාවිතයට ගෙන නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට රු. මිලියන 32 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් නියමිත පරිදි වැඩ නිම නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර කළ වැඩ පිළිබඳ තක්සේරු වාර්තාවක් සහ ඉදිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මධ්‍යම ඉංජිනේරු පිළිබඳ කාර්යාංශයට (CECB) දන්වා ඇතත්, 2023 මාර්තු වනතුරු මෙම තක්සේරු වාර්තාව හා ඇස්තමේන්තුව ලබා දී නොතිබුණි. 2023 අප්‍රේල් 10 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී ඉන්ධන පිරවුම්හලේ වහල මුළුමනින්ම දිරාපත් වීම ඇතුළු, කළ වැඩවල ප්‍රමිතිය පිළිබඳ සැලකිල්ලකින් තොරව හා සැලසුම්වලට අනනුකූල ලෙස කළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කර ගෙවීම් කිරීම හේතුවෙන් 2023 අප්‍රේල් වන විට මණ්ඩලයට රු. මිලියන 9 ක අලාභයක් දැරීමට සිදුව තිබුණි. එසේම 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 12 ක් ගෙවා ගෙන්වන ලද ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් හා ජෙනරේටරයක් අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර, ජෙනරේටරයේ වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි.

### වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම

මණ්ඩලය විසින් පළාත් මට්ටමින් වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබූ අතර, ඒ සඳහා එකී අරමුදල වෙතින් රු. මිලියන 22 ක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථානවලට අදාළ සිවිල් වැඩ ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 90 ක ඇස්තමේන්තු මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 28 ක මුදලක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන 09 හි භූමිය ඇස්පෝල්ට් යොදා කාපට් කිරීම සඳහා 2018 අගෝස්තු 16 දින රු.මිලියන 50 කට මග නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම හා ගමනාගමන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබූ නමුත් ඒ සඳහා දරණ ලද වියදම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. දැනට මෙම වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන අතර, වායු විමෝචන භාරකාර අරමුදල මගින් ලබා දී තිබූ රු. මිලියන 22 ක උපකරණ දිරාපත් වෙමින් තිබුණි. තවද මෙම වායු විමෝචන මධ්‍යස්ථාන සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබූ අතර, උපකරණ කට්ටල සමඟ ලබාදුන් පරිගණක වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන තිබුණි. ඒ අනුව වැය කරන ලද වියදම් නිෂ්කාර්යය වියදම් බවට පත් වී තිබුණි.

### පෙරසවි ටයර් නිෂ්පාදනය කිරීම

පහසුකම් හා තත්වය උසස්කිරීම තුළින් පිරිවැය පාලනය අරමුණු කර වැඩි ධාරිතාවයෙන් යුත් නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත ටයර් පෙරසවි කිරීමේ කර්මාන්ත ශාලාව නවීකරණය සඳහා 2022 වර්ෂයට රු. මිලියන 50 ක් වෙන් කර තිබූ අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 69 ක් වී තිබුණි. ඒ තුළින් දැනට පවතින නිෂ්පාදනගාරයේ ධාරිතාවය ඒකක 15,000 ක් දක්වා දෙගුණ කිරීමට සැලසුම්කර තිබූ නමුත් එම කාර්යය ඉටු නොවීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට තුළ දී මණ්ඩලයේ කලාප 06 ක් මගින් පමණක් රු. මිලියන 787 ක වටිනාකමින් යුත් පෙරසවි ටයර් 53,706 ක් මිලදී ගෙන තිබුණි. තවද කර්මාන්ත ශාලාවේ පවතින නිෂ්පාදන ධාරිතාවය උපරිම ලෙස උපයෝගී කරගෙන ටයර් පෙරසවි කිරීම කළ හැකි වූවත් අදාළ ප්‍රාදේශික හා ඩිපෝවලින් පෙරසවි කිරීම සඳහා අවශ්‍ය ටයර් කර්මාන්ත ශාලාව වෙත එවීමට කටයුතු කර නොතිබුණි.

### ක්‍රියාකාරි සැලැස්ම

මණ්ඩලය විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව දෛනිකව බස් රථ 5,794 ක් ධාවනය කරවීමට සැලසුම් කර තිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය එන්ජින් කට්ටල 840 ක් වාර්ෂිකව අළුත්වැඩියා කර ධාවනයට යෙදවීමට සැලසුම් කර තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාර හා ශ්‍රීලංගම ප්‍රතිපාදන රු.මිලියන 662 ක් වෙන් කර තිබුණි. නමුත් මණ්ඩලය විසින් අළුත්වැඩියා කර තිබූ බස් රථ ප්‍රමාණය 254 ක් වන අතර, ඒ සඳහා වැය කර තිබූ මුදල රුපියල් මිලියන 77 ක් විය.

### හානි පූර්ණ වන්දි අයකර නොගැනීම

කටුබැද්ද අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට අයත් වටිනාකම රු. මිලියන 11 ක් වූ අධි සුඛෝපභෝගී බස් රථයක් අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වී අලුත්වැඩියාවන් සිදුනොකර ධාවන තත්වයෙන් ඉවත් කර තිබුණි. ඒ සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද රක්ෂණ සංස්ථාවෙන් ලබාදී තිබූ කාලය තුළ බස් රථයෙහි අලුත්වැඩියාවන් සිදුකිරීමට ඩිපෝ අධිකාරි විසින් අපොහොසත්වීම නිසා හානි පූර්ණය කිරීම රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

### ඉන්ධන ඌනතාවය

මහරගම ඩිපෝවේ 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ අවසන් දිනට පැවතිය යුතු ඉන්ධන තොග ප්‍රමාණය ලීටර් 326,772 ක් විය. නමුත් එදිනට ටැංකිවල තිබූ සත්‍ය ඉන්ධන තොගය ලීටර් 48,598 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 120 ක් වටිනා ඉන්ධන ලීටර් 278,174 ක ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌණතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙලෙස පවත්නා ඉන්ධන තොග ඌණතාවය වෙනුවෙන් මණ්ඩලය විසින් ද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම්වල රු.මිලියන 37 ක වෙන් කිරීමක් කර තිබුණි.

### සහසර බස් නවීකරණ ව්‍යාපෘතිය

පොදු ප්‍රවාහනය සඳහා මගී ආකර්ශනය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් බස් රථ 23000 කට ආසන්න ප්‍රමාණයක් නවීකරනය කිරීමේ අරමුණින් 2018 සිට 2023 කාලය තුලදී මෙම ව්‍යාපෘතිය මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ වෙනුවෙන් රු.මිලියන 26,860 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද, 2022 වර්ෂය අවසාන වන විටත් ඉන් වැයකර තිබුණේ ඇස්තමේන්තු මුදලින් සියයට 1 කට ආසන්න රු.මිලියන 249 ක් පමණක් වන අතර එයින් සියයට 73 කට ආසන්න රු.මිලියන 181 ක් ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ ආකාර්යක්ෂමතාව හේතුවෙන් රජය විසින් ව්‍යාපෘතිය අතර මග නවතා දැමීමට තීරණය කොට තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් ඒ වන විටත් මිලදීගෙන තිබූ GPS යන්ත්‍ර 1465 කින් 500ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාවටද ඉතිරි 965ක් ප්‍රවාහන අමාත්‍යාංශය වෙතද භාරදීමට කටයුතු කර තිබුණි.

### ජාතික ගමනාගමන කොමිෂන් සභාව

### මගී අවසරපත්‍ර

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය අනුව යම් තැනැත්තෙකු වෙත 24 වගන්තිය යටතේ ලබාදෙන ලද මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි විය යුතු වුවත් 2022 වර්ෂය තුල දී මගී අවසර පත්‍ර සේවා 33 ක අයිතිය පැවරීම සිදුකර තිබුණි.

### GPS යන්ත්‍ර ඌන උපයෝජනය

කොමිෂන් සභාව වෙත 2021 නොවැම්බර් 26 දින ගාලු පාර කොරිඩෝවේ බස් රථ වල සවි කිරීම සඳහා GPS යන්ත්‍ර 500 ක් සහසර ව්‍යාපෘතියෙන් ලැබී තිබුණද, 2023 පෙබරවාරි 16 දින වන විට සවි කරන ලද මුළු GPS ප්‍රමාණය 186 ක් වන අතර ඉතිරි උපකරණ 314

ක ප්‍රමාණය බස්රථවලට සවි කිරීමට කටයුතු සිදු කර නොතිබුණි. මෙම GPS උපකරණවල වගකීම් කාලය ඉක්මයාමට ආසන්න තත්ත්වයේ පැවතිය ද කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම 2022 වර්ෂයේ දී GPS පද්ධතියේ නඩත්තු පිරිවැය ඇතුළු එහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා රු. මිලියන 8 ක වියදමක් දරා තිබුණු නමුත් දිවයින තුල මගී ප්‍රවාහන සියලු බස් රථ සඳහා GPS සවිකිරීමට කටයුතු නොකිරීම නිසා මෙම ව්‍යාපෘතියේ ඵලදායී තත්වය සීමිත වී තිබුණි.

තවද කොමිෂන් සභාවේ ලියා පදිංචි බලපත්‍ර හිමි බස්රථ 1,747 ක එනම් මුළු බස් රථ වලින් සියයට 56 ක ප්‍රමාණයක GPS උපකරණ සවිකල යුතු තත්ත්වයේ පැවතුණි.

### නිසි සැරිය ව්‍යාපෘතිය

සමාලෝචිත වර්ෂය තුළ දී නිසි සැරිය සේවා පවත්වා ගෙන යාමට හා නව ව්‍යාපෘති 100 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 34.5 ක් වෙන් කර තිබුණ ද, නව එක් සේවාවක් හෝ ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

# වරාය හා නාවික අංශය

## විගණන නිරීක්ෂණ

- ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ප්‍රමාද වූ ව්‍යාපෘති
- ණය උපයෝජන නොකිරීම නිසා බැඳීම් ගාස්තු සහ ණය පොළි නිශ්කාර්යව ගෙවීමට සිදු වීම
- බහාලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස
- නැව් බඩු මෙහෙයුම් කටයුතු
- කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම (ආගමනය)
- පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම
- නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය
- නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය
- වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් විසින් ලබාගත් ණය වෙනුවෙන් ඇපවීම
- වරාය අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්
- මුදල් පනතට හා වරායවල් පිළිබඳ අධිකාරී පනතට අනුකූල නොවීම්
- වරාය පනතට අනුකූල නොවීම
- විධිමත්ව ඉඩම්පවරා දී නොතිබීම
- අනාර්ථික වියදම්
- ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම
- පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් නොකිරීම
- ආනයන අපනයන භාණ්ඩ ප්‍රවාහනය
- නැව් සංස්ථාව මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන සාපේක්ෂව අඩු වීම

# වරාය හා නාවික අංශය

දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සාමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සාමුද්‍රිය සේවාවන් ලබාදීම සහ කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම දැක්මකින් යුතුව ක්‍රියාත්මක වන වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල 05ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකල යුතුව තිබුණි.

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වරාය, නාවික හා ගුවන්සේවා විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම, හා ඇගයීම.
- වාණිජ වරායන් සංවර්ධනය, කළමණාකරණය හා ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.
- බහලුම් අංගන, තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධනය සහ පරිපාලන කටයුතු සිදුකිරීම.
- නෞකා හිමිකාරත්වය සහ මෙහෙයුම්, නැව් කළමණාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා සම්බන්ධිත කටයුතු සහ නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා සහයවීම.
- නාවික ගාස්තු හා නාවික සේවා කටයුතු සහ වෙරළාසන්න මගී ප්‍රවාහන කටයුතු නියාමනය කිරීම.
- බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනිම.
- ජාත්‍යන්තර හා දේශීය ගුවන්තොටුපලවල් සංවර්ධනය හා නියාමන කටයුතු සිදු කිරීම හා ගුවන්තොටුපල මගින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම.
- ජාත්‍යන්තර ගුවන් ගමන් පුළුල් කිරීම, ගුවන් බඩු අපනයනය,දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය සහ පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය සහ ගුවන්යානා ලියාපදිංචි කිරීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යයභාරය ඉටුකිරීම සඳහා වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයට රු.මිලියන 6,414 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 2,800 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වරෂය තුළ රු.මිලියන 3,614 ක උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ වන රාජ්‍ය දෙපාර්තමේන්තු 01 ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල 05 ක් විසින් ඉහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

වරාය, නාවික හා ගුවන්සේවා කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන යටතේ කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම සඳහා වූ රු. මිලියන **824** ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස ඉතිරිය සියයට **33** ක් ද කුළුණු මතින් ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. මිලියන **1,010**කින් ඉතිරිය සියයට **72** ක්ද විය. තවද මෙම ව්‍යාපෘති 2 හි සැලසුම් කල ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කල පරිදි වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නොහැකි වීම නිසා කාර්යයසාධනය පිළිවෙලින් සියයට **95** සහ සියයට 54.3 යන මට්ටම් වල පැවතුණි.

### ප්‍රමාද වූ ව්‍යාපෘති

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් දැනට ප්‍රධාන මෙහෙයුම් කටයුතු සිදු කරන ජය බහලු පර්යන්තයේ දිග මීටර් 600 ක් පමණක් වීම නිසා දිග මීටර් 330 ක් වූ විශාල ප්‍රමාණයේ නෞකා 2 ක් එකවර හැසිරවීම අපහසුවීම හේතුවෙන් අධිකාරියට ව්‍යාපාරික අවස්ථාවන් අහිමිවී යන බැවින් එම පර්යන්තය මීටර් 120 කින් දීර්ඝ කිරීමට සහ ගැඹුර මීටර් 15 ක් ලෙස නැව්තොට සකස් කිරීමට 2017 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2018 නොවැම්බර් 29 දින වරාය අධිකාරිය හා කොන්ත්‍රාත්කරු සමග ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 5,035 (VAT රහිත) ක් විය. ගිවිසුම අනුව, ගිවිසුම්ගතවී දින 7 කට අඩු නොවන දිනකදී කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමේ නිවේදනය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කල යුතු වුවද, එයින් වසර 02 ක කාලයකට පසු 2020 නොවැම්බර් 23 දින සංශෝධන සහිතව වැඩ ආරම්භ කිරීමේ නිවේදනය නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්තුව පිළිබඳව නැවත සාකච්ඡාවට බඳුන්කර යෝජිත පරිදි වැඩිදියුණු කිරීම සිදු කිරීම සඳහා 2020 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ නැවත අනුමැතිය ලබා ගැනීම මෙම ප්‍රමාදය සඳහා හේතු වී තිබුණි. සංශෝධනයෙන් පසුව ඉහත කොන්ත්‍රාත්තුව 2022 ජූලි 23 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 42 ක් පමණක් වී තිබුණි.

### ණය උපයෝජන නොකිරීම නිසා බැඳීම් ගාස්තු සහ ණය පොළි නිශ්කාර්යව ගෙවීමට සිදු වීම

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 45.27ක ණය මුදලක් ලබා ගැනීමට 2018 ජනවාරි 10 දින ගිවිසුම් ගත වී තිබුණි. ණය ගිවිසුම අත්සන් කර වසර 05 ක් ගතවී තිබුණ ද වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.එ.ජ

ඩොලර් 905,194 ක් පමණක් උපයෝජනය තිබුණු අතර රු. මිලියන 12 ක මුදලක් ලබා නොගත් ණය සඳහා බැදීම් ගාස්තු සහ ණය පොළි ලෙස අනාර්ථිකව ගෙවීමට සිදු වී තිබුණි.

## බහාලුම් මෙහෙයුම් කටයුතුවල ජාත්‍යන්තර ස්ථානය සහ වරාය අධිකාරියේ වෙළඳපළ කොටස

2022 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 6,862,178 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 22 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 5.3 ක පසුබෑමක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහලුම් හැසිරවීම 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී සියයට 5 කින් අඩු වී තිබුණි.

## නැව් බඩු මෙහෙයුම් කටයුතු

කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2018 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 4,933 ක් වී තිබුණත්, 2022 වර්ෂය වන විට එම සංඛ්‍යාව 4,073 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන 2018 දී මිලියන 7.05 ක සිට 2022 වර්ෂයේදී මිලියන 6.9 ක් දක්වා අඩු වී තිබුණි. එසේම මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2018 වර්ෂයේදී මෙ.ටො.මිලියන 10.1 ක සිට 2022 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 6.2 ක් දක්වා අඩු වී තිබුණි. විස්තර වගුව 22 හි දැක්වේ.

| විස්තරය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| **පැමිණි නැව් සංඛ්‍යාව** | 4,933 | 4,708 | 4,337 | 4,180 | 4,073 |
| **මෙහෙයවන ලද විසිසම (TEUs) බහලුම් ඒකක ගණන (ඒකක '000)** | 7,047 | 7,228 | 6,854 | 7,249 | 6,862 |
| **මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටොන් '000)** | 10,136 | 9,530 | 8,894 | 9,229 | 6,249 |

වගුව 22 - ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2022 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව

## කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම (ආගමනය)

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී කොළඹ වරාය වෙත බහලුම්ගත යාත්‍රා පැමිණීම යාත්‍රා 27 කින් හෙවත් සියයට 0.7 කින් අඩු වී තිබුණි. 2017 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා බහලුම් යාත්‍රා පැමිණීමේ සුළු වැඩිවීමක් ද මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ යාත්‍රා වෙනුවට විශාල ප්‍රමාණයේ යාත්‍රා පැමිණීම හේතුවෙන් 2018 වර්ෂයෙන් පසුව 2021 වර්ෂය දක්වා බහලුම් යාත්‍රා පැමිණීමේ ක්‍රමික අඩුවීමක් හා 2022 වර්ෂය වනවිට සුළු වැඩිවීමක් නිරීක්ෂණය විය. 2021 වර්ෂයට සාපේක්ෂව බහලුම්ගත යාත්‍රා 105 ක එනම් සියයට 03 ක පමණක් වර්ධනයක් 2022 වර්ෂයේදී නිරීක්ෂණය විය. විස්තර රූපසටහන 35 හි හා රූපසටහන 36 හි පරිදිවේ. සාම්ප්‍රදායික සහ වෙනත් යාත්‍රා පැමිණීමද 2021 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 50 ක හා 24 ක පසුබැසීමක් නිරීක්ෂණය විය.




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| බහලුම්ගත | 3,683 | 3,739 | 3,604 | 3,281 | 3,180 | 3,287 |
| සාම්ප්‍රදායික | 56 | 51 | 77 | 64 | 62 | 31 |
| වෙනත් | 590 | 541 | 517 | 461 | 433 | 330 |

රූපසටහන 35 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - වර්ගීකරණය සහිතව

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2022 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| පැමිණි මුළු යාත්‍රා සංඛ්‍යාව | 4,329 | 4,331 | 4,198 | 3,806 | 3,675 | 3,648 |

රූපසටහන 36 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - මුළු යාත්‍රා සංඛ්‍යාව

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2022 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව

### පර්යන්ත මෙහෙයුම් කටයුතු පහත වැටීම

කොළඹ වරාය විසින් 2001 දී බහලුම් ඒකක 1,726,616 ක් මෙහෙයවා තිබූ අතර 2022 වන විට එම සංඛ්‍යාව බහලුම් ඒකක 6,862,184 දක්වා වර්ධනය වී තිබුණි. මෙම බහලුම් මෙහෙයුම් කටයුතුවලදී කොළඹ වරාය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොල කොටස 2001 වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා වර්ෂ විසි දෙකක කාලය තුළ සියයට 81 ක සිට සියයට 28 ක් දක්වා පහත වැටී තිබුණි. කොළඹ වරාය තුළ වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු 2021 වර්ෂය දක්වා ජය බහලුම් පර්යන්තය (JCT) මඟින් සිදු කරන ලද අතර 2021 වර්ෂයේ සිට නැගෙනහිර බහලුම් පර්යන්තයට මෙහෙයුම් කටයුතුවලට දායක වූ අතර තරඟකාරීව දිගුකාලීන බදු පදනම මත දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT) 2013 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර සියයට 26 ක වෙළඳපොල කොටසක්ද, කොළඹ ජාත්‍යාන්තර බහලුම් පර්යන්තය (CICT) 2001 වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කර සියයට 46 ක වෙළඳපොල කොටසක්ද 2022 වර්ෂය වන විට හිමිකරගෙන තිබුණි.

පසුගිය වර්ෂ පහක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර වගුව 23 පරිදි වේ.

| වර්ෂය | SLPA (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහලුම් විසිසම ඒකක මිලියන 3.550) | වෙළඳ පල කොටස | SAGT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහලුම් විසිසම ඒකක මිලියන 1.950) | වෙළඳපල කොටස | CICT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහලුම් විසිසම ඒකක මිලියන 2.400) | වෙළඳපල කොටස | එකතුව බහලුම් ඒකක |
|---|---|---|---|---|---|---|---|
| **2018** | 2,304,534 | 33 | 2,066,758 | 29 | 2,676,194 | 38 | 7,047,486 |
| **2019** | 2,282,618 | 32 | 2,052,153 | 28 | 2,893,566 | 40 | 7,228,337 |
| **2020** | 2,097,804 | 31 | 1,872,052 | 27 | 2,884,906 | 42 | 6,854,762 |
| **2021** | 2,198,334 | 30 | 1,838,693 | 25 | 3,212,331 | 45 | 7,249,358 |
| **2022** | 1,925,895 | 28 | 1,752,236 | 26 | 3,184,053 | 46 | 6,862,184 |

වගුව 23 - පසුගිය වර්ෂ පහක බහලුම් හැසිරීම පිළිබඳ විස්තර




රූපසටහන 37 - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු

මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2022 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපොල කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවතුණි. අධිකාරියේ බහලුම් මෙහෙයුම් කටයුතු (JCT) සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Berth Occupancy Ratio) සලකා බැලීමේදී 2018, 2019, 2020,2021 හා 2022 වර්ෂවල එය පිළිවෙලින් සියයට 64 ක්, සියයට 70 ක්, සියයට 72 ක් , සියයට 70 ක් හා සියයට 63 ක් වී තිබුණි. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2022 වර්ෂයේදී සියයට 7 කින් අඩුවී තිබුණි. අධිකාරියේ සියලු පර්යන්තයන්වල ධාරිතාවය විසිසම ඒකක මිලියන 3.55ක් වුවද 2022 වර්ෂයේ සත්‍ය බහලුම් මෙහෙයුම් විසිසම ඒකක මිලියන 1.92 ක් වූ අතර SAGT හා CICT බහලුම් පර්යන්තයන්හි ධාරිතාවය පිළිවෙලින් විසිසම ඒකක මිලියන 1.95ක් හා මිලියන 2.4ක් වුවද 2022 වර්ෂයේ සත්‍ය බහලුම් මෙහෙයුම් පිළිවෙලින් විසිසම ඒකක මිලියන 1.75ක් හා විසිසම ඒකක මිලියන 3.18ක් වූ අතර CICT පර්යන්තය උපරිම ධාරිතාවයද ඉක්මවා තිබුණි.

### නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය

ඉහත පරිදි බහලුම් මෙහෙයවීම සම්බන්ධයෙන් වරාය අධිකාරියේ දායකත්වය (JCT හි) අඩු වීම හේතුවෙන් එහි ධාරිතාවය වැඩි කිරීමට නැගෙනහිර පර්යන්තයෙහි (ECT) ඉදිකර තිබූ අතර නිමකර තිබූ කොටසෙහි මෙහෙයුම් කටයුතු 2021 වර්ෂයේ සිට ආරම්භ වීම නිසා 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි පර්යන්ත ධාරිතාවය විසිසම ඒකක මිලියන 3.55 දක්වා වැඩි වී තිබුණි.

### නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඌන උපයෝජනය

කොළඹ වරායේ දැනට ඉදිකර ඇති බහලුම් හැසිරවීම සඳහා වූ පර්යන්ත අතුරින් ගැඹුර මීටර් 14.25 ට වඩා වැඩි ගැඹුරු බේසමක් සහිත විශාල ප්‍රමාණයේ නැව් පැමිණිය හැකි පර්යන්ත වන්නේ කොළඹ ජාත්‍යන්තර බහලුම් පර්යන්තය හා නැගෙනහිර බහලුම් පර්යන්තය වේ.

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව බහලුම් විසිසම ඒකක මිලියන 0.8 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරැති හා මීටර් 440 ක් දිගැති නැගෙනහිර බහලුම් පර්යන්තයේ අදියර 1 හි ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් කර තිබුණි. ජය බහලු පර්යන්තය සඳහා මිලදීගත්, නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි දොඹකර තුනක්, 2020 පෙබරවාරි 07 දිනැති අංක PA/HD/25 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නැගෙනහිර බහලුම් පර්යන්තයේ (ECT) සවිකර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණි. අනතුරුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක. අමප/21/0198/328/005/ටිබීආර් දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නැගෙනහිර බහලුම් පර්යන්තය සංවර්ධනය කිරීම, මෙහෙයුම් උපකරණ මිලදීගැනීමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සම්පූර්ණ හිමිකාරිත්ව සහිත බහලුම් පර්යන්තයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2022 වර්ෂය තුළදී ගැඹුර මීටර් 14.25 ට වැඩි විශාල ප්‍රමාණයේ බහලුම් නෞකා 17 ක් පර්යන්තය වෙත පැමිණ තිබූ අතර බහලුම් 346,174 ක් පරිශ්‍රය තුලදී මෙහෙයවා තිබුණි. 2021 වර්ෂයේ සියයට 48 ක්ව පැවති පර්යන්ත ධාරිතා උපයෝජන අනුපාතය (Capacity Utilization) 2022 වර්ෂයේදී සියයට 43 ක් දක්වා අඩුවී තිබුණි. නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි විශාල පරිමාණයේ දොඹකර 12 ක් (STS Cranes) හා රේල් පීලි මත සවිකර ක්‍රියාකරන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 ක් (ARMG Cranes) එ.ජ.ඩො. මිලියන 282.56 ක ඇස්තමේන්තුගත පිරිවැයට මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලදී පර්යන්තයේ ධාරිතාවය සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

### වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් විසින් ලබාගත් ණය වෙනුවෙන් ඇපවීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් ලෙස මාගම්පුර වරාය කළමණාකරණ සමාගම 2007 අංක 07 සමාගම් පනත යටතේ 2013 ජූලි 05 වන දින සංස්ථාපනය කර තිබුණු අතර කළමනාකරණ ගිවිසුමක් මඟින් හම්බන්තොට වරායේ මෙහෙයුම් කළමනාකරණය සමාගම වෙත පවරා තිබුණි. සමාගම විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් (CEYPETCO) ලබාගත් බලපත්‍රයක් මඟින් හම්බන්තොට වරායේ ඉන්ධන සැපයුම්කරුවෙකු ලෙස මෙහෙයුම් ආරම්භ කළ අතර ගබඩා කිරීම සහ ජාත්‍යන්තර නෞකාවලට ප්‍රති අපනයනය කිරීම අරමුණු කරගෙන විශාල ලෙස ඉන්ධන ආනයනය කරන ලදී. කෙසේ වෙතත්, මූලික වශයෙන් ලෝක වෙළඳපලේ තෙල් මිල පහත වැටීම හේතුවෙන් සමාගමට ඉන්ධන සැපයුම මඟින් සැලකිය යුතු පාඩුවක් සිදු වී තිබුණි. 2014 වර්ෂයේදී සමාගම පුද්ගලික බැංකුවකින් ඇමරිකානු එක්සත් ජනපද (ඇ.එ.ජ) ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එයින් ණය මුදල හා පොළිය ලෙස ඇ.එ.ජ ඩොලර් මිලියන 26.49 (රු. මිලියන 9,617) ක් 2023 ඔක්තෝම්බර් 12 දින වන විටත් පියවා නොතිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති බවද නිරීක්ෂණය විය. 2017 නොවැම්බර් සිට සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අතර බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණු අතර 2022 වර්ෂය අවසාන වන විටද නඩු කටයුතු අවසන්ව නොතිබුණි.

### වරාය අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්

හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල වෙනුවෙන් අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ගෙවන ලද වාරික මුදල රු. මිලියන 4,406 ක් හා මුද්දර ගාස්තු රු. මිලියන 372 ක් ද ඇතුළුව රු.මිලියන 4,778 ක මුදල 2023 මැයි 31 දින දක්වාම අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් ශේෂ සනාථන අධිකාරිය විසින් කැඳවා තිබුණද මහා භාණ්ඩාගාරය විසින් එම සනාථන තහවුරු කර නොතිබුණු අතරම 2022 වර්ෂය සඳහා වූ ජනරජ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ තුළ මෙම ශේෂය ඇතුළත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. මේ නිසා මෙම මුදල ලැබීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෙල් ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඩොලර් ණය මුදල සඳහා වාරික මුදල් මහා භාණ්ඩාගාරය විසින් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් අධිකාරිය නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන එක්සත් ජනපද ඩොලර් ගිණුමෙන් 2018 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 0.64 එනම් රු.මිලියන 377.84 ක් බැංකුව විසින් අයකරගෙන තිබුණු නමුත් එම මුදල මෙතෙක් වරාය අධිකාරිය වෙත ලැබීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

### මුදල් පනතට හා වරායවල් පිළිබඳ අධිකාරී පනතට අනුකූල නොවීම්

මුදල් පනතට අනුව රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක මූල්‍ය ප්‍රකාශන අනුව අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේම 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 30 වගන්තිය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරන ලද වත්කම්වල අගය සහ අධිකාරියට ලබාදුන් මූල්‍යමය දායකත්වය මත වර්ෂයකට සියයට 8 ක් (අවම වශයෙන් රු.මිලියන 607) නොඉක්මවන ලාභාංශයක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. 1979 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 43 ක් තුල අධිකාරිය විසින් ලාභ ඉපයූ වර්ෂ සඳහා පමණක් ස්කන්ධ ප්‍රාග්ධනය මත ගෙවිය යුතු උපරිම ලාභාංශ රු.මිලියන 15,383 ක් වූ අතර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණේ රු.මිලියන 1,585 ක් එනම් සියයට 10ක් පමණි. කෙසේ වුවද, 2020 හා 2021 වර්ෂ සඳහා රු.මිලියන 39,433 ක් වූ බදු පසු ලාභයෙන් රු.මිලියන 985 ක් එනම් සියයට 2 ක් පමණක් ලාභාංශ ලෙස මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙත කිසිදු මුදලක් ප්‍රේෂණය කර නොතිබුණි.

### වරාය පනතට අනුකූල නොවීම

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ (v) කොටසෙහි 38 (1) (අ) සහ (ආ) වන වගන්ති අනුව අත්අඩංගුවට ගන්නා ලද හෝ රාජසන්තක කරන ලද භාණ්ඩ රේගු දෙපාර්තමේන්තුව විසින් බැහැර කරනු ලබන්නේ නම් අධිකාරියට ගෙවිය යුතු සියලුම ගාස්තු රේගු දෙපාර්තමේන්තුව විසින් අධිකාරියට ගෙවිය යුතුය. නමුත් අත්අඩංගුවට ගත් කන්ටේනර් 6 ක් සඳහා අධිකාරියට අයවිය යුතු රු. මිලියන 23 ක් එසේ අයකරගෙන නොතිබුණි.

### විධිමත්ව ඉඩම්පවරා දී නොතිබීම

ඩී.ආර්.විජේවර්ධන මාවතේ පිහිටි වටිනාකම රු. මිලියන 629 ක් වූ අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාරදී තිබුණ ද විධිමත් ක්‍රියාමාර්ග අනුව වටිනාකම රෙජිස්ටරයෙන් ඉවත් කර, හිමිකම් ඔප්පුවක් මගින් ඉඩම පවරාදී නොතිබුණි.

කැනල් අංගනය (බටහිර) කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන වටිනාකම රු.මිලියන 948 ක් වූ අක්කර 02 ක ඉඩම් රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ නමුත් නීත්‍යානුකූලව එම ඉඩම පවරාදීම හා වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

සිරිල් සී පෙරේරා මාවතේ පිහිටි වටිනාකම රු. මිලියන 84 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරි වෙත පවරාගෙන ඇති නමුත් නීත්‍යානුකූල හුවමාරුවීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී නොතිබුණි.

### අනාර්ථික වියදම්

දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණින් ගාල්ල වරායේ බහුකාර්ය පර්යන්තයක් ඉදිකිරීම සඳහා 2006 මාර්තු 28 දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ණය ගිවිසුමකට එළඹ තිබුණු අතර ගාලු කොටුව ආශ්‍රිතව මෙම ඉදිකිරීම් සිදු කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතවීමත්, ණය අරමුදල් ප්‍රමාණවත් නොවීමත්, ණය කාලසීමාව දීර්ඝ නොකිරීමත් යන හේතු මත මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. මේ සඳහා වැය කරන ලද රු. මිලියන 423 ක් වූ උපදේශන ගාස්තු අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල කෙරිගෙනයන වැඩ යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වියදම ප්‍රාග්ධන හෝ අයභාර වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඉහත වැය කරන ලද මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

### ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම

2010 වර්ෂයේදි දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 142 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණු බව දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ මෙම මුදල හෝ කොටස්වල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාල සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම සමග ගිවිසුම්ගත බැඳීමක් ඇති කරගෙන නොතිබීම හේතුවෙන් අධිකාරිය වෙත අදාල සමාගමේ කොටස් ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

### පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් නොකිරීම

2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය අනුව පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කල යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

### ආනයන අපනයන භාණ්ඩ ප්‍රවාහනය

සී/ස ලංකා නැව් සංස්ථාව, ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන ප්‍රවාහන කාර්යයන්හිලා පහසුකම් සැපයීම හා සහයෝගය ලබාදීම සඳහා පිහිටුවා ඇති පූර්ණ රාජ්‍ය හිමිකාරත්වය සහිත ව්‍යවසායයකි. රාජ්‍ය අංශයේ ආයතන විසින් සිදුකරන ආනයනයන්, භාණ්ඩ ප්‍රවාහනය, රේගු නිශ්කාෂණ හා අනෙකුත් සේවාවන්, වෙනත් නැව් සමාගම් මඟින් සිදුකිරීම අවම කර එම සේවාවන් රාජ්‍ය හිමිකාරත්වය සහිත දේශීය ප්‍රවාහයකු මඟින් සිදුකර විදේශ විනිමය රට තුල

රඳවා ගැනීමේ අරමුණ ඇතිව මෙම සමාගම වෙත රාජ්‍ය අනුග්‍රහයන් ලබාදී ඇති අතර ඒ සඳහා Mv Ceylon Breeze හා Mv Ceylon Princess නමින් වන නැව් දෙකෙහි හිමිකාරීත්වය සමාගම සතුය. මෙම නැව් 02 මඟින් මෙන්ම කුලී පදනම මත ලබා ගන්නා නැව් මඟින් ද ලංකා නැව් සංස්ථාව තම මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. ඒ අතරින් ද Voyage හා Charter hire ප්‍රධාන ආදායම් මාර්ග දෙක වේ.

Voyage (සංස්ථාවේ නැව් මඟින් නැව් ගමන් සිදු කර ආදායම් ඉපැයීම)

Charter hire

සමාගම ඉහත යාත්‍රා දෙක මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 70 ක කාලීන ණයක් ලබාගෙන ඇති අතර, 2018 පෙබරවාරි 03 දිනට බැංකුවට ගෙවිය යුතු ණය ප්‍රාග්ධන ශේෂය වසර 15 සිට අවුරුදු 20 දක්වා සංශෝධනය කර ඇත. සංශෝධිත ණය කොන්දේසි අනුව, ණය ආපසු ගෙවීම ඇමරිකානු ඩොලර් මිලියන 2 ක බැගින් වූ ද්විවාර්ෂික වාරික මගින් සිදු කළ යුතුය. 2022 මාර්තු 31 දින දක්වා වාරික වශයෙන් ඩොලර් මිලියන 18 ක් ගෙවිය යුතුව තිබුණද, සමාගම ගෙවා තිබුණේ ඩොලර් මිලියන 12 ක් පමණක් වන අතර සමාලෝචිත වසර අවසාන වන විට ද හිඟ ණය වාරිකය වන ඩොලර් මිලියන 6 ක් විය.

**නැව් සංස්ථාව මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන සාපේක්ෂව අඩු වීම**

2016 ජනවාරි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ 2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කළ යුත්තේ සමාගම හරහා වන අතර එහිදී සමාගම, රාජ්‍ය ආයතන වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන පරීක්ෂා කිරීමේදී, සමාගම හරහා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන සාපේක්ෂව අඩු වී තිබුණි. විස්තර පහත වගුව 24 හි දක්වා ඇත.

| වර්ෂය | වාර ගණන |
|---|---|
| **2018** | 1981 |
| **2019** | 1790 |
| **2020** | 2172 |
| **2021** | 1533 |
| **2022** | 790 |

වගුව 24 - සමාගම හරහා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවස්ථා ගණන.

# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අංශය

## විගණන නිරීක්ෂණ

- විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම්වල දුර්වලතා නිසා උපයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතීම
- ආර්ථික අපහසුතාවයෙන් යුත් දහම් පාසල් සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම කටයුතු අතරමග නවතා තිබීම
- ජෝන් ද සිල්වා සමරු රඟහලේ අලුත්වැඩියා කටයුතු නිමකිරීමට නොහැකි වීම
- දඹදිව වන්දනාකරුවන්ට පහසුකම් සැපයීම පිළිබඳ පසුවිපරම් සිදු නොකිරීම

# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අංශය

2022 වර්ෂය ආරම්භයේ දී බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රාජ්‍ය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු 08 ක් හා ව්‍යාස්ථාපිත මණ්ඩල / ආයතන 11 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව පැවති අතර වර්ෂය තුළ සිදු කරන ලද අමාත්‍යාංශවලට අදාල කාර්යභාර සංශෝධනවලින් පසු පැවති රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී දෙපාර්තමේන්තු 09 ක් සහ ව්‍යාස්ථාපිත මණ්ඩල / ආයතන 10 ක් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත්ව තිබුණි.

- දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථානවලට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම සඳහා "සසුන් උදාව" ජාතික වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.
- ජාතික උරුමයන් ආරක්ෂා කිරිම සඳහා අවශ්‍ය නීති අණපනත් සුදුසු පරිදි සංශෝධනය කිරීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කොට එය සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය පදනම සකස් කිරීම.
- ජනාධිපති කාර්ය සාධක බලකාය හා ඒකාබද්ධ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය හා නීතිමය පසුබිම සකස් කිරිම.
- සියළුම ආගම් වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරිම.
- ජාතික උරුමයන් ආරක්ෂා කිරිම සඳහා පවතින ආයතනවල ඵලදායිතාතාව ඉහළ දැමීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම.
- දේශීයත්වය මුල්කරගත් කතෘ භාග ගෙවිම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දිම.
- අංග සම්පූර්ණ "නාට්‍ය නිකේතනයක්" ස්ථාපිත කිරිම හා කලාකරුවන්ගේ වෘත්තිය සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරිම සඳහා ආයතනික ව්‍යුහයන් සැකසීම.
- කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශනය සඳහා විශේෂිත පහසුකම් සැලසීම.
- සාම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසාංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනිමේ සංචාරක හොටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදිමේ වැඩපිළිවෙලවල් සංචාරක අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම.

- නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 09 ක් වෙත එකතුව රු.මිලියන 6,918 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 5,983 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 935 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.




| | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | මහාභාරකාර දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 1,993 | 1,276 | 153 | 183 | 247 | 875 | 447 | 281 | 1,388 | 76 | 6,919 |
| වියදම | 1,765 | 1,180 | 122 | 168 | 225 | 747 | 329 | 191 | 1,186 | 71 | 5,984 |
| ඉතිරිය | 228 | 96 | 31 | 15 | 22 | 128 | 118 | 90 | 202 | 5 | 935 |

රූපසටහන 38 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම්වල දුර්වලතා නිසා උපයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතීම

2005 වර්ෂයේ ආරම්භ කර 2017 සැප්තැම්බර් 30 දින නිම කිරීමට නියමිතව තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව අදියර 05 ක් දක්වා ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1,246 ක පිරිවැයක් දරා තිබූ අතර ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද ගොඩනැඟිල්ලේ අත්තිවාරමේ පවතින දෝෂ සහිත බව නිසා ප්‍රධාන ගොඩනැගිල්ලට සමානව ඉදිරිපස හා පිටුපස පඩිපේලි ගිලා බැස තිබීම, ටයිල් ගැලවී ප්‍රවේශ පඩිපෙළ හා සම්බන්ධ බිත්ති පුපුරා ඉරිතලා තිබීම, ගොඩනැගිල්ලේ ඉහලම මහලෙහි ලින්ටල්වල බදාම තට්ටු ගැලවී තිබීම, ගොඩනැඟිල්ල තුළට පිටතින් ජලය කාන්දුවීමෙන් මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සහිත කාමරයේ සහ ජල ටැංකි ස්ථාපනය කර තිබූ ස්ථානයේ දිය සීරාව රැඳී තිබීම සහ ගොඩනැඟිල්ලේ සවි කර තිබූ ගිනි නිවීමේ උපකරණ 2019 නොවැම්බර් 10 දින කල් ඉකුත් වී තිබීම නිසා 2022 වර්ෂයේ අවසානය වන විටත් උපයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

### ආර්ථික අපහසුතාවයෙන් යුත් දහම් පාසල් සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම කටයුතු අතරමග නවතා තිබීම

මධ්‍යම සංස්කෘතික අරමුදල විසින්, ආර්ථික අපහසුතාවයෙන් යුත් දහම් පාසල් සඳහා ස්ථිර ගොඩනැගිලි 367 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මගින් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය අපේක්ෂා කර තිබුණද අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව 2023 මැයි 31 දින රු. මිලියන 872 ක් ගෙවා දහම් පාසල් ගොඩනැගිලි 298 ක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. තාක්ෂණික කමිටුවේ අනුමත මිල අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 1,175 ක් වුවද, භෞතික ප්‍රගතිය අනුව කරන ලද වැඩවල වටිනාකම රු. මිලියන 872 ක් විය. ඒ අනුව, ගොඩනැගිලි 367 ක වැඩ ආරම්භ කර තිබුණද ඉදිකිරීම් අවසන් කළ ගොඩනැගිලි සංඛ්‍යාව 131 ක් විය.

### ජෝන් ද සිල්වා සමරු රඟහලේ අලුත්වැඩියා කටයුතු නිමකිරිමට නොහැකි වීම

ජෝන් ද සිල්වා රඟහල අලුත්වැඩියා කිරීමේ දෙවන අදියරේ කටයුතු සඳහා රු.මිලියන 1,567 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් වූ රු.මිලියන 311 ක් අත්තිකරම් ලෙස ගෙවා තිබුණද එදින වන විට නිමකර ඇති ඉදිකිරීම් ප්‍රමාණය රු.මිලියන 86 කට සමාන ප්‍රමාණයක් විය. රඟහලේ අලුත්වැඩියා කටයුතු අවසන් කර 2022 දෙසැම්බර් 09 දින සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවද,

2023 අප්‍රේල් 20 දින වන විටත් අලුත්වැඩියා කටයුතු නිම කර නොතිබුණි.

### දඹදිව වන්දනාකරුවන්ට පහසුකම් සැපයීම පිළිබඳ පසුවිපරම් සිදු නොකිරීම

දඹදිව වන්දනා සංවිධායකයින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙහි ලියාපදිංචි කිරීම තුළින් චාරිකාවේ යෙදෙන්නන්ට නිදහස් වීසා ලබා ගැනීමේ පහසුව, විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ පහසුව හා වන්දනාකරුවන්ට වැඩි ආරක්ෂාවක් සැපයීම වැනි අවස්ථාවන් හිමිවන නමුත් එම පහසුකම් පිළිබඳව සංවිධායකයින් සහ වන්දනාකරුවන් දැනුවත්කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නොතිබූ අතර නිදහස් වීසා පහසුකම් ලබාදීම තුළින් වියදම අඩුවීමේ වාසිය වන්දනාකරුවන්ට හිමිවන්නේද යන්න පිළිබඳව පසු විපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

# වනාන්තර, වනසත්ත්ව හා පරිසර අංශය

## විගණන නිරීක්ෂණ

- වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
    - අවම ලන්සුව නොසලකා හැර ගොඩනැගිල්ලක් කුලියට ගැනීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
    - මුතුරාජවෙල පරිසර පද්ධතිය
    - අලි මිනිස් ගැටුම
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
    - ඉදිකිරීම් අතර මහ නවතා දමා තිබීම
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
    - තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම
    - කැලෑවලින් ලැබෙන ආදායම අඩු වීම
    - අයවිය යුතු මුදල් නිසි ලෙස අය වී නොතිබීම
    - කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා ලබාදුන් ඉඩමකින් අයවිය යුතු මුදල් අය වී නොතිබීම
    - වන වගාව සඳහා පැල සිටුවීම
    - වාහනවල භෞතික පැවැත්ම තහවුරු කර නොතිබීම
    - වන අපරාධ අවම කර ගැනීමට නොහැකි වීම
- රාජ්‍ය දැව සංස්ථාව
    - ගෘහ භාණ්ඩ තොග නිශ්කාර්යව පැවතීම
    - ණයට විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්
    - දැව පරිවර්තනය කිරීමේ අපතය
- වන සත්ව සංරක්ෂණ අරමුදල
    - ජාතික රක්ෂිත ප්‍රදේශ සඳහා ඇතුල්වීමේ ගාස්තු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය නිසා ආදායම් අහිමි වීම

- සත්වෝද්‍යාන සුභසාධන හා සංවර්ධන අරමුදල
    - සත්ව සුබසාධන උපාය මාර්ගයන්ට අනුකූල වීම
    - සත්ව නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපනය කර නොතිබීම
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය
- මධ්‍යම පරිසර අධිකාරිය
    - පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීම
    - කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය
    - ව්‍යාපෘති ප්‍රදානවලින් ඉතිරි වී තිබූ මුදල් ආපසු භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබීම
    - නිෂ්කාර්යව උපකරණ මිලට ගැනීම
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
    - නෞකා අනතුරට අදාළ වන්ධි ප්‍රතිපූරනය නොකිරීම
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
    - ගාස්තු අය කර ගැනීමට නොහැකි වීම
    - කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් වලට අදාළ ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වීම
- වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල
    - ත්‍යාග මුදල් හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රම වේදයක් නොතිබීම

# වනාන්තර, වනසත්ත්ව හා පරිසර අංශය

වන ජීවීන් හා වන සම්පත සුරැකි තිරසර දේශයක් දැක්ම කරගත් "වනජීවී හා වන සංරක්ෂණය මඟින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම අරමුණු කරගනිමින් ස්ථානීය වෘක්ෂලතා සංරක්ෂණය සහ ස්ථානීය හා පරිබාහිර සත්ත්ව සංරක්ෂණය ද තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියමු ආයතන සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම"යන මෙහෙවර ඉටු කිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු තුනක්, ව්‍යවස්ථාපිත ආයතනයක්, ව්‍යවස්ථාපිත අරමුදල් තුනක් සහ විදේශාධාර ව්‍යාපෘතියක් පැවති අතර අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාර්යභාර්ය ඉටුකළ යුතුව තිබුණි.

- රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- අමාත්‍යාංශ විෂය යටතට අයත් ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 03 කට රු.මිලියන 7,921 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 7296 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 625 ක් උපයෝජනය කර නොතිබුණි. විස්තර රූපසටහන 39 හි දැක්වේ.




| | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය | 2707 | 2256 | 749 | 2209 | 7921 |
| ප්‍රතිපාදන උපයෝජනය | 2329 | 2162 | 691 | 2114 | 7296 |
| ඉතිරිය | 378 | 94 | 58 | 95 | 625 |

රූපසටහන 39 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම
මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

### අවම ලන්සුව නොසලකා හැර ගොඩනැගිල්ලක් කුලියට ගැනීම

2016 ජූනි 01 දින සිට මහල් හයකින් යුතු පුද්ගලික ගොඩනැගිල්ලක වර්ග අඩි 22,522 ක වපසරියක වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා 2021 ජූනි මස 01 දින සිට 2023 මැයි 31 දින දක්වා රු. මිලියන 140 ක් ගෙවා තිබුණි. මේ සඳහා කැඳවූ මිල ගණන් අනුව ඒ ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලකින් ඊට වඩා රු. මිලියන 19 ක් අඩුවෙන් ලැබී තිබුණු මිල ගණන් නොසලකා සහ රජයේ මාසික තක්සේරුව වූ රු. මිලියන 8 ක් නොසලකා හැර ගොඩනැගිල්ල කුලියට ගෙන තිබුණ අතර රජයේ ගොඩනැගිල්ලකින් ඉඩකඩ පහසුකම් වෙන්කර ගැනීමට ද ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### මුතුරාජවෙල පරිසර පද්ධතිය

මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටර්යාර 1,285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභය භූමියක් ලෙස ගැසට් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභය භූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### අලි මිනිස් ගැටුම

2021 සහ 2022 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම සඳහා රු. මිලියන 1,251 ක් ද, එහි නඩත්තුව සඳහා රු. මිලියන 1,031 ක් ද වැය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකර තිබුණු සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ, දේපළ හානි හා ශාරීරික හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවීය. විස්තර වගුව 25 හි දැක්වේ.

| වර්ෂය | අලි මරණ | මිනිස් මරණ | දේපළ හානි | ශාරීරික හානි |
|---|---|---|---|---|
| **2018** | 319 | 96 | *838 | *37 |
| **2019** | 407 | 122 | *2,148 | *145 |
| **2020** | 327 | 113 | *850 | *75 |
| **2021** | 375 | 142 | *1,326 | *58 |
| **2022** | 439 | 145 | *2668 | *179 |
| **එකතුව** | **1,867** | **618** | **7,830** | **494** |

වගුව 25 - , පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ, දේපළ හානි හා ශාරීරික හානි

★ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වන්දි ගෙවන බැවින් දෙපාර්තමේන්තුව සතුව සම්පූර්ණ තොරතුරු නොමැත.

### ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

### පින්නවල සත්වෝද්‍යානයේ වානරයන් ප්‍රදර්ශනය නොකිරීම

2019 වර්ෂයේ ආරම්භ කළ පින්නවල සත්වෝද්‍යානයේ වානර දූපතෙහි ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය වන විට සම්පූර්ණයෙන් නිම කර තිබුණ ද, වසරකට අධික කාලයක් එම පරිශ්‍රයට සතුන් (වානරයන්) මුදා නොහැර නිෂ්කාර්යව පැවතුණි.

### ඉදිකිරීම් අතර මඟ නවතා දමා තිබීම

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ රු.මිලියන176 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා එළැඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තු අවසන් කර අතර මඟ නවතා දමා තිබුණු අතර එම ව්‍යාපෘති වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද රු. මිලියන 70 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩමූලික අත්තිකාරම් රු. මිලියන 14 ක් ද අය කරගත යුතුව තිබුණි.

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම

"වනාන්තර ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම" සහ "භෞමික පරිසර පද්ධති හා තිරසාරව කළමනාකරණය කරන ලද වනාන්තර ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, කාන්තාරකරණයට එරෙහිව කටයුතු කිරීම, ජෛව විවිධත්ව හානිය වැලැක්වීම" වශයෙන් 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන තිබුණු ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 2 ක් යටතේ 2030 වර්ෂය වන විට වන ආවරණය සියයට 32 දක්වා වැඩි කිරීම ඉලක්ක කර තිබුණි. එසේ වුවද, 2022 වර්ෂයේ කාර්යසාධන පිළිබඳ තොරතුරු, මුළු වන ගහනය සහ ඊට සාපේක්ෂව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් පත් කර නොතිබුණි.

### කැලෑවලින් ලැබෙන ආදායම අඩු වීම

දෙපාර්තමේන්තු කළමනාකරණය යටතේ පවතින ඉඩම්වල පිහිටි කළුගල් කඩා ඉවත් කිරීමේ දී 2009 මැයි 06 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව 2020 වර්ෂය දක්වා අයකළ ගාස්තු, සාධාරණ හේතුවක් නොමැතිව සියයට 50 කින් අඩු කිරීමට 2020 නොවැම්බර් 13 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ගාස්තු අඩු කිරීම හේතුවෙන් දිසාවන කාර්යාල 05 ක පමණක් කලු ගල් කැඩීමෙන් අහිමි වූ ආදායම රු. මිලියන 18 ක් විය.

### අයවිය යුතු මුදල් නිසි ලෙස අය වී නොතිබීම.

පුද්ගලික සමාගමක් විසින් පවත්වාගෙන ගිය කළුගල් කොරියක 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ සීමාව ඉක්මවා කැණීම් කරන ලද ගල් කියුබ් 541,471 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. මිලියන 133 ක් ඉදිරි වර්ෂ 3 ක් තුළ මාසික වාරික වශයෙන් අය කර ගැනීමට 2020 ඔක්තෝබර් මස ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට අය කරගත යුතුව තිබූ රු. මිලියන 78 කින් රු. මිලියන 66 ක් අය කරගෙන නොතිබුණු අතර රු. මිලියන 5 ක අගරු චෙක්පතක් ද ඒ අතර විය.

### කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා ලබාදුන් ඉඩමකින් අයවිය යුතු මුදල් අය වී නොතිබීම

කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලශක්ති පුද්ගලික සමාගමකට 2015 පෙබරවාරි මස සිට පර්චස් 200 ක් බදු දී තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව පර්චසයක් සඳහා වසරකට රු.5,000 ක් බැගින් පළමු වසර සඳහා පමණක් රු. මිලියනයක බදු මුදල් ලබාගෙන ඉන් අනතුරුව කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම සමාගම විසින් ගිවිසුම්ගත පර්චස් 200 ට අමතරව තවත් පර්චස් 523.78 ක් අනවසරයෙන් පරිහරණය කර තිබුණු අතර ඒ අනුව 2023 පෙබරවාරි 18 දින වන විට පර්චස් 723.78 ක් සඳහා වසර 08 ක් වෙනුවෙන් එම සමාගමෙන් අයවිය යුතු මුදල රු. මිලියන 40 ක් විය.

### වන වගාව සඳහා පැල සිටුවීම

නියමිත කාල වකවානු තුළ පැළ සිටුවීමට හෝ පැළ බෙදාදීම සඳහා සැලසුම්ගත වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙන් මුලතිවු හි පිහිටි පැළ තවාන් 02 හි 2019 වර්ෂයේ සිට රෝපණය කරන ලද පැළ 197,736 කින් බොහොමයක් සහ ගල්ගමුව අඩවි වන කාර්යාලයට අනුබද්ධිත මැදගම පැළ තවානේ 2022 වර්ෂයේ හා ඊට පෙර නිපදවූ පැළ 67,375 කින් පැළ 6,748 ක් ද, 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) රු. මිලියන71 ක ප්‍රතිපාදන මත රෝපණය කර නඩත්තු කරන ලද පැළ විශාල ප්‍රමාණයක් ද මියගොස් තිබුණු අතර තවත් විශාල පැළ ප්‍රමාණයක් අසාමාන්‍ය ලෙස වර්ධනය වී තිබුණි.

### වාහනවල භෞතික පැවැත්ම තහවුරු කර නොතිබීම

දෙපාර්තමේන්තුවට අයත් වාහන සංචිතය භෞතික සත්‍යාපනයක් සිදුකර නැති අතර වාහන 711 ක් පවතින බවට තොරතුරු ඉදිරිපත් විය. එසේ වුව ද, එයින් වාහන 288 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබීමෙන් ඒවායේ භෞතික පැවැත්ම සනාථ කළ නොහැකි විය.

### වන අපරාධ අවම කර ගැනීමට නොහැකි වීම

වන අපරාධ අවම කර ගැනීමට නොහැකි වීම, පවත්නා නඩු කාර්යක්ෂමව අවසන් කර ගැනීමට නොහැකි වීම, අවසන් වී ඇති නඩුවලට අදාළ දඩ මුදල් නිසි පරිදි අය කර ගැනීමට කටයුතු නොකිරීම යනාදී කරුණු හේතුවෙන් 2017 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මුලතිව් අඩවි වන කාර්යාලය සහ ඕළුමඩු අඩවි වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළි කිරීම්, ගස් හෙළීම්, දැව ප්‍රවාහනය වැනි වන අපරාධ පිළිවෙලින් 929 ක් සහ 491 ක් සිදු කර තිබුණි. එසේම කුරුණෑගල, ගල්ගමුව, මැල්සිරිපුර, කුලියාපිටිය සහ මහව යන අඩවි යටතේ පාලනය වන රක්ෂිත වනාන්තරවල හෙක්ටයාර් 253 කට හානි සිදු කිරීම සම්බන්ධ වන අපරාධ විශාල ප්‍රමාණයක් පැවති අතර නඩු විසඳීම මන්දගාමී වීමෙන් රජයට අයවිය යුතු ගාස්තු නියමිත කාලවකවානු තුළ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. වන අපරාධ දැව ද විශාල ලෙස ගොඩගැසී දිරාපත් වෙමින් පැවතුණි.

## රාජ්‍ය දැව සංස්ථාව

### ගෘහ භාණ්ඩ තොග නිශ්කාර්යව පැවතීම

2012 වර්ෂයේ සිට 2022 ජූලි 31 දින දක්වා නිෂ්පාදනය කරන ලද පිරිවැය රු. මිලියන 68 ක් වූ අතිරික්ත ගෘහ භාණ්ඩ තොගයක් ද, 2022 වර්ෂය තුළ කිසිදු අලෙවියක් කර නොතිබුණු රු. මිලියන 7 ක් වටිනා ගෘහ භාණ්ඩ අයිතම 32 ක් සහ ඉතා සෙමින් අලෙවි වන රු. මිලියන 3 ක් වටිනා ගෘහභාණ්ඩ අයිතම 12 ක් ද, 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිෂ්පාදනය කරන ලද නමුත් ඔප නොදමන ලද වටිනාකම රු. මිලියන 20 ක් වූ ගෘහ භාණ්ඩ තොගයක් ද බුස්ස ප්‍රදර්ශනාගාර ගබඩාවේ හා යන්ත්‍රාගාරයේ පැවතුණි.

### ණයට විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්

ණය පදනම මත ලබාදුන් දැව සහ දැව ආශ්‍රිත ගෘහභාණ්ඩ සඳහා 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුදල රු.මිලියන 909 ක් වූ අතර එයින් වසර 01 ත් 03 ත් අතර හිඟ හිටි ණය රු.මිලියන 431 ක් ද, වර්ෂ 04 ක් හා ඊට වැඩි ණය රු. මිලියන 60 ක් ද විය. ණය මුදල් ගෙවා නොමැති ආයතන 24 ක් වෙත නැවත නැවතත් ණයට භාණ්ඩ විකිණීම හේතුවෙන් එම ආයතනවලින් අයවිය යුතු ණය මුදල රු.මිලියන 771 ක් විය.

### දැව පරිවර්තනය කිරීමේ අපතය

අම්පාර දැව ඉරුම්හලේ 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිවර්තනය කිරීම සඳහා පරිවර්තනය කිරීමේ දී සිදු වී තිබූ අපතය ඝන ඩෙසිමීටර් 1,706,529 ක් හෙවත් සියයට 49 ක ප්‍රතිශතයක් බවට නිරීක්ෂණය වූ අතර එම කාලය තුළ ඇතැම් කාර්යයන් සඳහා අවශ්‍යතාව ඉක්මවා සියයට 32 ක් වැඩියෙන් ඝන ඩෙසිමීටර් 454,496 ක දැව ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. තවද, එම කාලය තුළ ඉරන ලද රු. මිලියන 295 ක් වටිනා ඝන ඩෙසිමීටර් 3,718,422 ක විශාල දැව තොගයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් නොතිබීමෙන් ගොඩගැසි තිබුණි.

## වන සත්ව සංරක්ෂණ අරමුදල

### ජාතික රක්ෂිත ප්‍රදේශ සඳහා ඇතුල්වීමේ ගාස්තු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය නිසා ආදායම් අහිමි වීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ජාතික රක්ෂිත ප්‍රදේශ සඳහා ඇතුල්වීමේ ගාස්තු 2022 අගෝස්තු 08 දිනැති අංක 2292/11 දරන ගැසට් පත්‍රය මඟින් එදින පටන් සංශෝධනය කර තිබුණ ද, එම ගාස්තු සංශෝධනය 2022 සැප්තැම්බර් මස 02 වන දින සිට අදාළ කර ගෙන ඒ දක්වා පැරණි ගාස්තුව අය කර තිබීම හේතුවෙන් යාල උතුරු ගල්ගේ පිවිසුම හා යාල පලටුපාන පිවිසුම යන යාල ජාතික උද්‍යාන පිවිසුම් දෙකෙහි සහ කුමන, ලාහුගල, මාදුරු ඔය, ගල්ඔය, විල්පත්තුව, ගැල්වෙස්ලෑන්ඩ් යන ජාතික උද්‍යාන 06 හි එම කාලයට අදාළව රු.මිලියන 17 ක ආදායමක් අහිමි වී තිබුණි.

### සත්වෝද්‍යාන සුභසාධන හා සංවර්ධන අරමුදල

### සත්ව සුබසාධන උපාය මාර්ගයන්ට අනුකූල වීම

ලෝක සත්වෝද්‍යාන හා මින් මැදුරු පිළිබඳ සංගමය විසින් 2015 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සත්ව සුබසාධන උපාය මාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ II ඡේදය ප්‍රකාරව සත්ව වර්ග 13 කට අදාළව මරණ පරීක්ෂණ පවත්වා නොතිබුණි. තවද, එහි 03 වන ඡේදය ප්‍රකාරව සත්වෝද්‍යානය තුළ සතුන්ට ස්වභාවික හැසිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කළ යුතු වුවද ඊට පටහැනිව 2022 දෙසැම්බර් 20 දින වන විට හුදකලාව දිවිගෙවන සතුන් 15 ක් හා සහකරුවන්

නොමැති සතුන් 56 ක් සත්වෝද්‍යානය ප්‍රදර්ශනය සඳහා තබා තිබුණි.

### සත්ව නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපනය කර නොතිබීම

බෝවන රෝගයක් වැළඳුනු සතුන් නීරෝගී සතුන්ගෙන් ඉවත් කර නිරෝධායනය කිරීම සඳහා දෙහිවල සත්වෝද්‍යානය තුළ නිරෝධායන මධ්‍යස්ථානයක් නොතිබුණු අතර ගෝණපළ ඉදිකරමින් පවත්නා නිරෝධායන මධ්‍යස්ථානයේ කටයුතු අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේ මාස 02 ක් වූ කෙටි කාලයක් තුළ සුදු මොනරකු හා මොනර පැටවුන් සිවු දෙනෙකු බෝවන රෝගයක් හේතුවෙන් මිය ගොස් තිබුණි.

### පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

පරිසර පද්ධතිවල කළමනාකරණය වැඩි කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කර එමඟින් ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර ගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වුවද, ජීවනෝපායන් වැඩි දියුණු කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා ස්වාභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම හා අලි මිනිස් සහජීවනය ඇති කිරීම යන අතිශය වැදගත් සංරචකයන් සඳහා රු.මිලියන 3,117 ක් වන සියයට 38 තරම් අඩු ප්‍රතිපාදනයක් ද, ආයතන කුසලතාවය හා ආයෝජන ධාරිතාව වැඩිකිරීම සඳහා රු.මිලියන 4,386 ක් හෙවත් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් ද වැය කර තිබුණි.

### මධ්‍යම පරිසර අධිකාරිය

### පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීම

1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත ප්‍රකාරව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වගකිව යුතු බව දක්වා තිබුණ ද, මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, වලව්වත්ත වතුරාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සහ බොල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබීමෙන් මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික සිද්ධීන් ආශ්‍රයෙන් පැන නගින ගැටළු නිරාකරණ කරගෙන එම පාරිසරික කලාප ආරක්ෂා කර ගැනීම නිසි පරිදි සිදුවන බවට සනාථ කළ නොහැකි විය.

### කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය

පුද්ගලික සමාගමක් සමඟ 2014 අගෝස්තු 08 දින ඇති කර ගත් ගිවිසුමක් මත කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියකට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන ගිවිසුමකට එළැඹ තිබුණු නමුත් මේ දක්වා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර එම සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ද ගැටලුකාරී තත්ත්වයක් පැවතුණි. ඒ හේතුවෙන් වැය කළ රු. මිලියන 64 ක මුදල ද, 2009 වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය මඟින් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා වැය කළ රු. මිලියන 13 ක මුදල ද, කසළ භාවිතා කරමින් විදුලිය

නිපදවීම සඳහා මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර ද නිෂ්කාර්ය වී තිබිණි.

### ව්‍යාපෘති ප්‍රදානවලින් ඉතිරි වී තිබූ මුදල් ආපසු භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබීම

මහා භාණ්ඩාගාරයෙන් සහ විදේශාධාරවලින් ලැබී ඇති ව්‍යාපෘති ප්‍රදානවලින් ඉතිරි වී වර්ෂ 04 ක සිට වර්ෂ 09 ක් දක්වා කාලයක් ගතවී ඇති රු.මිලියන 19 ක් ආපසු භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි.

### නිෂ්කාර්යව උපකරණ මිලට ගැනීම

2016 හා 2017 වර්ෂයන්හීදී පිළිවෙළින් රු.මිලියන 3.58 ක් හා රු.මිලියන 8 ක් ගෙවා මිලදී ගෙන තිබූ Dusk Track DRX Desktops Model 8553 උපකරණය සහ Micro mate Instantal වර්ගයේ කම්පන විශ්ලේෂණ උපකරණ 02 ක් නියමිත කාලය තුළ ක්‍රමාංකනය සිදු නොකිරීම නිසා 2022 වර්ෂයේ අවසානය දක්වාම නිෂ්කාර්යව පවතුණි.

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

### නෞකා අනතුරට අදාළ වන්ධි ප්‍රතිපූරනය නොකිරීම

MV X Press Pearl නෞකා අනතුරට අදාළව අධිකාරිය විසින් දරන ලද වියදම් සහ අනෙකුත් ආයතන විසින් දරන ලද වියදම් කොටසක් ද ඇතුළුව අවස්ථා 13 ක දී ප්‍රතිපූර්ණය සඳහා නෞකාවේ රක්ෂණ සමාගමට යොමුකර තිබූ ඇ.ඩො මිලියන 48.41 කින් ප්‍රතිපූර්ණය කර තිබූ ප්‍රමාණය ඇ.ඩො. මිලියන 6.72 ක් හා රු.මිලියන 20 ක් විය. ඉල්ලුම් කරන ලද ඇ.ඩො මිලියන 32.38 ක් ඇස්තමේන්තුගත වියදම් වීම හා පරිපාලන වියදම් සියයට 25 ක් ඇතුළත්ව තිබීම හේතුවෙන් රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කර ඇති බවටත්, ඉදිරියේ දී ප්‍රතිපූර්ණයන් සිදු නොකරන බවටත් විගණනය වෙත තොරතුරු ඉදිරිපත් විය.

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

### ගාස්තු අය කර ගැනීමට නොහැකි වීම

ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් සිට 2021 සැප්තැම්බර් දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රයට අදාළව එම ආයතනය විසින් අනුමත කළ වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම්වලින් අයවිය යුතු රු. මිලියන 75 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් වලට අදාළ ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වීම

2012 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2,228 කින් අනවසර ඉදිකිරීම් 2,069 ක් ඉවත් කිරීමටත්, 2021 හා 2022 වර්ෂයන්හි දිස්ත්‍රික්ක 13 ක ක්‍රියාමාර්ග ගැනීමට තිබූ බවට හඳුනාගත් අනවසර ඉදිකිරීම් 861 කින් 255 ක් සඳහා ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

### වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල

### ත්‍යාග මුදල් හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රම වේදයක් නොතිබීම

අධිකරණ විසින් අයකරගනු ලබන දඩ මුදල්, අරමුදල වෙත අයකර ගැනීමට හා ඒවා ත්‍යාග වශයෙන් අදාළ පාර්ශවයන්ට ලබාදීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර තොරතුරු හුවමාරු කිරීමේ නිසි ක්‍රමවේදයක් නොතිබීමෙන් අධිකරණවලින් ලැබිය යුතු දඩ මුදල් සහ ත්‍යාග ලබා දිය යුතු පුද්ගලයින් පහසුවෙන් හා ඉක්මණින් හඳුනාගැනීමටත්, භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 40 ක දඩ මුදල් ප්‍රමාණය නිසි වේලාවට ප්‍රේෂණය කිරීමටත් නොහැකි වී තිබුණි.

# ආයෝජන ප්‍රවර්ධනය අංශය

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
  - නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම්
  - මහා භාණ්ඩාගාරය වෙත නැවත ලබා දිය යුතු මුදලක් නොපියවීම
  - ඌණ උපයෝජන පරිශ්‍ර
  - ආයෝජන මණ්ඩලය වෙත අනුමත ආයතනවලින් ලැබිය යුතු හිඟ මුදල්

# ආයෝජන ප්‍රවර්ධනය අංශය

බොහෝවිට ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල ඒක පුද්ගල ආදායමේ මන්දගාමී වර්ධනයට හේතු වී ඇත්තේ ප්‍රාග්ධන උන්නතාවයි. මෙම උනතාවය මගහරවා ගැනීම සඳහා අනුගමනය කලයුතු හොඳම උපක්‍රමය වන්නේ ආයෝජන ප්‍රවර්ධනයයි. ඒ අනුව ආයෝජන ප්‍රවර්ධනය යනු රටක් ආයෝජනය කිරීම සඳහා සුදුසු ස්ථානයක් ලෙස තෝරාගනු ලැබීමට අවශ්‍ය පසුබිම ඇති කිරීම සඳහා කටයුතු කිරීමයි. ඒ අනුව ආයෝජකයන්ට අවශ්‍ය භෞතික, න්‍යායික, මූල්‍ය හා පාරිසරික පහසුකම් සැපයීම ආයෝජන ප්‍රර්වධනය මගින් සිදුවේ. ඒ අනුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන 06 ක් විසින් පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුව තිබුණි.

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආයෝජන ප්‍රවර්ධන විෂයට සහ ඒ යටතේ පිහිටුවා ඇති දෙපාර්තුමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ශ්‍රී ලංකාව කලාපීය වෙළඳ හා ආයෝජන සහයෝගීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය.
- ශ්‍රී ලංකාව තුළ ආර්ථික විභවතාව ප්‍රවර්ධනය කරමින් විදේශීය සෘජු ආයෝජන සහ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- ආර්ථික සංවර්ධන කලාප ප්‍රවර්ධනය, නියාමනය සහ අධීක්ෂණය
- කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම
- තාක්ෂණ උද්‍යාන ඇති කිරීම.
- ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත එකතුව රු. මිලියන 144 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 121 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර රූපසටහන 40 හි දැක්වේ.




රූප සටහන 40 - ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම

මූලාශ්‍රය - 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳව සිදුකළ විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම්

රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත අනුව රජය සතු ව්‍යාපාර එහි කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමික සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රු. මිලියන 544 ක් දීමනා සහ රු. මිලියන 68 ක් ප්‍රසාද දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

### මහා භාණ්ඩාගාරය වෙත නැවත ලබා දිය යුතු මුදලක් නොපියවීම

2021 වර්ෂයේදී, ඒකාබද්ධ අරමුදලට දායකත්වය වශයෙන් ඉල්ලුම් කළ රු. මිලියන 500 ක මුදලින් කැබිනට් තීරණයක් යටතේ ස්ථාපිත විශේෂ ඒකකයට 2022 වර්ෂයට ගෙවිය යුතු වැටුප් සහ දීමනා අයකර ගැනීමක් වශයෙන් රු. මිලියන 51ක් ආයෝජන මණ්ඩලය අඩු කරගෙන තිබුණි. කෙසේ වෙතත්, 2022 මැයි අග වන විට බඳවා ගත් නිලධාරීන් 09 දෙනාගෙන් නිලධාරීන් 8 ක් ඔවුන්ගේ තනතුරුවලින් අස් වී තිබුණු අතර එම නිලධාරීන් 9 දෙනාට 2022 වර්ෂය සඳහා ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 19 එම නිසා, එම මුදල අඩු කර ගැනීමෙන් පසු ඉතිරි මුදල වන රු. මිලියන 32 ඒකාබද්ධ අරමුදලට දායකත්වය වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත නැවත ලබා දීමට ආයෝජන මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර එය 2022 දෙසැම්බර් 31 දිනට

කලින් ලද අත්තිකාරම් ශේෂයේ අන්තර්ගත කර තිබුණි.

### ඌණ උපයෝජන පරිශ්‍ර

කලාප 13 කට අයත් අක්කර 773 ක ප්‍රමාණයක් 2022 දෙසැම්බර් 31 දිනට හිස්ව පැවති අතර එය කාර්මික භූමි ප්‍රමාණයෙන් සියයට 30 ක් ව පැවතුණි. ඊට අමතරව ආරුබොක්ක (ඖෂධ කලාපය) සහ බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ අදියර II හි පිළිවෙලින් අක්කර 751.7 ක් සහ 282.9 ක් එහි ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජනයන් කිසිවක් නොමැතිව හිස්ව පැවතුණි.තවද, කලාපවලට අයත් නොවන ඉඩම් 08 ක් සම්බන්ධයෙන් වූ අක්කර 777.11 ක ප්‍රමාණයක් ද 2022 දෙසැම්බර් 31 දිනට හිස්ව පැවතුණි.රු.මිලියන 516 ක් ගෙවා ඉදිකරන ලද මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයෙහි කි.මී 10.8 දුරින් යුත් අභ්‍යන්තර මාර්ගයෙන් භාවිතා කර ඇත්තේ මීටර් 800 ක් පමණි.

### ආයෝජන මණ්ඩලය වෙත අනුමත ආයතනවලින් ලැබිය යුතු හිඟ මුදල්

ආයෝජන මණ්ඩලය වෙත අනුමත ආයතනවලින් ලැබිය යුතු හිඟ මුදල 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 873 ක් වූ අතර ඉන් රු.මිලියන 143 ක් හෙවත් සියයට 16 ක් වර්ෂ 05කට වඩා හිඟ හිටිව පැවතුණි. හිඟ මුදල මත හානිකරණය සඳහා වෙන්කිරීම රු. මිලියන 359 ක් වූ අතර එය 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදලින් සියයට 41 ක් ව පැවතුණි.

# සංචාරක කටයුතු අංශය

## විගණන නිරීක්ෂණ

- ප්‍රතිපාදන උපයෝජනය කිරීම
- සංචාරකයින් පැමිණීම හා ආදායම අඩුවීම
- සචාරක ආදායම අඩු වී තිබූ පසුබිමක සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවීම
- මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු
- මානව සම්පත් කළමනාකරණය
- අනතුරකට ලක් වී අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණු ජීප් රථයක් අමාත්‍යාංශයට පවරා ගැනීම
- විදේශ දූත මණ්ඩල වෙත විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් ලබාදීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රචර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා නියෝජිත ආයතනයක් තෝරා ගැනීම
- ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම
- බදු දුන් ඉඩම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම
- තානායම් බදු දීම
- අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන වල දිගින් දිගටම අලාභ සිදුවීම

# සංචාරක කටයුතු අංශය

බොහෝ ආසියාතික රටවල තම විදේශ ආදායමේ ප්‍රධාන ස්ථානයක් සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇති අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම කෙරෙහි ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලබා දෙයි. ශ්‍රී ලංකාව කලාපයේ බොහෝ රටවලට වඩා සංචාරක ආකර්ශනය දිනා ගන්නා රටක් වුවද සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු නොකිරීම හා සංචාරකයන්ට අවශ්‍ය මූලික පහසුකම් දියුණු නොකිරීම තුල සංචාරක කර්මාන්තය විශාල පසුබෑමකට ලක් වී තිබේ. නමුත් රටේ සංචාරක කර්මාන්තයේ දියුණුව හා අභිවෘද්ධිය සඳහා වෙන් වූ පහත සඳහන් ආයතන වලින් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකළ යුතුව තිබුණි.

- පුළුල් පුද්ගල සහභාගීත්වයෙන් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සැකසීම.
- සංචාරකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් සකස් කිරීම.
- විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම.
- සංචාරකයින් ආකර්ශනය කර ගැනීම සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම.
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම් සැපයීම.
- ප්‍රධාන සංචාරක නගර සම්බන්ධ කරන මාර්ග මංසන්දි වල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටු වීම.
- ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මගින් සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.
- ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වාදීම.
- ගෘහ ආශ්‍රිත සහ ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම.
- සියලුම සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ අනන්‍යතාවය සහතික කිරීම සඳහා කටයුතු කිරීම.
- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපාරයක් බිහි කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් හඳුන්වාදීම.
- තොරතුරු තාක්ෂණය මගින් සංචාරකයින්ට පහසුකම් සැලසීම.
- One Stop සංකල්පය යටතේ එක් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හරහා සිදුකිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.
- උසස් තත්ත්වයේ සංචාරක හෝටල් පිහිටුවීම හා දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීම.

- ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ නිවැරදි තොරතුරු සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම සඳහා සංචාරක මගපෙන්වන්නන් හට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් කාර්යාංශ 2 ක් ආයතනයක් හා අධිකාරියක් මගින් ඉටුකරන ලද කාර්යභාරයන් පිළිබඳ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු සමහරක් සාරාංශ කර පහත දක්වා ඇත.

### ප්‍රතිපාදන උපයෝජනය කිරීම

ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශයට සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 1, 316ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 901ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 415 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. විස්තර රූපසටහන 41 හි දැක්වේ.




| | සංචාරක අමාත්‍යාංශය | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිපාදනය | 569 | 747 | 1316 |
| වියදම | 160 | 741 | 901 |
| ඉතිරිය | 409 | 6 | 415 |

රූපසටහන 41 - පාර්ලිමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනය, වියදම හා ඉතිරිය

මූලාශ්‍රය - 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

### සංචාරකයින් පැමිණීම හා ආදායම අඩුවීම

ඉකුත් වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත විදේශ සංචාරකයින් 194,495 ක් පැමිණ තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රමාණය සංචාරකයින් 719,978 ක් දක්වා නොහොත් සියයට 270 කින් වැඩිවී තිබුණි. කොවිඩ් වසංගතය හේතුවෙන් වරින් වර වසා දමා තිබූ රට ක්‍රමයෙන් ප්‍රකෘති තත්ත්වයට පත් වීම මීට හේතු වී තිබුණි. සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන වල කාර්යයන් හා කර්තව්‍යයන්ගේද තිබූ සීමා වීම් ඉවත් වීම මෙම සංචාරකයින්ගේ පැමිණීම වැඩි වීම නිසා සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සංචාරකයින්ගේ පැමිණීම ඉකුත් වසර හතර සමඟ සසඳා රූපසටහන 42 හි දැක්වේ.

එමෙන්ම 2018 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරයෙන් රු.මිලියන 711,961 ක ආදායමක් රැස් කර තිබුණත් 2019 වර්ෂයේදී එය රු.මිලියන 646,362 ක් දක්වා අඩු වී තිබුණු අතර 2020 වර්ෂයේදී එම ආදායම සියයට 80.78 කින් හෙවත් රු. මිලියන 522,173 කින් අඩු වී රු. මිලියන 124,189 ක් වී තිබුණි. 2021 වර්ෂයේදී එම ආදායම තවදුරටත් අඩුවී රු. මිලියන 100,620 ක් වී තිබූ නමුත් 2022 වර්ෂයේදී එම ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 260 කින් වැඩි වී රු. මිලියන 362,426 ක් වී තිබුණි. රටේ විදේශ විනිමය අගයේ පිරිහීම අනුව සලකා බලන විට සංචාරක කර්මාන්තයේ පිරිහීම මීට වඩා පසුගාමී තත්වයක පැවතුණි. ඒ පිළිබඳ විස්තරයක් රූපසටහන 43 හි දැක්වේ.




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| පැමිණි විදේශ සංචාරකයින් ගණන | 2,333,796 | 1,913,702 | 507,704 | 194,495 | 719,978 |

රූපසටහන 42 - 2022 වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ හතරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|
| සංචාරක ව්‍යාපාරයෙන් ලද අදායම (රු.මිලියන) | 405,492 | 512,293 | 598,356 | 711,961 | 646,362 | 124,189 | 100,620 | 362,426 |

රූපසටහන 43 - සංචාරක ව්‍යාපාරයෙන් ලද අදායම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### සචාරක ආදායම අඩු වී තිබූ පසුබිමක සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවීම

2013 වර්ෂයේ සිට ක්‍රමිකව වර්ධනය වී 2018 වර්ෂයේදී රු. මිලියන 1,482 ක් දක්වා සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවී තිබූ අතර 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංචාරක සංවර්ධන බදු ආදායම සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි. 2021 වර්ෂයේදී එය රු. මිලියන 809.7 ක් දක්වා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 51 කින් වැඩිවී තිබුණි. එසේම විදේශ සංචාරකයන් සඳහා වන අපගමන බදු ආදායම ද 2013 වර්ෂයේ සිට ක්‍රමිකව වර්ධනය වී 2018 වර්ෂයේදී රු. මිලියන 2,824.9 දක්වා වැඩිවී 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 483.9 දක්වා සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි. කෙසේ නමුත්, 2022 වර්ෂයේදී රු.මිලියන 1,426 ක් දක්වා සංචාරක සංවර්ධන බදු ආදායම වැඩිවී තිබූ අතර අපගමන බදු ආදායම ද රු.මිලියන 2,598 දක්වා වැඩි වී තිබුණි. විස්තර රූපසටහන 44 හි දැක්වේ.




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංචාරක සංවර්ධන බදු අදායම(රු.මිලියන) | 1,014.2 | 1,005.6 | 1,014.8 | 1,276.8 | 1,541.5 | 1,482.1 | 924.2 | 537.8 | 809.7 | 1,425.8 |
| විදේශ සංචාරකයන් සඳහා අපගමන බද්ද(රු.මිලියන) | 1,604.9 | 1,779.8 | 1,968.5 | 2,355.4 | 2,378.8 | 2,824.9 | 2,089.2 | 489.5 | 483.9 | 2,597.8 |

රූපසටහන 44 - සංචාරක සංවර්ධන බදු අදායම හා විදේශ සංචාරකයින් සඳහා අපගමන බද්ද

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය හා ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය යන ආයතන 04 සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කිසිදු රක්ෂණ නියෝජිතයෙකු සම්බන්ධ කර නොගෙන 2021 වර්ෂයට රු. මිලියන 50 ක් වටිනා රක්ෂණ පහසුකමක් ලබා ෙගන තිබුණි. ඒ වෙනුවෙන් නම් කරන ලද රක්ෂණ නියෝජිතයකු වෙත සියයට 10 ක කොමිස් මුදලක් සමාජ සත්කාරක වැඩ සටහනකට ගෙවන ලෙස අධිකාරියෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව අදාල රක්ෂණ සමාගම විසින් රු. මිලියන 4.8 ක් ගෙවා තිබුණි. නමුත් එම සත්කාරක වැඩ වැඩසටහන පිළිබඳ තොරතුරු නොමැති බැවින් මෙම ගණුදෙනුව සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් මත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022 දෙසැම්බර් 12 දින අල්ලස් කොමිසම හා වංචා විමර්ෂණ කාර්යාංශය වෙත වාර්තා කර ඇතත් ආයතනය විසින් ඒ සඳහා මූලික පරීක්ෂණයක් හෝ සිදුකර නොතිබුණි.

## මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරිනියක පත් කර තිබුණි.

මෙම නිලධාරිනිය විසින් සිය නිත්‍ය තනතුරේ රාජකාරී කිසිවක් ඉටු නොකර 2020 මාර්තු 10 සිට 2022 අගෝස්තු 31 දින දක්වා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වැඩ බැලීමේ තනතුරට අයත් ආරම්භක වැටුපෙන් සියයට 25 ක් පමණක් අදාළ නිලධාරිනිය වෙත ගෙවිය යුතු වුවද අමාත්‍යාංශය වෙතින් වැටුප් හා දීමනා

සහ මාසිකව දුරකතන දීමනා සහ ඉන්ධන දීමනා ලෙස රු. මිලියන 5 ක් ගෙවා තිබුණි.

### අනතුරකට ලක් වී අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණු ජීප් රථයක් අමාත්‍යාංශයට පවරා ගැනීම

සංවර්ධන උපාය මාර්ග සහ අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශයට අයත්ව තිබියදී, 2019 නොවැම්බර් 24 දින හදිසි අනතුරකට ලක් වී තිබුණු ජීප් රථයක් අළුත්වැඩියාව සඳහා රු.මිලියන 21 ක පිරිවැයකට සමාගමක් වෙත යොමු කර තිබිය දී, 2021 ජූලි 22 වන දින සංචාරක අමාත්‍යාංශ ලේකම් නමට පවරා ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, රක්ෂණ ආයතනයට අනුව මෙම රථයේ වෙළඳපල වටිනාකම වන රු.මිලියන 16 ක මුදලකට ගර්හිත කිරීම හෝ අලුත්වැඩියාව සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 9 ක මුදලක් පමණක් ගෙවීමට හැකිබව අමාත්‍යාංශය වෙත දන්වා තිබුණු බැවින් හිඟ අලුත්වැඩියා වියදම් වටිනාකම රු. මිලියන 12 ක වගකීමක් අමාත්‍යාංශයට භාර ගැනීමට සිදු වී තිබුණි.

### විදේශ දූත මණ්ඩල වෙත විදේශ ව්‍යාවහාර මුදල් අත්තිකාරම් ලබාදීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් රටවල් 24ක විදේශ දූත මණ්ඩල වෙත යැවූ විදේශ ව්‍යාවහාර මුදල් අත්තිකාරම් වල සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂය වූ රු.මිලියන 43 ක් සඳහා අදාළ ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණි. එමෙන්ම ඉහත ශේෂය මත හඳුනා ගත යුතුව තිබූ විදේශ විනිමය හුවමාරු ලාභය වූ රු.මිලියන 33 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගිණුම් ගතකර නොතිබුණි.

### ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා නියෝජිත ආයතනයක් තෝරා ගැනීම

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව 2022 මැයි 18 සිට 20 දක්වා ඉන්දියාවේ පැවත්වූ ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් නියෝජිත ආයතනයක් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණු නමුත් එසේ බැහැරවීමට හේතු වූ කරුණු නිශ්චිතව වාර්තා කර නොතිබුණි. වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් නියෝජිත ආයතනයට ගෙවූ මුදල රු.මිලියන 11 ක් විය.

### ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම

ලංකා බල බෝට්ටු සංගමය විසින් 2017 වර්ෂයේදී සංවිධානය කරන ලද බෙන්තොට ප්‍රදේශයේ පැවති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ජාත්‍යන්තර බල බෝට්ටු තරඟයකට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහභාගී වී තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව රු.මිලියන 8 ක දායකත්වයක් ලබා දීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, මෙහිදී සමස්ත පිරිවැයෙන් සියයට 20 ක් සඳහා සංගමය විසින් බැංකු ඇපකරයක් සපයා නොතිබීම, බොහෝ ප්‍රවර්ධන කටයුතු සංගමය විසින් ඉටුකර නොතිබීම, එකඟ වූ පිරිවැය රු.මිලියන 3 කින් හෝ සියයට 42 කින් වැඩිකර තිබීම, එංගලන්තයේ සිට බල බෝට්ටු ප්‍රවාහනය සඳහා නැව් සමාගමක් තෝරා

ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම, බල බෝට්ටු තරඟය පැවැත්වීමේ ප්‍රමාදයක් සිදු වීම සහ බෝට්ටු නැවට යොමු කිරීමේ ප්‍රමාදයක් ද සිදු වී තිබුණි.

### බදු දුන් ඉඩම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම

2014 වර්ෂයේදී සමාගම් 5 කට අක්කර 35 ක් ද, 2019 සහ 2020 වර්ෂවල තවත් සමාගම් 2 කට අක්කර 16.8 ක් ද වශයෙන් යාල පලටුපාන සංචාරක සංවර්ධන කලාපයේ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබුණ ද, සමාගම් 2 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා කුච්චවෙලි හි 2011 සහ 2014 වර්ෂවලදී පවරා ගත් ඉඩම් අක්කර 510 ක් වූ භූමි ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 49 ක් පමණක් සමාගම් 3කට බදු දී තිබුණ ද එම සමාගම් 3 න් එක් සමාගමක් පමණක් මෙහෙයුම් කටයුතු වල නිරතව තිබුණි. සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් කල්පිටියේ දූපත් 12 ක ඉඩම් අක්කර 2055.87 ක භූමි ප්‍රමාණයක් 2010 සහ 2012 වර්ෂයන් වලදී අධිකාරියට ලැබී තිබුණ ද, එම දූපත් 12 න් දූපත් 05 කට අයත් ඉඩම් අක්කර 206.58 ක් පමණක් 2010, 2011 සහ 2020 වර්ෂවලදී සමාගම් 03 ට බදු දීමට කටයුතු කර තිබුණි. කෙසේවුවද, එම කිසිදු සමාගමක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි බදු දී තිබුණු සමාගම් වලින් සමාගම් 2 ක පිළිවෙලින් රු.මිලියන 43 ක් සහ රු.මිලියන 9 ක් වශයෙන් වසර 3 සිට වසර 5 දක්වා බදු කුලිය හිඟව පැවතුණි.

### තානායම් බදු දීම

අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් වසර දෙක සිට අට දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල ඌන උපයෝජිතව පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ තානායම් 34 කින් ගෙවිය යුතු හිඟ කුලී ආදායම රු.මිලියන 30 ක් වූ අතර එයින් වසර 4 ක් තුළ හිඟ කුලී ආදායම රු රු.මිලියන 13 ක් හෝ සියයට 45 ක් විය. මුළු හිඟ මුදල අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොතිබුණි.

### අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන වල දිගින් දිගටම අලාභ සිදුවීම

අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 05 හි සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා පිළිවෙළින් රු.මිලියන 51 ක් සහ රු.මිලියන 73 ක් අලාභ සිදු වී තිබුණි. කෙසේ වෙතත්, එම නිවාඩු නිකේතනවල පාඩුව අවම කර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

# විදේශ ආධාර ව්‍යාපෘති

## විගණන නිරීක්ෂණ

- ව්‍යාපෘති වල කටයුතු ගිවිසුම් පරිදි අවසන් නොකෙරීම නිසා නිශ්කාර්යව බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වීම
- මාර්ග අංශයේ ව්‍යාපෘති
    - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන
    - දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන
    - අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය
    - කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
    - කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය
    - දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
    - වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය
    - කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය (ඔපෙක් II)
    - බස්නාහිර පළාත් ජාතික මහා මාර්ග ව්‍යාපෘතිය (ඔපෙක් III)
- ජල සම්පාදන අංශයේ ව්‍යාපෘති
    - නියමිත දිනට වැඩ අවසන් නොකිරීම නිසා නවතා දැමීමට තීරණය කර තිබූ ව්‍යාපෘති සඳහා සැලකියයුතු මුදලක් වැය කර තිබීම
    - අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර 1
    - මහ කොළඹ ජල හා අපජල කලමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ ආරම්භ කල ව්‍යාපෘති අවසන් කර නොතිබීම
    - අඹතලේ පද්ධති පුනරුත්ථාපන හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය
    - යාපනය හා කිලිනොච්චිය ජල සම්පාදන හා සනිපාරක්ෂක ව්‍යාපෘතිය
    - මොරටුව රත්මලාන අපජල බැහැරකිරීමේ ව්‍යාපෘතිය - අදියර 2
    - නගරාශ්‍රිත සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 02)

- නාගරික සංවර්ධන අංශයේ ව්‍යාපෘති
    - උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP)
    - නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය (SCURP)
    - නාගරික ව්‍යාපෘති පිලියෙල කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය (UPPF)
    - අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)
    - මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03
- සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති
    - ලෝක බැංකු ණය මඟින් ක්‍රියාත්මක COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය
- කෘෂිකාර්මික අංශයේ ව්‍යාපෘති
    - ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාගැනීමේ හදිසි ප්‍රතිචාර ව්‍යාපෘතිය

# විදේශ ආධාර ව්‍යාපෘති



2022 වර්ෂ සඳහා වූ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේ සමස්ත අයවැය හිඟය වූ රු.බිලියන 2,460 ක් පියවීම සඳහා රජය දේශීය මූලාශ්‍රවලින් රු.බිලියන 2,035 ක් හා විදේශීය මූලාශ්‍රවලින් රු.බිලියන 425 ක ශුද්ධ විදේශ ණය ලබාගෙන තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයේදී විදේශ මූලාශ්‍රවලින් ලබාගෙන තිබුණු රු.බිලියන 14 ක ශුද්ධ විදේශ ණය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ගැනීම් කැපී පෙනෙන ලෙස වැඩි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී රජය විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය දෙන නියෝජිත ආයතන සමඟ නව විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 15 කට එළඹ තිබුණු අතර එමගින් ඉදිරි වර්ෂ වලදී එ.ජ.ඩො.මිලියන 1,915 ක් ලබාගැනීමට නියමිතව තිබුණි. මෙය ඇ. ඩො. මිලියන 1,805.5 ක ණය පහසුකම් හා ඇ.ඩො.මිලියන 109.7 ක පූර්ණ ප්‍රදාන පහසුකම් වලින් සමන්විත විය.

2022 වාර්ෂයෙදී වෙළඳ අංශය සඳහා ඉහලම විදේශ මුල්‍යයන එකඟතා ලැබී තිබුන අතර, එය ඇ.ඩො. මිලියන 1,000 ක් නොහොත් සමස්ත විදේශ මුල්‍යනය එකඟතා වලින් සියයට 52 වූ අතර , විදුලිබල හා බලශක්ති අංශය ඇ.ඩො. මිලියන 500 ක් හා මානුෂීය ආධාර ඇ.ඩො. මිලියන 203 ක් වශයෙන් බෙදී ගොස් තිබුණි.

### ව්‍යාපෘති වල කටයුතු ගිවිසුම් පරිදි අවසන් නොකෙරීම නිසා නිශ්කාර්යව බැඳීම් ගාස්තු ගෙවීමට සිදු වීම

2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රට තුල ක්‍රියාත්මක වූ ආයෝජන ව්‍යාපෘති වලට ඒ ඒ ණය දෙන ආයතන සමඟ එළඹී ගිවිසුම් කාල සටහන අනුව ණය නිදහස් කර ගැනීමට අපොහොසත් වීම හේතුකොට ගෙන රජයට රු.බිලියන 19 ක බැඳීම් ගාස්තු නිෂ්කාර්යව ගෙවීමට සිදු වී තිබුණි.

මෙම නිෂ්කාර්ය බැඳීම් ගාස්තු සඳහා ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති මෙහෙයුම් ඒකක වල පවතින පහත අඩුපාඩු හේතු වී තිබුණි.

i. ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත්කර ගැනීම් නිම කර නොතිබීම
ii. විවිධ පූර්ව අනුමැතීන් ලබාගතයුතු ආයතන වලින් අනුමැතීන් ලබා නොගැනීම
iii. මූලික සැලසුම් අනුව ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම.
iv. නිසි දේශගුණික හා කාලගුණික පුරෝකථන සිදු නොකිරීම.

### මාර්ග අංශයේ ව්‍යාපෘති

මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති වල අරමුදල් උපයෝජනය සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

| ව්‍යාපෘතියේ නම | | ණය මුදල | | 2022.12.31 දිනට මුළු උපයෝජනය | | ව්‍යාපෘති කාලය | 2022.12.31 දිනට ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | වසර | මූල්‍ය | භෞතික |
| 1 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන | 800.00 | 104,000 | 526.47 | 91,418 | 06 | 66 | 63 |
| 2 | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන | 900.00 | 137,070 | 498.38 | 105,991 | 05 | 55 | 67 |
| 3 | බදුල්ල-චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 120.00 | 15,600 | 69.11 | 12,171 | 08 | 86 | 93 |
| 4 | ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය | 40.00 | 4,560 | 33.08 | 4,844 | 09 | 88 | 88 |
| 5 | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය | 150.00 | 54,000 | 6.63 | 2,194 | 05 | 4 | 25 |
| 6 | මධ්‍යම අධිවේගී මාර්ග අදියර-1 | 989.44 | 134,628 | 51.56 | 13,266 | 04 | 46 | 35 |
| 7 | කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය (KGF) | 52.00* | 10,192 | 13.95* | 3,411 | 2 1/2 | 48 | 49 |
| 8 | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ (KMTTDP) | 69.33 | 13,762 | 0.85 | 169 | 6 1/2 | 1 | - |
| 9 | නායයෑම්, ආපදා කළමනාකරණ ව්‍යාපෘතිය (LDPP) | 7,618.00 | 12,870 | 6,283.00 ** | 9,678 | 7 1/2 | 98 | 99 |
| 10 | කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය (NBCP) | 35,020.00 ** | 46,755 | 31,782.00 ** | 87,036 | 09 | 91 | 100 |
| 11 | මධ්‍යම සහ උඩව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (EXIM) | 85.00 | 10,774 | 73.15 | 9,272 | | 99 | 99 |
| 12 | ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ, පහසුකම් ව්‍යාපෘතිය (TPPF) | 10.00 | 1,457 | 2.51 | 449 | 6 1/2 | 93 | 94 |
| 13 | පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය (RCBP) | 10.00 *** | 4,632 | 6.66 | 4,128 | 07 | 67 | 97 |
| 14 | දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය(SRCP) | 70.36 | 14,274 | 68.68 | 12,395 | 08 | 98 | 86 |
| 15 | වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය | 293.89 | 46,382 | 108.26 | 28,447 | 09 | 81 | 54 |
| 16 | ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය | 9.00 | 1,305 | 2.36 | 727 | 07 | 54 | 77 |
| 17 | කොළඹ ජාතික මහා මාර්ග ව්‍යාපෘතිය(ඔපෙක් II) | 50.00 | 6,500 | 39.47 | 6,628 | 10 | 89 | 98 |
| 18 | බස්නාහිර පළාත් ජාතික මහා මාර්ග ව්‍යාපෘතිය (ඔපෙක් III) | 17.00 | 2,210 | 13.28 | 2,501 | 08 | 96 | 97 |
| 19 | රක්වාන- සූරියකන්ද A017 මාර්ගය(ඔපෙක් IV) | 40.00 | 5,498 | 0.91 | 320 | 02 | 9 | 5 |
| එකතුව | | | 626,468 | | 395,048 | | | |

* යුරෝ ** ජපන් යෙන් *** කුවේට් ඩිනාර්

වගුව 26 - මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති වල අරමුදල් උපයෝජනය සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

මූලාශ්‍රය - ව්‍යාපෘති ණය ගිවිසුම් හා කාර්ය සාධන වාර්තා

- එ.ජ. ඩොලර් මිලියන 3644.02 ක් යූරෝ මිලියන 52.00 ක්, කුවේට් ඩිනාර් මිලියන 10.00 ක් සහ ජපන් යෙන් මිලියන 42,638.00 කට සමාන රු. මිලියන 626,468 ක විදේශාධාර යටතේ ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මකව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එයින් රු.මිලියන 395,048 ක් හෙවත් සියයට 63.06 ක් වැය කර තිබුණි.

- ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 0 සිට 100 ක පරාසයක පැවතුණු අතර ව්‍යාපෘති වලින් වැඩි කොටසක් කාල දීර්ඝ කිරීම් (EOT) මත ක්‍රියාත්මක වෙමින් තිබුණි.

- ව්‍යාපෘති 19 අතරින් ව්‍යාපෘති 15 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මකව පැවති අතර ව්‍යාපෘති 03 ක් ඈවර කර තිබුණි. තවද එක් ව්‍යාපෘතියක් අතරමග නවතාදමා තිබුණි.

- ව්‍යාපෘති 14 ක අත්කර ගත් සමස්ත ඉඩම් කැබලි සංඛ්‍යාව 48,715 වූ අතර ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයිතිය පවරාගත් කැබලි සංඛ්‍යාව 5,052 හෙවත් සියයට 10 ක් පමණක් වී තිබුණි.

විදේශ ආධාර ව්‍යාපෘති ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන

රු. මිලියන 117,780 ක විදේශ හා දේශීය ආයෝජනයක් යටතේ 2014 වර්ෂයේදී වැඩසටහන යටතේ පුනරුත්ථාපනය කිරීමට තෝරාගත් ජාතික මාර්ග කිලෝමීටර 370 කින් සහ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 2,905 කින් ජාතික මාර්ග 4 ක කිලෝමීටර් 27.43 ක් සහ ග්‍රාමීය මාර්ග 566 ක කිලෝමීටර් 2,199 ක පුනරුත්ථාපන වැඩ පමණක් 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. එය අපේක්ෂිත ප්‍රගතියෙන් සියයට 68 ක් පමණක් වී තිබුණි. අකාර්යක්ෂම කොන්ත්‍රාත් කළමණාකරනය, ඉන්ධන සහ ද්‍රව්‍ය හිඟය මෙම දුර්වල ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර අදාල මාර්ග පැකේජ මුළුමනින් අවසන් නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට එම නිම කරන ලද මාර්ග අතරින් කිලෝමීටර් 72.22 ක් දිග ග්‍රාමීය මාර්ග 29 ක් අදාල රාජ්‍ය ආයතනවලට පවරා නොතිබුණි.

### දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන

2021 අප්‍රේල් මාසයේදී යාවත්කාලීන කරන ලද පහසුකම් පරිපාලන අත්පොතට අනුව උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග කිලෝමීටර් 417.75 ක් සහ ග්‍රාමීය මාර්ග 1349 කින් කිලෝමීටර් 3338.87 ක් වැඩසටහන මඟින් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කළද, 2022 දෙසැම්බර් 31 වන විට ජාතික මාර්ග 13 කින් කිලෝමීටර 153.74 ක් සහ ග්‍රාමීය මාර්ග 557 කින් කිලෝමීටර 1,432.42 ක් පමණක් පුනරුත්ථාපන කටයුතු අවසන් කර අදාළ ආයතන වෙත භාරදී තිබුණි. අකාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණය,

ඉන්ධන සීමා කිරීම් සහ ද්‍රව්‍ය හිඟය මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ 2 වන සංරචකය යටතේ ගොවීන් සඳහා සැපයුම් දාමය වැඩිදියුණු කිරීම සහ සේවා සඳහා ප්‍රවේශය වෙනුවෙන් ව්‍යාපෘතිය ආරම්භයේදී මුලිකව එ.ජ.ඩො. මිලියන 50 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) ක්‍රියාත්මක කිරීම සඳහා 2 වන සංරචකය වෙනුවෙන් වෙන්කර තිබුණු ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එබැවින් දෙවන සංරචකය යටතේ ගොවීන් සඳහා සැපයුම් දාමය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

### කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 2,213 ක් වූ කොහුවල ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු 2023 ජුනි 16 දින අවසන් කිරීමට නියමිතව තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය සියයට 73.5 ක් පමණක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8,187 ක් වූ ගැටඹේ ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු සියයට 78 ක් අවසන් කිරීමට අපේක්ෂා කළද, තත්‍ය ප්‍රගතිය සියයට 36 ක් පමණක් විය. ඉඩම් අත්පත්කර ගැනීම් ප්‍රමාදවීම සහ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නොගෙවීම මේ සඳහා ඍජුව බලපා තිබුණි. 2018 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කරන ලද මූලික ඇගයීම්වලට අනුව කොහුවල සහ ගැටඹේ ගුවන් පාලමක් ඉදිකිරීමෙන් ජාතික ආර්ථිකයට දිනකට රු. මිලියන 4 ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට අපේක්ෂා කළද, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රතිඵල ලභාකර ගැනීම ප්‍රමාද වී තිබුණි.

### කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය

නව කැලණි පාලම ඉදිකිරීමේ දී ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 943 ක් පමණ වැය කර තිබුණ ද, එම භූමි ප්‍රදේශය නැවතත් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගැනීම වැළැක්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා අනවසර පදිංචිකරුවන් 07 දෙනෙකු පමණ සමාලෝචිත වර්ෂය අවසන්වන විට නැවත පදිංචිව සිටින බව විගණනයේදී අනාවරණය විය. එමෙන්ම 2014 වර්ෂයේ සිට ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය සඳහා පවරාගත් ඉඩම්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 44 වගන්තිය අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමටද කටයුතුකර නොතිබුණි.

නව කැලණි පාලම් පරිශ්‍රය අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි කැමරා පද්ධතියක් සහිතව සන්නිවේදන ගොඩනැගිල්ලක් රු. මිලියන 24.45 ක් වැය කර ඉදිකර තිබුණු අතර, අදාළ ගොඩනැගිල්ලේ මෙහෙයුම් කටයුතු සඳහා විද්‍යුත් උපකරණ ද සවිකර තිබුණි. නමුත් මෙම ගොඩනැගිල්ල සහ එහි සවිකර තිබුණු කැමරා පද්ධතිය 2022 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, මෙම

ගොඩනැගිල්ල සඳහා සවිකර තිබූ වායුසමීකරණ යන්ත්‍ර දෙකක ඇතුළත කොටස් සොරුන් විසින් ගලවාගෙන ගොස් තිබුණි.

### දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

- ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2014 මැයි 27 දින ඇමෙරිකානු ඩොලර් මිලියන 70 ක වටිනාකමට අත්සන් කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දක්වා කිහිප වතාවක් ණය කාලපරිච්ඡේදය අවසන් දිනය දීර්ඝ කර තිබුණි. ණය කාලපරිච්ඡේදය දීර්ඝ කර තිබුණද කළමනාකරණ අකාර්යක්ෂමතාව හේතුවෙන් ණය කල් ඉකුත්වීමට පෙර ණය මුදලින් රු. මිලියන 478 ක් ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද 2022 දෙසැම්බර් 31 දිනවන විට සියයට 86 ක භෞතික ප්‍රගතියක් පමණක් ලභා කර ගෙන තිබියදී ව්‍යාපෘතිය නතර කර තිබුණි. ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වැයවන මුදල රු.මිලියන 2,536 ක් බව 2022 මාර්තු 21 දින අනුමත කර තිබූ නව ඇස්තමේන්තුව අනුව තහවුරු විය.

### වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය

- 2022 දෙසැම්බර් 31 දිනට වරාය පිවිසුම් ගුවන් මාර්ගයේ සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 54 ක් වුවද, මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 23,430 ක් වූ අතර එය මුළු පිරිවැය ඇස්තමේන්තුව වන රු. මිලියන 28,002 න් සියයට 83 ක් විය. තවද, උපදේශකවරයාගේ ප්‍රගති වාර්තාවට අනුව, මිල විචලතාවයන් හේතුවෙන් මුල් කොන්ත්‍රාත් වටිනාකම සියයට 81 කින් එනම් රු. මිලියන 50,800 කින් ඉහළ ගොස් තිබුණි.

- සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකර ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) දැනට සිටින කාර්ය මණ්ඩලය කුලියට ගත් ගොඩනැගිලිවල පදිංචි කර තිබුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය විසින් ගෙවිය යුතු මුළු මුදල වූ රු. මිලියන 195 න් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 117 ක් ගෙවා තිබුණි.

- එක්සත් ජනපද ඩොලර් මිලියන 28.4 ක ඇස්තමේන්තුගත වටිනාකමක් ඇති විද්‍යුත් ගාස්තු එකතු කිරීමේ පද්ධතිය (ETC) ක්‍රියාත්මක කිරීම අවලංගු කිරීමට ව්‍යාපෘතිය විසින් 2023 පෙබරවාරි 02 දින ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ඉල්ලා තිබුණි. වරාය පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ හා නාවික පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘති සංරචකවල කොන්ත්‍රාත් මිල විචලතාවයන් ගෙවීම සඳහා මෙම සංරචකය සඳහා වූ මුදල් ප්‍රතිපාදනද භාවිතා කිරීම නිසා ඉතිරි මුදල් මෙම සංරචකය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවීම මේ සඳහා හේතු ලෙස

අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සිය ලිපියෙහි දක්වා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් ETC පද්ධතියේ උපදේශන සේවා වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 162 ක් වැයකර තිබුණි. ඒ අනුව, ETC පද්ධතිය අවලංගු කිරීම හේතුවෙන් සියලු අධිවේගී මාර්ග සඳහා එකම ස්වයංක්‍රීය ගාස්තු එකතු කිරීමේ පද්ධතියක් හඳුන්වාදීමේ අවස්ථාව අහිමි වී තිබූ අතර දරන ලද වියදම් නිෂ්ඵල වියදමක් විය හැකිව තිබුණි .

### කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය (ඔපෙක් II)

ඔරුගොඩවත්ත අඔතලේ මාර්ග අදියර I,II ප්‍රතිසංස්කරණ කටයුතු 2017 සහ 2019 වර්ෂවල පිළිවෙලින් රු. මිලියන 1,528 හා රු.මිලියන 1,943 ක කොන්ත්‍රාත් වටිනාකමකට ආරම්භ කර තිබුණි. පිළිවෙලින් 2019 සහ 2021 වර්ෂවලදී ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් අදියර I සඳහා වැඩබිම නිදහස් කර නොදීම, කොරෝනා වසංගතය ඇතුළු හේතු නිසා දින 1204 ක කාලය දීර්ඝ කිරීමට අදාළව කොන්ත්‍රාත්කරුගේ දෛනික වියදම් පියවා ගැනීම සඳහා රු. මිලියන 26 ක් ද අදියර II සඳහා දින 428 ක කාලය දීර්ඝ කිරීමට අදාළව රු. මිලියන 71 ක්ද ගෙවීමට සිදුවී තිබුණි.

### බස්නාහිර පළාත් ජාතික මහා මාර්ග ව්‍යාපෘතිය (ඔපෙක් III)

කඩුවෙල අතුරුගිරිය මාර්ගය අදියර I ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ කොන්ත්‍රාත්තුව 2018 ජනවාරි 29 දින රු.මිලියන 1,065 කට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව 2019 ජූලි 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් 2023 මාර්තු 04 දක්වා ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම සහ කොවිඩ් වසංගතය වැනි හේතු නිසා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අදාළව රු.මිලියන 65 ක් ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

### ජල සම්පාදන අංශයේ ව්‍යාපෘති

2022 වර්ෂය නිමවන විට ජල සම්පාදන මණ්ඩලය යටතේ විදේශීය ණය හා ආධාර මඟින් ව්‍යාපෘති 33 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුන අතර එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත වටිනාකම්වල එකතුව රු.මිලියන 538,822 ක් විය. මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය නිමවන විට එම ව්‍යාපෘති වෙනුවෙන් වැයකර තිබූ මුළු මුදල රු. මිලියන 584,909 ක් වී තිබුණි. කොන්ත්‍රත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය, ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රමාදය, පරිසර ගැටලු හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අවස්ථා 02 සිට 07 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් එම ව්‍යාපෘති වෙනුවෙන් ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කාලසීමාවන් දින 275 සිට දින 2,131 දක්වා අතර පරාසයක ප්‍රමාද වී තිබුණි.

### නියමිත දිනට වැඩ අවසන් නොකිරීම නිසා නවතා දැමීමට තීරණය කර තිබූ ව්‍යාපෘති සඳහා සැලකියයුතු මුදලක් වැය කර තිබීම

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ සහ කඩිනම් කිරීමේ බලතල සහිත නිලධාරී කමිටුවේ නිර්දේශවලට අනුව,2022 දෙසැම්බර් 31 දින වනවිට වැඩ අවසන් කල යුතු බවට තීරණය කර තිබූ ව්‍යාපෘති 7 ක් එදින වන විට නිමකර නොතිබූ අතර තාවකාලිකව නැවැත්වි යුතු බවට රජය තීරණය කර තිබූ ව්‍යාපෘති 12 ක් සඳහා නැවැත්වීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පැවතුණි. තවදුරටත් එම කමිටුව විසින් 2023 වර්ෂයේදී ව්‍යාපෘති 10 ක් අවසන් කිරීමට හා ව්‍යාපෘති 2 ක් තාවකාලිකව නැවැත්වීමට තීරණය කර තිබුණි. එසේ නැවැත්වීමට තීරණය කර තිබූ ජල සම්පාදන ව්‍යාපෘති 5 ක් වෙනුවෙන් වර්ෂය අවසන් වන විට එකතුව රු. මිලියන 6,562 ක් වැය කර තිබුණි.

### අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘති අදියර 1

2023 ජුනි 30 දින වන විට රු. මිලියන 8,285 ක් වැය කර තිබූ මෙම ව්‍යාපෘතියේ අදියර 1 දන්තමය ආබාධ හා වකුගඩු රෝග සීඝ්‍ර ලෙස පැතිරී යන ප්‍රදේශ වලට ජලය ලබා දීම සඳහා ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියට ජලය ලබා දීමට එරෙහිව ප්‍රදේශයේ ගොවි සංවිධානවලින් දක්වන ලද අඛණ්ඩ විරෝධතා මත වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියට ජලය නිකුත් කිරීම නවතා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියට අවශ්‍ය පූර්ණ ජල ධාරිතාවය උතුරුමැද පළාත් මහඇල ව්‍යාපෘතිය නිමවීමෙන් පසු ලබාදීමට වාර්මාර්ග දෙපාර්තමේන්තුව කැමැත්ත පලකර තිබූ නමුත් මහවැලි අධිකාරිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින එම ව්‍යාපෘතිය තවමත් මූලික අදියරේ පවතින බැවින් ව්‍යාපෘතියට අවශ්‍ය ජල ධාරිතාවය ලබා ගැනීම පිළිබඳ දැඩි අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද 2022 වර්ෂය නිමවන විට රජය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 45 ක බැඳීම් ගාස්තු සහ රු.මිලියන 1,309 ක ණය ආපසු ගෙවීම් සිදුකර තිබුණි.

### මහ කොළඹ ජල හා අපජල කලමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ ආරම්භ කල ව්‍යාපෘති අවසන් කර නොතිබීම

කොළඹ නගරයේ 2012 වර්ෂයේ සිට පැවත එන සියයට 49 ක් වූ ආදායම් නොලබන ජල අනුපාතය 2020 වසර වන විට සියයට 18 දක්වා අඩු මට්ටමකට ගෙන ඒම, කොළඹ නගරයේ පැය 24 පුරා ගුණාත්මක ජල සැපයුමක් අඛණ්ඩව ලබාදීම හා ආයතන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමත් ප්‍රධාන අරමුණින් ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය දායකත්වය යටතේ 2022 වසර අවසන් වන විට රජයේ සහ ආසියානු සංවර්ධන බැංකුව මඟින් රු.බිලියන 40.40 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කර තිබූ තොග ජලමනු විශාල ප්‍රමාණයක් ක්‍රියා විරහිතවී තිබීම හේතුවෙන් ආදායම් නොවන ජල කලමනාකරණ කටයුතු වලට මෙන්ම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමටද විශාල බධාවක්ව පැවතුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාගත් ණය වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් පිළිවෙලින් රු.මිලියන 1,166 ක ණය පොලී හා ණය මුදල්හි ඌණ

උපයෝජනය මත රු.මිලියන 209 ක බැඳීම් ගාස්තු ගෙවීම් සිදුකර තිබුණි.

### අඹතලේ පද්ධති පුනරුත්ථාපන හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

අඹතලේ ජල පවිත්‍රාගාරය සඳහා මාසිකව වැයවන රු. මිලියන 203 කට අධික බලශක්ති පිරිවැය අවම කරගැනීම සඳහා අඩු කාර්යක්ෂමතාවයකින් යුතු හා පැරණි පොම්ප ඉවත් කර ඒ වෙනුවට නව පොම්ප ප්‍රතිස්ථාපනය කිරීමත්, වර්ෂ 70 ත් 100 ත් අතර පැරණි කුඩා සම්ප්‍රේෂණ නල පද්ධතීන් වෙනුවට ධාරිතාවයෙන් ඉහළ නල ඇතිරීම් තුලින් ඝර්ෂණ අලාභ (Friction loss) අවම කිරීමත් මෙම ව්‍යාපෘතියෙහි අරමුණු විය. ව්‍යාපෘති කටයුතු 2014 සැප්තැම්බර් ආරම්භ කර 2019 ජූනි විට වර්ෂ 4 මාස 9 කින් නිම කිරීමට මූලිකව සැලසුම් කලද, එම දිනට නිම කිරීමට අපොහොසත් වීම තුල 2023 ජූනි දක්වා තවත් අවුරුදු 4 කින් කාලය දීර්ඝ කර තිබුණි. එහෙත් 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කටයුතු ආරම්භ කර අවුරුදු 8 කට වැඩි කාලයක් ඉක්ම ගියද අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය සියයට 70.13 ක් වැනි අඩු ප්‍රතිශතයක් වූ අතර එදින වන විට එකතුව රු.මිලියන 11,047 ක පිරිවැයක් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණි.

### යාපනය හා කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

රු.මිලියන 34,492 ක ව්‍යාපෘති පිරිවැයක් යටතේ උක්ත ව්‍යාපෘතිය 2011 වර්ෂයේ ආරම්භ කර 2017 අගෝස්තු මස අවසන් කිරීමට සැලසුම් කර තිබූ නමුත් ව්‍යාපෘති කාලය 2026 ජූනි දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර පවත්වාගෙන යාමේදී ජල මූලාශ්‍රය සම්බන්ධව ඇතිවූ ගැටළුවක් හේතුවෙන් ජල මූලාශ්‍රය වෙනස්වූ අතර ව්‍යාපෘතියේ මූලික අරමුණක් වූ යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි ජීවත්වන පවුල් 80,000 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම ව්‍යාපෘති විෂය පථයෙන් ඉවත්කර මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකයක් ස්ථාපිත කිරීම විෂය පථයට ඇතුලත් කර ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත ඒකකයේ (SWRO) ඉලක්ක ගත භෞතික ප්‍රගතිය සියයට 83 ක් වුවත් ළඟාකර ගෙන තිබූ සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 49 ක් විය.

### මොරටුව රත්මලාන අපජල බැහැරකිරීමේ ව්‍යාපෘතිය - අදියර 2

රු. මිලියන 21,682 ක් වූ ව්‍යාපෘති පිරිවැයක් යටතේ 2019 වර්ෂයේදී ණය නියෝජිතායතනය සමඟ ණය ගිවිසුම් අත්සන් කර තිබූ අතර 2021 වර්ෂයේදී යුරෝ මිලියන 22.5 සහ ශ්‍රී ලංකා රු. මිලියන 4,116 ක වටිනාකමට ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතවී තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා රු. මිලියන 1,427 ක අත්තිකාරමක් 2021 දෙසැම්බර් 15 දින ගෙවා තිබූ නමුත් 2022 වර්ෂයේ සිට ණය නියෝජිත ආයතන ණය වාරික ගෙවීම අත්හිටුවීම නිසා උක්ත අත්තිකාරම් මුදල ප්‍රමාණවත් කාර්යය සාධනයකින් තොරව කොන්ත්‍රාත්කරු රඳවාගෙන තිබුණි. ණය ගිවිසුම ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දින වන විට සියළුම ණය ආපසු ගැනීම් සම්පූර්ණ කල යුතු වුවත්, නව

පොම්පාගාර ඉදිකිරීම, පොම්පාගාර හා පවිත්‍රාගාර නවීකරණය, අපජල පවිත්‍රාගාර ඉදිකිරීම, අපජල සම්බන්ධතා ලබාදීම, ඉදිකිරීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාතු උපදේශනය යන කොන්ත්‍රාත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි.

### නගරාශ්‍රිත සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 02)

රුපියල් මිලියන 18,740 ක මුළු ව්‍යාපෘති වටිනාකමකට ණය නියෝජිත ආයතනය සමග 2016 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගතවී තිබුණි. මීට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පැවති අකාර්යක්ෂමතා හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මකව නොමැති අතර 2022 වර්ෂය නිමවන විට එහි මූලික කටයුතු වෙනුවෙන් එකතුව රුපියල් මිලියන 1,775 ක් වැය වී තිබුණි. ණය මුදලේ ඌණ උපයෝජනය හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා රජය විසින් රුපියල් මිලියන 190 ක් බැඳීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි.

### නාගරික සංවර්ධන අංශයේ ව්‍යාපෘති

### උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP)

- ගාල්ල නගරයේ ගංවරතුර පාලනය සඳහා හඳුනාගත් ගංවතුර පාලන කාණු පද්ධති 16 ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා නොගැනීම නිසා ඉදිකිරීම් කටයුතු කල නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ උපදේශන සේවා වෙනුවෙන් රු. මිලියන 21 ක් ගෙවා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අතරමග නතර කිරීම හේතුවෙන් මෙම වියදම් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

- ගාල්ල මොරගොඩ ප්‍රධාන ඇල සහ පන්සල් අතුරු මාර්ගය ඉදිකිරීම සඳහා එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 845 ක් වූ අතර ඇල මර්ගයේ මුළු දිග මීටර් 4,250 ක් විය. එහෙත් රු.මිලියන 397 ක් වැය කර මීටර් 1,850 ක් පමණක් නිම කර ව්‍යාපෘතිය අවසන් කිරීම හේතුවෙන් එහි සම්පූර්ණ ප්‍රතිලාභ ජනතාවට අත්කර දීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘති ඉදිකිරීම්වලට අවශ්‍ය ඉඩම් පවරා ගැනීමට නොහැකිවීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

- වටිනාකම ඩොලර් මිලියන 202 ක් වූ උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහනේ එක් සංරචකයක් වන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය (Kandy Multimodal Transport Terminal - KMTT) කාලීනව ආරම්භ කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ඒ සඳහා වෙන්කල ඩොලර් මිලියන 92 ක ණය ලබාදීම ණය නියෝජිත ආයතනය විසින් අවලංගු කිරීම නිසා ව්‍යාපෘතිය අතරමඟ නතර කර තිබුණි.

### නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය (SCURP)

- නිවාස ඒකක 700ක් ඉදිකිරීම සඳහා වූ ඇපල්වත්ත නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 4,473 ක වටිනාකමට චීන සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු 2020 ඔක්තෝබර් 27 වන දින ආරම්භ කර 2023 ඔක්තෝබර් 17 වන දින අවසන් කිරීමට යෝජිතව තිබුණි. 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම අනුව, මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 64 ක් අපේක්ෂා කලද රු.මිලියන 1,145 ක් වැයකර ලබාගෙන තිබුණේ සියයට 22 ක භෞතික කාර්යසාධනයක් පමණි.

- ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,982 ක් වූ නිවාස ඒකක 300 ක් ඉදිකිරීම සඳහා වූ ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතියේ කටයුතු 2020 මැයි 5 වන දින ආරම්භ කර තිබුණි. 2022 ඔක්තෝම්බර් 21 දින ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතව තිබුණද කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 මාර්තු 29 වන දින මෙම ව්‍යාපෘතිය අවසන් කර තිබුණු අතර රු.මිලියන 271 ක් වැයකර ඒ වන විට සියයට 14 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. එහෙත් මේ දක්වා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ව්‍යාපෘතිය සහ රේඛීය අමාත්‍යාංශය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ 2 වන සංරචකය යටතේ ඉඩම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් 11 ක් යටතේ 2022 වර්ෂය අවසන් වන විට ඉඩම් අක්කර 111.5 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතව තිබුණද අක්කර 4 ක ඉඩම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පමණක් සිදුකර තිබුණු අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 3.58 ක තරම් ඉතා අඩු ප්‍රතිශතයක් විය.

### නාගරික ව්‍යාපෘති පිලියෙල කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය (UPPF)

- ණය ගිවිසුම අනුව, සපයා තිබුණු ණය මුදල රු.මිලියන 883 කට සමාන ඇ.ඩො.මිලියන 4.65 ක් වූ අතර ව්‍යාපෘතිය 2019 මාර්තු 06 දින ආරම්භ කර 2022 මාර්තු 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.
- 2020 අගෝස්තු 18 දින සිට ව්‍යාපෘතියේ සියලුම මෙහෙයුම් කටයුතු නවතා දැමීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් ලබා ගැනීමට අපේක්ෂිත උපදේශන වාර්තා 68 ක් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

### අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)

- අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය විසින් 2022 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 2,123 ක් වූ පැකේජ 5 ක වැඩ ආරම්භ කර තිබූ අතර ඉන් 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළ යුතු පැකේජ 4 කින් පැකේජ 2 කට අදාල වැඩ පමණක් නිමකර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් පිරිනමා නොතිබුණු

ව්‍යාපෘති පැකේජ 7 ක් වූ අතර එම ව්‍යාපෘතීන් සඳහා ලබා දීමට එකඟ වූ ණය මුදල රු.මිලියන 5,025 ක් විය.

- උතුරු හා දකුණු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රු.මිලියන 288 ක් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘති අතරමඟ නතර කිරීම නිසා දරන ලද වියදම් නිශ්කාර්ය වී තිබුණි.

**මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03**

- මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝපීය ආයෝජන බැංකු (යු. ආ. බැ.) ණය මඟින් රු.මිලියන 600ක හා ශ්‍රී ලංකා රජය මඟින් රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

- ආයෝජන වැඩසටහනෙහි 03 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 200 ක ප්‍රතිපාදනවලින් සියයට 55ක් වූ රු. මිලියන 110 ක් ද, මෙම වැඩසටහන තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 1,000ක ප්‍රතිපාදනවලින් සියයට 58 ක් වූ රු.මිලියන 576 ක් ද, ශ්‍රී ලංකා රජය යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 200 ක ප්‍රතිපාදනවලින් සියයට 79 ක් වූ රු.මිලියන 157 ක් ද, අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. ශ්‍රී ලංකා රජය මඟින් සලසාගෙන තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 8 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර වියදම් කර තිබුණි.

- ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකු ණය යටතේ රු.මිලියන 1,900 ක් හා ප්‍රදාන යටතේ රු.මිලියන 1,400 ක් ද, ශ්‍රී ලංකා රජය මඟින් රු.මිලියන 50ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ලෝක බැංකු ප්‍රදාන යටතේ සලසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 56 ක් හෙවත් රු.මිලියන 778 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

- ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නෙදර්ලන්ත රජයේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.මිලියන 300 ක ප්‍රතිපාදනවලින් සියයට 69 ක් වැයකර තිබුණද, ශ්‍රී ලංකා රජය මඟින් සලසාගෙන තිබුණු රු.මිලියන 12 ක ප්‍රතිපාදනවලින් සියයට 64 ක් වූ රු.මිලියන 8 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි

### සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති

**ලෝක බැංකු ණය මඟින් ක්‍රියාත්මක COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය**

- ව්‍යාපෘතිය මඟින් 2021 දෙසැම්බර් සිට 2022 ජනවාරි දක්වා කාලය තුළ කොවිඩ් 19 වසංගතය මැඩලීමට රු. මිලියන 16,102 ක් වටිනා ෆයිසර් එන්නත් මාත්‍රා 13,999,050 ක් මිල දී ගෙන තිබුණද ඒවාගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ නොතිබුණි.

- ඖෂධ නියාමන අධිකාරිය විසින් කල් ඉකුත් වීමේ කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීමේ දී එන්නත් මාත්‍රා 781,560 ක කාණ්ඩ 04 ක් සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණි.

- ෆයිසර් එන්නත් මාත්‍රා 20,907,900 න් එන්නත් මාත්‍රා 11,839,500 ක් එන්නත්කරණ වැඩසටහන් මඟින් ලබා දී තිබුණද එන්නත්කරණ වැඩසටහන්වලට එන්නත් ලබා ගත් ඇතැම් සෞඛ්‍ය ආයතන විසින් නියමිත කාලය වූ දින 30 ඉක්මවීම හේතුවෙන් එන්නත් භාවිතයෙන් ඉවත් කර තිබුණි.

### කෘෂිකාර්මික අංශයේ ව්‍යාපෘති

**ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාගැනීමේ හදිසි ප්‍රතිචාර ව්‍යාපෘතිය**

- ලෝක බැංකු ආධාර යටතේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාගැනීම ජාතික වැඩසටහන යටතේ කෙටිකාලීන ගබඩා පහසුකම් ලබාදීම යටතේ රු.මිලියන 223 ක පිරිවැයක් දරා දිස්ත්‍රික් කාර්යාල 11 ක් ආවරණය වන පරිදි ගබඩා 26 ක් 2021 වර්ෂය අවසානයට නිම කර අවසන් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විට ගබඩා 15 ක් ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ ගබඩා 11 න් එක් ගබඩාවක වැඩ අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් අවසන් කරන ලද ගබඩා 10 ම නිෂ්කාර්යව පැවතුණි.

# ක්‍රීඩා හා යෞවන කටයුතු අංශය

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් දිනා ගත් ජාත්‍යන්තර ජයග්‍රහණ
- නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති
- ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්
- වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්
- ජාතික ක්‍රීඩා සංගම් විසින් 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම
- දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීම
- කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම
- නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
    - ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබීම
    - උපයෝගීතාවය සලකා බැලීමකින් තොරව බිංගිරිය ප්‍රදේශයේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රජයේ අරමුදල් නිශ්කාරව යෙදවීම
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
    - සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම හා යකඩ වැට ඉදිකිරීම ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම
    - සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වට තාප්පය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම
    - පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය නඩත්තු නොකිරීම
    - රඳවා ගත් මුදල්  ශේෂ නිරවුල් නොකිරීම

- ශ්‍රී ලංකා ක්‍රිකට්
    - අත්තිකාරම් ශේෂයන් නිරවුල්කර ගැනීමට කටයුතු නොකිරීම
    - අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම අයකර ගැනීමට කටයුතු නොකිරීම
    - ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සහ බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා තිබීම
    - ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවන්නන්හට ප්‍රතිලාභ අත්කර දීමේ අරමුණ ඉටු වී නොතිබීම
    - නිලවරණ පවත්වා නීත්‍යානුකූලව නොතිබූ සංගම් සඳහා පරිපාලන වියදම් ගෙවීම
    - ක්‍රිකට් ක්‍රීඩාංගන වල පිහිණුම් තටාකයන්හි ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබීම
- ජාතික යොවුන් සේනාංකය
    - නිපුණතාවය පදනම්ව තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහනට ලබා දී තිබූ අරමුදල් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා යොදා ගැනීම
    - යොවුන් සේනාංක පනත පරිච්ඡින්න කර නව පනතක් සම්මත කර නොගැනීම
    - අත්තිකාරම් ආපසු අයකර නොගැනීම
    - අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු නොකිරීම
    - භාවිතයට ගනු ලබන වාහන සේනාංකය නමින් ලියා පදිංචි කර නොගැනීම
- ජාතික තරුණ සේවා සභාව
    - වත්කම් ගිණුම් ගත නොකිරීම
    - පරිගණක මිලටගත් අරමුණ සඳහා යොදා නොගැනීම
    - ක්‍රීඩා සමාජය හා යෞවන සමාජවල මූල්‍ය වාර්තා සභාවේ කළමනාකරණය වෙත ඉදිරිපත් නොකිරීම

# ක්‍රීඩා හා යෞවන කටයුතු අංශය

ජාතික ආර්ථිකයට සක්‍රීයව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහි කිරීම හා විනයගරුක, ක්‍රීඩාශීලී සමාජයක් තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායකවීම ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව. ජාතික තරුණ සේවා සභාව, ජාතික යොවුන් සේනාංකය, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය හා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන 10 ක්, ක්‍රීඩා අරමුදල හා ක්‍රීඩා සංගම් 66 මඟින් පහත සඳහන් කාර්යභාර්යන් ඉටු කළ යුතුව තිබුණි.

- ක්‍රීඩා විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාර්ය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරන ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ අපේක්ෂිත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම හා සානුබලයන් සැපයීම.
- ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණය ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අන්තර්ජාතික වශයෙන් ගොඩනැගීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීමට හැකි වන ලෙස නව ක්‍රමෝපායන් සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් අන්තර්ජාතික තරඟවලට සහභාගි වීමට ඇති අවස්ථාවන් පුළුල් කිරීම.
- පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය සිදු කිරීම.
- ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රීඩාවේ තහනම් උත්තේජක භාවිතය මැඩලීම සඳහා ක්‍රියා කිරීම.
- ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම හා කළමණාකරණය කිරීම.
- ක්‍රීඩා සමිති සංවිධානය සහ ක්‍රීඩා තරඟාවලි ප්‍රවර්ධනය කිරීම.
- තරුණ පරපුරේ අභිලාශයන් ඉටුවන ජාතික වැඩපිළිවෙලක් අරමුණු කර ගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොට ගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තරුණ සංවිධාන සම්බන්ධ නියාමන හා සංවර්ධන කටයුතු.
- තාරුණ්‍යයේ නිපුණතා, කුසලතා හා නිර්මාණශීලිත්වය සමාජ පිලිගැනීමක් ඇති වන හා ඔවුනට සිය අභිමතාර්ථ දියුණු කරගත හැකි වන සේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් විශේෂ වැඩසටහන් සම්පාදනය කිරීම
- දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම.
- තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමට පියවර ගැනීම සහ ඔවුනට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.
- ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ආශ්‍රිත දෙපාර්තමේන්තු ව්‍යාස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා වලට පවරා ඇති විෂයන්ට අදාළ අනෙකුත් සියළුම ක්‍රියාකිරකම් සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම.

2022 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එකතුව රු. මිලියන 6,822 ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 4,908 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට රු. මිලියන 1,914 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තරය රූපසටහන 45 හි දැක්වේ.




| | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන රු. මිලියන | 5,841 | 981 | 6,822 |
| වියදම | 4,106 | 802 | 4,908 |
| ඉතිරිය | 1,734 | 180 | 1,914 |

රූපසටහන 45 : ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා තථ්‍ය වියදම

මූලාශ්‍රය : 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉහත සඳහන් කාර්යභාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

### ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් දිනා ගත් ජාත්‍යන්තර ජයග්‍රහණ

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රීඩකයින් ප්‍රධාන ජාත්‍යන්තර තරගාවලි 06 කට සහභාගී වී ජයග්‍රහණ ලෙස රන් 03 ක් රිදී 05 ක් සහ ලෝකඩ 12 ක් වශයෙන් පදක්කම් 20 ක් ලබා ගෙන තිබුණි. තවද විවෘත සුපර් 100 බැඩ්මින්ටන් තරඟාවලිය, ආසියානු කුසලාන තරඟාවලිය හා 2022 ආසියානු දැල්පන්දු ශූරතාවලියට සහභාගී වී ශූරතාව ලබා ගෙන තිබුණි.

### නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 1,140 ක් ප්‍රතිපාදන සලසා ගෙන රු.මිලියන 324 ක් වියදම් කර තිබුණු ව්‍යාපෘති 07 ක් ප්‍රතිපාදන නොමැති වීම, කොන්ත්‍රාත් හා උපදේශක ආයතන සමඟ ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් යනාදී හේතූන් මත වැඩ නිම නොකර අතහැර දමා තිබුණි.

### ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 6 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 530 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට වැයකර තිබූ වියදම රු. මිලියන 315 ක් විය. විවිධ හේතූන් මත මෙම ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබූ අතර අමු ද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම හා ප්‍රතිපාදන සලසා ගැනීමේ දුෂ්කරතාවයන් නිසා මෙම ව්‍යාපෘති සඳහා මෙතෙක් වැයකර ඇති වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම අපහසු වී තිබුණි.

### වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්

2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග අනුව ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස්කර පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර තිබුණේ ක්‍රීඩා සංගම් 66 කින් ක්‍රීඩා සංගම් 11 ක් පමණි.

### ජාතික ක්‍රීඩා සංගම් විසින් 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

2016 අංක 01 දරණ ජාතික ක්‍රීඩා සංගම් නියෝග අනුව සියළුම ජාතික ක්‍රීඩා සංගම් විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ජාතික ක්‍රීඩා සංගම් 09 ක මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2023 අගෝස්තු මාසය වන විටද ඉදිරිපත් කර නොතිබුණි.

### දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීම

දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර් ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමේ දී 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන රු.මිලියන 606 ක් වියදම් කර තිබුණි. නමුත් එහි කෘතීම ධාවන පථයේ පැවති අඩුපාඩු , පැරණි ධාවන පථය පිහිටි ප්‍රේක්ෂකාගාරයේ වහලය සුළඟින් විනාශ වීම, කුඩා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම් අවසන් නොවීම. ,විදුලිජනක යන්ත්‍ර සවි කිරීම අවසන් නොකිරීම . හා මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීම ගිවිසුමක් රහිතව බාර දීම නිසා ගෙවූ රු. මිලියන 5.4 අයකර ගත නොහැකි වීම යනාදී කරුණු නිසා මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන් ඉටු නොවීම හේතුවෙන් ආයෝජිත මුදලට අපේක්ෂිත ප්‍රතිලාභයක් අත්කර ගෙන නොතිබුණි.

### කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම

කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම සඳහා රු. මිලියන 12 ක් ඇස්තමේන්තු කර 2018 මාර්තු 28 දින රු. මිලියන 12 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 6 කින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. නමුත් ව්‍යාපෘතියේ I වන අදියර පමණක් ඉටු කර තිබුණ අතර දුනු විදීම හා වෙඩි තැබීමේ ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගත නොහැකි වී තිබුණි.

### නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ මූලධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් 2018 සිට 2022 වර්ෂය දක්වා පිළිවෙලින් රු.මිලියන 266 ක් හා රු.මිලියන 72 ක් වැයකර තිබුණි. 2022 වර්ෂයේ දී මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන ප්‍රධාන පුහුණු වැඩසටහන් වන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 19ක්, අනාගතයට සූදානම් තරුණ නායකත්ව වැඩසටහන් 14ක්, ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 55ක් හා රාජ්‍ය නිලධාරීන් සඳහා නායකත්ව කුසලතා සංවර්ධන පුහුණු 6ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, සත්‍ය වශයෙන් පවත්වා තිබුණේ පිළිවෙලින් වැඩසටහන් 4ක්, 24ක්, 7ක් හා 1ක් පමණි.

### ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබීම

2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ජාතික කෞතුකාගාරය ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 90 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන රු. මිලියන 71 ක් වියදම් කර තිබුණු අතර ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් වැය කර තිබුණු මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණ අතර ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. කෞතුකාගාරයේ ඉදිකිරීම් නවතා දමා තිබුණු අතර එම ගොඩනැගිල්ලේ ජාතික ක්‍රීඩා සභාවේ කාර්යාලය හා ජාතික තේරීම් කමිටුව ස්ථාපිත කර තිබුණි.

## උපයෝගීතාවය සලකා බැලීමකින් තොරව බිංගිරිය ප්‍රදේශයේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රජයේ අරමුදල් නිශ්කාරව යෙදවීම

කුරුණෑගල වෙලගෙදර ක්‍රීඩාංගනය ආසන්නයේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. නමුත් ඒ අනුව කුරුණෑගල නගරය ආසන්නයේ ඉඩමක් තෝරා නොගෙන කුරුණෑගල නගරයේ සිට කි.මී. 55 ක් දුරින් පිහිටි බිංගිරිය ප්‍රදේශයේ ඉඩමක් තෝරාගෙන තිබුණි. මෙම ඉඩමේ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම් සඳහා රු. මිලියන 86 ක් ද, ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 207 ක් ද, පිහිනුම් තටාකයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 87 ක් ද, වැය කර තිබූ නමුත් ඒවාගේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි. මෙම ඉදිකිරීම් සඳහා වැඩබිමට රැගෙන විත් තිබූ යකඩ කාප්ප වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය දිරා පත් වෙමින් පැවතුණි. ඒ අනුව මෙම වැරදි තීරණය නිසා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල්වලින් ඉහත ඉදිකිරීම සඳහා පමණක් රු. මිලියන 380 ක් නිශ්කාර්යව වැය කර තිබූ අතර එම වැරදි තීරණය සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම මෙම ඉදිකිරීම් සිදුකර තිබූ ක්‍රීඩා සංකීර්ණය ඉදිකර ඇති අක්කර 15 ½ ක් විශාල වූ ඉඩම ක්‍රීඩා අමාත්‍යාංශය වෙත පවරාගෙන ද නොතිබුණි.



**ක්‍රීඩාගාරය**



**ගෘහස්ත ක්‍රීඩාංගනය**



**පිහිනුම් තටාකය**

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම හා යකඩ වැට ඉදිකිරීම ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම

2019 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 50 ක් වූ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම හා යකඩ වැට ඉදිකිරීම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 මැයි 10 දිනට වැඩ අවසන් කළ යුතු වුවද ඒ සඳහා රු. මිලියන 32 ක් වැය කර වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද වැඩ අවසන් කර නොතිබුණි.

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වට තාප්පය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම

කෙරීගෙන යන වැඩ තුළ ඇතුළත් රු. මිලියන 18 ක පිරිවැය වූ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වට තාප්පය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2019 සැප්තැම්බර් 18 වන දින ආරම්භ කර තිබූ අතර

2019 දෙසැම්බර් 18 දින නිම කළ යුතුව තිබුණි. රටේ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය හිඟකම හා කාලගුණික තත්ත්වයන් හේතුකරගෙන අදාළ උපදේශන ආයතනය විසින් කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 21 දින දක්වා දීර්ඝ කරවාගෙන ඇතත් මේ වන විටත් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

### පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය නඩත්තු නොකිරීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධාන පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය සඳහා ස්ථාපිත පොම්පාගාරය 2010 වර්ෂයෙන් පසුව අලුත්වැඩියාවක් සිදු කර නොතිබුණි. 2020 වර්ෂයේ සිට මෙම පොම්පාගාරය අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් ඇති වී තිබුණද මෙම අලුත්වැඩියාව සිදු නොකිරීමෙන් පැවති ජල කාන්දුව හේතුවෙන් නඩත්තු වියදම ද ඉහල ගොස් තිබුණි. නමුත් ආයතනය මෙතෙක් පොම්පාගාරය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ළමා ජල තටාකය ගිලා බැසීමට ලක්ව ඇති බැවින් පුහුණුවීම් සඳහා භාවිතා නොකරන අතර එය මෙතෙක් අලුත්වැඩියා කිරීමට ද කටයුතු කර නොතිබුණි.

### රඳවා ගත් මුදල් ශේෂ නිරවුල් නොකිරීම

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති 2014 වසරේ සිට පැවත එන එකතුව රු. මිලියන 87 ක් වූ රඳවා ගත් මුදල් ශේෂ නිරවුල් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

### ශ්‍රී ලංකා ක්‍රිකට්

### අත්තිකාරම් ශේෂයන් නිරවුල්කර ගැනීමට කටයුතු නොකිරීම

2018 වර්ෂයේ දී ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ 2020 වර්ෂයේ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම වෙනුවෙන් ලබා දී තිබූ පිළිවෙලින් රු. මිලියන 9 ක සහ රු. මිලියන 12 ක් ද, 2021 වර්ෂයේදී මොණරවිල ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ටර්ප් විකට් (Turf Wicket) 07 ක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 6 ක් සහ විද්‍යාර්ථ විද්‍යාලයේ ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 7 ක් ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම අයකර ගැනීමට කටයුතු නොකිරීම

2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංචාරය වෙනුවෙන් ලැබිය යුතු අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම වූ රු. මිලියන 37 ක් ලැබිය යුතු බවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද මේ සම්බන්ධයෙන් ආයතනය 2018 ඔක්තෝබර් 04 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කරන ලද පැමිණිල්ල ප්‍රකාර අධිකරණමය ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

### ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සහ බහු ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා තිබීම

පොළොන්නරුව හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ජාත්‍යන්තර තත්ත්වයට දියුණු කල හැකි පරිදි ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සහ බහු ක්‍රීඩා

සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 ඔක්තෝබර් මස නිම කිරීමට සැලසුම් කර 2017 අගෝස්තු 17 දින ආරම්භ කර ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු. මිලියන 154 ක් වැයකර තිබුණද අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ දක්වා අපොහොසත් වී තිබුණි.

### ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවන්නන්හට ප්‍රතිලාභ අත්කර දීමේ අරමුණ ඉටු වී නොතිබීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ඉල්ලීම පරිදි කිලිනොච්චිය ක්‍රිකට් ක්‍රීඩා පිටියෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2018 වර්ෂයේ දී රු.මිලියන 10 ක් යුධ හමුදා ව්‍යාපෘති ගිණුමට බැර කර තිබුණද එම මුදලින් පළාතේ ක්‍රීඩකයන්ට හා ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවන්නන්හට ප්‍රතිලාභ අත්කර දීමේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් වී තිබුණි.

### නිලවරණ පවත්වා නීත්‍යානුකූලව නොතිබූ සංගම් සඳහා පරිපාලන වියදම් ගෙවීම

දකුණු පළාත් ක්‍රිකට් සංගමයේ ව්‍යවස්ථාව ප්‍රකාරව, එහි නිලධාරීන් විසින් මහා සභා රැස්වීම වාර්ෂිකව හා නිලවරණය වර්ෂ 3 කට වරක්ද පවත්වා නොතිබුණද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. මිලියන 84 ක් දකුණු පළාත් ක්‍රිකට් සංගමය වෙත පරිපාලන කටයුතු, ක්‍රීඩා තරඟ හා ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා ගෙවා තිබුණි.

### ක්‍රිකට් ක්‍රීඩාංගන වල පිහිණුම් තටාකයන්හි ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබීම

පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිණුම් තටාකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදානය 2019 නොවැම්බර් 20 දින සිදු කර ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 04 ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 147 ක් වැයකර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අවසන් කර නොතිබුණි. රු. මිලියන 37 ක් වූ රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිණුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 නොවැම්බර් 20 දින ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි.

## ජාතික යොවුන් සේනාංකය

### නිපුණතාවය පදනම්ව තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහනට ලබා දී තිබූ අරමුදල් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා යොදා ගැනීම

නිපුණතාවය පදනම්ව තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපොල සිටින පිරිස් සඳහා න්‍යායික දැනුම හා පුහුණුව ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ දී සේනාංකය වෙත රු. මිලියන 90 ක අමතර ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. ඒ සඳහා ආයතනය පුහුණුලාභීන් 4,499 ක් සඳහා පාඨමාලා 16 කින් සමන්විත වූ රැකියාභිමුඛ පුහුණු වැඩ පිළිවෙලක් පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන 07 ක් සමග ක්‍රියාත්මක කිරීම සඳහා සැලැසුම් සකස් කර තිබුණි. නමුත් ඉහත

රැකියාභිමුඛ පුහුණු පාඨමාලා වලින් පාඨමාලා 2 ක් දැනටමත් ආයතනයේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන පාඨමාලා වුවත් එම පාඨමාලා දෙක සඳහාද ඉහත අරමුදල් වලින් රු. මිලියන 26 ක් උපයෝජනය කර තිබුණි.

### යොවුන් සේනාංක පනත පරිච්ඡින්න කර නව පනතක් සම්මත කර නොගැනීම

2011 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී වසර 12කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද මණ්ඩල තීරණය ප්‍රකාර රටේ තරුණ ප්‍රජාව බල ගැන්වීමේ කාර්යය වඩාත් හොඳින් හා ඵලදායිව ඉටු කිරීම සඳහා එයට ගැලපෙන පරිදි පවතින යොවුන් සේනාංක පනත පරිච්ඡින්න කර නව පනතක් සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### අත්තිකාරම් ආපසු අයකර නොගැනීම

ඉදිකිරීම් කටයුතු නවතා තිබූ පුහුණු මධ්‍යස්ථාන 5 කට අදාල කොන්ත්‍රාත් ගිවිසුම් වර්ෂ 02 ත් 06 ත් අතර කාලයක සිට අවලංගු කර තිබුණද ඒ සඳහා 2016 – 2017 වර්ෂ වලදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබූ එකතුව රු. මිලියන 61 ක් වූ අත්තිකාරම් ආපසු අයකරගෙන නොතිබුණි.

### අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු නොකිරීම

සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක හා පවතින මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම් කටයුතු විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව රාජ්‍ය ආයතනයක් මඟින් සිදු කිරීමට 2016 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මෙම ඉදිකිරීම් වල ප්‍රගතිය දුර්වල වීම හේතුවෙන් 2022 වර්ෂයේදී ගෙන තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කර තිබුණි. 2016 හා 2017 වර්ෂ වලදී මෙම ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දී තිබුණු රු. මිලියන 109 ක අත්තිකාරම් මුදලින් තවදුරටත් අයවිය යුතු රු. මිලියන 38 ක් වූ අත්තිකාරම් අය කර ගැනීමට සේනාංකය අපොහොසත් වී තිබුණි.

### භාවිතයට ගනු ලබන වාහන සේනාංකය නමින් ලියා පදිංචි කර නොගැනීම

2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව සේනාංකය විසින් භාවිතයට ගනු ලබන රු. මිලියන 31ක් පිරිවැය වූ වාහන 08ක් සේනාංකය නමින් ලියාපදිංචි කර නොතිබුණි.

### ජාතික තරුණ සේවා සභාව

### වත්කම් ගිණුම් ගත නොකිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 27 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට සභාව විසින් භුක්ති විඳිමින් පැවති ඉඩම් 61 කට අදාළ අක්කර 235 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සභාව සතු අක්කර 06 පර්චස් 58 ක්වූ ඉඩම් 06 ක වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

### පරිගණක මිලටගත් අරමුණ සඳහා යොදා නොගැනීම

ජපානයේ රැකියා ලබාදීම ඉලක්ක කර ගනිමින් ජපන් භාෂා පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 4 ක අගයකට ලැප්ටොප් පරිගණක 25 ක් මිලදීගෙන තිබුණද, අදාල පාඨමාලාව ආරම්භ කර නොතිබීම

හේතුවෙන් එම ලැප්ටොප් පරිගණක ඉහත අරමුණට අදාල නොවන සභාවේ විවිධ අංශ සඳහා නිකුත් කර තිබුණි.

**ක්‍රීඩා සමාජය හා යෞවන සමාජවල මූල්‍ය වාර්තා සභාවේ කළමනාකරණය වෙත ඉදිරිපත් නොකිරීම**

ජාතික තරුණ සේවා සභා පනත අනුව සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු සඳහා පවත්වාගෙන යා යුත්තේ සභාවේම අරමුදලක බව දක්වා තිබුණද, පනතේ කාර්යයන් ඉටු කිරීමට ක්‍රීඩා සමාජය හා යෞවන සමාජ පිහිටුවා තිබුණි. රු. මිලියන 20.5 ක්වූ මූල්‍ය වත්කම් පැවති අතර ඒවායේ කටයුතු සඳහා සභාවේ කාර්යය මණ්ඩලය හා භෞතික සම්පත් උපයෝගී කර ගන්නා නමුත්, එම සමාගම් වල මූල්‍ය වාර්තා සභාවේ කළමනාකරණය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

# පළාත් සභා

## විගණන නිරීක්ෂණ

- පළාත් සභා වල  මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
- පළාත් සභා වල ආදායම් හා වියදම්
    - පළාත් සභා ආදායම්
    - පළාත් සභා වියදම්
- ප්‍රාග්ධන වියදම් හා පෞද්ගලික පාරිශ්‍රමික වියදම
- ඉතිරිකිරීම් හා ආයෝජන
- පළාත් සභා වත්කම්
- පළාත් සභා වගකීම්
- උතුරුමැද පළාත් සභාව
- දකුණු පළාත් සභාව
- මධ්‍යම පළාත් සභාව
- වයඹ පළාත් සභාව
- උතුරු පළාත් සභාව
- නැගෙනහිර පළාත් සභාව
- බස්නාහිර පළාත් සභාව
- සබරගමුව පළාත් සභාව
- ඌව පළාත් සභාව

# පළාත් සභා



1987 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 154 අ (1) ව්‍යවස්ථාව මගින් බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර, උතුර, සබරගමුව යන පළාත් සභා 09 ක් පිහිටුවා තිබුණි.

පළාත් සභාවක් ආණ්ඩුකාරවරයාගේ පාලනය යටතේ පවතින අතර ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබයි. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයෙකු කටයුතු කරනු ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 05 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. දැනට පවතින පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඉ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකනු ලැබ ඇත. ඒ අනුව සභාවක් නොමැතිව සබරගමුව, නැගෙනහිර හා උතුරු මැද පලාත් සභාවන් 2017 වර්ෂයේ සිටද, වයඹ, මධ්‍යම හා උතුරු පළාත් සභාවන් 2018 වර්ෂයේ සිටද, බස්නාහිර, ඌව හා දකුණ පළාත් සභාවන් 2019 වර්ෂයේ සිටද 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පවත්වාගෙන එමින් පැවතුණි.

## පළාත් සභා වල මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සෑම පළාත් සභාවක් විසින්ම සභාවේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය ප්‍රකාරව එම මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපති විසින් කළ යුතුය.

ආරම්භයේ සිට මේ දක්වාම පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඒකාකාරී ගිණුම් ක්‍රමයක් හඳුන්වාදී නොතිබූ අතර 2021 හා 2022 වර්ෂවලදී පළාත් සභා 09 විසින් විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

තවද එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එකිනෙකට වෙනස් ආකෘතීන්, නාමයන් හා ප්‍රභවයන් භාවිත කරමින් මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් සටහන් කර තිබුණි. පළාත් සභා අරමුදල් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා විධිමත් ඒකාකාරී මාර්ගෝපදේශයක් හෝ චක්‍රලේඛයක් රජය හෝ පළාත් සභා විසින්

නිකුත් කර නොතිබූ අතර ඒවා විශ්ලේෂණය කර සන්සන්දනාත්මකව භාවිතා කරමින් තීරණ ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව පැවතුණි.

නිශ්චිත මාර්ගෝපදේශයක් නොලැබීම හේතුවෙන් පළාත් සභාවලට තොරතුරු වසං කිරීමේ, අත්හැරීමේ හෝ තීරණ ගන්නන් නොමඟ යන ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතුණි.

කෙසේ නමුත් පවතින තත්ත්වයන් සැලකිල්ලට ගෙන වැදගත් සංරචක කීපයක් සම්බන්ධයෙන් විශ්ලේෂණය කළ හැකි කරුණු පහත දැක්වේ.

### පළාත් සභා වල ආදායම් හා වියදම්

පළාත් සභාවන් උපචිත පදනම, මුදල් පදනම, වැඩිදියුණු කරන ලද මුදල් පදනම යන පදනම් විකල්ප ලෙස භාවිතා කර තිබීම හා ඒකාකාරී ක්‍රමවේද අනුගමනය නොකිරීම යන තත්ත්වයන්ට යටත්ව පළාත් සභාවන්හි ආදායම හා වියදම සැසඳීම සිදුකරන ලදී.

### පළාත් සභා ආදායම්

පළාත් සභාවක ආදායම් ප්‍රදාන වශයෙන් රජයේ ප්‍රදාන, බදු ආදායම හා බදු නොවන ආදායම ඇතුළු විවිධ ප්‍රභවයන්ගෙන් සමන්විත වේ. පළාත් සභා 09 විසින් 2022 වර්ෂයේදී එකතුව රු. මිලියන 419,307 ක ආදායම් රැස්කර තිබුණි. එම ආදායම තුල රු. මිලියන 56,726 ක බදු ආදායමක්ද රු. මිලියන 19,277 ක බදු නොවන හා වෙනත් ආදායම්ද පැවති අතර රජය විසින් පළාත් සභාවලට ලබාදුන් එකතුව රු. මිලියන 343,304 ක රජයේ ප්‍රදානද ඇතුලත්ව තිබුණි. ඒ අනුව පළාත් සභා විසින් රැස්කල මුළු ආදායමෙන් සියයට 82 ක්ම රජයෙන් ලබාදුන් ප්‍රදානවලින් සමන්විත වී තිබුණි.

### පළාත් සභා වියදම්

සෑම පළාත් සභාවක් විසින්ම පෞද්ගලික පාරිශ්‍රමික, අනෙකුත් භාණ්ඩ හා සේවා නඩත්තු වියදම් ඇතුලත්ව පුනරාවර්ථන වියදම්ද, ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වියදම්ද වාර්ෂිකව දරනු ලබයි. 2022 වර්ෂයේදී පළාත් සභා 09 විසින් එකතුව රු. මිලියන 403,544 ක් වියදම් කර තිබුණි. එම වියදමින් සියයට 96 ක් හෙවත් රු. මිලියන 387,118 ක් පුනරාවර්තන වියදම් ලෙසත් සියයට 4 ක් හෙවත් රු. මිලියන 16,426 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් වැය කර තිබුණි. මුළු පුනරාවර්තන වියදමින් සියයට 77 ක් හෙවත් රු. මිලියන 298,401 ක් පෞද්ගලික පඩි නඩි ගෙවීම සඳහා පළාත් සභා විසින් වැය කර තිබුණි.

### ප්‍රාග්ධන වියදම් හා පෞද්ගලික පාරිශ්‍රමික වියදම

2022 වර්ෂයේදී පෞද්ගලික පාරිශ්‍රමික වියදම් ලෙස රු. මිලියන 298,401 ක් වැය කරන විට එම පළාත්වල සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 16,426 ක් පමණක් වැය කර තිබුණි.

| පළාත් සභාව | 2022 දෙසැම්බර් 31 දිනට රැස්කළ මුළු ආදායම<br>රු.මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට මුළු වියදම<br>රු. මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට අතිරික්තය (ඌනතාවය)<br>රු. මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට රජයෙන් ලබාදුන් ප්‍රදාන<br>රු. මිලියන |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 102,093 | 86,877 | 15,216 | 62,062 |
| මධ්‍යම පළාත් සභාව | 48,375 | 51,247 | (2,872) | 42,859 |
| දකුණු පළාත් සභාව | 52,219 | 52,997 | (778) | 45,357 |
| වයඹ පළාත් සභාව | 49,760 | 47,368 | 2,392 | 41,647 |
| උතුරු මැද පළාත් සභාව | 27,519 | 27,655 | (136) | 24,757 |
| ඌව පළාත් සභාව | 30,772 | 34,101 | (3,329) | 28,519 |
| නැගෙනහිර පළාත් සභාව | 33,984 | 31,633 | 2,351 | 31,680 |
| උතුරු පළාත් සභාව | 33,959 | 31,314 | 2,646 | 29,395 |
| සබරගමුව පළාත් සභාව | 40,626 | 40,352 | 273 | 37,028 |
| එකතුව | 419,307 | 403,544 | 15,763 | 343,304 |

වගුව 27 - 2022 දෙසැම්බර් 31 දිනට පළාත් සභා වල ආදායම් හා වියදම්

## ඉතිරිකිරීම් හා ආයෝජන

පළාත් සභා විසින් රජයෙන් ලැබෙන ප්‍රදාන ඌන උපයෝජනය කර හෝ පළාත් සභා ආදායම නිසි ලෙස ඇස්තමේන්තු කිරීමකින් තොරව මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන ලබා ගැනීම හේතුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. විස්තර වගුව 28 මගින් දැක්වේ.

| පළාත් සභාව | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය<br>රු. මිලියන | 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය<br>රු. මිලියන |
|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 25,500 | 12,000 |
| දකුණු පළාත් සභාව | 3,888 | 3,388 |
| වයඹ පළාත් සභාව | 9,703 | 6,964 |
| සබරගමුව පළාත් සභාව | 3,050 | - |

වගුව 28 - පලාත් සභාවල ආයෝජන

ඒකාකාරී ගිණුම් ක්‍රමවේදයක් නොතිබූ බැවින් අනෙකුත් පළාත් සභාවල ආයෝජන පිළිබඳ තොරතුරු විගණනය වෙත ලබා ගැනීමට නොහැකි වීම.

මීට අමතරව 2022 දෙසැම්බර් 31 දිනට පළාත් සභා 09 හි පහත සඳහන් පරිදි මුදල් හා බැංකු ශේෂයක් පැවතුණි.

| පළාත් සභාව | මුදල් හා බැංකු ශේෂය රු. මිලියන |
|---|---|
| බස්නාහිර | 5,041 |
| මධ්‍යම | 910 |
| දකුණ | 588 |
| වයඹ | 1,252 |
| උතුරු මැද | 3,137 |
| ඌව | 1,603 |
| නැගෙනහිර | 1,278 |
| උතුර | 2,646 |
| සබරගමුව | 1,953 |
| එකතුව | 18,408 |

වගුව 29 - පළාත් සභාවල මුදල් හා බැංකු ශේෂයන්

මේ අනුව පළාත් සභාවලට ප්‍රතිපාදන ලබාදීමේදී මහා භාණ්ඩාගාරය, මුදල් කොමිසම, පළාත් පාලන අමාත්‍යාංශය වැනි ආයතන විසින් පළාත් සභා විසින් සිදුකර ඇති ආයෝජන හා ඉතිරි කිරීම් පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

## පළාත් සභා වත්කම්

2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 374,492 ක් ලෙස හඳුනාගත් පළාත් සභා මුළු වත්කම් ප්‍රමාණය 2022 දෙසැම්බර් 31 දින රු.මිලියන 409,697 ක් ලෙස හඳුනාගෙන තිබූ අතර එය සියයට 9 ක වර්ධනය වීමකි. 2022 වර්ෂයේ පළාත් සභාවන්හි මුළු වත්කම්වලින් එකතුව රු. මිලියන 325,898 ක් එනම් සියයට 80 ක් මූල්‍ය නොවන වත්කම් වූ අතර එයින් රු. මිලියන 85,806 ක් වූ වැඩිම මූල්‍ය නොවන වත්කම් ප්‍රමාණය ඌව පළාත් සභාව සතු විය. කෙසේ වෙතත් බස්නාහිර පළාත් සභාවද ඇතුළුව බොහෝ පළාත් සභා විසින් ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමටත්, කාලීනව ප්‍රත්‍යාගණනය කිරීමටත්, පරිහරණය කරන වත්කම් නිසි ලෙස පවරාගෙන ගිණුම්ගත කිරීමටත් කාලීනව කටයුතු නොකිරීම නිසා සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම ඵලදායි නොවීය. විස්තර වගුව 30 මගින් දැක්වේ.

| පළාත් සභාව | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය රු. මිලියන | 2021 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය රු. මිලියන |
|---|---|---|---|
| බස්නාහිර | 27,890 | 64,965 | 40,361 |
| මධ්‍යම | 6,683 | 9,258 | 11,294 |
| දකුණ | 49,091 | 58,358 | 55,372 |
| වයඹ | 84,011 | 96,693 | 87,869 |
| උතුරු මැද | 26,921 | 31,997 | 31,396 |
| ඌව | 85,806 | 88,220 | 91,843 |
| නැගෙනහිර | 15,906 | 18,007 | 16,802 |
| උතුර | 21,886 | 25,763 | 24,930 |
| සබරගමුව | 7,703 | 16,436 | 14,625 |
| **එකතුව** | **325,897** | **409,697** | **374,492** |

වගුව 30 - පළාත් සභා සතු වත්කම් ශේෂ

## පළාත් සභා වගකීම්

2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 11,893 ක් වූ පළාත් සභා මුළු වගකීම් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී රු. මිලියන 10,967 ක් විය. 2022 වර්ෂයේ මුළු වගකීම්වලින් රු. මිලියන 2,605 ක් එනම් සියයට 24 ක් උතුරු පළාත් සභාව සතු වගකීම් විය.

## උතුරුමැද පළාත් සභාව

- 2022 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 25,157 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 22,102 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරි කර තිබුණු මුදල රු. මිලියන 3,055 ක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් විය.

- උතුරුමැද පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා වාර්ෂික සමූපකාර සමිති දායකය රු. මිලියන 8 ක් සහ පළාත් සභා අරමුදලින් වාර්ෂිකව ලැබෙන රු. මිලියන 10 ක් සමඟ වාර්ෂික ලැබීම් රු. මිලියන 18 ක් විය. එහෙත් අරමුදලේ සේවක ප්‍රතිලාභීන් 560 ක් සඳහා වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වියදම රු. මිලියන 26 ක් බැවින් අරමුදලේ ඉදිරි පැවැත්ම අවිනිශ්චිත අතර 2021 සහ 2022 වර්ෂයන්ට අදාලව ප්‍රතිලාභීන් සඳහා විශ්‍රාම වැටුප් ලෙස තව දුරටත් ගෙවිය යුතු මුදල රු. මිලියන 18 ක් විය.

- උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ වාහන අළුත්වැඩියා අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 23 ක අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර එම අමතර කොටස් මිල දී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව තරඟකාරී මිල කැඳවීමකින් තොරව සිදු කර තිබුණි.

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල් 811න් 2022 වර්ෂයේ දී කොට්ඨාශ හා කලාප කාර්යාල මඟින් අධීක්ෂණය කර තිබුණු පාසල් ගණන 376 ක් පමණක් විය. අධීක්ෂණයට භාජනය කර තිබුණු පාසල් වලින්ද පාසල් 114 ක ගුණාත්මක දර්ශක අගය සියයට 60 ට වඩා අඩු සාමාන්‍ය කාර්ය සාධනය පහල මට්ටමක පැවතුණු අතර ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන අ.පො.ස (සා.පෙළ) සහ උසස් පෙළ විභාග ප්‍රතිඵල අනෙකුත් පළාත් සමඟ සැසඳීමේදී උතුරු මැද පළාත 09 වන ස්ථානය ගෙන තිබුණි.

- උතුරු මැද පළාත් පාසල්වලට අනුයුක්තව සිටි විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් 63 දෙනෙකු මාස 02 සිට වසර 32 ක් දක්වා කාල පරාසයක සිට වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර, එම මුදාහල ගුරුභවතුන්ගෙන් 61 දෙනෙකු සඳහා මුදාහල දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ නිලධාරීන් සේවයට වාර්තා කිරීම, පැමිණීම හා පිටවීම, නිවාඩු ආදිය පිළිබඳ තොරතුරු හා මුදාහල ආයතන වලින් ලබාගත් දීමනා පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමකින් තොරව කලාප අධ්‍යාපන කාර්යාල විසින් එකී නිලධාරීන්ට ගෙවා තිබූ වැටුප් හා දීමනාවල එකතුව රු. මිලියන 257 ක් විය.

- පාසල් 290 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත කර නොමැති වීම හේතුවෙන්, ගුරු සේවයට අයත් ගුරුවරුන්ට විදුහල්පති තනතුරේ රාජකාරී ඉටු කිරීමට වැඩ බලන තනතුරු ලබා දී තිබුණු නමුත්, පාසල් 122 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නියෝජ්‍ය විදුහල්පති තනතුරේ රාජකාරී ඉටු කරමින් පැවතුණි.

- ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ පදවිය මහසෙන් මහා විද්‍යාලය, පදවිය මහසෙන් ප්‍රාථමික විද්‍යාලය සහ පදවි පරාක්‍රමපුර ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල රු. මිලියන 66 ක ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් 2016 ඔක්තෝබර් 02 සිට 2017 පෙබරවාරි 12 දක්වා කාලය තුළ නිම කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුණ ද එම කොන්ත්‍රාත්තු නිම නොකර අතහැර දමා තිබූ අතර, ඒ වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු. මිලියන 14 ක් විය.

### දකුණු පළාත් සභාව

- 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල, මාතර හා හම්බන්තොට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලවල උසාවි දඩ ලෙස අයකර තිබූ එකතුව රු.මිලියන 40 ක් වූ නිරවුල් කළ යුතු උසාවි දඩ ශේෂයක් පැවති අතර මෙම මුදල අදාළ ප්‍රතිලාභී සමිති හඳුනාගෙන කඩිනමින් ලබාදීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, මෙම ශේෂය තුළ 2022 වර්ෂයට පෙර කාලයට අදාළ හඳුනා නොගත් රු.මිලියන 28 ක ශේෂයක් ද පැවතුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන අළුත්වැඩියාව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා තිබියදී, සමාලෝචිත වර්ෂය තුල, අධිකාරිය සතු වාහන බාහිර ආයතන වෙතින් අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 7 ක් වැය කර තිබුණි.

- දකුණු පළාත් සභාවේ ආයතන 08 ක නිල වාහන හිමිකම් ලබන තනතුරු 23 ක නිලධාරීන් 39 දෙනෙකුට 2019 මැයි මස සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 35 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අතරින් 2014 ජනවාරි 02 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයට අනුකූල නොවන සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩිසල් සඳහා රු.මිලියන 5 ක් ගෙවා තිබුණි.

- 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛය අනුව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව කාර්යාල දීමනා ගෙවිය නොහැකි වුවද දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා රු.මිලියන 2 ක් කාර්යාල දීමනා ගෙවා තිබුණි.

- වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සහ 2007 මැයි 18 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පළාත් පාලන ආයතන 49 ක් සඳහා තේරී පත් වූ සභිකයින් 1,131 දෙනෙකුගෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සභිකයින් පිළිවෙලින් 536 ක්, 652 ක්, 739 ක්, 689 ක් හා 771 දෙනෙකු වාර්ෂිකව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

- ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතුය. නමුත් විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කළ වටිනාකම රු.මිලියන 9 ක් වූ අධිභාර සහතික 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී පනතේ නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රොනික් ආදායම් ව්‍යාපෘතිය සඳහා 2018 මාර්තු මස ශ්‍රී ලංකා තොරතුරු හා

සන්නිවේදන නියෝජිතයාතනය සමඟ එකඟතා ගිවිසුමකට එළඹ රු.මිලියන 6 ක් ගෙවීම් කර තිබුණු අතර 2022 අප්‍රේල් මස වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත වුවද එය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එලෙස ව්‍යාපෘතිය නියමිත දිනට අවසන් නොවීම නිසා නැවත බලපත්‍ර මුද්‍රණය සඳහා රු.මිලියන 3 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

- ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමකින් තොරව ගරු ආණ්ඩුකාරවරගේ යෝජනාවක් මත දකුණු පළාතේ සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර තැපෑල කළමනාකරණ පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 07 දින රු.මිලියන 14 ක මුදලකට කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළදී රු.මිලියන 28 ක මුදලක් වැයකර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කර නොතිබුණි. මේ සඳහා රු.මිලියන 21 කට ස්කැනර් යන්ත්‍ර 86 ක් මිලට ගෙන පද්ධතිය ස්ථාපිත කරනු ලබන ආයතන වලට බෙදා හැර තිබුණද ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

**මධ්‍යම පළාත් සභාව**

- මධ්‍යම පළාත් සංවර්ධන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2,181ක, වැඩ යෝජනා 1006 කින් රු.මිලියන 31 ක් වූ නව වැඩ යෝජනා 15 ක් ආරම්භ කර නොතිබුණු අතර ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 123 ක් වූ නව වැඩ යෝජනා 35 ක ප්‍රගතිය සියයට 50 කට අඩුවෙන් පැවතුණි. තවද ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 123 ක් වූ සම්පූර්ණයෙන් වැඩ නිම නොවූ සියයට 50 කට වැඩියෙන් නිමකළ යෝජනා ගණන 26 ක් විය.

- හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලය විසින් හඟුරන්කෙත මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙන් 2011 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා ශේෂ ගුරු වැටුප් සහ අවකරණ මඟින් රු.මිලියන 14 ක අක්‍රමිකතාවයක් සිදුකර ඇති තිබුණ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 4 ක මුදලක් තවදුරටත් අයවීමට තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් මූලික විමර්ශන කමිටු වාර්තාව මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

- 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් සැකසිමේදී වැටුප් රාජකාරී ඉටු කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් බැංකු ගිණුම් 14 කට රු.මිලියන 52 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු.මිලියන 1 ක් වශයෙන් එකතුව රු.මිලියන 53 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු පාර්ශව හඳුනාගෙන ඔවුනට එරෙහිව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධි විධාන වලට පටහැනිව ආණ්ඩුකාරවරයාගේ නිල රථවල හා ආරක්ෂක රථයේ රියදුරන් විසින් ඉදිරිපත් කර තිබුණු ධාවන සාරාංශ සඳහා නිසි අධීක්ෂණයකින් තොරව සාවද්‍ය ලෙස දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1 ක් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරන් වෙත ගෙවා තිබුණි.

- 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව ආණ්ඩුකාරවරයාගේ නිල වාහන 02 කට 2020 මැයි සිට 2022 අප්‍රේල් දක්වා මාස 24 ක කාල පරිච්ඡේදය සඳහා ඉන්ධන ලීටර් 6720.21 කට අදාළව රු.මිලියන එකකට ආසන්නව ගෙවීම්කර තිබුණි.

- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහනවලට සිදු වූ අනතුරු 79 කට අදාළ රු.මිලියන 65 ක අලාභ හානි සම්බන්ධයෙන් අනතුර සිදුවී වසර 01 ත් 18 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබුණද කඩිනමින් ක්‍රියා මාර්ග ගෙන අලාභ අය කිරීමට හා අනෙකුත් පරීක්ෂණ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි

- කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් රු.මිලියන 9 ක් වැය කර පාංශු විද්‍යාගාර 3 ක් නවීකරණය කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 44 ක පාංශු විද්‍යාගාර උපකරණ ලැබී විගණිත දිනවූ 2023 පෙබරවාරි 24 දිනට මාස 09 ක් ගතවී තිබුණද අදාළ පාංශු පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ පාංශු විද්‍යාගාර වෙත නොලැබීම නිසා මෙම වැඩසටහනින් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණට පටහැනි කාර්යයන් 17 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 44 ක් වූ

මුදලක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණි.

- මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතන 05 ක් සඳහා විගණකාධිපතිතුමා විසින් 2019 සිට 2022 අතර කාල පරාසය තුළ නිකුත් කර තිබූ අධිභාර සහතික 10 කට අදාළව රු.මිලියන 9 ක අධිභාර මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අය කර නොතිබුණි.

- දිගින් දිගටම පැවත එන මධ්‍යම රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.මිලියන 172 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පිහිටි පළාත් මහී ප්‍රවාහන සේවා අධිකාරියට අයත් කඩ කාමර 219 කින් කඩකාමර 196 ක් සඳහා 2001 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු හිඟ කඩ කාමර කුලිය රු.මිලියන 16 ක් වූ අතර විගණන දින වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. ඉන් කඩ කාමර 13 ක් සඳහා ගිවිසුම්වලට ද එළඹී නොතිබුණි.

- ප්‍රාදේශීය සභා පනතේ 268 වන අධිකාරිය සහ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතට අනුකූලව සැලැස්මකින් තොරව 2010 වර්ෂයේ රු.මිලියන 6.5 ක් වැයකර ඉදිකරන ලද කටුකිතුල ගිමන්හල අනවසර ඉදිකිරීමක් ලෙස සලකා කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා විසින් ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස නියෝග කර තිබුණද එම වර්ෂයේ දී ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා රු.මිලියන 1 ක වියදම් කර තිබුණි.

- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතන 04 ක පැවති එකතුව රු.මිලියන 12 ක යන්ත්‍ර හා උපකරණ 34 ක් භාවිතයට ගත නොහැකිවීම මත නිෂ්ක්‍රියව පැවතුණි. මේවා පරීක්ෂා කර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේ ව්‍යවසායකත්ව කෘෂි අපනයන ගම්මාන වැඩසටහන යටතේ දෙකිඳ හා වැලිගොඩවත්ත වසම්වල ප්‍රතිලාභී ගොවීන්ට සියයට 70 ක රජයේ දායකත්වයක් යටතේ ලබාදී තිබුණු එකතුව රු.මිලියන 6 ක් වූ ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 54 ක් සහ ඊට අදාළව ලබාදී තිබුණු ලීටර් 1500 ප්ලාස්ටික් ජල ටැංකි හා ලීටර් 500 පොහොර ටැංකි ගොවීන්ට ලබාදී මාස 08 ක පමණ කාලයක් ගතවී තිබුණද පරීක්ෂණ දිනවූ 2022 ඔක්තෝබර් 04 දින වනවිටත් එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

- මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 15 හි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විදුහල්පති පුරප්පාඩු 505 ක් සඳහා වැඩ බලන විදුහල්පතිවරුන් පත්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහනුවර, දෙනුවර, ගම්පල, කටුගස්තොට, වත්තේගම, නාඋල, තෙල්දෙණිය, හඟුරන්කෙත හා මාතලේ කලාපවල විදුහල්පති ශ්‍රේණිධාරීන් 188 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.
- තෙල්දෙණිය කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා අනුමත පාසල් කාර්ය සහායක තනතුරු 63 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට 137 දෙනෙකු සේවයේ යෙදවීම නිසා 74 දෙනෙකු අතිරික්තවී තිබුණි.

### වයඹ පළාත් සභාව

- වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 38,791 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 37,367 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,424 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4 ක පමණ ප්‍රතිපාදන ඉතිරියක් විය. එම මුළු ඉතිරියෙන් රු.මිලියන 717 ක් හෙවත් සියයට 32 ක් පමණ මූලධන ප්‍රතිපාදන වලින් වන අතර, පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිය රු.මිලියන 706 ක් හෙවත් සියයට 2 ක් පමණ විය.
-

- වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දීර්ඝකාලීන ඉඩම් බදු යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 10 ක අවස්ථා 17 කට අදාලව වසර 01 සිට වසර 12 ක කාල පරාසයකට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 98 ක් අයවිය යුතුව පැවතුණි.

- වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් ආදායම වන ආරක්ෂක හා පවිත්‍රතා සේවාවේ පිළිවෙළින් රු.මිලියන 56 ක් හා රු.මිලියන 130 ක් වූලැබිය යුතු ආදායමක් සමාලෝචිත වර්ෂය අවසානයට පවතින අතර එයින් වර්ෂයට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 28 ක් හා රු. මිලියන 13 ක් විය.

- වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් විගණකාධිපති විසින් 2009 – 2014 ත් අතර කාල පරාසය තුළ නිකුත් කර තිබුණු රු.මිලියන 3 ක් වූ අධිභාර සහතික 07 ක් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- සමුපකාර සමිති පනත අනුව සෑම ලියාපදිංචි සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ලද පරිදි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 කට වැඩි නොවන සහ රු.500 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා අයවිය යුතු වුවත්, සමුපකාර සමිති වෙතින් සමුපකාර අරමුදලට

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති මුදල රු.මිලියන 77 ක් විය.

- වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ දෙකක පිහිටි සමුපකාර සමිතිවල රු.මිලියන 99 ක මුදල් වංචා හෝ මුදල් අඩුවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාර්තා වී තිබුණ ද ඊට අදාළ විමර්ශනයන් සිදුකිරීම දුර්වල මට්ටමක විය.

- වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඖෂධ අවශ්‍යතාව වෙනුවෙන් 2014 සිට 2022 කාලය තුළ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වෙතින් කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලය වෙත ලැබී තිබූ ඖෂධ වලින් රු.මිලියන 15 ක් වටිනා ඖෂධ හා වටිනාකම හඳුනාගත නොහැකි 37,716 වූ ශල්‍ය ද්‍රව්‍ය තොගයක් තත්ත්වයෙන් අසමත්ව පැවති අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

- වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරියට අයත් ජංගම ගිණුමක් වර්ෂ ගණනාවක සිට අයිරා තත්ත්වයේ පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අයිරා පොළිය වශයෙන් රු.මිලියන 1 ක් ගෙවා තිබුණු නමුත් ඉතුරුම් ගිණුම් 04 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 66 ක ශේෂයක් විය.

- ප්‍රධාන අමාත්‍ය අරමුදලේ වාර්ෂික පොළී මුදල් සමඟ අලුත් වන සුනාමි තැන්පතු ස්ථාවර තැන්පත් ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.මිලියන 8 ක ශේෂයක් පැවති අතර, මෙම මුදල් යෙදවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබුණු අතර එම වටිනාකම වයඹ පළාත් සභා මූල්‍ය ප්‍රකාශන වලින් අතහැරී තිබුණි.

- වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය, කොරෝනා වෛරස් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය 2020 වර්ෂය අවසානය දක්වාම නැවත පටක රෝපන විද්‍යාගාරයක් ලෙස ආරම්භකර නොතිබුණි. නව පටක රෝපණ විද්‍යාගාරයක් මාවතගම ඩෙනවර්වත්ත රජයේ ගොවිපලක ඉදිකිරීමට 2019 වර්ෂයේ ආරම්භ කර රු.මිලියන 21 ක් වැයකර තිබුණද එහි ඉදිකිරීම් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

- වයඹ ජනකලා පදනමේ නව ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2020 වර්ෂය වන විට රු.මිලියන 159 ක් වැයකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි ඉදිකිරීම් අවසන්ව නොතිබුණි.එමෙන්ම රු.මිලියන 8 ක් වැයකර ස්ථාපිත කර තිබූ ට්‍රාන්ස්ෆෝමරයද, පිළිවෙලින් රු.මිලියන. 8 ක් හා රු.මිලියන 11 ක් වැයකර ඉදිකර තිබූ වතුර ටැංකියද, උපස්ථාන

ගොඩනැගිල්ලද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

- වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වලකුඹුර මැටි නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2020 වර්ෂයේදී රු.මිලියන 10 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.

- වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දින රු. මිලියන 16 ක් වැයකර මිලදීගෙන තිබූ Solar Power Daler 50 න් කුරුණෑගල හා වාරියපොල කෘෂිකර්ම කලාප කාර්යාලවලට ලබාදී තිබූ පිළිවෙලින් යන්ත්‍ර 04 ක් හා 07 ක්ද වාරියපොල ගොවිපලට ලබාදී තිබූ යන්ත්‍ර 08 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගොවීන් වෙත බෙදා හැර නොතිබුණි. ගොවීන් වෙත ලබාදුන් ඒකක 31 න් ද ඵලදායී ලෙස උපයෝජනය කරන්නේද යන්න පිළිබඳ පසු විපරම් කර නොතිබුණි.

### උතුරු පළාත් සභාව

- රාජ්‍ය ව්‍යවසාය දෙපර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අදාළ පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයන් 47 දෙනෙකුට සහ එහි සභාපතිවරයා වෙත සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂය තුළ එකතුව රු.මිලියන 5 ක මුදලක් ප්‍රවාහන දීමනා, දුරකථන දීමනා, විශේෂ දීමනා සහ ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි.

- උතුරු පළාත් භාණ්ඩාගාරයට 2016 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ප්‍රේෂණය කරන ලද එකතුව රු. මිලියන 266 ක් වූ මුද්දර ගාස්තු පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණ නමුත්, අදාල පළාත් පාලන ආයතනවලට නියමිත කාලපරිච්ඡේදයේ දී ඒවා ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍යායතන පනතේ 03 වගන්තිය ප්‍රකාරව පෞද්ගලික වෛද්‍යාතන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හරහා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව වෙත යොමුකර ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතු වුවත් එවැනි සහතිකයක් ලබා නොගෙන පෞද්ගලික ඔසුසල් 167ක් පළාත් බලප්‍රදේශය තුල පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 වර්ෂයේ සිට 2020 දක්වා කාලපරිච්ඡේදයේ ළඟම පාසැල හොඳම පාසැල වැඩසටහන යටතේ පාසල් 34ක් සඳහා මාස 06 සිට 12ක් දක්වා කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ තිබූ එකතුව රු. මිලියන 515 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 34 ක ගිවිසුම් කාලය දීර්ඝ කිරීම් මුල් ගිවිසුම් කාලයටත් වඩා දෙගුණයකටත් අධික

කාලයක් එනම් මාස 12 සිට 26ක් දක්වා ලබාදී තිබුණත් වර්තමාන වන විටත් අදාල ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

- උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් පාඩු හා අත්හැරීම් යටතේ දක්වා ඇති රු. මිලියන 20 ක මූල්‍ය වංචාව පිළිබඳ විමර්ශන අවසන් කර පළාත් සභාවේ අරමුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- මහනගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත් ප්‍රකාරව ඒ ඒ පළාත්පාලන ආයතන යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතු යුතුකම් ඉටු කිරීම සඳහා මහජන බදුවලින් උපයාගත් මුදල් යොදා ගත යුතු නමුත් පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 කින් 33 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. මිලියන 4,388 ක් පොලී උපයා ගැනීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## නැගෙනහිර පළාත් සභාව

- 2022 වර්ෂය දක්වා කාලය තුළ රජයේ ප්‍රධාන රු. මිලියන 20,482 සිට රු. මිලියන 29,964 දක්වා එනම් සියයට 46 කින් වැඩි වී තිබූ අතර, පලාත් සභාවේ ආදායම් එකතු කිරීම රු. මිලියන 3,839 සිට රු. මිලියන 2,596 දක්වා එනම් සියයට 32 කින් සැලකිය යුතු ලෙස පිරිහී තිබුණි. එමෙන්ම පුනරාවර්තන වියදම් රු. මිලියන 30,643 සිට රු. මිලියන 32,895 දක්වා සියයට 7.3 කින් වැඩි වී තිබුණි.

- ඇස්තමේන්තු නොමැතිව නැගෙනහිර පළාතේ විවිධ ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2,575 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබුණද, රු. මිලියන 1,634 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඉටු කර ගැනීමට අපේක්ෂිත රු. මිලියන 941 ක කෘෂිකාර්මික වැඩිදියුණු කිරීම්, ජීවනෝපාය සංවර්ධන කටයුතු වැනි පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි.

- පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන යටතේ රු.මිලියන 22 ක් වැය කර 2021 වසරේ ආරම්භ කර තිබුණ කටයුතු 2023 මාර්තු 31 වන විටත් අවසන් කර නොතිබීම හේතුවෙන් නැගෙනහිර පළාතේ සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කළ හැකි අයුරින් අපේක්ෂිත සංචාරක සේවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- පළාත් සභාව විසින් 2018 ජනවාරි සිට ජංගම බැංකු ගිණුම් තුනක ආසන්න වශයෙන් රු.මිලියන 414 ක ශේෂයක් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබූ අතර 2022 දෙසැම්බර් මාසය අවසන් වන විට එය රු.මිලියන 640 දක්වා ඉහළ ගොස් තිබුණි. ඉහත පරිදි 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුළ බැංකු ජංගම ගිණුම්වල මුදල් අක්‍රියව පැවතීමට ඉඩ දීමෙන් රජයට දළ වශයෙන් රු.මිලියන 281 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

- ලෝක බැංකු ආධාර මත ඉදිකරන ලද මල්වතු සුරිපොඩෙයි පාරේ පාලම් 02 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් බෙරුම්කර්ණ ක්‍රියාවලිය අනුගත වීමට සිදු වීම නිසා රු.මිලියන 150 ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට සිදු වී තිබුන අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 72 ක පාඩුවක් පළාත් සභාවට සිදු වී තිබුණි.

- සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා සඳහා යොදවා ඇති සේවකයන් වෙනුවෙන් රු.මිලියන 58 ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වයක් ලෙස අදාල සේවා සපයන ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණ ද, මෙම දායක මුදල් අදාල ආයතන වෙත ප්‍රේෂණය කළේද යන්න තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි. තවද ඉහත දායක මුදල් මත ගණනය කරන ලද රු. මිලියන 6 ක එකතු කළ අගය මත බද්ද එම ආයතනය වෙත අවිධිමත් ලෙස ගෙවා තිබුණද එම අවිධිමත් ගෙවීම් මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### බස්නාහිර පළාත් සභාව

- ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාර ගරු ආණ්ඩුකාරවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් හා ආරක්ෂක රථයක් වුවත්, බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා ආරක්ෂක රථයක්ද ඇතුළු නිල වාහන 04 ක් පරිහරණයට යොදවා ගෙන තිබුණි.

- විගණකාධිපති වාර්තාවල සඳහන් කරුණු පිළිබඳව විමසා බැලීම සඳහා මූල්‍ය හා කාර්යසාධන වාර්තා සමාලෝචන කමිටුවක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් පිහිටුවා එම කමිටුවට සාමාන්‍ය රාජකාරී වේලාව තුළ සහභාගී වූ නිලධාරීන්ට ජාතික අයවැය චක්‍රලේඛනයට පටහැනිව රු.මිලියන 3 ක් ගෙවා තිබුණි.

- 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා සභාපතිවරයා සඳහා නිවාස කුලී දීමනාවක් ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී 2009 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මසකට රු.50,000 බැගින් එකතුව

රු.මිලියන 8 ක නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණි.

- බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තිය යටතේ, බස්නාහිර පළාතේ මගී ප්‍රවාහනය සඳහා බස් රථ ධාවනය කළ හැකි මාර්ග වලට මගී සේවා අවසර පත්‍ර ටෙන්ඩර් ක්‍රමය මගින් තෝරා ගනු ලබන බස් හිමි ධාවකයින්ට පමණක් නිකුත් කල යුතුය. නමුත් ඊට පටහැනිව අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු මගී සේවා බලපත්‍ර 6,161 න් බලපත්‍ර 5,064 ක් හෙවත් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවෙන් සියයට 82 ක් විධිමත් ටෙන්ඩර් පටිපාටියක් බැහැරව නිකුත් කර තිබුණි.

- බස්නාහිර පළාත් සභා විෂය පථයට අයත් නොවන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වෙත රු.මිලියන 27 ක් වටිනා ප්‍රාඩෝ ජීප් රථයක් පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ලබාදී ඒ වෙනුවෙන් 2021 දෙසැම්බර් 07 දින සිට 2023 දෙසැම්බර් 29 දින දක්වා වූ රක්ෂණ ගාස්තු රු.557,770 ක් සහා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ මධ්‍යම පුහුණු පාසලේ බරවාහන පුහුණු පාඨමාලාවන් සඳහා 2007 වර්ෂයේදී රු.මිලියන 3 කට මිලදී ගෙන තිබුණු බස් රථය වසර 03 කට ආසන්න කාලයක් නිෂ්ක්‍රියව හෝමාගම බස් නැවතුම් අංගනයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

- බස්නාහිර පළාත තුළ ලියාපදිංචි කර ඇති ත්‍රීරෝද රථ, අධිකාරිය යටතේ පාලනය වන ත්‍රීරෝද රථ කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා 2018 වර්ෂයේදී රු.මිලියන 3 ක් වටිනා හැඳුනුම්පත් බහාලුම් 50,000 ක් මිලදී ගෙන තිබුණද ඒවා වසර 05 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

- වටිනාකම රු.මිලියන 158 ක්වූ කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර 02 ක් 2012 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මිලදී ගෙන ගෙන තිබුණද ඒවා වසර 10 ක කාලය තුළ මාර්ග 15 ක යන්ත්‍ර පැය 420 ක ඉදිකිරීම් සඳහා පමණක් භාවිතා කර ඌන උපයෝජිතව තිබුණි.

- 2012 වර්ෂයේදී රු.මිලියන 6 කට මිලදී ගෙන තිබූ කර්බ් යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට කිසිම ව්‍යාපෘතියක සේවයේ යොදවා ගැනීමකින් තොරව දිවුලපිටිය පෙරනිමි අංගනයේ නිෂ්ක්‍රීයව ගාල්කර තිබුණි.

- පිරිස් හා පුහුණු අංශය වෙත MIS මෘදුකාංගයක් ස්ථාපනය කිරීම සඳහා 2021 වර්ෂයේ රු.මිලියන 2 කුත් 2022 වර්ෂයේ රු.මිලියන 3 කුත් වශයෙන් එකතුව රු.මිලියන 5 ක් වියදම් කර තිබුණු නමුත් අදාළ මෘදුකාංග පද්ධතිය 2023 මැයි වනවිටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.
- මීරිගම "සෙත් සෙවන" වැඩිහිටි නිවාසයේ වහලය හා බිත්තිය අලුත්වැඩියා කිරීම

සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17 ක් වැයකර තිබුණද එම ගොඩනැගිල්ලේ අනෙකුත් අවශ්‍යතා වන දොරවල් හා ජනෙල් සවිකර නොතිබීම හේතුවෙන් 2023 මැයි වනවිටත් භාවිතයට ගත නොහැකිව පැවතුණි.

- මාකොළ සහතික කළ පාසලේ පරිගණක ඒකකය, සුළු සේවක නිවාසය සහ 2021 වර්ෂයේ රු.මිලියන 11 ක වියදමක් දරා ඉදිකළ ක්‍රීඩාගාරය 2023 ජුනි මාසය වනවිටත් නිෂ්කාර්යව පැවතුණි.

- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ ග්‍රීන්පාත් පුහුණු මධ්‍යස්ථානය සඳහා 2021 වර්ෂය තුළ මිලට ගෙන තිබූ රු.මිලියන 11 ක් වටිනා භාණ්ඩ 2022 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂයකට අධික කාලයක් නිශ්කාර්යව පැවතුණි.

- පළාත් සභා විෂය පථයට අයත් නොවන ගම්පහ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට භාවිතට ලබා දී තිබූ වාහනයකට 2022 වර්ෂයේ අනතුරක් සිදු වීම හේතුවෙන් අලුත්වැඩියා කිරීමේ වියදම රු.මිලියන 19 ක් විය. ඒ සඳහා අදාළ රක්ෂණ සමාගම විසින් රු.මිලියන 7 ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුණු අතර ඉතිරි රු.මිලියන 12 ක මුදල පළාත් සභාව විසින් ගෙවා තිබුණි.

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සතු තක්සේරු වටිනාකම රු.මිලියන 7 ක්වූ කැඩ් රථයක් 2017 අගෝස්තු 31 දින ගින්නෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. මේ සඳහා රථය භාර රියදුරා හා රථය පරිහරණය කළ නිලධාරියා වගකිව යුතු වුවද රථය පරිහරණය කළ නිලධාරියාට එරෙහිව අදාළ විනය ක්‍රියාමාර්ග නොගෙන පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් සිටියද තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත පළාත් සේවයේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

- 2014 ජනවාරි 01 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර මාසයේ පළමු දින පැවැති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ඉන්ධන දීමනාව ගණනය නොකර නිල වාහන හිමිකම් ලබන නිලධාරීන් 52 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින ඉන්ධන ලීටරයක මිල ලෙස සුපිරි පෙට්‍රල්වල සහ සුපිරි ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2011 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ රු.මිලියන 6 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2004 අගෝස්තු 01 දින සිට 2023 අප්‍රේල් වනවිටත් නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 1/3 ක හා 1/4 ක දීමනාවක් ලෙස ගෙවමින් පැවති අතර 2019 අප්‍රේල් 21 දිනෙන් VI වන බස්නාහිර පළාත් සභාවේ නිල කාලය

අවසන් වී නව පළාත් සභාවක් තේරී පත්වී නොමැති තත්ත්වයක් තිබියදී නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 1/4 ක් වන පරිදි ගෙවා තිබුණු මුළු දීමනාව රු.මිලියන 15 ක් විය.

- ආයතන සංග්‍රහය අනුව මාසික නිවාස කුලී ලෙස දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 11 දෙනෙකුට වසර 05 කට වැඩි කාලයක සිට රු.මිලියන 20 ක මාසික නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණි.
- මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2012 වර්ෂයේදී ඇස්පෝල්ට් නිෂ්පාදනයට තාර උණු කිරීම සඳහා සපයා තිබූ රු.මිලියන 28 ක වටිනාකමින් යුත් Decanting යන්ත්‍රය ස්ථාපනය කර වසර 10 ක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තාර කිලෝ ග්‍රෑම් 535,680 ක් පමණක් නිෂ්පාදනයට උපයෝජනය කර තිබුණු අතර යන්ත්‍රය මිලදී ගැනීමේදී ආයතනයට ඇති ආර්ථිකමය වාසිය ගැන අවධානය යොමුකර නොතිබුණි.

- පළාත් සභාවේ සියලු වැඩ හා සේවා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ නියමයන් ප්‍රකාර සිදු කල යුතු නමුත් පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාර ප්‍රසම්පාදනයන් සිදු නොකර වාර්ෂිකව රු.මිලියන 59 කට ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

- පළාතේ බස් මාර්ග කිහිපයකට මගී සේවා අවසර පත්‍ර ලබාදීමට ලංසු කැඳවා තෝරා ගත් අයදුම් කරුවන්ට අවසර පත්‍රය පිරිනැමීමේ ලිපිය යවා තිබුණි. එම ලිපිය ලැබූ දින සිට දින 60 ක් ඇතුළත බස් රථ ප්‍රවාහන සේවයට එක් කර ප්‍රවාහන සේවාව ආරම්භ කළ යුතු වුවද, එකතුව රු.මිලියන 14 ක් වූ ගෙවා තිබූ අයදුම් කරුවන් 18 දෙනෙකු මගී සේවා අවසර ලබාගෙන වසර 01 මාස 08 ක් ගත වී තිබුණද, බස් රථ ධාවනයට එක් කර නොතිබුණ බැවින් මගී සේවා අවසර පත්‍ර පිරිනැමීමේ මූලික පරමාර්ථය ඉටු වී නොතිබුණි.

- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය තුළදී මාර්ග සංඥා පුවරු ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා මිලදී ගෙන තිබුණි. ඒ අනුව සංඥා පුවරු සවි කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය දෙකක් සඳහා පමණක් රු.මිලියන 9 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පමණක් බස්නාහිර පළාත් සභාවට සහ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල දීපව්‍යාප්ත තනතුරු සඳහා නිලධාරීන් 50 දෙනෙකු නීත්‍යානුකූල නොවන ආකාරයට කොන්ත්‍රාත් පදනම්

මත, විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට යෙදවීම සහ එකී නිලධාරීන්ගේ කොන්ත්‍රාත් කාලය එලෙසම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට බස්නාහිර පළාත් සභාව තුල තිබූ පාසල් 135 ක් වසා දැමීමට කටයුතු කර තිබුණි.

- කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල පැවති නිල නිවාස 06 ක්ද, ගුරු නිවාස 02 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ නිල නිවාසයක් ද, ගුරු නිවාස 02 ක් ද, කළුතර දිස්ත්‍රික්කයේ නිල නිවාස 05 ක් ද, ගුරු නිවාස 35 ක් ද, නිල නිවාස ලෙස භාවිතයට නොගෙන අදාළ විද්‍යාලයේ වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබූ බැවින්, එම විද්‍යාලවල සේවය කරන විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට පහසුවෙන් රාජකාරී කිරීමට තිබූ අවස්ථාව හා පළාත් සභාවට ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

- බස්නාහිර පළාතේ සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 18 දෙනෙකු 2022 දෙසැම්බර් 31 දිනට වසර 05 ත් 30 ත් අතර කාලයක් ස්ථානමාරු වීමකින් තොරව එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි.

- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තදුචිත පදනම යටතේ සේවකයින් 362 ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 153 ක් වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 515 ක් සේවයේ යොදවාගෙන තිබුණු අතර මිනිස්බල සැලැස්මක් සකස්කර එයට අනුව කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

- බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක 03 හි පිහිටි පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් 20 ක්, විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් 262 ක්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් 256 ක්, සහකාර විදුහල්පතිවරුන් 47 ක් හා ගුරු සේවයේ නිලධාරීන් 1,893 ක් පුරප්පාඩුව පැවතුණි.

### සබරගමුව පළාත් සභාව

- පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සම්බන්ධයෙන් 2022 ජනවාරි මාසයේ නිකුත් කළ මූලික විමර්ශන වාර්තාව අනුව හඳුනාගත් රු.මිලියන 54 ක හානි, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජිකයන් වෙත 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දීමනා ලෙස රු. මිලියන 5.5 ක් ගෙවා ඇතත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගෙන නොතිබුණි. එමෙන්ම, සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය වසින් 2016 වර්ෂයේදී රු. මිලියන 9 කට පොත් 20,651 ක් මිල දී ගෙන තිබුණද, ඉන් පොත් 7,028 ක් පරිහරණයට නොගෙන වසර 08 ක කාලයක් තිස්සේ පුස්තකාල ශාලාවක නිෂ්ක්‍රියව තිබුණි.

- ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය උපදෙස් ප්‍රකාර එක් නිලධාරියෙකුට හිමි ඉන්ධන දීමනාව තවත් නිලධාරියෙකුට ලබා දීමට ප්‍රතිපාදන සලසා නොතිබියදී, ආණ්ඩුකාර වරයාගේ දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහුට හිමි රු. මිලියනකට ආසන්න ඉන්ධන දීමනාව පෞද්ගලික ලේකම්වරිය වෙත ගෙවා තිබුණු අතර ගෙවීම් අනුමත කළ හා සහතික කළ නිලධාරීන්ගෙන් අයකරගත යුතුව තිබුණි.

- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනනුකූලව සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඉකුත් වසරට අදාළ ලාභාංශ පළාත් සභා අරමුදලට ගෙවා නොතිබිය දී හා අධිකාරියේ වියදම් සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගෙන තිබිය දී, අධිකාරියේ සේවක ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, 2022 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු මත දීමනා ලෙස රු. මිලියන 2 ක් ගෙවා තිබුණි.

- ප්‍රඥප්තිය අනුව පෞද්ගලික බස් හිමියන්ගේ ණය වෙනුවෙන් සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ඇප විය නොහැකි වුවද, එවැනි ණය වෙනුවෙන් අධිකාරිය ඇප වී තිබුණි .ඉන් 31දෙනෙකු රු. මිලියන 3 ක් ගෙවීම පැහැර හැරීම නිසා ඇපකරු ලෙස අධිකාරිය වගකීමෙන් බැඳී තිබුණි.

### ඌව පළාත් සභාව

- 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් වූ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2022 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ඌව පළාත් සභාවට කිසිදු සේවයක් ලබා ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා වශයෙන් රුපියල් මිලියන 4 ක් ගෙවා තිබුණි.
- ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් තොරව 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද, උඩවලව සංචාරක විවේකාංගණයට 2022 වර්ෂය වන විට ඌව පළාත් සභාව මගින් රුපියල් මිලියන 41 ක් වැයකර තිබුණ ද 2022 අගෝස්තු වන විට ද මෙම විවේකාංගණය හා කඩ කාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබීම මත වැය කළ මුදලින් පළාත් සභාවට මෙතෙක් ආදායම් උපයා ගැනීමට නොහැකිව තිබුණි.
- 2016 වර්ෂයේදී රුපියල් මිලියන 131 කට ඇස්තමේන්තු කර රු.මිලියන 88 කට පිරිනමා තිබුණු ඌව පළාත් සභාවේ

නිලධාරීන් සඳහා පස්මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා රු. මිලියන 50 ක් ගෙවා තිබුණ ද මේ දක්වා කර්මාන්තය අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා එහි පිරිවැය රු. මිලියන 205 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව පළාත් සභා පරිපාලනයේ දුර්වල තාවය නිසා මුල් ඇස්තමේන්තුව මෙන් සියයට 56 ක් නොහොත් රු. මිලියන 74 ක් වැඩිපුර වැය කිරීමට සිදු වී තිබුණි.

- රෝගී සත්කාරක සේවා ඉහළ නැංවීම සහ විදේශීය ජාතිකයින්ට ආයුර්වේද පහසුකම් සැපයීමෙන් ආදායම් ඉපයීම අරමුණු කරගෙන බල්ලකැටුව ආයුර්වේද රෝහලේ මුළුතැන් ගෙය හා ඖෂධාලය ඉදිකිරීම සඳහා රු. මිලියන 24 ක ඇස්තමේන්තුවක් සිදු කර රු. මිලියන 19 ක ගිවිසුම් වලට එළඹ තිබුණද එහි වැඩකොටස් වලින් සියයට 45 ක පමණ ප්‍රමාණයක් ඉටුකර, ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණ බැවින් අදාළ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

- ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පළාත් සභා ප්‍රතිපාදන මත, 2021 වර්ෂයේදී රු. මිලියන 4 ක් වැයකර, බණ්ඩාරවෙල දිස්ත්‍රික් රෝහලෙහි වෛද්‍ය වායු පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු 2021 අගෝස්තු 17 දින වන විට අවසන් කර තිබුණු අතර 2022 නොවැම්බර් 18 දින වන විටත් මෙම පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.

- මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ ගබඩාව සඳහා 2016 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ රුපියල් මිලියන 6 ක් වැයකර සූර්ය කෝෂ විදුලි පද්ධති 02 ක් සවිකර තිබුණ ද 2022 දෙසැම්බර් 15 දින වන විටත් එම සූර්ය කෝෂ විදුලි පද්ධති ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

- මහියංගනය අධ්‍යාපන කලාපයේ 2000 – 2016 කාලපරිච්ඡේදය සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් නොවන ගුරු උපදේශක තනතුරු 24 ක් වෙනුවෙන් ගුරුභවතුන් 24 ක් පත්කර 2020 ජනවාරි මාසයේ සිට 2022 සැප්තැම්බර් මාසය දක්වා වූ කාලච්ඡේදයට එකතුව රුපියල් මිලියන 72 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

# පළාත් පාලනය

## විගණන නිරීක්ෂණ

- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණන මතයන්
- වරිපනම් බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයකර ගැනීම
    - හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු නොකිරීම
    - අයවිය යුතු හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය නොවීම
    - ප්‍රාග්ධන ආදායම්
- වත්කම් හා වගකීම්
    - ඉඩම් හා ගොඩනැගිලි
    - මෝටර් රථවාහන
    - ආයෝජන
    - මුදල් හා බැංකු ගිණුම්
    - පළාත් පාලන ආයතනවල ණය
- අධිභාර අයකර ගැනීමට කටයුතු නොකිරීම
- පාලන ආයතන විගණනයේදී නිරීක්ෂණය වූ වැදගත් කරුණු

# පළාත් පාලනය



### මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණන මතයන්

ශ්‍රී ලංකාවේ පළාත් පාලනය පළාත් පාලන ආයතන 341ක් මඟින් ක්‍රියාත්මක වන අතර එම පළාත් පාලන ආයතන මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන මහා නගර සභා 24 කින් හා නගර සභා ආඥා පනතේ 255වන අධිකාරිය මඟින් ක්‍රියාත්මක නගර සභා 41 කින්ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ක්‍රියාත්මක ප්‍රාදේශීය සභා 276 කින්ද සමන්විත වේ. මෙම පළාත් පාලන ආයතනයන්වල 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ මතයන් පිළිබඳ සාරාංශයක් පහත වගුව 31 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු සභා ගණන | 2023 ඔක්තෝබර් 12 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සභා ගණන | විගණන වාර්තා නිකුත් කළ සභා ගණන | නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ | මතය ව්‍යාවෘතය | අහිතකර මතය |
| මහා නගර සභා | 24 | 24 | 24 | 18 | - | 03 | 03 |
| නගර සභා | 41 | 41 | 41 | 39 | - | 01 | 01 |
| ප්‍රාදේශීය සභා | 276 | 275 | 275 | 263 | 02 | 04 | 06 |
| එකතුව | **341** | **340** | **340** | **320** | **02** | **08** | **10** |

කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය ඉදිරිපත් කර නොතිබුණි

වගුව 31 - 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ මතයන්

### වරිපනම් බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයකර ගැනීම

සමාලෝචිත වර්ෂයේ ඉහත පළාත් පාලන ආයතනවල විවිධ බදු කුලී හා බලපත්‍ර ගාස්තු සඳහා බිල් කළ ආදායම රු. මිලියන 34,284 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර වගුව 32 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වරිපනම් බදු<br>රු. මිලියන | කුලී<br>රු. මිලියන | බලපත්‍ර ගාස්තු<br>රු. මිලියන | වෙනත් ආදායම්<br>රු. මිලියන | මුලු ආදායම<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| මහා නගර සභා | 7,699 | 1,592 | 444 | 6,736 | 16,471 |
| නගර සභා | 1,380 | 875 | 94 | 1,446 | 3,795 |
| ප්‍රාදේශීය සභා | 2,357 | 2,822 | 441 | 8,398 | 14,019 |
| එකතුව | **11,435** | **5,289** | **979** | **16,580** | **34,284** |

වගුව 32 - පළාත් පාලන ආයතනවල විවිධ බදු කුලී හා බලපත්‍ර ගාස්තු සඳහා බිල් කළ ආදායම

### විගණන නිරීක්ෂණ

- පළාත් පාලන ආයතනවල වසර 05 සිට 10 දක්වා කාල පරාසයක් තුල පවතින වරිපනම් බදු තක්සේරු කිරීමේ ප්‍රමාදයන් දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය නොකිරීම් සහ සංවර්ධන බලපත්‍ර ලබා දීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කර බදු සංශෝධනය නොකිරීම හේතුවෙන් පළාත් පාලන ආයතන වලට අය විය යුතු විශාල වරිපනම් බදු ප්‍රමාණයක් අය නොවී පැවතුණි.

- කාලීනව කුලී තක්සේරු නොකිරීම, තක්සේරු කළ බදු කුලී අය කිරීම් ප්‍රමාද කිරීම සහ බදු ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හේතුවෙන් බොහෝ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු කුලී ආදායම් අතහැරී තිබුණි.

- වර්ෂය ආරම්භ වීමට පෙර වෙළඳ බලපත්‍ර පිළිබඳ සමීක්ෂණයක් සිදු කර, ඒ අනුව ආදායම බිල් කළ යුතු වුවත්, එසේ නොකර සභාවට ලැබෙන ආදායම් පමණක් බිල් කිරීම නිසා ලැබිය යුතු විශාල වෙළඳ බලපත්‍ර ආදායමක් අහිමි වී තිබුණි.

- ආදායම් අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබීම, අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන නොකිරීම, ආදායම් අය කිරීමේ අයිතීන් වාර්ෂිකව බදු දීමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියේ දුර්වලතා හේතුවෙන් අයකරගත හැකි වෙනත් ආදායම් අහිමි වී තිබුණි.

### හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු නොකිරීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු හිඟ ආදායම රු. මිලියන 20,347 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර වගුව 33 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වරිපනම් බදු<br>රු. මිලියන | කුලී<br>රු. මිලියන | බලපත්‍ර ගාස්තු<br>රු. මිලියන | වෙනත් ආදායම්<br>රු. මිලියන | මුලු හිඟය<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| මහා නගර සභා | 7,314 | 1,968 | 80 | 2,190 | 11,553 |
| නගර සභා | 1,288 | 638 | 7 | 215 | 2,148 |
| ප්‍රාදේශීය සභා | 2,008 | 1,270 | 55 | 3,312 | 6,645 |
| එකතුව | **10,610** | **3,876** | **143** | **5,718** | **20,347** |

වගුව 33 - 2022 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු හිඟ ආදායම

මෙම හිඟයන් ඇති වීමට පහත කරුණු බලපා තිබුණි.

- වරිපනම් හා බදු අය කර ගැනීම සඳහා පනත්වල විධිවිධාන අනුව කටයුතු නොකිරීම.
- කුලී ආදායම් අය කර ගැනීම සඳහා කුලී ගිවිසුම්වල කොන්දේසි අනුව කටයුතු නොකිරීම.
- හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා නඩු නොපැවරීම.
- වෙනත් ආදායම් අය කිරීම සහා පනත්වල විධිවිධාන, අතුරු ව්‍යවස්ථා විධිවිධාන සහ ගිවිසුම් අනුව කටයුතු නොකිරීම.

### අයවිය යුතු හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව උසාවි දඩ රු. මිලියන 1,628 ක් සහ මුද්දර ගාස්තු රු.10,589 ක් පළාත් සභාවලින් අයවිය යුතුව තිබුණි. විස්තර වගුව 34 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | උසාවි දඩ<br>රු. මිලියන | මුද්දර ගාස්තු<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 121 | 3,181 | 3,302 |
| නගර සභා | 28 | 902 | 930 |
| ප්‍රාදේශීය සභා | 1,479 | 6,507 | 7,986 |
| එකතුව | **1,628** | **10,589** | **12,217** |

වගුව 34 - අයවිය යුතු හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු

උසාවි දඩ හා මුද්දර ගාස්තු නියමිත පරිදි පළාත් පාලන ආයතන වෙත ලබා දීම පළාත් සභා විසින් අතපසු කර තිබුණු අතර,එය පළාත් පාලන ආයතනවල අයවැය සහ සැලසුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා තිබුණි.

### ප්‍රාග්ධන ආදායම්

සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන ආයතන වෙත මධ්‍යම රජයේ පළාත් සභාවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් රු. මිලියන 7,129 ක ප්‍රාග්ධන ආධාර ලැබී තිබුණු අතර සහ අරමුදල්ද ඇතුළුව රු. මිලියන 8,996 ක් වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. විස්තර වගුව 35 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | ප්‍රාග්ධන ආදායම්<br>රු. මිලියන | ප්‍රාග්ධන වියදම්<br>රු. මිලියන | ඉතිරිය<br>රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 1,870 | 2,312 | 89 |
| නගර සභා | 1,318 | 1,106 | 775 |
| ප්‍රාදේශීය සභා | 3,940 | 5,577 | 2,733 |
| එකතුව | **7,129** | **8,996** | **3,596** |

වගුව 35 - පළාත් පාලන ආයතනවල ප්‍රාග්ධන ආදායම්, වියදම් හා ඉතිරිය

## වත්කම් හා වගකීම්

### ඉඩම් හා ගොඩනැගිලි

රට තුළ ඇති වාණිජ වටිනාකමින් වැඩි ඉඩම් සහ ගොඩනැගිලිවලින් විශාල ප්‍රමාණයක අයිතිය පළාත් පාලන ආයතන සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. මිලියන 229,246 ක් වේ. විස්තර වගුව 36 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | වටිනාකම රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 88,333 |
| නගර සභා | 50,876 |
| ප්‍රාදේශීය සභා | 90,037 |
| එකතුව | **229,246** |

වගුව 36 - පළාත් පාලන ආයතන සතු ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම

ඉහත ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුළ ඇතුළත් ඉඩම් හා ගොඩනැගිලි වලින් බස්නාහිර පළාත් සහ උතුරුමැද පළාත්වල පළාත් පාලන ආයතන පමණක් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව වත්කම් වර්තමාන වෙළඳපොළ මිලට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දක්වා තිබුණි.

### මෝටර් රථවාහන

2022 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන සංඛ්‍යාව 10,792 ක් වූ අතර ඒවායේ වටිනාකම රු. මිලියන 26,877ක් විය. විස්තර වගුව 37 මගින් දැක්වේ

| පළාත් පාලන ආයතන වර්ගය | වාහන සංඛ්‍යාව | වටිනාකම රු. මිලියන |
|---|---|---|
| මහා නගර සභා | 3,145 | 11,238 |
| නගර සභා | 1503 | 2,966 |
| ප්‍රාදේශීය සභා | 6144 | 12,674 |
| එකතුව | **10,792** | **26,877** |

වගුව 37 - පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන සංඛ්‍යාව

### ආයෝජන

පළාත් පාලන ආයතනවල ප්‍රධාන අරමුණ පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම බැවින් ඒ සඳහා සභාවේ ආදායමට ගැළපෙන පරිදි වියදම් සැලසුම් කර අය වැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. නමුත් පළාත් පාලන ආයතන බොහොමයක අයවැය සහ පරිපූරක ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඒවා ආදායම් ඉපයීමේ අරමුණු ඇතිව ස්ථාවර තැන්පතු හා වෙනත් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. විස්තර වගුව 38 මගින් දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | ආයෝජන මුදල රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 7,942 |
| නගර සභා | 3,159 |
| ප්‍රාදේශීය සභා | 9,850 |
| එකතුව | **20,951** |

වගුව 38 - ස්ථාවර තැන්පතු හා වෙනත් තැන්පතුවල ආයෝජනයන්

පළාත් පාලන ආයතනවලට පැවරී ඇති මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා , පොදු මංමාවත් පිළිබඳ කටයුතු සහ ජනතා සුභසාධන කටයුතු ඉටු කිරීම් නිසි පරිදි ඉටු කර නොනිඛියදී ඒවායේ අරමුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යෑම ගැටළුකාරී තත්ත්වයක් විය.

## මුදල් හා බැංකු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල බැංකු ගිණුම්වල පැවති සහ අතැති මුදල් ශේෂය රු. මිලියන 7,821ක් විය. විස්තර වගුව 39 මගින් දැක්වේ

| පළාත් පාලන ආයතන වර්ගය | මුදල රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 880 |
| නගර සභා | 1,103 |
| ප්‍රාදේශීය සභා | 5,838 |
| එකතුව | **7,821** |

වගුව 39 - පළාත් පාලන ආයතනවල බැංකු ගිණුම්වල පැවති සහ අතැති මුදල් ශේෂ

## පළාත් පාලන ආයතනවල ණය

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) වෙතින් සහ වෙනත් ආයතනවලින් ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය රු.මිලියන 7,068 ක් විය. විස්තර වගුව 40 මගින් දැක්වේ

| පළාත් පාලන ආයතන වර්ගය | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය රු. මිලියන | වෙනත් ණය රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 1,417 | 3,286 | 4,703 |
| නගර සභා | 1,293 | 128 | 1,422 |
| ප්‍රාදේශීය සභා | 656 | 287 | 943 |
| එකතුව | **3,367** | **3,701** | **7,068** |

වගුව 40 - පළාත් පාලන ආයතන ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය

## අධිභාර අයකර ගැනීමට කටයුතු නොකිරීම

සමාලෝචිත වර්ෂය තුළදී මහා නගර සභා ආඥා පනතේ 226 වගන්තිය නගර සභා ආඥා පනතේ 182 වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්තිය අනුව විගණකාධිපති විසින් තැනැත්තන් 135 දෙනෙකුගෙන් රු. මිලියන 6ක් සභා අරමුදල්වලට අයකර ගැනීම සඳහා අධිභාර 10 ක් නිකුත් කර තිබුණ නමුත් එම අධිභාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඉහත පොදු නිරීක්ෂණවලට අමතරව ඒ ඒ පළාත් පාලන ආයතන විගණනයේදී නිරීක්ෂණය වූ වැදගත් කරුණු පහත සාරාංශයක් දක්වා ඇත.

- මධ්‍යම රජය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගන්නා ලද ඇ.ඩො. මිලියන 232 ක ණය මුදලක් භාවිතයෙන් කොළඹ මහා නගර සභාවේ මලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරිම සඳහා 2022 දෙසැම්බර් 31 දින විට රු. මිලියන 23,210 ක මුදලක් ආයෝජනය කර ඇති අතර එයින් රු. මිලියන 19,971 ක මුදලක් ගිණුම්ගත කිරිමට හෝ හෙලිදරව් කිරිමට කටයුතු නොකර එම මුදලින් ආපසු ගෙවීමට ගිවිසුම්ගත වී තිබූ රු. මිලියන 3,239 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

- මීගමුව මහා නගර සභාව 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මිලදී ගත් හා පරිත්‍යාග ලෙස ලද රු. මිලියන 17 ක් වූ වත්කම් 7 ක් භාවිතයට නොගෙන ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතිණි.

- රත්නපුර මහා නගර සභාවේ නගර සභා ගොඩනැගිල්ලේ විදුලි පද්ධතියේ අලුත්වැඩියාවකදී විදුලි උපාංග සඳහා රු.මිලියන 5.3 ක් හා ශ්‍රම දින 1046 ක් වැයකර තිබුණි. එහෙත්, ඊට විධිමත් සැලැස්මක් (Electric Drawing) හා පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර වරලත් විදුලි ඉංජිනේරුවරයෙකු ලවා අනුමත කරවාගෙන නොතිබුණි.

- ඇඹිලිපිටිය නගර සභාවේ 2019 වර්ෂයේ ස්ථාපනය කර තිබූ LED දැන්වීම් පුවරුවක් සඳහා වූ රු. මිලියන 2.7 ක වියදම මාස 20 කින් පියවා ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත්, දැන්වීම් පුවරුව ස්ථාපිත කර මාස 34ක ආදායම රු.35,500ක් පමනක් විය.

- නිවිතිගල ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය වෙනුවෙන් 2019 වර්ෂයේ සිට වැයකර තිබූ රු. මිලියන 9 ක් සහ 2022 අගෝස්තු 08 දින පළාත් සභාවෙන් ලැබී තිබූ රු. මිලියනයක් වූ බෙලර් යන්ත්‍රයද විදුලිය නොමැතිවීම නිසා උපයෝජනය කර නොතිබුණි.

- භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීමකින් තොරව අයගම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කර පසුව අත්තිවාරම හා කුලුනු පාදම (Column Shaft) පමණක් ඉදිකර තිබියදී 2022 වර්ෂයේදී අන්‍යෝන්‍ය එකඟතාව මත

ගිවිසුම අවසන් කර තිබුණ ද, නිමකළ වැඩ වෙනුවෙන් රු. මිලියන 2 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- බලංගොඩ ප්‍රාදේශීය සභාවේ වේළිඔය නගරයේ 2015 වර්ෂයේ දී ඉදිකළ රු.මිලියන 27 ක් වූ දෙමහල් ගොඩනැගිල්ල 2022 වර්ෂය අවසන් වනවිටත් අභාවිතව පැවැතිණි.

- මහා නගර සභා ආඥා පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණ කුරුණෑගල මහ නගර සභා නාගරික මන්ත්‍රීවරයෙකුගේ රෝග තත්ත්වයක් සඳහා ආධාර පිණිස රු.මිලියනයක් ගෙවා තිබුණි.

- කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අදාලව ජලාපවහන සැලැස්ම (Master Drainage Plane) සංශෝධනය කිරීමට අදාල ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා 2022 මැයි 17 දින රු. 540,000ක මුදලක් අත්තිකාරමක් වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවා තිබුණි. මෙම ජලාපවහන සැලැස්ම සංශෝධන කිරීම කඩිනමින් අවසන් කළ යුතු වුවද 2022 දෙසැම්බර් 31 වන විටත් ඉටුකර නොතිබුණි.

- කුරුණෑගල මහා නගර සභාවේ ජල අංශය මඟින් ජල පරිභෝජනයේ සිදුවන වෙනස්වීම් හඳුනා ගැනීම සඳහා තොග ජල මනු සවිකිරීම හා නල මගින් ජලය බෙදාහැරීමේ ක්‍රමය යාවත්කාලීන කිරීම සඳහා රු. මිලියන 1.5 ක් වටිනා ජල උපකරණ වර්ග 06 ක් මිලදී ගෙන තිබුණද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

- කුරුණෑගල මහා නගර සභාව මධ්‍යම වෙළඳපල I අදියර ඉදිකිරීම පෞද්ගලික ආයතනයක් සමග රු. මිලියන 949 ක මුදලකට ගිවිසුම්ගතව තිබුණද මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ලංසු කැඳවීමේ දී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි ශ්‍රේණිගත කිරීම් වලට වඩා ඉහළ සුදුසුකම් ඉල්ලා තිබීම නිසා මහා නගර සභාව සමඟ සම්බන්ධතා පවත්වනු ලබන ලංසුකරුවන්ගේ ලංසු පමණක් ලබා ගෙන විවෘත තරගයට වූ ඉඩ කඩ අහුරා ඇස්තමේන්තු මුදලට වඩා රු. මිලියන 270 ක් වැඩි මුදකට ලංසු ප්‍රදානය කර තිබුණි.

- කුරුණෑගල මහා නගර සභාව විසින් මධ්‍යම වෙළඳපල ඉදිකිරීමේදී පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කමිටු වාර්තාව මඟින් ප්‍රධාන වැඩ විෂයයන් 20 සම්බන්ධයෙන්ම දළ වෙළඳපල මිල හා මූලික ඇස්තමේන්තුව අතර සැසඳීමක් නොකර කොන්ත්‍රාත්කරුට වාසිදායක වනසේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ 01 හා 15 යන වැඩ විෂයයන් දෙක එනම් Preliminaries

හා වායුසමීකරණය අයිතමයන්ගේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 76 ක් වැඩිකර තිබුණි.

- කුරුණෑගල මහා නගර සභා මධ්‍යම වෙළඳපල ඉදිකිරීමේදී ඇස්තමේන්තුවේ සඳහන් Provisional sum අගයන් පරීක්ෂාවේදී පැවති විචලනයන් සම්බන්ධයෙන් එම විචලන කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තු මිලට ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම නිසා අයිතම 03 ක් සඳහා රු.මිලියන 93 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

- කුරුණෑගල මහා නගර සභා මධ්‍යම වෙළඳපල ඉදිකිරීමේදී අසාමාන්‍ය මිල රේටයන් මත වයඹ පළාත් ගොඩනැගිලි සම්මත රේට (BSR) අභිභවා රු. මිලියන 35 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- කුරුණෑගල මහා නගර සභාවේ MC – Plaza ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව විශේෂ අනුමැතියක් ලබා නොගෙන රු.මිලියන 20 ක අමතර වැඩ ඉටුකර තිබුණි. මෙම අමතර වැඩ ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකමින් සියයට 10 ක් නොයික්ම වියයුතු වුවත්, ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ විෂයයන් ඉටු නොකර සියයට 53 ක අමතර වැඩ ඉටුකර තිබුණි.

කුරුණෑගල මහා නගර සභාවේ MC – Plaza ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුවේ ගිවිසුම්ගත වී එකඟ වූ වටිනාකමෙන් ඉටු නොකළ අයිතම 23 ක වටිනාකම රු.මිලියන 20 ක් වූ අතර එය ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 53 ක ප්‍රතිශතයක් විය.

- කුරුණෑගල මහා නගර සභාවේ MC – Plaza ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී ගොඩනැගිලි මිල විශ්ලේෂණයේ රේටයන් භාවිතා නොකර අමතර වැඩ සඳහා විශේෂ මිල රේටයන් සකස් කර ගෙවීම් කිරීම හේතුවෙන් වැඩ විෂයයන් 08 කට රු.මිලියන 20 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

- සුන්දරාපොළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත්තු මඟින් කුරුණෑගල මහා නගර සභාවට පිරිවැය වාසියක් ලැබී නොතිබූ අතර රු. මිලියන 240 ක් වටිනා ව්‍යාපෘතියකින් රු. මිලියන 100 මුදලකට ගිවිසුම්ගත වී තිබුණද මෙම රු. මිලියන 100 තුළ ඉටුකළ යුතු වැඩ කොටස නිශ්චිතව හඳුනාගෙන මහා නගර සභාව විසින් ගිවිසුම්ගත වී නොතිබුණි. විගණිත 2022 අගෝස්තු 25 දින වන විට කොන්ත්‍රාත් මුදලින් රු. මිලියන 57 මුදලක් ගෙවීම් කර තිබුණි.

- හලාවත නගර සභාව විසින් හලාවත රෝහල වෙත ශර්ලි කොරයා ශාලාව 2017 වර්ෂයේදී ගිවිසුම් රහිතව කුලියට

ලබා දී තිබූ අතර නගර සභාවට අයවිය යුතු කුලී මුදල් වූ රු.මිලියන 3 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කර තිබූ රු. මිලියන 3 ක ද්‍රව්‍ය නඩත්තු ගබඩා ලේඛනයට ඇතුළත් නොකිරීම හේතුවෙන් ඒවා අදාළ අරමුණට යොදා ගත්තේද යන්න තහවුරු කරගත නොහැකි විය.

- කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘති 4 ක 2022 ඔක්තෝබර් 31 දිනට සාමාජික හා ජල ගාස්තු හිඟය රු. මිලියන 2 ක් විය.

- පුත්තලම නගර සභාවේ ඇල්ෆා වෙළෙඳ සංකීර්ණයේ සියලු කඩ කාමර අලෙවිය මත සභාවට ලැබිය යුතු එක්වන් මුදල් (key money) රු. මිලියන 717ක් වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වසර 03 කට ආසන්න කාලයක් ගත වී ඇතත් සභාව විසින් රැස් කරගෙන තිබූ වටිනාකම රු. මිලියන 253 ක් පමණක් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 35 ක් විය.

- සමාලෝචිත වර්ෂයේ මහනුවර මහා නගර සභා ක්‍රීඩා පිටිය සඳහා සවිකර තිබූ සූර්යය බල වීථි පහන් භෞතිකව පරීක්ෂා කිරීමේදී එක් වීදි පහන් කනුවක් සඳහා ගෙවිය යුතු වටිනාකමට වඩා රු. මිලියන 1 ක් පහන් කණු 13 ක් සඳහා වැඩිපුර ගෙවා තිබුණි.

- මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩමක් වෙන්දේසියේ විකුණා තිබුණද තක්සේරු ගත වටිනාකම මත වූ සියයට 1 ක රු. මිලියන **3** ක කොමිස් අයකර ගෙන නොතිබුණි.

- 2005 වර්ෂයේ දී දේශීය ණය සහ සංවර්ධන අරමුදල් රු. මිලියන 96 ක් යොදවා ඉදිකර තිබූ මහල් 03 කින් යුත් ගම්පොළ පොදු වෙළඳ සංකීර්ණයේ මහල් 02 ක් පමණක් ඉදිකර තිබුණු අතර එහි කඩ කාමර 197 න් කඩ කාමර 100 ක් වසර 17 ක කාලයක සිට වසා තිබීම හේතුවෙන් මෙම භූමිය විවිධ විෂමාචාර සඳහාද ඉඩ සැලසී තිබුණි.

- පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත නකල්ස් සංචාරක මධ්‍යස්ථානයේ ආගන්තුක සත්කාරක නිවහනක් ඉදිකිරීම සඳහා රු.මිලියන 13 කට ගිවිසුම්ගතව 2017 වර්ෂය වන විට ඉන් රු. මිලියන 4.4 ක් ගෙවා තිබුණද අඩක් ඉදිකර තිබූ ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.

- නුවරඑළිය නගරය ඇතුළත මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීම සඳහා පසුගිය අවුරුදු 5 තුල වැඩසටහන් 11 ක් වෙනුවෙන් රු. මිලියන 111 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඒවා අරමුණුගත කාර්යයන් සඳහා යොදවා නොතිබුණු අතර කානු හා ඇළ මාර්ග 107 ක් නඩත්තුව හා වැඩි දියුණු කිරීම සඳහා

රු. මිලියන 15 ක ප්‍රතිපාදන අයවැයෙන් වෙන් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉන් ව්‍යාපෘති 93 ක් ඉටු කර නොතිබුණි.

- මාතලේ දිස්ත්‍රික්කයේ කසළ කළමනාකරණය වෙනුවෙන් රු. මිලියන 307 ක් වැයකර 2017 වර්ෂයේදී සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා දිනකට රු.මිලියන 90 ක වියදමින් 2021 වර්ෂයේදී ධාරිතාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට පොහොර ටොන් 25 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

- මාතලේ මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටා තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහල ත්‍රිමාණ සිනමා ශාලාවක් සඳහා වර්ග අඩි 2000 ක් සඳහා ගිවිසුම්ගත වී බදු දී තිබුණද ගිවිසුම්ගතවී තිබුණ ප්‍රමාණය ඉක්මවා වර්ග අඩි 3,972 ක් පරිහරණය කර තිබූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

- නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 13 හි අවසන් ගිණුම්වල රු.මිලියන 1,307 වටිනා ඉඩම් හා ගොඩනැගිලි දක්වා තිබුණද ඒවායේ අයිතිය තහවුරු කළ හැකි ඔප්පු, මිනින්දෝරු සැලසුම් කිසිවක් නොවීය.

- මහියංගණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනකට දිරන සහ නොදිරන කසළ මෙට්‍රික් ටොන් 03 කට ආසන්න ප්‍රමාණයක් බැහැර කර තිබුණි. සමාලෝචිත වර්ෂයට වසර 06 කට පෙර කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු රු.මිලියන 16 ක් වැය කර ස්ථීර කසළ අංගනයක් සහ කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණද ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය හේතුවෙන් එම ස්ථානයේ කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද සිදුකර නොතිබුණු අතර අදාල ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

- මහියංගණ ප්‍රදේශීය සභාව තුල එකතු වන කසළ දොඩම්වත්ත නව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ විවෘත භූමියකට අවිධිමත් ලෙස බැහැර කර තිබුණු බැවින් මැස්සන් වැනි කෘමි සතුන් බෝවීමත්, දුර්ගන්ධයක් පැතිරෙන බවත්, වර්ෂා කාලයේදී මිශ්‍ර වූ කසළ සේදී ගොස් කසළ අංගනය ආසන්නයෙන් ගලා බසින මහවැලි ගඟට එකතුවීමේ අවදානමක් පැවතුනි.ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේ මෙම ස්ථානයේ කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් රු.මිලියන 38 ක් වැය කර තිබුණි.

- මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 07 කට අදාලව යන්ත්‍ර කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. මිලියන 21 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

- 2021 දෙසැම්බර් 24 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව ගිණි ආරක්ෂණ සේවා ගාස්තු කාණ්ඩ 33 ට අයත් අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර 1931 කින් රු.2,500 බැගින් අයකළ යුතු වුවත් එලෙස කාණ්ඩ ගතකර ගාස්තු අයකර නොතිබීම නිසා රු.මිලියන 5 ක පමණ වාර්ෂික ආදායමක් මහා නගර සභාවට අහිමි වී තිබුණි.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා එකොළහකට අයත් යන්ත්‍ර සහ වාහන කුලියට ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට අයවිය යුතු හිඟ මුදල රු. මිලියන 11 ක් විය.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා එකොළහකට අයත් වටිනාකම රු.මිලියන 53 ක් වූ වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම හෝ ප්‍රයෝජනයට ගතහැකි පරිදි නිමකර නොතිබීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා හතරක් විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු. මිලියන 5.5 ක් විය.

- පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 27 ක් වැය කර 2019 වර්ෂයේ ඉදිකිරීම් නිමකර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත භාරදුන් නව පොදු වෙළඳපොළ කඩ කාමර 92 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කුලියට දීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. ඒ යටතේ තක්සේරු කුලිය මත සමාලෝචිත වර්ෂයට අදාළව පමණක් අහිමි වූ ආදායම රු. මිලියන 13 ක් විය.

- පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය ඒකකය මගින් රු.මිලියන 145 ක් වැය කර 2019 වර්ෂයේදී ලංකාපුර ප්‍රාදේශීය සභාවේ ස්ථාපනය කර තිබුණු කව්ෂිමා යන්ත්‍රය මගින් දිනකට නිෂ්පාදනය කළ හැකි කොම්පෝස්ට් ධාරිතාවය ටොන් 50 ක් පමණ වුවද, බල ප්‍රදේශයේ එවැනි ධාරිතාවයකට අවශ්‍ය කසළ රැස් නොවීම හා අධික නඩත්තු පිරිවැය හේතුවෙන් යන්ත්‍රය ඌණ උපයෝජිතව පැවතුණි.

- ප්‍රාදේශීය සභා තුනකට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට පැවති හිඟ කඩ කුලිය රු. මිලියන 11 ක් වූ අතර මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට වරිපනම් බදු හිඟය රු. මිලියන 3.4 ක් විය

- මාතර මහා නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන ටොන් 35 ක පමණ වූ කසළ කලමනාකරණය කිරීම සඳහා දිගුකාලීන විසඳුමක් ලෙස කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය මාතර මහා නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය හා එක්තරා පෞද්ගලික සමාගමක් අතර 2014 අගෝස්තු 08 දින ගිවිසුමකට එලඹී කොටවිලවත්ත ඉඩමෙන් අක්කර 05 ක භූමි ප්‍රමාණයක් වසර 25 ක කාල සීමාවක් සඳහා ලබා දී තිබුණි. නමුත් වසර 08 ක පමණ කාලසීමාවක් තිස්සේ එම ඉඩමේ කුණු කසළ විවෘත භූමියේ ගොඩ ගැසී තිබී ඒවා රු. මිලියන 41 ක කුලී ගෙවා පස්වලින් යට කර තිබූ නමුත් නැවත කසළ කන්ද පෙර පරිදි නිරාවරණය වීමෙන් කසළ යට කිරීම සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

- මාතර මහා නගර සභාවේ මුල්‍ය ප්‍රකාශන අනුව ආසියානු ණය සංවර්ධන බැංකුව මගින් බස් නැවතුම්පොළ සහ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර උපකරණ ලබා ගැනීම සඳහා ලබා දී තිබූ ණය මුදල හා පොලිය රු. මිලියන 55 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරියට අනුව එම ශේෂය රු. මිලියන 148 ක්වූ අතර වෙනසට හේතු සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

- අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගබඩා තොග සාරාංශයේ ඇතුලත් රු.මිලියන 26 වටිනා ගබඩා තොග ශේෂ 11 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, එම ශේෂයන් සභාව සතුව භෞතිකව නොතිබුණි.

- වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ඇළ මාර්ග 08 ක් හාරා මඩ ඉවත් කිරීම කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට හා ගොවි සංවිධානයකට රු. මිලියන 6 ක මුදලක් අවිධිමත් ලෙස වැය කර තිබූ අතර, ප්‍රාදේශිය සභා විෂය පථයට අයත් නොවන එම කාර්යයන් සඳහා අනුමැතියකින් තොරව සභා අරමුදලින් වියදම් දැරීම සිදු කර තිබුණි.

- පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 03 ක විවිධ ඉදිකිරීම් 07 ක් රු. මිලියන 24 ක වැඩ අතරමග නතර කර තිබූ බැවින් එම ඉදිකිරීම් ආරම්භ කිරීම තුලින් බලාපොරොත්තු වූ අරමුණුද ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර ඉදිකරන ලද කොටස්ද විනාශ වෙමින් තිබුණි.

- වැලිගම ප්‍රාදේශීය සභාවට අයත් නාගරික බල ප්‍රදේශය තුළ සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන ඇති බවට තොරතුරු ඉදිරිපත් නොවූ ව්‍යාපාරිකයන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රු. මිලියන 6 ක ගාස්තු අයකර එම

ඉදිකිරීම් විධිමත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

- 2022 නොවැම්බර් 22 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව සහ ලිපි ගොනු සාක්ෂි අනුව අඩුපාඩු පවතින බැවින් වැලිගම ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව විසින් අනුමත නොකරන ලද ගොඩනැඟිලි සැලසුම් 02 ක් සභාපති විසින් තම නිල මුද්‍රාව තබා වංචනිකව අනුමත කර තිබූ අතර ක්ෂේත්‍ර පරීක්ෂණ දින වන විටත් වර්ග අඩි 1,205.3 ක නේවාසික දෙමහල් ගොඩනැඟිල්ලක් හා වාණිජ ගොඩනැඟිල්ලක් එහි ඉදිකර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී කඹුරුගමුව කසළ ව්‍යාපෘතියට යාබදව පිහිටි පිඹුරු අංක 35/215 දරන ඉඩමෙන් පර්චස් 100 ක් මිලදී ගැනීමේදී වැලිගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති සතු ඉඩමක් රුපියල් මිලියන 1 කට තුන්වන පාර්ශවයකට විකුණා එම ඉඩම නැවත මාස 02 කින් රුපියල් මිලියන 9 කට සභාවට මිලදී ගෙන තිබීමෙන් සභා අරමුදලට පාඩු සිදු වී තිබුණි.

- 2008 වසරේ සිට මේ දක්වා තංගල්ල නගර සභාවේ සභිකයෙකු ලෙස කටයුතු කරමින් එම සභාවට අයත් බස් නැවතුම්පල කඩ කාමරයක බදුකරු වශයෙන්ද කටයුතු කිරීම සභිකධුරය දැරීමට නුසුදුසු කමක් වුවද 2008 වර්ෂයේ සිට මේ දක්වා එකතුව රු.මිලියන 2 ක් වූ දීමනා එම සභිකයාට ගෙවා තිබුණි.

මුද්‍රණය : මුද්‍රණ අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව